සැ. යු. - 2023.11.17 දින පළ කරන ලද අංක 2359 *ගැසට් පත්‍රයේ* II,III සහ IV(අ) කොටස් පළ නොවීය.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,360 - 2023 නොවැම්බර් මස 24 වැනි සිකුරාදා - 2023.11.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

IV(අ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

	පිටුව
තනතුරු-ඇබෑර්තු	2288
විභාග, විභාග ප්‍රතිඵල ආදිය	—
බඩුබාහිරාදිය විකිණීම්	—
පළාත් පාලන නිවේදන	2293
අතුරු ව්‍යවස්ථා	—
පළාත් පාලන සභා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් ..	—
ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන	—
අයවැය ලේඛන	—
දේපළ විකිණීම්	—
විවිධ දැන්වීම්	2306

සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12 00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට්* පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2023 දෙසැම්බර් මස 15 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2023 දෙසැම්බර් මස 01 වැනි දින දහවල් 12 00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."

ගංගානි ලියනගේ,
රජයේ මුද්‍රණාලයාධිපති.

2023 ජනවාරි මස 02 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය www.documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

2287- B 82518— 5,403 (2023/11)

තනතුරු - ඇබෑර්තු

මහනුවර මහා නගර සභාවේ ශ්‍රම මිල දී ගැනීමේ පදනම මත මුල් ළමාවිය සංවර්ධන උපකාරක නිලධාරි සේවය, GIS තාක්ෂණ සේවා නිලධාරි සේවය සහ තොරතුරු තාක්ෂණ නිපුණතා නිලධාරි සේවය ලබා ගැනීම

මහනුවර මහා නගර සභාවේ සේවා අවශ්‍යතාවය මත ශ්‍රම මිල දී ගැනීමේ පදනම මත මුල් ළමාවිය සංවර්ධන උපකාරක සේවය, GIS තාක්ෂණ සේවා සේවය සහ තොරතුරු තාක්ෂණ නිපුණතා සේවය ලබා ගැනීමට නියමිත සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. ඒ අනුව අයදුම්පත් බහාලන කවරයෙහි වම්පස ඉහළ කෙළවරෙහි සේවාවේ නාමය සඳහන් කර **2023.12.15 දිනට** ප්‍රථම නාගරික කොමසාරිස්, මහනුවර මහා නගර සභාව, මහනුවර යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

මුල් ළමාවිය සංවර්ධන උපකාරක සේවය

1. මිල දී ගැනීමට නියමිත සේවාව : මුල් ළමාවිය සංවර්ධන උපකාරක සේවය (ශ්‍රම මිල දී ගැනීමේ පදනම මත)

2. දෛනික දීමනාව : දිනකට රු. 1,400.00 බැගින්

3. කායික සුදුසුකම් : අදාළ සේවාව ලබා දීමට ප්‍රමාණවත් තරම් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

4. අධ්‍යාපන සුදුසුකම් : අ.පොෙ.ස. (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව හා තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් හයකින් එකවර සමත් වීම;

හා

අ.පොෙ.ස. (උසස් පෙළ) විභාගයෙන් අවම වශයෙන් විෂයයන් එකක්වත් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හා සාමාන්‍ය ඉංග්‍රීසි හැර සමත් වී තිබීම.)

*** *සටහන* - එම විභාගයන්හි දී චිත්‍ර කර්මය, සංගීතය, නැටුම් යන සෞන්දර්ය විෂයන්ගෙන් සමත්වීම විශේෂ සුදුසුකමක් වනු ඇත.**

5. වෘත්තීය සුදුසුකම් : පූර්ව පාඨශාලා අධ්‍යාපනය පිළිබඳව විවෘත විශ්වවිද්‍යාලයේ බාහිර සේවා මණ්ඩලය මගින් නිකුත් කරන පූර්ව පාසල් අධ්‍යාපනය පිළිබඳ ඩිප්ලෝමාව ;

හෝ

ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශයේ ළමා ලේකම් කාර්යාලය යටතේ ලියාපදිංචි කර ඇති ආයතන මගින් පිරිනමනු ලබන පෙර පාසල් ගුරු පුහුණු ඩිප්ලෝමාව ;

හෝ

මධ්‍යම පළාත් සභාවේ මුල් ළමාවිය සංවර්ධන ඒකකය මගින් පිරිනමනු ලබන පෙර පාසල් ගුරු පුහුණු ඩිප්ලෝමාව ;

හෝ

තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ අනුමත ආයතන මගින් පිරිනමනු ලබන පෙර පාසල් ගුරු පුහුණු ඩිප්ලෝමාව.

*** මෙම ඩිප්ලෝමා පාඨමාලාවේ කාල සීමාව අවම වශයෙන් වසරක් හෝ ඊට වැඩි විය යුතු ය.**

6. වෙනත් සුදුසුකම් : (i) ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතු ය.

(ii) පූර්වාසන්න වසර 03 ක කාලය තුළ මහනුවර මහා නගර සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිය සහිත කාන්තා අයදුම්කරුවන් පමණක් විය යුතුය.

(iii) අයදුම්කාරියන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

(iv) සේවය ලබා ගැනීම සඳහාවන සියලු සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයෙන් ම සම්පූර්ණ කර තිබිය යුතුය.

7. වයස : සියලුම අයදුම්කරුවන් වයස අවුරුදු 18ට නොඅඩු විය යුතු අතර අවුරුදු 35ට නොවැඩි විය යුතුය.

8. තෝරා ගැනීමේ ක්‍රමය : සුදුසුකම්ලත් නිලධාරීනීන් පහත කොන්දේසිවලට යටත්ව තෝරාගනු ලැබේ.

1. මූලික සුදුසුකම් සපුරා ඇති අයවලුන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට යොමු කරනු ලැබේ. අනතුරුව ඉන් ඉහළම ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් ප්‍රායෝගික පරීක්ෂණයට යොමු කරනු ලබයි.

2. සේවය ලබා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවෙන් දළ වශයෙන් දෙගුණයක් පමණ ප්‍රායෝගික පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

3. ව්‍යුහගත පරීක්ෂණයේ හා ප්‍රායෝගික පරීක්ෂණයෙන් ඉහළම ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් සේවා සපයා ගැනීම සඳහා තෝරාගනු ලැබේ.

4. මෙම සේවා ලබා ගැනීම හුදෙක් සේවා අවශ්‍යතාවය මත පමණක් වන බැවින් රජයේ කිසිදු නිත්‍ය තනතුරක් දැරීම සඳහා එය අයිතිවාසිකමක් නොවේ.

තොරතුරු තාක්ෂණ නිපුණතා සේවය

1. මිල දී ගැනීමට නියමිත සේවාව : තොරතුරු තාක්ෂණ නිපුණතා සේවය (ශ්‍රම මිල දී ගැනීමේ පදනම මත)

2. දෛනික දීමනාව : දිනකට රු. 2,300.00 බැගින්

3. කායික සුදුසුකම් : අදාළ සේවාව ලබාදීමට ප්‍රමාණවත් තරම් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

4. අධ්‍යාපන සුදුසුකම් : 1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් පරිගණක විද්‍යාව/තොරතුරු තාක්ෂණය පිළිබඳ උපාධියක් ලබා තිබීම ;

හෝ

2. i. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් පරිගණක විද්‍යාව/තොරතුරු තාක්ෂණය ප්‍රධාන විෂයයක් සහිත උපාධියක් ලබා තිබීම (මෙහි දී සම්පූර්ණ උපාධියෙන් අවම වශයෙන් 1/3 කොටසක් හෝ පරිගණක විද්‍යාව තොරතුරු තාක්ෂණය විය යුතු ය ;

සහ

ii. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් පරිගණක විද්‍යාව/තොරතුරු තාක්ෂණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා තිබීම ;

හෝ

3. i. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධිය ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් උපාධියක් ලබා තිබීම ;

සහ

ii. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් පරිගණක විද්‍යාව/තොරතුරු තාක්ෂණය පිළිබඳ පශ්චාත් උපාධියක් ලබා තිබීම ;

හෝ

4. i. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන තොරතුරු තාක්ෂණය පිළිබඳ ජාතික වෘත්තීය කුසලතා (NVQ 7) මට්ටම හෝ ඊට ඉහළ (NVQ) සහතික ලබා තිබීම ;

සහ

ii. අදාළ ක්ෂේත්‍රයේ වසර දෙකක වෘත්තීය පළපුරුද්ද ලබා තිබිය යුතුය.

5. වෘත්තීය පළපුරුද්ද : අදාළ ක්ෂේත්‍රයේ සේවා සැපයීම සම්බන්ධව පූර්ව පළපුරුද්දක් ලබා තිබීම විශේෂ සුදුසුකමක් සේ සලකනු ලැබේ.

6. වෙනත් සුදුසුකම් : (i) ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතුය.

(ii) පූර්වාසන්න වසර 03ක කාලය තුළ මහනුවර මහා නගර සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිය සහිත විය යුතුය.

(iii) අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

(iv) තෝරාගැනීම සඳහාවන සියලු සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

7. වයස : සියලුම අයදුම්කරුවන් වයස අවුරුදු 21ට නොඅඩු විය යුතු අතර අවුරුදු 35ට නොවැඩි විය යුතු ය.

8. තෝරාගැනීමේ ක්‍රමය : සුදුසුකම්ලත් නිලධාරීන්ගේ පහත කොන්දේසිවලට යටත්ව තෝරාගනු ලැබේ.

1. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින් තෝරාගනු ලැබේ.

2. ව්‍යුහගත පරීක්ෂණයේ ඉහළම ලකුණු ලබාගන්නා අයදුම්කරු, සේවා සැපයීම සඳහා යොදාගනු ලැබේ.

3. මෙම තෝරාගැනීම හුදෙක් සේවා අවශ්‍යතාවය මත පමණක්වන බැවින් රජයේ කිසිදු නිත්‍ය තනතුරක් දැරීම සඳහා එය අයිතිවාසිකමක් නොවේ.

GIS තාක්ෂණ නිලධාරි සේවය

1. මිල දී ගැනීමට නියමිත සේවාව : GIS තාක්ෂණ නිලධාරි සේවය (ශ්‍රම මිල දී ගැනීමේ පදනම මත)

2. දෛනික දීමනාව : දිනකට රු. 1,500.00 බැගින්

3. කායික සුදුසුකම් : අදාළ සේවාව ලබා දීමට ප්‍රමාණවත් තරම් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

4. අධ්‍යාපන සුදුසුකම් : විශ්වවිද්‍යාල කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් භූගෝල විද්‍යාව පිළිබඳ විශේෂ උපාධියක් ලබා තිබිය යුතුය.

5. වෙනත් සුදුසුකම් : (i) ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතුය.

(ii) පූර්වාසන්න වසර 03 ක කාලය තුළ මහනුවර මහා නගර සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිය සහිත විය යුතුය.

(iii) බඳවා ගැනීම සඳහාවන සියලු සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

7. තෝරා ගැනීමේ ක්‍රමය : සුදුසුකම්ලත් නිලධාරීන් පහත කොන්දේසිවලට යටත් ව සේවය තෝරා ගනු ලැබේ.

1. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින් ලබා ගන්නා ලද ලකුණුවල ප්‍රමුඛතාවය අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවෙන් දළ වශයෙන් දෙගුණයක් පමණ ප්‍රායෝගික පරීක්ෂණය සඳහා ඉදිරිපත් කරනු ලැබේ.

2. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් සමත්වන සියලු අයදුම්කරුවන් ප්‍රායෝගික පරීක්ෂණය සඳහා ඉදිරිපත් විය යුතුය.

3. ව්‍යුහගත පරීක්ෂණයේ හා ප්‍රායෝගික පරීක්ෂණයෙන් ඉහළම ලකුණු ලබාගන්නා අයදුම්කරුවන් සේවා සපයා ගැනීම සඳහා බඳවා ගනු ලැබේ.

4. මෙම බඳවා ගැනීම හුදෙක් සේවා අවශ්‍යතාවය මත පමණක් වන බැවින් රජයේ කිසිදු තනතුරක් දැරීම සඳහා එය අයිතිවාසිකමක් නොවේ.

සටහන :- මෙම සේවා සපයා ගැනීම සඳහා වන අයදුම්පත් මහනුවර මහා නගර සභාවේ වෙබ් අඩවියෙන් ද බාගත කරගත හැක. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට අවශ්‍ය සියලු සුදුසුකම් සපුරා තිබිය යුතු අතර සේවය ලබා ගැනීම සම්බන්ධයෙන් අවසාන තීරණය මහනුවර මහා නගර සභාවේ නාගරික කොමසාරිස් සතු වේ. අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුර කාල සීමාවේ දී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම, වෙනස් කිරීම, මෙම නිවේදනය අවලංගු කිරීම, මෙම නිවේදනය සංශෝධනය කිරීම සම්බන්ධ පූර්ණ අයිතිය මහනුවර මහා නගර සභාවේ නාගරික කොමසාරිස් සතුය.

කේ. කේ. ජී. අයි. ඩී. පී. විජේතිලක,
නාගරික කොමසාරිස්,
මහනුවර මහා නගර සභාව.

2023 නොවැම්බර් මස 16 වැනි දින.

11-591/1

මහනුවර මහා නගර සභාවේ මහජනාධාර දෙපාර්තමේන්තුව මගින් ආරම්භ කිරීමට නියමිත ඉංග්‍රීසි මාධ්‍ය පෙර පාසල සඳහා කොන්ත්‍රාත් පදනම මත සේවා සපයා ගැනීම

මහනුවර මහා නගර සභාවේ මහජනාධාර දෙපාර්තමේන්තුව මගින් ආරම්භ කිරීමට නියමිත ඉංග්‍රීසි මාධ්‍ය පෙර පාසල සඳහා ගුරුවරියක් වශයෙන් සේවය සැපයීමට උනන්දුවක් දක්වන සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. ඒ අනුව අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරෙ හි ඉංග්‍රීසි මාධ්‍ය පෙර පාසල් ගුරු නාමය සඳහන් කර **2023.12.15** දිනට ප්‍රථම නාගරික කොමසාරිස්, මහනුවර මහා නගර සභාව, මහනුවර යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

1. මිල දී ගැනීමට නියමිත සේවාව : පෙර පාසල් ගුරු සේවය ඉංග්‍රීසි මාධ්‍ය (කොන්ත්‍රාත් පදනම මත)

2. කායික සුදුසුකම් : අදාළ සේවාව ලබා දීමට ප්‍රමාණවත් තරම් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

3. දෛනික දීමනාව : දිනකට රු. 1,400.00 බැගින්

4. අධ්‍යාපන සුදුසුකම් : අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව හා තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථ සහිතව එකවර විෂයයන් හයකින් සමත් වීම;

හා

අ.පො.ස. (උසස් පෙළ) විභාගයෙන් අවම වශයෙන් විෂයයන් එකක්වත් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හා සාමාන්‍ය ඉංග්‍රීසි හැර) සමත් වී තිබීම.

* *සටහන.*- එම විභාගයන්හි දී චිත්‍ර කර්මය, සංගීතය, නැටුම් යන සෞන්දර්ය විෂයයන්ගෙන් සමත්වීම විශේෂ සුදුසුකමක් වනු ඇත.

5. වෘත්තීය සුදුසුකම් : පූර්ව පාඨශාලා අධ්‍යාපනය පිළිබඳව විවෘත විශ්වවිද්‍යාලයේ බාහිර සේවා මණ්ඩලය මගින් නිකුත් කරන පූර්ව පාසල් අධ්‍යාපනය පිළිබඳ ඩිප්ලෝමාව ;

හෝ

ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශයේ ළමා ලේකම් කාර්යාලය යටතේ ලියාපදිංචි කර ඇති ආයතන මගින් පිරිනමනු ලබන පෙර පාසල් ගුරු පුහුණු ඩිප්ලෝමාව ;

හෝ

මධ්‍යම පළාත් සභාවේ, මුල් ළමාවිය සංවර්ධන ඒකකය මගින් පිරිනමනු ලබන පෙර පාසල් ගුරු පුහුණු ඩිප්ලෝමාව ;

හෝ

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ අනුමත ආයතන මගින් පිරිනමනු ලබන පෙර පාසල් ගුරු පුහුණු ඩිප්ලෝමාව.

* ***සටහන.***- මෙම ඩිප්ලෝමා පාඨමාලාවේ කාල සීමාව අවම වශයෙන් වසරක් හෝ ඊට වැඩි විය යුතුය.

6. වෙනත් සුදුසුකම් : (i) ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතුය.

(ii) පූර්වාසන්න වසර 03 ක කාලය තුළ මහනුවර මහා නගර සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිය සහිත කාන්තා අයදුම්කාරියන් පමණක් අයදුම් කළ යුතුය.

(iii) අයදුම්කාරියන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

(iv) සේවය ලබා ගැනීම සඳහාවන සියලු සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින් ම සම්පූර්ණ කර තිබිය යුතුය.

7. වයස : සියලුම අයදුම්කාරියන් වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 35 ට නොවැඩි විය යුතුය.

8. තෝරා ගැනීමේ ක්‍රමය : සුදුසුකම්ලත් නිලධාරීන් පහත කොන්දේසිවලට යටත් ව තෝරා ගනු ලැබේ.

5. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින් ලබා ගන්නා ලද ලකුණුවල ප්‍රමුඛතාවය අනුව සේවය ලබා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවෙන් දළ වශයෙන් දෙගුණයක් පමණ ප්‍රායෝගික පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

6. ව්‍යුහගත පරීක්ෂණයේ හා ප්‍රායෝගික පරීක්ෂණයෙන් ඉහළම ලකුණු ලබා ගන්නා අයදුම්කාරියන් වසරක කාලයක් සඳහා තෝරා ගනු ලැබේ.

7. මෙම බඳවා ගැනීම හුදෙක් සේවා අවශ්‍යතාවය මත පමණක් වන බැවින් රජයේ කිසිදු නිත්‍ය තනතුරක් දැරීම සඳහා එය අයිතිවාසිකමක් නොවේ.

මෙම තනතුර සඳහා වන අයදුම්පත මහනුවර මහා නගර සභාවේ වෙබ් අඩවියෙන් ද බාගත කර ගත හැක. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට අවශ්‍ය සියලු සුදුසුකම් සපුරා තිබිය යුතු අතර සේවය ලබා ගැනීම සම්බන්ධයෙන් අවසාන තීරණය මහනුවර මහා නගර සභාවේ, නාගරික කොමසාරිස් සතුවේ. අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුර කාල සීමාවේ දී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම, වෙනස් කිරීම, මෙම නිවේදනය අවලංගු කිරීම, මෙම නිවේදනය සංශෝධනය කිරීම සම්බන්ධ පූර්ණ අයිතිය මහනුවර මහා නගර සභාවේ නාගරික කොමසාරිස් සතු ය.

කේ. කේ. ජී. අයි. ඩී. පී. විජේතිලක,
නාගරික කොමසාරිස්,
මහනුවර මහා නගර සභාව.

2023 නොවැම්බර් මස 16 වැනි දින.

11-591/2

පළාත් පාලන නිවේදන

කරන්දෙණිය ප්‍රාදේශීය සභාව

දියුණු කළ ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශයට පත්කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 134 (1) උප වගන්තියෙන් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාරව කරන්දෙණිය ප්‍රාදේශීය සභාවේ ලේකම් විසින් 2023 වර්ෂයේ ඔක්තෝබර් මස 18 වන දින තීරණ අංක 2023.10.18 216 යටතේ ගෙන ඇති පහත සඳහන් තීරණයට එකී පනතේ 134(1) උප වගන්තියෙන් පළාත් පාලන සහකාර කොමසාරිස් ලෙස කටයුතු කරනු ලබන සංදීපනී නිල්මිණි දම්මුල්ලගේ වන මවිසින් අනුමැතිය දෙන ලද බව මහජනයා වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

සංදීපනී නිල්මිණි දම්මුල්ලගේ,
පළාත් පාලන සහකාර කොමසාරිස්,
ගාල්ල.

2023 නොවැම්බර් මස 15 වැනි දින,
ගාල්ල පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයේ දී ය.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 134(1) වන වගන්තිය ප්‍රකාරව, කරන්දෙණිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි පහත උපලේඛනයේ විස්තර කර ඇති ග්‍රාම නිලධාරී, කොට්ඨාසවලින් සමන්විත ප්‍රදේශය දියුණු කළ ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශයට පත් කිරීමටත්, ඒ සඳහා ගාල්ල දිස්ත්‍රික් පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ/නියෝජ්‍ය පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතිය ලබා ගැනීමටත් තීරණය කරමි.

උපලේඛනය

අනු අංකය	*කොට්ඨාස අංකය*	*ග්‍රාම නිලධාරී කොට්ඨාසය*
1	39J	වල්ඉඟුරුකැටිය
2	39A	ඌරගස්මංහන්දිය උතුර
3	39	ඌරගස්මංහන්දිය දකුණ
4	39D	යටගල
5	39c	ඌරගස්මංහන්දිය නැගෙනහිර
6	41A	හිපන්කන්ද
7	41D	සිරිපුර
8	41c	ලේනගල්පලාත
9	39f	හල්ගහවෙල
10	41	මාගලඋතුර
11	95	මාගලදකුණ
12	95B	පෙහෙඹියකන්ද
13	95A	අගුළුගල්ල
14	92A	මඩකුඹුර
15	92f	මහඒදණ්ඩ
16	91	කරන්දෙණිය උතුර
17	91c	දංගහවිල
18	91A	කරන්දෙණිය දකුණ
19	91E	මහගොඩ
20	91f	එගොඩවෙල
21	92c	දිවියගහවෙල
22	92	බොරකන්ද
23	92E	කිරිනුගේ
24	93A	පහළ කිරිපේද්ද

අනු අංකය	*කොට්ඨාස අංකය*	*ග්‍රාම නිලධාරී කොට්ඨාසය*
25	93C	අඟනකැටිය
26	93B	ඉහළ කිරිපේද්ද
27	93D	ගලගොඩඅත්ත
28	93E	ජයබිම
29	93	කුරුඳුගහහැතැක්ම

11-569

ගාල්ල මහා නගර සභාව

2024 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීම

මහා නගර සභා ආඥා පනතේ 286 (අ) වගන්තිය පරිදි නාගරික කොමසාරිස් වන මා වෙත පැවරුන බලතල පරිදි, මාගේ 2023.10.04 දිනැති තීරණ අංක 2023/10/04 1182 ට අනුව පහත දැක්වෙන යෝජනා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

01. 2024 වර්ෂය සඳහා පනවන ලද වරිපනම් බදු මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30. දෙසැම්බර් 31 යන දින වලින් අවසන් වන සෑම කාර්තුවක් තුළ දී සමාන වාරික හතරකින් ගාල්ල මහා නගර සභා කාර්යාලයට ගෙවිය යුතු බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

02. 2024 වර්ෂය සඳහා වන සම්පූර්ණ වරිපනම් බදු 2024 වර්ෂයේ ජනවාරි මස 31 වැනි දින හෝ එදිනට පෙර ගාල්ල මහා නගර සභා කාර්යාලය වෙත ගෙවනු ලැබුවහොත් එම සම්පූර්ණ වරිපනම් බදු ප්‍රමාණයෙන් සියයට දහය (10%) ක වට්ටමක් ද එක් එක් කාර්තුවට අදළ වරිපනම් බදු ඒ එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දින හෝ එදිනට පෙර ගාල්ල මහා නගර සභාවට ගෙවනු ලැබුවහොත් ඒ එක් එක් කාර්තුවේ වරිපනම් බදු ප්‍රමාණයෙන් සියයට පහ (5%) ක වට්ටමක් ද ගෙවනු ලැබේ.

03. ඉහත සඳහන් කාල සීමාව තුළ දී වරිපනම් බදු නොගෙවන අදාළ මුඩු ඉඩම් හා වාසස්ථාන වෙනුවෙන් සියයට පහළොවක (15%) වරෙන්තු ගාස්තුවක් ද මුඩු ඉඩම් හා වාසස්ථාන නොවන අනෙකුත් දේපළ වෙනුවෙන් සියයට විස්ස (20%) ක වරෙන්තු ගාස්තුවක් ද අය කරනු ලැබේ.

ආර්. එම්. ටී. කේ. රස්නායක,
නාගරික කොමසාරිස්,
ප්‍රධාන විධායක නිලධාරී,
ගාල්ල මහා නගර සභාව.

2023 ඔක්තෝබර් 04 වැනි දින,
ගාල්ල මහා නගර සභා කාර්යාලයේ දී.

යෝජනාව

''252 වැනි අධිකාරිය වූ මහා නගර සභා ආඥා පනතේ 238 වැනි වගන්තිය (1) වැනි උප වගන්තියෙන් මහා නගර සභාව වෙත කරන ලද නියමය ප්‍රකාර, ගාල්ල මහ නගර සභා බල ප්‍රදේශ ඇතුළත පිහිටි සියලුම නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල හා කවර වූ හෝ ගෙවල්වල වාර්ෂික තක්සේරු වටිනාකම වශයෙන් 2023 වර්ෂය සඳහා පිළිගෙන තිබූ වාර්ෂික තක්සේරු වටිනාකම 2024 වර්ෂය සඳහා වූ තක්සේරු වටිනාකම වශයෙන් පිළිගැනීමටත්,

එකී, මහා නගර සභා ආඥා පනතේ 230 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් ගාල්ල මහා නගර සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර එකී දේපළ මත වාර්ෂික වටිනාකමින්,

(අ) නේවාසික ස්ථාන මත සියයට හත (7%) ක වරිපනම් බද්දක් ද, සහ

(ආ) වෙළඳ හෝ වාණිජ කාර්යය සඳහා පාවිච්චි කරනු ලබන ස්ථාන මත සියයට දෙළහක (12%) වරිපනම් බද්දක් ද,

(ඇ) අනෙකුත් සියලුම රජයේ දේපළ හිස් ඉඩම් සඳහා සියයට විසිදෙකක (22%) වරිපනම් බද්දක් ද, 2024 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්, සහ

ඒ වරිපනම් එකී මහා නගර සභා ආඥාපනතේ 230 වැනි වගන්තියේ (2) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ විධිවිධාන යටතේ 2024 මාර්තු මස 31, ජූනි මස 30, සැප්තැම්බර් මස 30 හා දෙසැම්බර් මස 31 වැනි දින වලින් අවසන් වන එක් එක් කාර්තුව අවසන් වීමට පෙර සමාන වාරික හතරකින් ගාල්ල මහා නගර සභාවට ගෙවීමට විධාන කිරීමටත් ගාල්ල මහා නගර සභාව යෝජනා කරන්නීය.

11-531

යාපනය මහ නගර සභාව

2024 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීම

යාපනය මහ නගර සභාවේ බලතල ක්‍රියාත්මක කරන අතර, කාර්යයන් සහ ක්‍රියාකාරකම් ඉටු කරන යාපනය මහ නගර සභාවේ නගරාධිපති තනබාලසිංගම් ජෙයසීලන් වන මම යාපනය මහනගර සභා ආඥා පනතේ 286 අ වගන්තියත් සමඟ කියවිය යුතු එකී පනතේ 230(1) වගන්තියේ විධිවිධාන අනුව යාපනය මහ නගර සභාවේ බල ප්‍රදේශයට 2024 වසර සඳහා වරිපනම් බදු අය කිරීම පහත පරිදි විය යුතු යැයි තීරණය කරමි. එනම්,

මහ නගර සභා ආඥා පනතේ 238 වගන්තියේ (1) උප වගන්තිය යටතේ යාපනය මහනගර සභාවට ලැබී ඇති බලතල භාවිතා කොට මහනගර සභා බල ප්‍රදේශය තුළ පිහිටා ඇති සියලුම නිවාස, ගොඩනැගිලි, ඉඩම් සහ ඉදිකිරීම්වල, වාර්ෂික වටිනාකම, 2023 වර්ෂය සඳහා කල තක්සේරු කිරීම/තක්සේරුව 2024 වර්ෂය සඳහා තක්සේරු කිරීම/තක්සේරුවක් ලෙස සැලකිය යුතු බවත්, මෙම තක්සේරු කිරීමේ පදනම මත, මහ නගර සභා ආඥාපනතේ 286(අ) වගන්තියත් සමඟ කියවිය යුතු එකී පනතේ 230(1) වගන්තියේ විධිවිධාන අනුව මා හට ලබා දී ඇති බලතල භාවිතා කොට එකී දේපලවලින් හිස් ඉඩම් සහ නිවාස සඳහා වාර්ෂික වටිනාකමෙන් 8% ක් හා වෙළඳ මධ්‍යස්ථානවලින් වාර්ෂික වටිනාකමෙන් 10% වාර්ෂික වරිපනම් බද්දක් ලෙස අය කළ යුතු බවත්, තවද, 2024 වර්ෂයේ දී පහත වගුවේ දක්වා ඇති සෑම කාර්තුවකට ම අදාළ ව ඉදිරියෙන් සඳහන් කොට ඇති දිනයට පෙර එසේ අය කරනු ලබන වාර්ෂික වරිපනම් යාපනය මහ නගර සභාවේ අරමුදලට ගෙවිය යුතු බවත්, එලෙස වාර්ෂික වරිපනම් බද්ද 2024 ජනවාරි 31 වැනි දිනට හෝ ඊට පෙර සම්පූර්ණයෙන් ගෙවන්නේ නම්, වාර්ෂික වරිපනම් මුදලින් සියයට දහයක (10%) වට්ටමක් ද, පහත වගුවේ සෑම කාර්තුවකට ම ඉදිරියෙන් තුන්වන තීරුවේ දක්වා ඇති දිනට පෙර අදාළ වරිපනම් බදු ප්‍රමාණය යාපනය මහ නගර සභාවේ අරමුදලට ගෙවන්නේ නම්, එම කාර්තුමය මුදලින් 5% වට්ටමක් යාපනය මහ නගර සභාව විසින් ගෙවනු ලබන බවත්, අදාළ කාලසීමාව තුළ ගෙවීම් සිදු නොකළහොත්, හිස් ඉඩම් සහ නිවාස සඳහා 15% (සියයට පහළොවක්) සහ අනෙකුත් සියලුම ස්ථානවලින් 20% (සියයට විස්සක) වරෙන්තු ගාස්තුවක් අය කළ යුතු බවටත් මම තීරණය කරමි.

තනබාලසිංගම් ජෙයසීලන්,
නගරාධිපති,
මහනගර සභාව,
යාපනය.

	කාර්තුව	*ගෙවිය යුතු දිනය*	*5% වට්ටමක් ලබා ගත හැකි අවසන් දිනය*
01	පළමු කාර්තුව	2024.01.01 - 2024.03.31	2024.01.31
02	දෙවන කාර්තුව	2024.04.01 - 2024.06.30	2024.04.30
03	තුන්වන කාර්තුව	2024.07.01 - 2024.09.30	2024.07.31
04	සිව්වන කාර්තුව	2024.10.01 - 2024.12.31	2024.10.31

11-530

අම්බලන්ගොඩ ප්‍රාදේශීය සභාව

දියුණු කළ ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශයට පත් කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 134(1) උප වගන්තියෙන් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාරව, අම්බලන්ගොඩ ප්‍රාදේශීය සභාවේ ලේකම් විසින් 2023 වර්ෂයේ ඔක්තෝබර් මස 18 වන දින තීරණ අංක 2023/10/18/415 යටතේ ගෙන ඇති පහත සඳහන් තීරණයට එකී පනතේ 134(1) උප වගන්තියෙන් පළාත් පාලන සහකාර කොමසාරිස් වෙත ලැබී ඇති බලතල ප්‍රකාරව ගාල්ල පරිපාලන දිස්ත්‍රික්කයේ පළාත් පාලන සහකාර කොමසාරිස්/නියෝජ්‍ය පළාත් පාලන කොමසාරිස් ලෙස කටයුතු කරනු ලබන සංදීපනී නිල්මිණි දම්මුල්ලගේ වන මා විසින් අනුමැතිය දෙන ලද බව මහජනයා වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

සංදීපනී නිල්මිණි දම්මුල්ලගේ,
පළාත් පාලන සහකාර කොමසාරිස් - ගාල්ල.

2023 නොවැම්බර් මස 13 වැනි දින,
ගාල්ල පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයේ දී ය.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) වගන්ති ප්‍රකාරව පහත උපලේඛනයේ විස්තර කර ඇති අම්බලන්ගොඩ ප්‍රාදේශීය සභාවේ සමස්ථ බල ප්‍රදේශයම දියුණු කළ ප්‍රදේශයන් වශයෙන් ප්‍රකාශයට පත් කිරීමටත්, ඒ සඳහා පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ අනුමැතිය ලබා ගැනීමට තීරණය කරමි.

උපලේඛනය

උතුරට - හල්වතුර ගඟට වැටෙන පල්ලේතොට ඇළ මධ්‍ය ලක්ෂයේ සිට එම ගඟ දිගේ ගොස් ගොඩහේන - තල්ගස්ගොඩ ප්‍රධාන මාර්ගය හරහා ඇති බෝක්කුව ඔස්සේ ගොස්, නාගස්කැළේ ඇලන්ඩේල් හා බිෂොප් වතුවල බස්නාහිර මායිම ඔස්සේ, අම්බලන්ගොඩ (තල්ගස්ගොඩ හරහා) බටපොල ප්‍රධාන මාර්ගය කැපී ගොස්, නැවත බිෂොප් වත්තේ බටහිර මායිම්ව ඉදිකැටිය වත්ත හා ඉදිකැටිය තුඩුව උතුර - බටහිර මායිමෙන් බෙන්වල ඇලට වැටී, බෙන්වල ඇළ මායිමේ, එතැන් සිට නැගෙනහිර දෙසට 15 ක් ගොස් ගම්සභා පාරට වැටී එම ලක්ෂයේ සිට අඟල් 99 ක් ගිනිකොන දෙසට ගම්සභා ඔස්සේ ගොස් බටපොල කුරුදුගහ මාර්ගයට යාවී,

නැගෙනහිරට - එතැන් සිට දම්වැල් 30 ක් බටපොල කුරුදුගහ පාරේ ඊසාන දිගට ගොස් එතැන් සිට එම ලක්ෂයේ සිට දම්වැල් 270 ක් වැල්ලබඩපත්තුව නැගෙනහිරට මායිම දිගේ ගොස්, බටපොල අම්පෙගම ප්‍රධාන මාර්ගය කැපෙන ලක්ෂ්‍යය තෙක් ද, එතැන් සිට දම්වැල් 105ක් දකුණු දෙසට අළුත්වල අම්පේගම මහා මාර්ගය කැපෙන ලක්ෂ්‍යය තෙක් ද දම්වැල් 70 ක් ගිනිකොන දිසාවට ද දම්වැල් 50 ක් නිරිත දිගටද ගොස් හික්කඩුව බද්දේගම මාර්ගයේ සිට රත්මැහැර වත්තට යන පාර දිගේ දම්වැල් 52 කින් හමුවන පාරේ ලක්ෂ්‍යයට වැටී එතැන් සිට රත්මැහැර වත්ත පාර දිගේ මධ්‍යය රේඛාව ඔස්සේ දම්වැල් 52ක් දකුණු දෙසට ගොස් එම රත්මැහැර හංදියේ සිට මාපුවාන කෙරෙදේවලට යන පාරේ දම් වැල් 2 ක් දුරින් පාරට උතුරින් සමාන්තරව දම්වැල් 30 ක් ගොස් එතැන් සිට දකුණු දෙසට දම්වැල් 120 ක් කෙලින්ම ගොස් සඳඋඩුවැල්ල හන්දිය පාලමට වැටී එතැන් සිට,

දකුණට - ඉහත කී ලක්ෂ්‍යයේ සිට දම්වැල් 85 ක් බස්නාහිර දෙසට සේරි වත්ත හරහා ගොස් කුමාරකන්ද - ඇල්පිටිය ප්‍රධාන මාර්ගයේ 3 වැනි කිලෝමීටර් කණුව අසල වල්ලපට්ට ඇළේ බෝක්කුව දක්වා ගොස්, එතැන් සිට වල්ලපට්ට ඇළ ඔස්සේ සහ පතන ඇළ ඔස්සේ ද ගොස්, පතන නාරිගම මාර්ගය පතන සිට දම්වැල් 16 ක් දකුණු දෙසට ගොස් හමුවන මධ්‍යය ලක්ෂ්‍යයට යාවී, එම පාර මධ්‍ය ලක්ෂ්‍යය සිට වයඹ දෙසට පුංචි පතනනාරිගම පාරේ පුංචිපතන සිට දම්වැල් 21 කින් ඇති ලක්ෂ්‍යයට යාවී එම පාර දිගේ දම්වැල් සමාන්තරව හික්කඩුව - බද්දේගම පාරට බටහිරින් ගොස්, හික්කඩුව බද්දේගම පාර කැපී එයට පසු,

බස්නාහිරට - ඉහත කී ලක්ෂ්‍ය සිට උතුරු දෙසට දම්වැල් 30 කින් හික්කඩුව ගඟ හමු වී එතැන් සිට ඒදණ්ඩ ඇළ දිගේ ද, කිරලාන ඇළ දිගේ ද, උතුරට ගොස් රංගල් ඇළ හා තෙල්වත්ත ඇළ මධ්‍ය රේඛාව ඔස්සේ උතුරු දෙසට ගොස් දම්වැල් 30 ක් උතුරු දෙසට බත්තරමුල්ල ඇළට යාවී, එතැන් සිට බෝයගොඩ ඇළ දිගේ ගොස්, මුංගල ඇළ ඔස්සේ හරංගල පාරට වැටී, එතැන් සිට දම්වැල් 3ක් එම පාර ඔස්සේ උතුරට ගොස් එතැන් සිට ජූල්ගහ කන්දේ නැගෙනහිර හා දකුණු මායිම් ඔස්සේ මීටියාගොව - කහව මාර්ගයට වැටී, එතැන් සිට දම්වැල් 55ක් උතුරු දෙසට අම්බලන්ගොඩ - මීටියාගොඩ මහා මාර්ගයේ, ගලගොඩහන්දියේ සිට මීටියාගොඩ දෙසට දම්වැල් 65 කින් ඇති ලක්ෂ්‍යයට යාවී එම ලක්ෂයේ සිට ගලගොඩ හන්දියට එම පාර මධ්‍ය රේඛාව දිගේ දම්වැල් 65ක් එයට පසු දම්වැල් 135 ක් ගලගොඩ - රොන්නවුව මාර්ගයේ උතුරු දෙසට ගොස් මාදම්පේ ගඟ කැපී, දෙල්වුව වූපත පිටවන සේ මාදම්පාගඟ දිගේ ගොස් හල්වතුර ගඟ මධ්‍ය ලක්ෂ්‍යයට යාවී එම හල්වතුර ගඟේ මධ්‍ය ලක්ෂ්‍යය දිගේ මුලින් කී අරම්භක ලක්ෂ්‍යයට යාවිය යුතුය.

11-521

ජාඇල ප්‍රාදේශීය සභාව

2024 වර්ෂයට අදාළව වරිපනම් බදු පැනවීම

ජාඇල ප්‍රාදේශීය සභාවේ, බලතල, කාර්යය කර්තව්‍ය, ක්‍රියාත්මක කරන ජා-ඇල ප්‍රාදේශීය සභාවේ ලේකම් එල්. ඩබ්. එල්. කේ. ධර්මසේන වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 134 (1) වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව ජා-ඇල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2024 වර්ෂයට අදාළව වරිපනම් බදු නියම කිරීම 2023.11.22 දින තීරණ පොතේ තීරණ අංක 1339 යටතේ පහත සඳහන් තීරණය ගන්නට යෙදුනු බව මෙයින් නිවේදනය කරමි. එනම්,

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වන වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ ජාඇල ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 453/6 හා 1987.05.12 දිනැති *අතිවිශෙෂ ගැසට් පත්‍රය*

මගින් ජාඇල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය දියුණු කළ ප්‍රදේශ යැයි ප්‍රකාශයට පත් කර ඇත්තා වූ කඳාන සහ දඩුගම උප කාර්යාල බල ප්‍රදේශය තුළ පිහිටියා වූ නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල, ගෙපත්වල වාර්ෂික වටිනාකම සඳහා 2019 වර්ෂයේ ආරම්භ කර 2023 වර්ෂයේ අවසාන කරන ලද තක්සේරු ප්‍රතිශෝධන වාර්තාව අනුව වාර්ෂික වටිනාකම 2024 වර්ෂය සඳහා තක්සේරුව ලෙස පිළිගැනීමටත්,

ජා ඇල ප්‍රාදේශීය සභාවේ රාගම උපකාර්යාල බල ප්‍රදේශය ඇතුළත විශේෂ දේපළ ලෙස හඳුනාගත් නිවාස, ගොඩනැගිලිවල, ගෙපත්වල වාර්ෂික වටිනාකම් සඳහා 2019 වර්ෂයේ ආරම්භ කර 2023 වර්ෂයේ අවසාන කරන ලද තක්සේරු ප්‍රතිශෝධන වාර්තාව අනුව වාර්ෂික වටිනාකම 2024 වර්ෂය සඳහා තක්සේරුව ලෙස පිළිගැනීමටත්,

ජාඇල ප්‍රාදේශීය සභාවේ බටුවත්ත, නිවන්දම උපකාර්යාල බල ප්‍රදේශයේ පිහිටියා වූ නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල, ගෙපත්වල සහ රාගම උපකාර්යාල බල ප්‍රදේශය තුළ විශේෂ දේපල ලෙස හඳුනාගත් දේපළ හැර නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල, ගෙපත්වල වාර්ෂික වටිනාකම සඳහා 2002 වර්ෂය සඳහා වූ තක්සේරුව 2024 වර්ෂය සඳහා තක්සේරුව ලෙස සම්මත කළ යුතු බවටත්,

එකී තක්සේරුව මත 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමඟ කියවිය යුතු 134(1) උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව එකී දේපළ මත ඉහත කී තක්සේරු සඳහා 2022.12.28 දින ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ප්‍රකාරව වාර්ෂික වටිනාකමින්, සියයට දහයක (10%) වාර්ෂික බද්දක් නියම විය යුතු බවටත්,

තව ද, 2024 වර්ෂයේ දී පහත උපලේඛනයෙහි සඳහන් එක් එක් කාර්තුව වෙනුවෙන් ඉදිරියෙන් නිරූපිත දිනයට පෙර එසේ නියම කරන ලද වාර්ෂික වරිපනම් බද්ද ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවිය යුතු බවටත්, එලෙස වාර්ෂික වරිපනම් බද්ද 2024 වර්ෂයෙහි ජනවාරි මස 31 වැනි දින හෝ ඊට ප්‍රථම ගෙවන්නේ නම් වාර්ෂික වරිපනම් බද්දේ ප්‍රමාණයෙන් සියයට දහයක (10%) වට්ටමක් ද, එකී උපලේඛනයෙහි එක් එක් කාර්තුව ඉදිරියෙහි III වැනි තීරුවේ නිරූපිත දිනයට පෙර අදාළ වරිපනම් බදු මුදල ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවනු ලබන්නේ නම්, එම කාර්තුවට අදාළ මුදලින් සියයට පහක (5%) ක වට්ටමක් ද ප්‍රාදේශීය සභාව ලබා දිය යුතු බවටත් මම තීරණය කරමි.

එල්. ඩබ්. එල්. කේ. ධර්මසේන,
ලේකම් හා ප්‍රාදේශීය සභාවේ බලතල කාර්ය,
කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිළධාරී,
ජාඇල ප්‍රාදේශීය සභාව, කඳාන.

2023 නොවැම්බර් 22 වැනි දින,
ජා-ඇල ප්‍රාදේශීය සභාව, කඳාන.

උපලේඛනය

I වැනි තීරුව	*II වැනි තීරුවේ*	*III වැනි තීරුවේ*
කාර්තුව	*ගෙවිය යුතු අවසන් දිනය*	*5% වට්ටම් සඳහා හිමිකම් ලබන අවසාන දින*
පළමුවන කාර්තුව	2024 මාර්තු මස 31	2024 ජනවාරි මස 31
දෙවන කාර්තුව	2024 ජූනි මස 30	2024 අප්‍රේල් මස 30
තුන්වන කාර්තුව	2024 සැප්තැම්බර් මස 30	2024 ජූලි මස 31
හතරවන කාර්තුව	2024 දෙසැම්බර් මස 31	2024 ඔක්තෝබර් මස 31

11-631

නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව

විෂය භාර අමාත්‍යවරයාගේ විධානය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තියෙන් බලතල ක්‍රියාත්මක කරන කාර්ය කර්තව්‍ය ඉටුකරන නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා විසින් අළුත් තක්සේරුවක් හෝ සත්‍යෝක්ෂණයක් කිරීමට 1987 අංක 15 ප්‍රාදේශීය සභා පනතේ 146(1) වන වගන්තිය ප්‍රකාරව පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයාගේ විධානය ලබා ගත යුතු බවට තීරණය කර ඇත.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146(1) වගන්තිය ප්‍රකාරව නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දියුණු කල ප්‍රදේශය ඇතුළත පිහිටියා වූ දේපළ මත අළුත් තක්සේරුවක් කිරීමට 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමඟ කියවිය යුතු 1987 අංක 15 ප්‍රාදේශීය සභා පනතේ 146(1) වන වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව, උතුරුමැද පළාත් ආණ්ඩුකාරවර මහීපාල හේරත් වන මා විසින් නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාවේ වරිපනම් දේපළ මත අළුත් තක්සේරුවක් හා සත්‍යෝක්ෂණයක් සඳහා විධානය කරනු ලබන්නේය.

මහීපාල හේරත්,
ආණ්ඩුකාරවර,
පළාත් පාලන විෂය භාර අමාත්‍ය,
උතුරුමැද පළාත.

2023 අගෝස්තු මස 16 වැනි දින,
උතුරුමැද පළාත් ආණ්ඩුකාරවර කාර්යාලය.

11-568/1

නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව

වරිපනම් ප්‍රතිශතය සඳහා අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය මත කියවිය යුතු එම පනතේ 134(1) උපවගන්තියෙන් ලේකම් වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දියුණුකළ ප්‍රදේශය තුළ පිහිටියා වූ දේපල මත වාර්ෂික වටිනාකමින් සියයට තුනක (3%) වාර්ෂික වරිපනම් බද්දක් පනවා අය කිරීම සඳහා නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන කාර්ය කර්තව්‍ය ඉටුකරන නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාවේ ලේකම් ජේ. ඒ. එස්. උදයසිරි ගෙන ඇති තීරණය අනුමත කරනු ලබන්නේ ය.

මහීපාල හේරත්,
ආණ්ඩුකාරවර,
පළාත් පාලන විෂය භාර අමාත්‍ය,
උතුරුමැද පළාත.

2023 අගෝස්තු මස 16 වැනි දින,
උතුරුමැද පළාත් ආණ්ඩුකාරවර කාර්යාලය.

11-568/2

මාතර මහා නගර සභාව

2024 අයවැය ලේඛනය

2024 වර්ෂය සඳහා ඇස්තමේන්තු කරන ලද ආදයම් හා වියදම් ඇතුළත් කෙටුම්පත් අයවැය ලේඛනය මාතර මහා නගර සභා කාර්යාලයේ දී මහජනතාවගේ පරීක්ෂාව සඳහා 2023.11.24 දින සිට දින හතක (07) කාලයක් විවෘතව තබන බව මහා නගර සභා ආඥාපනතේ (252 අධිකාරය) 212 (ආ) වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

කාංචනා කේ. තල්පාවිල,
නාගරික කොමසාරිස්,
මාතර මහ නගර සභාව.

2023 නොවැම්බර් මස 15 වැනි දින,
මාතර මහා නගර සභා කාර්යාලයේ දී ය.

11-574

වැලිමඩ ප්‍රාදේශීය සභාව

2024 අයවැය කෙටුම්පත සම්බන්ධව බල ප්‍රදේශයේ පුරවැසියන් සඳහා සිදු කරනු ලබන නිවේදනයයි

අංක 2199/25 දරන 2020 ඔක්තෝබර් මස 29 වැනි දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික *ගැසට් පත්‍රයේ අතිවිශෙෂ* නිවේදනය හා බැඳේ.

එහි රීති 10(2)(ආ) වගන්තිය යටතේ 2024 වර්ෂය සඳහා වැලිමඩ ප්‍රාදේශීය සභා බල සීමාව ආවරණය වන පරිදි වැලිමඩ ප්‍රාදේශීය සභාව විසින් සැකසූ අයවැය කෙටුම්පත පරීක්ෂා කර බැලීම සඳහා මහජනතාවට අවස්ථාව ලබා දෙනු ලබන බව මෙයින් දන්වා සිටිමි.

ලේකම්,
ප්‍රාදේශීය සභාව,
වැලිමඩ.

11-560

හපුතලේ නගර සභාව

2024 වර්ෂයේ කෙටුම්පත් අයවැය ලේඛනය මහජනතාවට පරීක්ෂා කර බැලීම සඳහා අවස්ථාව සැලසීම

255 වන අධිකාරිය වන නගර සභා ආඥාපනතේ 178 වගන්තියෙන් නියම කර ඇති පරිදි හා එම පනතේ 193 වන වගන්තියෙන් ලැබී ඇති බලතල ප්‍රකාරව ගරු ඌව පළාත් ආණ්ඩුකාරතුමා විසින් 2020.10.29 දින *ගැසට් පත්* අංක 2199/25 මගින් ප්‍රසිද්ධියට පත්කරන ලද 2020 නගර සභා අයවැය සම්පාදනය හා බලාත්මක කිරීමේ රීති අංක 10(2) (ආ) ප්‍රකාරව හපුතලේ නගර සභාව විසින් 2024 වර්ෂය වෙනුවෙන් ඉදිරිපත් කිරීමට නියමිත කෙටුම්පත් අයවැය ලේඛනය 2023.11.17 දින සිට හපුතලේ නගර සභා කාර්යාලයේ දී මහජනතාවට පරීක්ෂා කර බැලීම සඳහා අවස්ථාව සළසා ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩබ්. එච්. සී. නිශාන්ති,
ලේකම් (වැ. බ.),
නගර සභාව,
හපුතලේ.

2023 නොවැම්බර් මස 15 වැනි දින.

11-542

දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභාව

2024 වර්ෂයේ කෙටුම්පත් අයවැය ලේඛනය මහජනතාවට පරීක්ෂා කර බැලීම සඳහා තබා ඇති බව දැනුම් දීමයි

දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභාවේ 2024 වර්ෂයට අදළව කෙටුම්පත් අයවැය ලේඛනය 2023 නොවැම්බර් 24 වැනි දින සිට 2023 දෙසැම්බර් 01 වැනි දින තෙක් (රජයේ නිවාඩු දින හා ඉරිදු දින හැර) කාර්යාල වේලාව තුළ මහජනයාට පරීක්ෂා කර බැලීම සඳහා දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී හා දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභා මහජන පුස්තකාලයේ තබා ඇති බව මහජනතාව වෙත මෙයින් දැනුම් දෙමි.

අයි. ජී. එස්. සී. කුමාරි,
ලේකම්,
දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභාව.

11-533

මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව

වරිපනම් දේපළ මත අලුත් තක්සේරුවක් හා සත්‍යාක්ෂණයක් සඳහා විධානය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තියෙන් බලතල ක්‍රියාත්මක කරන කාර්ය කර්තව්‍ය ඉටුකරන මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා විසින් අලුත් තක්සේරුවක් හෝ සත්‍යාක්ෂණයක් කිරීමට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146(1) වන වගන්තිය ප්‍රකාරව පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයාගේ විධානය ලබා ගත යුතු බවට 2023.05.17 දිනැති එන්සීපී/2023/05/17/10 අංක යටතේ තීරණය කර ඇත.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146(1) වගන්තිය ප්‍රකාරව මධ්‍යම නුවරගම් පළාත බල ප්‍රදේශයේ දියුණු කල ප්‍රදේශය ඇතුළත පිහිටියා වූ දේපළ මත අලුත් තක්සේරුවක් හා සත්‍යාක්ෂණයක් කිරීමට 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමඟ කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146(1) වන වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව, උතුරුමැද පළාත් ආණ්ඩුකාරවර මහීපාල හේරත් වන මා විසින් මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය සභාවේ වරිපනම් දේපළ මත අලුත් තක්සේරුවක් හා සත්‍යාක්ෂණයක් සඳහා විධානය කරනු ලබන්නේය.

මහීපාල හේරත්,
ආණ්ඩුකාරවර,
පළාත් පාලන විෂය භාර අමාත්‍ය,
උතුරුමැද පළාත.

2023 අගෝස්තු මස 16 වැනි දින,
උතුරුමැද පළාත් ආණ්ඩුකාරවර කාර්යාලය.

11-508

නෙළුව ප්‍රාදේශීය සභාව

දියුණු කළ ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශයට පත්කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 134 (1) උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාරව නෙළුව ප්‍රාදේශීය සභාවේ ලේකම් විසින් 2023 වර්ෂයේ සැප්තැම්බර් මස 22 වන දින තීරණ අංක 2023/09/22(1) යටතේ ගෙන ඇති පහත සඳහන් තීරණයට එකී පනතේ 134(1) උප වගන්තියෙන් පළාත් පාලන සහකාර කොමසාරිස් වෙත ලැබී ඇති බලතල ප්‍රකාරව ගාල්ල පරිපාලන දිස්ත්‍රික්කයේ පළාත් පාලන සහකාර කොමසාරිස ලෙස කටයුතු කරනු ලබන සන්දීපනී නිල්මිණි දම්මුල්ලගේ වන මවිසින් අනුමැතිය දෙන ලද බව මහජනයා වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

සන්දීපනී නිල්මිණි දම්මුල්ලගේ,
පළාත් පාලන සහකාර කොමසාරිස්,
ගාල්ල.

2023 ඔක්තෝබර් මස 16 වැනි දින,
ගාල්ල පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයේ දී ය.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) වගන්තිය ප්‍රකාරව සභාවට ලැබී ඇති බලතල යටතේ නෙළුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි පහත උපලේඛනයේ විස්තර කෙරෙන ප්‍රදේශය සඳහා උපරිම මට්ටමෙන් සේවා ව්‍යාප්ත කිරීමට නෙළුව ප්‍රාදේශීය සභාව කටයුතු කර ඇති හෙයින්, එම ප්‍රදේශය දියුණු කළ ප්‍රදේශයක් ලෙස පිළිගත යුතු බවටත්, එම තීරණයට ගාල්ල දිස්ත්‍රික් නියෝජ්‍ය පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ අනුමැතිය ලබාගත යුතු බවටත්, උක්ත ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව තීරණය කරමි.

උපලේඛනය - (1) 230 නෙළුව ග්‍රාම නිලධාරී කොට්ඨාශය

11-629

අක්මීමන ප්‍රාදේශීය සභාව

ගාල්ල පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය

දියුණු කළ ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශයට පත් කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 134 (1) උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාරව අක්මීමන ප්‍රාදේශීය සභාවේ ලේකම් විසින් 2023 වර්ෂයේ නොවැම්බර් මස 07 වන දින තීරණ අංක 84 යටතේ ගෙන ඇති පහත සඳහන් තීරණයට එකී පනතේ 134(1) උප වගන්තියෙන් පළාත් පාලන සහකාර කොමසාරිස් ලෙස කටයුතු කරනු ලබන සංදීපනී නිල්මිණී දම්මුල්ලගේ වන මවිසින් අනුමැතිය දෙන ලද බව මහජනයා වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

සංදීපනී නිල්මිණී දම්මුල්ලගේ,
පළාත් පාලන සහකාර කොමසාරිස්,
ගාල්ල.

2023 නොවැම්බර් මස 15 වැනි දින,
ගාල්ල පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයේ දී ය.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) වගන්තිය ප්‍රකාරව අක්මීමන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි පහත උපලේඛනයේ විස්තර කර ඇති ග්‍රාම නිලධාරී කොට්ඨාසවලින් සමන්විත ප්‍රදේශය දියුණු කළ ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශයට පත් කිරීමටත්, ඒ සඳහා ගාල්ල දිස්ත්‍රික් පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ අනුමැතිය ලබා ගැනීමටත්, ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය ප්‍රකාරව තීරණය කරමි.

උපලේඛනය

අනු. අංකය	*කොට්ඨාස අංකය*	*ග්‍රාම නිලධාරී කොට්ඨාසය*
1	109ඒ	ඉහළගොඩ නැගෙනහිර
2	110ඒ	පින්නදූව
3	112ඒ	වලහන්දූව
4	152	පිලාන
5	112	මානවිල
6	109බී	ඉහළගොඩ දකුණ
7	113බී	නුගදූව
8	134ඩී	බඹරගොඩ
9	135බී	මැළැගොඩ
10	130ඊ	අම්බලන්වත්ත

11-583

ජා ඇල නගර සභාව

වරිපනම් බදු පැනවීම - 2024 වර්ෂය

ජා ඇල නගර සභාවේ බලතල කාර්ය කර්තව්‍ය ඉටු කරන ජා ඇල නගර සභාවේ ලේකම් ඩී. පී. එච්. සමරවික්‍රම වන මම, නගර සභා ආඥාපනතේ (255 වන අධිකාරය) 184 (අ) වැනි වගන්තිය සමඟ කියවිය යුතු 160(1) වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව ජා ඇල නගර සභා බල ප්‍රදේශය සඳහා 2024 වර්ෂයට අදාළව වරිපනම් බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු යැයි මම තීරණය කරමි.

එනම් නගර සභා ආඥාපනතේ 255 වන අධිකාරය වන නගර සභා ආඥාපනතේ 184(අ) වැනි වගන්තිය සමඟ කියවිය යුතු 160(1) වැනි වගන්තිය යටතේ අතුරු ව්‍යවස්ථා සමඟ නියම කරනු ලැබිය හැකි, සීමා කිරීම් හා නිදහස් කිරීම්වලට යටත් ව ජා ඇල නගර සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ජා ඇල නගර සභා බල ප්‍රදේශය තුළ පිහිටියා වූ නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල ගෙපත්වල 2023 වාර්ෂික වටිනාකම සඳහා 2016 වර්ෂයේ දී සිදු කරන ලද තක්සේරුව 2024 වර්ෂය සඳහා පිළිගැනීමටත්,

එකී තක්සේරුව වන 255 වන අධිකාරය වන නගර සභා ආඥාපනතේ 184(අ) වගන්තිය හා 166 වන වගන්තිය සමග කියවිය යුතු මහ නගර සභා ආඥාපනතේ 233 සිට 241 වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව ඉහත කී වාර්ෂික වටිනාමෙන් සියයට තුනක (3%) නේවාසික ස්ථාන සඳහා ද, සියයට දහයක් (10%) ව්‍යාපාරික ස්ථාන සඳහා ද වාර්ෂික වරිපනම් බද්දක් ලෙස අයකළ යුතු බවත්,

මෙම වරිපනම් බදු කාර්තුව අවසාන වන දින හෝ ඊට පෙර නොගෙවනු ලැබුවහොත් ගෘහස්ථ, මුඩු ඉඩම් සඳහා 15% ක අධි ගාස්තුවක් ද ගෘහස්ථ හා මුඩු ඉඩම් නොවන දේපළ සඳහා 20% ක අධි ගාස්තුවක් ද අය කිරීමටත්,

2024 වර්ෂයෙහි පහත උපලේඛනයෙහි සඳහන් එක් එක් කාර්තුව වෙනුවෙන් ඉදිරියෙන් නිරූපිත දිනයට පෙර එසේ නියම කරන ලද වාර්ෂික වරිපනම් බද්ද ජා ඇල නගර සභා අරමුදලට ගෙවිය යුතු බවටත්, එලෙස වාර්ෂික වරිපනම් බද්ද 2024 වර්ෂයෙහි ජනවාරි මස 31 වැනි දින හෝ ඊට ප්‍රථම ගෙවන්නේ නම් වාර්ෂික වරිපනම් බද්දේ ප්‍රමාණයෙන් සියයට (10%) ක වට්ටමක්ද, එකී උපලේඛනයෙහි එක් එක් කාර්තුව ඉදිරියේ තුන්වන තීරුවේ නිරූපිත දිනයට පෙර අදාල වරිපනම් බදු මුදල ජාඇල නගර සභා අරමුදලට ගෙවනු ලබන්නේ නම් එක කාර්තුවකට අදළ මුදලින් 5% ක වට්ටමක් ද ජා ඇල නගර සභාව ලබා දිය යුතු බවටත්, තීරණය කරමි.

උපලේඛනය

I තීරුව *කාර්තුව*	*II තීරුව* *ගෙවිය යුතු දිනය*	*III තීරුව* *5% වට්ටම සඳහා හිමිකම් ලබන අවසාන දිනය*
පළමු කාර්තුව	2024.03.31	2024.01.31
දෙවන කාර්තුව	2024.06.30	2024.04.30
තුන්වන කාර්තුව	2024.09.30	2024.07.31
හතරවන කාර්තුව	2024.12.31	2024.10.31

ඩී. පී. එච්. සමරවික්‍රම,
ලේකම් හා සභාවේ බලතල කාර්යය, කර්තව්‍ය
ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
ජා ඇල නගර සභාව.

2023 නොවැම්බර් මස 13 වැනි දින,
ජා ඇල - ජා ඇල නගර සභාවේ දී ය.

11-496

කුරුණෑගල මහා නගර සභාව

2024 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීම

කුරුණෑගල මහා නගර සභාව විසින් 2023 වර්ෂයේ ඔක්තොබර් මස 31 වැනි දින OFMC/08/2023/10/31/MAR/A1 දරන තීරණ අංකය යටතේ පහත දැක්වෙන යෝජනාව අනුමත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

මහා නගර සභා ආඥාපනතේ (252 අධිකාරය) 286(අ) වගන්තිය යටතේ නාගරික කොමසාරිස්ට පවරා ඇති බලතල මත)

එම්. ඒ. බී. සී. ආලෝක බංඩාර,
නාගරික කොමසාරිස්,
මහා නගර සභාව,
කුරුණෑගල.

2023 වර්ෂයේ නොවැම්බර් මස 10 වැනි දින,
කුරුණෑගල මහා නගර සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

252 වන අධිකාරය වූ මහා නගර සභා ආඥාපනතේ 238 වන වගන්තියේ (1) වන උපවගන්තියේ මහ නගර සභා වෙත කරන ලද නියමය ප්‍රකාර කුරුණෑගල මහා නගර සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටි සියලුම නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල හා කවර වූ දේපළක වාර්ෂික තක්සේරු වටිනාකමින් අය කිරීමේ ප්‍රතිශතය, වයඹ පළාත් ගරු ආණ්ඩුකාරවර, ලේකම්ගේ අංක NWP/GOV/AD/08/45/6-VII ලිපිය මගින් අනුමත කරන ලද තක්සේරු වටිනාකම් ප්‍රතිශතය, තක්සේරු ප්‍රතිශතය වශයෙන් පිළිගැනීමටත්,

එකී මහා නගර සභා ආඥාපනතේ 230 වැනි වගන්තියේ (1) වන උපවගන්තියෙන් කුරුණෑගල මහා නගර සභාවට ලැබී ඇති බලතල ප්‍රකාරව සියලුම නේවාසික ස්ථානවලට වාර්ෂික වටිනාකමෙන් සියයට හයක (6%) වරිපනම් බද්දක් ද වෙළඳ හා වාණිජ කාර්යය සඳහා පාවිච්චි කරනු ලබන ස්ථාන, ඉඩම්වලට වාර්ෂික වටිනාකමින් සියයට අටක (8%) වරිපනම් බද්දක් 2024 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්,

2024 වර්ෂය සඳහා වන සම්පූර්ණ වරිපනම් බදු 2024 වර්ෂයේ ජනවාරි මස 31 දින හෝ එදිනට පෙර කුරුණෑගල මහා නගර සභා කාර්යාලය වෙත ගෙවනු ලැබුවහොත් එම සම්පූර්ණ වරිපනම් බදු ප්‍රමාණයෙන් සියයට දහයක (10%) ක වට්ටමක් ද එක් එක් කාර්තුවට අදාළ වරිපනම් බදු මුදල එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දින හෝ එදිනට මත්තෙන් කුරුණෑගල මහා නගර සභාවට ගෙවනු ලැබුවහොත් ඒ එක් එක් කාර්තුවේ වරිපනම් බදු ප්‍රමාණයෙන් සියයට පහක (5%) වට්ටමක් ද ගෙවනු ලැබේ.

ඒ වරිපනම් බදු, එකී මහා නගර සභා ආඥාපනතේ 230 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තියේ (ඇ) ඡේදයේ විධිවිධාන යටතේ එකී වර්ෂයේ මාර්තු මස 31, ජූනි මස 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 දිනවලින් අවසන් වන එක් එක් කාර්තුව අවසන් වීමට පෙර සමාන වාරික හතරකින් කුරුණෑගල මහා නගර සභාවට ගෙවිය යුතු බවටත්, වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

තවද, නියමිත දින වලට පසු ගෙවනු ලබන වරිපනම් බදු සඳහා නේවාසික ස්ථානවලට 15% ක හා වෙළඳ හා වාණිජ කාර්ය සඳහා පාවිච්චි කරනු ලබන ස්ථාන, ඉඩම්වලට 20% වරෙන්තු ගාස්තු අය කරනු ලබයි.

11-556/1

කුරුණෑගල මහා නගර සභාව

2024 වර්ෂය සඳහා වරිපනම් පොත පරීක්ෂා කිරීම

2024 වර්ෂය සඳහා මෙම නගර සභාවේ වරිපනම් පොත සාමාන්‍ය කාර්යාල වේලාවන්හි දී පරීක්ෂා කර බැලීම සඳහා මෙම කාර්යාලයේ දැන් සූදානම්ව ඇති බව මහා නගර සභා ආඥාපනතේ නෛතික විධිවිධාන යටතේ මෙයින් දැනුම් දෙමි.

(මහා නගර සභා ආඥාපනතේ (252 අධිකාරය) 286(අ) වගන්තිය යටතේ නාගරික කොමසාරිස්ට පවරා ඇති බලතල මත)

එම්. ඒ. බී. සී. ආලෝක බංඩාර,
නාගරික කොමසාරිස්,
මහා නගර සභාව,
කුරුණෑගල.

2023 වර්ෂයේ නොවැම්බර් මස 10 වැනි දින,

11-556/2

මැදදුම්බර ප්‍රාදේශීය සභාව

ගෝ ඝාතක ආඥාපනත (272 වැනි අධිකාරය) යටතේ ගෝ ඝාතකාගාරයක් පවත්වාගෙන යාම වෙනුවෙන් විරෝධතා කැඳවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, 2023 වර්ෂයේ නොවැම්බර් මස 09 වන දින තීරණ අංක 528 යටතේ පහත දැක්වෙන තීරණය ගන්නා ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

චාමින්දි අමදෝරු,
ලේකම්,
මැදදුම්බර ප්‍රාදේශීය සභාව.

2023 නොවැම්බර් මස 09 වැනි දින,
මැදදුම්බර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

මෙහි පහත උපලේඛනයේ සඳහන් අය විසින් එහි සඳහන් කර ඇති ස්ථානයේ 2024 වර්ෂයට ගෝ ඝාතකාගාරයක් පවත්වාගෙන යාම සඳහා බලපත්‍ර ලබා ගැනීමට ඉදිරිපත් වී සිටින බව ගෝ ඝාතක ආඥාපනතේ 272 වැනි අධිකාරය 7(2) වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

මෙම බලපත්‍රය නිකුත් කිරීම පිළිබඳ මැදදුම්බර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පදිංචි යම් අයෙකු විරුද්ධ වන්නේ නම් ඒ ඔහු හෝ ඇය විරුද්ධ වන්නේ කුමන හේතුවක් නිසා ද යන වග සඳහන් ලියවිල්ලක් පිටපත් දෙකකින් යුක්තව මෙම දන්වීම *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට දින 14 ක් ඇතුළත මා වෙත ඉදිරිපත් කළ යුතු බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෙම කාල සීමාව තුළ මෙම නිවේදනය පිළිබඳ යම් විරුද්ධත්වයක් ඉදිරිපත් නොවුවහොත් මෙහි උපලේඛනයේ සඳහා ඉල්ලුම්කරු වෙත ගෝ ඝාතකාගාරය කරගෙන යාම සඳහා 2024.01.01 දින සිට 2024.12.31 වැනි දින දක්වා බලපත්‍රය ලබා දීම කරන බව පොදු මහජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

උපලේඛනය

ඉල්ලුම්කරුගේ නම	*ගෝ ඝාතකාගාරය පිහිටි ස්ථානය*	*ස්වභාවය*
එම්. එෆ්. අහමද් සිරාජ්	අංක 244, අඹගහලන්ද, තෙල්දෙණිය	මස් පිණිස එළ හරක් ඝාතනය

11-510/14

මැදදුම්බර ප්‍රාදේශීය සභාව

ගෝ ඝාතක ආඥාපනත (272 වැනි අධිකාරය) යටතේ එළ ගවමස් වෙළඳාලක් පවත්වාගෙන යාම වෙනුවෙන් විරෝධතා කැඳවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, 2023 වර්ෂයේ නොවැම්බර් මස 09 වන දින තීරණ අංක 526 යටතේ පහත දැක්වෙන තීරණය ගන්නා ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

චාමින්දි අමදෝරු,
ලේකම්,
මැදදුම්බර ප්‍රාදේශීය සභාව.

2023 නොවැම්බර් මස 09 වැනි දින,
මැදදුම්බර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

2024 වර්ෂයට මැදදුම්බර ප්‍රාදේශීය සභාව සතු ගවමස් වෙළඳසැල පවත්වාගෙන යාම සඳහා ගෝ ඝාතක ආඥාපනතේ 272 වැනි අධිකාරය 7(2) වගන්තිය යටතේ විරෝධතා කැඳවන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

මෙම බලපත්‍රය නිකුත් කිරීම පිළිබඳ මැදදුම්බර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල පදිංචි යම් අයෙකු විරුද්ධ වන්නේ නම් ඒ ඔහු හෝ ඇය විරුද්ධ වන්නේ කුමන හේතුවක් නිසා ද යන වග සඳහන් ලියවිල්ලක් පිටපත් දෙකකින් යුක්තව මෙම දන්වීම *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට දින 14 ක් ඇතුලත මා වෙත ඉදිරිපත් කළ යුතු බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෙම කාල සීමාව තුළ මෙම නිවේදනය පිළිබඳ යම් විරුද්ධත්වයක් ඉදිරිපත් නොවුවහොත් අදාළ ව්‍යාපාර ස්ථාන වල වෙළඳාම් කරගෙන යාම සඳහා 2024.01.01 දින සිට 2024.12.31 වැනි දින දක්වා බලපත්‍රය ලබා දීම කරන බව පොදු මහජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

11-510/15

මැදදුම්බර ප්‍රාදේශීය සභාව

ගෝ ඝාතක ආඥාපනත (272 වැනි අධිකාරය) යටතේ එළ ගවමස් වෙළඳ සැලක් පවත්වාගෙන යාම වෙනුවෙන් විරෝධතා කැඳවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, 2023 වර්ෂයේ නොවැම්බර් මස 09 වන දින තීරණ අංක 527 යටතේ පහත දැක්වෙන තීරණය ගන්නා ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

චාමින්දි අමදෝරු,
ලේකම්,
මැදදුම්බර ප්‍රාදේශීය සභාව.

2023 නොවැම්බර් මස 09 වැනි දින,
මැදදුම්බර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

මෙහි පහත උපලේඛනයේ සඳහන් අය විසින් එහි සඳහන් කර ඇති ස්ථානයේ 2024 වර්ෂයට ගවමස් වෙළඳ සැලක් පවත්වාගෙන යාම සඳහා බලපත්‍ර ලබා ගැනීමට ඉදිරිපත්ව සිටින බව ගෝ ඝාතක ආඥාපනතේ 272 වැනි අධිකාරය 7(2) වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

මෙම බලපත්‍රය නිකුත් කිරීම පිළිබඳ මැදදුම්බර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පදිංචි යම් අයෙකු විරුද්ධ වන්නේ නම් ඒ ඔහු හෝ ඇය විරුද්ධ වන්නේ කුමන හේතුවක් නිසාද යන වග සඳහන් ලියවිල්ලක් පිටපත් දෙකකින් යුක්තව මෙම දන්වීම *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට දින 14 ක් ඇතුළත මා වෙත ඉදිරිපත් කළ යුතු බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෙම කාල සීමාව තුළ මෙම නිවේදනය පිළිබඳ යම් විරුද්ධත්වයක් ඉදිරිපත් නොවුවහොත් මෙහි උපලේඛනයේ සඳහා ඉල්ලුම්කරු වෙත අදාල ව්‍යාපාර ස්ථානවල වෙළඳාම කරගෙන යාම සඳහා 2024.01.01 දින සිට 2024.12.31 වැනි දින දක්වා බලපත්‍රය ලබා දීම කරන බව පොදු මහජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

උපලේඛනය

ඉල්ලුම්කරුගේ නම	*ගවමස් වෙළඳ සැල පිහිටි ස්ථානය*	*ස්වභාවය*
එම්. එෆ්. අහමද් සිරාජ්	අංක 70/ A, අඹගහලන්ද, තෙල්දෙණිය	මස් පිණිස එළ ගව මස් වෙළඳ සැල

11-510/16

විවිධ දැන්වීම්

ගම්පහ මහා නගර සභාව

දේපළ වරිපනම් බද්ද - 2024 වර්ෂය

මහා නගර සභා ආඥාපනතේ 230 වගන්තියෙන් ගම්පහ මහා නගර සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ව ගම්පහ මහා නගර සභා බල ප්‍රදේශය සඳහා 2024 වර්ෂයට පහත සඳහන් ගාස්තු අය කිරීමට ගම්පහ මහා නගර සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය, කර්තව්‍ය ඉටු කරන නාගරික කොමසාරිස් වන මා විසින් 2023.10.25 දිනැති හා අංක 220 දරන තීරණය යටතේ තීරණය කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

ලෝචනා බාලසූරිය,
නාගරික කොමසාරිස්,
බලතල කාර්යය, කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
ගම්පහ මහා නගර සභාව.

2023 නොවැම්බර් මස 16 වැනි දින,
ගම්පහ මහා නගර සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

මහා නගර සභා ආඥාපනතේ 238(1) වගන්තියෙන් ගම්පහ මහා නගර සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ව ගම්පහ මහා නගර සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටි සියලු නිවාස/ගොඩනැගිලි/ඉඩම් ගෙපත් වල 2024 වර්ෂයේ වටිනාකම සඳහා යක්කල උපකාර්යාල බල ප්‍රදේශයේ 2005 වර්ෂයේ සිදු කරන ලද තක්සේරුව 2024 වර්ෂය සඳහා පිළිගැනීමටත් ගම්පහ මහා නගර සභාවට අයත් ඉතිරි ප්‍රදේශවල 2011 වර්ෂයේ සිදු කරන ලද තක්සේරුව 2024 වර්ෂයේ වටිනාකම ලෙස පිළිගැනීමට එකී තක්සේරුව මත මහා නගර සභා ආඥාපනතේ 230(1) වගන්තියට අනුව පැවරී ඇති බලතල ප්‍රකාර ව එකී දේපළ මත ඉහත කී වාර්ෂික වටිනාකමින් පහත සඳහන් පරිදි වරිපනම් බද්දක් පනවා අය කිරීමට තීරණය කරමි.

දේපළ වරිපනම් බද්ද :

අනු. අංකය	*විස්තරය*	*2024 ප්‍රතිශතය*
01	නේවාසික ස්ථාන සඳහා එම දේපළවල වාර්ෂික තක්සේරු වටිනාකමින්	7%
02	වාණිජ දේපළවල වාර්ෂික තක්සේරු වටිනාකමින්	10%
03	හිස් බිම්, මුඩු බිම්, සංවර්ධනය නොකළ ඉඩම් සඳහා දේපළවල වාර්ෂික තක්සේරු වටිනාකමින්	15%

වරිපනම් ලේඛන සේවා ගාස්තු :

01	වරිපනම් ලේඛනයේ නම් මාරු කිරීම සඳහා පෝරම ගාස්තුව	100
02	ලියාපදිංචි කිරීමේ සහතික	500
03	ආකෘති පත්‍ර විකිණීම සඳහා	100
04	සහතික පත්‍ර උධෘත නිකුත් කිරීමේ ගාස්තුව	100

ගම්පහ මහා නගර සභාව

2024 වර්ෂයට ඉඩම් විකිණීම විෂයෙහි බදු පැනවීම

මහා නගර සභා ආඥාපනතේ 247 ඉ (1) වගන්තිය යටතේ ගම්පහ මහා නගර සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර ව ගම්පහ මහා නගර සභා බල ප්‍රදේශය සඳහා 2024 වර්ෂයට පහත සඳහන් ගාස්තු අය කිරීමට ගම්පහ මහා නගර සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය, කර්තව්‍ය ඉටු කරන නාගරික කොමසාරිස් වන මා විසින් 2023.10.25 දිනැති හා අංක 220 දරන තීරණය යටතේ තීරණය කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

ලෝචනා බාලසූරිය,
නාගරික කොමසාරිස්,
බලතල කාර්යය, කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
ගම්පහ මහා නගර සභාව.

2023 නොවැම්බර් මස 16 වැනි දින,
ගම්පහ මහා නගර සභා කාර්යාලයේ දී ය.

247 ඉ(1) වගන්තිය

මහා නගර සභාවක පාලන සීමාව තුළ පිහිටි යම් ඉඩමක් වෙන්දේසිකරුවෙකු විසින් හෝ බ්‍රෝකර් කෙනෙකු විසින් හෝ ඔහුගේ සේවකයෙකු *නැතහොත්* අනුයෝජිතයකු විසින් හෝ ප්‍රසිද්ධ වෙන්දේසියේ *නැතහොත්* වෙනත් ආකාරයකින් විකුණනු ලැබුවහොත් ඒ විකිණීමෙන් ලැබුණු මුදලින් සියයට එකකට සමාන බද්දක් ඒ විකුණුම්කරු හෝ වෙන්දේසිකරු හෝ බ්‍රෝකර් හෝ ඔහුගේ සේවකයා හෝ අනුයෝජිතයා හෝ විසින් ඒ ඉඩම විකුණාලත් මුදලින් ඒ සභාවට ගෙවිය යුතුය.

11 - 571/2

ගම්පහ මහා නගර සභාව

2024 වර්ෂයට අදාළ බලපත්‍ර ගාස්තු පැනවීම

මහා නගර සභා ආඥාපනතේ (252 වන අධිකාරිය) 247 අ. වගන්තිය ප්‍රකාරව මා වෙත පැවරී ඇති බලතල අනුව ගෝඝාතක ආඥාපනතේ අංක 4(1) වගන්තිය සම්බන්ධයෙන් ගම්පහ මහා නගර සභා බල ප්‍රදේශය සඳහා 2024 වර්ෂයට පහත සඳහන් ගාස්තු අය කිරීමට ගම්පහ මහා නගර සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය, කර්තව්‍ය ඉටු කරන නාගරික කොමසාරිස් වන මා විසින් 2023.10.25 දිනැති හා අංක 220 දරන තීරණය යටතේ තීරණය කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

ලෝචනා බාලසූරිය,
නාගරික කොමසාරිස්,
බලතල කාර්යය, කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
ගම්පහ මහ නගර සභාව.

2023 නොවැම්බර් මස 16 වැනි දින,
ගම්පහ මහා නගර සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

මහා නගර සභා ආඥාපනතෙහි (252 වන අධිකාරිය) 247 අ. වගන්තිය ප්‍රකාරව මා වෙත පැවරී ඇති බලතල අනුව ගෝඝාතක ආඥාපනතෙහි අංක 4(1) වගන්තිය යටතේ ගම්පහ මහා නගර සභා බල ප්‍රදේශය ඇතුළත යම් ස්ථානයක මස් විකිණීම සම්බන්ධව 2024 වර්ෂයේ නිකුත් කරනු ලබන බලපත්‍රයක් සඳහා රු. 25ක ගාස්තුවක් පනවා අයකළ යුතු යැයි තීරණය කරමි.

එසේම එම ගාස්තුව 2024 මාර්තු මස 31 වැනි දිනට හෝ ඊට ප්‍රථම ගෙවීමට කටයුතු කරන ලෙස ද දන්වා සිටිමි.

11 - 571/3

ගම්පහ මහා නගර සභාව

2024 වර්ෂයට අදාළව වාහන හා සත්ත්ව බදු පැනවීම

මහා නගර සභා ආඥාපනතේ 245 (1) වගන්තිය යටතේ ගම්පහ මහා නගර සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර ව ගම්පහ මහා නගර සභා බල ප්‍රදේශය සඳහා 2024 වර්ෂයට පහත සඳහන් ගාස්තු අය කිරීමට ගම්පහ මහා නගර සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය, කර්තව්‍ය ඉටු කරන නාගරික කොමසාරිස් වන මා විසින් 2023.10.25 දිනැති හා අංක 220 දරන තීරණය යටතේ තීරණය කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

ලෝචනා බාලසූරිය,
නාගරික කොමසාරිස්,
බලතල කාර්යය, කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
ගම්පහ මහ නගර සභාව.

2023 නොවැම්බර් මස 16 වැනි දින,
ගම්පහ මහා නගර සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

මහා නගර සභා ආඥාපනතේ 245 (1) වගන්තිය යටතේ ගම්පහ මහා නගර සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර, එකී පනතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ මෙහි පහත උපලේඛනයේ සඳහන් වාහන හා සත්ත්වයන් සඳහා වාහන හා සත්ත්වයන් බද්දක් 2024 වර්ෂය සඳහා පනවා අය කිරීමට යෝජනා කරමි.

උපලේඛනය

	රු. ශත
මෝටර් කාර් රථයක්, රෝද තුනේ මෝටර් රථයක්, මෝටර් ලොරි රථයක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, අත් කරත්තයක්, රික්ෂෝවක්, බයිසිකලයක් හා ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා	25 0
සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාර් රථයක් *නැනහොත්* බයිසිකල් කරත්තයක් ම සඳහා	
(අ) එය වෙළඳ කටයුතු සඳහා පාවිච්චි කරන්නේ නම්	10 0
(ආ) එය වෙළඳ කටයුතු නොවන කාර්යය සඳහා යොදවන්නේ නම්	5 0
සෑම කරත්තයක් සඳහා	20 0
සෑම අත් කරත්තයක් සඳහා	10 0
සෑම රික්ෂෝවක් සඳහා	7 50
සෑම අශ්වයකු/පෝනියකු හෝ කොටළුවකු සඳහා	15 0
සෑම අලියකු සඳහා	50 0
සුනඛයෙකු ලියාපදිංචිය සඳහා	5 0

රෝදවල විශ්කම්භය අඟල් 26 ට නොවැඩි ළමා වාහන, වීල්බැරැක්ක හුදෙක් පෞද්ගලික ස්ථානයක් තුළ පමණක් වෙළෙඳ කරත්ත සහ වෙළෙඳ කටයුතු සඳහා භාවිතා කරන අත් කරත්ත සහ වෙළඳ කටයුතු සඳහා භාවිතා නොකරන අත්කරත්ත මෙම ගෙවීම්වලින් නිදහස් වේ.

මේ උපලේඛනයේ "වෙළෙඳ කටයුතු" යන යෙදුමට යම් වෙළෙඳ ව්‍යාපාරයකට හෝ කර්මාන්තයකට සම්බන්ධව විකිණීම සඳහා වුව ද අන්‍ය කාර්යයන් සඳහා වුව ද යම් භාණ්ඩයක් හෝ බඩු හෝ ලිඛිතව *නැනහොත්* මුද්‍රිත ද්‍රව්‍ය කිසිවක් හෝ ගෙන යෑම හෝ ප්‍රවාහනය කිරීම ඇතුළත් වේ. තව ද, එම ගාස්තු 2024.03.31 වැනි දිනට පෙර ගෙවීමට කටයුතු කරන ලෙස දන්වා සිටිමි.

ගම්පහ මහා නගර සභාව

විනෝද බද්ද - 2024 වර්ෂය

1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ 02(1) වගන්තියේ හා 1984 අංක 37 දරන විනෝද බදු සංශෝධිත පනත අනුව ගම්පහ මහා නගර සභා බල ප්‍රදේශය සඳහා 2024 වර්ෂයට පහත සඳහන් ගාස්තු අය කිරීමට ගම්පහ මහා නගර සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය, කර්තව්‍ය ඉටු කරන නාගරික කොමසාරිස් වන මා විසින් 2023.10.25 දිනැති හා අංක 220 දරන තීරණය යටතේ තීරණය කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

ප්‍රසිද්ධ රඟදැක්වීමේ ආඥාපනත (176 අධිකාරය) 03 වැනි වගන්තිය යටතේ සිනමා ශාලා වල ප්‍රදර්ශනය කරනු ලබන චිත්‍රපට දර්ශන සඳහා අලෙවි කරනු ලබන ටිකට් පත් වල මුළු වටිනාකමින් 7.5% ක විනෝද බද්දක් ගෙවිය යුතු බවත්,

ගම්පහ මහා නගර සභා බල ප්‍රදේශය තුළ ප්‍රදර්ශනය කරනු ලබන සෑම ආධාරක චිත්‍රපටි දර්ශනයක්, මැජික් සංදර්ශනයක්, සර්කස් සංදර්ශනයක්, සංගීත සංදර්ශනයක්, ප්‍රදර්ශන ක්‍රීඩා තරගයක්/ඉසව්/සංදර්ශන, ඕනෑම වර්ගයේ සැණකෙළියක්, විනෝද ක්‍රීඩා ඉසව්/සංදර්ශනයක් සඳහාම මුද්‍රණය කරනු ලබන ප්‍රවේශපත්‍ර වල වටිනාකමින් 25% ක විනෝද බද්දක් ගෙවිය යුතු බවත් එබැවින්, අදාළ බදු මුදල් ගෙවිය යුතු බව මෙයින් දැනුම් දෙනු ලබන අතර, ඒ වෙනුවෙන් පහත සඳහන් උපලේඛනයේ පරිදි බලපත්‍ර ගාස්තුවක් ද ගෙවිය යුතුය.

විනෝද බද්දට අමතරව පහත උපලේඛනයේ පරිදි ගාස්තු ගෙවා පොදු රැගුම් බලපත්‍රයක් ලබා ගැනීම.

උපලේඛනය

දින ගණන	*අයකරන බලපත්‍ර මුදල*
එක් දිනක වැඩසටහනක් සඳහා	රු. 1,000 + රජයේ අනුමත බදු මුදල්
දිනකට වැඩි දින 03ක් දක්වා වැඩසටහනක් සඳහා	රු. 2,000 + රජයේ අනුමත බදු මුදල්
දින 03ට වැඩි සහ දින 07ක් දක්වා වැඩසටහනක් සඳහා	රු. 3,000 + රජයේ අනුමත බදු මුදල්
දින 07ට වැඩිවන සෑම වැඩසටහනක් සඳහා	රු. 5,000 + රජයේ අනුමත බදු මුදල්

ලෝචනා බාලසූරිය,
නාගරික කොමසාරිස්,
බලතල කාර්යය, කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
ගම්පහ මහ නගර සභාව.

2023 නොවැම්බර් මස 16 වැනි දින,
ගම්පහ මහා නගර සභා කාර්යාලයේ දී ය.

11 - 571/5

ගම්පහ මහා නගර සභාව

2024 වර්ෂයට අදාළව කර්මාන්ත බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර, එකී පනතේ හෝ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ එකී පනතේ 150 වන වගන්තිය යටතේ යම් කර්මාන්ත බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ හා වෘත්තියක් නොවන්නා වූ කිසියම් ව්‍යාපාරයක් මැදදුම්බර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුලත 2024 වර්ෂයේ දී කරගෙන යනු ලබන සෑම තැනැත්තෙකුගෙන්ම, එකී ව්‍යාපාරයේ ඊට පෙර වර්ෂයේ ලැබීම් මෙහි පහත උපලේඛනයේ I තීරුවේ නිරූපිත යම් විෂය අංකයක සීමාවන් ඇතුළත පවත්නා අවස්ථාවක එහි II වන තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත අනුප්‍රමාණය අනුව වූ ව්‍යාපාර බද්දක් 2024 වර්ෂය සඳහා පනවා අයකිරීමටත්, 2024 වර්ෂයේ දී ආරම්භ කරන නව ව්‍යාපාරයක් සඳහා පහත තෙවන උපලේඛනයේ I වන තීරුවේ නිරූපිත යම විෂය අංක සීමාවන් ඇතුලත පවත්වා අවස්ථාවක එහි II තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත ප්‍රමාණය අනුප්‍රමාණය අනුව වූ ව්‍යපාර බද්දක් 2024 වර්ෂය සඳහා නියම කර අය කිරීමටත්, බද්දට යටත් වූ යම් තැනැත්තෙකු ව්‍යාපාර බද්ද වර්ෂයේ අප්‍රේල් මස 30 වන දිනට පෙර මැදදුම්බර ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතු බවට තීරණය කරමි.

පළමුවන උපලේඛනය

1.	වෙන්දේසි ව්‍යාපාර
2.	බ්‍රෝකර් ව්‍යාපාර
3.	මුදල් ආයෝජන ව්‍යාපාර (මෙරට)
4.	මුදල් දීමේ ව්‍යාපාර
5.	මුදල් ණයට දීමේ ව්‍යාපාර
6.	මුදල් ආයෝජන ව්‍යාපාර (අපනයන ව්‍යාපාරිකයන්)
7.	බඩු උකස් ගැනීමේ ව්‍යාපාර
8.	කොන්ත්‍රාත් ව්‍යාපාර
9.	සැපයුම් කටයුතු කිරීමේ ව්‍යාපාර (ගොඩනැගිලි, නිමි ඇඟළුම්, සුඛෝපභෝගී භාණ්ඩ සහ වෙනත්)
10.	රියදුරු පුහුණු කිරීමේ ව්‍යාපාර
11.	විදේශ සංචාර සංවිධානය කිරීමේ ව්‍යාපාර
12.	දේශීය සංචාර සංවිධානය කිරීමේ ව්‍යාපාර
13	විදේශ රැකියා නියෝජිත ව්‍යාපාර
14.	ලොතරැයි අලෙවි නියෝජිත ව්‍යාපාර
15.	රේස් ඔට්ටු ඇල්ලීමේ ව්‍යාපාර
16.	රක්ෂණ ව්‍යාපාර
17.	රක්ෂණ නියෝජිත වශයෙන් කටයුතු කිරීමේ ව්‍යාපාර
18.	නියෝජිත තැපැල්හල්
19.	ශාලා කුලියට දීමේ ව්‍යාපාර (උත්සව ශාලා)
20.	අලෙවි නියෝජිත ව්‍යාපාර
21.	උළු, ගල්, වැලි, ගඩොල් සැපයීමේ හා බෙදාහැරීමේ ව්‍යාපාර
22.	සැලසුම් ශිල්පී ආයතන
23	විදේශ චෙක්පත් හා මුදල් මාරු කිරීමේ ව්‍යාපාර
24.	මුදල් හුවමාරු කිරීමේ ව්‍යාපාර
25.	භාණ්ඩ කුලියට දීමේ ව්‍යාපාර (උත්සව සඳහා)
26.	හෙද සේවා හා රෝගී සත්කාරසේවා සපයන ව්‍යාපාර
27.	පෞද්ගලික හෝ රජයේ බැංකු ව්‍යාපාර
28.	පොත් ප්‍රකාශන ව්‍යාපාර

පළමුවන උපලේඛනය

29. සංචාරක සේවා සැපයීමේ ව්‍යාපාර
30. ප්‍රවාහන සේවා සැපයීමේ ව්‍යාපාර
31. පෞද්ගලික ආරක්ෂක සේවා සැපයීමේ ව්‍යාපාර
32. වැඩසටහන් නිෂ්පාදනය සහ ප්‍රචාරණ කටයුතු කිරීමේ ව්‍යාපාර
33 විදුලි රැහැන් ඇදීමේ හා මංපෙත් එළිපෙහෙළි කිරීමේ ව්‍යාපාර
34. උද්‍යාන සැලසුම් කිරීමේ ව්‍යාපාර
35. ජ්‍යොතිෂ්‍ය කටයුතු කිරීමේ ව්‍යාපාර
36. දැව ආනයනය කිරීමේ හා සැපයීමේ ව්‍යාපාර
37. රූපවාහිනී සම්ප්‍රේෂණ කුළුණු / විදුලි සංදේශ සංඥා සම්ප්‍රේෂණ කුළුණු පත්වාගෙන යාමේ ව්‍යාපාර
38. විදුලි උපකරණ බෙදා හැරීමේ ව්‍යාපාර
39. දේශීය රැකියා නියෝජිත ව්‍යාපාර
40. විදේශීය රැකියා නියෝජිත ව්‍යාපාර
41. ආනයන කටයුතු කිරීමේ නියෝජිත ව්‍යාපාර
42. අපනයන කටයුතු සිදුකිරීමේ නියෝජිත ව්‍යාපාර
43 පානීය ජල බෝතල් බෙදාහැරීමේ ව්‍යාපාර
44. අන්තර්ජාලය මගින් වෙළඳාම් කිරීමේ ව්‍යාපාර
45. රා/රටබීම/අරක්කු/බියර් ආදී මධ්‍යසාර ගබඩා කිරීම
46. රා/රටබීම/අරක්කු/බියර් ආදී මධ්‍යසාර බෙදාහැරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
47. විශේෂඥ වෛද්‍ය සේවා සැපයීමේ ව්‍යාපාර
48. ගෘහස්ථ ක්‍රීඩාංගනයක් පවත්වාගෙන යාමේ ස්ථානයක් පවත්වාගෙන යාම
49. රා/රටබීම/අරක්කු/බියර් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
50. පෞද්ගලික ඉගනුම් ආයතනයක් පවත්වාගෙන යාම
51 සනීපාරක්ෂක සේවා සැපයීමේ ව්‍යාපාර

දෙවන උපලේඛනය

I වැනි තීරුව *බද්ද අදාළ වන වර්ෂයට පෙර වර්ෂයේ ව්‍යාපාරයෙන් ලත් ලැබීම් ප්‍රමාණය*	*II වැනි තීරුව* *ගෙවිය යුතු බද්ද* *රු. ශත.*
01. රු 6000.00 නොඉක්මවන අවස්ථාවක	කිසිත් නැත.
02. රු 6001.00 නොඉක්මවන එහෙත් රු. 12,000.00 නොඉක්මවන අවස්ථාවක	90.00
03. රු 12,001.00 නොඉක්මවන එහෙත් රු. 18,750.00 නොඉක්මවන අවස්ථාවක	180.00
04. රු 18,751.00 නොඉක්මවන එහෙත් රු. 75,000.00 නොඉක්මවන අවස්ථාවක	360.00
05. රු 75,001.00 නොඉක්මවන එහෙත් රු. 150,000.00 නොඉක්මවන අවස්ථාවක	1,200.00
06. රු 150,001.00 ඉක්මවන අවස්ථාවක	3,000.00

තෙවන උපලේඛනය

I වැනි තීරුව *ස්ථානයේ වාර්ෂික වටිනාකම*	*II වැනි තීරුව* *ගෙවිය යුතු බද්ද* *රු. ශත.*
01. රු 750.00 නොඉක්මවන අවස්ථාවක	රු. 500.00
02. රු 750.00 ඉක්මවන එහෙත් රු. 1,500.00 නොඉක්මවන අවස්ථාවක	රු. 750.00
03. රු 1,500.00 ඉක්මවන අවස්ථාවක	රු. 1000.00

11 - 510/4

මැදඋම්බර ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා කර්මාන්ත බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2023 වර්ෂයේ ඔක්තෝබර් මස 17 වැනි දින තීරණ අංක 451 යටතේ පහත තීරණ ගන්නා ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

තවද 2024 වර්ෂය සඳහා පනවන ලද ඒ කර්මාන්ත බද්ද 2024 අප්‍රේල් මස 30 වන දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවට වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

චාමින්දි අමදෝරු,
ලේකම,
මැදඋම්බර ප්‍රාදේශීය සභාව.

2023 නොවැම්බර් මස 09 වැනි දින,
මැදඋම්බර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාරව, මැදඋම්බර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත කරගෙන යනු ලබන පහත උපලේඛනයේ I වන තීරුවේ සඳහන් එක් එක් කර්මාන්තය වෙනුවෙන්, එම උපලේඛනයේ II වන තීරුවේ, ඒ එක් එක් කර්මාන්තය පවත්වාගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකමට අනුරූපිත තීරුවේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2024 වර්ෂය සඳහා පනවා අය කළයුතු බවටත්, එකී කර්මාන්ත බද්දට යටත් තැනැත්තෙකු 2024 වර්ෂයේ අප්‍රේල් මස 30 වන දිනට පෙර මැදඋම්බර ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් තීරණය කරමි

අනු අංක	*කර්මාන්තයේ ස්වභාවය*	*පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම (රු.)*		
		750 නොඉක්මවන අවස්ථාවක	*751ට වැඩි එහෙත් 1500 නොඉක්මවන අවස්ථාවක*	*1501 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
01.	ක්ෂණික ඡායා පිටපත් ගැනීමේ / පරිගණක මුද්‍රණ කටයුතු/දේශීය විදේශීය දුරකතන ඇමතුම් පහසුකම් සැපයීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
02.	වී. සී. ඩී./ඩී. වී. ඩී. පටි අලෙවිය	500 0	750 0	1,000 0
03.	ගුවන් විදුලි, රූපවාහිනී යන්ත්‍ර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

අනු අංක	කර්මාන්තයේ ස්වභාවය	පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම (රු.)		
		750 නොඉක්මවන අවස්ථාවක	751 ට වැඩි එහෙත් 1500 නොඉක්මවන අවස්ථාවක	1501 ඉක්මවන අවස්ථාවක
		රු. ශත	රු. ශත	රු. ශත
04.	L. E. D. බල්බ සැකසීම හා අලෙවි කටයුතු සිදුකිරීම	500 0	750 0	1,000 0
05.	හඳුන්කුරු/පහන් තිර/සුවඳ දුම් කුඩු/ නිල් කුඩු/රබර් බෑන්ඩ් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
06.	ගොඩනැගිලි ද්‍රව්‍ය විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
07.	කළුගල් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
08.	ඉරූ දැව විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
09.	දර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
10.	මෝටර් රථ අමතර කොටස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
11.	ටයර්, ටියුබ් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
12.	ලිහිසි තෙල් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
13.	රෙදි සාප්පුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
14.	අභ්‍යාස පොත් සෑදීමේ හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
15.	පොත් හා ලිපිද්‍රව්‍ය විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
16.	ඇලුමිනියම්, ප්ලාස්ටික් භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
17.	සාප්පු බඩු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
18.	ඔරලෝසු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
19.	පූජා භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
20.	සපත්තු හා බෑග් අලෙවිසැලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
21.	පත්තර අලෙවිසැලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
22.	ගෘහ භාණ්ඩ අලෙවිසැලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
23.	රන් රිදී භාණ්ඩ අලෙවිසැලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
24.	මැණික් ගල් වර්ග විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
25.	උත්සව භාණ්ඩ සැපයීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
26.	සුළු අපනයන බෝග රැස් කිරීමේ /විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
27.	හණ කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම			
28.	තිර රෙදි අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
29.	ඇසුරුම් කළ ආහාර අලෙවිසැලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
30.	සුවඳ විලවුන් අලෙවිසැලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
31.	ඔරලෝසු අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
32.	දැන්වීම් පුවරු සකස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සහ ස්ටිකර් සකස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
33.	පරණ ගෘහ භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
34.	පරිගණක විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
35.	තීන්ත අලෙවිසැලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
36.	මැටි භාණ්ඩ අලෙවිසැලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
37.	මාළු කෑම, කපුරු බෝල, රබර් බෑන්ඩ් පැකට් කර අලෙවිකිරීම	500 0	750 0	1,000 0
38.	රිබන් මල් කොන්ඩ බෑන්ඩ් සෑදීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යෑම	500 0	750 0	1,000 0

මැදදුම්බර ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා ජල ගාස්තු බදු පැනවීම

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 9.3 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2023 වර්ෂයේ නොවැම්බර් මස 09 වැනි දින තීරණ අංක 522 යටතේ පහත තීරණ ගන්නා ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

චාමින්දි අමදෝරු,
ලේකම්,
මැදදුම්බර ප්‍රාදේශීය සභාව.

2023 නොවැම්බර් මස 09 වැනි දින,
මැදදුම්බර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 සහ 126 දක්වා වූ වගන්තිවලින් සහ 1952 අංක 6 දරණ පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා පනතේ) 2 වැනි වගන්තියේ 3 වන උප වගන්තියෙන් පනවා ගැනීමට ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව 1952 අංක 6 දරන පළාත් පාලන සම්මත අතුරු ව්‍යවස්ථා පනතේ 2 වන වගනතියෙන් පළාත් පාලන අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල අනුව ඔහු විසින් සම්පාදනය කර 1988 අගෝස්තු 23 වැනි දින 520/7 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පලකරන ලද්දා වූද මධ්‍යම පළාත් සභා විසින් අනුමත කර 1990 අප්‍රේල් 20 වන දින අංක 607 දරන ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මගින් පිළිගනු ලැබුවා වූ ද සම්මත අතුරු ව්‍යවස්ථාවේ 1991.11.22 වැනි දින *අති විශෙෂ ගැසට් පත්‍රයේ* iv (ආ) කොටසේ පළ කළ මැදදුම්බර ප්‍රදේශීය සභා බල ප්‍රදේශය තුළ බලාත්මක කරනු ලැබූ ජල සම්පාදනය පිළිබද අතුරු ව්‍යවස්ථාවට අනුව පහත උපලේඛනයේ සඳහන් පරිදි ගාස්තුවක් 2024 වර්ෂය සඳහා පනවා අය කිරීම සුදුසු බව තීරණය කරමි.

උපලේඛනය

මැදදුම්බර ප්‍රාදේශීය සභාව මගින් ක්‍රියාත්මක කරනු ලබන ජල යෝජනා ක්‍රම වලින් ලබා දෙනු ලබන ජල සෑපයුම් වෙනුවෙන්:

- ස්ථාවර ගාස්තු මාසිකව:
  - ගෘහමය ඒකකයකට රු. 100.00 අය කිරීමටත්,
  - වානිජ්‍ය ඒකකයකට රු. 150.00 අය කිරීමටත්,

- ජල ඒකකයන් සඳහා පහත පරිදි ගාස්තු අය කිරීමටත්,

අනු. අංකය	*සන ඒකක*	*ගෘහමය ස්ථානයක් සඳහා රු.*	*ව්‍යාපාර ස්ථානයක් සඳහා රු.*
1	1	12.00	30.00
2	2	17.00	50.00
3	3	22.00	70.00
4	4	27.00	90.00
5	5	32.00	110.00
6	6	42.00	140.00
7	7	52.00	170.00
8	8	62.00	200.00
9	9	72.00	230.00
10	10	82.00	260.00
11	11	97.00	300.00

අනු. අංකය	*සත ඒකක*	*ගෘහමය ස්ථානයක් සඳහා රු.*	*ව්‍යාපාර ස්ථානයක් සඳහා රු.*
12	12	112.00	340.00
13	13	127.00	380.00
14	14	142.00	420.00
15	15	157.00	510.00
16	16	177.00	510.00
18	18	217.00	610.00
19	19	237.00	660.00
20	20	500.00	1100.00
21	20ට වැඩි වන සෑම ඒකකයකට	50.00 බගින්	100.00 බැගින්

තීරණය කරමි.

11 - 510/6

මැදදුම්බර ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා වාහන හා සතුන් පිළිබඳ අතුරු ව්‍යවස්ථාව අනුව ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2023 වර්ෂයේ ඔක්තෝබර් මස 19 වැනි දින තීරණ අංක 458 යටතේ 2024 වර්ෂය සඳහා වාහන හා සතුන් පිළිබඳ බද්දක් පනවා අය කිරීමට තීරණය කල බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ අනුව මැදදුම්බර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මේ බද්දට යටත් වන කිසියම් වාහනයක් හෝ සතෙකු තබා ගන්නා සෑම තැනැත්තෙකුම විසින් එකී වාහනය හෝ සතා තමන් භාරයේ තබා ගන්නා දින ගණන දින තිහක් සම්පූර්ණ වූ වහාම 2024 වර්ෂය සඳහා වන මෙම බද්ද මැදදුම්බර ප්‍රාදේශීය සභාව වෙත විය යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

.

චාමින්දි අමදෝරු,
ලේකම්,
මැදදුම්බර ප්‍රාදේශීය සභාව,

2023 නොවැම්බර් මස 09 වැනි දින,
මැදදුම්බර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 148 (1) වන වගන්තිය යටතේ තෙල්දෙණිය මැදදුම්බර ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව මැදදුම්බර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2024 වර්ෂයේ දී පහත උපලේඛනයේ I වන තීරුවේ දැක්වෙන පරිදි කිසියම් වාහනයක් හෝ සතෙකු තමා සන්තකයෙහි තබා ගන්නා සෑම තැනැත්තෙකුගෙන්ම එහි II තීරුවේ අනුරූපිත සටහනේ නිරූපිත බද්දක් 2024 වර්ෂය සඳහා පනවා අය කිරීමට මැදදුම්බර ප්‍රාදේශීය සභාව මෙයින් තීරණය කරමි.

උපලේඛනය

	I වැනි තීරුව *විස්තරය*	*II වැනි තීරුව* *රු. ශත*
01.	මෝටර් රථයක්, මෝටර් ට්‍රයිසිකලයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක් හෝ කරත්තයක් හෝ ජින් රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා,	25 0
02.	සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක්, බයිසිකල් කාරයක් හෝ කරත්තයක් සඳහා : (අ) වෙළෙඳ කාර්යයක් සඳහා යොදවන්නේ නම් (ආ) වෙළෙඳ කාර්යක් නොවන කාර්යයක් සඳහා යොදවන්නේ නම්	 18 0 4 0
03.	සෑම කරත්තයක් සඳහා	20 0
04.	සෑම අත්කරත්තයක් සඳහා	10 0
05.	සෑම රික්ෂෝවක් සඳහා	7 50
06.	සෑම අශ්වයෙකු/පෝනියෙකු/කොටළුවෙකු සඳහා	15 0
07.	සෑම ඇතෙකු සඳහා	50 0

11 - 510/7

මැදදුම්බර ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා ත්‍රීරෝද රථ නවතා තැබීමේ අතුරු ව්‍යවස්ථාවට අනුව ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2023 වර්ෂයේ නොවැම්බර් මස 09 වැනි දින තීරණ අංක 523 යටතේ පහත දැක්වෙ තීරණය ගන්නා ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

චාමින්දි අමදෝරු,
ලේකම්,
මැදදුම්බර ප්‍රාදේශීය සභාව,

2023 නොවැම්බර් මස 09 වැනි දින,
මැදදුම්බර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

1989 අංක 12 දරන පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය 1 වැනි උප වගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු 261 වන අධිකාරිය වන 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා පනතේ) 2 වැනි වගන්තියේ 1 උප වගන්තිය යටතේ මධ්‍යම පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මධ්‍යම පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2016.02.23 වන දින අංක 1955/7 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ IV* (අ) වැනි කොටසේ පළ කරනු ලැබූ හා මධ්‍යම පළාත් සභාව විසින් අනුමත කොට 2017.05.05 වැනි දින අංක 2017/42 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති *විශෙෂ ගැසට් පත්‍රයේ IV* (අ) වැනි කොටසේ පළ කරනු ලැබූ නිවේදනයේ ප්‍රකාශයට පත් කරන ලද්දා වූ ද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2022.09.02 වැනි දින 2296 අංක දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ IV* (අ) වැනි කොටසේ පළ කළ මැදදුම්බර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ බලාත්මක කරනු ලැබූ ත්‍රීරෝද රථ නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාවට අනුව පහත උපලේඛනය පරිදි බලපත්‍ර ගාස්තුවක් 2024 වර්ෂය සඳහා පනවා අය කිරීම සුදුසු බවට තීරණය කරමි.

පහත උප ලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ආකාරයට නැවත දැනුම් දීමකින් අවලංගු කරන තෙක් 2024 වර්ෂයේ ජනවාරි මස 01 වැනි දින සිට ගාස්තු පනවා ඇති බව දැනුම් දෙමි. අදාළ ගාස්තුව සෑම වසරකම මාර්තු 31 වැනි දිනට හෝ පෙර ගෙවිය යුතු බවත්, මාර්තු මස 31 වැනි දිනෙන් පසුව ත්‍රීරෝද රථගාල් සඳහා ලියාපදිංචි වන අයවලුන් දින 14ක් ගත වීමට ප්‍රථමව අදාළ ගාස්තුව ගෙවා අවසර බලපත්‍රය ලබා ගත යුතු බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

උපලේඛනය

- මැදදුම්බර ප්‍රාදේශීය සභා ප්‍රදේශයේ පවතින සියලුම නම් කරන ලද
  ත්‍රීරෝද රථ නැවතුම්පළ අවසර පත්‍ර ගාස්තු - වාර්ෂික ගාස්තුව රු. 1,440.00

- මැදදුම්බර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පවතින සියලුම නම් කරන ලද ත්‍රීරෝද රථ නැවතුම්පළ ස්ථාන

1. උඩිස්පත්තුව ත්‍රී රෝද රථ නැවතුම්පල
2. තෙල්දෙණිය බස් නැවතුම්පල අසල ත්‍රී රෝද රථ නැවතුම්පල
3. තෙල්දෙණිය තැපැල් කාර්යාලය අසල ත්‍රී රෝද රථ නැවතුම්පල
4. බිම්පුස්ස ත්‍රී රෝද රථ නැවතුම්පල
5. මොරගහමුල ත්‍රී රෝද රථ නැවතුම්පල
6. මැදමහනුවර ත්‍රී රෝද රථ නැවතුම්පල
7. ඉස්කොලමුදුන ත්‍රී රෝද රථ නැවතුම්පල
8. මැදමහනුවර පල්ලිය අසල ත්‍රී රෝද රථ නැවතුම්පල
9. දුන්හින්න ත්‍රී රෝද රථ නැවතුම්පල
10. සෙනරත්වෙල ත්‍රී රෝද රථ නැවතුම්පල
11. ගැටගහවෙල ත්‍රීරෝද රථ නැවතුම්පල
12. හිජ්රාපුර පල්ලිය අසල ත්‍රී රෝද රථ නැවතුම්පල
13. වෛතලාව ත්‍රී රෝද රථ නැවතුම්පල
14. ඉන්ද්‍රා මානෙල් ත්‍රී රෝද රථ නැවතුම්පල
15. පුටුහපුව ත්‍රී රෝද රථ නැවතුම්පල
16. උඩවෙල මහින්ද වෙළඳසැල ත්‍රී රෝද රථ නැවතුම්පල
17. උඩිස්පත්තුව පල්ලිය අසල ත්‍රී රෝද රථ නැවතුම්පල
18. තෙල්දෙණිය එම. ජේ. ගාමන්ට් අසල ත්‍රී රෝද රථ නැවතුම්පල
19. ඩිපෝව අසල ත්‍රී රෝද රථ නැවතුම්පල
20. රංගල ත්‍රී රෝද රථ නැවතුම්පල
21. එලගොල්ල ත්‍රී රෝද රථ නැවතුම්පල
22. බෝගහපිටිය ත්‍රී රෝද රථ නැවතුම්පල
23. තෙල්දෙණිය උපෝසථාරාමය අසල ත්‍රී රෝද රථ නැවතුම්පල
24. මකුල්දෙනිය මංසන්දිය අසල ත්‍රී රෝද රථ නැවතුම්පල

11 - 510/8

මැදදුම්බර ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා කුලී රථ නවතා තැබීමේ අතුරු ව්‍යවස්ථාවට අනුව ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2023 වර්ෂයේ නොවැම්බර් මස 09 වැනි දින තීරණ අංක 524 යටතේ පහත දැක්වෙන තීරණය ගන්නා ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

චාමින්දි අමදෝරු,
ලේකම්,
මැදදුම්බර ප්‍රාදේශීය සභාව,

2023 නොවැම්බර් මස 09 වැනි දින,
මැදදුම්බර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

1989 අංක 12 දරන පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය 1 වැනි උප වගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු 261 වන අධිකාරිය වන 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා පනතේ) 2 වැනි වගන්තියේ 1 උප වගන්තිය යටතේ මධ්‍යම පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මධ්‍යම පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2016.02.23 වැනි දින අංක 1955/7 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ IV* (අ) වැනි කොටසේ පළ කරනු ලබූ හා මධ්‍යම පළාත් සභාව විසින් අනුමත කොට 2017.05.05 වැනි දින අංක 2017/42 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති *විශෙෂ ගැසට් පත්‍රයේ IV* (අ) වැනි කොටසේ පළ කරනු ලැබූ නිවේදනයන් ප්‍රකාශයට පත් කරන ලද්දා වූ ද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2022.09.02 වැනි දින 2296 අංක දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ IV* (අ) වැනි කොටසේ පළ කළ මැදදුම්බර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ බලාත්මක කරනු ලැබූ කුලී රථ නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාවට අනුව පහත උපලේඛනය පරිදි බලපත්‍ර ගාස්තුවක් 2024 වර්ෂය සඳහා පනවා අය කිරීමට සුදුසු බවට තීරණය කරමි.

උපලේඛනය

- මැදදුම්බර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පවතින සියලුම නම් කරන ලද වෑන් රථ නැවතුම්පළ අවසර පත්‍ර ගාස්තු - වාර්ෂික ගාස්තුව රු. 1,800.00
- මැදදුම්බර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පවතින සියලුම නම් කරන ලද ලොරි රථ නැවතුම්පළ අවසර පත්‍ර ගාස්තු - වාර්ෂික ගාස්තුව රු. 2,000.00

- මැදදුම්බර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පවතින සියලුම නම් කරන ලද වෑන් රථ සහ ලොරි රථ නැවතුම්පළ ස්ථාන

1. තෙල්දෙණිය ඔරලෝසු කණුව අසල ලොරි රථ නැවතුම්පල
2. තෙල්දෙණිය බස් නැවතුම්පල කිරිහල අසල වෑන් රථ නැවතුම්පල

11 - 510/9

මැදදුම්බර ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා කසල ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2023 වර්ෂයේ ඔක්තෝබර් මස 25 වැනි දින තීරණ අංක 482 යටතේ පහත දැක්වෙන තීරණය ගන්නා ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

චාමින්දි අමදෝරු,
ලේකම්,
මැදදුම්බර ප්‍රාදේශීය සභාව,

2023 නොවැම්බර් මස 07 වැනි දින,
මැදදුම්බර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

1989 අංක 12 දරන පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය 1 වැනි උප වගන්තියේ (අ) ඡෙදය සමග කියවිය යුතු 261 වන අධිකාරිය වන 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා පනතේ) 2 වැනි වගන්තියේ 1 උප වගන්තිය යටතේ මධ්‍යම පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මධ්‍යම පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2016.02.28 වැනි දින අංක 1916/42 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ IV* (අ) වැනි කොටසේ පළ කරනු ලබූ හා මධ්‍යම පළාත් සභාව විසින් අනුමත කොට 2015.06.08 වැනි දින අංක 2018/7 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති *විශෙෂ ගැසට් පත්‍රයේ IV* (අ) වැනි කොටසේ පළ කරනු ලද්දාවූ නිවේදනයේ ප්‍රකාශයට පත් කරන ලද්දා වුද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සාජවාදී ජනරජයේ 2022.09.02 වැනි දින 2296 අංක දරන *ගැසට් පත්‍රයේ* පළ කළ මැදදුම්බර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ බලාත්මක කරනු ලැබූ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථාවට අනුව පහත උපලේඛනය පරිදි බලපත්‍ර ගාස්තුවක් 2024 වර්ෂය සඳහා පනවා අය කිරීමට සුදුසු බවට තීරණය කරමි.

මසකට අයකිරීමේ ගාස්තුව

අනු. අංක	කසල වර්ගය	කි. ග්‍රෑ. 10-19 රු.	කි. ග්‍රෑ. 20-29 රු.	කි. ග්‍රෑ. 30-39 රු.	කි. ග්‍රෑ. 40-49 රු.	කි. ග්‍රෑ. 50-99 රු.	කි. ග්‍රෑ. 100-199 රු.	කි. ග්‍රෑ. 200 ට වැඩි රු.
1.	හෝටල්, නිවාඩු නිකේතන, උත්සව ශාලා	500.00	750.00	750.00	1,000.00	2,000.00	4,000.00	6,000.000
2.	මස්, මාළු, කකුල් මස්, බිත්තර වෙළඳසැල්	550.00	800.00	1,200.00	2,200.00	4,200.00	6,200.00	7,700.00
3.	එළවළු පලතුරු වෙළඳසැල්	400.00	600 .00	800.00	1,000.00	1,500.00	2,000.00	3,000.00
4.	සුපර් මාර්කට්	550.00	800.00	1,500.00	2,500.00	4,500.00	6,500.00	8,000.00
5.	කර්මාන්ත ශාලා	400.00	700.00	1,000.00	1,500.00	2,500.00	3,000.00	6,000.00
6.	තේ කඩ/ සිල්ලර හා සාප්පු	400.00	600.00	800.00	1,000.00	1,500.00	2,000.00	3,000.00
7.	රාජ්‍ය ආයතන හා මුල්‍ය ආයතන	550.00	800.00	1,200.00	2,200.00	4,200.00	6,200.00	7,700.00

11 - 510/10

මැදදුම්බර ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා ප්‍රචාරක දැන්වීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථාව සඳහා ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2023 වර්ෂයේ ඔක්තෝබර් මස 26 වැනි දින තීරණ අංක 488 යටතේ පහත දැක්වෙන තීරණය ගන්නා ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2024 වර්ෂය සඳහා පනවන ලද පහත උපලේඛනයේ දැක්වෙන ප්‍රචාරක දැන්වීම් ගාස්තු මැදදුම්බර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ වීථියකට, පාරකට, ඇළකට, වැවකට හෝ අහසට පෙනෙන පරිදි ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීමට පෙර ප්‍රාදේශීය සභාව වෙතින් නිසි අවසරය ලබා ගත යුතු බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

චාමින්දි අමදෝරු,
ලේකම්,
මැදදුම්බර ප්‍රාදේශීය සභාව,

2023 නොවැම්බර් මස 09 වැනි දින,
මැදදුම්බර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

1989 අංක 12 දරන පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තියේ 1 වැනි උප වගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු 261 වන අධිකාරිය වන 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා පනතේ) 2 වැනි වගන්තියේ 1 උප වගන්තිය යටතේ මධ්‍යම පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මධ්‍යම පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2016.02.23 වැනි දින අංක 1955/7 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ IV* (අ) වැනි කොටසේ පළ කරනු ලැබූ හා මධ්‍යම පළාත් සභාව විසින් අනුමත කොට 2017.05.05 වැනි දින අංක 2017/42 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති *විශෙෂ ගැසට් පත්‍රයේ IV* (අ) වැනි කොටසේ පළ කරනු ලැබූ නිවේදනයෙන් ප්‍රකාශයට පත් කරන ලද්දා වූද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2022.09.02 වැනි දින 2296 අංක දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ IV* (අ) වැනි කොටසේ පළ කළ මැදදුම්බර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ බලාත්මක කරනු ලැබූ ප්‍රචාරක දැන්වීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථාවට අනුව පහත උපලේඛනය පරිදි බලපත්‍ර ගාස්තුවක් 2024 වර්ෂය සඳහා පනවා අය කිරීමට සුදුසු බවට තීරණය කරමි.

උපලේඛනය

අනු. අංකය	*විස්තරය*	*වර්ග අඩියකට අය කරනු ලබන බලපත්‍ර ගාස්තුව රු. ශත*
01.	බිත්තියක හෝ පුවරුවක ප්‍රදර්ශනය කරනු ලබන දැන්වීමකට ලිත් වර්ෂයකට	125.00
02.	බිත්තියකට, පුවරුවකට හෝ ලෑල්ලක ආධාරකයක් මගින් ප්‍රදර්ශනය කරනු ලබන ප්‍රතිදීප්ත දැන්වීමකට ලිත් වර්ෂයකට	175.00
03.	ප්‍රදර්ශනය කරනු ලබන තාවකාලික බැනර් සඳහා :	
	i මාසයක් ප්‍රදර්ශනය සඳහා	100.00
	ii මාස 03 ප්‍රදර්ශනය සඳහා	75.00

11 - 510/11

මැදදුම්බර ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා සංචාරක වෙළඳාම කිරීම සම්බන්ධ බලපත්‍ර ගාස්තු පැනවීම

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 9.3 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2023 වර්ෂයේ නොවැම්බර් මස 09 වැනි දින තීරණ අංක 525 යටතේ පහත දැක්වෙන තීරණය ගන්නා ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

චාමින්දි අමදෝරු,
ලේකම්,
මැදදුම්බර ප්‍රාදේශීය සභාව,

2023 නොවැම්බර් මස 09 වැනි දින,
මැදදුම්බර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

1989 අංක 12 දරන පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තියේ 1 වැනි උප වගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු 261 වන අධිකාරිය වන 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා පනතේ) 2 වැනි වගන්තියේ 1 උප වගන්තිය යටතේ මධ්‍යම පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මධ්‍යම පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2016.02.23 වැනි දින අංක 1955/7 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ IV* (අ) වැනි කොටසේ පළ කරනු ලැබූ හා මධ්‍යම පළාත් සභාව විසින් අනුමත කොට 2017.05.05 වැනි දින අංක 2017/42 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති *විශෙෂ ගැසට් පත්‍රයේ IV* (අ) වැනි කොටසේ පළ කරනු ලැබූ නිවේදනයේ ප්‍රකාශයට පත් කරන ලද්දා වූද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2022.09.02 වැනි දින 2296 අංක දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ IV* (අ) වැනි කොටසේ පළ කළ මැදදුම්බර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ බලාත්මක කරනු ලැබූ සංචාරක වෙළඳාම පිළිබඳ අතුරු ව්‍යවස්ථාවට අනුව මැදදුම්බර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පවත්වාගෙන යනු ලබන පහත උපලේඛනයේ සඳහන් පරිදි සංචාරක වෙළඳාම සඳහා බලපත්‍ර ගාස්තුවක් 2024 වර්ෂය සඳහා පනවා අය කිරීමට සුදුසු බවට තීරණය කරමි.

අනු. අංකය		*ගාස්තුව රු.*
1	අත් කරත්තයකින් හෝ කරත්තයක් මගින් වෙළඳාම් කිරීම	1,000.00
2	බයිසිකලයකින් හෝ ට්‍රයිසිකලයක් මගින් වෙළඳාම් කිරීම	1,000.00
3	ත්‍රී රෝද රථයක් මගින් වෙළඳාම් කිරීම	1,250.00
4	වෑන් රථයක් මගින් වෙළඳාම් කිරීම	1,500.00

11 - 510/12

මැදඋම්බර ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා සේවා සඳහා ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2023 වර්ෂයේ නොවැම්බර් මස 09 වැනි දින තීරණ අංක 530 යටතේ පහත දැක්වෙ තීරණය ගන්නා ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

චාමින්දි අමදෝරු,
ලේකම්,
මැදඋම්බර ප්‍රාදේශීය සභාව,

2023 නොවැම්බර් මස 09 වැනි දින,
මැදඋම්බර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

1989 අංක 12 දරන පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තියේ 1 වැනි උප වගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු 261 වන අධිකාරිය වන 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා පනතේ) 2 වැනි වගන්තියේ 1 උප වගන්තිය යටතේ මධ්‍යම පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මධ්‍යම පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2016.02.23 වන දින අංක 1955/7 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ IV* (අ) වැනි කොටසේ පළ කරනු ලැබූ හා මධ්‍යම පළාත් සභාව විසින් අනුමත කොට 2017.05.05 වැනි දින අංක 2017/42 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති *විශෙෂ ගැසට් පත්‍රයේ IV* (අ) වැනි කොටසේ පළ කරනු ලැබූ නිවේදනයෙන් ප්‍රකාශයට පත් කරන ලද්දා වූ ද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සාජවාදී ජනරජයේ 2022.09.02 වැනි දින 2296 අංක දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ IV* (අ) වැනි කොටසේ පළ කළ මැදඋම්බර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ බලාත්මක කරනු ලැබූ සේවා සඳහා ගාස්තු අතුරු ව්‍යවස්ථාවට අනුව පහත උපලේඛනය පරිදි ගාස්තුවක් 2024 වර්ෂය සඳහා අය කිරීමට සුදුසු බවට තීරණය කරමි.

අනු. අංකය	*සේවා වර්ගය*	*ගාස්තුව රු. ශත*
1	**ගොඩනැගිලි ඉදිකිරීම සඳහා වූ සැලසුම් පරීක්ෂා කිරීමට අදාළ ගාස්තු**	
1	පිඹුරුපත් අනුමත කිරීමේ ගාස්තු	1,500.00
2	වීථි රේඛා / ගොඩනැගිලි සීමා හා නොපවරා ගැනීමේ සහතිකයක් නිකුත් කිරීමේ ගාස්තු	1,500.00
3	ගොඩනැගිලි අයදුම්පත්‍ර ගාස්තු	750.00
4	පෙරසැරි ගාස්තු :	
	• **නේවාසික ගොඩනැගිල්ලක**	
	වර්ග අඩි 0 - 1000 දක්වා	1,000.00
	වර්ග 1001 - 2000 දක්වා	2,000.00
	වර්ග අඩි 2000 ට වැඩිවන සෑම වර්ග අඩියකටම	10.00 බැගින්
	• **වාණිජ ගොඩනැගිල්ලක**	
	වර්ග අඩි 1 - 200 දක්වා	1,500.00
	වර්ග 201 - 500 දක්වා	2,000.00
	වර්ග 501 - 2000 දක්වා	4,000.00
	වර්ග අඩි 2000 ට වැඩිවන සෑම වර්ග අඩියකටම	25.00 බැගින්
5	බැම් ඉදිකිරීම සඳහා වර්ග අඩි 01 ට	
6	සම්ප්‍රේෂණ කුළුණු අනුමත කිරීමේ පෙරසැරි ගාස්තු	75,000.00
7	ගොඩනැගිලි අයදුම්පත් අනුමත කර නෙගෙන ඉදිකිරීම් ආරම්භ කර ඇති ගොඩනැගිලි සඳහා දඩ මුදල් අය කිරීම - වර්ග අඩියකට	
	1. අත්තිවාරම් මට්ටම	10.00
	2. බිත්ති මට්ටම	15.00
	3. වහල මට්ටම	25.00

අනු. අංකය	සේවා වර්ගය	ගාස්තුව රු. ශත
8	අයදුම්පත් අනුමත කර නොගෙන ඉදි කිරීම ආරම්භ කර ඇති බැමි සඳහා දඩ මුදල් අය කිරීම - වර්ග අඩියකට	10.00
9	අතිරේක ගොඩනැගිලි සැලසුම් පිටපතක් අනුමත කර දීමේ ගාස්තු	500.00
10	වසර දෙකක් ඉක්මවූ ගොඩනැගිලි සැලැස්මක් එක් වසරකින් කාලය දීර්ඝ කිරීමේ ගාස්තු	1,000.00
11	අනුකූලතා සහතික නිකුත් කිරීමේ ගාස්තු	2,000.00
12	අනු පිටපත් ලබා දීමේ ගාස්තු	500.00
13	කට්ටි ඉඩම් සැලැස්මක් අනුමත කිරීමේදී :	
	ඉඩම් කට්ටි 1 - 10 දක්වා එක් කට්ටියක් සඳහා	500.00
	ඉඩම් කට්ටි 11 - 15 දක්වා එක් කට්ටියක් සඳහා	1,000.00
	ඉඩම් කට්ටි 16 - 20 දක්වා එක් කට්ටියක් සඳහා	1,500.00
	ඉඩම් කට්ටි 21 - 40 දක්වා එක් කට්ටියක් සඳහා	2,000.00
	40 වැඩි සෑම කට්ටියකට ම	2,500.00
	[1]කට්ටි ඉඩම් සැලැස්මක් සඳහා ගෙවිය යුතු අතර එහි විකිණුම් මිලෙන් 1% ක මුදලක් ගෙවන තෙක් තක්සේරුකර ඇති මුදලෙන් 1% ක මුදලක් සහාව වෙත ගෙවිය යුතු වේ.	
14	සැලසුම් ශිල්පීන් ලියාපදිංචි කිරීමේ ගාස්තු	10,000.00
2	**සභාව සතු ගෙඩනැගිලි සහ ක්‍රීඩාංගනය වෙන් කිරීම :**	
	i සර්කස්/සංගීත සංදර්ශන/ විනෝද සැණකෙළි සඳහා දිනකට අයකරන ගාස්තුව	15,000.00
	ii සර්කස්/සංගීත සංදර්ශන සඳහා අපසු ගෙවන ඇප තැන්පතුව	15,000.00
	iii ක්‍රීඩා තරග/රැස්වීම් පැවැත්වීම සඳහා දිනකට අයකරන ගාස්තුව	5,000.00
	iv ක්‍රීඩා තරග/රැස්වීම් පැවැත්වීම සඳහා ආපසු ගෙවනු ලබන ඇප තැන්පතුව	3,000.00
	v තෙල්දෙණිය ශ්‍රවණාගාරය කුලියට දීමේ දිනකට ගාස්තුව	13,000.00
	vi තෙල්දෙණිය ශ්‍රවණාගාරය කුලියට දීමේ වරුවකට ගාස්තුව	6,500.00
	vii තෙල්දෙණිය ශ්‍රවණාගාරය කුලියට දීමේ දී නැවත ගෙවනු ලබන ඇප තැන්පතුව	10,000.00
	viii ප්‍රජාශාලා කුලී ගෙවීම - කාර්යාලය පවත්වාගෙන යාමට ලබා දෙන දීමනාවෙන් 10% කාර්යාල නඩත්තුව සඳහා තබාගෙන ඉතිරිය	
	ix ප්‍රජා ශාලා කුලියට දීම	500.00
	x රජයේ ආයතන සඳහා ශ්‍රවණාගාරය ලබා දීමේ දී දිනකට අය කරන ගාස්තුව	3,000.00
	xi රජයේ ආයතන සඳහා ශ්‍රවණාගාරය ලබා දීමේ දී වරුවකට අය කරන ගාස්තුව	1,500.00
3	**ප්‍රජා ශාලාවල පෙර පාසල් පවත්වාගෙන යාම වෙනුවෙන් ගාස්තු අය කිරීම (මාසික ගාස්තුව)**	
	i පෙර පාසලේ ළමුන් සංඛ්‍යාව 10 අඩු නම් එක් ළමයෙකුගෙන්	50.00
	ii ළමුන් සංඛ්‍යාව 10 වැඩි නම් එක් ළමයකුගෙන්	100.00
4	**කොඩිකණු කුලියට දීම (අඟලේ GI බට)**	
	කොඩිකණු එකක් සඳහා දිනකට ගාස්තු	50.00
	කොඩි කණු ලබා දීම සඳහා තැන්පත් ගාස්තු	1,000.00
5	**ඡායා පිටපත් ලබා දීම**	
	A4 කොළයේ තනිපිට	30.00
	A4 කොළයේ දෙපිට	50.00
	ලීගල් කොළයේ තනිපිට	50.00
	ලීගල් කොළයේ දෙපිට	70.00

අනු. අංකය	*සේවා වර්ගය*	*ගාස්තුව රු. ශත*
	A3 කොළයේ තනිපිට	80.00
	A3 කොළයේ දෙපිට	100.00
6	තවකාලික ගව මස් ප්‍රවාහන බලපත්‍ර මාසික ගාස්තු	1,000.00
7	ගවජීව දාන ගාස්තු/උත්සව සඳහා ගවයෙකු ඝාතනය කිරීම සඳහා අය කරන ගාස්තුව	2,000.00
8	JCB යන්ත්‍රය කුලියට දීමේ පැයකට ගාස්තුව	4,800.00
9	කෘ සැබ් රථය කුලියට දීම	දිස්ත්‍රික් මිල ගණන් අනුව
10	ලොරිය කුලියට දීම	
11	ශ්‍රවනාගාරයේ පවතින ප්ලාස්ටික් පුටු කුලියට දීමේ ගාස්තුව (දිනකට එක් පුටුවක් සඳහා)	20.00
12	ශ්‍රවනාගාරයේ පවතින ප්ලාස්ටික් පුටු කුලියට දීමේ තැන්පත් ගාස්තු :	
	පුටු 25 ක් සඳහා	1,000.00
	පුටු 50 හෝ ඊට වැඩි	2,000.00
	පුටු 100 හෝ ඊට වැඩි	3,000.00
13	ශ්‍රවණාගාරයේ පවතින කුෂන් පුටු කුලියට දීමේ ගාස්තුව දිනකට එක් පුටුවක් සඳහා	50.00
14	ශ්‍රවණාගාරයේ පවතින කුෂන් පුටු කුලියට දීමේ තැන්පත් ගාස්තු	
	පුටු 25 ක් සඳහා	1,500.00
	පුටු 50 හෝ ඊට වැඩි	2,500.00
	පුටු 100 හෝ ඊට වැඩි	3,500.00
15	බල ප්‍රදේශය තුළ අලෙවි ප්‍රවර්ධන කටයුතු සඳහා ජංගම කුටියක් හෝ ජංගම රථයක් යොදා ගැනීම සඳහා එක් දිනකට හෝ ඉන් කොටසකට අය කරන ගාස්තුව :	
	පැය 6 සඳහා	2,000.00
	පැය 6 වැඩි නම්	4,000.00
16	Tent (තහඩු සහිත හට් එක) දිනකට කුලියට ලබා දීමේ ගාස්තුව	1,000.00
17	Tent (තහඩු සහිත හට් එක) තැන්පත් මුදල	5,000.00
18	**මැදදුම්බර ප්‍රාදේශීය සභා දිවා සුරැකුම් මධ්‍යස්ථානය සඳහා ගාස්තු:-**	
	i අයදුම් ගාස්තු	25.00
	ii ලියාපදිංචි ගාස්තු	350.00
	iii මාසික ගාස්තු	
	අවු.1-3 අතර දරුවන් සඳහා	6,000.00
	අවු. 3-5 අතර දරුවන් සඳහා	5,000.00
	අවු. 5-12 අතර දරුවන් සඳහා	4,000.00
	iv පාසල්/පෙර පාසල් අවසන් වී සවස් වරුවට පැමිණෙන දරුවන් සඳහා	3,000.00
19	**මැදදුම්බර ප්‍රාදේශීය සභා ඊ නැණ පියස පරිගණක මධ්‍යස්ථාන ගාස්තු**	
	i ලියාපදිංචි කාරීමේ ගාස්තු	1,000.00
	ii පාඨමාලා ගාස්තු	10,000.00
20	**මැදදුම්බර ප්‍රාදේශීය සභා රණවිරු පෙර පාසල සඳහා ගාස්තු:-**	
	i අයදුම්පත් ගාස්තු	25.00
	ii ලියාපදිංචි ගාස්තු	500.00
	iii මාසික ගාස්තු	750.00

අනු. අංකය	සේවා වර්ගය	ගාස්තුව රු. ශත
21	**පරිසර අංශය මගින් අය කරන ගාස්තු:-**	
	i පරිසර බලපත්‍ර ඉල්ලුම්පත්‍ර ගාස්තු - නව	100.00
	ii පරිසර බලපත්‍ර ඉල්ලුම්පත්‍ර ගාස්තු - අලුත් කිරීමේ දී	50.00
	iii පරිසර බලපත්‍ර ගාස්තු	4,500.00
	iv පරිසර බලපත්‍ර පරීක්ෂණ ගාස්තු	3,000.00
22	තෙල්දෙණිය නගරයේ පල්දෝරු පද්ධතියේ නඩත්තුව සඳහා එක ස්ථානයකට මසකට අය කරණ ගාස්තුව	200.00
23	සැපයුම් කරුවන් ලියාපදිංචි කිරීමේ ගාස්තු	2,000.00
24	කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීමේ අයදුම්පත් ගාස්තු	250.00
25	**කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීමේ ගාස්තු :**	
	i රු. 100,000ට අඩු	1,000.00
	ii රු. 100,000 - 500,000 දක්වා	3,000.00
	iii රු. 500,000 - 1,000,000 දක්වා	5,000.00
	iv රු. 1,000,000 ට වැඩි	10,000.00
26	**ටෙන්ඩර් පෝරම ගාස්තු:-**	
	i තෙල්දෙණිය ගවමස් වෙළඳසැල	2,500.00
	ii උඩිස්පත්තුව කඩ කාමර අංක 1-4	750.00
	iii වේඩරුව කඩ කාමර අංක 1-5	750.00
	iv තෙල්දෙණිය පොදු පොළ	2,500.00
	v මැදමහනුවර සති පොළ	2500.00
	vi උඩිස්පත්තුව සති පොළ	750.00
	vii උඩිස්පත්තුව පොළ ගොඩනැගිල්ලේ ඉහල මහලේ අංක 1 හා 2 කාමර	750.00
	viii තෙල්දෙණිය පොදු වැසිකිලිය	1,000.00
	ix මැදමහනුවර සහ උඩිස්පත්තුව පොදු වැසිකිලි	750.00
27	දුරකථන සම්ප්‍රේෂණ කුළුණු	10,000.00
28	නිර්දේශිත ලිපි නිකුත් කිරීම (එක් ලිපියක් සඳහා)	200.00
29	පාට කොඩි කුලියට ලබා දීම (එක් කොඩියක් සඳහා)	20.00
30	පාට කොඩි කුලියට ලබා දීම (එක් කොඩියක් සඳහා) - තැන්පත් මුදල	1,000.00
31	වැසි ආවරණ කුලියට දීම (එක් දිනකට)	1,000.00
32	වැසි ආවරණ කුලියට දීම (එක් දිනකට) - තැන්පත් මුදල	5,000.00
33	**පුස්තකාල ගාස්තු :**	
	i පුස්තකාල සාමාජික ඇප තැන්පතු - අවුරුදු 12 ට අඩු	100.00
	ii පුස්තකාල සාමාජික ඇප තැන්පතු - අවුරුදු 12 ට වැඩි	150.00
	iii පුස්තකාල සාමාජික ගාස්තු අලුත් කිරීම	50.00
	iv පුස්තකාල සාමාජික ඉල්ලුම්පත්‍ර ගාස්තු	25.00
	v ප්‍රමාද වී භාර දෙන පුස්තකාල පොතක් සඳහා දිනකට අය කරන දඩ මුදල	2.00
	vi අස්ථානගත වූ පුස්තකාල පොතක් සඳහා අය කරන ගාස්තුව පොතේ වර්තමාන වටිනාකම මෙන් දෙගුණයක් හා දෙපාර්තමේන්තු ගාස්තුව ලෙස පොතෙහි වටිනාකමෙන් 25%ක් ගාස්තුවක් අය කරනු ලැබේ.	

අනු. අංකය	*සේවා වර්ගය*	*ගාස්තුව රු. ශත*
34	**මැදදුම්බර ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුල ත්‍රී රෝද රථ සඳහා ගාස්තු:-**	
	i ත්‍රී රෝද රථ අයදුම්පත් ගාස්තු	50.00
	ii ලේඛනයට නම ඇතුළත් කිරීමේ ගාස්තු	2000.00
	iii ත්‍රී රෝද රථ නම් සංශෝධනය ගාස්තුව	500.00
35	**මැදදුම්බර ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුල කුලී රථ (වෑන්/ලොරි) සඳහා ගාස්තු:-**	
	වෑන්/ලොරි රථ අයදුම්පත් ගාස්තු	100.00
	ලේඛනයට නම ඇතුළත් කිරීමේ ගාස්තු	2000.00
	වෑන්/ලොරි රථ නම් සංශෝධනය ගාස්තුව	500.00

36. ජල සබඳතාවක් සඳහා පහත පරිදි ගාස්තු අය කිරීමටත්,

අනු. අංකය	*කාරණය*	*ගාස්තුව*	
		ගෘහමය	*ව්‍යාපාර*
1	ජල අයදුම්පත් ගාස්තු	200.00	200.00
2	ජල මීටර් නොමැති - ජල සැපයුමක් සඳහා අය කරන ගාස්තුව	750.00	1,500.00
3	නව ජල සම්බන්ධතා ලබා දීමේ දී ආරක්ෂිත ඇප තැන්පත	1,500.00	2,000.00
4	නමක් මාරු කිරීමේ දී හා විසන්ධි ජල සැපයුමක් නැවත ලබා දීමේ දී අය කරන සේවා ගාස්තුව	1,500.00	1,500.00
5	හිඟ මත කපා හරින ලද ජල සැපයුම නැවත ලබා දීම අය කරන දඩ ගාස්තු	3,000.00	3,000.00
6	අනවසර ලෙස ජලය ලබා ගැනීම මත කපා හරින ලද සැපයුම් නැවත ලබා දීමේ දඩ මුදල	5,000.00	5,000.00

37. මාර්ගය පළුදු කර ජල නල එලීම සඳහා පහත පරිදි ගාස්තු අය කිරීමටත්,

අනු. අංකය	*කාරණය*	*ගාස්තුව රු.*
1	සේවා ගාස්තුව	1,000.00
2	ආපසු ගෙවන ඇප තැන්පු ගාස්තු	
	1. මාර්ගයට යාබද වලක් පළුදු කිරීම සඳහා ගාස්තු අය කිරීම - වර්ග අඩියකකට	
	(අ) පස් දැමූ මාර්ගය	1,000.00
	(ආ) කොන්ක්‍රීට් මාර්ගය	2,500.00
	(ඇ) තාර මාර්ගය	3,500.00
	2. මාර්ගය හරහා පළුදු කිරීම සඳහා ගාස්තු අය කිරීම - දික් අඩියකට	
	(අ) පස් දැමූ මාර්ගය	1,500.00
	(ආ) කොන්ක්‍රීට් මාර්ගය	2,500.00
	(ඇ) තාර මාර්ගය	5,000.00

38. පාට කොඩි/ජාතික කොඩි/බෞද්ධ කොඩි කුලියට ලබා දීම (එක් කොඩියකට දිනකට) - 10.00
තැන්පත් ගාස්තුව - 1,000.00

කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය සභාව

2024 වර්ෂයට බලපත්‍ර ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වැනි වගන්තිය යටතේ කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2023 සැප්තැම්බර් මස 04 වැනි දින පවත්වන ලද ප්‍රාදේශීය සභාවේ මූල්‍ය හා කළමනාකරණ කමිටු රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බවට මෙයින් නිවේදනය කරමි.

එල්. ජී. රෝෂිණී ජයසිංහ,
ලේකම්,
කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය සභාව.

2023 සැප්තැම්බර් මස 04 වැනි දින,
කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය සභාවේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත යටතේ කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව එකී පනතේ හෝ එකී පනත යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විස්තර කර ඇති මෙහි පහත උපලේඛනයෙහි I වැනි තීරුවේ නියමිත යම් කාර්යයක් සඳහා කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත යම් ස්ථානයක් හෝ පරිශ්‍රයක් පාවිච්චි කිරීමට බලය දෙමින් 2023 වර්ෂයේ නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් සම්බන්ධයෙන් එම උපලේඛනයේ II වැනි තීරුවේ අනුරූප සටහනේ නිරූපිත බලපත්‍ර ගාස්තුවක් 2024 වර්ෂය සඳහා නියම විය යුතු බවට ද,

තව ද, එකී ස්ථානය හෝ පරිශ්‍රය 1968 අංක 14 දරන සංචාරක මණ්ඩල පනතේ කාර්ය සඳහා සංචාරක මණ්ඩලයේ අනුමත කර ඇති පිළිගෙන ඇති හෝටලයක්, ආපන ශාලාවක් නවාතැන් පළක් වන විට දී ඊට අදාළ බලපත්‍ර ලබා දීමේදී එම ස්ථානයේ හෝ පරිශ්‍රයේ 2023 වර්ෂයේ ආදායමින් 1% ක මුදලක් බලපත්‍ර ගාස්තුවක් ලෙස 2024 වර්ෂය සඳහා ගෙවිය යුතු බවට යෝජනා කරමි.

උපලේඛනය

1 වැනි තීරුව	*II වැනි තීරුව*		
බලපත්‍රයෙන් බලය දෙනු ලබන කාර්යය	*පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම*		
	රු. 750 නොඉක්මවන අවස්ථාවක	*රු. 751 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,501 ඉක්මවන අවස්ථාවක*
	රු. ශත	*රු. ශත*	*රු. ශත*
1. ලැගුම් නිවාසයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
2. බත් කඩයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
3. ආපන ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
4. තේ කඩයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
5. කෝපි කඩයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
6. බේකරියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
7. කිරි පට්ටියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
8. කිරි විකිණීම	500 0	750 0	1,000 0

1 වැනි තීරුව	*11 වැනි තීරුව*		
බලපත්‍රයෙන් බලය දෙනු ලබන කාර්යය	*පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම*		
	රු. 750 නොඉක්මවන අවස්ථාවක	*රු. 751 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,501 ඉක්මවන අවස්ථාවක*
	රු. ශත	*රු. ශත*	*රු. ශත*
9. මාළු විකිණීම	500 0	750 0	1,000 0
10. මස් විකිණීම	500 0	750 0	1,000 0
11. අයිස් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
12. සිසිල් බීම කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
13. ලොන්ඩරියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
14. ගව ගාලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
15. පෞද්ගලික වෙළඳ සැලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
16. කොණ්ඩා සැකසීමේ සැලුන් හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
17. බාබර් සාප්පුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
18. ගෝ ඝාතක ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
19. වඩු මඩු පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

11-491/1

කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය සභාව

2024 වර්ෂයට කර්මාන්ත බද්ද පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තිය යටතේ කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2023 සැප්තැම්බර් මස 04 වැනි දින පවත්වන ලද ප්‍රාදේශීය සභාවේ මූල්‍ය හා කළමනාකරණ කමිටු රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බවට මෙයින් නිවේදනය කරමි.

එල්. ජී. රෝමිණි ජයසිංහ,
ලේකම්,
කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය සභාව.

2023 සැප්තැම්බර් මස 04 වැනි දින,
කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය සභාවේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තියේ (1) උප වගන්තියෙන් කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක පවත්වාගෙන යනු ලබන මෙහි පහත උපලේඛනයෙහි 1 වැනි තීරුවේ නිරූපිත සෑම කර්මාන්තයක් සම්බන්ධයෙන් එම උපලේඛනයෙහි II වැනි තීරුවේ අනුරූප සටහනේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2024 වර්ෂය සඳහා පනවා අයකළ යුතු බවට යෝජනා කරමි.

උපලේඛනය

		I වැනි තීරුව *කර්මාන්තයේ ස්වභාවය*	*II වැනි තීරුව* *බලපත්‍රයෙන් බලය දෙනු ලබන කාර්යයය*		
		රු. 750 නොඉක්මවන අවස්ථාවක	*රු. 751 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,501 ඉක්මවන අවස්ථාවක*	
		රු. ශත	*රු. ශත*	*රු. ශත*	
1.	ඔරලෝසු අලුත්වැඩියාව	500 0	750 0	1,000 0	
2.	ගුවන් විදුලි/රූපවාහිනී අලුත්වැඩියාව	500 0	750 0	1,000 0	
3.	කොන්ක්‍රීට් ගල් හෝ සිමෙන්ති භාණ්ඩ නිෂ්පාදනය	500 0	750 0	1,000 0	
4.	පැල තවාන් හා බෙදා හැරීම	500 0	750 0	1,000 0	
5.	විසිතුරු මල් පැල වර්ග විකිණීම	500 0	750 0	1,000 0	
6.	රස කැවිලි අලෙවිය	500 0	750 0	1,000 0	
7.	කුළු බඩු අලෙවිය	500 0	750 0	1,000 0	
8.	යෝගට් නිෂ්පාදනය හා අලෙවි කිරීම	500 0	750 0	1,000 0	
9.	බිම්මල් නිෂ්පාදනය හා අලෙවි කිරීම	500 0	750 0	1,000 0	
10.	දූල් ආම්පන්න විකිණීම	500 0	750 0	1,000 0	

11-491/2

කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය සභාව

2024 වර්ෂයට ව්‍යාපාර බද්දක් පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වැනි වගන්තිය යටතේ කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2023 සැප්තැම්බර් මස 04 වැනි දින පවත්වන ලද ප්‍රාදේශීය සභාවේ මූල්‍ය හා කළමනාකරණ කමිටු රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බවට මෙයින් නිවේදනය කරමි.

එල්. ජී. රෝෂිණී ජයසිංහ,
ලේකම්,
කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය සභාව.

2023 සැප්තැම්බර් මස 04 වැනි දින,
කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය සභාවේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වැනි වගන්තියෙහි (1) වැනි උපවගන්තිය යටතේ කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව, එකී පනතේ හෝ එම පනතේ ඒ යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථා විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබාගැනීම හෝ එම පනතේ 150 වැනි වගන්තිය යටතේ යම් බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ යම් ව්‍යාපාරයක් කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2024 වර්ෂයේ දී පවත්වාගෙන යන සෑම තැනැත්තෙකුගෙන් ම එම ව්‍යාපාරයේ 2024 වර්ෂයේ ආදායම මෙහි පහත උපලේඛනයෙහි I වැනි තීරුවේ නිරූපිත යම් විෂය අංකයක සීමාවන් ඇතුළත පවතින අවස්ථාවක එකී II වැනි තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත අනුප්‍රමාණයක ව්‍යාපාර බද්දක් 2024 වර්ෂය සඳහා පනවා අය කිරීමට සහ (3) වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර බද්දට යටත් වන සෑම තැනැත්තෙකු විසින් ම යටොක්ත බද්ද 2024.03.31 වැනි දිනට ප්‍රථම ගෙවිය යුතු යැයි යෝජනා කරමි.

උපලේඛනය

	I වැනි තීරුව *2024 වර්ෂයේ දී ව්‍යාපාර ආදායම*	*II වැනි තීරුව* *රු. ශත*
01.	රු. 6,000 නොඉක්මවන අවස්ථාවක	කිසිවක් නැත
02.	රු. 6,001 ඉක්මවන එහෙත් රු. 12,000 නොඉක්මවන අවස්ථාවක	90 0
03.	රු. 12,001 ඉක්මවන එහෙත් රු. 18,750 නොඉක්මවන අවස්ථාවක	180 0
04.	රු. රු.18,751 ඉක්මවන එහෙත් රු. 75,000 නොඉක්මවන අවස්ථාවක	360 0
05.	රු. 75,001 ඉක්මවන එහෙත් රු. 1,50,000 නොඉක්මවන අවස්ථාවක	1,200 0
06.	රු. 1,50,001 ඉක්මවන අවස්ථාවක	3,000 0

11-491/3

කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය සභාව

2024 වර්ෂයට අන්තරාදායක වෙළඳාම සඳහා බලපත්‍ර ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන ප්‍රකාරව කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2024 වර්ෂයට අදාළව අන්තරායකර වෙළඳාම කිරීම සඳහා ගාස්තු අය කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට 2023 සැප්තැම්බර් මස හතර වැනි දින පවත්වන ලද ප්‍රාදේශීය සභාවේ මූල්‍ය හා කළමනාකරණ කමිටු රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බවට මෙයින් නිවේදනය කරමි.

එල්. ජී. රෝෂිණී ජයසිංහ,
ලේකම්,
කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය සභාව.

2023 සැප්තැම්බර් මස 04 වැනි දින,
කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය සභාවේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වැනි වගන්තිය හා 126 වැනි වගන්තිය යටතේ කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව උතුරු මැද පළාත් සභාව මගින් පිළිගන්නා ලදුව 1992.02.28 වැනි දින අංක 704 දරන *ගැසට් පත්‍රයේ* පළකර වැළඳ ගන්නා ලද්දා වූ එම සම්මත අතුරු ව්‍යවස්ථාවේ 21 වැනි ඡේදය යටතේ කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය සභා සීමාව තුළ අන්තරාදායක වෙළෙඳාම් කිරීම වෙනුවෙන් මෙහි පහත උපලේඛනයේ සඳහන් මුදලක් කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට යෝජනා කරමි.

උපලේඛනය

අනු. අංකය	*I වැනි තීරුව* *ව්‍යාපාරයේ ස්වභාවය*	*II වැනි තීරුව* *බලපත්‍රයෙන් බලය දෙනු ලබන කාර්යය* *රු. 750 නොඉක්මවන අවස්ථාවක* *රු. ශත.*	*රු. 751 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක* *රු. ශත.*	*රු.1,501 ඉක්මවන අවස්ථාවක* *රු. ශත*
1.	කලුගල් වැඩපල	500 0	750 0	1,000 0
2.	මෝටර් රථ අමතර කොටස්	500 0	750 0	1,000 0
3.	පාපැදි වෙළඳාම	500 0	750 0	1,000 0
4.	පාපැදි අමතර කොටස්	500 0	750 0	1,000 0

I වැනි තීරුව *II වන තීරුව*

බලපත්‍රයෙන් බලය දෙනු ලබන කාර්යය

අනු. අංකය	*ව්‍යාපාරයේ ස්වභාවය*	*රු. 750 නොඉක්මවන අවස්ථාවක*	*රු. 751 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු.1,501 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත.	*රු. ශත.*	*රු. ශත*
5.	බුලත් පුවක් වෙළඳාමේ ස්ථානයක්	500 0	750 0	1,000 0
6.	රබර් සීල්/නාම පුවරු නිපදවන ස්ථානයක්	500 0	750 0	1,000 0
7.	ජල නළ පද්ධති/විදුලි කාර්මික සේවා ස්ථානයක්	500 0	750 0	1,000 0
8.	ලී කැටයම් සෑදීම සහ අලෙවි කිරීම	500 0	750 0	1,000 0
9.	වැද්දුම් හා පින්තාරු කිරීම	500 0	750 0	1,000 0
10.	කෘමිනාශක අලෙවිය	500 0	750 0	1,000 0
11.	පොහොර වෙළඳාම	500 0	750 0	1,000 0
12.	පින්තූර රාමු කිරීම	500 0	750 0	1,000 0
13.	ශීතකරණ අලුත්වැඩියාව	500 0	750 0	1,000 0
14.	අබලි බඩු එකතු කිරීම	500 0	750 0	1,000 0
15.	ලියවන පට්ටල පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
16.	ලී වෙළඳ සැල	500 0	750 0	1,000 0
17.	විදුලි උපකරණ අළුත්වැඩියාව	500 0	750 0	1,000 0
18.	යතුරු පැදි අළුත්වැඩියාව	500 0	750 0	1,000 0
19.	පොල්තෙල් මෝල්	500 0	750 0	1,000 0
20.	පාපැදි අලුත්වැඩියාව	500 0	750 0	1,000 0
21.	බැටරි චාජ් කිරීම	500 0	750 0	1,000 0
22.	කම්මල්	500 0	750 0	1,000 0
23.	ගරාජ පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
24.	වෑල්ඩින් වැඩපල	500 0	750 0	1,000 0
25.	ගෑස් සිලින්ඩර් අලෙවිය	500 0	750 0	1,000 0
26.	මුද්‍රණාලයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
27.	අළු හුණු විකිණීම	500 0	750 0	1,000 0
28.	පිඟන් ගඩොල් විකිණීම	500 0	750 0	1,000 0
29.	විදුලි මංපෙත් එළිපෙහෙළි කිරීම	500 0	750 0	1,000 0
30.	යකඩ බඩු	500 0	750 0	1,000 0
31.	සිමෙන්ති අලෙවිය	500 0	750 0	1,000 0
32.	රෙකෝඩ් බාර් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
33.	වී මෝල්	500 0	750 0	1,000 0
34.	ටයර් හා ටියුබ් වෙළඳාම	500 0	750 0	1,000 0
35.	උළු, සෙවිලි තහඩු, ඇස්බැස්ටස් අලෙවිය	500 0	750 0	1,000 0
36.	භූමිතෙල් අලෙවිය/ඩීසල් අලෙවිය	500 0	750 0	1,000 0
37.	සිල්ලර වෙළඳසැලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
38.	වඩු මඩුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
39.	ධාන්‍ය ඇඹරුම්හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
40.	සත්ත්ව ආහාර අලෙවිය	500 0	750 0	1,000 0

කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය සභාව

2024 වර්ෂයට කසළ ශෝධන ගාස්තුවක් පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතට ප්‍රකාරව කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2024 වර්ෂයට අදාළව කසළ ශෝධන ගාස්තුවක් නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට 2023 සැප්තැම්බර් මස 04 වැනි දින පවත්වන ලද ප්‍රාදේශීය සභාවේ මූල්‍ය හා කළමනාකරණ කමිටු රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බවට මෙයින් නිවේදනය කරමි.

එල්. ජී. රෝෂිණී ජයසිංහ,
ලේකම්,
කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය සභාව.

2023 සැප්තැම්බර් මස 04 වැනි දින,
කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය සභාවේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වැනි වගන්තිය හා 126 වගන්තිය යටතේ කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, උතුරු මැද පළාත් සභාව මගින් පිළිගන්නා ලදුව, 1992.02.28 වැනි දින අංක 704 දරන *ගැසට් පත්‍රයේ* පළකරන ලද්දා වූ කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය සභාව මගින් 1994.05.20 වැනි දින *ගැසට් පත්‍රයේ* පළ කර වැළඳ ගන්නා ලද්දා වූ එම සම්මත අතුරු ව්‍යවස්ථාවේ 09 වැනි අතුරු ව්‍යවස්ථාව පරිදි කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය සභා සීමාව තුළ කසළ ශෝධන ගාස්තු වශයෙන් බල ප්‍රදේශයේ නගර සීමාව තුළ පිහිටි සියලුම වෙළෙඳ හා ව්‍යාපාරික ස්ථානවලින් වාර්ෂිකව රු. 1,200.00 සිට රු. 100,000.00 දක්වා වූ ගාස්තුවක් කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතු බවට යෝජනා කරමි.

	I වැනි තීරුව	*II* වැනි තීරුව
1.	සිල්ලර වෙළඳසැල් සඳහා	රු. 1,200
2.	ආපන ශාලා සඳහා	රු. 1,200 සිට රු. 5,000 දක්වා
3.	ඇඟලුම් කර්මාන්ත ශාලා සඳහා	රු. 80,000 සිට රු. 1,00,000 දක්වා
4.	නේවාසික ස්ථාන	රු. 1,200 සිට 5,000 දක්වා
5.	නේවාසිකාගාර	රු. 1,200 සිට 5,000

11-491/5

කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය සභාව

2024 වර්ෂයට පුස්තකාල පිළිබඳ ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන ප්‍රකාරව කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2024 වර්ෂයට අදාළව පුස්තකාල ඇප තැන්පතුවක් හා දඩ මුදලක් නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට 2023 සැප්තැම්බර් මස 04 වැනි දින පවත්වන ලද ප්‍රාදේශීය සභාවේ මූල්‍ය හා කළමනාකරණ කමිටු රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බවට මෙයින් නිවේදනය කරමි.

එල්. ජී. රෝෂිණී ජයසිංහ,
ලේකම්,
කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය සභාව.

2023 සැප්තැම්බර් මස 04 වැනි දින,
කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය සභාවේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වැනි වගන්තිය හා 126 වැනි වගන්තිය යටතේ කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, උතුරු මැද පළාත් සභාව මගින් පිළිගන්නා ලදුව, 1992.02.28 වැනි දින අංක 704 දරන *ගැසට් පත්‍රයේ* පළකරන ලද්දා වූ කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය සභාව මගින් 1994.05.20 වැනි දින *ගැසට් පත්‍රයේ* පළකර වැළඳ ගන්නා ලද්දා වූ එම සම්මත අතුරු ව්‍යවස්ථාවේ 36 වැනි ඡේදය යටතේ පුස්තකාල ලියාපදිංචි ගාස්තු හා දඩ මුදල් වශයෙන් 2024 වර්ෂය සඳහා මෙහි පහත උපලේඛනයේ සඳහන් මුදල් කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතු බවට යෝජනා කරමි.

උපලේඛනය

I වැනි තීරුව	*II වැනි තීරුව*
පුස්තකාලය සඳහා වාර්ෂික ලියාපදිංචි ගාස්තුව :	*රු. ශත*
01. ශිෂ්‍ය	50 0
02. වැඩිහිටි	100 0
03. ආපසු භාර දිය යුතු දිනය ඉක්මවූ විට දිනක දඩ මුදල	0 50

11-491/6

කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය සභාව

2024 වර්ෂයට ප්‍රචාරක, දෘෂ්‍ය පරිසරය පිළිබඳ ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන ප්‍රකාරව කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2024 වර්ෂයට අදාළව ප්‍රචාරක දෘෂ්‍ය පරිසරය පිළිබඳ ගාස්තුවක් නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට 2023 සැප්තැම්බර් මස 04 වැනි දින පවත්වන ලද ප්‍රාදේශීය සභාවේ මූල්‍ය හා කළමනාකරණ කමිටු රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බවට මෙයින් නිවේදනය කරමි.

එල්. ජී. රෝෂිණී ජයසිංහ,
ලේකම්,
කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය සභාව.

2023 සැප්තැම්බර් මස 04 වැනි දින,
කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය සභාවේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වන වගන්තිය හා 126 වන වගන්තිය යටතේ කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, උතුරු මැද පළාත් සභාව මගින් පිළිගන්නා ලදුව, 1992.02.28 වැනි දින අංක 704 දරන *ගැසට් පත්‍රයේ* පළකරන ලද්දා වූ කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය සභාව මගින් 1994.05.20 වැනි දින *ගැසට් පත්‍රයේ* පළකර වැළඳ ගන්නා ලද්දා වූ එම සම්මත අතුරු ව්‍යවස්ථාවේ 39 වැනි ඡේදය යටතේ කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය සභා සීමාව තුළ ප්‍රචාරක දැන්වීම්, ඉදිකිරීම් හා ප්‍රදර්ශනය කිරීම වෙනුවෙන් මෙහි පහත උපලේඛනයේ සඳහන් මුදල් කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතු බවට යෝජනා කරමි.

උපලේඛනය

බැනර් ප්‍රදර්ශන ගාස්තු කටවුට් සඳහා	*කටවුට් වර්ග අඩි 1කට රු. ශත*	*බැනර් වර්ග අඩි 1කට රු. ශත*
01. දින 14 දක්වා	25 0	25 0
දින 14 සිට දින 30 දක්වා	50 0	50 0
දින 30ට වැඩි උපරිම මාස 6 දක්වා	100 0	100 0
02. නාම පුවරු සඳහා වාර්ෂිකව	200 0	200 0
03. දිවා රාත්‍රී විදුලි ආලෝක නාම පුවරු සඳහා වර්ෂයකට	500 0	500 0
04. වෙළෙඳ ප්‍රචාරක දැන්වීම් පුවරු සහ සාමාන්‍ය නාම පුවරු සඳහා වර්ෂයකට	150 0	150 0

11-491/7

කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය සභාව

2024 වර්ෂයට සේවා සඳහා ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන ප්‍රකාරව කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2024 වර්ෂයට අදාළව සේවා සඳහා ගාස්තුවක් නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට 2023 සැප්තැම්බර් මස 04 වැනි දින පවත්වන ලද ප්‍රාදේශීය සභාවේ මූල්‍ය හා කළමනාකරණ කමිටු රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බවට මෙයින් නිවේදනය කරමි.

එල්. ජී. රෝෂිණී ජයසිංහ,
ලේකම්,
කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය සභාව.

2023 සැප්තැම්බර් මස 04 වැනි දින,
කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය සභාවේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත යටතේ කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය සභාව මගින් 2024 වර්ෂයේ සපයනු ලබන සේවාවන් සඳහා වන ගාස්තු 1 උපලේඛනයේ සඳහන් ආකාරයට විය යුතු බවට හා එම සේවාවන් සපයා ගැනීම වෙනුවෙන් අදාළ ගාස්තු කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතු බවට යෝජනා කරමි.

උපලේඛනය

I වැනි තීරුව		*II වැනි තීරුව*
		රු. ශත
01.	ගොඩනැගිලි අයදුම්පත්‍ර ගාස්තු (වෙළෙඳ)	1,000 0
02.	ගොඩනැගිලි අයදුම්පත්‍ර ගාස්තු (නිවාස)	1,000 0
03.	අවසර ගැනීමකින් තොරව කරන ලද ඉදිකිරීම් සඳහා දඩ වශයෙන් අයකරනු ලබන ගාස්තු	10,000 0
04.	ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීමේ පෙරසැරි ගාස්තු පහත පරිදි :	
I.	ව්‍යාපාරික කාර්යයන් සඳහා වූ ගොඩනැගිලි සැළසුම් අනුමත කිරීමේ ගාස්තු (වර්ග අඩි 01ක් සඳහා)	05 0
II.	ව්‍යාපාරික නොවන කාර්යයන් සඳහා වූ ගොඩනැගිලි සැළසුම් අනුමත කිරීමේ ගාස්තු (වර්ග අඩි 01ක් සඳහා)	02 50
III.	මායිම් තාප්ප/ආරක්ෂක බැමි ඉදිකිරීම	

මායිම් තාප්ප ඉදිකිරීමේ සීමාව	*මායිම් තාප්පයේ දිග මීටර් 01ක් සඳහා ගාස්තුව*	
	නේවාසික	*වාණිජ හා වෙනත් වර්ග*
	රු. ශත	*රු. ශත*
ගොඩනැගිලි සීමාව ඇතුළත	300 0	400 0
ගොඩනැගිලි සීමාව මත	500 0	600 0

05.	අනුකූලතා සහතික නිකුත් කිරීමේ ගාස්තු	1,200 0
06.	වීරීරේඛා සහතික හා නොපරවා ගැනීමේ සහතික නිකුත් කිරීමේ ගාස්තු	1,200 0
07.	වෙනත් සහතික සහ අවසර ලිපි නිකුත් කිරීමේ ගාස්තු	750 0
08.	පිඹුරු පිටපතක් අනුමත කිරීමේ ගාස්තු	1,200 0
09.	පරිසර බලපත්‍ර අයදුම්පතක් නිකුත් කිරීමේ ගාස්තු	100 0
10.	පරිසර බලපත්‍ර අලුත් කිරීමේ අයදුම්පතක් නිකුත් කිරීමේ ගාස්තු	50 0

		I වැනි තීරුව	*II වැනි තීරුව*
			රු. ශත
11.			
	(i) පරිසර බලපත්‍ර නිකුත් කිරීමේ බලපත්‍ර ගාස්තු (වසර 3ක් සඳහා)	4,000	0
	(ii) පරිසර බලපත්‍ර නිකුත් කිරීම සඳහා පරීක්ෂණ ගාස්තු (ජාතික පාරිසරික පනතේ විධිවිධාන පරිදි (පරීක්ෂණ ගාස්තුවෙන් 50% පරීක්ෂණ කණ්ඩායමට සමසේ ගෙවනු ලැබේ.)		
12.	දීර්ඝ කාලීන බලපත්‍ර නිකුත් කිරීම සඳහා එකඟතා සහතික ලබා දීමේ ගාස්තු	1,500	0
13.	සියලුම සහතික නිකුත් කිරීම සඳහා පරීක්ෂණ ගාස්තු	500	0
14.	පාපැදි බලපත්‍ර නිකුත් කිරීම - ලිපි ද්‍රව්‍ය ගාස්තු	10	0
15.	කර්මාන්ත ගිවිසුම් කට්ටලයක් නිකුත් කිරීම සඳහා ගාස්තු	1,000	0
16.	I. අයාලයේ යන ගවයින් ඇල්ලීම වෙනුවෙන් ගාස්තු (බලපත්‍රලාභීන් වෙනුවෙන් ගෙවනු ලැබේ.)	500	0
	II. අයාලයේ යන ගවයන් අල්ලා ආරක්ෂා කිරීම වෙනුවෙන් කණු ගාස්තු (දිනකට, එක් ගවයෙකු සඳහා)	200	0
	III. අයාලයේ යන ගවයන් අල්ලා නඩත්තු කිරීම වෙනුවෙන් අය කරන ගාස්තු (දිනකට, එක් ගවයෙකු සඳහා)	200	0
17.	අයාලයේ යන ගවයින් ඇල්ලීම වෙනුවෙන් අය කරනු ලබන පරිපාලන හා වෙනත් ගාස්තු (එක් ගවයෙකු සඳහා ඇල්ලීමේ ගාස්තු, කණු ගාස්තු නඩත්තු ගාස්තු බලපත්‍රලාභීන් වෙත නිදහස් කරනු ලැබේ.)	1,000	0
18.	අයාලයේ යන ගවයින් ඇල්ලීම සඳහා බලපත්‍ර නිකුත් කිරීම සඳහා අය කරනු ලබන ගාස්තු	500	0
19.	වාණිජ කටයුතු සඳහා බණිජ වර්ග ප්‍රවාහනය කිරීමට ප්‍රාදේශීය සභාව සතු මාර්ග භාවිතා කිරීම වෙනුවෙන් කියුබ් 01 ක් සඳහා අය කරනු ලබන ගාස්තු (එක් වරකට)	150	0
20.	වාණිජ නොවන කටයුතු සඳහා බණිජ වර්ග ප්‍රවාහනය කිරීමට ප්‍රාදේශීය සභාව සතු මාර්ග භාවිතා කිරීම වෙනුවෙන් කියුබ් 01 ක් සඳහා අයකරනු ලබන ගාස්තු (එක් වරකට)	100	0
21.	ට්‍රැක්ටර් රථය කුළියට දීම ට්‍රෙලරය සමග දිනකට (ඉන්ධන හා රියදුරු සමග)	9,000	0
22.	ට්‍රැක්ටර් රථය කුළියට දීම ට්‍රෙලරය රහිත දිනකට (ඉන්ධන හා රියදුරු සමග)	8,000	0
23.	ජල බවුසරය කුළියට දීම ට්‍රැක්ටරය සහිතව (ඉන්ධන හා රියදුරු සමග)	10,000	0
24.	ආගමික කටයුතු සඳහා ගවයෙකු ඝාතනය කරගැනීමේ ගාස්තු	1,500	0
25.	බවුසරය මගින් පිරිපහදු කළ ජලය ප්‍රවාහනය කරදීමට අයකරනු ලබන ගාස්තු ලීටර් එකක් සඳහා	2	0
26.	බවුසර් මගින් ළිං ජලය ප්‍රවාහනය කිරීම අයකරනු ලබන ගාස්තු ලීටර් එකක් සඳහා (පානීය නොවන කටයුතු සඳහා)	1.00	
27.	බවුසරය මගින් උල්පත් ජලය ප්‍රවාහනය කරදීමට අයකරනු ලබන ගාස්තු ලීටර් එකක් සඳහා	1.50	
28.	RO මධ්‍යස්ථානයේ දී අළෙවි කරන ජලය ලීටර් එකක් සඳහා අය කිරීම	1.50	
29.	ජල බවුසරය කුළියට දීම ට්‍රැක්ටරය රහිතව (දිනකට)	3,000	0
30.	ගලි බවුසරයේ සේවා (වැසිකිළි අපද්‍රව්‍ය ගලි ට්‍රැක්ටර් ටැංකි 01 ඉවතලීම) සඳහා	7,500	0
31.	ගලි සේවා නොවන (හෝටල් ආදියෙහි ඉඳුල් ජලය ඉවතලීම, ගලි ට්‍රැක්ටර් ටැංකි 01ක් සඳහා)	6,000	0
32.	ගලි බවුසරයේ සේවා ගාස්තුවෙන් රුපියල් 2,000 0 සෞඛ්‍ය කම්කරු වෙත ගෙවනු ලැබේ. (ගලි ට්‍රැක්ටර් ටැංකි 01ක් සඳහා)	2,000	0
33.	ගලි බවුසරයේ ප්‍රවාහනය සඳහා දුර අනුව කිලෝමීටර් පහකින් පසුව අමතරව අය කරනු ලබන ගාස්තු කිලෝ මීටර් 01 සඳහා	75	0
34.	ජල බවුසරය සැපයීම (මංගල කටයුතුවලදී) දින 01කට	1,500	0
35.	ජල බවුසරය සැපයීම (මංගල) දින 1කට කි. මී. 03කින් පසු අමතර කි. මී. 01 ක් සඳහා අය කරන ගාස්තු	40	0

	I වැනි තීරුව	*II වැනි තීරුව*
		රු. ශත
36.	රැස්වීම් ශාලාව කුළියට දීම දින 01කට	4,000 0
37.	බැකෝ ලෝඩර් යන්ත්‍රය කුළී පදනම මත සේවයේ යෙදවීම (ප්‍රවාහන කාලය ඇතුළුව) මීටර් පැය 01ක් සඳහා අයකරනු ලබන ගාස්තු	7,000 0
38.	ටිපර් රථය (කියුබ් 2.5) කුළී පදනම මත සේවයේ යෙදවීම (දිනකට පැය 08) සහ බල ප්‍රදේශය තුළ	20,000 0
39.	ටිපර් රථය (කියුබ් 2.5) නගර සීමාව තුළ කුළී පදනම මත සේවයේ යෙදවීම (එක් වරකට)	2,700 0
40.	ටිපර් රථය (කියුබ් 2.5) නගර සීමාවෙන් එපිට කුළී පදනම මත සේවයේ යෙදවීම කිලෝමීටර් එකක් සඳහා	375 0
41.	වෙළෙඳ ප්‍රවර්ධන ප්‍රචාරක කුටියක් සඳහා දෛනික ගාස්තු	2,000 0
42.	නගරයේ තාවකාලික වෙළෙඳ කුටිවලින් අයකරනු ලබන ගාස්තු (සතියකට)	150 0
43.	සෑම චිත්‍රපට සංදර්ශනයක්, මැජික් සංදර්ශනයක්, සර්කස් සංදර්ශනයක්, කතුරු ඔන්චිල්ලා, මාරක ළිඳේ මෝටර් සයිකල් ධාවනය වැනි ඕනෑම සැණකෙළි සංදර්ශන පැවැත්වීම වෙනුවෙන් අය කරනු ලබන ගාස්තු (මුද්‍රණය කරනු ලබන ප්‍රවේශපත්‍රයේ සඳහන් වටිනාකමින්)	10%
44.	මහජන ක්‍රීඩාංගනය විවිධ වැඩසටහන් උත්සව සඳහා ලබාදීම (පාසල් ළමුන් ඇතුළත් වන්නේ නම්) දිනකට අයකරනු ලබන ගාස්තු	1,000 0
45.	මහජන ක්‍රීඩාංගනය වෙළෙඳ ප්‍රවර්ධන හෝ වෙනත් උත්සව සැණකෙළි සඳහා ලබාදීම දිනකට අයකරනු ලබන ගාස්තු	3,000 0
46.	වෙළෙඳ කටයුතු සඳහා පැමිණි නගර සීමාව තුළ නවතා තබනු ලබන වාහනවලින් අයකරනු ලබන ගාස්තු දිනකට (වෑන් සහ ලොරි රථ වලින් වරුවක් සඳහා)	50 0
47.	වෙළෙඳ කටයුතු සඳහා පැමිණි නගර සීමාව තුළ නවතා තබනු ලබන වාහනවලින් අයකරනු ලබන ගාස්තු දිනකට (ත්‍රී රෝද රථ)	30 0
48.	ඉරිදා සතිපොළ දිනයේදී සතිපොළ ඉදිරිපිට පෞද්ගලික යතුරුපැදි නවතා තැබීම වෙනුවෙන් අයකරනු ලබන ගාස්තු	20 0
	● ත්‍රීරෝද රථ හා වෙනත් වාහන නවතා තැබීම වෙනුවෙන්	50 0
49.	නගරයේ සුසාන භූමි වෙන් කර ගැනීමේ ගාස්තු,	
	● මෘත දේහ ආදාහනය කිරීමේ ගාස්තු	1,000 0
	● සොහොන් කොත බැඳීමේ ගාස්තු	1,500 0
50.	ගල් රෝලය ලබාදීමේ ගාස්තු (මීටර් පැය 1 ඉන්ධන රහිතව)	2,500 0
51.	ගල් රෝලය ලබාදීමේ ගාස්තු (මීටර් පැය 1 ඉන්ධන සහිතව)	7,000 0
52.	නිවාස/ආයතන සඳහා ජල සම්බන්ධතාවය ලබා ගැනීම සඳහා මාර්ග පළුදු කිරීම,	
	● මාර්ග පළුදු කිරීම (කාපට්)	10,000 0
	● මාර්ග පළුදු කිරීම (තාර)	7,000 0
	●මාර්ග පළුදු කිරීම (බොරළු)	5,000 0
53.	වැකර් යන්ත්‍රය සේවකයෙකු සහිතව, ඉන්ධන රහිතව දිනකට ලබා දීම (පැය 08ක් සඳහා)	5,000 0
54.	වාහන සඳහා බදු (වෙළෙඳ කාර්යන් නොවන පාපැදි)	04 0
55.	වාහන සඳහා බදු (වෙළෙඳ කාර්යයන් සඳහා යොදවන යතුරු පැදි, පාපැදි)	18 0
56.	නිදහස් උයන කුලී පදනම මත ලබාදීම වෙනුවෙන් දිනකට මුදල	1,000 0
57.	තණකොළ කපන යන්ත්‍රය පැය 01 කට ඉන්ධන හා රියදුරු සමග	6,000 0

මඩුල්ල ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා පෙරසැරි ගාස්තු අයකිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2023.09.25 වැනි දිනැති තීරණ අංක 322 යටතේ ගන්නට යෙදුනු බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

මඩුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි ඉඩම් කොටස් කිරීම, අලුතින් තාප්ප ඉදි කිරීම, අලුතින් ගොඩනැගිලි ඉදිකිරීම, පවත්නා ගොඩනැගිලි අලුත්වැඩියාව සහ අනුකූලතා සහතික නිකුත් කිරීම වැනි කාර්යයන්හිදී පහත උපලේඛනයේ සඳහන් ගාස්තු 2024 වර්ෂය සඳහා පනවා අයකිරීමට තීරණය කරන ලද බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

එච්. බී. එම්. චන්දිමා මල්කාන්ති,
සභා ලේකම්,
මඩුල්ල ප්‍රාදේශීය සභාව.

2023 සැප්තැම්බර් මස 25 වැනි දින,
මඩුල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

1915 අංක 15 දරන නිවාස හා නාගරික සංවර්ධන ආඥාපනතේ 06 වැනි වගන්තිය ප්‍රකාරව මඩුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි ඉඩම් කොටස් කිරීම, අලුතින් තාප්ප ඉදිකිරීම, අලුතින් ගොඩනැගිලි ඉදිකිරීම, පවත්නා ගොඩනැගිලි අලුත්වැඩියාව සහ අනුකූලතා සහතික නිකුත් කිරීම සඳහා ගාස්තු පනවා අය කිරීමට මඩුල්ල ප්‍රාදේශීය සභාවේ කළමනාකරණ කමිටු නිර්දේශය පදනම් කරගෙන මම තීරණය කරමි.

ඉඩම් කොටස් කිරීමේ පෙරසැරි ගාස්තු

බිම් කට්ටියක වර්ග ප්‍රමාණය	*පර්චස් ප්‍රමාණය*	*එක් බිම් කට්ටියකට අයකළ මුදල (රු.) (මාර්ග කාණු හා පොදු බිම් කොටස් හැර)*
ව.මී. 150 - 300	5.93 - 11.86	700.00
ව.මී. 301 - 600	11.87 - 23.72	560.00
ව.මී. 601 - 900	23.73 - 35.58	420.00
ව.මී. 900 ට වැඩි	35.59 ට වැඩි	280.00

ගොඩනැගිලි පෙරසැරි ගාස්තු

ගෙබිම් ප්‍රමාණය වර්ග අඩි	*නේවාසික රු. ශත*	*වාණිජ රු. ශත*
185 ට අඩු	700.00	1,400.00
485 - 970	1,400.00	2,100.00
971 - 1940	2,100.00	2,800.00
1941 - 2910	2,800.00	4,200.00
2911 - 4842	4,200.00	6,300.00
4843 - 7263	5,570.00	8,350.00
7264 - 9684	6,960.00	10,450.00
9685 - 13181	8,350.00	13,920.00
13181 ට වැඩි	9,750.00	13,920.00
13182 ඉක්මවීමෙන් පසු සෑම වර්ග අඩි 969 ටම	700.00	13,65.00

පොදු කරුණු :

1. ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීමේ ඉල්ලුම් පත්‍රයක් සඳහා රු. 350.00
2. ඉඩම් කොටස් කිරීමේ ඉල්ලුම් පත්‍රයක් සඳහා රු. 350.00
3. වීථිරේඛා ඉල්ලුම් පත්‍රයක් සඳහා රු. 140.00,
4. වීථිරේඛා සහතිකයක් නිකුත් කිරීම සඳහා 640.00,
5. සංවර්ධන බලපත්‍රවල කාලය දීර්ඝ කිරීම සහ රු. 150.00 ක අවමයකට යටත්ව මුලින් අය කළ පෙරසැරි ගාස්තුවෙන් 25%ක්,
6. භාවිතය වෙනස් කිරීමට රු. 150.00 ක අවමයකට යටත්ව අය කළ ගාස්තු අතර වෙනස, මෙම වෙනස අඩුවන අවස්ථාවලදී රු. 150.00 ක අවමයක් ගෙවිය යුතුය.,
7. ඉඩම් අනුබෙදුම - පළමු බිම් කොටසකට රු. 1,470.00 ක් සහ ඊට වැඩිවන සෑම බිම් කට්ටියකටම රු. 700.00 ක්,
8. නේවාසික ඉදිකිරීම් ව.මී. 300 ට අඩු රු. 4,175.00 ක් සහ ඊට වැඩිවන සෑම ව.මී. 1 ට රු. 15.00 ක්,
9. වාණිජ හා වෙනත් ව.මී. 100 ට අඩු රු. 4,175 ක් සහ ඊට වැඩිවන සෑම ව.මී. 1 ට රු. 15.00 ක්,
10. අනුකූලතා සහතිකයක් නිකුත් කිරීම සඳහා රු. 3,150.00.

11-554/1

මඩුල්ල ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා ඉඩම් විකිණීම මත බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2023.09.25 වැනි දිනැති තීරණ අංක 323 යටතේ පහත සඳහන් තීරණය ගන්නට යෙදුනු බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

ඒ අනුව මඩුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ යම් ඉඩමක් වෙන්දේසිකරුවෙකු හෝ ඔහුගේ සේවකයෙකු හෝ අනු නියෝජිතයෙකු විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ හෝ අන්‍යාකාරයෙන් විකුණනු ලබන අවස්ථාවක ඒ ඉඩම් විකිණීමෙන් ලත් මුදලින් සියයට එකක (1%) සමාන බද්දක් විකුණුම්කරු හෝ වෙන්දේසිකරු හෝ තැරැව්කරු හෝ ඔහුගේ සේවකයන් හෝ අනුගාමිකයන් විසින් මඩුල්ල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

එච්. බී. එම්. චන්දිමා මල්කාන්ති,
සභා ලේකම්,
මඩුල්ල ප්‍රාදේශීය සභාව.

2023 සැප්තැම්බර් මස 25 වැනි දින,
මඩුල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154(1) වගන්තිය ප්‍රකාරව මඩුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ යම් ඉඩමක් වෙන්දේසිකරුවෙකු හෝ ඔහුගේ සේවකයෙකු හෝ අනු නියෝජිතයකු විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ හෝ අන්‍යාකාරයෙන් විකුණනු ලබන අවස්ථාවක ඒ ඉඩම් විකිණීමෙන් ලත් මුදලින් සියයට එකකට (1%) සමාන බද්දක් විකුණුම්කරු හෝ වෙන්දේසිකරු හෝ තැරැව්කරු හෝ ඔහුගේ සේවකයන් හෝ අනුගාමිකයන් විසින් මඩුල්ල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට මඩුල්ල ප්‍රාදේශීය සභාවේ කළමනාකරණ කමිටු නිර්දේශය පදනම් කරගෙන මම තීරණය කරමි.

11-554/2

මඩුල්ල ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා වාහන හා සතුන් පිළිබඳ බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2023.09.25 වැනි දිනැති තීරණ අංක 324 යටතේ පහත සඳහන් තීරණය ගන්නට යෙදුනු බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

ඒ අනුව මඩුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මේ බද්දට යටත් වන කිසියම් වාහනයක් හෝ සතෙකු තබා ගන්නා සෑම තැනැත්තෙකුම විසින්, එකී වාහනය හෝ සතා තමන් භාරයේ තබා ගන්නා දින ගණන දින 30 ක් සම්පූර්ණ වූ වහාම 2024 වර්ෂය සඳහා වන මෙම බද්ද මඩුල්ල ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

එච්. බී. එම්. චන්දිමා මල්කාන්ති,
සභා ලේකම්,
මඩුල්ල ප්‍රාදේශීය සභාව.

2024 සැප්තැම්බර් මස 25 වැනි දින,
මඩුල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වන වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 148 වැනි වගන්තිය හා V වන උපලේඛනයේ විධිවිධානවලින් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාරව මඩුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2024 වර්ෂයේ දී පහත උපලේඛනයෙහි I වන තීරුවෙහි සඳහන් කිසියම් වාහනයක් හෝ සතෙකු II තීරුවේ අනුරූපිත සටහනෙහි නිරූපිත බද්දක් 2024 වර්ෂය සඳහා පනවා අය කිරීමට මඩුල්ල ප්‍රාදේශීය සභාවේ කළමනාකරණ කමිටු නිර්දේශය පදනම් කරගෙන මම තීරණය කරමි.

උපලේඛනය

I වැනි තීරය	*II වැනි තීරය*
	රු. ශත
මෝටර් රථයක්, මෝටර් ට්‍රයිකාරයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක් ජින් රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහාම	25 0
(අ) වෙළඳ කාර්යයක් සඳහා යොදවන්නේ නම්	18 0
(ආ) වෙළඳ නොවන කාර්යයක් සඳහා යොදවන්නේ නම්	04 0
සෑම කරත්තයක් සඳහා	20 0
සෑම පාපැදියක් සඳහා	10 0
සෑම අත්කරත්තයක් සඳහා	10 0
සෑම රික්ෂෝවක් සඳහා	7 0
සෑම අශ්වයෙකු, පෝනියෙකු හෝ කොටළුවෙකු සඳහා	15 0
සෑම ඇතෙකු සඳහා	50 0

02. රෝදවල විශ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝද සහිත ළමා වාහන, වීල්බැරෝ, හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළෙඳ කාර්යයන් සඳහා යොදවන අත් කරත්ත සහ වෙළෙඳ කාර්ය සඳහා නොයොදවන අත් කරත්ත ඉහත ගෙවීම්වලින් නිදහස් කෙරේ.

මඩුල්ල ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා ප්‍රචාරක දැන්වීම් පිළිබඳ ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2023.09.25 වැනි දිනැති තීරණ අංක 325 යටතේ පහත සඳහන් තීරණය ගන්නට යෙදුනු බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

ඒ අනුව මඩුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ යම් වීදියකට, පාරකට, ඇලකට හෝ අහසට පෙනෙන පරිදි ප්‍රචාරක දැන්වීමක් හෝ ප්‍රචාරක දැන්වීම් ඉදිකිරීමක් හෝ ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම වෙනුවෙන් පහත උපලේඛනයේ සඳහන් ගාස්තුවක් 2024 වර්ෂය සඳහා පනවා අය කිරීමට තීරණය කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

2024 වර්ෂය සඳහා පනවන ලද එම ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශන ගාස්තුව එකී ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීමට දින තුනකට (03) පෙර මඩුල්ල ප්‍රාදේශීය සභා කාර්යාලය වෙත ගෙවිය යුතු බවත්, එසේ නොකරන්නේ නම් ප්‍රදර්ශනය කරන ලද ප්‍රචාරක දැන්වීම ඉවත් කිරීමට සිදුවන බවත්, වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

එච්. බී. එම්. චන්දිමා මල්කාන්ති,
සභා ලේකම්,
මඩුල්ල ප්‍රාදේශීය සභාව.

2023 සැප්තැම්බර් මස 25 වැනි දින,
මඩුල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 122, 126 වැනි වගන්ති ප්‍රකාරව මා වෙත පැවරී ඇති බලතල අනුව හා 1988.08.23 වැනි දින අංක 520/07 දරන පළාත් පාලන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළාත් පාලන නිවාස හා ඉදිකිරීම් ගරු අමාත්‍යතුමා විසින් අනුමත කොට ප්‍රකාශයට පත්කර ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවල 39 වැනි කොටසේ ප්‍රචාරක දැන්වීම්/ දෘශ්‍ය පරිසරය පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව 2013.06.28 දින අංක 1816/43 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කර ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවේ අතුරු ව්‍යවස්ථා විධිවිධාන ප්‍රකාරව මඩුල්ල ප්‍රාදේශීය සභා සීමාව තුළ යම් වීදියකට, පාරකට, ඇලකට, අහසට පෙනෙන පරිදි ප්‍රචාරක දැන්වීමක් හෝ ප්‍රචාරක දැන්වීම් ඉදිකිරීමක් හෝ ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම වෙනුවෙන් පහත උපලේඛනයේ සඳහන් ගාස්තු 2024 වර්ෂය සඳහා පනවා අයකර ගැනීමට මඩුල්ල ප්‍රාදේශීය සභාවේ කළමනාකරණ කමිටු නිර්දේශය පදනම් කරගෙන මම තීරණය කරමි.

උපලේඛනය

	විස්තරය	*රු. ශත*
1.	ස්ථිර ප්‍රචාරක දැන්වීමක් සඳහා බිත්තියක හෝ පුවරුවක ප්‍රදර්ශනය කරනු ලබන විට වර්ග අඩියකට හෝ ඉන් කොටසක් සඳහා	150 0
2.	තාවකාලික ප්‍රචාරක දැන්වීමක් සඳහා බැනරයක් වශයෙන් ප්‍රදර්ශනය කරනු ලබන විට වර්ග අඩියකට හෝ ඉන් කොටසකට :	
	මසකට (වර්ග අඩියකට)	100 0
	මාස තුනකට (වර්ග අඩියකට)	120 0
	මාස හයකට (වර්ග අඩියකට)	150 0
3.	චිත්‍රපට පෙන්වීම සම්බන්ධ එක් ප්‍රචාරක දැන්වීමක් හෝ වෙනත් ප්‍රචාරක බැනරයක් සඳහා වර්ග අඩියකට හෝ ඉන් කොටසකට :	
	මසකට (වර්ග අඩියකට)	100 0
	මාස තුනකට (වර්ග අඩියකට)	120 0
	මාස හයකට (වර්ග අඩියකට)	150 0

මඩුල්ල ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා ව්‍යාපාර බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2023.09.25 වැනි දිනැති තීරණ අංක 326 යටතේ පහත සඳහන් තීරණය ගන්නට යෙදුනු බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

2024 වර්ෂය සඳහා පනවන ලද ව්‍යාපාර බද්ද ඒ වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත්, වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

එච්. බී. එම්. චන්දිමා මල්කාන්ති,
සභා ලේකම්,
මඩුල්ල ප්‍රාදේශීය සභාව.

2023 සැප්තැම්බර් මස 25 වැනි දින,
මඩුල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වගන්තියේ (1) වන උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර, එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ එකී පනතේ 150 වන වගන්තිය යටතේ යම් කර්මාන්ත බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ හා වෘත්තියක් නොවන්නා වූ කිසියම් ව්‍යාපාරයක් මඩුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2024 වර්ෂය තුළ දී පවත්වාගෙන යනු ලබන සෑම තැනැත්තෙකුගෙන්ම එකී ව්‍යාපාරයේ ඊට පෙර වර්ෂයේ ලැබීම් මෙහි පහත උපලේඛනයේ I වැනි තීරුවේ නිරූපිත යම් විෂයාංකයක සීමාවන් ඇතුළත පවත්නා අවස්ථාවක එහි II වැනි තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත අනුප්‍රමාණය අනුව වූ ව්‍යාපාර බද්දක් 2024 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්, එකී ව්‍යාපාර බද්දට යටත් සෑම තැනැත්තෙක්ම එකී ව්‍යාපාර බද්ද 2024 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර මඩුල්ල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් මඩුල්ල ප්‍රාදේශීය සභාවේ කළමනාකරණ කමිටු නිර්දේශය පදනම් කරගෙන මම තීරණය කරමි.

උපලේඛනය

I වැනි තීරුව	*II වැනි තීරුව*
බද්ද අදාළ වන වර්ෂයට පෙර වර්ෂයේ ව්‍යාපාරයෙන් ලන් ලැබීම් ප්‍රමාණය	*ගෙවිය යුතු බද්ද රු. ශත*
රු. 6,000 නොඉක්මවන අවස්ථාවක	කිසිවක් නැත
රු. 6,001 ඉක්මවන නමුත් රු. 12,000 නොඉක්මවන අවස්ථාවක	90 0
රු. 12,001 ඉක්මවන නමුත් රු. 18,750 නොඉක්මවූ අවස්ථාවක	180 0
රු. 18,751 ඉක්මවන නමුත් රු. 75,000 නොඉක්මවූ අවස්ථාවක	360 0
රු. 75,001 ඉක්මවන නමුත් රු. 150,000 නොඉක්මවූ අවස්ථාවක	1,200 0
රු. 150,001 ඉක්මවන විට	3,000 0

ව්‍යාපාර බදු යටතට ගැනෙන ව්‍යාපාර :

01. කොන්ත්‍රාත්කරුවන්
02. මුදල් ණයට දෙන්නන් (රජයේ හා පෞද්ගලික)
03. මුදල් ආයෝජකයින් (බැංකු)
04. වෙන්දේසිකරුවන් හා තැරැව්කරුවන්
05. විදුලි බලයෙන් ක්‍රියාකරන මුද්‍රණාලයක් පවත්වාගෙන යාම
06. ලොතරැයි ටිකට් නියෝජිතවරුන්
07. පුද්ගලික බස් රථ නියෝජිතවරුන්

08. කුළී රථ අයිතිකරුවන්
09. රැකියා ඒජන්තවරුන්
10. කොමිස් ඒජන්තවරුන්
11. ප්‍රචාරක නියෝජිතවරුන්
12. මෝටර් රථ වාහන අලෙවිකරුවන්
13. මැණික් වෙළෙන්දන්
14. බැංකු හෝ රක්ෂණ නියෝජිතවරුන්
15. ඉන්ධන පිරවුම්හල් නියෝජිතවරුන්
16. සැපයුම්කරුවන් (හුණු ගල්, කළු ගල්)
17. උකස් බඩු ගන්නා ස්ථානයක් පවත්වාගෙන යාම
18. අනෙකුත් ව්‍යාපාර නියෝජිතවරුන්
19. ලිහිසි තෙල් නියෝජිතවරුන්
20. තාවකාලික අලෙවි ප්‍රවර්ධන කටයුතු
21. ක්‍රීඩා සමාජ පවත්වාගෙන යාම
22. රියැදුරු පුහුණු ආයතනයක් පවත්වාගෙන යාම
23. පෞද්ගලික වෛද්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
24. පෞද්ගලික තැපැල් හලක් පවත්වාගෙන යාම
25. මත්පැන් විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම
26. පරිගණක පුහුණු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
27. ගිණුම් සේවා සපයන ස්ථානයක් පවත්වාගෙන යාම
28. සන්නිවේදන සේවා සපයන ආයතනවල නියෝජිතවරුන්
29. මෙම වගන්තිය යටතේ ව්‍යාපාර බදු ගෙවිය යුතු බවට මඩුල්ල ප්‍රාදේශීය සභාව විසින් නියම කරනු ලබන ඇතැම් සීමිත සමාගම්
30. සම්ප්‍රේෂණ කුළුණු
31. යන්ත්‍රෝපකරණ කුළී පදනම මත ලබාදීම
32. අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය බෙදාහැරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
33. යන්ත්‍රානුසාරයෙන් නිෂ්පාදනය කරන හඳුන්කුරු අලෙවි කරන ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
34. රසායනාගාරයක් පවත්වාගෙන යාම
35. විශ්‍රාමශාලා පවත්වාගෙන යාම
36. කාමර පහසුකම් ලබාදීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
37. වැලි, ගඩොල් විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
38. වානිජමය වැලි කැනීම් ස්ථානයක් පවත්වාගෙන යාම
39. ගෘහ නිර්මාණ හා උද්‍යාන ශිල්පී ආයතනයක් පවත්වාගෙන යාම
40. පුද්ගලික අධ්‍යාපන පංති පවත්වන්නෙකු
41. වාහන දුම් පරීක්ෂා කිරීමේ ජංගම ස්ථානයක් පවත්වාගෙන යන්නෙකු
42. හාඩ්වෙයාර් එකක් පවත්වාගෙන යන්නෙකු
43. පැළ තවාන්
44. වාහන අමතර කොටස් අලෙවිය
45. උපදේශන සේවා සැපයීමේ ආයතනයක් පවත්වාගෙන යාම
46. පිරිසිදු කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
47. දෙස් විදෙස් රැකියා ඒජන්සියක් පවත්වාගෙන යාම
48. ගෘහ භණ්ඩ හා විදුලි උපකරණ විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
49. යාන්ත්‍රික වඩු මඩුවක් පවත්වාගෙන යාම
50. සාප්පු භාණ්ඩ, ප්‍රජා භාණ්ඩ විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
51. යතුරු පැදි, ත්‍රිරෝද රථ හා වාහන විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
52. යතුරුපැදි, ත්‍රිරෝද රථ හා රථ වාහන අමතර කොටස් විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම

මඩුල්ල ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා කර්මාන්ත බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2023.09.25 වැනි දිනැති තීරණ අංක 327 යටතේ පහත සඳහන් තීරණය ගන්නට යෙදුනු බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

2024 වර්ෂය සඳහා පනවන ලද ඒ කර්මාන්ත බද්ද, ඒ වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත්, වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

එච්. බී. එම්. චන්දිමා මල්කාන්ති,
සභා ලේකම්,
මඩුල්ල ප්‍රාදේශීය සභාව.

2023 සැප්තැම්බර් මස 25 වැනි දින,
මඩුල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තියේ (1) වන උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර මඩුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත කරගෙන යනු ලබන කර්මාන්තය එකී පනතේ හෝ ඒ පනත යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක් යටතේ බලපත්‍රයක් ලබා ගැනීම අවශ්‍ය නොවන්නා වූ යම් කර්මාන්තයක් හෝ වෙළෙඳාමක් වෙනුවෙන් ඒ කර්මාන්තය පවත්වාගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකම මෙහි පහත උපලේඛනයේ I වන තීරුවේ විෂයාංග ගත සීමාවක් ඇතුළත පවතින අවස්ථාවක අය කරනු ලබන බද්ද II තීරුවේ අනුරූප සටහනෙහි දක්වා ඇති මුදල් ප්‍රමාණයට සමාන මුදලක් කර්මාන්ත නැනහොත් වෙළෙඳාම් බද්දක් 2024 වර්ෂය සඳහා පනවා අයකළ යුතු බවටත්, එකී කර්මාන්ත බද්දට යටත් සෑම තැනැත්තෙක්ම 2024 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර එකී බද්ද මඩුල්ල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් මඩුල්ල ප්‍රාදේශීය සභාවේ කළමනාකරණ කමිටු නිර්දේශය පදනම් කරගෙන මම තීරණය කරමි.

උපලේඛනය

I වැනි තීරුව *පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම*	*II වැනි තීරුව* *ගෙවිය යුතු බද්ද* *රු. ශත*
(1) රු. 750 නොඉක්මවන අවස්ථාවක	500 0
(2) රු. 750 ඉක්මවන නමුත් රු. 1500 නොඉක්මවන විට	750 0
(3) රු. 1500 ඉක්මවන විට	1,000 0

අනු. අංකය	*I වැනි තීරුව* *ව්‍යාපාරයේ ස්වභාවය*	*II වැනි තීරුව* *වාර්ෂික වටිනාකම රු. 750 ට නොවැඩි අවස්ථාවක රු. ශත*	*වාර්ෂික වටිනාකම රු. 751 සිට රු. 1,500 දක්වා රු. ශත*	*වාර්ෂික වටිනාකම රු. 1,501 ට වැඩි රු. ශත*
01.	සාප්පු බඩු වෙළෙඳසැලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
02.	ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
03.	ලී බඩු වෙළෙඳසලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
04.	ගෘහ භාණ්ඩ විකිණීමේ ස්ථානයක්, වෙළෙඳසැලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
05.	ගොඩනැගිලි උපකරණ හා යකඩ බඩු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

අනු. අංකය	I වැනි තීරුව ව්‍යාපාරයේ ස්වභාවය	වාර්ෂික වටිනාකම රු. 750 ට නොවැඩි අවස්ථාවක රු. ශත	II වැනි තීරුව වාර්ෂික වටිනාකම රු. 751 සිට රු. 1,500 දක්වා රු. ශත	වාර්ෂික වටිනාකම රු. 1,501 ට වැඩි රු. ශත
06.	පිඟන් බඩු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
07.	බෙලෙක් වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
08.	ධාන්‍ය මිලදී ගැනීම හා විකිණීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
09.	මහන මැෂින් අමතර කොටස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0 500 0	750 0 750 0	1,000 0 1,000 0
10.	විදුලි උපකරණ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
11.	පරිගණක උපාංග විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
12.	වාහන අමතර කොටස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
13.	යතුරුපැදි හා පා පැදි විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
14.	මසා නිමකළ ඇඳුම් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
15.	ඇඳුම් මැසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
16.	පින්තූර රාමු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
17.	පත්තර, සඟරා, පාසල් උපකරණ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
18.	ඔරලෝසු අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
19.	බුලත්, පුවක් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
20.	සිමෙන්ති ගබඩා කිරීමේ හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
21.	තැඹිලි හා කුරුම්බා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
22.	ඉංග්‍රීසි බෙහෙත් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම (ෆාර්මසි)	500 0	750 0	1,000 0
23.	බීඩි, සුරුට්ටු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
24.	හඳුන්කුරු නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
25.	විසිතුරු මැටි බඳුන් අලෙවි සැලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
26.	ශබ්ද විකාශන යන්ත්‍ර කුළියට දීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
27.	කොහු හෝ කෙඳිවලින් භාණ්ඩ නිපදවීමේ ස්ථානයක් සඳහා	500 0	750 0	1,000 0
28.	දුරකතන ඇමතුම් සේවා සපයන ස්ථානයක් (කොමියුනිකේෂන්) සඳහා	500 0	750 0	1,000 0
29.	අඟුරු සඳහා දැව පොල්කටු දැවීම හෝ අඟුරු ගබඩා කිරීමේ ස්ථානයක් සඳහා	500 0	750 0	1,000 0
30.	ටයර් හෝ ටියුබ් වෝල්කනයිස් කරන ස්ථානයක් සඳහා	500 0	750 0	1,000 0
31.	විදුලි උපකරණ නව නිපැයුම් (LED බල්බ)	500 0	750 0	1,000 0
32.	කොට්ට පුළුන්, කපු පුළුන් විකිණීමේ ස්ථානයක් සඳහා	500 0	750 0	1,000 0
33.	වියළි කෝෂ, බැටරි නිපදවීමේ ස්ථානයක් සඳහා	500 0	750 0	1,000 0
34.	ශරීර සුවතා ආයතනයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
35.	තලාතු මිනිරන් චේළීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
36.	බෝල මේස ක්‍රීඩා කරන ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
37.	නොතාරිස් කාර්යාලයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
38.	පොල් ලී අලෙවි ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

අනු. අංකය	I වැනි තීරුව ව්‍යාපාරයේ ස්වභාවය	II වැනි තීරුව වාර්ෂික වටිනාකම රු. 750 ට නොවැඩි අවස්ථාවක රු. ශත	වාර්ෂික වටිනාකම රු. 751 සිට රු. 1,500 දක්වා රු. ශත	වාර්ෂික වටිනාකම රු. 1,501 ට වැඩි රු. ශත
39.	බීරළු කපන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
40.	දුම්කොළ ගබඩා කිරීමේ ව්‍යාපාර ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
41.	රබර් දුම් ගැසීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
42.	රබර් මුද්‍රා කැපීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
43.	ජ්‍යොතිෂ්‍ය කාර්යාලයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
44.	සිමෙන්ති, බ්ලොක් ගල් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
45.	පාවහන් විකිණීමේ හා ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
46.	කොන්ක්‍රීට් හා මැටි පයිප්ප හෝ භාණ්ඩ නිෂ්පාදනය කර ගබඩා කර තැබීම	500 0	750 0	1,000 0
47.	ගුවන්විදුලි, රූපවාහිනී යන්ත්‍ර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
48.	ගුවන්විදුලි, රූපවාහිනී යන්ත්‍ර අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
49.	මැණික්ගල් කැපීම - ඔප දැමීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
50.	සිගරට් තොග වෙළෙඳ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
51.	ලොතරැයි ටිකට්පත් විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
52.	දන්ත චිකිත්සාගාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
53.	වෙළෙඳ ප්‍රචාරක දැන්වීම් සැපයීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
54.	ටයර් ටියුබ් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
55.	දැව විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
56.	ගීත පටිගත කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
57.	මනාලියන් හැඩගැන්වීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
58.	උත්සව ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
59.	පිත්තල භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
60.	ලොරි බොඩි සෑදීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
61.	කුෂන් වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
62.	ගෙවතු පිරිසිදු කිරීමේ/අලංකරණය කිරීමේ සේවා සපයන ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
63.	පැළ තවානක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
64.	කොන්ක්‍රීට් පෙරසවි භාණ්ඩ අලෙවිය හා නිෂ්පාදනය කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
65.	උත්සව භාණ්ඩ කුලියට ලබාදීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
66.	යකඩ තලන කම්හල්	500 0	750 0	1,000 0
67.	පූජා භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

මඩුල්ල ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා බලපත්‍ර ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2023.09.25 වැනි දිනැති තීරණ අංක 328 යටතේ පහත සඳහන් තීරණය ගන්නට යෙදුනු බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

ඒ අනුව මඩුල්ල ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ක්‍රියාත්මක කිරීමට තීරණය කරන ලද ප්‍රාදේශීය සභා සම්මත අතුරු ව්‍යවස්ථාවල යම් අතුරු ව්‍යවස්ථාවක් යටතේ බලපත්‍රයක් ලබා ගත යුතු මඩුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ සෑම කර්මාන්තයක්ම පවත්වාගෙන යාමේ ස්ථානය වෙනුවෙන් 2024 වර්ෂය සඳහා මඩුල්ල ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරනු ලබන වලංගු බලපත්‍රයක් ලබාගත යුතු බවත්, එසේ ලබාගත් වලංගු බලපත්‍රයක් නොමැතිව යම් කර්මාන්තයක් පවත්වාගෙන යාම වරදක් බවත් මෙයින් නිවේදනය කරනු ලැබේ. එවැනි යම් කර්මාන්තයක් පවත්වාගෙන යනු ලබන එක් එක් ස්ථානය වෙනුවෙන් 2024 වර්ෂයට මඩුල්ල ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක්ම මත ගාස්තුවක් මඩුල්ල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

එච්. බී. එම්. චන්දිමා මල්කාන්ති,
සභා ලේකම්,
මඩුල්ල ප්‍රාදේශීය සභාව.

2023 සැප්තැම්බර් මස 25 වැනි දින,
මඩුල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

ප්‍රාදේශීය සභාව විසින් සාදන ලද අතුරු ව්‍යවස්ථාවක් යටතේ හෝ මඩුල්ල ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවක් යටතේ මඩුල්ල ප්‍රාදේශීය සභාව විසින් 2024 වර්ෂය තුළදී නිකුත් කරනු ලබන බලපත්‍ර සම්බන්ධයෙන්, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වන වගන්තිය සමග කියවිය යුතු 149 වගන්තියෙන් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර පහත උපලේඛනයේ I වන තීරුවේ සඳහන් එක් එක් කර්මාන්තය වෙනුවෙන් එම උපලේඛනයේ II වන තීරුවේ අනුරූපිත සටහනෙහි මෙහි නිරූපිත ප්‍රමාණයක බලපත්‍ර ගාස්තුවක් පනවා අය කිරීමටත්,

එකී උපලේඛනයේ සඳහන් කර්මාන්තය 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතේ කාර්යය සඳහා ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ඇත්තා වූ හෝ ඒ මණ්ඩලය විසින් අනුමත කරනු ලැබූ හෝ පිළිගනු ලැබ ඇත්තා වූද වන අවස්ථාවක ඉහත 2 වන කොටසේ කුමක් සඳහන්ව තිබුණද ඒ හෝටලය හෝ ආපනශාලාව හෝ නවාතැන්පල හෝ පවත්වාගෙන යනු ලබන ස්ථානය සඳහා සභාපති/ලේකම්වරයා විසින් නිකුත් කරනු ලබන බලපත්‍රයක් මත ගෙවිය යුතු ගාස්තුව ඒ හෝටලයේ හෝ ආපනශාලාවේ හෝ නවාතැන්පොලෙහි හෝ 2022 වර්ෂය තුළ ලැබීම්වලින් සියයට එකක් (1%ක්) විය යුතු බවට මඩුල්ල ප්‍රාදේශීය සභාවේ කළමනාකරණ කමිටු නිර්දේශය පදනම් කරගෙන මම තීරණය කරමි.

උපලේඛනය

I වැනි තීරුව *පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම*	*II වැනි තීරුව* *ගෙවිය යුතු බද්ද* *රු. ශ.*
(1) රු. 750 නොඉක්මවන අවස්ථාවක	500 0
(2) රු. 750 ඉක්මවන නමුත් රු. 1500 නොඉක්මවන විට	750 0
(3) රු. 1500 ඉක්මවන විට	1,000 0

(01) ලැගුම් නිවාස
(02) හෝටල්
(03) බත් කඩ, ආපන ශාලා සහ තේ හෝ කෝපි කඩ
(04) බේකරි
(05) ආහාර විකිණීම

(06) මාළු විකිණීම
(07) මස් විකිණීම
(08) සිසිල් බීම කර්මාන්ත ශාලා
(09) ලොන්ඩරි
(10) සංචාරක වෙළෙන්දෝ
(11) ඝාතක මඩු
(12) කොණ්ඩ සැකසීමේ සැලුන් හල් සහ බාබර් ඝාප්පු
(13) අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථාන
(14) පීඩාකාරී හෝ අන්තරායදායක ව්‍යාපාර
(15) පොදු හෝ පෞද්ගලික වෙළෙඳපොළවල්

පීඩාකාරී ව්‍යාපාර :

1. මිණිරන් ශුද්ධ කිරීම හෝ ගබඩා කිරීම
2. පොහොර හෝ රසායනික පොහොර නිපදවීම හෝ විකිණීමට තබාගැනීම
3. සම් පදම් කිරීම
4. සත්ත්ව පාලනය (මස්, කිරි හෝ බිත්තර සඳහා) සතුන් ඇති කරන ස්ථාන පවත්වාගෙන යාම
5. උම්බලකඩ නිෂ්පාදනය කිරීම හෝ කිලෝග්‍රෑම් 50 ට වඩා ගබඩා කිරීම
6. රබර් නිෂ්පාදනය කිරීම හෝ රබර් රොටී තබාගැනීම
7. පශු වෛද්‍ය ඖෂධ පැවැත්වීම
8. තොග වශයෙන් විකිණීම සඳහා නරක්වන සුළු කෑම වර්ග
9. සම් විකිණීමට තබා ගැනීම
10. කරවල, මාළු හෝ ජාඩි කිලෝග්‍රෑම් 100 ට වඩා වැඩි ප්‍රමාණයක් තබා ගැනීම
11. මාළු හෝ මස් ජාඩි දැමීම, හෝ වේලීම හෝ අයිස් දැමීම
12. පොල්කටු අඟුරු හෝ දැව අඟුරු නිපදවීම
13. දුම්කොළ වියළීම
14. සත්ත්ව ආහාර නිපදවීම
15. සබන් නිෂ්පාදනය
16. අළුත් ලෝහ හෝ පරණ ලෝහ තබාගැනීම
17. ලෝහ සුන්බුන් තබාගැනීම
18. ගෘහ භාණ්ඩ නිපදවීම
19. වේවැල් භාණ්ඩ නිපදවීම
20. වඩු කර්මාන්ත ශාලාවක් පැවැත්වීම
21. සිරප් හෝ පළතුරු බීම නිපදවීම
22. රස කැවිලි නිපදවීම
23. පොල් ලෙලි නිපදවීම හෝ (පල් කිරීම)
24. බුරුසු වර්ග නිපදවීම (දත් බුරුසු හැර)
25. දත් බුරුසු නිපදවීම
26. රා එකතු කිරීම
27. විනාකිරි නිපදවීම
28. දැව ඉරීම
29. පින්තාරු තීන්ත, වාර්නිෂ් හෝ ඩිස්ටෙම්පර් නිපදවීම
30. සෝඩා නිපදවීම
31. කෙඳි සායම් කිරීම
32. සම් භාණ්ඩ නිපදවීම
33. පළතුරු, මාළු හෝ වෙනත් ආහාර වර්ග ටින්වල ඇසිරීම
34. කෝපි, ධාන්‍ය වර්ග පිටි කිරීම
35. බේකින් පවුඩර් නිපදවීම

36. කපුරු නිපදවීම
37. පොටි නිපදවීම
38. ඉටිපන්දම් නිපදවීම
39. ලියන තීන්ත, අච්චු තීන්ත හෝ ස්ටෙන්සිල් තීන්ත නිපදවීම
40. රෙදි සෝදන ද්‍රව්‍ය නිපදවීම
41. ලාකඩ නිපදවීම
42. සුවඳ විලවුන් නිපදවීම
43. පාසල් රටහුණු නිපදවීම
44. ටයර් හෝ ටියුබ් නිපදවීම
45. ටයර් ටියුබ් වොල්කනයිසින් කිරීම
46. සිමෙන්ති නිපදවීම
47. සිමෙන්ති භාණ්ඩ හෝ ඇස්බැස්ටස් භාණ්ඩ නිපදවීම
48. වැලි කඩදාසි නිපදවීම
49. ප්ලාස්ටික් භාණ්ඩ නිපදවීම
50. ගඩොල් පිළිස්සීම
51. යන්ත්‍රාණුසාරයෙන් රෙදි විවීම
52. අළු නිෂ්පාදනය
53. පොහොර, හුණු, පිටි හෝ වෙනත් ද්‍රව්‍යයක් දමා තිබූ ගෝනි පිරිසිදු කර විකිණීම
54. නිමි ඇඳුම් නිෂ්පාදනය කිරීම
55. කුකුළු වෙළෙඳ සලක් පවත්වාගෙන යාම
56. විෂබීජ නාශක නිපදවීම
57. ටයර් ටියුබ් අළුත්වැඩියා කිරීම
58. සපත්තු/ බෑග්/ සම්භාණ්ඩ නිෂ්පාදනය
59. දුම්කොළ යොදා කරන සිගරට්, බීඩි, සුරුට්ටු නිපදවීම

අන්තරායදායක ව්‍යාපාර :
1. කළුගල් කැනීම හෝ කැඩීම
2. අයිස් නිෂ්පාදනය
3. එළවළු තෙල් නිෂ්පාදනය
4. පොල්තෙල් නිෂ්පාදනය
5. ගිනිපෙට්ටි නිෂ්පාදනය හෝ ගබඩා කිරීම
6. කොහු හෝ වෙනත් කෙඳි වර්ග නිෂ්පාදනය
7. කොහු හෝ වෙනත් කෙඳි වර්ගවලින් භාණ්ඩ
8. පිදුරු තබා ගැනීම
9. පාවිච්චි කළ ඇඳුම් ගබඩා කිරීම
10. ස්වර්ණාභරණ නිෂ්පාදනය හෝ අලුත්වැඩියාව
11. යන්ත්‍රානුසාරයෙන් ලී ඉරීම
12. හිරිගල් හෝ හුණුගල් කැඩීම
13. යන්ත්‍රෝපකරණ පාවිච්චි කරන කම්හලක් පවත්වාගෙන යාම
14. හිස් ගෝනි හෝ හිස් බෝතල් තබාගැනීම
15. පාපැදි හෝ යතුරුපැදි අලුත්වැඩියා කිරීම
16. පාවිච්චි කරන ලද කඩදාසි හෝ පත්තර තබාගැනීම
17. ගිණිකෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤා ගබඩා කිරීම
18. ලෝහ සංස්කාරක කර්මාන්ත ආයුධ (යන්ත්‍රෝපකරණ, ආයුධ, උපකරණ නිපදවීම)
19. වැල්ඩින් වැඩපලක් පවත්වාගෙන යාම

පීඩාකාරී හා අන්තරායදායක ව්‍යාපාර :
1. තලාතු මිනිරන් ශුද්ධ කිරීම
2. රසායනික ද්‍රව්‍ය පාවිච්චි කර කුරුඳු, කරදමුංගු එනසාල් හෝ කෙඳි වර්ග සකස් කිරීම

3. ඩ්‍රයි ක්ලීන් කිරීම
4. රෙදි මුද්‍රණය කිරීම හෝ සායම් දැමීම
5. විද්‍යුත් ලෝහ ආලේපනය කිරීම
6. තෙල් හෝ සත්ත්ව මේද නිපදවීම
7. හුණු ගල් හෝ හිරි ගල් නිපදවීම
8. ගිණිකෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤා නිපදවීම
9. බැටරි විද්‍යුත් ආරෝපණය කිරීම හෝ අළුත්වැඩියා කිරීම
10. ලෝහ වර්ග පෑස්සීම
11. මෝටර් වාහන අළුත්වැඩියාව
12. මෝටර් වාහන සේවා කිරීම
13. යන්ත්‍රානුසාරයෙන් ලෝහ කුඩු කිරීම
14. වාත්තු මඩුවක් පවත්වාගෙන යාම
15. බෙලෙක් වැඩපලක් පවත්වාගෙන යාම
16. මෝටර් වාහන බෝඩ් තැනීම
17. කෘමිනාශක, දිලීරනාශක, පැළෑටි හෝ පළිබෝධනාශක නිපදවීම
18. විෂබීජ නාශක නිපදවීම
19. මදුරු දඟර නිපදවීම
20. දැව ආරක්ෂණ නිපදවීම
21. ගල් තාර හෝ බිටුමන්මය ද්‍රව්‍ය නිපදවීම
22. වීදුරු භාණ්ඩ නිපදවීම
23. යකඩ තහඩු ගැල්වනයිස් කිරීම
24. පාස්සන ඊයම් නිපදවීම
25. ඇලුමිනියම් භාණ්ඩ නිපදවීම
26. කටු කම්බි නිපදවීම
27. කම්බි ඇණ නිපදවීම
28. කාබන් කඩදාසි හෝ යතුරුලියන පටි (රිබන්) නිපදවීම
29. බෙලෙක් බඳුන්, වානේ රිප්ප හෝ කාබනික ටැංකි නිපදවීම
30. ජී. අයි. බාල්දි නිපදවීම
31. වායුසමීකරණ යන්ත්‍ර, ශීතකරණ හෝ අධි ශීතකරණ නිපදවීම
32. වායුසමීකරණ යන්ත්‍ර, ශීතකරණ හෝ අධි ශීතකරණ අළුත්වැඩියා කිරීම
33. බ්‍රේක් ලයිනර් ක්ලච් ලයිනර් නිපදවීම
34. යන්ත්‍රෝපකරණ නිපදවීම
35. විදුලි භාණ්ඩ නිපදවීම
36. රබර් මිශ්‍ර කෙඳි නිපදවීම
37. සංචායන බැටරි නිපදවීම
38. ට්‍රැක්ටර් රථ එකලස් කිරීම
39. රේඩියේටර් නිපදවීම
40. ඉලෙක්ට්‍රොනික් උපකරණ නිපදවීම හෝ අළුත්වැඩියා කිරීම
41. වියළි කෝෂ බැටරි නිපදවීම
42. වී මෝල්
43. මිනී පෙට්ටි තැනීම
44. දුරකතන නිපදවීම හෝ අළුත්වැඩියා කිරීම
45. විද්‍යුත් උපකරණ අළුත්වැඩියාව හෝ එකලස් කිරීම
46. පරිගණක හෝ තොරතුරු තාක්ෂණ උපකරණ එකලස් කිරීම හෝ අළුත්වැඩියාව
47. උක් ඇඹරුම්හල්

මඩුල්ල ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා විනෝද බදු ආඥාපනත යටතේ බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2023.09.25 වැනි දිනැති තීරණ අංක 329 යටතේ පහත සඳහන් තීරණය ගන්නට යෙදුනු බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

විනෝද බදු ආඥාපනත යටතේ සෑම චිත්‍රපට දර්ශනයක්, මැජික් දර්ශනයක්, සැණකෙළි සංදර්ශනයක් සඳහා මුද්‍රණය කරනු ලබන ප්‍රවේශ පත්‍රවල වටිනාකමින් 10%ක විනෝද බද්දක් 2024 වර්ෂය සඳහා පනවා අය කිරීමට තීරණය කරන ලද බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

එච්. බී. එම්. චන්දිමා මල්කාන්ති,
සභා ලේකම්,
මඩුල්ල ප්‍රාදේශීය සභාව.

2023 සැප්තැම්බර් මස 25 වැනි දින,
මඩුල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

විනෝද බදු ආඥාපනත යටතේ සෑම චිත්‍රපට දර්ශනයක්, මැජික් දර්ශනයක්, සැණකෙළි සංදර්ශනයක් සඳහා මුද්‍රණය කරනු ලබන ප්‍රවේශ පත්‍රවල වටිනාකමින් 10%ක විනෝද බද්දක් 2024 වර්ෂය සඳහා පනවා අය කිරීමට මඩුල්ල ප්‍රාදේශීය සභාවේ කළමනාකරණ කමිටු නිර්දේශය පදනම් කරගෙන මම තීරණය කරමි.

11-554/8

මඩුල්ල ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා සභාව සතු දේපළ කුලියට දීමේ දී ගාස්තු අය කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2023.09.25 වැනි දිනැති තීරණ අංක 330 යටතේ පහත සඳහන් තීරණය ගන්නට යෙදුනු බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

මඩුල්ල ප්‍රදේශීය සභාව සතු ඉඩමක්, ගොඩනැගිල්ලක්, හෝ වාහනයක් කුලියට දීමේ දී පහත උපලේඛනවල සඳහන් ගාස්තුවක් 2024 වර්ෂය සඳහා පනවා අය කිරීමට තීරණය කරන ලද බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

එච්. බී. එම්. චන්දිමා මල්කාන්ති,
සභා ලේකම්,
මඩුල්ල ප්‍රාදේශීය සභාව.

2023 සැප්තැම්බර් මස 25 වැනි දින,
මඩුල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

මඩුල්ල ප්‍රාදේශීය සභාවට අයත් ඉඩමක්, ගොඩනැගිල්ලක්, හෝ වාහනයක් පහත උපලේඛන 01 හි I වැනි තීරුවේ සඳහන් යම් කටයුත්තක් සඳහා කුලියට ගැනීමේදී එහි අනුරූපි සටහනේ II වැනි තීරුවේ සඳහන් කුළිය 2024 වර්ෂය සඳහා පනවා අයකිරීමටත්, II වැනි උපලේඛනයේ I වන තීරුවේ සඳහන් යම් කටයුත්තක් සඳහා ඊට අනුරූපි II වන තීරුවේ සඳහන් ගාස්තු පනවා අයකිරීමටත්, III වැනි උපලේඛනයේ I වන තීරුවේ සඳහන් යම් කටයුත්තක් සඳහා එහි II වැනි තීරුවේ අනුරූපි සටහනේ දක්වා ඇති ගාස්තු පනවා අය කිරීමටත් මඩුල්ල ප්‍රාදේශීය සභාවේ කළමනාකරණ කමිටු නිර්දේශය පදනම් කරගෙන මම තීරණය කරමි.

01. උපලේඛනය (ඉඩමක් හෝ ගොඩනැගිල්ලක්)

I වැනි තීරුව	*II වැනි තීරුව* *රු. ශත*
01. **පොළ භූමිය දවසකට කුළියට දීම**	
I. මකුල්ල පොළ භූමිය	
දිනකට	6,000 0
වරුවකට	3,000 0
II. මාරිඅරාව පොළ භූමිය	
දිනකට	5,000 0
වරුවකට	2,500 0
02. **මකුල්ල බස් නැවතුම්පොළ කුළියට දීම**	
දිනකට	5,000 0
වරුවකට	2,500 0
03. **ශ්‍රවණාගාරය කුළියට දීම**	
I. වැඩමුළු සඳහා	
දිනකට (පැය 08) ශබ්ද විකාශන යන්ත්‍ර හා වේදිකා අලංකාර බුබුළු සමග	20,000 0
දිනකට (පැය 08) ශබ්ද විකාශන යන්ත්‍ර හා වේදිකා අලංකාර බුබුළු නොමැතිව	10,000 0
වරුවකට (පැය 04) ශබ්ද විකාශන යන්ත්‍ර හා වේදිකා අලංකාර බුබුළු සමග	10,000 0
වරුවකට (පැය 04) ශබ්ද විකාශන යන්ත්‍ර හා වේදිකා අලංකාර බුබුළු නොමැතිව	5,000 0
(ඉන් ඔබ්බට ගතවන පැය ගණන්වලට වරුවකට හෝ දිනයට අදාළව ගාස්තු අයකරකරනු ලැබේ)	
II. උත්සව කටයුතු සඳහා	
දිනකට ශබ්ද විකාශන යන්ත්‍ර හා වේදිකා අලංකාර බුබුළු සමග	35,000 0
දිනකට ශබ්ද විකාශන යන්ත්‍ර හා වේදිකා අලංකාර බුබුළු නොමැතිව	25,000 0
04. **සංචාරක නිවාඩු නිකේතනය කුළියට දීම**	
එක් කාමරයක් සඳහා දිනකට A/C සමග	4,000 0
එක් කාමරයක් සඳහා දිනකට A/C නොමැතිව	3,000 0
සම්පූර්ණ සංචාරක නිවාඩු නිකේතනයම දිනකට (උපරිම පුද්ගල සංඛ්‍යාව 10 කි)	15,000 0
උත්සව කටයුත්තක් සඳහා දිනකට	30,000 0
05. **ක්‍රීඩාංගනය ව්‍යාපාර හා විනෝද කටයුතු සඳහා කුළියට ලබා දීම**	
(විනෝද බදු හැර)	
දිනකට	6,000 0
වරුවකට	3,000 0
06. **ආදාහනාගාරය කුළියට ලබා දීම**	
මෘතදේහයක් ආදාහනය සඳහා	12,000 0
ආදාහනාගාර භූමියේ එක් මෘත දේහයක අළු තැන්පත් කිරීම සඳහා	4,000 0
07. **ළමා උද්‍යානයේ උත්සව කටයුතු සඳහා ඡායාරූප ගැනීම සඳහා අයකිරීම**	3,000 0
08. **නෙළුම්වැව බෝට්ටු සේවාව සඳහා ගාස්තු අයකිරීම**	
විනාඩි 30ක් සඳහා	250 0
වැඩිවන සෑම විනාඩි 15කටම	150 0

02. උපලේඛනය (රථ වාහන හා යන්ත්‍ර සූත්‍ර)

I වැනි තීරුව	*II වැනි තීරුව* *රු. ශත*
01. බැකෝ ලෝඩර් යන්ත්‍රය (මීටර් පැයකට)	6,000 0
02. මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය (මීටර් පැයකට)	6,500 0
03. ලොරි ජල බවුසර් එකක් (6,000 L)	7,000 0
පළමු 5 Km ඇතුළත ප්‍රවාහන ගාස්තුවක් අය නොකරන අතර පළමු 5 Km ට අමතරව වැඩිවන සෑම Km කටම	50 0
04. ට්‍රැක්ටර් ජල බවුසර් එකක් (3,000 L)	5,000 0
පළමු 5Km ඇතුළත ප්‍රවාහන ගාස්තුවක් අය නොකරන අතර පළමු 5 Km ට අමතරව වැඩිවන සෑම Km කටම	50 0
05. හිස් ට්‍රැක්ටර් ජල බවුසරය (පැරණි) දිනකට	1,500 0
06. **ට්‍රැක්ටර් රථය සමග හිස් ට්‍රැක්ටර් ජල බවුසරය**	
දිනකට (පැය 08)	10,000 0
වරුවකට (පැය 04)	5,000 0
07. **ට්‍රැක්ටර් රථය කුළියට ලබා දීම**	
දිනකට (පැය 08)	10,000 0
වරුවකට (පැය 04)	5,000 0
පැයකට	2,500 0
08. **ට්‍රිපර් රථය කුළියට ලබා දීම**	
(i) බල ප්‍රදේශය ඇතුළත	
දිනකට (පැය 08)	20,000 0
වරුවකට (පැය 04)	10,000 0
පැය දෙකක් සඳහා	5,000 0
පැයකට	2,500 0
(ii) **බල ප්‍රදේශයෙන් පිටත**	
කිලෝමීටර්	
0-50 දක්වා එක් කිලෝමීටරයකට	300 0
51-100 දක්වා එක් කිලෝමීටරයකට	200 0
101-150 දක්වා එක් කිලෝමීටරයකට	175 0
151ට වැඩිවන සෑම කිලෝමීටරයකටම	150 0
* ඉහත සඳහන් කිලෝමීටර් පරාසය යෑමට සහ ඒමට (Up and Down) අදාළව ගණනය කරනු ලබයි	
09. මික්ස්චර් යන්ත්‍රය දිනකට	4,500 0
10. වැකර් යන්ත්‍රය දිනකට	4,500 0
11. ට්‍රැක්ටර් නඟුල සඳහා දිනකට	2,500 0

03. උපලේඛනය (වෙනත් සේවා)

I වැනි තීරුව	*II වැනි තීරුව* *රු. ශත*
01. මඩුල්ල ප්‍රාදේශීය සභාව සතු හට් එක කුළියට ලබා දීම (දිනකට)	200 0
02. මඩුල්ල ප්‍රාදේශීය සභාව සතු පුටු කුලියට ලබා දීම (එක් පුටුවක් සඳහා)	5 0
03. මඩුල්ල ප්‍රාදේශීය සභාව සතු කොඩි ලබා දීම (කොඩියක් දිනකට)	20 0
04. මඩුල්ල ප්‍රාදේශීය සභාව සතු කොඩි කණු කුළියට ලබා දීම (කොඩි කණුවක් දිනකට)	20 0
05. ළමා උද්‍යානයට ඇතුල්වීමේ ගාස්තුව එක් අයෙකු සඳහා	
වයස අවු. 12ට අඩු එක් අයෙකු සඳහා	30 0
වයස අවු. 12ට වැඩි එක් අයෙකු සඳහා	50 0
06. පොළ තරාදිය යෙදවීමේ කිරුම් ගාස්තුව (බර 10 kg ට වැඩි වන විට)	20 0

11-554/9

මඩුල්ල ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා නැණසල මධ්‍යස්ථානවල දඩ හා ගාස්තු අයකිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2023.09.25 වැනි දිනැති තීරණ අංක 331 යටතේ පහත සඳහන් තීරණය ගන්නට යෙදුනු බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

ඒ අනුව මඩුල්ල ප්‍රාදේශීය සභාව විසින් පවත්වාගෙන යනු ලබන නැණසල මධ්‍යස්ථානවල සේවාලාභීන් වෙනුවෙන් සලසා ඇති පහසුකම් සඳහා වැයවන ගාස්තු පියවීම පිණිස පහත සඳහන් උපලේඛනයට අදාළ ගාස්තු 2024 වර්ෂය සඳහා පනවා අය කිරීමට තීරණය කරන ලද බව වැඩිදුරටත් මෙයින් නිවේදනය කරනු ලැබේ.

එච්. බී. එම්. චන්දිමා මල්කාන්ති,
සභා ලේකම්,
මඩුල්ල ප්‍රාදේශීය සභාව.

2023 සැප්තැම්බර් මස 25 වැනි දින,
මඩුල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

මඩුල්ල ප්‍රාදේශීය සභාවට අයත් මහජන පුස්තකාල තුළ පවත්වාගෙන යනු ලබන නැණසල මධ්‍යස්ථානවල සේවාලාභීන් වෙනුවෙන් සලසා ඇති පරිගණක යන්ත්‍ර හා ඡායා පිටපත් යන්ත්‍ර නඩත්තු හා මෙහෙයුම් වෙනුවෙන් වැයවන ගාස්තු පියවීම පිණිස 2024 වර්ෂය සඳහා පහත සඳහන් උපලේඛනයට අදාළ ගාස්තු පැනවීමට මඩුල්ල ප්‍රාදේශීය සභාවේ කළමනාකරණ කමිටු නිර්දේශය පදනම් කරගෙන මම තීරණය කරමි.

උපලේඛනය

අනු අංකය	*ලබාදෙනු ලබන සේවාව*	*මුදල* *රු. ශත*
01.	අන්තර්ජාල පහසුකම් (පැය 1 සඳහා)	200 0

		රු. ශත
02.	ඡායා පිටපත්	
	තනිපැත්ත	15 0
	දෙපැත්ත	20 0
03.	මුද්‍රණය කිරීම	
	තනිපැත්ත	
	A4	20 0
	Legal	25 0
	A3	30 0
	දෙපැත්ත	
	A4	25 0
	Legal	30 0
	A3	35 0
04.	සකස් කර මුද්‍රණය කිරීම	
	තනිපැත්ත	130 0
	දෙපැත්ත	200 0
05.	සාමාජික මුදල (පාසල්, වැඩිහිටි)	100 0
06.	සාමාජිකත්වය අළුත් කිරීම (මසකට)	100 0
07.	පාඨමාලා ගාස්තු (මාස 06)	6,000 0

11-554/10

මඩුල්ල ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා දෛනික මාළු වෙළෙඳාම් සිදු කරන ස්ථානවලින් ගාස්තු අයකිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2023.09.25 වැනි දිනැති තීරණ අංක 332 යටතේ පහත සඳහන් තීරණය ගන්නට යෙදුනු බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

එච්. බී. එම්. චන්දිමා මල්කාන්ති,
සභා ලේකම්,
මඩුල්ල ප්‍රාදේශීය සභාව.

2023 සැප්තැම්බර් මස 25 වැනි දින,
මඩුල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

2016.12.09 වැනි දින අංක 1997 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළකර වැළඳ ගන්නා ලද උෆව පළාතේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2013.06.28 වැනි දින අංක 1816/43 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* IV(අ) කොටසේ පළ කරන ලද්දා වූ මාළු විකිණීම පිළිබඳ 20 වැනි සම්මත අතුරු ව්‍යවස්ථාවේ නියමයන් හා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 126 වැනි වගන්තියේ (IX) වන උපවගන්තියේ (ඒ) ඡේදයෙන් ලැබී ඇති බලතල ප්‍රකාරව මඩුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ යතුරු පැදි, ත්‍රීරෝද රථ හෝ ලොරි රථ මගින් දෛනික මාළු වෙළෙඳාම් සිදුකරන වෙළෙන්දන්ගෙන් පහත උපලේඛනයේ I වැනි තීරුවේ සඳහන් යම් කටයුත්තක් සම්බන්ධයෙන් එහි අනුරූපී සටහනේ II වැනි තීරුවේ සඳහන් ගාස්තු 2024 වර්ෂය සඳහා පනවා අයකිරීමට මඩුල්ල ප්‍රාදේශීය සභාවේ කළමනාකරණ කමිටු නිර්දේශය පදනම් කරගෙන මම තීරණය කරමි.

උපලේඛනය I

I වැනි තීරුව	*II වැනි තීරුව* *රු. ශත*
මාළු වෙළෙඳාම් කරන යතුරු පැදියකින් හෝ ස්ථානයකින් දිනකට	200 0
ලොරි රථයකින් හෝ වෙනත් වාහනයකින් දිනකට	300 0
මකුල්ල බස් නැවතුම් පොළ අසළ මඩුල්ල ප්‍රාදේශීය සභා මත්ස්‍ය වෙළෙඳ සැලෙහි දෛනිකව වෙළඳාම් කරන එක් අයෙකුගෙන් දිනකට	200 0

11-554/11

මඩුල්ල ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා සංචාරක වෙළෙඳාම් සිදුකරන ස්ථානවලින් ගාස්තු අයකිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2023.09.25 වැනි දිනැති තීරණ අංක 333 යටතේ පහත සඳහන් තීරණය ගන්නට යෙදුනු බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

එච්. බී. එම්. චන්දිමා මල්කාන්ති,
සභා ලේකම්,
මඩුල්ල ප්‍රාදේශීය සභාව.

2023 සැප්තැම්බර් මස 25 වැනි දින,
මඩුල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

2016.12.09 වැනි දින අංක 1997 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළකර වැළඳ ගන්නා ලද ඌව පළාතේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2013.06.28 වැනි දින අංක 1816/43 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* IV(ඇ) කොටසේ පළ කරන ලද්ද වූ සංචාරක වෙළෙඳාම පිළිබඳ 23 වන අතුරු ව්‍යවස්ථාවේ නියමයන් හා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වගන්තියේ 1 වන උපවගන්තියෙන් ලැබී ඇති බලතල ප්‍රකාරව මඩුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ සංචාරක වෙළෙඳාම් සිදුකරන වෙළෙන්දන්ගෙන් හා ස්ථානවලින්, පහත උපලේඛනයේ I වන තීරුවේ සඳහන් යම් කටයුත්තක් සම්බන්ධයෙන් එහි අනුරූපී සටහනේ II වැනි තීරුවේ සඳහන් ගාස්තු 2024 වර්ෂය සඳහා පැනවීමට මූල්‍ය හා ප්‍රතිපත්ති කමිටුවේ දී තීරණය කරන ලදී. නමුත් ස්වයං රැකියාවක් ලෙස ආබාධිත අය විසින් වෙළෙඳාම් කටයුතු සිදු කරන අවස්ථාවල දී ඔවුන්ගේ ලිඛිත ඉල්ලීමක් මත මෙම ගාස්තු අය කිරීම නිදහස් කළ හැකි බවද මඩුල්ල ප්‍රාදේශීය සභාවේ කළමනාකරණ කමිටු නිර්දේශය පදනම් කරගෙන මම තීරණය කරමි.

උපලේඛනය

I වැනි තීරුව	*II වැනි තීරුව* *රු. ශත*
කුඩා පරිමාණ සංචාරක ව්‍යාපාරයකින් දිනකට (යතුරු පැදියකින්, පා පැදියකින් හෝ ත්‍රිරෝද රථයකින්)	50 0
මහා පරිමාණ සංචාරක වෙළෙඳාමක් සඳහා දිනකට (ලොරි රථයකින් හෝ වෙනත් වාහනයකින්)	100 0
තාවකාලික සංචාරක වෙළඳාම් සිදු කරන ස්ථානයකින්	200 0
ජංගම වෙළඳ කුටියකින්	200 0

11-554/12

මඩුල්ල ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා වැලි, පස්, ගල් ප්‍රවාහනයේ දී ගාස්තු අයකිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2023.09.25 වැනි දිනැති තීරණ අංක 334 යටතේ පහත සඳහන් තීරණය ගන්නට යෙදුනු බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

එච්. බී. එම්. චන්දිමා මල්කාන්ති,
සභා ලේකම්,
මඩුල්ල ප්‍රාදේශීය සභාව.

2023 සැප්තැම්බර් මස 25 වැනි දින,
මඩුල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

2016.12.09 වැනි දින අංක 1997 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළකර වැළඳ ගන්නා ලද ඌව පළාතේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2013.06.28 වැනි දින අංක 1816/43 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* IV(ඇ) කොටසේ පළ කරන ලද්දා වූ අංක 07 දරන මාර්ගවල ගමන් කරන වාහනවල බර හා වේග සීමා කිරීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථාව හා අංක 8 දරන පාරවල් හා මංමාවත්වල බාධක, අවහිර කිරීම් හා අලාභහානි වැළැක්වීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා මගින් සලසා ඇති ප්‍රතිපාදන සැළකිල්ලට ගනිමින් භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කැනීම් කාර්යංශයෙන් නිකුත් කර ඇති බලපත්‍රයෙහි සඳහන් කියුබ් ප්‍රමාණය අනුව එක් කියුබ් 1 කින් රු. 250.00 ක මුදලක් අය කිරීමට මඩුල්ල ප්‍රාදේශීය සභාවේ කළමනාකරණ කමිටු නිර්දේශය පදනම් කරගෙන මම තීරණය කරමි.

11-554/13

මඩුල්ල ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා පාරිසරික නිර්දේශ ලබාදීමේ දී ගාස්තු අයකිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2023.09.25 වැනි දිනැති තීරණ අංක 335 යටතේ පහත සඳහන් තීරණය ගන්නට යෙදුනු බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

එච්. බී. එම්. චන්දිමා මල්කාන්ති,
සභා ලේකම්,
මඩුල්ල ප්‍රාදේශීය සභාව.

2023 සැප්තැම්බර් මස 25 වැනි දින,
මඩුල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වගන්තියේ 1 වැනි උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව වානිජමය කටයුත්තක් උදෙසා වැලි කැනීම් බලපත්‍රයක් ලබා ගැනීමට අවශ්‍ය පාරිසරික නිර්දේශ ලබාදීමේ දී පරීක්ෂණ ගාස්තු වශයෙන් රු. 1000.00 ක මුදලක් අයකිරීමට මඩුල්ල ප්‍රාදේශීය සභාවේ කළමනාකරණ කමිටු නිර්දේශය පදනම් කරගෙන මම තීරණය කරමි.

11-554/14

මඩුල්ල ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා කසල බදු අයකිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2023.09.25 වැනි දිනැති තීරණ අංක 336 යටතේ පහත සඳහන් තීරණය ගන්නට යෙදුනු බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

එච්. බී. එම්. චන්දිමා මල්කාන්ති,
සභා ලේකම්,
මඩුල්ල ප්‍රාදේශීය සභාව.

2023 සැප්තැම්බර් මස 25 වැනි දින,
මඩුල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

2016.12.09 වැනි දින අංක 1997 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළකර වැළඳ ගන්නා ලද ඌව පළාතේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2013.06.28 වැනි දින අංක 1816/43 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* IV(ඇ) කොටසේ පළ කරන ලද්දා වූ අංක 13 දරන කසල ශෝධනය පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථාව මගින් සලසා ඇති ප්‍රතිපාදන සැලකිල්ලට ගනිමින් කසල එකතු කරනු ලබන සීමාව තුළ, ආපනශාලා, වෙළඳසැල්, ව්‍යාපාරික ස්ථාන, හෝටල්, පෞද්ගලික ආයතන වලින් මසකට පහත උපලේඛනයේ සඳහන් ගාස්තු අයකිරීමට මඩුල්ල ප්‍රාදේශීය සභාවේ කළමනාකරණ කමිටු නිර්දේශය පදනම් කරගෙන මම තීරණය කරමි.

උපලේඛනය

I වැනි තීරුව *කිලෝග්‍රෑම්*	*II වැනි තීරුව* *රු. ශත*
00-05	ගාස්තු අය නොකළ යුතුයි.
06-10	350 0
11-20	450 0
21-30	500 0
31-50	700 0
51-60	1,000 0
61-100	2,000 0
101-150	3,000 0
151-200	5,000 0
201-300	7,000 0
301ට වැඩි	9,000 0

11-554/15

මඩුල්ල ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා ත්‍රීරෝද රථවලින් ගාස්තු අයකිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2023.09.25 වැනි දිනැති තීරණ අංක 337 යටතේ පහත සඳහන් තීරණය ගන්නට යෙදුනු බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

එච්. බී. එම්. චන්දිමා මල්කාන්ති,
සභා ලේකම්,
මඩුල්ල ප්‍රාදේශීය සභාව.

2023 සැප්තැම්බර් මස 25 වැනි දින,
මඩුල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

2016.12.09 වැනි දින අංක 1997 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළකර වැළඳ ගන්නා ලද උඟව පළාතේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2013.06.28 වැනි දින අංක 1816/43 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ *ගැසට් පත්‍රයේ* IV(ඇ) කොටසේ පළ කරන ලද්දා වූ අංක 08 දරන පාරවල් හා මංමාවත්වල බාධක අවහිර කිරීම් හා අලාභහානි වැළැක්වීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා මගින් සලසා ඇති බලතල ප්‍රකාරව හා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 34 වන වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව මඩුල්ල ප්‍රාදේශීය සභාව මගින් පවත්වාගෙන යනු ලබන ත්‍රීවීල් රථාංගනයක පවතින ත්‍රීරෝද රථයකින් වාර්ෂිකව රු. 1,200.00 ක මුදලක් අය කිරීමට මඩුල්ල ප්‍රාදේශීය සභාවේ කළමනාකරණ කමිටු නිර්දේශය පදනම් කරගෙන මම තීරණය කරමි.

11-554/16

මඩුල්ල ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා දැව ප්‍රවාහනය කිරීමේ දී ගාස්තු අයකිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2023.09.25 වැනි දිනැති තීරණ අංක 338 යටතේ පහත සඳහන් තීරණය ගන්නට යෙදුනු බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

එච්. බී. එම්. චන්දිමා මල්කාන්ති,
සභා ලේකම්,
මඩුල්ල ප්‍රාදේශීය සභාව.

2023 සැප්තැම්බර් මස 25 වැනි දින,
මඩුල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

2016.12.09 වැනි දින අංක 1997 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළකර වැළඳ ගන්නා ලද උඟව පළාතේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2013.06.28 වැනි දින අංක 1816/43 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* IV(ඇ) කොටසේ පළ කරන ලද්ද, වූ අංක 07 දරන මාර්ගවල ගමන් කරන වාහනවල බර හා වේග සීමා කිරීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථාව හා අංක 8 දරන පාරවල් හා මංමාවත්වල බාධක, අවහිර කිරීම් හා අලාභහානි වැළැක්වීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා මගින් සලසා ඇති බලතල ප්‍රකාරව මඩුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ දැව ප්‍රවාහනය කිරීමේ දී ප්‍රාදේශීය අතුරු මාර්ග භාවිතා කරන්නේ නම් දැව ලොරි ලෝඩ් එකකින් රු. 5,000.00 ක මුදලක් ගාස්තු වශයෙන් අය කිරීමට මඩුල්ල ප්‍රාදේශීය සභාවේ කළමනාකරණ කමිටු නිර්දේශය පදනම් කරගෙන මම තීරණය කරමි.

11-554/17

මඩුල්ල ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා ජල ගාස්තු අයකිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2023.09.25 වැනි දිනැති තීරණ අංක 339 යටතේ පහත සඳහන් තීරණය ගන්නට යෙදුනු බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

එච්. බී. එම්. චන්දිමා මල්කාන්ති,
සභා ලේකම්,
මඩුල්ල ප්‍රාදේශීය සභාව.

2023 සැප්තැම්බර් මස 25 වැනි දින,
මඩුල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

2016.12.09 වැනි දින අංක 1997 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළකර වැළඳ ගන්නා ලද 1989 අංක 32 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වගන්තියේ 1 වන උපවගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු 261 අධිකාරිය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තියේ 1 වන උපවගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව ඌව පළාතේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2013.01.22 වැනි දින අංක 1794/12 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ *ගැසට් පත්‍රයේ* පළකරන ලද්දා වූ ප්‍රජාමූල සංවිධාන කළමනාකරණය කරනු ලබන ග්‍රාමීය ජල සම්පාදන ක්‍රම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථාවේ නියමයන් හා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වන වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 126 වගන්තියේ XIII උපවගන්තියේ (ඔ) ඡේදයෙන් ලැබී ඇති බලතල ප්‍රකාරව මඩුල්ල ප්‍රාදේශීය සභාවේ බල ප්‍රදේශය තුළ ගෘහස්ථ ජල සැපයුම් සඳහා අය කරන ගාස්තු උපලේඛන 1 හි ද වාණිජ ජල සැපයුම් සඳහා අයකරන ගාස්තු උපලේඛන 2 හි ද ජල ව්‍යාපෘති සම්බන්ධ මූලික තොරතුරු උපලේඛන 3 හි ද පහත පරිදි දක්වා ඇත.

උපලේඛනය 1 (ගෘහස්ථ)

උපලේඛන 1

මූදල රු. ශත	*ඒකකය*	*ඒකකයක මිල රු. ශත*	*මුළු මුදල රු. ශත*
15.00	1	15.00	215.00
	2	30.00	230.00
	3	45.00	245.00
	4	60.00	260.00
	5	75.00	275.00
20.00	6	95.00	295.00
	7	115.00	315.00
	8	135.00	335.00
	9	155.00	355.00
35.00	10	175.00	375.00
	11	210.00	410.00
	12	245.00	445.00
	13	280.00	480.00

මුදල *රු. ශත*	*ඒකකය*	*ඒකකයක මිල* *රු. ශත*	*මුළු මුදල* *රු. ශත*
35.00	14	315.00	515.00
	15	350.00	550.00
45.00	16	395.00	595.00
	17	440.00	640.00
	18	485.00	685.00
	19	530.00	730.00
	20	575.00	775.00
55.00	21	630.00	830.00
	22	685.00	885.00
	23	740.00	940.00
	24	795.00	995.00
	25	850.00	1050.00
	26	905.00	1105.00
	27	960.00	1160.00
	28	1015.00	1215.00
	29	1070.00	1270.00
	30	1125.00	1325.00
	31	1180.00	1380.00
	32	1235.00	1435.00
	33	1290.00	1490.00
	34	1345.00	1545.00
	35	1400.00	1600.00
	36	1455.00	1655.00
	37	1510.00	1710.00
	38	1565.00	1765.00
	39	1620.00	1820.00
	40	1675.00	1875.00
	41	1730.00	1930.00
	42	1785.00	1985.00
	43	1840.00	2040.00
	44	1895.00	2095.00
	45	1950.00	2150.00
65.00	46	2015.00	2215.00
	47	2080.00	2280.00
	48	2145.00	2345.00
	49	2210.00	2410.00
	50	2275.00	2475.00
	51	2340.00	2540.00
	52	2405.00	2605.00
	53	2470.00	2670.00
	54	2535.00	2735.00

මූදල *රු. ශත*	*ඒකකය*	*ඒකකයක මිල* *රු. ශත*	*මුළු මූදල* *රු. ශත*
65.00	55	2600.00	2800.00
	56	2665.00	2865.00
	57	2730.00	2930.00
	58	2795.00	2995.00
	59	2860.00	3060.00
	60	2925.00	3125.00
	61	2990.00	3190.00
	62	3055.00	3255.00
	63	3120.00	3320.00
	64	3185.00	3385.00
	65	3250.00	3450.00

උපලේඛනය 2 (වාණිජ)

15.00	1	15.00	265.00
	2	30.00	280.00
	3	45.00	295.00
	4	60.00	310.00
	5	75.00	325.00
20.00	6	95.00	345.00
	7	115.00	365.00
	8	135.00	385.00
	9	155.00	405.00
	10	175.00	425.00
40.00	11	215.00	465.00
	12	255.00	505.00
	13	295.00	545.00
	14	335.00	585.00
	15	375.00	625.00
50.00	16	425.00	675.00
	17	475.00	725.00
	18	525.00	775.00
	19	575.00	825.00
	20	625.00	875.00
60.00	21	685.00	935.00
	22	745.00	995.00
	23	805.00	1055.00
	24	865.00	1115.00
	25	925.00	1175.00

60.00	26	985.00	1235.00
	27	1045.00	1295.00
	28	1105.00	1355.00
	29	1165.00	1415.00
	30	1225.00	1475.00
	31	1285.00	1535.00
	32	1345.00	1595.00
	33	1405.00	1655.00
	34	1465.00	1715.00
	35	1525.00	1775.00
	36	1585.00	1835.00
	37	1645.00	1895.00
	38	1705.00	1955.00
	39	1765.00	2015.00
	40	1825.00	2075.00
	41	1885.00	2135.00
	42	1945.00	2195.00
	43	2005.00	2255.00
	44	2065.00	2315.00
	45	2125.00	2375.00
70.00	46	2195.00	2445.00
	47	2265.00	2515.00
	48	2335.00	2585.00
	49	2405.00	2655.00
	50	2475.00	2725.00

උපලේඛනය 3

ජල ව්‍යාපෘතියේ නම	*ස්ථාවර තැන්පත් ගාස්තුව රු. ශත*	*ගෘහස්ථ අනිවාර්ය ගාස්තුව රු. ශත*	*වාණිජ අනිවාර්ය ගාස්තුව රු. ශත*	*දඩ මුදල රු. ශත*
මකුල්ල	18,000.00	200.00	250.00	1%
කහගොල්ල	18,000.00	200.00	250.00	1%
හැකිරිල්ල	18,000.00	200.00	250.00	1%

පොදු කරුණු :

01. නව ජල සම්බන්ධතාවය ලබා ගැනීමේ ඉල්ලුම්පත්‍ර ගාස්තුව - රු. 200.00

නාත්තණ්ඩිය ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වන වගන්තියේ (3) වන උප වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාරව, නාත්තණ්ඩිය ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍ය ඉටු කරන, ලේකම් වන කේ. පී. චන්දන කුමාර වන මම, නාත්තණ්ඩිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙහි දියුණුගම් කලාපය ලෙසට හඳුනාගන්නා ලද කලාපය තුළ 2024 වර්ෂය සඳහා වරිපනම් බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට 2023.10.16 වැනි දිනැති අංක 1997 දරන තීරණය යටතේ මවිසින් තීරණය කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

කේ. පී. චන්දන කුමාර,
ලේකම්/ බලතල කාර්යය කර්තව්‍ය
ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
නාත්තණ්ඩිය ප්‍රාදේශීය සභාව.

2023 ඔක්තෝබර් මස 16 වැනි දින,
නාත්තණ්ඩිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වන වගන්තියේ (3) වන උප වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාරව,

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ නාත්තණ්ඩිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටියා වූ නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල, ගෙපත්වල වාර්ෂික වටිනාකම සඳහා 2012 වර්ෂයේ ක්‍රියාත්මකව 2023 වර්ෂයේ (පෙර වර්ෂයේ) දී ද පිළිගෙන ක්‍රියාත්මක කරන ලද තක්සේරුව 2024 වර්ෂය සඳහා වන තක්සේරුව ලෙස පිළිගත යුතු බවටත්,

10.	අයිස්ක්‍රීම්/ අයිස් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම	500.00	750.00	1000.00
11.	සෝගාතකාගාරයක් පවත්වාගෙන යාම	500.00	750.00	1000.00
12.	කොණ්ඩා සැකසීම/ සැලුන් (බාබර් සාප්පු)	500.00	750.00	1000.00
13.	සිසිල් බීම කාර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම	500.00	750.00	1000.00
14.	ගවගාලක් පවත්වාගැනීම	500.00	750.00	1000.00
15.	පෞද්ගලික වෙළෙඳපොළවල් හෝ වෙනත් බලයලත් ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1000.00
16.	උකස්කරුවන් සඳහා ලියාපදිංචිය ලබාදීම	500.00	750.00	1000.00
17.	සංචාරක වෙළෙන්දෝ	500.00	750.00	1000.00
18.	ආහාර විකිණීම	500.00	750.00	1000.00
19.	තැරැව්කරුවන් හා වෙන්දේසිකරුවන්	500.00	750.00	1000.00
20.	අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථාන	500.00	750.00	1000.00

උපලේඛන අංක 05

01.	වෙන්දේසිකරුවන් හා බ්‍රෝකර්වරුන් ලියාපදිංචි කිරීම සඳහා වන බලපත්‍ර ගාස්තුව	රු. 1000.00
02.	1975 අංක 17 දරන සමාජශාලාවලට බලපත්‍ර ලබාදීමේ පනත යටතේ වන බලපත්‍ර ගාස්තුව	රු. 1000.00

11 - 512/1

නිකවැරටිය ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා ව්‍යාපාර බද්ද පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වන වගන්තියේ (3) වැනි උපවගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාරව නිකවැරටිය ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍ය ඉටු කරන, නිකවැරටිය ප්‍රාදේශීය සභාවේ ලේකම් එච්.එම්.එම්.බී. හේරත් වන මම, එකී පනතේ 152 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව නිකවැරටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2024 වර්ෂයට අදාළව ව්‍යාපාර බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට 2023.10.19 දිනැති NPS/10/0864/2023

අංක දරන තීරණය යටතේ මවිසින් තීරණය කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

එච්. එම්. එම්.බී. හේරත්,
ලේකම් හා බලතලකාර්ය කර්තව්‍ය ඉටුකරන නිලධාරි,
නිකවැරටිය ප්‍රාදේශීය සභාව.

2023 ඔක්තෝබර් මස 19 වැනි දින,
නිකවැරටිය ප්‍රාදේශීය සභාවේ දී ය.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වැනි වගන්තියේ (3) වන උප වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 152 වන වගන්තියේ (1) වන උපවග්තිය යටතේ නිකවැරටිය ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලල ප්‍රකාර එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍ර ලබා ගැනීමට හෝ එම පනතේ 150 වන වගන්තිය යටතේ යම් බද්දක් ගෙවීමට අවශ්‍ය නොවන්නා වූ යම් ව්‍යාපාරයක් නිකවැරටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2024 වර්ෂයේදී පවත්වාගෙන යන සෑම තැනැත්තෙක්ගෙන් ම එම ව්‍යාපාරයේ 2024 වර්ෂයේ ආදායම මෙහි පහත උපලේඛනයෙහි I වන තීරුවේ නිරූපිත යම් විෂයංක සීමාවන් ඇතුළත පවතින අවස්ථාවක එකී උපලේඛනයේ II තීරුවේ අනුරූප සටහනේ නිරූපිත අනුප්‍රමාණයක ව්‍යාපාර බද්දක් 2024 වර්ෂය සඳහා නියම විය යුතු බවටත්, එකී ව්‍යාපාර බද්දට යටත් තැනැත්තකු 2024 වර්ෂයේ මාර්තු මස 30 දිනට පෙර එකී ව්‍යාපාර බද්ද නිකවැරටිය ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් තීරණය කරමි.

උපලේඛනය

	I වැනි තීරුව	*II වැනි තීරුව*
	2023 වර්ෂයේ දී ව්‍යාපාරයේ ආදායම:	*රු. ශත*
01	රු. 6,000 නොඉක්මවන අවස්ථාවක	කිසිවක් නැත
02	රු. 6,001 ඉක්මවන නමුත් රු. 12,000 නොඉක්මවන විට	90 0
03	රු. 12,001 ඉක්මවන නමුත් රු. 18,750 නොඉක්මවන විට	180 0
04	රු 18,751 ඉක්මවන නමුත් රු. 75,000 නොඉක්මවන විට	360 0
05	රු. 75,001 ඉක්මවන නමුත් රු. 1,50,000 නොඉක්මවන විට	1,200 0
06	රු. 1,50,001 ඉක්මවන විට	3,000 0

11 - 512/2

නිකවැරටිය ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා කර්මාන්ත බද්ද පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වනවගන්තියේ (3) වන උප වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාරව නිකැරටිය ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍ය ඉටු කරන, ලේකම් වන එච්.එම්.එම්.බී. හේරත් වන මම, එකී පනතේ 150 වන වගන්තියෙහි (1) වන වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව නිකවැරටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙහි 2024 වර්ෂය සඳහා බලපත්‍ර ගාස්තු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට 2023.10.19 වැනි දින අංක NPS/10/0865/2023 දරන තීරණය යටතේ මවිසින් තීරණය කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

එච්. එම්. එම්. බී. හේරත්,
ලේකම් හා බලතල කාර්ය කර්තව්‍ය ඉටු කරන නිලධාරි,
නිකවැරටිය ප්‍රාදේශීය සභාව.

2023 ඔක්තෝබර් මස 19 වැනි දින,
නිකවැරටිය ප්‍රාදේශීය සභාවේ දී ය.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වන වගන්තියෙ (3) වන උප වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 150 වැනි වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව - නිකවැරටිය ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක පවත්වාගෙන යනු ලබන. මෙහි පහත උපලේඛනයෙහි II වන තීරුවේ අනුරූප සටහනේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2024 වර්ෂය සඳහා නියමවිය යුතු බවටත්, එකී කර්මාන්ත බද්දට යටත් තැනැත්තෙකු 2024 වර්ෂයේ මාර්තු මස 30 වැනි දිනට පෙර කර්මාන්ත බද්ද නිකවැරටිය ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් තීරණය කරමි.

උපලේඛනය

උපලේඛනය අංක 04

අප්‍රසන්න හා අන්තරායදායක ව්‍යාපාර :

I වැනි — *II* වැනි තීරුව
පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම

	බලය දෙනු ලබන කාර්යය	*රුපියල් 750 නොඉක්මවන අවස්ථාවක*	*රුපියල් 751 ඉක්මවන එහෙත් රුපියල් 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රුපියල් රු. 1,501 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
01.	ලියවන පට්ටලයක් පවත්වාගෙන යාම	500.00	750.00	1000.00
02.	ස්ත්‍රීන් ප්‍රින්ටින් වැඩපලක් පවත්වාගෙන යාම	500.00	750.00	1000.00
03.	ගල් ස්මාරක, සිහිවටන පුවරු සෑදීමේ හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1000.00
04.	පපඩම හෝ නූඩ්ල්ස් නිපදවීම හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1000.00
05.	ඔසු පැන්හලක්, කොළ කැඳ හෝ බැදපු කඩල, රටකජු (ටේස්ට් කඩල) විකිණීම	500.00	750.00	1000.00
06.	පානීය ජලය බෝතල් කර ගබඩා කර තබාගැනීම හා විකිණීම සඳහා ස්ථානයක් පැවැත්වීම	500.00	750.00	1000.00
07.	තීන්ත නිෂ්පාදනය හා අලෙවිය	500.00	750.00	1000.00
08.	කොප්පරා නිෂ්පාදනය කිරීම, ගබඩා කිරීම හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1000.00
09.	පොලිතින් බෑග් නිෂ්පාදනය කිරීම හෝ ගබඩා කර තැබීම සඳහා ව්‍යාපාරයක් පැවැත්වීම	500.00	750.00	1000.00
10.	විසිතුරු භාණ්ඩ හෝ කැටයම් භාණ්ඩ නිෂ්පාදනය කිරීම හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1000.00
11.	විකිණීම සඳහා බිම්මල් හෝ වෙනත් මල්පැළ වර්ග තවාන් කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම	500.00	750.00	1000.00

	බලය දෙනු ලබන කාර්යය	රුපියල් 750 නොඉක්මවන අවස්ථාවක	රුපියල් 751 ඉක්මවන එහෙත් රුපියල් 1,500 නොඉක්මවන අවස්ථාවක	රුපියල් රු. 1,501 ඉක්මවන අවස්ථාවක
		රු. ශත	රු. ශත	රු. ශත
12.	ඇඳුම් මැසීමේ ස්ථානයක් පැවැත්වීම	500.00	750.00	1000.00
13.	ඇස් කණ්ණාඩි නිපදවීම, විකිණීමේ ස්ථානයක් පැවැත්වීම	500.00	750.00	1000.00
14.	පින්තූර රාමු කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1000.00
15.	මදුරුදැල් මහන ස්ථානයක් හෝ විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1000.00
16.	සුරතල් මසුන් ඇති කිරීම, විකිණීම හා මාළු ටැංකි සෑදීම හා විකිණීම පවත්වාගෙන යාම	500.00	750.00	1000.00
17.	අභ්‍යාස පොත් නිෂ්පාදනය කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500.00	750.00	1000.00
18.	දැන්වීම් පුවරු ඇඳීම, ප්ලාස්ටික් අංක තහඩු සැකසීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1000.00
19.	ඉස්සන් හා මාළු ඇති කිරීමේ ගොවිපළක් පැවැත්වීම	500.00	750.00	1000.00
20.	දත් කුඩු නිෂ්පාදනය	500.00	750.00	1000.00
21.	තල් අමුද්‍රව්‍ය යොදා භාණ්ඩ නිපදවීම හා අලෙවිය	500.00	750.00	1000.00

11 - 512/3

නිකවැරටිය ප්‍රාදේශීය සභාව

2024 වර්ෂ සඳහා වරිපනම් බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වන වගන්තියේ (3) වන උප වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාරව නිකැරටිය ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍ය ඉටු කරන, ලේකම් වන එච්.එම්.එම්.බී. හේරත් වන මම, නිකවැරටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙහි දියුණු ගම් කලාප ලෙසට හඳුනාගන්නා ලද කලාපය 2024 වර්ෂය සඳහා වරිපනම් බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට 2023.10.19 වැනි දින අංක NPS/10/0866/2023 දරන තීරණය යටතේ මවිසින් තීරණය කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

එච්.එම්.එම්.බී. හේරත්,
ලේකම් හා බලතල කාර්ය කර්තව්‍ය කරවන නිලධාරි,
නිකවැරටිය ප්‍රාදේශීය සභාව.

2023 ඔක්තෝබර් මස 19 වැනි දින,
නිකවැරටිය ප්‍රාදේශීය සභාවේ දී ය.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වන වගන්තියේ (3) වන උප වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාරව,

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වන වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ නිකවැරටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2023 වර්ෂය සඳහා බලාත්මක කරන ලද සත්‍යක්ෂණය කිරීම 2024 වර්ෂය සඳහා සත්‍යක්ෂණය කිරීම ලෙස

පිළිගත යුතු බවටත්,

එකී පනතේ 134 වගන්තියේ (1) උපවගන්තිය යටතේ එකී දේපළ මත ඉහත කී තක්සේරුව සඳහා වාර්ෂික වටිනාකමින් සියයට පහක (5%)ක වාර්ෂික වරිපනම් බද්දක් නියමවිය යුතු බවටත්,

තවද 2024 වර්ෂයෙහි පහත උපලේඛනයෙහි සඳහන් එක් එක් කාර්තුව වෙනුවෙන් ඉදිරියෙන් නිරූපිත දිනයට පෙර එසේ නියම කරන ලද වාර්ෂික වරිපනම් බද්ද නිකවැරටිය ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවිය යුතු බවටත්, එලෙස වාර්ෂික වරිපනම් බද්ද එම වර්ෂයේ ජනවාරි මාසයේ 31 වැනි දින හෝ ඊට ප්‍රථම ගෙවන්නේ නම් වාර්ෂික වරිපනම් බද්දේ ප්‍රමාණයෙන් සියයට 10%ක වට්ටමක් ද, එකී උපලේඛනයේ එක් එක් කාර්තුව ඉදිරියේ තුන්වන තීරුවේ නිරූපිත දිනයට අදාළ වරිපනම් බදු මුදල නිකවැරටිය ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවන්නේ නම් එකී කාර්තුවට අදළ මුදලින් 5%ක වට්ටමක් ද නිකවැරටිය ප්‍රාදේශීය සභාව ලබා දිය යුතු බවටත් තීරණය කරමි.

i. තීරුව	*ii. තීරුව*	*iii. තීරුව*
කාර්තුව	*ගෙවිය යුතු දිනය*	*5%ක වට්ටම් සඳහා හිමිකම් ලබන අවසාන දිනය*
පළමු වන කාර්තුව	2024.03.31	2024.01.31
දෙවන කාර්තුව	2024.06.30	2024.04.30
තුන්වන කාර්තුව	2024.09.30	2024.07.31
හතරවන කාර්තුව	2024.12.31	2024.10.31

11 - 512/4

නිකවැරටිය ප්‍රාදේශීය සභාව

2024 වර්ෂ සඳහා වරිපනම් බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වන වගන්තියේ (3) වන උප වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාරව නිකැරටිය ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍ය ඉටු කරන, ලේකම වන එච්. එම්. එම්. බී. හේරත් වන මම, නිකවැරටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙහි දියුණුගම් කලාපය ලෙසට හඳුනා ගන්නා ලද කලාපය හැර සෙසු කලාපයන් සඳහා 2024 වර්ෂය සඳහා අක්කර බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට 2023.10.19 වැනි දින අංක NPS/10/0867/2023 දරන තීරණය යටතේ මවිසින් තීරණය කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

එච්.එම්.එම්.බී. හේරත්,
ලේකම් හා බලතල කාර්ය කර්තව්‍ය කරවන නිලධාරි,
නිකවැරටිය ප්‍රාදේශීය සභාව.

2023 ඔක්තෝබර් මස 19 වන දින,
නිකවැරටිය ප්‍රාදේශීය සභාවේ දී ය.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වන වගන්තියේ (3) වන උප වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාරව,

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වන වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ නිකවැරටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2023 වර්ෂය බලාත්මක කරන ලද සත්‍යාක්ෂණය කිරීම 2024 වර්ෂය සඳහා සත්‍යාක්ෂණයට කිරීම ලෙස පිළිගත යුතු බවටත්,

එකී සත්‍යාක්ෂණය කිරීම මත 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තියේ (3) වන උප වගන්තිය ප්‍රකාර නිකවැරටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටියා වූ ද, ඉහත කී පනතේ 135 වන වගන්තියෙන් අක්කර බද්දෙන් නිදහස්කර නොමැත්තා වූ ද, ස්ථිර හෝ නීතිපතා ගොවිතැනක් යටතේ වූ

(අ) හෙක්ටයාර් පහක් හෝ ඊට වැඩි වූ සෑම ඉඩමක් වෙනුවෙන් ම එකී ඉඩමේ සෑම හෙක්ටයාරයක් ම මත 2024 වර්ෂය සඳහා රුපියල් දහය බැගින්වන වාර්ෂික අක්කර බද්දක් පනවා අය කිරීමටත්,

(ආ) ඉහත කී පනතේ 134 වන වගන්තියේ (3) වන උප වගන්තියේ අතුරු විධානය යටතේ පළාත් පාලන විෂයභාර ගරු අමාත්‍යතුමා විසින් නිකවැරටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය විශේෂ ප්‍රදේශයක් වශන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී iv (ආ) ජනරජයේ 1989.03.10 දිනැති *ගැසට්* පත්‍රයෙන් ප්‍රකාශයට පත්කර ඇති හෙයින්, හෙක්ටයාර් එකකට වැඩි එහෙත් හෙක්ටයාර පහකට අඩු සෑම ඉඩමක් මත 2024 වර්ෂය සඳහා රුපියල් පනහ බැගින් (රු.50.00) වන වාර්ෂික අක්කර බද්දක් පනවා අයකිරීමට සහ

තව ද, 2024 වර්ෂයෙහි පහත උපලේඛනයෙහි සඳහන් එක් එක් කාර්තුව වෙනුවෙන් ඉදිරියෙන් නිරූපිත දිනයට පෙර එසේ නියම කරන ලද වාර්ෂික අක්කර බද්ද නිකවැරටිය ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවිය යුතු බවටත්, එලෙස වාර්ෂික අක්කර බද්ද එම වර්ෂයෙහි ජනවාරි මස 31 වැනි දින හෝ ඊට ප්‍රථම ගෙවන්න් නම් වාර්ෂික අක්කර බද්දේ ප්‍රමාණයෙන් සියයට දහයක (10%) ක වට්ටමක් ද, එකී උපලේඛනයෙහි එක් එක් කාර්තුව ඉදිරියේ තුන්වන තීරුවේ නිරූපිත දිනයට පෙර අදාළ අක්කර බදු මුදල ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවනු ලබන්නේ නම් එකී කාර්තුවට අදාළ මුදලින් 5%ක වට්ටමක් ද ලබා දිය යුතු බවටත් තීරණය කරමි.

උපලේඛනය

i. තීරුව	*ii. තීරුව*	*iii. තීරුව*
කාර්තුව	*ගෙවිය යුතු දිනය*	*5%ක වට්ටම් සඳහා හිමිකම් ලබන අවසාන දිනය*
පළමු වන කාර්තුව	2024.03.31	2024.01.31
දෙවන කාර්තුව	2024.06.30	2024.04.30
තුන්වන කාර්තුව	2024.09.30	2024.07.31
හතරවන කාර්තුව	2024.12.31	2024.10.31

11 - 512/5

නිකවැරටිය ප්‍රාදේශීය සභාව

වාහන හා සත්ව බදු 2024 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වන වගන්තියේ (3) වන උප වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාරව නිකවැරටිය ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍ය ඉටු කරන, ලේකම් වන එච්.එම්.එම්.බී. හේරත් වන මම, එකී පනතේ 147 වන වගන්තිය හා 148 වැනි වගන්තිවල විධිවිධාන ප්‍රකාරව නිකවැරටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙහි 2024 වර්ෂය සඳහා වාහන හා සත්ව බද්ද නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට 2023.10.19 වැනි දින අංක NPS/10/0868/2023 දරන තීරණය යටතේ මවිසින් තීරණය කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

එච්. එම්. එම්. බී. හේරත්,
ලේකම් හා බලතල කාර්ය කර්තව්‍ය ඉටුකරන නිලධාරි,
නිකවැරටිය ප්‍රාදේශීය සභාව.

2023 ඔක්තෝබර් මස 19 වන දින,
නිකවැරටිය ප්‍රාදේශීය සභාවේ දී ය.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 හා 148 වැනි වගන්තිවලින් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර නිකවැරටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2024 වර්ෂයේදී පහත උපලේඛනයෙහි i වැනි තීරුවේ සඳහන් කිසියම වාහනයක් හෝ සතෙකු තමා සන්තකයේ තබා ගන්නා සෑම තැනැත්තෙකුම එහි ii වැනි තීරුවේ සඳහන් අනුප්‍රමාණයක වාහන හා සත්ව බද්දක් 2024 වර්ෂය සඳහා නියම විය යුතු බවටත් එකී වාහන හා සත්ව බද්දට යටත් සෑම තැනැත්තකුම විසින් එකී වාහනය හෝ සතා තමන් භාරයේ තබා ගන්නා දින ගණන දින තිහක් සම්පූර්ණ වූ වහාම 2024 වර්ෂය සඳහා වන මෙම බද්ද නිකවැරටිය ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත මා තීරණය කරමි.

උපලේඛනය

I වැනි තීරුව		*II* වැනි තීරුව
		රු. ශත
(i)	මෝටර් රථයක්, මෝටර් ට්‍රයිකාරයක්, මෝටර් ලොරියක්, මොටර් බයිසිකලයක්, කරත්තයක්, ජීප් රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහාම	25.00
(ii)	සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල්කාරයක් හෝ බයිසිකල් කරත්තයක් සඳහා	
	(අ) වෙළෙඳ කාර්යයක් සඳහා යොදවන්නේ නම්	18 0
	(ආ) වෙළෙඳ නොවන කාර්යයක් සඳහා යොදවන්නේ නම්	4 0
(iii)	සෑම කරත්තයක් සඳහාම	20 0
(iv)	සෑම අත් කරත්තයක් සඳහාම	10 0
(v)	සෑම රික්ෂෝවක් සඳහාම	7 50
(vi)	සෑම අශ්වයකු, පෝනියකු හෝ කොටළුවකු සඳහා	15 0
(vii)	සෑම ඇතෙකු, අලියෙකු සඳහා	50 0

විශ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝද සහිත ළමා වාහන, වීල් බැරෝ, හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් යොදවන අත් කරත්ත සහ වෙළෙඳ කාර්ය සඳහා නොයොදවන අත් කරත්ත ඉහත ගෙවීමෙන් නිදහස් කෙරේ.

11 - 512/6

නිකවැරටිය ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා ප්‍රචාරක දැන්වීම් සඳහා ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වන වගන්තියේ (3) වන උප වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාරව නිකැරටිය ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍ය ඉටු කරන, නිකවැරටිය ප්‍රාදේශීය සභාවේ ලේකම් වන එච්.එම්.එම්.බී. හේරත් වන මම, එකී පනතේ 22, 122 සහ 126 යන වගන්ති වල විධිවිධාන ප්‍රකාරව ප්‍රචාරක දැන්වීම්, දෘශ්‍ය පරිසරය පිළිබඳව බලපත්‍ර ගාස්තු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට 2023.10.19 වැනි දින අංක NPS/10/0869/2023 අංක දරන තීරණය යටතේ මවිසින් තීරණය කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

එච්.එම්.එම්.බී. හේරත්,
ලේකම් හා බලතල කාර්ය කර්තව්‍ය කරවන නිලධාරී,
නිකවැරටිය ප්‍රාදේශීය සභාව.

2023 ඔක්තෝබර් මස 19 වන දින,
නිකවැරටිය ප්‍රාදේශීය සභාවේ දී ය.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වනවගන්තියේ (3) වන උප වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 22, 122 සහ 126 යන වගන්තිවලින් පැවරී ඇති බලතල අනුව හා 1988.08.23 වැනි දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 520/7 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළාත් පාලන කොටසේ ගරු අමාත්‍යතුමා විසින් ප්‍රකාශයට පත්කර, වයඹ පළාතේ පළාත් සභාවේ 1990.02.24 වැනි දින කියවා සම්මත කළ බව 1990.09.28 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 630 දරන ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත්කරන ලද සම්මත අතුරු ව්‍යවස්ථා මාලාවේ 39 වෙනි ඡේදය යටතේ සඳහන් ප්‍රචාරක දැන්වීම්, දෘෂ්‍ය පරිසරය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යටතේ නිකවැරටිය ප්‍රාදේශීය සභා සීමාව තුළ ප්‍රචාරක දැන්වීම් ඉදිකිරීම හා ප්‍රදර්ශනය කිරීම වෙනුවෙන් මෙහි පහත I උපලේඛනයේ සඳහන් ගාස්තුවක් නිකවැරටිය ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට තීරණය කරමි.

ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීම සඳහා වෙන් කර ඇති ප්‍රදේශ II උපලේඛනයේ දක්වා ඇත.

උපලේඛනය

I වැනි තීරය *විස්තරය*	*II වැනි තීරය* *අය කරන ගාස්තුව රු. ශත
01. බිත්තියක හෝ තාප්පයක, පුවරුවක ලෑල්ලක හෝ ආධාරකයක් මගින් ප්‍රදර්ශනය කරන ස්ථිර ප්‍රචාරක දැන්වීමක් සඳහා (සෑම වසරකම ගෙවිය යුතුය)	වර්ග අඩියකට රු. 200.00
02. එක් මසකට වැඩි මාස තුනකට අඩු කාල සීමාවක් සඳහා ප්‍රදර්ශනය කෙරෙන බැනරයක් සඳහා	වර්ග අඩියකට රු. 100.00
03. මාස එකක් හෝ ඊට අඩු කාලයක් සඳහා ප්‍රදර්ශනය කෙරෙන බැනරයක් සඳහා	වර්ග අඩියකට රු. 75.00
04. කටවුට් සඳහා මාස තුනකට වැඩි කාල සීමාවකට	වර්ග අඩියකට රු. 200.00
05. කටවුට් සඳහා මාස තුනකට අඩු කාල සීමාවකට	වර්ග අඩියකට රු. 150.00
06. මුද්‍රිත පෝස්ටර් දැන්වීම් සඳහා මාසයක් සඳහා	වර්ග අඩියකට රු. 50.00
07. ප්‍රාදේශීය සභාවේ අනුමත ස්ථානවල ආධාරක කණු හා ආධාරක ආවරණ සහිතව ප්‍රදර්ශනය කරනු ලබන මුද්‍රිත ප්‍රචාරක දැන්වීම් පුවරු ප්‍රදර්ශන ගාස්තු	වර්ග අඩියක් සඳහා වාර්ෂික ගාස්තුව රු. 800.00 මාස හයක 06 කාලයක් සඳහා රු. 850.00
08. විද්‍යුත් දැන්වීම් පුවරු (LED Screen) ප්‍රදර්ශනය සඳහා වර්ග අඩියක් සඳහා වාර්ෂික ගාස්තුව	රු. 1,000.00

II වැනි උපලේඛනය

දැන්වීම් ප්‍රදර්ශනය කිරීම සීමාකර ඇති ප්‍රදේශ

1. නිකවැරටිය ඩඩ්ලි මාවත දෙසින් බස් නැවතුම්පල ඉඩම් මායිම
2. නිකවැරටිය ජයන්ති පංසල දෙසින් පිහිටි බස්නැවතුම්පල ඉඩම් මායිම.
3. මහව මංසන්ධිය වටරවුම ඉදිරිපස (කුරුණෑගල මාර්ගය හා මහව මාර්ගය)
4. ඔරලෝසු කණුව අසල හීලෝගම හංදිය.
5. කුරුණෑගල පාර ළමා උද්‍යානය අසල
6. සොඛ්‍ය හා පොදු පහසුකම් මධ්‍යස්ථානය ඉදිරිපස.

11 - 512/7

නිකවැරටිය ප්‍රාදේශීය සභාව

2024 වර්ෂයට අදාළව සේවා ගාස්තු අය කිරීම

නිකවැරටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2024 වර්ෂයට සේවා සැපයීම වෙනුවෙන් පහත උපලේඛනයේ සඳහන් ගාස්තු නැවත සංශෝධනය කරන තුරු 2024.01.01 දින සිට පනවා අය කිරීමට 2023.10.19 දිනැති NPS/10/0870/2023 අංක දරන තීරණය යටතේ ම විසින් තීරණය කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

එච්.එම්.එම්.බී. හේරත්,
ලේකම් හා බලතල කාර්ය කර්තව්‍ය කරවන නිලධාරි,
නිකවැරටිය ප්‍රාදේශීය සභාව.

2023 ඔක්තෝබර් මස 19 වන දින,
නිකවැරටිය ප්‍රාදේශීය සභාවේ දී ය.

සේවා සඳහා ගාස්තු අයකිරීම (2024)

නිකවැරටිය ප්‍රාදේශීය සභාව විසින් සපයනු ලබන පහත සඳහන් සේවාවන් සඳහා 2024.01.01 වැනි දින සිට 2024.12.31 වැනි දින දක්වා පහත සඳහන් පරිදි ගාස්තු අය කළ යුතු බවට නිකවැරටිය ප්‍රාදේශීය සභාව තීරණය කරමි.

උපලේඛනය

සේවා සඳහා ගාස්තු අය කිරීම - 2024:				
I වැනි තීරය		*II වැනි තීරය*		
01.	පරිසර ඉල්ලුම් පත්‍ර ගාස්තු	රු. 200.00		
02.	පරිසර ගාස්තු			
i.	රු. 100,000.00 අඩු	රු. 1000.00		
ii.	රු. 100,001.00 සිට රු. 200,000.00	රු. 1500.00		
iii.	රු. 200,001.00 සිට රු. 500,000.00	රු. 2500.00		
iv.	රු. 500,001.00 සිට රු. 1,000,000.00	රු. 5000.00		
v.	රු. 1,000,001.00 සිට රු. 1,500,000.00	රු. 7500.00		
vi.	රු. 1,500,000.00 වැඩි	රු. 10,000.00		
03.	පරිසර බලපත් අලුත් කිරීමේ පෝරම ගාස්තු	රු. 100.00		
04.	පරිසර බලපත්‍ර ගාස්තු	රු. 1250.00		
05.	සියලුම නව ගොඩනැගිලි ඉදිකිරීම සඳහා පෙරසැරි ගාස්තු - නාගරික නොවන	වර්ග අඩි ප්‍රමාණය අනුව		
වර්ග ප්‍රමාණ		නිවාස		ව්‍යාපාර
වර්ග අඩි 2000 දක්වා		රු. 1000.00		රු. 1250.00
වර්ග අඩි 2000 ට වැඩි සෑම වර්ග අඩි 100 සඳහාම		රු. 100.00		රු. 200.00
06.	අලුතින් ඉදිකරන තාප්ප සඳහා දික් මීටරයක් සඳහා	රු. 200.00		රු. 400.00
07.	වීථි රේඛා සහ නොපරවා ගැනීමේ සහතික ගාස්තු	රු. 800.00		
08.	වීථි රේඛා තැම්පත් ගාස්තු	රු. 200.00		
09.	වීථි රේඛා අයදුම්පත් ගාස්තු	රු. 100.00		
10.	වීථි රේඛා පරීක්ෂණ ගාස්තු	රු. 1000.00		
11.	ගොඩනැගිලි අයදුම්පත්‍ර ගාස්තු	රු. 750.00		
12.	ගොඩනැගිලි අයදුම්පත්‍ර පරීක්ෂා කිරීමේ ගාස්තු	රු. 1500.00		
13.	පිඹුරුපත් පරීක්ෂාකිරීමේ ගාස්තු එක් කැබැල්ලක් සඳහා	රු. 1000.00		
14.	ගොඩනැගිලි ඉල්ලුම් පත්‍ර සහ වලංගු කාලය දීර්ඝ කිරීම උපරිම වසර 03 දක්වා	කාලය	නිවාස	ව්‍යාපාර
		1 වසර	රු. 2000.00	රු. 3000.00
		2 වසර	රු. 3000.00	රු. 4000.00
		3 වසර	රු. 4000.00	රු. 5000.00
15.	සභා බලප්‍රදේශයේ (ග්‍රාමීය) අනවසර ඉදිකිරීම් සඳහා දඩ මුදල් අය කිරීම			
i.	තාප්පය සඳහා වර්ග අඩියකට පෙරසැරි ගාස්තුමෙන් දෙගුණයකි			
ii.	නගර සීමාතුළ අනවසරයෙන් ඉදි කරන ලද ගොඩනගිලි සඳහා ආවරණ අනුමැතිය දීමට ගාස්තු අයකිරීම			

විස්තර		*නේවාසික*	*ව්‍යාපාර*
(වර්ග මීටරයක් සඳහා)		*රු. ශත*	*රු. ශත*
i.	අත්තිවාරම සම්පූර්ණ කර ඇති විට	30.00	30.00
ii.	වහල මට්ටම දක්වා	45.00	55.00
iii.	වහලය ඇතුළුව ඉදිකොට ඇති විට	65.00	110.00
iv.	සම්පූර්ණයෙන්ම වැඩ නිමකොට ඇති විට	110.00	160.00
16.	අනුකූලතා සහතිකයක් නිකුත් කිරීමේ ගාස්තුව	1500.00	2500.00
17.	සතිපොළ කඩ කාමර සඳහා ගාස්තු අය කිරීම		
i.	අඩි 7X6 ප්‍රමාණයේ කඩ කාමර සඳහා	රු. 400.00	
ii.	විවෘත භූමිය අඩි 08X06 සඳහා	රු. 250.00	
iii.	බුලත් 1000ක් සඳහා	රු. 200.00	
iv.	එළවළු ගෝනියක් 20 kg අවමයට යටත්ව	රු. 100.00	
v.	ජංගම අලෙවිය ඇවිදිමින් අලෙවි කරන්නන්ගෙන්	රු. 100.00	
vi.	තැඹිලිගෙඩියක් සඳහා	රු. 05.00	
vii.	කෙසෙල් කැණක් සඳහා	රු. 30.00	
ප්‍රාදේශීය සභාවේ වෙනත් ගාස්තු			
පුස්තකාල සාමාජික ගාස්තු - වැඩිහිටි		රු. 200.00	
පුස්තකාල සාමාජික ගාස්තු ළමා		රු. 150.00	
පුස්තකාල අයදුම්පත් ගාස්තු		රු. 50.00	
ඡායා පිටපත් කිරීමේ ගාස්තු			
A4 තනි පිටුව		රු. 15.00	
A4 පිටු දෙක		රු. 20.00	
A3 තනි පිටුව		රු. 25.00	
A3 පිටු දෙක		රු. 30.00	
ටෙන්ඩර් දඩ මාසික කුලියෙන් (ටෙන්ඩර් මුදලින්)		10%	
තක්සේරු ලේඛනයෙහි නම වෙනස් කිරීමේ ගාස්තු		රු. 250.00	
අනතුරුදායක ගස් හා වෙනත් ගස් ඉවත් කරවා ගැනීමේ ඉල්ලුම් පත් ගාස්තුව		රු. 250.00	
අනුකූලතා සහතික නිකුත් කිරීමේ අයදුම්පත් ගාස්තුව (නාගරික සංවර්ධන අධිකාරිය)		රු. 100.00	
අනුකූලතා සහතික නිකුත් කිරීමේ අයදුම් පත් ගාස්තුව (ග්‍රාමීය)		රු. 100.00	
නොපවරා ගැනීමේ සහතිකය නිකුත් කිරීමේ අයදුම් පත් ගාස්තුව		රු. 500.00	
ඉඩම් අනුබෙදුම්/ඒකාබද්ධ කිරීමේ හෝ සංවර්ධනය කිරීමේ අයදුම්පත් ගාස්තු		රු. 250.00	
වයඹ පළාතේ ඉඩම් කට්ටි කර විකිණීම සඳහා අයදුම්පත් ගාස්තු		රු. 1000.00	
මාර්ග හා පොදු ස්ථාන නම් කිරීම සහ ස්මාරක පිහිටුවීම සඳහා අයදුම් පත් ගාස්තු		රු. 200.00	
18.	ඉඩම් කට්ටි සැලැස්ම හෝ අනු බෙදුම අනුමත කිරීමේ ගාස්තු අයකිරීම්		

ප්‍රමාණය	සංවර්ධන සැලැස්ම	අනු බෙදුම	සේවා ගාස්තු
හෙක්ටයාර් 1 ට අඩු	500.00	500.00	එක් කාර්තුවකට රු. 750.00

විස්තර		නේවාසික		වාහපාර
(වර්ග මීටරයක් සඳහා)		රු. ශත		රු. ශත
හෙක්ටයාර් 02 - 04		750.00	750.00	එක් කාර්තුවකට රු. 750.00
හෙක්ටයාර් 04 ට වැඩි		1000.00	1000.00	එක් කාර්තුවකට රු. 750.00
19.	සභා බල ප්‍රදේශයේ අනුමැතියට පෙර ඉදිකරන ලද සම්ප්‍රේෂණ කුළුණු සඳහා (කුළුණු ධාරිතාව කියුබ් මීටර්) xරු.200.00 යන පදනමින් දඩ මුදල් අයකරනු ලැබේ.			
20.	ආදාහනාගාර ගාස්තු			
i.	බල ප්‍රදේශය තුළ පදිංචි වැඩිහිටි අයෙකුගේ මෘත දේහයක් ආදාහනය කිරීමට			රු. 16,500.00
ii.	බල ප්‍රදේශයෙන් පිටත පදිංචි වැඩිහිටි අයෙකුගේ මෘතදේහයක් ආදාහනය කිරීමට			රු. 20,000.00
iii.	බල ප්‍රදේශය තුළ වැඩිහිටි නිවාසයන්හි වාසය කරන අයගේ මෘතදේහයක් ආදාහනය කිරීමට			රු. 8,000.00
iv.	බල ප්‍රදේශය තුළ පදිංචි වයස අවු 12 ට අඩු අයෙකුගේ මෘත දේහයක් ආදාහනය සඳහා			රු. 15,500.00
v.	බල ප්‍රදේශයෙන් පිටත පදිංචි වයස අවු 12 ට අඩු අයෙකුගේ මෘත දේහයක් ආදාහනය සඳහා			රු. 16,500.00
vi.	බල ප්‍රදේශයේ පදිංචි අඩු ආදායම්ලාභී වැඩිහිටි අයකුගේ මෘත දේහයක් ආදාහනය කිරීමට			රු. 15,000.00
vii.	බල ප්‍රදේශයේ පදිංචි අඩු ආදායම්ලාභී වයස අවුරුදු 12 අඩු අයෙකුගේ මෘත දේහයක් ආදාහනය කිරීමට			රු. 14,500.00
21.	නිකවැරටිය ප්‍රාදේශීය සභා ක්‍රීඩා භූමිය එක් දිනක් සඳහා කුලියට ලබා දීම ආපසු ගෙවනු ලබන තැන්පත් මුදල			රු. 20,000.00 රු. 15,000.00
22.	නිකවැරටිය නව බස් නැවතුම්පල භූමිය එක් දිනක් සඳහා කුලියට ලබා දීම			රු. 10,000.00
23.	නිකවැරටිය පැරණි බස් නැවතුම්පල භූමිය එක් දිනක් සඳහා කුලියට ලබා දීම			රු. 10,000.00
24.	නිකවැරටිය සතිපොළ භූමිය කුලියට ලබා දීම			
	පෙ.ව. 8.00 සිට ප.ව. 6.00 දක්වා			රු. 20,000.00
	ප.ව. 6.00 සිට රාත්‍රී 10 දක්වා			රු. 25,000.00
	ප.ව. 06.00 සිට රෑය පහන් වන තුරු (පැය 12 ක කාලයක්)			රු. 30,000.00
	තැන්පත් මුදල			රු. 20,000.00
25.	නිකවැරටිය නගර ශාලාව කුලියට ලබා දීම			
i.	ප්‍රධාන ශාලාව කුලියට දීම			රු. 25,000.00
ii.	එක් පුටුවක් සඳහා			රු. 20.00
iii.	පුටු කවරයක් සඳහා			රු. 20.00
iv.	ශබ්ද වාහිනි යන්ත්‍රය කුළියට දීම			රු. 15,000.00
v.	එක් මේසයක් සඳහා			රු. 50.00
vi.	ජී. අයි. බට එකක් සඳහා			රු. 25.00
vii.	එක් කොඩිරෙද්දක් සඳහා			රු. 25.00
viii.	තැම්පත් මුදල			රු. 20,000.00
26.	නිකවැරටිය ප්‍රාදේශීය සභාවේ වාහන සහ යන්ත්‍ර කුලියට ලබා දීම			
i.	බැකෝලෝඩරය (මීටර් පැයකට)			රු. 6,500.00
ii.	මෝටර් ග්‍රේඩරය (මීටර් පැයකට)			රු. 10,000.00
iii.	ඝන අඩි 75 ට්ලරය මීටර් පැයකට			රු. 1,800.00
iv.	ටිපර් රථය කියුබ් 02.50			

	විස්තර	නේවාසික	ව්‍යාපාර
	(වර්ග මීටරයක් සඳහා)	රු. ශත	රු. ශත
	i. කි. මී. 01 - 25 දක්වා		රු. 4000.00
	ii. 25 km ට වඩා වැඩිවන සෑම කි. මී. සඳහා		රු. 200.00
v.	ජල බවුසරය (ලීටර් 6000) නගර සීමාව තුළ ජලය ලීටරයක් සඳහා		රු. 01.00
	ජල බවුසරය නගර සීමාවෙන් පිටත යන කිලෝමීටර් එකක් සඳහා මුදල ජලය සඳහා ජල සම්පත් මණ්ඩලයේ ගාස්තු අයකෙරේ.		රු. 189.00
vi.	ජල බවුසරය (ලීටර් 3500) නගර සීමාව තුළ ජලය ලීටරයක් සඳහා		රු. 01.00
	නගර සීමාවෙන් පිටත එක් කිලෝමීටරයක් සඳහා ජලය සඳහා ජල සම්පත් මණ්ඩලයේ ගාස්තු අයකෙරේ.		රු. 90.00
vii	ගලි බවුසරය සඳහා ගාස්තු		රු. 6000.00
viii	ගලි බවුසරය සඳහා කම්කරු ගාස්තු		රු. 1000.00
ix	ගලි බවුසරය සඳහා ප්‍රවාහන ගාස්තුව (බල ප්‍රදේශය තුළ ප්‍රවාහනය)		රු. 3000.00
x	ගලි බවුසරය සඳහා බල ප්‍රදේශයෙන් පිටත කි.මී. 1ක් සඳහා (කාර්යාලයේ සිට)		රු. 90.00
xi	ගලි බවුසරය ලබා ගැනීමට අයදුම්පත් ගාස්තුව		රු. 100.00
27.	මහජන වැසිකිළි සඳහා ගාස්තුව/පොදු වැසිකිලි/සතිපොළ වැසිකිළි		රු. 20.00
28.	නළ ලිං සඳහා ගාස්තු අයකිරීම වර්ෂයක් සඳහා		රු 500.00
29.	කොම්පෝස්ට් පොහොර අළෙවි සඳහා ගාස්තු අය කිරීම. කි.ග්‍රෑ. 01ක් සඳහා මිල		
	උර රහිතව		රු. 10.00
	උර සහිතව		රු. 15.00
30.	තණකොළ කපන යන්ත්‍රය (අක්කර 01ක් සඳහා)		ර. 14,500.00

නිකවැරටිය ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා වෙනත් ගාස්තු අය කිරීම

නිකවැරටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2024 වර්ෂයට වෙනත් ගාස්තු අයකිරීම වෙනුවෙන් පහත උපලේඛනයේ සඳහන් ගාස්තු නැවත සංශෝධනය කරන තුරු 2024.01.01 දින සිට පනවා අයකිරීමට 2023.10.19 දින NPS/10/0871 අංක දරන තීරණය යටතේ ම විසින් තීරණය කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

එච්.එම්.එම්.බී. හේරත්,
ලේකම් හා බලතල කාර්ය කර්තව්‍ය කරවන නිලධාරි,
නිකවැරටිය ප්‍රාදේශීය සභාව.

2023 ඔක්තෝබර් මස 19 වැනි දින,
නිකවැරටිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය
වෙනත් ගාස්තු අයකිරීම

නිකවැරටිය ප්‍රාදේශීය සභාව විසින් සපයනු ලබන පහත සඳහන් සේවාවන් සඳහා 2024.01.01 වැනි දින සිට 2024.12.31 වැනි දින දක්වා පහත සඳහන් පරිදි ගාස්තු අයකළ යුතු බවට නිකවැරටිය ප්‍රාදේශීය සභාව තීරණය කරන්නීය.

උපලේඛනය

වෙනත් ගාස්තු අයකිරීම - 2024 වර්ෂය

	I වැනි තීරය	*II වැනි තීරය*
01.	ගෝඝාතකාගාර ගාස්තු අයකිරීම	රු. ශත
(i.)	ගෝඝාතකාගාර සඳහා අයකිරීම	10,000.00
(ii.)	එක් ගවයෙකු සඳහා කණු ගාස්තු	250.00

නිකවැරටිය ප්‍රාදේශීය සභාව

නිකවැරටිය ප්‍රාදේශීය සභා සීමාව තුළ වාහන නවතා තැබීම සඳහා ගාස්තු අය කිරීම (2024)

නිකවැරටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2024 වර්ෂයට නිකවැරටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වාහන නවතා තැබීම සඳහා ගාස්තු 2024.01.01 දින සිට පනවා අයකිරීමට 2023.10.19 දිනැති අංක NPS/10/0872/2023 දරන තීරණය යටතේ ම විසින් තීරණය කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

එච්.එම්.එම්.බී. හේරත්,
ලේකම් හා බලතල කාර්ය කර්තව්‍ය කරවන නිලධාරි,
නිකවැරටිය ප්‍රාදේශීය සභාව.

2023 ඔක්තෝබර් මස 19 වැනි දින,
නිකවැරටිය ප්‍රාදේශීය සභාවේ දී ය.

තීරණය

වයඹ පළාතේ, පළාත් පාලන විෂය භාර ගරු අමාත්‍ය තුමා විසින් සාදන ලදුව 2010.07.16 වෙනි දින අංක 1663 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* iv (අ) කොටසේ පළ කරන ලද 2011.01.18 දින වයඹ පළාත් සභා රැස්වීමේදී ස්ථිර කරන ලද බවට 2011.04.28 දිනැති අංක 1703/18 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* iv (අ) වන කොටස මගින් ප්‍රකාශයට පත්කර ඇති ප්‍රාදේශීය සභා සීමාව තුළ වාහන නවතා තැබීම පිළිබඳව අතුරු ව්‍යවස්ථාව නිකවැරටිය ප්‍රාදේශීය සභාව තුළ ක්‍රියාත්මක කළ යුතු බවට 2011.06.24 වෙනි දින පැවති මහ සභාව විසින් පිලිගෙන අංක 1785 හා 2011.11.16 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනජයේ *ගැසට් පත්‍රයේ* iv (අ) වන කොටසෙන් නිවේදනය කර ඇති අතර එම අතුරු ව්‍යවස්ථාව ප්‍රකාරව පහත උපලේඛනයේ සඳහන් ගාස්තු අයකළ යුතු යැයි නිකවැරටිය ප්‍රාදේශීය සභාව තීරණය කරමි.

	I වැනි තීරය	*II වැනි තීරය*	*III වැනි තීරය*
		එක් වරක් පමණක් ගෙවන වාර්ෂික ගාස්තුව	*නවතා තැබීමේ ගාස්තු දිනකට*
		රු. ශත	*රු. ශත*
(i.)	සෑම මගී ප්‍රවාහන බස් රථයක් සඳහාම	1300.00	100.00
(ii.)	සෑම ත්‍රීරෝද රථයක් සඳහාම	1200.00	100.00
(iii.)	මගී ප්‍රවාහන බස්රථ, ත්‍රීරෝද රථ නොවන වෙනත් වාහන සඳහා	1250.00	100.00

(iv.) කුලී ගමන් අපේක්ෂාවෙන් තොර ප්‍රාදේශීය සභා භූමිය තුළ පිහිටි රථගාලකට පැයකට අධික කාලයක් නවතා තබන ලද වාහනයකින් රු. 50.00ක මුදලක් ද යතුරු පැදියකින් රු. 25.00ක මුදලක්ද අයකරනු ලැබේ.

අලෙවි ප්‍රවර්ධන කටයුත්ත සඳහා සභා සීමාව තුළ ජංගම රථයක් භාවිතා කරමින් ප්‍රවර්ධන කටයුත්තක් සිදුකිරීම සඳහා දිනක ගාස්තු :		*රු. ශත*
i.	ලොරි රථයක් සඳහා	3,000.00
ii.	වෑන් රථයක් හෝ කාර් රථයක් ත්‍රීරෝද රථයක් සඳහා	1,500.00
iii.	කුඩාරමක් හෝ හට් එකක් සඳහා	500.00
iv.	කුඩයක් සඳහා	250.00

වාහන නවතා තැබීමේ ගාස්තු:

වාහන පන්තිය	*පළමු පැය 1-3 (රු.)*	*අතිරේක පැය 3>4 (රු.)*	*අතිරේක පැය 4> (රු.)*
යතුරු පැදි	20.00	10.00	05.00
ත්‍රී රෝද රථ	40.00	20.00	10.00
මෝටර් රථ/රිය පෙට්ටි	50.00	20.00	10.00
බස්රථ/ලොරි රථ	100.00	30.00	20.00
වෙනත් මෝටර් වාහන	40.00	20.00	10.00

11 - 512/10

නිකවැරටිය ප්‍රාදේශීය සභාව

සංචාරක වෙළඳාම කිරීම සඳහා ගාස්තු අයකිරීම (2024)

නිකවැරටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2024 වර්ෂයට නිකවැරටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සංචාරක වෙළඳාම් කිරීම සඳහා ගාස්තු 2024.01.01 දින සිට පනවා අයකිරීමට 2023.10.19 දිනැති NPS/10/0873/2023 අංක දරන තීරණය යටතේ ම විසින් තීරණය කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

එච්.එම්.එම්.බී. හේරත්,
ලේකම් හා බලතල කාර්ය කර්තව්‍ය කරවන නිලධාරි,
නිකවැරටිය ප්‍රාදේශීය සභාව.

2023 ඔක්තෝබර් මස 19 වැනි දින,
නිකවැරටිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

වයඹ පළාතේ, පළාත් පාලන විෂය භාර ගරු අමාත්‍ය තුමා විසින් සාදන ලදුව 2010.07.16 වෙනි දින අංක 1663 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* iv (ඇ) කොටසේ පළ කරන ලද 2011.01.18 දින වයඹ පළාත් සභා රැස්වීමේදී ස්ථිර කරන ලද බව 2011.04.28 දිනැති අංක 1703/18 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* iv (ඇ) වන කොටස මගින් ප්‍රකාශයට පත්කර ඇති සංචාරක වෙළඳාම් සම්බන්ධ අතුරු ව්‍යවස්ථාව නිකවැරටිය ප්‍රාදේශීය සභාව තුළ ක්‍රියාත්මක කළ යුතු බවට 2011.06.24 වැනි මහ සභාව විසින් පිළිගෙන අංක 1785 iv (ඇ) කොටසෙහි නිවේදනය කර ඇති අතර එම අතුරු ව්‍යවස්ථාව ප්‍රකාරව සංචාරක වෙළඳ බලපත්‍රයක් සඳහා 2024 වර්ෂයට ගාස්තුවක් අයකළ යුතු යැයි නිකවැරටිය ප්‍රාදේශීය සභාව තීරණය කරමි.

I වැනි තීරය		*II වැනි තීරය*		
		රු. 1 සිට රු. 750 දක්වා	*රු. 751 සිට රු. 1,500 දක්වා*	*රු. 1,500 වැඩි*
01.	තැඹිලි කුරුම්බා වෙළඳාම	200.00	400.00	600.00
02.	කඩල, වඩේ, මුරුක්කු, බයිට්ස් පැකට් වෙළඳාම	200.00	400.00	600.00
03.	විදුලි උපකරණ අලෙවිය	500.00	750.00	1,000.00
04.	බිම්මල් අලෙවිය	200.00	400.00	600.00
05.	රෙදි අලෙවිය	300.00	500.00	800.00
06.	පාවහන් වෙළඳාම	300.00	500.00	750.00
07.	සාප්පු බඩු අලෙවිය	300.00	500.00	750.00
08.	මල් පැල එළවළු පැල හා පළතුරු පැල අලෙවිය	250.00	500.00	750.00
09.	පොත් පත්තර වෙළඳාම	300.00	500.00	750.00
10.	ගොඩනැගිලි ද්‍රව්‍ය සැපයීම	500.00	750.00	1,000.00
11.	ධාන්‍ය වර්ග පැකට් කර විකිණීම	300.00	500.00	750.00
12.	එළවළු හා පළතුරු වෙළඳාම	200.00	400.00	600.00

	I වැනි තීරය	*II වැනි තීරය*		
		රු. 1 සිට රු. 750 දක්වා	*රු. 751 සිට රු. 1,500 දක්වා*	*රු. 1,500 වැඩි*
13.	කෘත්‍රිම මල් අලෙවිය	300.00	500.00	750.00
14.	ජංගම බැංකු සේවා	500.00	750.00	1,000.00
15.	පහන්තිර, හඳුන්කුරු ඇතුළු පූජා භාණ්ඩ අලෙවිය	200.00	400.00	600.00
16.	ලොතරැයි අලෙවිය	200.00	400.00	600.00
17.	ඔරලෝසු වෙළඳාම	250.00	500.00	750.00
18.	වෙනත් වෙළඳාම්	250.00	500.00	750.00

11 - 512/11

නිකවැරටිය ප්‍රාදේශීය සභාව

ඉඩම් විකිණීම මත බදු අයකිරීම - 2024

නිකවැරටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2024 වර්ෂයට ඉඩම් විකිණීම මත බදු අය කිරීම සඳහා 2023.10.19 දිනැති NPS/10/0874/2023 අංක දරන තීරණය යටතේ ම විසින් තීරණය කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

එච්. එම්. එම්. බී. හේරත්,
ලේකම් හා බලතල කාර්ය කර්තව්‍ය කරවන නිලධාරි,
නිකවැරටිය ප්‍රාදේශීය සභාව.

2023 ඔක්තෝබර් මස 19 වැනි දින,
නිකවැරටිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154 වැනි වගන්තිය යටතේ ඉඩම් විකිණීම මත බදු අය කිරීම නිකවැරටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි ඉඩමක් වෙන්දේසි කරුවකු හෝ බ්‍රෝකර්කරුවකු විසින් ඔවුන්ගේ සේවකයා විසින් නැතහොත් නියෝජිතයකු විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ නැතහොත් වෙනත් ආකාරයකින් විකුණනු ලැබුවහොත් එම විකිණීමෙන් ලැබෙන මුදලින් (1%) බද්දක් 2024 වර්ෂයට පනවා අයකිරීමට තීරණය කර ඇති බවත් එම බද්ද ගෙවීමට අදාළ ඉඩම් විකුණු වර්ෂය අවසානයට පෙර අය විය යුතු බවත් මෙයින් යෝජනා කරන්නීය.

11 - 512/12

නිකවැරටිය ප්‍රාදේශීය සභාව

අයාලේ යන ගවයින් සඳහා ගාස්තු අයකිරීම - 2024

නිකවැරටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2024 වර්ෂයට අයාලයේ යන ගවයින් සඳහා ගාස්තු 2024.01.01 දින සිට පනවා අය කිරීමට 2023.10.19 දිනැති NPS/10/0875/2023 අංක දරන තීරණය යටතේ ම විසින් තීරණය කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

එච්. එම්. එම්. බී. හේරත්,
ලේකම් හා බලතල කාර්ය කර්තව්‍ය කරවන නිලධාරි,
නිකවැරටිය ප්‍රාදේශීය සභාව.

2023 ඔක්තෝබර් මස 19 වැනි දින,
නිකවැරටිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 66(1) වැනි වගන්තිය අනුව මින් ඉදිරියට නිකවැරටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත අල්ලා ගන්නා ලද අයාලේ යන ගවයින් වෙනුවෙන් එකී පනතේ අංක 66(2)(1) උප වගන්තිය ප්‍රකාරව එසේ අල්ලා ගන්නා ලද ගවයෙකු වෙනුවෙන් මින් ඉදිරියට රු. 15,000.00ක මුදලක් හා ගාල්කර තබනු ලබන එක් දිනක් වෙනුවෙන් රු. 1,000.00 ක අමතර මුදලක් එකී අල්ලා ගනු ලබන ගවයෙකුගේ අයිතිකරුගෙන් 2024 වර්ෂය සඳහා අයකළ යුතු යැයි තීරණය කරමි.

11 - 512/13

නිකවැරටිය ප්‍රාදේශීය සභාව

සංවර්ධනය නොකළ ඉඩම් මත බද්ද (2024)

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වන වගන්තියේ (3) වන උප වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාරව නිකවැරටිය ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍ය ඉටු කරන, නිකවැරටිය ප්‍රාදේශීය සභාවේ ලේකම් එච්. එම්. එම්. බී. හේරත් වන මම, එකී පනතේ 153 වන වගන්තියේ (1) උපවගන්තියේ විධිවිධාන ප්‍රකාරව සංවර්ධනය නොකළ ඉඩම් මත බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට 2023.10.19 දිනැති අංක NPS/10/0876/2023 දරන තීරණය යටතේ ම විසින් තීරණය කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

එච්.එම්.එම්.බී. හේරත්,
ලේකම් හා බලතල කාර්ය කර්තව්‍ය කරවන නිලධාරි,
නිකවැරටිය ප්‍රාදේශීය සභාව.

2023 ඔක්තෝබර් මස 19 වන දින,
නිකවැරටිය ප්‍රාදේශීය සභාවේ දී ය.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වන වගන්තියේ (3) වන උප වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 153 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර නිකවැරටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටි ගොඩනැගිලි ඉදි කිරීමට හෝ ස්ථාවර නැතහොත් නිතිපතා ගොවිතැන් කිරීමට සුදුසු යම් ඉඩමක,

(අ) ගොඩනැගිලි කිසිවක් ඉදිකර නොමැති නම් : හෝ

(ආ) එම ඉඩම විධිමත් ලෙස හෝ නිත්‍ය ලෙස වගා කිරීමට යටත් කර නොමැති විටක : හෝ

(ඇ) එම ඉඩමේ ඉදිකර ඇති ගොඩනැගිල්ලට හෝ වගාවට ඇත්ත වශයෙන් ම යට වී ඇති බිම් ප්‍රමාණය සහ එම ඉඩමේ සම්පූර්ණ බිම් ප්‍රමාණය අතර ඇති අනුපාතය 1:20 (එකට්විස්ස) ට වඩා අඩු වන්නේ නම්,

එකී ඉඩම සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකීමට සහ එවැනි සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකෙන ඉඩම් මත 2024 වර්ෂය සඳහා ඒ එක් එක් ඉඩමේ භූමියේ ප්‍රාග්ධන අගයෙන් සියයට දශම විසිපහ (0.25%) වාර්ෂික බද්දක් පැනවීමටත්, එකී සංවර්ධනය නොකළ ඉඩම මත බද්ද 2024 වර්ෂයේ අප්‍රේල් මස 01 වැනි දිනට පෙර නිකවැරටිය ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් තීරණය කරමි.

11 - 512/14

තුම්පනේ ප්‍රාදේශීය සභාව - ගලගෙදර

තුම්පනේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කිසියම් කර්මාන්තයක් පවත්වාගෙන යාමට අදාළ අතුරු ව්‍යවස්ථා යටතේ 2024 වර්ෂය සඳහා පීඩාකාරී ව්‍යාපාර, අන්තරාදායක ව්‍යාපාර, පීඩාකාරී හා අන්තරාදායක ව්‍යාපාර සඳහා නිකුත් කරනු ලබන බලපත්‍ර මත ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තියෙන් තුම්පනේ ප්‍රාදේශීය සභාවේ ලේකම් වශයෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2023 වර්ෂයේ ඔක්තෝබර් මස 23 වැනි දින මාගේ අංක 827 දරන තීරණය මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ අනුව කිසියම් අතුරු ව්‍යවස්ථාවක් යටතේ තුම්පනේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කිසියම් කර්මාන්තයක් පවත්වාගෙන යාම සඳහා 2024 වර්ෂයේ දී තුම්පනේ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක්ම මත ගාස්තුවක් අයකරනු ලබන බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

ඩබ්. ඒ. එල්. ටී. ජයරත්න,
ලේකම්,
තුම්පනේ ප්‍රාදේශීය සභාව.

2024 ඔක්තෝබර් මස 23 වැනි දින,
තුම්පනේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව තුම්පනේ ප්‍රාදේශීය සභාවේ ලේකම් ලෙස එකී ප්‍රාදේශීය සභාව විසින් සාදන ලද අතුරු ව්‍යවස්ථාවක් යටතේ හෝ තුම්පනේ ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවක් යටතේ හෝ තුම්පනේ ප්‍රාදේශීය සභාව විසින් 2024 වර්ෂය තුළදී නිකුත් කරනු ලබන බලපත්‍ර සම්බන්ධයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වන වගන්තිය සමග කියවිය යුතු 149 වන වගන්තියෙන් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර පහත උපලේඛනයේ I වැනි තීරුවේ සඳහන් එක් එක් කර්මාන්තය වෙනුවෙන් එම උපලේඛනයේ II වැනි තීරුවේ අනුරූපිත සටහනෙහි නිරූපිත ප්‍රමාණයක බලපත්‍ර ගාස්තුවක් පනවා අයකිරීමටත්,

එකී උපලේඛනයේ සඳහන් කර්මාන්තය ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ඇති හෝ අනුමත කර ඇති හෝ පිළිගෙන ඇති හෝටලයක් හෝ ආපනශාලාවක් හෝ නවාතැන්පලක් වන විට එකී හෝටලයේ හෝ ආපන ශාලාවේ හෝ නවාතැන්පොළේ පසුගිය වර්ෂයේ ලත් ලැබීම් වලින් සියයට එකක් (1%) ප්‍රමාණයක බලපත්‍ර ගාස්තුවක් පනවා අයකිරීමටත් තීරණය කරමි.

උපලේඛනය 1

අනු. අංකය	*I වැනි තීරුව* *කර්මාන්තයේ ස්වභාවය*	*II වැනි තීරුව* *ස්ථානයේ වාර්ෂික වටිනාකම (රු)*		
		රු. 750.00 නොඉක්මවන අවස්ථාවක	*රු. 751 ඉක්මවන එහෙත් රු. 1500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1501 ඉක්මවන අවස්ථාවක*
01.	සිල්ලර බඩු වෙළඳසැලක් සඳහා	500.00	750.00	1,000.00
02.	එළවළු විකුණන වෙළඳසැලක් සඳහා	500.00	750.00	1,000.00
03.	තේ පැන් අලෙවිසැලක් සඳහා	500.00	750.00	1,000.00
04.	භෝජනාගාරයක් සඳහා	500.00	750.00	1,000.00
05.	බේකරියක් පවත්වාගෙන යාම සඳහා	500.00	750.00	1,000.00
06.	බිස්කට් නිෂ්පාදන කරන කර්මාන්ත ශාලාවක් සඳහා	500.00	750.00	1,000.00
07.	යන්ත්‍රානුසාරයෙන් රසකැවිලි නිෂ්පාදනය කරන ස්ථානයක් සඳහා	500.00	750.00	1,000.00

අනු. අංකය	I වැනි තීරුව කර්මාන්තයේ ස්වභාවය	II වැනි තීරුව ස්ථානයේ වාර්ෂික වටිනාකම (රු)		
		රු. 750.00 නොඉක්මවන අවස්ථාවක	රු. 751 ඉක්මවන එහෙත් රු. 1500 නොඉක්මවන අවස්ථාවක	රු. 1501 ඉක්මවන අවස්ථාවක
08.	යන්ත්‍රසූත්‍ර භාවිතා නොකර රසකැවිලි නිෂ්පාදනය කරන ස්ථානයක් හෝ ආහාර නිපදවන ස්ථානයක් සඳහා	500.00	750.00	1,000.00
09.	බාබර් සැප්පුවක් සඳහා	500.00	750.00	1,000.00
10.	භූමිතෙල් ගබඩාවක් සඳහා	500.00	750.00	1,000.00
11.	යෝගට් නිෂ්පාදන ආයතනයක් සඳහා	500.00	750.00	1,000.00
12.	කුකුළු ගොවිපලක් සඳහා	500.00	750.00	1,000.00
13.	කිරිපට්ටි (දෙනුන් 03ට වැඩි 10 ට අඩු)	500.00	750.00	1,000.00
14.	කිරිපට්ටි (දෙනුන් 10ට වැඩි)	500.00	750.00	1,000.00
15.	ඌරු ගොවිපලක් සඳහා	500.00	750.00	1,000.00
16.	ගඩොල් පෝරණුවක් සඳහා	500.00	750.00	1,000.00
17.	හුණු පෝරණුවක් සඳහා	500.00	750.00	1,000.00
18.	යන්ත්‍ර සූත්‍ර භාවිතා කරන්නේ නැති වඩුමඩුවක් සඳහා	500.00	750.00	1,000.00
19.	හෝටලය, නවාතැන්පොළ, ආපනශාලාව	500.00	750.00	1,000.00
20.	යන්ත්‍ර සූත්‍ර භාවිතා කරන වඩුමඩුවක් සඳහා	500.00	750.00	1,000.00
21.	වින්කල් වැඩපොළක් සඳහා (පාපැදි අලුත් වැඩියා)	500.00	750.00	1,000.00
22.	යතුරුපැදි, ත්‍රීරෝද රථ, අලුත් වැඩියා කිරීමේ වැඩපලක්	500.00	750.00	1,000.00
23.	මෝටර් වාහන සර්විස් කරන හෝ අලුත් වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
24.	විසිරි තීන්ත (ස්ප්‍රේ පේන්ටින්) ආයතනයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
25.	ලොරි බොඩි ගැසීමේ ස්ථානයක් සඳහා	500.00	750.00	1,000.00
26.	මුද්‍රණාලයක් පවත්වාගෙන යාම සඳහා	500.00	750.00	1,000.00
27.	කුළුබඩු පැකට් කිරීම සඳහා වූ ව්‍යාපාරයක් සඳහා	500.00	750.00	1,000.00
28.	කෝපි, ධාන්‍ය වර්ග, මාංශභෝග, කුළු බඩු හෝ පිටි ඇඹරීම සඳහා ඇඹරුම්හලක් පැවැත්වීම සඳහා	500.00	750.00	1,000.00
29.	වී මෝල්ක් සඳහා (අශ්වබල 1 සිට 7.5 දක්වා)	500.00	750.00	1,000.00
30.	වී මෝල්ක් සඳහා (අශ්වබල 7.5 සිට 10 දක්වා)	500.00	750.00	1,000.00
31.	වී මෝල්ක් සඳහා (අශ්වබල 10 වැඩි)	500.00	750.00	1,000.00
32.	කොන්ක්‍රීට් වැඩපළක් සඳහා	500.00	750.00	1,000.00
33.	සුරතල් මසුන් අලෙවිසැලක් සඳහා	500.00	750.00	1,000.00
34.	සම් භාණ්ඩ නිෂ්පාදනය සඳහා වූ කර්මාන්ත ශාලාවක්/ වැඩපලක් පවත්වා ගෙන යාම	500.00	750.00	1,000.00
35.	සම් පදම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
36.	ගෘහ භාණ්ඩ නිෂ්පාදන ආයතනයක් හෝ ගෘහ භාණ්ඩ අලෙවිසැලක් පවත්වාගෙන යාම සඳහා	500.00	750.00	1,000.00
37.	ලොන්ඩරියක් පවත්වාගෙන යාම සඳහා	500.00	750.00	1,000.00

අනු. අංකය	I වැනි තීරුව කර්මාන්තයේ ස්වභාවය	II වැනි තීරුව ස්ථානයේ වාර්ෂික වටිනාකම (රු)		
		රු. 750.00 නොඉක්මවන අවස්ථාවක	රු. 751 ඉක්මවන එහෙත් රු. 1500 නොඉක්මවන අවස්ථාවක	රු. 1501 ඉක්මවන අවස්ථාවක
38.	ඡායා රූප ශාලාවක් පවත්වාගෙන යාම සඳහා	500.00	750.00	1,000.00
39.	කඩල කඩයක් පවත්වාගෙන යාම සඳහා	500.00	750.00	1,000.00
40.	අලුත් මාළු විකුණන ස්ථානයක් සඳහා	500.00	750.00	1,000.00
41.	එළු මස් වෙළඳසැලක් පවත්වාගෙන යාම සඳහා	500.00	750.00	1,000.00
42.	ගව මස් වෙළෙඳසැලක් පවත්වාගෙන යාම සඳහා	500.00	750.00	1,000.00
43.	ගෝඝාතක ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා	500.00	750.00	1,000.00
44.	ශීතකල මස් හෝ මාළු විකුණන ස්ථානයක් සඳහා	500.00	750.00	1,000.00
45.	ශීතකරණ වල තබා අලෙවි කරනු ලබන සියලුම වර්ගයේ අයිස්ක්‍රීම්, යෝගට්, මුදවපු කිරි හෝ මෙකී නිෂ්පාදනයන්හි වෙළෙඳ ස්ථානයක් සඳහා	500.00	750.00	1,000.00
46.	කරවල සිල්ලර වෙළඳසැලක් සඳහා (කිලෝග්‍රෑම් 150ට අඩු)	500.00	750.00	1,000.00
47.	කරවල තොග වෙළඳසැලක් සඳහා (කිලෝග්‍රෑම් 150ට වැඩි)	500.00	750.00	1,000.00
48.	අවමංගල්‍යය භාණ්ඩ සාප්පුවක් සඳහා	500.00	750.00	1,000.00
49.	නවාතැන් පොළක්, ලැගුම්හලක් පවත්වාගෙන යාම සඳහා	500.00	750.00	1,000.00
50.	කොහු මෙට්ට රබර් කැවූ භාණ්ඩ නිපදවන ආයතනයක් සඳහා	500.00	750.00	1,000.00
51.	තේ දළු ගබඩා කරන ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා	500.00	750.00	1,000.00
52.	තේ පෙට්ටි හෝ ලෑලි පෙට්ටි නිෂ්පාදනය කරන ආයතනයක් සඳහා	500.00	750.00	1,000.00
53.	පළතුරු අලෙවි කරන ස්ථානයක් සඳහා (තාවකාලික හෝ ස්ථිර පළතුරු වර්ග)	500.00	750.00	1,000.00
54.	සිසිල් බීම නිෂ්පාදනය හෝ අලෙවිසැලක් සඳහා	500.00	750.00	1,000.00
55.	සිවිලින් ලෑලි නිෂ්පාදනය හෝ සිවිලින් ලෑලි අලෙවිසැලක් සඳහා	500.00	750.00	1,000.00
56.	සියලුම වර්ගයේ පදික වෙළඳාම් සඳහා	500.00	750.00	1,000.00
57.	අතින් ලී ඉරන ඉරුම්හලක් හෝ පට්ටලයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
58.	යන්ත්‍රෝපකරණ පාවිච්චි කරන ලද ලී මෝල්ක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
59.	දැව ගබඩාවක් සඳහා	500.00	750.00	1,000.00
60.	ලී වෙළඳසැලක් සඳහා	500.00	750.00	1,000.00
61.	ස්වර්ණාභරණ නිෂ්පාදනය කරන හෝ අලුත්වැඩියා කරන ස්ථානයක් සඳහා	500.00	750.00	1,000.00
62.	රන් රිදී වැඩපොලක් හෝ වර්ණාලේපිත ස්ථානයක් සඳහා	500.00	750.00	1,000.00
63.	කම්මලක් සඳහා	500.00	750.00	1,000.00
64.	වෑල්ඩින් වැඩපොලක් සඳහා	500.00	750.00	1,000.00
65.	කළුගල් වැඩපොලක් සඳහා	500.00	750.00	1,000.00

අනු. අංකය	I වැනි තීරුව කර්මාන්තයේ ස්වභාවය	II වැනි තීරුව ස්ථානයේ වාර්ෂික වටිනාකම (රු) රු. 750.00 නොඉක්මවන අවස්ථාවක	රු. 751 ඉක්මවන එහෙත් රු. 1500 නොඉක්මවන අවස්ථාවක	රු. 1501 ඉක්මවන අවස්ථාවක
66.	විකිණීම සඳහා වූ තේ කුඩු පැකට් කරන ස්ථානයක් සඳහා	500.00	750.00	1,000.00
67.	හාල් විකිණීමේ ස්ථානයක් සඳහා	500.00	750.00	1,000.00
68.	ගිණිකෙළි භාණ්ඩ හා රතිඤ්ඤා විකිණීමේ ස්ථානයක් සඳහා	500.00	750.00	1,000.00
69.	කෘෂි රසායන ද්‍රව්‍ය ගබඩා කිරීම හෝ විකිණීම සඳහා	500.00	750.00	1,000.00
70.	රෙදි මුද්‍රණය කරන හෝ රෙදි සායම් දමන ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා	500.00	750.00	1,000.00
71.	රසායනික පොහොර ගබඩා කිරීමේ හෝ විකිණීමේ ස්ථානයක් සඳහා	500.00	750.00	1,000.00
72.	සබන් සෑදීමේ කර්මාන්තයක් සඳහා	500.00	750.00	1,000.00
73.	කොප්පරා වේලීම හෝ සකස් කරන ස්ථානයක් සඳහා	500.00	750.00	1,000.00
74.	යන්ත්‍රෝපකරණයෙන් හෝ වෙනත් ක්‍රමයකින් පොල්තෙල් හෝ එළවළු තෙල් නිෂ්පාදනය කිරීම සඳහා	500.00	750.00	1,000.00
75.	පුවක් සකස් කිරීම හෝ ගබඩා කිරීම	500.00	750.00	1,000.00
76.	අයිස් නිපදවීම සඳහා ආයතනයක් පවත්වාගෙන යාම සඳහා	500.00	750.00	1,000.00
77.	තොග වශයෙන් විකිණීම සඳහා පිටි, සීනි, ලුණු හෝ ඕනෑම ආහාර ද්‍රව්‍යයක් හොන්ඩර ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම.	500.00	750.00	1,000.00
78.	රබර් රෝලක් තබා ගැනීම	500.00	750.00	1,000.00
79.	සත්ව ආහාර ගබඩාවක් හා විකිණීමේ වෙළඳසැලක් පවත්වාගෙන යාම සඳහා	500.00	750.00	1,000.00
80.	පාසල් රටහුණු නිෂ්පාදනය කිරීම සඳහා	500.00	750.00	1,000.00
81.	ඉටිපන්දම් නිපදවීම සඳහා	500.00	750.00	1,000.00
82.	රෙදි සෝදන නිල් නිපදවීම සඳහා	500.00	750.00	1,000.00
83.	බෙලෙක් භාණ්ඩ නිෂ්පාදන වැඩපොළක් සඳහා	500.00	750.00	1,000.00
84.	සුවඳ පුයරු නිපදවීම හෝ සුවඳ විලවුන් නිපදවීම සඳහා	500.00	750.00	1,000.00
85.	බිම්මල් වගාකිරීමේ ස්ථානක්	500.00	750.00	1,000.00
86.	පිත්තල වැඩපොළක් සඳහා	500.00	750.00	1,000.00
87.	ඔරලෝසු අලුත්වැඩියා කරන ස්ථානයක් සඳහා	500.00	750.00	1,000.00
88.	ගුවන් විදුලි යන්ත්‍ර රූපවාහිනී යන්ත්‍ර අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් සඳහා	500.00	750.00	1,000.00
89.	රබර් කිරි එකතු කිරීමේ මධ්‍යස්ථානයක් සඳහා	500.00	750.00	1,000.00
90.	රබර් දුම් ගැසීමේ ස්ථානයක් සඳහා	500.00	750.00	1,000.00
91.	බීඩි නිෂ්පාදනය කිරීමේ හෝ ගබඩාවක් වශයෙන් පවත්වාගෙන යාම සඳහා	500.00	750.00	1,000.00
92.	අභ්‍යාස පොත් නිෂ්පාදනය	500.00	750.00	1,000.00

පළමු උපලේඛනය - පීඩාකාරී ව්‍යාපාර

අනු. අංකය	*I වැනි තීරුව* *කර්මාන්තයේ ස්වභාවය*	*II වැනි තීරුව* *ස්ථානයේ වාර්ෂික වටිනාකම*		
		රු. 750 නොඉක්මවන අවස්ථාවක	*රු. 751 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,501 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
01.	පොහොර හෝ රසායනික පොහොර නිපදවීම හෝ ගබඩා කර තැබීම	500	750	1,000
02.	සම්පදම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම හෝ සම් විකිණීම	500	750	1,000
03.	සත්ත්ව පාලනය, (මස්, කිරි හෝ බිත්තර සඳහා)	500	750	1,000
04.	ඡායාරූප ශාලාවක් පැවැත්වීම	500	750	1,000
05.	පශු වෛද්‍ය ගිලන්හලක් පැවැත්වීම	500	750	1,000
06.	විකිණීම සඳහා නරක් වන සුලු කෑම වර්ග හෝ ආහාර ද්‍රව්‍ය ගබඩා කර තබා ගැනීම	500	750	1,000
07.	කරවල, ලුණුවල හෝ ජාඩි කිලෝග්‍රෑම් 150 ට වැඩි ප්‍රමාණයක් තබා ගැනීම	500	750	1,000
08.	දුම්කොළ සකස් කිරීම හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500	750	1,000
09.	සත්ව ආහාර නිපදවීම හෝ සත්ව ආහාර ගබඩාවක් පැවැත්වීම	500	750	1,000
10.	සබන් නිෂ්පාදනය කිරීම	500	750	1,000
11.	අලුත් හෝ පරණ ලෝහ ගබඩාකර තබා ගැනීම	500	750	1,000
12.	ලෝහමය සුන්බුන් ද්‍රව්‍ය ගබඩා කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500	750	1,000
13.	ගෘහ භාණ්ඩ නිපදවීම හෝ ගබඩා කර තබාගැනීම	500	750	1,000
14.	වඩු කර්මාන්ත ශාලාවක් පැවැත්වීම	500	750	1,000
15.	රසකැවිලි වර්ග නිපදවීම	500	750	1,000
16.	බුරුසු වර්ග නිපදවීම (දත් බුරුසු හැර)	500	750	1,000
17.	යන්ත්‍රානුසාරයෙන් හෝ අතින් දැව ඉරීමේ ස්ථානයක් පැවැත්වීම	500	750	1,000
18.	පින්තාරු තීන්ත, වාර්නිෂ් හෝ ඩිස්ටෙම්පර් සායම් හෝ ඒවා ලීටර් 100 ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම,	500	750	1,000
19.	සම් භාණ්ඩ නිපදවීම	500	750	1,000
20.	පළතුරු මාළු හෝ වෙනත් ආහාර වර්ග ටින්වල ඇසිරීම	500	750	1,000
21.	මිරිස්, කෝපි, ධාන්‍ය වර්ග මාංශභෝග කුලු බඩු හෝ පිටි ඇඹරීම සඳහා ඇඹරුම්හලක් පැවැත්වීම	500	750	1,000
22.	ටයර් හෝ ටියුබ් 50 ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම	500	750	1,000
23.	සිමෙන්ති භාණ්ඩ හෝ ඇස්බැස්ටොස් සිමෙන්ති භාණ්ඩ නිපදවීම	500	750	1,000
24.	යන්ත්‍රානුසාරයෙන් සිමෙන්ති බ්ලොක්ගල් නිපදවීම	500	750	1,000
25.	ධාන්‍ය හෝ මාංශභෝග කිලෝ ග්‍රෑම් 250 ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම	500	750	1,000

උපලේඛනය 2

අන්තරාදයක ව්‍යාපාර :

01.	තොග වශයෙන් විකිණීම සඳහා පිටි, ලුණු හෝ සීනි කිලෝ ග්‍රෑම් 750 ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම	500	750	1,000
02.	මැසූ ඇඳුම් නිෂ්පාදනය කිරීම	500	750	1,000
03.	මුද්‍රණාලයක් පැවැත්වීම	500	750	1,000
04.	කුකුළන් 50 ට වැඩි ප්‍රමාණයක් සඳහා කුකුල් ගාලක් හෝ කුකුල් කොටුවක් පැවැත්වීම	500	750	1,000
05.	එළුවන්, ඌරන් 10 ට වැඩි ප්‍රමාණයක් සඳහා ගාලක් හෝ මඩුවක් පැවැත්වීම	500	750	1,000

අනු. අංකය	I වැනි තීරුව කර්මාන්තයේ ස්වභාවය	II වැනි තීරුව ස්ථානයේ වාර්ෂික වටිනාකම		
		රු. 750 නොඉක්මවන අවස්ථාවක	රු. 751 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක	රු. 1,501 ඉක්මවන අවස්ථාවක
		රු. ශත	රු. ශත	රු. ශත
06.	ගඩොල් හෝ උළු ගබඩාකර තබා ගැනීම	500	750	1,000
07.	දර ගබඩාවක් පැවැත්වීම	500	750	1,000
08.	කළුගල් කැනීම හෝ කැඩීම යන්ත්‍රානුසාරයෙන් හෝ අතින්	500	750	1,000
09.	සිසිල් බීම නිෂ්පාදනය හෝ සිසිල් බීම බෝතල් 100 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම	500	750	1,000
10.	අයිස් ක්‍රීම් නිෂ්පාදනය	500	750	1,000
11.	පොල්තෙල් නිෂ්පාදනය හෝ ලීටර් 300 ට වැඩි ප්‍රමාණයක් ගඩබා කිරීම	500	750	1,000
12.	කොහු හෝ වෙනත් කෙදි වර්ගවලින් භාණ්ඩ නිෂ්පාදනය හෝ ගබඩා කිරීම	500	750	1,000
13.	ස්වර්ණාභරණ නිෂ්පාදනය කිරීම හෝ අලුත්වැඩියා කිරීම	500	750	1,000
14.	යන්ත්‍රානුසාරයෙන් ලී ඉරීම	500	750	1,000
15.	යන්ත්‍රානුසාරයෙන් පාවිච්චි කරන කම්හලක් පැවැත්වීම	500	750	1,000
16.	හිස් ගෝනි හෝ හිස් බෝතල් ගබඩාකර තබා ගැනීම	500	750	1,000
17.	පාපැදි හෝ යතුරු පැදි අලුත්වැඩියා කිරීමේ වැඩපලක් පැවැත්වීම	500	750	1,000
18.	පාවිච්චි කරන ලද කඩදාසි හෝ පත්තර ගබඩාකර තබා ගැනීම	500	750	1,000
19.	ගිනිකෙලි භාණ්ඩ හෝ රතිඤ්ඤු ගබඩා කිරීම හෝ නිපදවීම	500	750	1,000
20.	පොල්තෙල් හැර වෙනත් එළවළු තෙල් ලීටර් 50 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම	500	750	1,000
21.	ශීතකළ මස් හෝ මාළු ගබඩාකර තබාගැනීම	500	750	1,000
22.	දූව ගබඩා කිරීම	500	750	1,000
	උපලේඛන 3			
පීඩාකාරී හා අන්තරාදයක ව්‍යාපාර :				
01.	රසායනික ද්‍රව්‍ය පාවිච්චි කර කුරුඳු, කරඳමුංගු එනසාල් හෝ ගබඩා කිරීම	500	750	1,000
02.	ඩ්‍රයික්ලීන් කිරීම හෝ සායම් දැමීම	500	750	1,000
03.	රෙදි මුද්‍රණය කිරීම හෝ සායම් දැමීම	500	750	1,000
04.	විද්‍යුත් ලෝහ ආලේපනය කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500	750	1,000
05.	හුණුගල් හෝ හිරිගල් පිලිස්සීම, සකස් කිරීම හෝ අලුහණු ගබඩා කිරීම	500	750	1,000
06.	බැටරි විද්‍යුත් ආරෝපණය කිරීම හෝ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500	750	1,000
07.	මෝටර් වාහන අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500	750	1,000
08.	මෝටර් වාහන සේවා කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500	750	1,000
09.	වාත්තු මඩුවක් පවත්වාගෙන යාම	500	750	1,000
10.	බෙලෙක් වැඩපලක් පවත්වාගෙන යාම	500	750	1,000
11.	ගෑස් සිලින්ඩර් ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500	750	1,000
12.	ආයුර්වේද ඖෂධ, දේශීය ඖෂධ නිෂ්පාදනය කිරීම හෝ සංයෝජනය කිරීම	500	750	1,000
13.	වීදුරු භාණ්ඩ හෝ වීදුරු තහඩු ගබඩා කිරීම	500	750	1,000
14.	ප්ලාස්ටික් හෝ ෆයිබර් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත ශාලාවක් පැවැත්වීම	500	750	1,000
15.	කිලෝග්‍රෑම් 100 ට වැඩි ප්‍රමාණයක් තේ කුඩු ගබඩාකර තබා ගැනීම	500	750	1,000

අනු. අංකය	*I වැනි තීරුව* *කර්මාන්තයේ ස්වභාවය*	*II වැනි තීරුව* *ස්ථානයේ වාර්ෂික වටිනාකම*		
		රු. 750 නොඉක්මවන අවස්ථාවක	*රු. 751 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,501 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
16.	වෑල්ඩින් සඳහා ස්ථානයක් පැවැත්වීම	500	750	1,000
17.	ලියවන පට්ටල් භාවිත කරමින් වැඩපලක් පැවැත්වීම	500	750	1,000
18.	පැට්‍රොල්, ඩීසල්, තෙල් හෝ වෙනත් යම් ඛනිජ තෙල් වර්ගයක් ගබඩාකොට ඇති ස්ථානයක් පවත්වාගෙන යාම	500	750	1,000
19.	වායුසමන යන්ත්‍ර ශීතකරණ හෝ අධි ශීතකරණ සේවා කිරීම හෝ අලුත්වැඩියා කිරීම	500	750	1,000
20.	විදුලි කර්මාන්ත වැඩපලක් හෝ විදුලි උපකරණ නිපදවන හෝ අලුත්වැඩියා කිරීමේ වැඩපලක් පත්වාගෙන යාම	500	750	1,000

තුම්පනේ ප්‍රාදේශීය සභාව - ගලගෙදර

2024 වර්ෂය සඳහා කර්මාන්ත බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වැනි වගන්තියේ (3) වැනි උපවන්තියෙන් තුම්පනේ ප්‍රාදේශීය සභාවේ ලේකම් වශයෙන් මාවෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2023 වර්ෂයේ ඔක්තෝබර් මස 23 වැනි දින මාගේ අංක 828 දරන තීරණය මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2024 වර්ෂය සඳහා පනවන ලද ඒ ඒ කර්මාන්ත බද්ද, ඒ වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවට වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

ඩබ්. ඒ. එල්. ටී. ජයරත්න,
ලේකම්,
තුම්පනේ ප්‍රාදේශීය සභාව.

2023 ඔක්තෝබර් මස 23 වැනි දින,
තුම්පනේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව තුම්පනේ ප්‍රාදේශීය සභාවේ ලේකම් ලෙස එකී "1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර තුම්පනේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත කරගෙන යනු ලබන පහත උපලේඛනයේ I වැනි තීරුවේ සඳහන් එක් එක් කර්මාන්තය වෙනුවෙන්, එම උපලේඛනයේ II වැනි තීරුවේ, ඒ එක් එක් කර්මාන්තය පවත්වාගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකමට අනුරූප තීරුවේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2024 වර්ෂය සඳහා පනවා අය කළ යුතු බවටත්, එකී කර්මාන්ත බද්දට යටත් තැනැත්තෙකු එකී බද්ද 2024 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර තුම්පනේ ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් තීරණය කරමි.

උපලේඛනය

අනු. අංකය	*I වැනි තීරුව* *කර්මාන්තයේ ස්වභාවය*	*II වැනි තීරුව* *ස්ථානයේ වාර්ෂික වටිනාකම*		
		රු. 750 නොඉක්මවන අවස්ථාවක	*රු. 751 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,501 ඉක්මවන අවස්ථාවක*
		රු.	*රු.*	*රු.*
01.	හඳුන්කුරු සෑදීමේ කර්මාන්තයක් පවත්වාගෙන යාම	500	750	1,000
02.	ගිනිපෙට්ටි කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම	500	750	1,000

අනු. අංකය	I වැනි තීරුව කර්මාන්තයේ ස්වභාවය	II වැනි තීරුව ස්ථානයේ වාර්ෂික වටිනාකම		
		රු. 750 නොඉක්මවන අවස්ථාවක	රු. 751 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක	රු. 1,501 ඉක්මවන අවස්ථාවක
		රු.	රු.	රු.
03.	බිස්කට් නිෂ්පාදනය කරන කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම	500	750	1,000
04.	යන්ත්‍රානුසාරයෙන් රසකැවිලි නිෂ්පාදනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500	750	1,000
05.	යන්ත්‍රසූත්‍ර භාවිතා නොකර රසකැවිලි නිෂ්පාදනය කරන ස්ථානයක් හෝ ආහාර නිපදවන ස්ථානයක් පවත්වාගෙන යාම	500	750	1,000
06.	යෝගට් නිෂ්පාදන ආයතනයක් පවත්වාගෙන යාම	500	750	1,000
07.	ගඩොල් පෝරණුවක් පවත්වාගෙන යාම	500	750	1,000
08.	හුණු පෝරණුවක් පවත්වාගෙන යාම	500	750	1,000
09.	කොන්ක්‍රීට් වැඩපලක් පවත්වාගෙන යාම	500	750	1,000
10.	සම් භාණ්ඩ නිෂ්පාදනය සඳහා වූ කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම	500	750	1,000
11.	කොහු මෙට්ට රබර් කැවූ භාණ්ඩ නිපදවන ආයතනයක් පවත්වාගෙන යාම	500	750	1,000
12.	තේ පෙට්ටි හෝ ලෑලි පෙට්ටි නිෂ්පාදනය කරන ආයතනයක් පවත්වාගෙන යාම	500	750	1,000
13.	සිසිල් බීම නිෂ්පාදනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500	750	1,000
14.	සිවිලින් ලෑලි නිෂ්පදනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500	750	1,000
15.	සබන් සැදීමේ කර්මාන්තයක් පවත්වාගෙන යාම	500	750	1,000
16.	යන්ත්‍රෝපකරණයෙන් හෝ වෙනත් ක්‍රමයකින් පොල්තෙල් හෝ එළවළු තෙල් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500	750	1,000
17.	අයිස් නිපදවීම සඳහා ආයතනයක් පවත්වාගෙන යාම	500	750	1,000
18.	පාසල් රටහුණු නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500	750	1,000
19.	ඉටිපන්දම් නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500	750	1,000
20.	රෙදි සෝදන නිල් නිපදවීම කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500	750	1,000
21.	බෙලෙක් භාණ්ඩ නිෂ්පාදන වැඩපොලක් පවත්වාගෙන යාම	500	750	1,000
22.	සුවඳ පුයර නිපදවීම හෝ සුවඳ විලවුන් නිපදවීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500	750	1,000
23.	අභ්‍යාස පොත් නිෂ්පාදනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500	750	1,000

11 - 494/2

තුම්පනේ ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා ව්‍යාපාර බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වැනි වගන්තියේ (3) වැනි උපවන්තියෙන් තුම්පනේ ප්‍රාදේශීය සභාවේ ලේකම් වශයෙන් මාවෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2023 වර්ෂයේ ඔක්තෝබර් මස 23 වැනි දින මාගේ අංක 829 දරන තීරණය මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2024 වර්ෂය සඳහා පනවන ලද ඒ ඒ කර්මාන්ත බද්ද, 2024 අප්‍රේල් මස 30 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවටත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

ඩබ්. ඒ. එල්. ටී. ජයරත්න,
ලේකම්,
තුම්පනේ ප්‍රාදේශීය සභාව.

2023 ඔක්තෝබර් මස 23 වැනි දින,
තුම්පනේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව තුම්පනේ ප්‍රාදේශීය සභාවේ ලේකම් ලෙස එකී සභා පනතේ 152 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර, එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ එකී පනතේ 150 වන වගන්තිය යටතේ යම් කර්මාන්ත බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නාවූ හා වෘත්තියක් නොවන්නා වූ කිසියම් ව්‍යාපාරයක් තුම්පනේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2024 වර්ෂයේ දී කරගෙන යනු ලබන සෑම තැනැත්තෙකු විසින් ම එකී ව්‍යාපාරයේ ඊට පෙර වර්ෂයේ ලැබීම් මෙහි පහත උපලේඛනයේ I වැනි තීරුවේ නිරූපිත යම් විෂයාංකයක සීමාවන් ඇතුළත පවත්නා අවස්ථාවක එහි II වැනි තීරුවේ අනුරූපි සටහනෙහි නිරූපිත අනුප්‍රමාණය අනුව වූ ව්‍යාපාර බද්දක් 2024 වර්ෂය සඳහා නියමකර අයකිරීමටත්, බද්දට යටත් යම් තැනැත්තෙකු එකී ව්‍යාපාර බද්ද 2024 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට හෝ ඊට පෙර තුම්පනේ ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් තීරණය කරමි.

උපලේඛනය

	I වැනි තීරුව	*II වැනි තීරුව*
අනු. අංකය	*අදාළවන වර්ෂයට පෙර වර්ෂයේ ව්‍යාපාරයෙන් ලත් ලැබීම් ප්‍රමාණය*	*ගෙවිය යුතු බද්ද රු. ශත*
1	රු. 6,000 නොඉක්මවන අවස්ථාවක	අය කිරීමක් නැත
2	රු. 6,001 සිට රු. 11,999 දක්වා	90 0
3	රු. 12,001 සිට 18,749 දක්වා	180 0
4	රු. 18,751 සිට රු. 74,999 දක්වා	360 0
5	රු. 75,001 සිට රු. 1,49,999 දක්වා	1,200 0
6	රු. 1,50,001 ඉහළට	3,000 0

11 - 494/3

තුම්පනේ ප්‍රාදේශීය සභාව - ගලගෙදර

2024 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තියෙන් තුම්පනේ ප්‍රාදේශීය සභාවේ ලේකම් වශයෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2023 වර්ෂයේ ඔක්තෝබර් මස 23 වැනි දිනැති තීරණ අංක 830 යටතේ වරිපනම් පනවා අය කිරීමට තීරණය කළ බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2024 වර්ෂය සඳහා පනවන ලද වරිපනම්, මාර්තු මස 31, ජූනි මස 30, සැප්තැම්බර් මස 30 හා දෙසැම්බර් මස 31 යන දිනවලින් අවසන් වන සෑම කාර්තුවක් තුළ දී සමාන වාරික හතරකින් (4) ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවට වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

2024 වර්ෂය සඳහා වන සම්පූර්ණ වරිපනම් 2024 වර්ෂයේ ජනවාරි මස 31 වැනි දින හෝ ඊට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලය වෙත ගෙවනු ලැබුවහොත් එම සම්පූර්ණ වරිපනම් ප්‍රමාණයෙන් සියයට දහය (10%)ක වට්ටමක් ද, එක් එක් කාර්තුවකට අදාළ වරිපනම් ඒ එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දිනයට පෙරාතුව ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබුවහොත් සියයට පහක (5%)ක වට්ටමක් ද ගෙවනු ලැබේ.

ඩබ්. ඒ. එල්. ටී. ජයරත්න,
ලේකම්,
තුම්පනේ ප්‍රාදේශීය සභාව.

2023 ඔක්තෝබර් මස 23 වැනි දින,
තුම්පනේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව තුම්පනේ ප්‍රාදේශීය සභාවේ ලේකම් ලෙස එකී ප්‍රාදේශීය සභා පනතේ 146 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට පැවරී ඇති බලතල ප්‍රකාරව තුම්පනේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දියුණු කල ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත්කරන ලද ප්‍රදේශය ඇතුළත පිහිටි සියලුම නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම් හා ගෙපත්වල 2016 වර්ෂයේ දී ක්‍රියාත්මක කරන ලද වාර්ෂික තක්සේරු වටිනාකම් 2024 වර්ෂය සඳහා පිළිගැනීමටත්;

එකී ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව මෙහි පහත දක්වා ඇති මාර්ගයන් හා පාරවල් දෙපස ඇති දේපළ මත ඉහත කී වාර්ෂික වටිනාකමෙන්, පහත අනුරූපිත ප්‍රතිශතයන්, 2024 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්, ඒ වරිපනම් එකී ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (6) වන උපවගන්තියේ විධිවිධාන යටතේ එකී වර්ෂයේ මාර්තු මස 31, ජූනි මස 30, සැප්තැම්බර් මස 30 හා දෙසැම්බර් මස 31 යන දිනවලින් අවසන් වන කාර්තු හතර තුළදී සමාන වාරික හතරකින් (4) ගෙවීමට විධානය කිරීමටත් තීරණය කරමි.

I. ගලගෙදර කොට්ඨාසයේ :

රඹුක්කන පාර පෙතිගෙවෙල පාර පොහොලියද්ද පාර විද්‍යාල පාර වැත්තෑව පාර කුරුණෑගල පාර කුරුණෑගල හරස් පාර උසාවිය පාර නුවර පාර	පිහිටි සෑම නිශ්චල දේපළක් මත සියයට දහය (10%) ක වරිපනම් බද්දක් ද,
අක්කරේ පාර මාඋස්සාව පාර නිදහස් පටුමග විහාරතැන්න පාර ගොඩලියද්ද පාර කොහිලඇල්ල පාර මල්පොලයාය පාර මැදගොඩ දක්වා	පිහිටි සෑම නිශ්චල දේපළක් මත සියයට පහක (5%) ක වරිපනම් බද්දක් ද,

II. අරඹේකඩේ කොට්ඨාසයේ :

කටුගස්තොට පාර කුරුණෑගල පාර බොක්කාවල පාර හෑදෙනිය මැදවල පාර	පිහිටි සෑම නිශ්චල දේපළක් මත සියයට පහ (5%) ක වරිපනම් බද්දක් ද,

III. හතරලියද්ද කොට්ඨාසයේ :

නුවර පාර රඹුක්කන පාර සංඝරාජපුර පාර	පිහිටි සෑම නිශ්චල දේපළක් මත සියයට පහ (5%) ක වරිපනම් බද්දක් ද,

තුම්පනේ ප්‍රාදේශීය සභාව - ගලගෙදර

2024 වර්ෂය සඳහා වෙනත් සේවා සඳහා ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තියෙන් තුම්පනේ ප්‍රාදේශීය සභාවේ ලේකම් වශයෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2023 වර්ෂයේ ඔක්තෝබර් මස 23 වැනි දින මාගේ අංක 831 දරන තීරණය මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩබ්. ඒ. එල්. ටී. ජයරත්න,
ලේකම්,
තුම්පනේ ප්‍රාදේශීය සභාව.

2023 ඔක්තෝබර් මස 23 වැනි දින,
තුම්පනේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව තුම්පනේ ප්‍රාදේශීය සභාවේ ලේකම් ලෙස 2024 වර්ෂය සඳහා පහත උපලේඛනයේ සඳහන් සේවාවන් සම්බන්ධයෙන් ඊට අනුරූපිත තීරුවේ සඳහන් ගාස්තු පනවා අය කිරීමට තීරණය කරමි.

01) පරිසර ආරක්ෂණ බලපත්‍ර ගාස්තු :

වර්ෂ 2000 අංක 53 1988 අංක 56 දරන පනත් මගින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 26 වැනි වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාර එකී පනත යටතේ ස්ථාපිත මධ්‍යම පරිසර අධිකාරිය වර්ෂ 2022 පෙබරවාරි මස 24 වන දින සිට මෙකී පළමුවැනි උප ලේඛනයේ "ඇ" කොටස සඳහන් ව්‍යාපාර 39ක් සඳහා නිශ්චිතව සඳහන් බලතල, කාර්යයන් හා කර්තව්‍යයන් ක්‍රියාත්මක කිරීම සඳහා තුම්පනේ ප්‍රාදේශීය සභාවේ සභාපති වෙත මෙයින් බලය පවරා ඇත.

"ඇ" කොටස

1. සේවක සංඛ්‍යාව 10ක් හෝ ඊට වැඩි පිරිසක් සේවයේ නියුක්තව සිටින ඉටිපන්දම් නිෂ්පාදන කර්මාන්ත
2. සේවක සංඛ්‍යාව 5ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින බතික් කර්මාන්තය
3. සේවක සංඛ්‍යාව 5ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින වාණිජ මට්ටමේ රෙදි සෝදන ස්ථාන
4. රෙදි වියන යන්ත්‍ර මැෂින් 10ක් හෝ ඊට වැඩි පිරිසක් සහිත අත් යන්ත්‍ර පෙහෙකම්හල් හෝ ගෙතීමේ හෝ එම්බ්‍රොයිඩර් කිරීමේ කර්මාන්ත
5. දිනකට ලීටර 200කට අඩු නිෂ්පාදන ධාරිතාවක් සහිත වාණිජ මට්ටමේ පොල් තෙල් නිස්සාරණය කිරීමේ කර්මාන්ත
6. පොල්තෙල් සහ ආයුර්වේද තෙල් නිස්සාරණය කිරීමේ කර්මාන්ත හැර දිනකට ලීටර 10කට අඩු නිෂ්පාදන ධාරිතාවක් සහිත වාණිජ මට්ටමේ ශාක තෙල් නිස්සාරණය කිරීමේ කර්මාන්ත
7. දිනකට ලීටර් 10 කට අඩු නිෂ්පාදන ධාරිතාවක් සහිත මධ්‍යසාරමය නොවන බීම වර්ග නිෂ්පාදනය කිරීමේ හෝ බෝතල්ගත කිරීමේ කර්මාන්තය.
8. දිනකට කිලෝග්‍රෑම් 500 හෝ ඊට වැඩි නිෂ්පාදන ධාරිතාවක් සහිත වියළි සැකසුම් ක්‍රියාවලි සහිත වී මෝල
9. මසකට කිලෝග්‍රෑම් 1000කට අඩු නිෂ්පාදන ධාරිතාවක් සහිත ඇඹරුම්හල්
10. සේවක සංඛ්‍යාව 10ක් හෝ ඊට වැඩි සහ 25ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින දුම්කොළ වියළීමේ කර්මාන්ත හෝ දුම් වැටි හෝ දුම්කොළ ආශ්‍රිත වෙනත් නිෂ්පාදන කර්මාන්ත
11. එක් තොගයකට කිලෝග්‍රෑම් 250 හෝ ඊට වැඩි යෙදවුම් ධාරිතාවක් සහිත සල්ෆර් දුම් ගැසීම සහිත කුරුඳු දුම් ගැසීමේ කර්මාන්තය
12. සේවක සංඛ්‍යාව 5ට වැඩි පිරිසක් සේවයේ නියුක්තව සිටින ආහාරයට ගන්නා ලුණු ඇසුරුම් කිරීමේ සහ සැකසුම් කිරීමේ කර්මාන්ත
13. සේවක සංඛ්‍යාව 5ට වැඩි පිරිසක් සේවයේ නියුක්තව සිටින වාණිජමය තේ මිශ්‍ර කිරීමේ /මුහුවම් කිරීමේ කර්මාන්ත

14. සේවක සංඛ්‍යාව 05ක් හෝ ඊට වැඩි සහ 10ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින ආහාර නිෂ්පාදනය කිරීමේ හෝ සකස් කිරීමේ කර්මාන්ත

15. දිනකට පිටි කිලෝග්‍රෑම් 250ට අඩු ප්‍රමාණයක යෙදවුම් ධාරිතාවක් සහිත වාණිජ මට්ටමේ බේකරි සහ රස කැවිලි නිෂ්පාදන කර්මාන්ත

16. ඕනෑම අවස්ථාවක වැඩුණු පක්ෂීන් 100 හෝ ඊට වැඩි සහ 500ට අඩු සංඛ්‍යාවක් සිටින කුකුළු ගණයේ පක්ෂි ගොවිපලවල්

17. ඕනෑම අවස්ථාවක වැඩුණු සතුන් 05 ක් හෝ ඊට වැඩි සහ 10 ට අඩු සංඛ්‍යාවක් සිටින ඌරු හෝ ගව ගොවිපලවල්"

18. ඕනෑම අවස්ථාවක වැඩුණු සතුන් 25ක් හෝ ඊට වැඩි සහ 50ට අඩු සංඛ්‍යාවක් සිටින එළු ගොවිපලවල්

19. වැඩුණු සතුන් මුළු එකතුව 100 ක් හෝ ඊට වැඩි සහ 500ට අඩු සංඛ්‍යාවක් සිටින මිශ්‍ර ගොවිපලවල් * මිශ්‍ර ගොවිපලවල් සඳහා අනුපාතය = පක්ෂීන් සංඛ්‍යාව + (50 x ඌරන් සංඛ්‍යාව + ගවයන් සංඛ්‍යාව)

20. ගබඩා ධාරිතාවය සත මීටර් 100 ක් හෝ ඊට වැඩි පළතුරු හෝ එළවළු හෝ මාංශ හෝ වෙනත් ආහාර ද්‍රව්‍ය ගබඩා කරන ස්ථාන

21. කොන්ක්‍රීට් පෙරසවි කර්මාන්ත

22. යන්ත්‍රානුසාරයෙන් සිමෙන්ති බ්ලොක්ගල් නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත

23. දිනකට නිෂ්පාදන ධාරිතාවය මෙට්‍රික් ටොන් 20ට අඩු ප්‍රමාණයක් සහිත හුණු පෝරණු

24. සේවක සංඛ්‍යාව 5කට වැඩි ප්‍රමාණයක් සේවයේ නියුක්තව සිටින "ප්ලාස්ටර් ඔෆ් පැරිස්" අමුද්‍රව්‍ය වශයෙන් යොදාගන්නා ඕනෑම කර්මාන්තයක්

25. බෙලිකටු කැබලි කිරීමේ/පතුරු කිරීමේ කර්මාන්ත

26. උළු සහ ගඩොල් පෝරණු

27. වීදුරු ද්‍රව කිරීමේ ක්‍රියාවලිය රහිතව වීදුරු භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත

28. කළුගල් කැපීමේ සහ ඔප දැමීමේ කර්මාන්ත

29. පුපුරණ ද්‍රව්‍ය භාවිතා කර එක් බෝර වලක් බැගින් පුපුරවමින් සිදු කරනු ලබන ශිල්පීය කැණීම් කටයුතු

30. දිනකට සත මීටර් 25ට අඩු ඉරුම් ධාරිතාවක් සහිත ලී මෝල් හෝ සේවක සංඛ්‍යාව 05ක් හෝ ඊට වැඩි සහ 10කට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින දැව ආශ්‍රිත කර්මාන්ත

31. දැව පදම් කිරීම සඳහා බෝරෝන පිරියම් ක්‍රමය භාවිතා කරන වඩු කර්මාන්ත

32. බහු කාර්ය වඩු කාර්මික යන්ත්‍ර භාවිතා කරන වඩු කර්මාන්ත

33. සේවක සංඛ්‍යාව 05ක් හෝ ඊට වැඩි සහ 10ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින නේවාසික පහසුකම් රහිත හෝටල් හෝ අවන්හල් හෝ උත්සව ශාලා හෝ සේවක සංඛ්‍යාව 10ක් හෝ ඊට වැඩි සහ 20ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින ආහාර පිළියෙල කිරීමේ ස්ථාන හෝ ආහාර සැපයීමේ සේවා

34. පදිංචි සංඛ්‍යාව දිනකට 25ක් හෝ ඊට වැඩි සහ 100ට අඩු පුද්ගලයන් ප්‍රමාණයක් සිටින නේවාසිකාගාර හෝ එවැනි ලැගුම් හල්

35. විසිරි පින්තාරු කිරීමේ හෝ වාහන වායු සමීකරණ යන්ත්‍ර අලුත්වැඩියා කිරීම්, නඩත්තු කිරීම් හෝ සවි කිරීම් සිදු නොකරන වාහන අලුත්වැඩියා කිරීමේ හෝ නඩත්තු කිරීමේ කටයුතු සිදු කරන ගරාජ

36. වාහන සේවා සිදු නොකරන බහාලුම් (කන්ටේනර්) පර්යන්ත

37. ඊයම් උණු කිරීම ඇතුළත් නොවන මුද්‍රණාල සහ අකුරු මුද්‍රණය කිරීමේ යන්ත්‍ර

38. මෘත ශරීර කල්තබා ගැනීමට සකස් කිරීම සහිත මල් ශාලා

39. මෙම උපලේඛනයේ "ඈ" කොටසේ ඇතුළත් නොවන එක් වැඩ මුරයකට සේවක සංඛ්‍යාව 10 හෝ ඊට වැඩි සහ 50ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින ඕනෑම ක්‍රියාකාරකමක්/කර්මාන්තයක්

ගාස්තු අයකිරීම :

i. පරිසර ආරක්ෂණ බලපත්‍ර ගාස්තු අලුත් කිරීම සහ නව ව්‍යාපාරයක් සඳහා ඉල්ලුම්පත් ගාස්තු - රු. 500.00
ii. පරිසර ආරක්ෂණ බලපත්‍ර ගාස්තු වසර 3ක් හෝ ඊට අඩු කාලයක් සඳහා - රු. 4500.00

iii. මුද්දර ගාස්තු - රු. 450.00
iv. සුළු පරිමාණ ව්‍යාපාර සඳහා සභාවේ අනුමැතිය ලද ව්‍යාපාරවල පරිසර ගාස්තු - රු. 1000.00

වඩු කර්මාන්ත
වී ඇඹරුම්හල්
බ්ලොක් ගල් ව්‍යාපාර
මිශ්‍ර ඇඹරුම් හල්
ගරාජ

v. අනෙක් සියලු ව්‍යාපාර සඳහා පරිසර ගාස්තු - රු. 3000.00

පරිසර ආරක්ෂණ බලපත්‍ර ගාස්තු පරිසර අධිකාරි පනත අනුව අය කෙරේ.

02. නොපවරා ගැනීමේ සහ වීටීරේබා සහතිකයක් ලබාදීම සඳහා - රු. 1500.00
(මෙම සහතිකය මාස හයක (06) කාලයක් වලංගු වේ)

03. මිනින්දෝරු සැලැස්මක් අනුමත කිරීම සඳහා ගාස්තු/ගොඩනැගිලි සැලැස්මක් අනුමත කිරීම සඳහා ගාස්තු අනුකූලතා සහතිකයක් නිකුත් කිරීම සඳහා ගාස්තු
(නාගරික සංවර්ධන අධිකාරියේ ගැසට් නිවේදනය සහ නාගරික සංවර්ධන අධිකාරි පනත අනුව අය කෙරේ.)
04. ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීමේ ඉල්ලුම් පත්‍රයක් සඳහා - රු. 800.00

05. මිනින්දෝරු සැලැස්මක් අනුමත කිරීම සඳහා ඉල්ලුම්පත් ගාස්තු - රු. 500.00

අනුකූලතා සහතික අයදුම්පත් ගාස්තු - රු. 700.00

කාලය දීර්ඝ කිරීමේ අයදුම්පත් ගාස්තු - රු. 300.00

කුඹුරු ඉඩම් ගොඩ කිරීම සඳහා ගාස්තු - රු. 3000.00

06. වරිපනම් ලේඛනයේ නම වෙනස් කිරීමේ ඉල්ලුම් පත්‍රයක් සඳහා - රු. 300.00

07. අනතුරුදායක ගස් සම්බන්ධ ඉල්ලුම්පතක් සඳහා - රු. 2000.00

08. ආදාහනාගාර ගාස්තු :

i. බල ප්‍රදේශය තුළ පදිංචි අයෙකු සඳහා - රු. 13000.00
ii. බල ප්‍රදේශයෙන් පිටත පදිංචි අයෙකු සඳහා - රු. 15000.00

09. ඉඩම් කට්ටිකර අලෙවි කිරීමේ ගාස්තු විකුණුම් මිලෙන් 1%ක්

10. ගලගෙදර සරත් අමුණුගම ක්‍රීඩාංගණය ක්‍රිකට් තරඟ සඳහා ලබාදීමේ ගාස්තු :

සතියේ දිනවල
- පාසල් ක්‍රිකට් තරගයක් සඳහා දිනකට (බල ප්‍රදේශය තුළ) - රු. 3500.00
- පාසල් ක්‍රිකට් තරගයක් සඳහා දිනකට (බල ප්‍රදේශයෙන් පිටත) - රු. 7000.00

සති අන්තයේ දිනවල
- පාසල් ක්‍රිකට් තරගයක් සඳහා දිනකට (බල ප්‍රදේශය තුළ) - රු. 4500.00
- පාසල් ක්‍රිකට් තරගයක් සඳහා දිනකට (බල ප්‍රදේශයෙන් පිටත) - රු. 9000.00

සතියේ දිනවල හා සති අන්තයේ දිනවල
- රාජ්‍ය ආයතන ක්‍රිකට් තරගයක් සඳහා දිනකට - රු. 10500.00
- ක්‍රීඩා සමාජ ක්‍රිකට් තරගයක් සඳහා දිනකට - රු. 13000.00
- වෙනත් පෞද්ගලික ආයතනය ක්‍රිකට් තරගයක් සඳහා දිනකට - රු. 33000.00
- වොලිබෝල් තරගයක් සඳහා දිනකට - රු. 2500.00

11. **සරත් අමුණුගම සම්මන්ත්‍රණ ශාලාව කුළී පදනම මත ලබාදීම :**

• සම්මන්ත්‍රණයක්, දේශනයක් සඳහා දිනකට	- රු. 7500.00
• මංගල උත්සවයක් හෝ වෙනත් (සහතික පත්‍ර ප්‍රදානෝත්සව ආදී) දේශනයක් සඳහා	- රු. 15000.00
• ආදයම් උත්පාදනය කරන වැඩසටහනක් පැවැත්වීම සඳහා (නාට්‍යයක් ප්‍රදර්ශනය කිරීම වැනි)	- රු. 10,000.00

12. ගලගෙදර පුරනැගුම ශාලාව කුළී පදනම මත ලබාදීම

• උත්සවයක්, සම්මන්ත්‍රණයක් හා දේශනයක් සඳහා දිනකට	- රු. 7500.00
• සහතික පත්‍ර ප්‍රධානෝත්සවයක් සඳහා	- රු. 6000.00
• ආදායම් උත්පාදනය කරන වැඩසටහනක් පැවැත්වීම සඳහා	- රු. 15,000.00

13. බැකෝ යන්ත්‍රය කුළී පදනම මත ලබාදීම (පැයකට) - රු. 6500.00

14. මෝටර් ග්‍රේඩරය කුළී පදනම මත ලබාදීම (පැයකට) - රු. 6600.00
    • බැකෝ යන්ත්‍රය හා මෝටර් ග්‍රේඩරය ලබා ගැනීමේ දී අවම පැය 3 කට ගෙවිය යුතු යි.

15. මාර්ග තලනය කුළී පදනම මත ලබාදීම (දිනකට) - රු. 9500.00

16. ටිපර් රථය කුළී පදනම මත ලබාදීම (කිලෝ මීටරයකට) - රු. 350.00

17. ජල බවුසරය කුළී පදනම මත ලබාදීම - රු. 8000.00

18. **සභාව සතු කොඩි කණු හා පුටු ලබාදීම**
රාජ්‍ය ආයතන හැර අනෙකුත් උත්සව සඳහා සභාව සතු පුටු හා කොඩි කණු ලබාදීමේ දී පුටුවකට දිනකට රු. 20ක් හා එක් කොඩි කණුවකට දිනකට රු. 20ක මුදලක් අය කෙරේ.

19. **කසළ ගාස්තු**

1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියේ (අ) ඡේදය සමඟ කියවිය යුතු 261 වැනි 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ (2) වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මධ්‍යම පළාත් සභාවේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මධ්‍යම පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2013.06.28 වැනි දින අංක 1816/ 42 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ iv (අ) කොටසේ පල කරනු ලැබූ නිවේදනයෙන් ප්‍රකාශයට පත් කරන ලද්දා වූ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ 2016.09.15 අංක 1611 දරන ගැසට් පත්‍රයේ iv (අ) කොටසේ පළ කර තුම්පනේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ බලාත්මක කරනු ලැබූ ඝන අපද්‍රව්‍ය කළමණාකරණ අතුරු ව්‍යවස්ථාව අනුව පහත උපලේඛනය අනුව කසල ගාස්තු අයකිරීම සිදු කෙරේ.

අනු. අංකය	වර්ගය	දිනකට පරිමාණය (මසකට ගාස්තු) රුපියල් පරිමාණය කි.ග්‍රෑම් 10 අඩු	පරිමාණය කි.ග්‍රෑම් 10-20	පරිමාණය කි.ග්‍රෑම් 20ට වැඩි
1.	සාප්පු කාර්යාලය	300 0	500 0	750 0
2.	හෝටල්	500 0	1,000 0	1,500 0
3.	එළවළු, පළතුරු	500 0	750 0	1,000 0
4.	මාළු, කුකුල් මස්, බිත්තර	500 0	750 0	1,000 0
5.	පදික	300 0	500 0	750 0
6.	කර්මාන්තශාලා	1,000 0	1,500 0	2,000 0
7.	කැණීම්, ඉදිකිරීම් කඩාදැමීම් ට්‍රැක්ටර් ලෝඩ් එකක් සඳහා	3,000 0	-	-
8.	ආරෝග්‍ය ශාලා	1,000 0	1,500 0	2,000 0
9.	වෙනත්	500 0	750 0	1,000 0

කසල ගාස්තුවල උපරිම ගාස්තුව - රු. 15,000.00

		රු. ශත
20.	නව සති පොල සඳහා ගාස්තු (දිනකට)	
	ශාලාව තුළ වෙළඳාම් කිරීම - වර්ග අඩි 16ට අඩු	150 0
	- වර්ග අඩි 16ක් සඳහා	300 0
	- වර්ග අඩි 64ක් සඳහා	500 0
	ශාලාවෙන් බැහැර වෙළඳම් කිරීම - වර්ග අඩි 25ට අඩු	150 0
	- වර්ග අඩි 25ක් සඳහා	250 0
	- වර්ග අඩි 60ක් සඳහා	400 0
	- වර්ග අඩි 100ක් සඳහා	500 0
	වෙනත් වාහන තුළ වෙළඳාම් කිරීම	300 0
21.	පුස්තකාල ගාස්තු :	
	වාර්ෂික සාමාජික ගාස්තු	50 0
	පොත් ප්‍රමාද ගාස්තු එක් පොතක් සඳහා	5 0
	තැන්පතු ගාස්තු	100 0
22.	ප්‍රාදේශීය සභා මාර්ගවල දැව/පස් ප්‍රවාහනය කරන ලොරි රථ සඳහා බලපත්‍රක් නිකුත් කිරීම සඳහා ගාස්තු අය කිරීම	1,000 0
23.	වැලි කියුබ් එකක් ගොඩදැමීම සඳහා වන ගාස්තුව	2,000 0
24.	මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානවලට තත්ත්ව සහතික නිකුත් කිරීම සඳහා වන ගාස්තු	3,000 0
25.	කර්මාන්ත ගිවිසුම්වල ලේඛන කට්ටලයක් (ගිවිසුම්පත් 02/03 ඇස්තමේන්තු පිටපත් 01, සැලසුම් පිටපත් 01, පැවරුම 01) නිකුත් කිරීම සඳහා වන ගාස්තු	800 0
26.	වෙළඳ ප්‍රවර්ධන ගාස්තුව (දෛනිකව)	1,500 0

11 - 494/5

තුම්පනේ ප්‍රාදේශීය සභාව - ගලගෙදර

2024 වර්ෂය සඳහා ප්‍රචාරක දැන්වීම් සහ දෘශ්‍ය පරිසරය ප්‍රදර්ශන ගාස්තු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වැනි වගන්තියේ (3) වැනි උපවන්තියෙන් තුම්පනේ ප්‍රාදේශීය සභාවේ ලේකම් වශයෙන් මාවෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2023 වර්ෂයේ ඔක්තෝබර් මස 23 වැනි දින තීරණ අංක 832 යටතේ 2024 වර්ෂය සඳහා ප්‍රචාරක දැන්වීම් සහ දෘෂ්‍ය පරිසරය ප්‍රදර්ශන ගාස්තු පනවා අයකිරීමට තීරණය කළ බවත්, පනවන ලද මෙම ගාස්තුව දැන්වීම් ප්‍රදර්ශනය කිරීමට අදහස් කරන දිනට යටත් පිරිසයෙන් දින 07 කට කලින් ප්‍රදේශීය සභාවට ගෙවා තුම්පනේ ප්‍රාදේශීය සභාවේ ලේකම්/සභාපති වෙතින් බලපත්‍රයක් ලබාගත යුතු බව මහජනයා වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩබ්. ඒ. එල්. ටී. ජයරත්න,
ලේකම්,
තුම්පනේ ප්‍රාදේශීය සභාව.

2023 ඔක්තෝබර් මස 23 වැනි දින,
තුම්පනේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

"1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව තුම්පනේ ප්‍රාදේශීය සභාවේ ලේකම් ලෙස එකී පනතේ 122 (1) වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල අනුව හා 1988.8.23 වැනි දින අංක 520/7 දරන අති විශෙෂ ගැසට් පත්‍රය මගින් 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 02 වැනි වගන්තිය යටතේ පළාත් පාලන නිවාස හා ඉදිකිරීම් ගරු අමාත්‍යතුමන් විසින් ප්‍රකාශයට පත්කරන ව්‍යවස්ථාවේ 39 වන අතුරු ව්‍යවස්ථාව වන ප්‍රචාරක දැන්වීම්/දෘෂ්‍ය පරිසරය පිළිබඳ අතුරු ව්‍යවස්ථා විධිවිධාන අනුව තුම්පනේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ යම් වීදියකට, පාරකට, ඇළකට, දෙළකට, වැවකට හෝ අහසට පෙනෙන පරිදි දැන්වීමක් ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම වෙනුවෙන් පහත උපලේඛනයේ සඳහන් වන පරිදි ගාස්තුවක් 2024 වර්ෂය සඳහා පනවා අයකිරීමට එම ගාස්තුව ගෙවිය යුතු යම් තැනැත්තෙක්/ආයතනය දැන්වීම් ප්‍රදර්ශනය කිරීමට අදහස් කරන දිනට දින හතකට (07) කලින් තුම්පනේ ප්‍රාදේශීය සභාවට ගාස්තු ගෙවා බලපත්‍රයක් ලබාගත යුතු බවට තීරණය කරමි.

		රු. ශත
(i)	තහඩුවලින් එක් පැත්තක් සඳහා වසරකට වර්ග අඩි එකක් වෙනුවෙන්	200 0
(ii)	තහඩුවලින් දෙපැත්තක් සඳහා වසරකට වර්ග අඩි එකක් වෙනුවෙන්	300 0
(iii)	ජංගම දුරකථන සම්බන්ධ දැන්වීම් පුවරු වර්ග අඩි එකක් වෙනුවෙන්	125 0
(iv)	කිසියම් ව්‍යාපාරයක වෙළඳ නාමයකට අමතරව වෙනත් වෙළඳ නිෂ්පාදන ප්‍රචාරක දැන්වීම් පුවරු සඳහා වර්ග අඩි එකක් වෙනුවෙන්	50 0
(v)	රෙදි බැනර් සඳහා මාසයක කාලයකට වර්ග අඩි එකක් වෙනුවෙන්	50 0
(vi)	ෆ්ලෙක්ස් වලින් දෙපැත්තක් සඳහා වසරකට වර්ග අඩි එකක් වෙනුවෙන්	125 0
	මසකට අඩු කාලයක් ප්‍රදර්ශනය කරන දැන්වීම් පුවරු සඳහා තැම්පතු මුදල	1500 0

11 - 494/6

තුම්පනේ ප්‍රාදේශීය සභාව - ගලගෙදර

2024 වර්ෂය සඳහා ජල ගාස්තු අයකිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තියෙන් තුම්පනේ ප්‍රාදේශීය සභාවේ ලේකම් වශයෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2023 වර්ෂයේ ඔක්තෝබර් මස 23 වැනි දින තීරණ අංක 833 යටතේ 2024 වර්ෂය සඳහා ජල ගාස්තු පනවා අයකිරීමට තීරණය කළ බව මහජනයා වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩබ්. ඒ. එල්. ටී. ජයරත්න,
ලේකම්,
තුම්පනේ ප්‍රාදේශීය සභාව.

2023 ඔක්තෝබර් මස 23 වැනි දින,
තුම්පනේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව තුම්පනේ ප්‍රාදේශීය සභාවේ ලේකම් ලෙස 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 126 වන වගන්තියෙහි (xiii) (ඈ) ඡේදය යටතේ වූ සම්මත අතුරු ව්‍යවස්ථාවට අනුව 2024 වර්ෂය සඳහා පහත උපලේඛනයේ සඳහන් සේවාවන් සම්බන්ධයෙන් ඊට අනුරූපිත තීරුවේ සඳහන් ජල ගාස්තු පනවා අයකිරීමට තීරණය කරමි.

ජල සම්බන්ධතා ගාස්තු රු. 28,000/- (රු. 3,000ක ආරක්ෂක තැන්පත් මුදල ද ඇතුළත්ව)

ස්ථාවර ගාස්තු (ගෘහස්ථ/ආගමික)	රු. 100.00
ස්ථාවර තැන්පත් (ව්‍යාපාරික)	රු. 150.00
ඒකක 01 සිට 10 දක්වා එක් ඒකකයකට	රු. 8.50
ඒකක 11 සිට 20 දක්වා එක් ඒකකයකට	රු. 12.50
ඒකක 21 සිට 25 දක්වා එක් ඒකකයකට	රු. 15.00
ඒකක 26 සිට 30 දක්වා එක් ඒකකයකට	රු. 20.00
ඒකක 31 සිට 35 දක්වා එක් ඒකකයකට	රු. 27.00
ඒකක 36ට වැඩි එක් ඒකකයකට	රු. 35.00

මීට අමතරව විදුලි බිල අනුව විදුලි ගැලපුම් ගාස්තුවක් අය කෙරේ.

විසන්ධි කළ සම්බන්ධතා නැවත ලබා දීමේ ගාස්තු	රු. 1500.00
පාරිභෝගික නම වෙනස් කිරීමේ ගාස්තු	රු. 1000.00
ජල මාපක පරීක්ෂණ ගාස්තු	රු. 750.00
ජල අයදුම්පත් ගාස්තු	රු. 300.00

11 - 494/7

තුම්පනේ ප්‍රාදේශීය සභාව - ගලගෙදර

2024 වර්ෂය සඳහා සංවර්ධනය නොකළ ඉඩම් සඳහා බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තියෙන් තුම්පනේ ප්‍රාදේශීය සභාවේ ලේකම් වශයෙන් මාවෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2023 වර්ෂයේ ඔක්තෝබර් මස 23 වැනි දින මාගේ අංක 834 යටතේ 2024 වර්ෂය සඳහා සංවර්ධනය නොකළ ඉඩම් සඳහා බද්දක් පනවා අයකිරීමට තීරණය කළ බව මහජනයා වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2024 වර්ෂය සඳහා පනවන ලද ඒ සංවර්ධනය නොකළ ඉඩම් මත බද්ද ඒ වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

ඩබ්. ඒ. එල්. ටී. ජයරත්න,
ලේකම්,
තුම්පනේ ප්‍රාදේශීය සභාව.

2023 ඔක්තෝබර් මස 23 වැනි දින,
තුම්පනේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව තුම්පනේ ප්‍රාදේශීය සභාවේ ලේකම් ලෙස එකී පනතේ 153 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය අනුව ප්‍රාදේශීය සභාවලට පැවරී ඇති බලතල අනුව තුම්පනේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටි ගොඩනැගිලි ඉදිකිරීමට හෝ ස්ථාවර නැතහොත් නිතිපතා ගොවිතැන් කිරීමට සුදුසු යම් ඉඩමක,

(අ) ගොඩනැගිලි කිසිවක් ඉදිකර නොමැති නම් හෝ

(ආ) ඒ ඉඩම විධිමත් ලෙස හෝ නිත්‍ය ලෙස වගා කිරීමට යටත්කර නොමැති විටක හෝ

(ඇ) ඒ ඉඩමේ ඉදිකර ඇති ගොඩනැගිලිවලට ඇත්ත වශයෙන්ම යට වී ඇති බිම් ප්‍රමාණය සහ ඒ ඉඩමේ සම්පූර්ණ බිම් ප්‍රමාණය අතර ඇති අනුපාතය 143 ට වඩා අඩු වන්නේ නම්,

එකී ඉඩම් සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකීමට සහ එවැනි සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකෙන ඉඩම් මත 2024 වර්ෂය සඳහා ඒ එක් එක් ඉඩමේ, භූමියේ ප්‍රාග්ධන අගයෙන් සියයට 0.5 (0.5%)ක වාර්ෂික බද්දක් පැනවීමටත්, එකී සංවර්ධනය නොකළ ඉඩම් මත බද්ද 2024 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර තුම්පනේ ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතු බවට විධානය කළ යුතු යැයි තීරණය කරමි.

11 - 494/8

තුම්පනේ ප්‍රාදේශීය සභාව - ගලගෙදර

2024 වර්ෂය සඳහා වාහන හා සතුන් පිළිබඳ බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තියෙන් තුම්පනේ ප්‍රාදේශීය සභාවේ ලේකම් වශයෙන් මාවෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2023 වර්ෂයේ ඔක්තෝබර් මස 23 වැනි දින තීරණ අංක 835 තීරණය මහජනයා වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ අනුව තුම්පනේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මේ බද්දට යටත් වන කිසියම් වාහනයක් හෝ සතෙකු තබාගන්නා සෑම තැනැත්තෙකුම විසින් එකී වාහනය හෝ සතා තමන් භාරයේ තබාගන්නා දින ගණන දින තිහක් සම්පූර්ණ වූ වහාම 2024 වර්ෂය සඳහා වන මෙම බද්ද තුම්පනේ ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

ඩබ්. ඒ. එල්. ටී. ජයරත්න,
ලේකම්,
තුම්පනේ ප්‍රාදේශීය සභාව.

2023 ඔක්තෝබර් මස 23 වැනි දින,
තුම්පනේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව එකී පනතේ 147 වන වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 148 වන වගන්තිය සහ හතරවන උපලේඛනයේ විධිවිධානවලින් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර තුම්පනේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2024 වර්ෂයේ දී පහත උපලේඛනයේ I වැනි තීරුවේ සඳහන් කිසියම් වාහනයක් හෝ සතෙකු තමා සන්තකයේ තබාගන්නා සෑම තැනැත්තෙකු මතම එහි II වැනි තීරුවේ අනුරූපිත සටහනෙහි නිරූපිත බද්දක් 2024 වර්ෂය සඳහා පනවා අයකිරීමට තීරණය කරමි.

උපලේඛනය

අනු. අංකය	*I වැනි තීරුව*	*II වැනි තීරුව* රු. ශත
01.	මෝටර් රථයක්, මෝටර් ට්‍රයිකාරයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා	25 0
02.	සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාරයක් හෝ කරත්තයක් සඳහා -	
	(අ) වෙළඳ කාර්යය සඳහා යොදවන්නේ නම්	18 0
	(ආ) වෙළඳ කාර්ය නොවන කාර්යයන් සඳහා යොදවන්නේ නම්	4 0
03.	සෑම කරත්තයක් සඳහා	20 0
04.	සෑම අත් කරත්තයක් සඳහා	10 0
05.	සෑම රික්ෂෝවක් සඳහා	7 50
06.	සෑම අශ්වයකු, පෝනියකු හෝ කොටළුවෙකු සඳහා	15 0
07.	සෑම ඇතෙකු සඳහා	50 0

02. විශ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝද සහිත ළමා වාහන, විල් බැරෝ, හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළෙඳ කාර්ය සඳහා යොදවන අත් කරත්ත සහ වෙළඳ කාර්ය සඳහා නොයොදවන අත් කරත්ත ඉහත ගෙවීමෙන් නිදහස් කෙරේ.

11 - 494/9

තුම්පනේ ප්‍රාදේශීය සභාව - ගලගෙදර

2024 වර්ෂය සඳහා කුළී රථ වාහන නවතා තැබීම සඳහා අවසර පත්‍ර ගාස්තු

2011.05.30 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1708/10 දරන *ගැසට් පත්‍රයේ* 4(අ) වැනි කොටසේ පළකරන ලද කුළී රථවාහන නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ වගන්ති අනුව කුළී රථවාහන නවතා තැබීම සඳහා මසකට ගාස්තු පැනවීම සඳහා 2023 වර්ෂයේ ඔක්තෝබර් මස 23 වැනි දින තීරණ අංක 836 දරන තීරණය මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩබ්. ඒ. එල්. ටී. ජයරත්න,
ලේකම්,
තුම්පනේ ප්‍රාදේශීය සභාව.

2024 ඔක්තෝබර් මස 23 වැනි දින,
තුම්පනේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව එකී පනතේ 2011.05.30 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1708/10 දරන *ගැසට්* පත්‍රයේ iv (අ) වැනි කොටසේ පළ කරන ලද කුලී රථවාහන නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ 03 වැනි වගන්තිය අනුව පහත උපලේඛනයේ සඳහන් කුලී රථවාහන නවතා තැබීම සඳහා අවසර පත්‍ර ගාස්තුවක් 2024 වර්ෂය සඳහා පනවා අයකිරීමට තීරණය කරමි.

උපලේඛනය

අනු. අංකය	*කුලී රථ වර්ගය*	*පළමු පැය රු. ශත*	*දෙවැනි පැය සහ ඊට පසු සෑම පැයකටම ගාස්තුව රු. ශත*
01	බස්රථ / ට්‍රැක්ටර්	40.00	රු. 20.00
02	ලොරි රථ	40.00	රු. 20.00
03	කාර්/ වෑන්	30.00	රු. 15.00
04	ත්‍රී රෝද රථ	30.00	රු. 15.00
05	මෝටර් බයිසිකල්	20.00	රු. 10.00
	දිනකට වෙන් කිරීම් සඳහා	*රු. ශත*	
(i)	බස්රථ/ ට්‍රැක්ටර්	200.00	
(ii)	වෙනත් වාහන සඳහා	100.00	

11 - 494/10

තුම්පනේ ප්‍රාදේශීය සභාව - ගලගෙදර

2024 වර්ෂය සඳහා ත්‍රීරෝද රථ නවතා තැබීම වෙනුවෙන් ගාස්තු පනවා අය කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තියෙන් තුම්පනේ ප්‍රාදේශීය සභාවේ ලේකම් වශයෙන් මාවෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2023 වර්ෂයේ ඔක්තෝබර් මස 23 වැනි දින මාගේ අංක 837 යටතේ 2024 වර්ෂය සඳහා ත්‍රීරෝද රථ නවතා තැබීම සඳහා ගාස්තු පනවා අය කිරීමට තීරණය කළ බව මහජනයා වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩබ්. ඒ. එල්. ටී. ජයරත්න,
ලේකම්,
තුම්පනේ ප්‍රාදේශීය සභාව.

2023 ඔක්තෝබර් මස 23 වැනි දින,
තුම්පනේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 (1) වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල අනුව හා 1989 අංක 12 දරන පළාත් සභා අනුශාංගික විධිවිධාන පනතේ 2 (1) වන උප වගන්තියේ 'අ' ඡේදය සමග කියවිය යුතු 261 වන අධිකාරිය වන 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 02 වැනි වගන්තියේ 1 වන උප වගන්තියේ මධ්‍යම පළාත් පාලන විෂය භාර ගරු අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2016.02.23 වන දින 1955/7 දරන ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයේ පළකරනු ලැබූ හා මධ්‍යම පළාත් සභාව විසින් අනුමත කර සම්මත අතුරු ව්‍යවස්ථාව 2017.11.30 දින අංක 2048 දරන ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී *ගැසට්* පත්‍රය මගින් පිළිගෙන ප්‍රකාශයට පත්කර ඇති අංක 2 දරන ත්‍රීරෝද රථ නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා විධිවිධාන අනුව තුම්පනේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ත්‍රීරෝද රථ නවතා තැබීම සඳහා වර්ෂයකට රු. 1,500 0 ක ගාස්තුවක් 2024 වර්ෂය සඳහා පනවා අයකිරීමට තීරණය කරමි.

2024 වර්ෂය සඳහා ත්‍රීරෝද රථ නැවතුම්පොල *ගැසට්* කිරීම

අනු අංකය	*ත්‍රීරෝද රථ නැවතුම්පොල*	*උපරිම ලබා දිය හැකි නැවතුම්පොළ ලියාපදිංචි ගණන*
1	ගලගෙදර රෝහල හංදිය	52
2	කවුඩැල්ල ඕපල්ල හංදිය	9
3	කවුඩැල්ල මල්වතුගොඩ හංදිය	7
4	මඩිගේ පැරණි ලංකා බැංකුව අසල	35
5	වලතැන්න හංදිය	10
6	පෙතිගෙවෙල හංදිය	39
7	10 කණුව	4
8	ගලගෙදර පොලීසිය අසල	26
9	එක්සත් මඩිගේ සමගි ත්‍රීරෝද රථ නැවතුම් පොළ	37
10	ගිරිහාගම හංදිය	10
11	නාරංවල හංදිය	25
12	ගලගෙදර මහා විද්‍යාලය අසල	2
13	උඩුව හංදිය රථගාල	13
14	මැදගොඩ 3 කණුව හංදිය	4
15	අරඹේකඩේ හංදිය	24
16	කුඹුරේගම හංදිය	9
17	දෙවෙලේගන ගිරන්දෙණිය මංසන්ධිය	5
18	පෙතිගේවෙල පන්සල අසළ	5
19	හතරලියද්ද හංදිය	53
20	වැලිගොඩපොල හංදිය	10
21	කොටිකාම්ඹ පහළ හංදිය	21

අනු අංකය	*ත්‍රීරෝද රථ නැවතුම්පොල*	*උපරිම ලබා දිය හැකි නැවතුම්පොළ ලියාපදිංචි ගණන*
22	කොටිකාම්ඹ ඉහළ හංදිය	14
23	අළුදෙණිය හංදිය	18
24	රංගමුව හංදිය	10
25	කොළුගල අම්බලම අසළ	3
26	දුංකුඹුර හංදිය	27
27	ගොඩතලේ හංදිය	8
28	පල්ලේපොල හංදිය	17
29	මීගස්තැන්න හංදිය	10
30	මුරුද්දෙණිය රථගාල	4
31	එරමුදුලියද්ද පාලම අසළ හංදිය	4
32	දම්පාගොඩ හංදිය	7
33	දේදුණුපිටිය ඉහළ හංදිය	6
34	එරමුදුලියද්ද බස් නැවතුම්පොළ අසල	6
35	හතරලියද්ද රෝයල් ස්ටෝර්ස් අසල	1

11 - 494/11

තුම්පනේ ප්‍රාදේශීය සභාව - ගලගෙදර

2024 වර්ෂයට එළ ගව මස් වෙළඳසැලක් පවත්වාගෙන යාමට බලපත්‍ර ලබාදීමට එරෙහිව විරෝධතා කැඳවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වැනි වගන්තියේ (3) වැනි උපවන්තියෙන් තුම්පනේ ප්‍රාදේශීය සභාවේ ලේකම් වශයෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2023 වර්ෂයේ ඔක්තෝබර් මස 23 වැනි දින මාගේ අංක 838 යටතේ 1893 අංක 9 දරන ගෝඝාතක ආඥාපනත හා සංශෝධන පනත යටතේ එහි අංක 7(1) හි පරිදි එළ හරක් මස් විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම සඳහා පහත සඳහන් අය විසින් 2024 වර්ෂය වෙනුවෙන් බලපත්‍රයක් ලබාගැනීම සඳහා ඉල්ලුම්කර ඇති බව මින් මහජනයාට නිවේදනය කරනු ලැබේ.

ඩබ්. ඒ. එල්. ටී. ජයරත්න,
ලේකම්,
තුම්පනේ ප්‍රාදේශීය සභාව.

2023 ඔක්තෝබර් මස 23 වැනි දින,
තුම්පනේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව එකී ස්ථානයට එබඳු බලපත්‍රයක් නිකුත් කිරීමට විරුද්ධව කරුණු ඉදිරිපත් කරනු කැමති තුම්පනේ ප්‍රාදේශීය සභා බල සීමාව ඇතුළත

පදිංචි තැනැත්තන් විසින් එසේ විරුද්ධත්වයට තිබෙන කරුණු පිළිබඳව ලිඛිත ප්‍රකාශයක් පිටපත් දෙකකින් (2) යුක්තව මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කළ දින සිට දින 30ක් ඇතුළත මා වෙත ඉදිරිපත් කරන ලෙස මෙයින් ඉල්ලා සිටිනු ලැබේ.

එළගව මස් වෙළෙඳසැල පවත්වාගෙන යාමට ඉල්ලුම් කරන ස්ථානයේ විස්තර :

අනු. අංකය	*එළගව මස් වෙළඳ සැල පවත්වා ගෙන යාමට ඉල්ලුම්කළ තැනැත්තාගේ නම හා ලිපිනය*	*එළ ගව මස් ලබා ගන්නා ස්ථානය හා එම අයිතිකරුගේ නම හා ලිපිනය*	*එළගව මස් වෙළඳ සැල පවත්වාගෙන යාමට අදහස් කරන ස්ථානයේ ලිපිනය හා හඳුනා ගැනීමේ විස්තරය*	*ග්‍රාම නිලධාරී වසම*
01.	එස්. එම්. රියාස් මයා, අංක : 67/1, දෙහිදෙණිය මඩිගේ, හතරලියද්ද (ජා.හැ.අ. 781261432v)	ඒ. කේ. එම්. රිස්වාන් මයා, බෙට්ටියගොඩ, කහපත්වල (ජා.හැ.අ. 683431796x)	හතරලියද්ද, කොටිකාම්ඹ මංසන්ධියේ ඇති නයිම් හජ්ජියාර් මාවතේ ජුම්මා පල්ලිය ඉදිරිපිට දෙහිදෙණිය මඩිගේ එළ ගව මස් වෙළඳ සැල	අංක 386 - දෙහිදෙණිය මඩිගේ
02.	එස්. එස්. එම්. නජීම් මයා, අංක : 319, මඩිගේ, ගලගෙදර (ජා.හැ.අ. 812332996v)	ඒ. එස්. එම්. බුර්හාන් මයා, වැඋඩ, පරගහදෙණිය	ගලගෙදර මඩිගේ පෙතිගෙවෙල මංසන්ධිය ඉදිරිපිට ඇති අංක 319 දරන එළ ගව මස් අලෙවිසැල	ගලගෙදර මඩිගේ දකුණ
03.	ඒ. කේ. එම්. රිස්වාන් මයා, බෙට්ටියගොඩ, කහපත්වල, ගලගෙදර (ජා.හැ.අ. 683431796x)	එම්. ජේ. එම්. සලීම් මයා, නුවර පාර, පරගහදෙණිය	9 කණුවේ සිට හතරලියද්ද පාරේ කි.මී. 1/2ක් පැමිණ බෙට්ටිගොඩ, කහපත්වල එළ ගවමස් වෙළඳ සැල	අංක 380 මීගහහේන දකුණ
	ඒ. එෆ්. එම්. රිෆාක් මයා, අංක : 226, නිදහස් පටුමග, මඩිගේ, ගලගෙදර (ජා.හැ.අ. 721541576v)	යූ. එල්. එම්. ලාෆීර් මයා, වාරියපොල එම්. එෆ්. නිරෝෂ් මයා, මොහොමඩ් නිකදලුපොත	ගලගෙදර මඩිගේ ඉන්ධන පිරවුම්හල අසල ඉදිරිපිට ඇති අංක 367 දරන එළ ගව මස් වෙළඳසැල	අංක 369, ගලගෙදර බටහිර

11 - 494/12

තුම්පනේ ප්‍රාදේශීය සභාව - ගලගෙදර

1975 අංක 17 දරන සමාජ ශාලාවලට බලපත්‍ර ලබාදීමට එරෙහිව විරෝධතා කැඳවීම - 2024 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වැනි වගන්තියේ (3) වැනි උපවන්තියෙන් තුම්පනේ ප්‍රාදේශීය සභාවේ ලේකම් වශයෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2023 වර්ෂයේ ඔක්තෝබර් මස 23 වැනි දින මාගේ අංක 839 යටතේ 1975 අංක 17 දරන සමාජ

ශාලා පනතට අනුව එකී පනතේ බලපත්‍ර ලබාදීමේ 6 වැනි වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර පහත උපලේඛනයේ දැක්වෙන සමාජ ශාලාව සඳහා 2024 වර්ෂය වෙනුවෙන් බලපත්‍රයක් ලබාගැනීම සඳහා ඉල්ලුම් කර ඇති බව මින් මහජනයාට නිවේදනය කරනු ලැබේ.

ඩබ්. ඒ. එල්. ටී. ජයරත්න,
ලේකම්,
තුම්පනේ ප්‍රාදේශීය සභාව.

2023 ඔක්තෝබර් මස 23 වැනි දින,
තුම්පනේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව හා 1975 අංක 17 දරන සමාජ ශාලා පනතට අනුව එකී පනතේ බලපත්‍ර ලබා දීමේ 6 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පහත උපලේඛනයේ දැක්වෙන සමාජ ශාලාව සඳහා 2024 වර්ෂය වෙනුවෙන් බලපත්‍රයක් ලබාගැනීම සඳහා ඉල්ලුම් කර ඇති බව මින් මහජනයා වෙත නිවේදනය කරමි. එකී සමාජ ශාලාව අසල හෝ එකී සමාජ ශාලාව සඳහා අපේක්ෂිත ස්ථාන අසළ හෝ පදිංචි යම් තැනැත්තෙකු එකී සමාජ ශාලාව සඳහා බලපත්‍ර නිකුත් කිරීමට විරුද්ධ වන්නේ නම් මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළවූ දිනයේ සිට දින 30ක් ඇතුළත තම විරෝධතාවට හේතු ලියවිල්ලකින් දක්වමින් පිටපත් දෙකකින් (2) යුක්තව මා වෙත ඉදිරිපත් කරන ලෙස මෙයින් ඉල්ලා සිටිනු ලැබේ.

උපලේඛනය

ඉල්ලුම්කරුගේ නම හා ලිපිනය	*සමාජ ශාලාවේ සභාපති ද ලේකම්ද, කළමනාකරු ද යන වග*	*සමාජ ශාලාවේ නම*	*සමාජශාලාවේ කටයුතු කරගෙන යාමට බලාපොරොත්තුවන ස්ථානය*
ජෙරමී කෙනන් ප්‍රනාන්දු මයා රොස්වුඩ්වත්ත, රත්කරවිව.	සභාපති	මවුන්ට් වීව් සමාජශාලාව	අංක 33, කුරුණෑගල පාර, ගලගෙදර.

11 - 494/13

තණමල්විල ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා ඇතැම් ව්‍යාපාර සඳහා බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 9 (3) වගන්තිවලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව තණමල්විල ප්‍රාදේශීය සභාව විසින් 2023 වර්ෂයේ 2023/09/12/208 වන කළමනාකරන කමිටු තීරණ අංකය පරිදි පහත දක්වන යෝජනාව සම්මත කරන ලද බව මහජනතාවට මෙයින් නිවේදනය කරනු ලැබේ.

ලක්ෂ්මන් අබේකෝන්,
ලේකම්,
ප්‍රාදේශීය සභාව,
තණමල්විල.

2023 සැප්තැම්බර් මස 27 වැනි දින,
ප්‍රාදේශීය සභාව,
තණමල්විල.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147, 152 වගන්තිය සමග කියවිය යුතු (1) වැනි උප වගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර, එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීමට හෝ එකී පනතේ 150 වන වගන්තිය යටතේ යම් කර්මාන්ත බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ හා වෘත්තිකයෙක් නොවන්නා වූ කිසියම් ව්‍යාපාරයක් තණමල්විල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2024 වර්ෂයේ දී කරගෙන යනු ලබන සෑම තැනැත්තකුගෙන්ම, එකී ව්‍යාපාරයේ ඊට පෙර වර්ෂයේ ලැබීම් මෙහි පහත උපලේඛනයේ I තීරුවේ නිරූපිත යම් විෂයාංකයක සීමාවක් ඇතුළත පවත්නා අවස්ථාවක එහි දෙවන තීරුවේ අනුරූපිත සටහනේ නිරූපිත අනුප්‍රමාණය අනුව වූ ව්‍යාපාර බද්දක් 2024 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්, බද්දට යටත් යම් තැනැත්තෙකු එකී ව්‍යාපාර බද්ද 2024 වර්ෂයේ මාර්තු මස 31 වන දිනට පෙර තණමල්විල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් තීරණය කරමි.

(**I**) වන උපලේඛනය

බද්ද අදාළවන 2023 වර්ෂයේ ව්‍යාපාරයෙන් ලත් ලැබීම් ප්‍රමාණය

	I වැනි තීරුව	*II වැනි තීරුව ගෙවිය යුතු බද්ද රු. ශ.*
01.	රු. 6,000.00 නොඉක්මවන අවස්ථාවක	නැත
02.	රු. 6,001.00 ඉක්මවන නමුත් රු. 12,000 නොඉක්මවන විට	90 0
03.	රු. 12,001.00 ඉක්මවන නමුත් රු. 18,750 නොඉක්මවන විට	180 0
04.	රු. 18,751.00 ඉක්මවන නමුත් රු. 75,000 නොඉක්මවන විට	360 0
05.	රු. 75,001.00 ඉක්මවන නමුත් රු. 150,000.00 නොඉක්මන විට	1,200 0
06.	රු. 150,001.00 ඉක්මවන විට	3,000 0

(**II**) වන උපලේඛනය

''වෙළඳ ව්‍යාපාරය'' යන්නට, යම් කර්මාන්තයක් හෝ නිෂ්පාදකයකුගේ හෝ යම් ගණුදෙනුවක් හෝ ඉටුකළ සේවා සම්බන්ධයෙන් කොමිස් මුදලක් හෝ ගාස්තුවක් ලබා ගන්නා යම් තැනැත්තෙකුගේ වෙළඳ ව්‍යාපාරය හෝ ස්වාධීන කොන්ත්‍රාත්කරුවකුගේ ව්‍යාපාරය ඇතුළත්වන නමුත්, භාණ්ඩ බඩු හෝ ද්‍රව්‍ය පෞද්ගලික පොළක විකිණීමේ රක්ෂාව හෝ රාජ්‍ය අරමුදලින් ප්‍රදානයක් ගෙවනු ලබන්නා වූ හෝ කලින් එවැනි ප්‍රදානයක් ගෙවන ලද නමුදු දැනට ගෙවනු නොලබන්නා වූ යම් අධ්‍යාපනික ආයතනයක් හෝ පාසලක් පවත්වාගෙන යාමේ රක්ෂාව ඊට ඇතුලත් නොවේ; තව ද,

(ආ) යම් ව්‍යාපාරයක් සම්බන්ධයෙන් වූ ''ආදායම්'' යන්නෙන් එම වෙළඳ ව්‍යාපාරය සම්බන්ධයෙන් ඇතුළත් වූ ගණුදෙනුවලින් හෝ එම ව්‍යාපාරය පවත්වාගෙන යාමෙහි ලා ඉටු කළ සේවය සඳහා ලැබුණු හෝ ලැබිය යුතු මුළු මුදල අදහස්වන අතර, ඊට මේවා ද ඇතුළත් වේ.

(i) මුදල දෙන්නෙකු, මුදල් ණයට දෙන්නකු හෝ බඩු උකස් ගන්නෙකු සම්බන්ධයෙන් වන අවස්ථාවක ණය වශයෙන්

ඔහු විසින් දෙන ලද මුදල්, ඒ ණය සඳහා ඔහුට ලැබුණු හෝ ලැබිය යුතු පොළිය සහ ඒ ණය සම්බන්ධයෙන් ගාස්තු හෝ වෙනත් අය කිරීම් වශයෙන් ඔහුට ලැබුණු මුදල්,

(ii) වෙන්දේසිකරුවෙකු සම්බන්ධයෙන් වන විට සහ (iii) ඡේදයේ විධිවිධානවලට යටත්ව තැරැව්කරුවෙකු හෝ කොමිස් නියෝජිතයෙකු සම්බන්ධයෙන් වන අවස්ථාවක -

(අ) ඔහු විසින් විකුණන ලද ඉඩම් හෝ ඔහු විසින් හේතු කාරක වූ විකිණීම සම්බන්ධයෙන් වූ විට, ඒ විකිණීම සම්බන්ධයෙන් ඔහු විසින් ක්‍රියාත්මක කරන ගණුදෙනු හා ඉටු කරන ලද සේවා සඳහා ඔහුට ලැබුණු හෝ ලැබිය යුතු හෝ කොමිස් මුදල් හා සේවා ගාස්තු,

(ආ) ඔහු විසින් විකුණන ලද යම් බඩු හෝ ඔහු විසින් හේතු කාරක වූ විකිණීම සම්බන්ධයෙන් වූ විට, ඒ බඩු ගැණුම්කරුවන් විසින් ගෙවන ලද හෝ ගෙවිය යුතු මුළු මුදල,

(iii) (අ) ශ්‍රී ලංකාවේ නේවාසිකයෙකු නොවන, යම් තැනැත්තෙකු වෙනුවෙන්, ඒ අනේවාසික තැනැත්තාගේ යම් බඩු විකුණන හෝ විකිණීමෙහිලා හේතුකාරක වන්නා වූ ,

(ආ) ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත යම් බඩු අපනයන කරන්නකු වෙනුවෙන් ක්‍රියා කරන්නා වූ, හෝ

(ඇ) ශ්‍රී ලංකාවේ ව්‍යාපාරයක් පවත්වා ගෙන යන වෙනත් යම් තැනැත්තෙකු වෙනුවෙන්, යම් බඩු විකිණීමෙන් ලත් මුදල ඒ වෙනත් තැනැත්තාගේ වෙළඳ ව්‍යාපාරයේ ආදායමට ඇතුළත් කරනු ලැබූ ඒ වෙනත් තැනැත්තාගේ ඒ බඩු ශ්‍රී ලංකාවේ විකිණීමෙහිලා හේතු කාරක වන්නා වූ,

යම් තැරැව්කරුවෙක් හෝ කොමිස් නියෝජිතයෙකු සම්බන්ධයෙන්වන අවස්ථාවක, එසේ විකිණීමෙහි, ක්‍රියා කිරීමෙහිලා හෝ එසේ විකිණීම සඳහා හේතු කාරක වීමෙහිලා ඒ තැරැව්කරු හෝ කොමිස් නියෝජිතයා විසින් ක්‍රියාත්මක කරන ලද යම් ගණුදෙනු හෝ ඉටු කරන ලද සේවා සම්බන්ධයෙන් ඔහුට ලැබුණු හෝ ලැබිය යුතු කොමිස් හෝ ගාස්තු සහ කොටස් තැරැව්කරුවෙකු හෝ නිෂ්පාදන තැරැව්කරුවෙකු සම්බන්ධයෙන්වන අවස්ථාවක ඒ තැරැව්කරු හෝ කොමිස් නියෝජිතයා විසින් ක්‍රියාත්මක කරන ලද යම් ගණුදෙනු හෝ ඉටුකරන ලද සේවා සම්බන්ධයෙන් ඔහුට ලැබුණු හෝ ලැබිය යුතු කොමිස් මුදල් හෝ ගාස්තු; සහ

(iv) යම් අධ්‍යාපනික ආයතනයක් හෝ පාසලක් පවත්වාගෙන යන යම් තැනැත්තෙකු සම්බන්ධයෙන්වන අවස්ථාවක ඒ අධ්‍යාපනික ආයතනය හෝ පාසැල හෝ සතු මුදල් ආයෝජන කිරීමෙන් ලැබුණු ලාභ අතහැර එම අධ්‍යාපනික ආයතන හෝ පාසල් පවත්වාගෙන යෑමෙන් ඒ තැනැත්තාට ලැබුණු හෝ ලැබීමට ඇති මුළු මුදල අදහස් වන නමුත් ප්‍රාග්ධනය වත්කම් විකිණීමෙන් ලැබුණු හෝ ලැබිය යුතු යම් මුදලක් ඊට ඇතුළත් නොවේ.

11 - 478/1

තණමල්විල ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා කර්මාන්ත බද්ද පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 9 (3) වගන්තිවලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව තණමල්විල ප්‍රාදේශීය සභාව විසින් 2023 වර්ෂයේ 2023/09/12/208 වන කළමණාකරන කමිටු තීරණ අංකය පරිදි පහත දක්වන යෝජනාව සම්මත කරන ලද බව මහජනතාවට මෙයින් නිවේදනය කරනු ලැබේ.

ලක්ෂ්මන් අබේකෝන්,
ලේකම්,
ප්‍රාදේශීය සභාව,
තණමල්විල.

2023 සැප්තැම්බර් මස 27 වැනි දින,
ප්‍රාදේශීය සභාව,
තණමල්විල.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වගන්තිය සමග කියවිය යුතු 150 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර තණමල්විල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත කරගෙන යනු ලබන පහත උපලේඛනයේ I වැනි තීරුවේ සඳහන් එක් එක් කර්මාන්තය වෙනුවෙන් එම උපලේඛනයේ II වන තීරුවේ ඒ එක් එක් කර්මාන්තය පවත්වාගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකම අනුරූප තීරුවේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දට යටත් තැනැත්තෙකු 2024 වර්ෂයේ මාර්තු මස 31 වන දිනට පෙර තණමල්විල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට තීරණය කරමි.

උපලේඛන අංක 1

අනු. අංකය	*කර්මාන්තයේ ස්වභාවය*	*I වැනි තීරුව*	*II වැනි තීරුව ස්ථානයේ වාර්ෂික වටිනාකම*	
		රු. 750 නොඉක්මවන අවස්ථාවක	*රු. 751 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,501 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
01.	මුද්‍රණාලයක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
02.	ශීතකරණ හා වායු සමීකරණ අළුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
03.	කම්මලක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
04.	වෙල්ඩින් වැඩපලක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
05.	ලියවන පට්ටලයක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
06.	ඇඟළුම් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
07.	උක් ඇඹරුම් හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
08.	කොහු ආශ්‍රිත ද්‍රව්‍ය නිෂ්පාදන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

11 - 478/2

තණමල්විල ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා බලපත්‍ර ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 9 (3) වගන්තිවලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව තණමල්විල ප්‍රාදේශීය සභාව විසින් 2023 වර්ෂයේ 2023/09/12/208 වන කළමනාකරණ කමිටු තීරණ අංකය පරිදි පහත දක්වන යෝජනාව සම්මත කරන ලද බව මහජනතාවට මෙයින් නිවේදනය කරනු ලැබේ.

ලක්ෂ්මන් අබේකෝන්,
ලේකම්,
ප්‍රාදේශීය සභාව,
තණමල්විල.

2023 සැප්තැම්බර් මස 27 වැනි දින,
ප්‍රාදේශීය සභාව,
තණමල්විල.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වැනි වගන්තිය සමග කියවිය යුතු 149 වැනි වගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර එකී පනතේ හෝ එකී පනත යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විස්තර කර ඇති මෙහි පහත උපලේඛනයේ I වැනි තීරුවේ නිරූපිත යම් කාර්යයක් සඳහා තණමල්විල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක් පාවිච්චි කිරීමට බලය

දෙමින් 2024 වර්ෂයේ නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් සම්බන්ධයෙන් එම උපලේඛනයේ II වන තීරුවේ අනුරූප සටහනේ නිරූපිත බලපත්‍ර ගාස්තුවක් පනවා අය කිරීමටත්,

එකී උපලේඛනයේ සඳහන් කර්මාන්තය 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතේ කාර්ය සඳහා ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ඇත්තා වූ හෝ ඒ මණ්ඩලය විසින් අනුමත කරනු ලැබූ හෝ පිළිගනු ලැබ ඇත්තා වූ වන අවස්ථාවක ඉහත දෙවන කොටසේ කුමක් සඳහන්ව තිබුණ ද ඒ හෝටලය හෝ ආපන ශාලාව හෝ නවාතැන් පොළ හෝ පවත්වාගෙන යනු ලබන ස්ථානය සඳහා සභාපතිවරයා විසින් නිකුත් කරනු ලබන බලපත්‍රයක් මත ගෙවිය යුතු ගාස්තුව ඒ හෝටලයේ හෝ ආපන ශාලාවේ හෝ නවාතැන් පොළෙහි හෝ 2023 වර්ෂය තුළ ලැබීම් වලින් සියයට එකක් (1%) විය යුතු බවට තීරණය කරමි.

උපලේඛන අංක 1

I වැනි තීරය		*II වැනි තීරය* *ස්ථානයේ වාර්ෂික වටිනාකම*		
අනු. අංකය	*ව්‍යාපාරයේ ස්වභාවය*	*රු. 750 නොඉක්මවන අවස්ථාවක*	*රු. 751 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,501 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
01.	ලැගුම් නිවාසයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
02.	හෝටලයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
03.	බත්කඩ ආපනශාලා සහ තේ හෝ කෝපි විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
04.	බේකරියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
05.	කිරි පට්ටි හා කිරි වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
06.	ආහාර වර්ග විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
07.	මාළු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
08.	මස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
09.	ලොන්ඩ්‍රියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
10.	කොණ්ඩා සැකසුම් සැලුන්හලක් සහ බාබර් සාප්පුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
11.	සංචාරක වෙළෙන්දෝ	500 0	750 0	1,000 0
12.	ගව ගාලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

අප්‍රසන්න හා අන්තරාදායක වෙළඳාම

උපලේඛන අංක (2)

01.	ගල් කොරියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
02.	කළු ගල් ඇඹරීම, යන්ත්‍රානුසාරයෙන් මෝලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
03.	කළුගල් කැඩීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
04.	ගෑස් සිලින්ඩර් ගබඩාකර විකිණීම	500 0	750 0	1,000 0
05.	ටින්කර් හා ස්ප්‍රේ පේන්ට් කිරීම	500 0	750 0	1,000 0
06.	ෆයිබර් ග්ලාස් වැඩපලක්	500 0	750 0	1,000 0
07.	වඩුමඩුවක් පවත්වාගෙන යාම සඳහා (යාන්ත්‍රික නොවන)	500 0	750 0	1,000 0

	I වැනි තීරය	II වැනි තීරය ස්ථානයේ වාර්ෂික වටිනාකම		
අනු. අංකය	ව්‍යාපාරයේ ස්වභාවය	රු. 750 නොඉක්මවන අවස්ථාවක	රු. 751 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක	රු. 1,501 ඉක්මවන අවස්ථාවක
		රු. ශත	රු. ශත	රු. ශත
08.	යාන්ත්‍රික වඩුමඩුවක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
09.	ටයර් ටියුබ් අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
10.	ජංගම අයිස්ක්‍රීම් අලෙවිකරුවන්	500 0	750 0	1,000 0
11.	ගඩොල් පෝරණුවක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
12.	පිරිපහදු ජලය අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
13.	තුනපහ ඇඹරුම් හලක් පවත්වාගෙන යාම අශ්ව බල 1සිට 10 දක්වා	500 0	750 0	1,000 0
14.	කොන්ක්‍රීට් ආශ්‍රිත නිෂ්පාදන වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
15.	පළතුරු කඩයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
16.	මෝටර් රථ අලුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
17.	යකඩ ආශ්‍රිත නිෂ්පාදනයන් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
18.	වී මෝලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
19.	ධාන්‍ය ඇඹරුම්හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
20.	අවමංගල්‍ය සේවා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
21.	සිමෙන්ති ආශ්‍රිත කොන්ක්‍රීට් නිෂ්පාදන සඳහා	500 0	750 0	1,000 0
22.	වාහන සේවා කිරීමේ ස්ථානයක් සඳහා	500 0	750 0	1,000 0
23.	කොප්පරා ඇඹරුම් කිරීමේ ස්ථානයක් සඳහා	500 0	750 0	1,000 0
24.	සත්ත්ව ගොවිපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
25.	කාබනික පොහොර නිෂ්පාදන හා අලෙවි ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
26.	මෙම පනත යටතේ බලපත්‍ර ලබාගත යුතු සංචාරක වෙළඳාමක් සඳහා	500 0	750 0	1,000 0
27.	බිම්මල් වගා කිරීමේ හා අලෙවි කිරීමේ ස්ථානයක්	500 0	750 0	1,000 0
28.	සරුවත් පැණි බීම අලෙවිසැල්	500 0	750 0	1,000 0
29.	මිරිස් කුළුබඩු සහල් ධාන්‍ය වර්ග ඇතුළු ආහාර ද්‍රව්‍ය ඇසුරුම් ස්ථානයක්	500 0	750 0	1,000 0
30.	කෘෂි රසායන ද්‍රව්‍ය පොහොර අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
31.	විසිතුරු කෘෂි බෝග, දැවමය පැළ තවාන් කිරීම සහ අලෙවි ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
32.	සාත්තු සේවා සැපයීමේ ඒජන්සි හෝ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

11 - 478/3

තණමල්විල ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා සැලසුම් හා සංවර්ධන කටයුතු සඳහා ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 9 (3) වගන්තිවලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව තණමල්විල ප්‍රාදේශීය සභාව විසින් 2023 වර්ෂයේ 2023/09/12/208 වන කළමනාකරණ කමිටු තීරණ අංකය පරිදි පහත දැක්වන යෝජනාව සම්මත කරන ලද බව මහජනතාවට මෙයින් නිවේදනය කරනු ලැබේ.

ලක්ෂ්මන් අබේකෝන්,
ලේකම්,
ප්‍රාදේශීය සභාව,
තණමල්විල.

2023 සැප්තැම්බර් මස 27 වැනි දින,
ප්‍රාදේශීය සභාව,
තණමල්විල.

යෝජනාව

1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරී පනතේ සහ එහි සශෝධනයන්හි ඇතුළත් 2021/07/08 දිනැති අති විශෙෂ *ගැසට්* පත්‍රයේ සඳහන් පරිදි තණමල්විල ප්‍රාදේශීය සභාව තුළ සැලසුම් හා සංවර්ධන ගාස්තු පහත සඳහන් පරිදි අයකිරීමට තීරණය කරමි.

1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරී පනතේ සහ එහි සංශෝධනයන්හි ඇතුළත් 2021.07.08 දිනැති අති විශේෂ *ගැසට්* පත්‍රයේ සඳහන් පරිදි තණමල්විල ප්‍රාදේශීය සභාව තුළ ගොඩනැගිල්ල සැලසුම් ඉඩම් අනුබෙදුම් අනුමත කිරීමේ ගාස්තු.

1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරී පනත යටතේ අය කරන ඉඩම් අනුබෙදුම් හා පෙරසැරි ගාස්තු පැනවීම.

වර්ග මීටර් ගණන	*එක් කොටසක මිල (රු.)*
150 - 300	500.00
301 - 600	400.00
601 - 900	300.00
901 වැඩි	200.00

පෙරසැරි ගාස්තු +-* ගොඩනැගිලි	රු.	රු.
වර්ග අඩි 485 අඩු	500.00	1000.00
485 - 970	1500.00	2000.00
970 - 1940	2500.00	3000.00
1940 - 2910	3500.00	4000.00
2910 - 4842	4500.00	6000.00
4842 - 7263	5500.00	8000.00
7263 - 9684	6500.00	10,000.00
9684 - 13181	7500.00	12,000.00
13181 වැඩි	7500.00	12,000.00
	වර්ග අඩි 13192 ඉක්මවීමෙන් පසු සෑම වර්ග අඩි 969 කටම රු. 1000.00 බැගින්	වර්ග අඩි 13192 ඉක්මවීමෙන් පසු සෑම වර්ග අඩි 969 කටම රු. 1250.00 බැගින්

11 - 478/4

තණමල්විල ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා වාහන හා සතුන් පිළිබඳව බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 9 (3) වගන්තිවලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව තණමල්විල ප්‍රාදේශීය සභාව විසින් 2023 වර්ෂයේ 2023/09/12/208 වන කළමනාකරණ කමිටු තීරණ අංකය පරිදි පහත දැක්වෙන යෝජනාව සම්මත කරන ලද බව මහජනතාවට මෙයින් නිවේදනය කරනු ලැබේ.

ලක්ෂ්මන් අබේකෝන්,
ලේකම්,
ප්‍රාදේශීය සභාව,
තණමල්විල.

2023 සැප්තැම්බර් මස 27 වැනි දින,
ප්‍රාදේශීය සභාව,
තණමල්විල.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වැනි වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 148 වැනි වගන්තියේ විධිවිධානවලින් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර තණමල්විල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2024 වර්ෂයේ දී පහත උපලේඛනයේ I වැනි තීරුවේ සඳහන් කිසියම් වාහනයක් හෝ සතෙකු සන්තකයේ තබා ගන්නා සෑම තැනැත්තෙකු මතම එකී II වැනි තීරුවේ අනුරූපිත සටහනෙහි නිරූපිත බද්දක් 2024 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්, මෙම බද්ද තණමල්විල ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතු බවට තීරණය කරමි.

උපලේඛනය

අනු අංකය	*I තීරුව*	*II තීරුව*
		රු. ශත
01.	මෝටර් රථයක්, මෝටර් ට්‍රයිකාරයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, ජින් රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා	රු. 25 0
02.	සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් බයිසිකල් කාරයක් හෝ බයිසිකල් කරත්තයක් සඳහා	
	(i) වෙළඳ කාර්යයන් සඳහා යොදවන්නේ නම්	රු. 18 0
	(ii) වෙළඳ නොවන කාර්යයන් සඳහා යොදවන්නේ නම්	4 0
03.	සෑම කරත්තයක් සඳහා	රු. 20 0
04.	සෑම අත් කරත්තයක් සඳහා	රු. 10 0
05.	සෑම අශ්වයෙකු, පෝනියෙකු හෝ කොටළුවෙකු සඳහා	රු. 15 0
06.	සෑම ඇතෙකු සඳහා	රු. 50 0

11 - 478/5

තණමල්විල ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා ප්‍රචාරක දැන්වීම් පුවරු ගාස්තු අය කිරීම - (දෘෂ්‍ය පරිසර)

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 9 (3) වගන්තිවලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව තණමල්විල ප්‍රාදේශීය සභාව විසින් 2023 වර්ෂයේ 2023/09/12/208 වන කළමනාකරණ කමිටු තීරණ අංකය පරිදි පහත දැක්වෙන යෝජනාව සම්මත කරන ලද බව මහජනතාවට මෙයින් නිවේදනය කරනු ලැබේ.

ලක්ෂ්මන් අබේකෝන්,
ලේකම්,
ප්‍රාදේශීය සභාව,
තණමල්විල.

2023 සැප්තැම්බර් මස 27 වැනි දින,
ප්‍රාදේශීය සභාව,
තණමල්විල.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122(1) වැනි උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව 1988.08.23 වන දින අංක 520/7 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළාත් පාලන විෂය භාර ගරු ඇමතිතුමා විසින් අනුමත කොට ප්‍රකාශයට පත්කර ඇති හා 2003.03.24 දින අංක හා දින දරන *ගැසට්* පත්‍රය මගින් තණමල්විල ප්‍රාදේශීය සභාව විසින් පනවා ක්‍රියාත්මක කරන ලද සම්මත අතුරු ව්‍යවස්ථාවේ 39 වන ඡේදය යටතේ ප්‍රචාරක දැන්වීම් දෘෂ්‍ය පරිසරය අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාර තණමල්විල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කුමන ආකාරයක හෝ ප්‍රචාරක දැන්වීම්, බැනර් ආදිය ඉදිකිරීම හා ප්‍රදර්ශනය කිරීම වෙනුවෙන් පහත උපලේඛනයේ දැක්වෙන ගාස්තු ප්‍රමාණයන් 2024.01.01 වන දින සිට පනවා අය කිරීමට තීරණය කරමි.

බලපත්‍ර ගාස්තු

අනු. අංකය	*විස්තරය*	*මුදල රු. ශ.*
01.	පොදු ප්‍රදර්ශන පුවරුවක කරනු ලබන ඕනෑම ප්‍රචාරක දැන්වීමක් සඳහා වර්ග අඩියකට (මාසයක් හෝ ඉන් කොටසක්)	15.00
02.	ලෑල්ලක් ආධාරයෙන් හෝ බැනරයක් මගින් ප්‍රදර්ශනය කරනු ලබන චිත්‍රපට ප්‍රදර්ශනයක් හෝ වේදිකා නාට්‍ය හැර) ඕනෑම ප්‍රචාරක දැන්වීමක් සඳහා මසකට වර්ග අඩියකට	25.00
03.	චිත්‍රපට පෙන්වීමට සම්බන්ධ එක් ප්‍රචාරක දැන්වීමක් හෝ බැනරයක් සඳහා මසකට වර්ග අඩියකට	10.00
04.	වර්ෂයකට විදුලි බුබුළු සවි කළ වෙළඳ ප්‍රචාරක පුවරු සඳහා වර්ග අඩියකට	250.00
05.	වර්ෂයකට තහඩුවලින් නිම වූ පුවරු සඳහා වර්ග අඩියකට	100.00
06.	වර්ෂයකට ඩිජිටල් මුද්‍රණය කළ පුවරු සඳහා වර්ග අඩියකට	110.00
07.	මාස 06 කට වැඩි රෙදි වලින් නිම වූ ප්‍රචාරක පුවරු සඳහා වර්ග අඩියකට	75.00
08.	මාස 06 කට අඩු රෙදිවලින් නිම වූ ප්‍රචාරක පුවරු සඳහා වර්ග අඩියකට	50.00

11 - 478/6

තණමල්විල ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සේවාවන් සඳහා

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 9 (3) වගන්තිවලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව තණමල්විල ප්‍රාදේශීය සභාව විසින් 2023 වර්ෂයේ 2023/09/12/208 වන කළමනාකරණ කමිටු තීරණ අංකය පරිදි පහත දැක්වෙන යෝජනාව සම්මත කරන ලද බව මහජනතාවට මෙයින් නිවේදනය කරනු ලැබේ.

ලක්ෂ්මන් අබේකෝන්,
ලේකම්,
ප්‍රාදේශීය සභාව,
තණමල්විල.

2023 සැප්තැම්බර් මස 27 වැනි දින,
ප්‍රාදේශීය සභාව,
තණමල්විල.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ කාර්ය කර්තව්‍ය ඉටු කිරීම හා බලතල ක්‍රියාත්මක කිරීමේදී තණමල්විල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ප්‍රජාවට පහත සඳහන් සේවාවන් ලබා දීමේදී, (I) වන තීරුවේ සඳහන් සේවාවන් ලබාදීම වෙනුවෙන් (II) වන තීරුවේ සඳහන් ගාස්තුවක් අය කළ බවට තීරණය කරමි.

අනු. අංකය	*I වැනි තීරුව*	*II වැනි තීරුව*
01	වීථිරේඛා හා නොපවරා ගැනීමේ සහතිකයන් නිකුත් කිරීමේ ගාස්තු	රු. 1,000.00
02	ගොඩනැගිලි අයදුම්පතක් නිකුත් කිරීමේ ගාස්තු	රු. 1,000.00
03	ඉඩම් අනුබෙදුම් අයදුම්පත්‍ර නිකුත් කිරීමේ ගාස්තු	රු. 1,000.00

අනු. අංකය	*I වැනි තීරුව*	*II වැනි තීරුව*
04	අනුකූලතා සහතිකය නිකුත් කිරීමේ ගාස්තු	රු. 1,000.00
05	වාහන සේවා සැපයීමේ දී ජල බවුසර් සේවා සැපයීමේ දී	
•	ජල බවුසරයක් ජලය රහිතව ලබා දීම සඳහා (ප්‍රවාහනය සහා ට්‍රැක්ටරය මගින් සිදුකරන විටදී දුර ප්‍රමාණය මත ප්‍රවාහනය සඳහා පළමු කි. මී. 02 සඳහා 500.00 ද, ඊළඟ කි. මී. 1 සිට කි. මී. එකක් සඳහා රු. 250.00 බැගින් වෙනම මුදල් ගෙවිය යුතුය.)	රු. 1,000.00 (හා අමතර මුදල්)
•	ජලය සහිත බවුසරයක් ලබා දීමේ දී (ප්‍රවාහනය සඳහා පළමු කි. මී. 02 සඳහා රු. 500.00 ද, ඊළඟ කි. මී. 1 සිට කි. මී. එකක් සඳහා රු. 250.00 බැගින් වෙනම මුදල් ගෙවිය යුතුය.)	රු. 3,000.00 (හා අමතර මුදල)
•	සේවා සඳහා ජල බවුසරය රැගෙන ගොස් නවතා තබා ගැනීම සඳහා දිනකට ගාස්තු	රු. 750.00
•	ගල් තලන යන්ත්‍රය සඳහා පැයකට ගාස්තු	රු. 5,000.00
•	ගල් තලන යන්ත්‍රය සේවා සඳහා රැගෙන ගොස් රඳවා තබා ගන්නා අවස්ථාවක දිනකට ගාස්තුව	රු. 2,000.00
•	ටිපර් රථය කුලියට ලබා දීමේදී ගාස්තුව පැයකට (කි.මීටර් ගණනට අය වීමේදී පළමු කි. මී. 02 සඳහා රුපියල් 1,000.00 ද ඊළඟ කි. මී. 01 සිට රුපියල් 250.00 බැගින්)	රු. 3,200.00
•	මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය කුලියට ලබා දීමේ දී ගාස්තු පැයකට	රු. 8,000.00 රු. 7,500.00
•	මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය කුලියට ලබා ගෙන රඳවා තබා ගැනීමක දී දිනකට ගාස්තු	රු. 2,000.00
•	ගලි සේවා සැපයීම (එක් සේවා වාරයක් සඳහා)	
•	ගලි බවුසරය සඳහා ගාස්තුව	රු. 6,000.00
•	යන්ත්‍ර ක්‍රියාකරුවන්ට (තුන් දෙනා සඳහා)	රු. 1,000.00
•	බැහැර කිරීම සඳහා ස්ථානීය ගාස්තු	රු. 500.00
•	ප්‍රවාහනයට ට්‍රැක්ටර් රථය සඳහා ගාස්තු කි. මී. 01 ක් සඳහා	රු. 150.00
06.	වෙළඳ කටයුත්තක් සඳහා බිම ලබා දීමේදී	
•	තාවකාලික වෙළඳ කුටියක් සඳහා දිනකට ගාස්තු	වර්ග අඩියක් රු. 80.00
•	ප්‍රාදේශීය සභා භූමිය, සතිපොළ භූමියෙන් කොටසක්, බස් නැවතුම් පොළ ඉදිරිපිට, තැපැල් කාර්යාලය ඉදිරිපිට පොදු ක්‍රීඩාංගනය ඉදිරිපිට සහා බල ප්‍රදේශයේ මාර්ග රක්ෂිත භූමියක වෙළඳ ප්‍රචාරණ කටයුත්තක් සඳහා වෙළඳ බදු දිනකට	රු. 4,000.00

අනු. අංකය	*I වැනි තීරුව*	*II වැනි තීරුව*
•	පොදු ක්‍රීඩාංගනය දිනකට වෙන් කිරීම සඳහා	රු. 5,000.00
•	**මහවැලි සංස්කෘතික මධ්‍යස්ථානය වෙන් කිරීමේ දී දිනක ගාස්තු :**	
•	රාජ්‍ය ආයතන සඳහා	රු. 10,000.00
	වෙනත් ආයතන හෝ සංගමයන් සඳහා	රු. 20,000.00
07.	**රථ ගාල්/රථ සංගම් ලියාපදිංචි ගාස්තු :**	
•	ජීප් රථ, වෑන් රථ, ත්‍රිරෝද සංගමයක් ලියාපදිංචි කිරීමේ දී ගාස්තුව	රු. 5,000.00
•	ජීප් රථ, වෑන් රථ, ත්‍රිරෝද වාර්ෂික රථගාල් ගාල් කිරීමේ ගාස්තුව එක් රථයකින්	රු. 2,000.00
08.	**මාර්ග භාවිතයන්වලදී :**	
•	මාර්ග පළුදු කිරීමක දී (බොරළු මාර්ග හා කොන්ක්‍රීට්)	රු. 50,000.00
	කාපට්, තාර, කුට්ටිගල්, කොන්ක්‍රීට් ඇතිරූ මාර්ග සඳහා ඒ අවස්ථාවේ තක්සේරු කරන ලද තැන්පතු මුදල්	පළාත් මාර්ග අධිකාරියේ තක්සේරුව මත
•	පස්, ගල්, බොරළු, වැලි හෝ වෙනත් ද්‍රව්‍ය ප්‍රවාහනයේ දී ඇප තැන්පතු ගාස්තු	200,000.00
	කාපට්, තාර, කුට්ටිගල්, කොන්ක්‍රීට් ඇතිරූ මාර්ග සඳහා ඒ අවස්ථාවේ තක්සේරු කරන ලද තැන්පතු මුදල්	ඉල්ලීම් කරන අවස්ථාවේ මාර්ග පරීක්ෂක තක්සේරුව මත
•	අනුමත වන සෑම ප්‍රවාහන බලපත්‍රයක් සඳහා කියුබ් 01කට මාසිකව	රු. 100.00
•	දීර්ඝ කාලීන බදු පදනම මත ඉඩම් ලබා දීමේදී අනුමත කිරීම සඳහා ගාස්තු	
	ඉල්ලුම් පත්‍ර ගාස්තුව	රු. 100.00
	ප්‍රදේශයෙන් පිටත ඉල්ලුම්කරුවෙකු වන විටදී පෙරසැරි ගාස්තු :	
	දේපළ සඳහා ප්‍රවේශ දුර කි. මී. 0 - 20 විටදී	රු. 5,000.00
	කි. මී. 20 - 40 වන විට දී	රු. 10,000.00
	කි. මී. 40 - 60 වන විට දී	රු. 15,000.00
	කි. මී. 60 වැඩි වන විට දී	රු. 50,000.00
	බල ප්‍රදේශයේ ඉල්ලුම්කරුවකු වන විටදී පෙරසැරි ගාස්තුව	
	කි. මී. 0 - 20 වන විටදී	-
	කි. මී. 20 - 40 වන විට දී	-
	කි. මී. 40 - 60 වන විට දී	රු. 5,000.00
	කි. මී. 60 වැඩි වන විට දී	රු. 10,000.00
	සභා පෙර පාසල සඳහා ළමුන් ඇතුළත් කිරීමේ ඉල්ලුම්පත්‍ර ගාස්තු	රු. 100.00

අනු. අංකය	*I වැනි තීරුව*	*II වැනි තීරුව*
	පෙර පාසල් සඳහා ළමුන් ලියා පදිංචි කිරීමේ ඉල්ලුම්පත්‍ර ගාස්තු :	
	මහවැව ආදර්ශ පෙර පාසල	රු. 1,000.00
	සිනුක්කුව ජයමග පෙර පාසල	රු. 1,000.00
		1,300 0		වැඩිවන සෑම පැයක් සඳහා
ලොරි බවුසරය LL-7356	3.5	8,000 0	FX5/3	පළමු කි. මී. 05 ඇතුළත
		8,500 0	FX5/3	කි. මී. 6-10 දක්වා
		9,000 0	FX5/3	කි. මී. 11-15 දක්වා
		9,500 0	FX5/3	කි. මී. 16-20 දක්වා
		500 0	FX1/3	කි. මී. 21 සිට වැඩිවන සෑම කි. මී. 01 ක් සඳහා
		100 0		නවතා තැබීමේ ගාස්තු (පැය 01 ක් සඳහා)
		200 0		නවතා තැබීම් පැය 08 ට වැඩි වන විට
ලොරි බවුසරය LL-7356 (ජලය සහිතව)		12,000 0		පැය 08 ක් සඳහා (ඉන්ධන රහිතව)
		12,000 0	FX1/3	ඉන්ධන සහිතව (කි. මී. 01 ක් සඳහා)
		1,400 0		වැඩිවන සෑම පැයක් සඳහා

		ස්ථාවර ගාස්තු *රු.*	විචල්‍ය ගාස්තු	
ජලය බෙදා හැරීම	3.5	1,000 0		1,000 L සඳහා
ලොරි බවුසරය LL-7356 (ජලය රහිතව)		7,500 0		පැය 08 ක් සඳහා (ඉන්ධන රහිතව)
		7,500 0	FX1/3	ඉන්ධන සහිතව (කි. මී. 01 ක් සඳහා)
		1,250 0		වැඩිවන සෑම පැයක් සඳහා
බැකෝ යන්ත්‍රය ZA - 5202	5.5	48,000 0	(F-400.00) X8X5.5	පැය 08 ක් සඳහා
		6,000 0	(F-400.00) X5.5	යන්ත්‍ර පැය 01 ක් සඳහා
		1,500 0		එක් ගමන් වාරයක් සඳහා
ට්‍රැක්ටර් බවුසරය		4,500 0	FX2	පළමු කි. මී. 05 ඇතුළත
(ජලය සමග)		5,000 0	FX2	කි. මී. 6-10 දක්වා
		5,500 0	FX2	කි. මී. 11-15 දක්වා
		400 0	FX2/5	කි. මී. 16 සිට වැඩිවන සෑම කි. මී. 01 ක් සඳහා
		100 0		නවතා තැබීමේ ගාස්තු (පැය 01 ක් සඳහා)
		200 0		නවතා තැබීමේ පැය 08 ට වැඩි වන විට
ට්‍රැක්ටර් බවුසරය ජලය රහිතව		3,000 0		පැය 08ක් සඳහා (ඉන්ධන රහිතව)
		3,000 0 300 0	FX2	ඉන්ධන සහිතව (පැය 08 ක් සඳහා) වැඩිවන සෑම පැයක් සඳහා

**F - ඉන්ධන මිල

**සභාව සතු බැකෝ යන්ත්‍රය (ZA - 5202) කුළියට ලබා ගැනීමේදී F හි අවම අගය රු. 400.00 ලෙස සැලකිය යුතු අතර, අනෙකුත් වාහන කුළියට ලබා ගැනීමේ දී එය නොසලකනු ලැබේ.

උපකරණ, ක්‍රීඩාපිටිය හා ගොඩනැගිලි කුළියට දීම සඳහා ගාස්තු පැනවීම

උපලේඛනය

	ගාස්තුව (රු.)
සභා ශාලාවේ ශබ්ද වාහිනී යන්ත්‍රය (පැය 08 කට)	3,000 0
අතිරේක පැයකට	100 0
කොන්ක්‍රීට් නියැදි පරීක්ෂක ඝනක අච්චු 1ක් සඳහා දින 03 කට	500 0
ප්‍රමාද ගාස්තු අතිරේක දිනකට	50 0
සභා ශාලාව (පැය 08 කට)	4,000 0
අතිරේක පැයකට	100 0
කඩ කාමර 1ක් සඳහා (මාසිකව)	5,000 0 - 10,000 0
ක්‍රීඩා පිටිය (දිනකට)	3,000 0
පෙර පාසල් ගොඩනැගිල්ල (වර්ෂයකට)	9,000 0

යටවත්ත ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා ජල සැපයුම් සේවා සඳහා ගාස්තු පැනවීම

යටවත්ත ප්‍රාදේශීය සභාව විසින් 2023 ඔක්තෝබර් මස 18 වැනි දින පවත්වන ලද කළමනාකරණ කමිටු නිර්දේශ මත 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය ප්‍රකාරව මා වෙත පැවරී ඇති බලතල අනුව තීරණ අංක 558 යටතේ පහත දැක්වෙන තීරණය අනුමත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ආර්. සඳමාලී ලියන්ගොල්ල,
ලේකම්,
යටවත්ත ප්‍රාදේශීය සභාව.

2023 ඔක්තෝබර් මස 18 වැනි දින,
යටවත්ත ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තිය යටතේ පළාත් පාලන, නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමා විසින් සාදනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 520/7 දරන හා 1988.08.23 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* IV (ඇ) කොටසේ ගරු ඇමතිතුමා විසින් ප්‍රකාශයට පත්කර ඇති හා අංක 711 දරන හා 1992.04.15 දිනැති *ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශයට පත්කර යටවත්ත ප්‍රාදේශීය සභාව විසින් වැළඳගෙන ඇති පොදු අතුරු ව්‍යවස්ථාවේ 34 අතුරු ව්‍යවස්ථාව වන ජල සම්පාදනය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යටතේ ජල සැපයුම් සේවා වෙනුවෙන් පහත උපලේඛනයේ දැක්වෙන ආකාරයට 2024 වර්ෂය සඳහා ගාස්තු පනවා අය කළ යුතු බවට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය ප්‍රකාරව මා වෙත පැවරී ඇති බලතල අනුව තීරණය කරමි.

උපලේඛනය

විස්තරය		*ගාස්තුව රු. ශත*
නව ජල සම්බන්ධතා ගාස්තු (ගෘහ ඒකකයට)	ජල තැන්පතු ජල ඇස්තමේන්තු	5,000.00 20,000.00
නව ජල සම්බන්ධතා ඉල්ලුම් පත්‍ර		200.00
නැවත ජල සම්බන්ධතා ගාස්තු		2,000.00
අනිසි ලෙස ජලය ලබා ගැනීම, ජලනල වලට හානි කිරීම මත අය කරන දඩ ගාස්තු		5,000.00 - 30,000.00
ඒකකයක් සඳහාම	1-10	35.00
	11-15	40.00
	16-20	55.00
	21-25	90.00
	26 ට වැඩිවන සෑම ඒකකයක් සඳහාම	110.00
මාසික ස්ථාවර ගාස්තුව		150.00

යටවත්ත ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා කසළ ගාස්තු පැනවීම

යටවත්ත ප්‍රාදේශීය සභාව විසින් 2023 ඔක්තෝබර් මස 18 වැනි දින පවත්වන ලද කළමනාකරණ කමිටු නිර්දේශ මත 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය ප්‍රකාරව මා වෙත පැවරී ඇති බලතල අනුව තීරණ අංක 558 යටතේ පහත දැක්වෙන තීරණය අනුමත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ආර්. සඳමාලී ලියන්ගොල්ල,
ලේකම්,
යටවත්ත ප්‍රාදේශීය සභාව.

2023 ඔක්තෝබර් මස 18 වැනි දින,
යටවත්ත ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 (ix) උපවගන්තිය යටතේ කියවිය යුතු 122 (1) උපවගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවට බලය පැවරී සාදනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2009 දරන හා 2017.03.03 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* IV (ඇ) කොටස මගින් ප්‍රකාශයට පත්කර ඇති ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යටතේ කසල කළමනාකරණය වෙනුවෙන් පහත උපලේඛනයේ දැක්වෙන ආකාරයට 2024 වර්ෂය සඳහා ගාස්තු පනවා අය කළ යුතු බවට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය ප්‍රකාරව මා වෙත පැවරී ඇති බලතල අනුව තීරණය කරමි.

උපලේඛනය

කසළ ගාස්තු අය කිරීම (මසකට)

විස්තරය	*ගාස්තුව* *රු. ශත*
කර්මාන්ත ශාලා	3,500 0
එළවළු අලෙවිසැල්	200 0-1,000 0
ආපන ශාලා/හෝටල්	300 0-750 0
පලතුරු අලෙවිසැල්	250 0
බැංකු	300 0
සිල්ලර අලෙවිසැල්	200 0
නේවාසික හෝටල්/උත්සව ශාලා	1,000 0
ගෘහ ඒකක	200 0

හික්කඩුව නගර සභාව

2024 වර්ෂය සඳහා වරිපනම් බද්ද පැනවීම

255 වන අධිකාරය වන නගර සභා ආඥාපනතේ 166 වැනි වගන්තිය සමඟ කියවිය යුතු 252 අධිකාරිය වන මහ නගර සභා ආඥාපනතේ 238 වැනි වගන්තියේ (1) උප වගන්තියෙන් නගර සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර හික්කඩුව නගර සභා බල ප්‍රදේශය ඇතුළත සියලුම නිවාසවල, ගොඩනැගිලිවල ඉඩම්වල හා ගෙපත්වල නව තක්සේරු වාර්ෂික වටිනාකම 2024 වර්ෂයේ වාර්ෂික වටිනාකම ලෙස පිළිගැනීමටත්, එකී නගර සභා ආඥාපනතේ 160 වන වගන්තියෙන් ලැබී ඇති බලතල ප්‍රකාර ඉහත කී වාර්ෂික වටිනාකමෙන්,

(අ) නේවාසික ස්ථාන මත සියයට අටක (8%) වරිපනම් බද්දක් ද;

(ආ) වෙළඳ හෝ වාණිජ කාර්යය සඳහා පාවිච්චි කරනු ලබන ස්ථාන මත සියයකට දහයක (10%) වරිපනම් බද්දක් ද;

2024 වර්ෂය සඳහා පනවා අය කිරීමටත් සහ ඒ වරිපනම් බදු එකී නගර සභා ආඥාපනතේ 170 වන වගන්තිය සමඟ කියවිය යුතු මහනගර සභා ආඥාපනතේ 230 වගන්තියේ (2) වැනි උප වගන්තියේ (ඇ) ඡේදයේ විධිවිධාන යටතේ, එකී වර්ෂයේ මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30, දෙසැම්බර් 31 යන දිනවලින් අවසන්වන කාර්තු හතර තුළදී සමාන වාරික හතරකින් ගෙවීමට විධාන කිරීමටත්, තව ද 1979 අංක 42 දරන මහ නගර සභා හා නගර සභා (සංශෝධිත) පනතේ 12 වැනි වගන්තිය ප්‍රකාර ඉහත සඳහන් වාර්ෂික බදු මුදල් සම්පූර්ණයෙන් පහත දැක්වෙන පරිදි ගෙවූ විට එහි දැක්වෙන වට්ටම් මුදල අඩු කිරීමටත්, 255 අධිකාරිය වන නගර සභා ආඥාපනතේ 184 (අ) වගන්තිය අනුව හික්කඩුව නගර සභාවේ ලේකම් හා කාර්ය කර්තව්‍ය හා බලතල ක්‍රියාත්මක කරන නිලධාරි එම්. බී. පී. ජානකී වන මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ලේකම් තීරණ අංක 2023/10/12/293 (I) යටතේ තීරණය කළ බව මෙයින් නිවේදනය කරමි.

(අ) 2024 ජනවාරි මස 31 වැනි දින හෝ ඊට පෙර මුළු වර්ෂයට ම ගෙවිය යුතු වරිපනම් ගාස්තු ගෙවනු ලැබූ විට එම මුදලින් සියයට දහයක (10%) වට්ටම් මුදලක් ද,

(ආ) එම මුදල් කොටස් වශයෙන් ගෙවන විට වරිපනම් බදු ගෙවිය යුතු කාර්තුවේ පළමු වන මස තුළ ගෙවනු ලැබුවහොත් ඒ ගෙවන මුදලින් සියයට පහක් (5%) ද,

ඉහත සඳහන් බදු මුදල් ඒ ඒ කාර්තුවේ අවසාන දිනට හෝ ඊට පෙර ගෙවනු නොලැබුවහොත් හිඟ වරිපනම් බදු අය කර ගැනීම සඳහා නිකුත් කරනු ලබන වරෙන්තු සම්බන්ධයෙන් පහත සඳහන් වරෙන්තු ගාස්තුවක් ද අය කරනු ලැබීමටත් හික්කඩුව නගර සභාව නිවේදනය කරනු ලැබේ.

(ඇ) මුඩු ඉඩම් හෝ පදිංචි ස්ථානවලින් අයකළ යුතු බද්දෙන් සියයට පහළොවක් (15%) ද,

(ඈ) මුඩු ඉඩම් හෝ පදිංචි ස්ථාන නොවන දේපළවලින් (වාණිජ ස්ථානවලින්) අය කළ යුතු බද්දෙන් සියයට විස්සක් (20%) ද වේ.

එම්. බී. පී. ජානකී,
ලේකම්,
හික්කඩුව නගර සභාව.

11-464/1

හික්කඩුව නගර සභාව

2024 වර්ෂය සඳහා වූ ඇතැම් ඉඩම් විකිණීම පිළිබඳ බදු පැනවීම

255 වන අධිකාරය වන නගර සභා ආඥාපනතේ 165 (ඇ) වැනි වගන්තිය යටතේ හික්කඩුව නගර සභා සීමාව තුළ පිහිටි යම් ඉඩමක් වෙන්දේසිකරුවෙකු හෝ බ්‍රෝකර්වරයෙකු හෝ ඔහුගේ සේවකයෙකු හෝ අනුයෝජිතයෙකු හෝ ප්‍රසිද්ධ වෙන්දේසියේ නැතහොත් වෙනත් යම් ආකාරයකින් විකුණනු ලැබුවහොත් ඒ විකිණීමෙන් ලැබූ මුදලින් සියයට එකක (1%) සමානවන බද්දක් ඒ විකුණුම්කරු හෝ වෙන්දේසිකරු හෝ බ්‍රෝකර් හෝ ඔහුගේ සේවකයෙකු හෝ අනුයෝජිතයෙකු විසින් එසේ ඒ ඉඩම විකුණාලන ලබන මුදලින් හික්කඩුව නගර සභාවට ගෙවිය යුතු බවට 255 අධිකාරිය වන නගර සභා ආඥාපනතේ 184 (අ) වගන්තිය අනුව හික්කඩුව නගර සභාවේ ලේකම් හා කාර්ය කර්තව්‍ය හා බලතල ක්‍රියාත්මක කරන නිලධාරි එම්. බී. පී. ජානකී වන මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ලේකම් තීරණ අංක 2023/10/12/293 (II) යටතේ තීරණය කළ බව මෙයින් නිවේදනය කරමි.

එම්. බී. පී. ජානකී,
ලේකම්,
හික්කඩුව නගර සභාව.

11-464/2

හික්කඩුව නගර සභාව

2024 වර්ෂයට අදාළව බලපත්‍ර ගාස්තු පැනවීම

255 වන අධිකාරය වන නගර සභා ආඥාපනතේ 164 (1) වැනි වගන්තියෙන් නගර සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව සහ දකුණු පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ඔහු විසින් සාදනු ලැබූ හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1811 හා 2013.05.17 වැනි දිනැති *ගැසට් පත්‍රයේ* IV(ආ) කොටසේ පළ කරනු ලැබුවා වූ සම්මත අතුරු ව්‍යවස්ථාව අනුව හික්කඩුව නගර සභා බල ප්‍රදේශය ඇතුළත කරගෙන යනු ලබන පහත උපලේඛනයේ I තීරුවේ සඳහන් එක් එක් බලපත්‍රයක් වෙනුවෙන් එම උපලේඛනයේ II තීරුවේ ඒ එක් එක් ව්‍යාපාරය පවත්වාගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකමට අනුරූපී තීරුවේ නිරූපිත ප්‍රමාණයක බලපත්‍ර ගාස්තුවක් 2024 වර්ෂය සඳහා පනවා අයකළ යුතු බවටත් 255 අධිකාරිය වන නගර සභා ආඥාපනතේ 184 (අ) වගන්තිය අනුව හික්කඩුව නගර සභාවේ ලේකම් හා කාර්ය කර්තව්‍ය හා බලතල ක්‍රියාත්මක කරන නිලධාරි එම්. බී. පී. ජානකී වන මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ලේකම් තීරණ අංක 2023/10/12/293 (III) ක යටතේ තීරණය කළ බව මෙයින් නිවේදනය කරමි.

එම්. බී. පී. ජානකී,
ලේකම්,
හික්කඩුව නගර සභාව.

I වැනි උපලේඛනය

I වැනි තීරය බලපත්‍රයේ ස්වභාවය		*II* වැනි තීරය		
අනු. අංකය	*ව්‍යාපාරයේ නම*	*ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. 750ට නොවැඩි* *රු. ශත*	*ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. 751 - රු. 1,500 ට නොවැඩි* *රු. ශත*	*ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. 1,501ට වැඩි* *රු. ශත*
1.	එළවළු වෙළෙඳසැල්	500 0	750 0	1,000 0
2.	පළතුරු වෙළෙඳසැල්	500 0	750 0	1,000 0

I වැනි තීරය බලපත්‍රයේ ස්වභාවය		*II* වැනි තීරය		
අනු. අංකය	*ව්‍යාපාරයේ නම*	*ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. 750ට නොවැඩි* *රු. ශත*	*ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. 751 - රු. 1,500 ට නොවැඩි* *රු. ශත*	*ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. 1,501ට වැඩි* *රු. ශත*
3.	මස් වෙළඳාම	500 0	750 0	1,000 0
4.	මාළු වෙළෙඳාම	500 0	750 0	1,000 0
5.	සිසිල් බීම කර්මාන්තශාලා	500 0	750 0	1,000 0
6.	බාබර් සාප්පු (කොණ්ඩා කැපීමේ මධ්‍යස්ථානය)	500 0	750 0	1,000 0
7.	රූපලාවන්‍යාගාර	500 0	750 0	1,000 0
8.	බේකරියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
9.	කිරි පට්ටියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
10.	පිහිණුම් තටාකයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
11.	අයිස් කර්මාන්තශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
12.	තේ හෝ කෝපි කඩයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
13.	බත් කඩයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
14.	ආපනශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
15.	හෝටලයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
16.	නවාතැන්පොළක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
17.	ලොන්ඩ්‍රියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
18.	කර්මාන්තශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
19.	අවමංගල සේවා සැපයීමෙන් ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
20.	ජංගම වෙළඳපොළක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
21.	ඉදිකිරීමේ ද්‍රව්‍ය ආශ්‍රිත කර්මාන්ත ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
22.	ඉදිකිරීමේ ද්‍රව්‍ය ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
23.	වාහන නතර කිරීම හා වාහන හැසිරවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
24.	1968 අංක 14 දරන සංචාරක පනතේ කාර්යයන් සඳහා ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි වී ඇති ආපනශාලාවක්, ලැගුම්හලක් හෝ හෝටලයක් සඳහා අය කරනු ලබන බලපත්‍ර ගාස්තුව වනුයේ එකී ගාස්තු අයකරනු ලබන අවුරුද්දට පෙරාතුව වූ අවුරුද්දේ ආදායමට අනුව එම ආදායමෙහි 0.3% ක ගාස්තුවකි.			
25.	කළුගල්, කබොක්, බොරළු කැඩීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
26.	ආයුර්වේද සම්භාහන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
27.	කේක් වර්ග, රසකැවිලි නිෂ්පාදන සහ අලෙවිය	500 0	750 0	1,000 0
28.	එක් දින අලෙවි ප්‍රවර්ධන වැඩසටහන් සඳහා එක් දිනක් සඳහා ගාස්තුව	500 0	750 0	1,000 0
29.	යාන්ත්‍රික ලී මඩුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
30.	බිත්තර වෙළඳාම	500 0	750 0	1,000 0
31.	ශරීර පින්තාරු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
32.	රසායනික ද්‍රව්‍යය ගබඩා කිරීමේ හා බෙදාහැරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම.	500 0	750 0	1,000 0

හික්කඩුව නගර සභාව

සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි වී ඇති ආපනශාලාවක්, ලැගුම්හලක් හෝ හෝටලයක් සඳහා 0.3% බලපත්‍ර ගාස්තු අය කිරීම- 2024 වර්ෂය

පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් සාදන ලද 2013.05.17 වැනි දින අංක 1811 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* iv (ආ) කොටසේ පලකරනු ලැබූ සම්මත අතුරු ව්‍යවස්ථා 2018.06.19 වැනි දින පැවති හික්කඩුව නගර සභා රැස්වීමේ දී සභා තීරණ ඒ(6) යටතේ ක්‍රියාත්මක කිරීම සඳහා පිළිගෙන ඒ බව 2018.10.05 වැනි දින අංක 2092 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV (ආ) කොටසේ පළකල දැන්වීම තුළින් හා 255 වන අධිකාරය මත නගර සභා ආඥාපනතේ 164 (2) වැනි වගන්තියෙන් නගර සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර හික්කඩුව නගර සභා බල ප්‍රදේශය ඇතුළත කරගෙන යනු ලබන 1968 අංක 14 දරන සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි වී ඇති ආපන ශාලාවක්, ලැගුම්හලක් හෝ හෝටලයක් සඳහා අය කරනු ලබන බලපත්‍ර ගාස්තු වන්නේ එකී ගාස්තු අය කරනු ලබන අවුරුද්දට පෙරාතුව වූ අවුරුද්දේ ආදායමට අනුව එම ආදයමෙන් 0.3%ක ගාස්තුවක් 2024 වර්ෂය සඳහා පනවා අයකළ යුතු බවට 255 අධිකාරිය වන නගර සභා ආඥාපනතේ 184 (අ) වගන්තිය අනුව හික්කඩුව නගර සභාවේ ලේකම් හා කාර්ය කර්තව්‍ය හා බලතල ක්‍රියාත්මක කරන නිලධාරි එම්. බී. පී. ජානකී වන මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ලේකම් තීරණ අංක 2023/10/12/293 (IV) යටතේ තීරණය කළ බව මෙයින් නිවේදනය කරමි.

එම්. බී. පී. ජානකී,
ලේකම්,
හික්කඩුව නගර සභාව.

11-464/4

හික්කඩුව නගර සභාව

2024 වර්ෂය සඳහා කර්මාන්ත බද්ද පැනවීම

255 වැනි අධිකාරිය වන නගර සභා ආඥාපනතේ 165 (අ) (1) වැනි වගන්තියෙන් නගර සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර හික්කඩුව නගර සභා බල ප්‍රදේශය ඇතුළත කරගෙන යනු ලබන පහත උපලේඛනයේ I වැනි තීරුවේ සඳහන් එක් එක් කර්මාන්තය වෙනුවෙන් එම උපලේඛනයේ II වැනි තීරුවේ ඒ එක් කර්මාන්තය පවත්වාගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකමට අනුරූපි තීරුවේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2024 වර්ෂය සඳහා පනවා අය කළ යුතු බවට 255 අධිකාරිය වන නගර සභා ආඥාපනතේ 184 (අ) වගන්තිය අනුව හික්කඩුව නගර සභාවේ ලේකම් හා කාර්ය කර්තව්‍ය හා බලතල ක්‍රියාත්මක කරන නිලධාරි එම්. බී. පී. ජානකී වන මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ලේකම් තීරණ අංක 2023/10/12/293 (V) යටතේ තීරණය කළ බව මෙයින් නිවේදනය කරමි.

එම්. බී. පී. ජානකී,
ලේකම්,
හික්කඩුව නගර සභාව.

II වැනි උපලේඛනය

I වැනි තීරුව		*II වැනි තීරුව*		
අනු. අංකය	*ව්‍යාපාරයේ නම වෙළඳාමේ හෝ ව්‍යාපාරයේ ස්වභාවය*	*ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. 1 - 750ට නොවැඩි රු. ශත*	*ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. 751-1,500ට නොවැඩි රු. ශත*	*ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. 1,501ට වැඩි රු. ශත*
1.	ස්වර්ණාභරණ නිෂ්පාදනය කිරීමේ හෝ අලුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

අනු. අංකය	වෙළඳාමේ හෝ ව්‍යාපාරයේ ස්වභාවය	*I* වැනි තීරුව ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. 1 - 750ට නොවැඩි රු. ශත	*II* වැනි තීරුව ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. 751-1,500ට නොවැඩි රු. ශත	ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. 1,501ට වැඩි රු. ශත
	ව්‍යාපාරයේ නම			
2.	හුණු පැකට් ගබඩා කර තැබීම හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
3.	මැණික් ගල් කැපීම, ඔප දැමීම හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
4.	මෝටර් වාහන හා බොඩි නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
5.	සිල්ලර බඩු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
6.	වඩු මඩුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
7.	අභ්‍යාස පොත් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
8.	වාත්තු මඩුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
9.	වීදුරු භාණ්ඩ නිපදවීමේ හෝ වීදුරු කැඩපතක් සහ වීදුරු තහඩු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
10.	ඇලුමිනියම් භාණ්ඩ නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
11.	විදුලි කර්මාන්ත වැඩපලක් හෝ ගුවන් විදුලි යන්ත්‍ර අලුත්වැඩියා කරන වැඩපලක් හෝ රූපවාහිනී යන්ත්‍ර අලුත්වැඩියා කිරීමේ වැඩපලක් පවත්වාගෙන යාම.	500 0	750 0	1,000 0
12.	රබර් සීල් කැපීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
13.	දර මඩුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
14.	කුෂන් වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
15.	පොල් පරාල විකිණීමේ හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
16.	ලොතරැයි අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම		750 0	
17.	විකිණීම සඳහා මාළු ඇති කිරීමේ හෝ මාළු ටැංකි විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
18.	බෙහෙත් වැඩපොළක් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
19.	ඔරලෝසු අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
20.	තේ කොළ හෝ කෝපි කුඩු හෝ මිරිස් කුඩු හෝ තුනපහ පැකට් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
21.	යතුරු ලියන යන්ත්‍ර හෝ රෝනියෝ යන්ත්‍ර අලුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම.	500 0	750 0	1,000 0
22.	විකිණීම සඳහා මල් වැවීම පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
23.	නාම පුවරු ඇඳීමේ ස්ථානයක් හෝ ප්ලාස්ටික් නාම පුවරු සැකසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
24.	පා පැදි අලුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
25.	පරිගණක යන්ත්‍ර අලුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
26.	පින්තූර රාමු කිරීමේ හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
27.	ස්පයිසර් තෙල් වර්ග, පික්ච්ර් පෝස්කාඩ් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
28.	මැටි වලං හෝ මැටි භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
29.	බුලත්, පුවක්, කොසු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
30.	ඇඳුම් මැසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
31.	රටකජු පැකට් හෝ බයිට් පැකට් හෝ රටකජු විකිණීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
32.	පූජා භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
33.	යතුරු පැදි හා පා පැදි ආරක්ෂා කර දීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
34.	බෙහෙත් නිෂ්පාදන ආයතනයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
35.	ජංගම දුරකථන අලුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
36.	මෝටර් සයිකල් හා ත්‍රී රෝද රථ සර්විස් කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම.	500 0	750 0	1,000 0

හික්කඩුව නගර සභාව

2024 වර්ෂයට අදාළව ව්‍යාපාර බද්ද පැනවීම

255 වන අධිකාරිය වන නගර සභා ආඥාපනතේ 165 (ආ) (1) වන වගන්තියෙන් නගර සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර එකී ආඥාපනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ එහි ආඥාපනතේ 165 (අ) (1) වන වගන්තිය යටතේ යම් කර්මාන්ත බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ කිසියම් ව්‍යාපාරයක් හික්කඩුව නගර සභා බල ප්‍රදේශය ඇතුළත 2024 වර්ෂයේ කරගෙන යනු ලබන සෑම තැනැත්තෙකුගෙන් ම එකී ව්‍යාපාරයේ ඊට පෙර වර්ෂයේ ලැබීම් මෙහි පහත I වැනි උපලේඛනයේ නිරූපිත යම් විෂයාංකයක පවත්නා අවස්ථාවක II වැනි උපලේඛනයේ අනුරූප සටහනෙහි නිරූපිත ප්‍රමාණ අනුව ව්‍යාපාර බද්දක් 2024 වර්ෂය සඳහා පනවා අයකිරීමටත් බද්ද යටතේ සෑම තැනැත්තෙකුම එකී ව්‍යාපාරයේ බද්ද 2024 වර්ෂයේ මාර්තු මස 31 දිනට පෙර හික්කඩුව නගර සභාවට ගෙවිය යුතු බවට 255 අධිකාරිය වන නගර සභා ආඥාපනතේ 184 (අ) වගන්තිය අනුව හික්කඩුව නගර සභාවේ ලේකම් හා කාර්ය කර්තව්‍ය හා බලතල ක්‍රියාත්මක කරන නිලධාරි එම්. බී. පී. ජානකී වන මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ලේකම් තීරණ අංක 2023/10/12/293 (VI) ක යටතේ තීරණය කළ බව මෙයින් නිවේදනය කරමි.

එම්. බී. පී. ජානකී,
සභාපති,
හික්කඩුව නගර සභාව.

II වැනි උපලේඛනය

ආරම්භ වර්ෂය හැරෙන්නට ඉහත සඳහන් ව්‍යාපාර කරගෙන යන සෑම තැනැත්තෙකුගේ ම පෙර වූ වර්ෂයේ දී ඒ ව්‍යාපාරයේ ලැබීම්වලට අදාළව පහත දැක්වෙන පරිදි වාර්ෂික බද්දකි :

ව්‍යාපාරයේ වාර්ෂික ලැබීම්	*ගෙවිය යුතු බද්ද* *රු. ශත.*
රු. 1 සිට රු. 6000 දක්වා	නැත
රු. 6001 සිට 12,000 දක්වා	90 0
රු. 12,001 සිට 18,750 දක්වා	180 0
රු. 18,751 සිට 75,000 දක්වා	360 0
රු. 75,001 සිට 150,000 දක්වා	1,200 0
රු. 150,001 සිට ඉහළට	3,000 0

උපලේඛනය I

ඇතැම් වෙළඳ ව්‍යාපාර සම්බන්ධ බදු -165 (ආ) (1) වගන්තිය

1. වෙන්දේසිකරුවන්
2. බ්‍රෝකර්වරුන්
3. කොමිස් ඒජන්තවරුන්
4. මුදල් ආයෝජකයන්
5. උකස් බඩු ගන්නවුන්
6. කොන්ත්‍රාත්කරුවන්
7. සැපයුම්කරුවන්
8. රියදුරු පුහුණු ආයතන
9. රක්ෂණ නියෝජිතයෝ
10. ගෘහ නිර්මාණ ශිල්පීන්

11. ප්‍රවාහන සේවා අයිතිකරුවෙකු හා ප්‍රවාහන නියෝජිතයෙකු
12. පෞද්ගලික අධ්‍යාපන ආයතනයක් පවත්වන්නෙකු
13. මුදල් ණයට දෙන්නෙකු වශයෙන් කටයුතු කිරීම
14. ලොතරැයි ටිකට් නියෝජිතවරයෙකු
15. විදේශ රැකියා හා විදේශ අධ්‍යාපන ඒජන්සියක් පවත්වන්නෙකු
16. ගණන් පරීක්ෂකවරුන්
17. නීතිඥයින්
18. පෞද්ගලික මිනින්දෝරුවන්
19. වෛද්‍යවරුන් (ආයුර්වේද)
20. වෛද්‍යවරුන් හා පශු වෛද්‍යවරුන් (බටහිර)
21. මෝටර් රථ, ත්‍රීරෝද රථ, යතුරුපැදි අලෙවි නියෝජිත ආයතනයන්
22. පෞද්ගලික බස්රථ සමාගම් හිමියන්
23. ඡායාරූප ශිල්පීන් හා ශාලාවක් පවත්වාගෙන යාම
24. බැංකු, රක්ෂණ සමාගමක්, මූල්‍ය ආයතනයක්
25. රට බීම සාප්පුවක් (මත්පැන්)
26. ජලය බෙදා හැරීමේ මධ්‍යස්ථානයක්
27. විදුලිය බෙදා හැරීමේ මධ්‍යස්ථානයක්
28. දුරකථන සම්ප්‍රේෂණ මධ්‍යස්ථානයක්/කුළුනක්
29. විදේශීය දුරකථන සේවා මධ්‍යස්ථානයක්
30. පශු වෛද්‍ය ශිලන්හලක්
31. රේස් ඔට්ටු පොලක් පවත්වාගෙන යාම හා තුණ්ඩු දැමීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
32. විදේශීය මුදල් මාරු කිරීමේ ස්ථානයක්
33. රියදුරු පුහුණු පාසලක් පවත්වාගෙන යාම
34. උත්සව භාණ්ඩ කුලියට දීම/සැපයීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
35. ගොඩනැගිලි ද්‍රව්‍ය අලෙවි ස්ථානයක් පවත්වාගෙන යාම
36. රසායනාගාර
37. කල්බදු ආයතන (ලීසිං ආයතන)
38. ස්වයංක්‍රීය ටේලර් යන්ත්‍ර
39. ඉන්ධන පිරවුම්හලක් පවත්වාගෙන යාම
40. සුපිරි වෙළඳසැල්
41. පෞද්ගලික රෝහල්
42. මහා පරිමාණ තුරඟ ඔට්ටුපල
43. උත්සව ශාලාවක් පවත්වාගෙන යාම
44. ඇඟළුම් කාර්මාන්තශාලා
45. මහා පරිමාණ ලෙස පානීය ජලය බෝතල් කිරීමේ මධ්‍යස්ථාන
46. ප්‍රචාරක ආයතන
47. කුලී පදනම මත යන්ත්‍රෝපකරණ බදු දීම
48. පිරිසිදු කරන්නන් කුලියට දීමේ ආයතන
49. පෞද්ගලික ආරක්ෂක සේවා සැපයීමේ මධ්‍යස්ථාන
50. ස්වර්ණාභරණ අලෙවිසැල්
51. සමූපකාර ග්‍රාමීය බැංකු
52. පින්තාරු තීන්ත වර්ග වාර්නිෂ් හෝ ඩිස්ටැම්පර් සායම් හොන්ඩර් 05 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තැබීම හෝ විකුණන ස්ථානයක්
53. බටහිර බෙහෙත් වර්ග විකිණීමේ හෝ ප්‍රතිකාර කිරීමේ ස්ථානයක්
54. පා පැදි සහ මෝටර් සයිකල් කුළියටදීමේ ස්ථානයක්
55. ආයුර්වේද බෙහෙත් වර්ග විකිණීමේ හෝ ප්‍රතිකාර කිරීමේ ස්ථානයක්.
56. මනමාලියන් හැඩ ගැන්වීමේ, කොණ්ඩා මෝස්තර හා උපකරණ කුළියටදීමේ ස්ථානයක්
57. ලිපිද්‍රව්‍ය කඩදාසි පාසල් පොත් අභ්‍යාස පොත් විකිණීමේ ස්ථානයක්
58. නිමි ඇඳුම් විකිණීමේ ස්ථානයක්
59. ඇස් කණ්නාඩි විකිණීමේ ස්ථානයක්
60. වෛද්‍ය රසායනාගාරයක් පැවැත්වීමේ ස්ථානයක්
61. ගෘහ භාණ්ඩ විකිණීමේ ස්ථානයක්
62. විදුලි උපකරණ අලෙවිය

63. අලෙවි නියෝජිත ආයතනයක් පවත්වාගෙන යාම.
64. පැරණි ගෘහ භාණ්ඩ විකිණීමේ හා ගබඩාකර තැබීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
65. තොග වශයෙන් සිගරට් තබා ගැනීම, විකිණීම හා බෙදාහරින ස්ථානයක් පවත්වාගෙන යාම.
66. මහන මැෂින් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
67. මෝටර් සයිකල් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
68. රථ වාහන විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
69. සාප්පු බඩු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
70. දුරකථන අමතර කොටස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
71. කුකුල් කෑම ගබඩා කරතැබීම හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
72. ටයර් ටියුබ් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
73. සම් භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
74. ලෝහමය සුන්බුන් ගබඩාකර තැබීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
75. මෝටර් සයිකල් මෝටර් රථ අමතර කොටස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
76. පා පැදි අමතර කොටස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
77. සන්නිවේදන පියසක් පවත්වාගෙන යාම.
78. පිත්තල භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
79. ලී ගබඩා කිරීම හා අලෙවි මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම.
80. ධීවර ආම්පන්න විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
81. ග්ලාස් බෝට්ටු කුලියටදීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
82. කිමිදුම් උපකරණ හෝ පිහිනුම් උපකරණ හෝ දියමත ලිස්සා යාමේ ලෑලි කුලියටදීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
83. සහල් අලෙවිය
84. දන්ත වෛද්‍ය ශාලාවක් පවත්වාගෙන යාම
85. මුද්‍රණාලයක් පවත්වාගෙන යාම
86. කායවර්ධන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
87. නියෝජිත තැපැල් කාර්යාලයක පවත්වාගෙන යාම
88. සංගීත භාණ්ඩ, ක්‍රීඩා භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
89. බැටරි විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
90. කර්මාන්ත බද්ද යටතට හෝ බලපත්‍ර ගාස්තු ගත යුතු ව්‍යාපාර යටතට අයත් නොවන අනෙකුත් ව්‍යාපාර.

11-464/6

හික්කඩුව නගර සභාව

තාවකාලික වෙළඳසැල් - 2024 වර්ෂය

උත්සව සඳහා තාවකාලික වෙළඳසැල්වලින් හික්කඩුව නගර සභා බල ප්‍රදේශය තුළ පහත උපලේඛනයේ සඳහන්වන පරිදි 2024 වර්ෂය සඳහා පනවා අයකිරීමට 255 අධිකාරිය වන නගර සභා ආඥාපනතේ 184 (අ) වගන්තිය අනුව හික්කඩුව නගර සභාවේ ලේකම් හා කාර්ය කර්තව්‍ය හා බලතල ක්‍රියාත්මක කරන නිලධාරි එම්. බී. පී. ජානකී වන මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ලේකම් තීරණ අංක 2023/10/12/293 (VII) යටතේ තීරණය කළ බව මෙයින් නිවේදනය කරමි.

එම්. බී. පී. ජානකී,
ලේකම්,
හික්කඩුව නගර සභාව.

		රු. ශත
01.	තාවකාලික වෙළඳසැල් සඳහා (වර්ග අඩියකට)	50 0
02.	අයිස්ක්‍රීම් වෑන් රථයකින් දිනකට (උත්සව අවස්ථාවක දී)	500 0
03.	අයිස්ක්‍රීම් බයිසිකලයකින් දිනකට	200 0
04.	ජංගම වෙළඳාම කඩල/රසකැවිලි/බයිට්/වෙනත්	500 0
05.	පෞද්ගලික රථගාල	100 0
06.	පාපැදි හා යතුරු පැදි ආරක්ෂා කරන ස්ථාන	500 0

11-464/7

හික්කඩුව නගර සභාව

2024 වර්ෂය සඳහා ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීමේ ගාස්තු පැනවීම

255 වැනි අධිකාරය වන නගර සභා ආඥාපනතේ 153 වැනි හා 157 වැනි වගන්තිය යටතේ හික්කඩුව නගර සභාව විසින් සම්පාදිතව එම ආඥාපනතේ 154 වැනි වගන්තිය යටතේ ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීමේ ගාස්තු 2024 ජනවාරි මස පළමු දින සිට පහත සඳහන් ලෙස පනවා අයකිරීම කළ යුතු බවට 255 අධිකාරය වන නගර සභා ආඥාපනතේ 184(අ) වගන්තිය අනුව හික්කඩුව නගර සභාවේ ලේකම් හා කාර්ය කර්තව්‍ය හා බලතල ක්‍රියාත්මක කරන නිලධාරි එම්. බී. පී. ජානකී වන මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ලේකම් තීරණ අංක 2023/10/12/293 (VIII) යටතේ තීරණය කළ බව මෙයින් නිවේදනය කරමි.

එම්. බී. පී. ජානකී,
ලේකම්,
හික්කඩුව නගර සභාව.

01. යම් තැනැත්තෙකු විසින් උසුලාගෙන යනු ලබන හෝ ගමන් කරන වාහනයකට සවි කොට ඇති හෝ මහජනතාවට දැන ගැනීමට හැකි වන පරිදි යම් තැනක සවිකර තබන ප්‍රචාරක බැනරයක් සඳහා වර්ග අඩියකට රු. 30 0 බැගින්,

02. ප්‍රචාරක දැන්වීම් පුවරුවක් ප්‍රදර්ශනය කිරීම සඳහා යම්කිසි ස්ථානයක සවිකිරීමේ දී මාස 06කට අඩු කාලයකට වර්ග අඩියකට රු. 100.0 බැගින් සහ මාස 06ක සිට එක් වර්ෂයක කාලයකට වර්ග අඩියකට රු. 150 0 බැගින්,

03. ව්‍යාපාරික ස්ථානයක සවිකර ඇති වෙළඳ දැන්වීම් පුවරුවක් ප්‍රදර්ශනය කිරීම සඳහා මාස 06කට අඩු කාලයකට වර්ග අඩියකට රු. 75.0 බැගින් සහ මාස 06 සිට එක් වර්ෂයක කාලයකට වර්ග අඩියකට රු. 100 0 බැගින්,

04. ගොඩනැගිල්ලක, බිත්තියක හෝ තාප්පයක පින්තාරු තීන්තෙන් ප්‍රචාරක දැන්වීමක් ඇඳ තැබීම සඳහා මාස 06 කට අඩු කාලයකට වර්ග අඩියකට රු. 30.0 බැගින් සහ මාස 06 සිට එක් වර්ෂයක කාලයකට වර්ග අඩියකට රු. 50 0 බැගින්,

05. ප්‍රතිදීප්ත දැන්වීම් පුවරු සඳහා අඩියකට රු. 200 0 බැගින්.

11-464/8

හික්කඩුව නගර සභාව

2024 වර්ෂය සඳහා විනෝද බදු පැනවීම

267 වන අධිකාරය වන විනෝද බදු ආඥාපනතේ දෙවන වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව හික්කඩුව නගර සභාවේ පරිපාලන සීමා ඇතුළත වූ ප්‍රදේශයෙහි පවත්වනු ලබන එකී ආඥාපනතේ විස්තර කර ඇති යම් විනෝද කටයුත්තකට කරනු ලබන ගෙවීමකින් 10% කට සමාන මුදලක් බද්දක් වශයෙන් පනවා අය කළ යුතු යැයිද, මෙම යෝජනාව 2024.01.01 දින සිට ක්‍රියාත්මක විය යුතු යැයි ද යෝජනා කරන්නීය. එසේම ඉහත පනවන ලද විනෝද බද්ද එකී විනෝද කාර්යය පවත්වන දිනට පෙර අදාළ සංවිධායක හෝ සංවිධායකවරුන් විසින් නිසි ලෙස හික්කඩුව නගර සභාවට ගෙවිය යුතු බවට 255 අධිකාරය වන නගර සභා ආඥාපනතේ 184 (අ) වගන්තිය අනුව හික්කඩුව නගර සභාවේ ලේකම් හා කාර්ය කර්තව්‍ය හා බලතල ක්‍රියාත්මක කරන නිලධාරි එම්. බී. පී. ජානකී වන මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ලේකම් තීරණ අංක 2023/10/12/293 (IX) යටතේ තීරණය කළ බව මෙයින් නිවේදනය කරමි.

එම්. බී. පී. ජානකී,
ලේකම්,
හික්කඩුව නගර සභාව.

11-464/9

හික්කඩුව නගර සභාව

2024 වර්ෂය සඳහා සුනඛයින් ලියාපදිංචි කිරීමේ ගාස්තු පැනවීම

හික්කඩුව නගර සභාව විසින් සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ (447 වැනි අධිකාරය) 4 වන වගන්තිය ප්‍රකාර හික්කඩුව නගර සභා පාලන සීමාව තුළ තබා ගන්නා සෑම බල්ලෙකුටම සෑම බැල්ලියකටම රු. 5.00 ක ලියාපදිංචි කිරීමේ ගාස්තුවක් 2024 වර්ෂය සඳහා පනවා අයකළ යුතු බවට 255 අධිකාරය වන නගර සභා ආඥාපනතේ 184 (අ) වගන්තිය අනුව හික්කඩුව නගර සභාවේ ලේකම් හා කාර්ය කර්තව්‍ය හා බලතල ක්‍රියාත්මක කරන නිලධාරී එම්. බී. පී. ජානකී වන මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ලේකම් තීරණ අංක 2023/10/12/293 (X) යටතේ තීරණය කළ බව මෙයින් නිවේදනය කරමි.

එම්. බී. පී. ජානකී,
ලේකම්,
හික්කඩුව නගර සභාව.

11-464/10

හික්කඩුව නගර සභාව

2024 වර්ෂය සඳහා ප්‍රසිද්ධ රඟ දැක්වීමේ ආඥාපනත අනුව බලපත්‍ර ගාස්තු පැනවීම

හික්කඩුව නගර සභා සීමාව තුළ ප්‍රදර්ශනය කරනු ලබන ප්‍රසිද්ධ රැඟුම් හා සංදර්ශන සඳහා අයකරනු ලබන ප්‍රසිද්ධ රැගුම් හා සංදර්ශන බලපත්‍ර ගාස්තුව 2024 වර්ෂයට ද පහත සඳහන් උපලේඛනය අනුව ගෙවිය යුතු බවට 255 අධිකාරය වන නගර සභා ආඥා පනතේ 184 (අ) වගන්තිය අනුව හික්කඩුව නගර සභාවේ ලේකම් හා කාර්ය කර්තව්‍ය හා බලතල ක්‍රියාත්මක කරන නිලධාරී එම්. බී. පී. ජානකී වන මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ලේකම් තීරණ අංක 2023/10/12/293 (XI) යටතේ තීරණය කළ බව මෙයින් නිවේදනය කරමි.

එම්. බී. පී. ජානකී,
ලේකම්,
හික්කඩුව නගර සභාව.

උපලේඛනය

		රු. ශත
01.	තාවකාලික චිත්‍රපටි දර්ශන/මැජික් දර්ශන/ සර්කස්/ නාට්‍ය හෝ වෙනත් සංදර්ශන සඳහා එක් දිනකට බලපත්‍ර ගාස්තුව	1,000 0
02.	තාවකාලික චිත්‍රපටි දර්ශන/මැජික් දර්ශන/සර්කස්/ නාට්‍ය හෝ වෙනත් සංදර්ශන සඳහා එක් දිනකට වැඩිවන සෑම දිනක් සඳහාම බලපත්‍ර ගාස්තුව	500 0
03.	සංගීත සංදර්ශන සඳහා එක් දිනකට බලපත්‍ර ගාස්තුව	1,000 0

11-464/11

හික්කඩුව නගර සභාව

2024 වර්ෂය සඳහා රථවාහන හා සතුන් පිළිබඳ බදු පැනවීම

1979 අංක 42 දරන මහ නගර සභා සංශෝධන පනතින් සංශෝධිත (255 වැනි අධිකාරය වන) නගර සභා ආඥාපනතේ 162 දරන වගන්තිය යටතේ හික්කඩුව නගර සීමාව තුළ පහත සඳහන් උපලේඛනයේ නම් කරන ලද රථවාහන හා සතුන් වෙනුවෙන් එම උපලේඛනයේ එම වාහන හා සතුන් ඉදිරියෙන් සඳහන් කර තිබෙන ගාස්තු 2024 වර්ෂය සඳහා පනවා ඇති බව ද එකී බදු 2024 වර්ෂය

තුළ ගෙවිය යුතු බවත් තහඩුව හා ලිපිද්‍රව්‍ය ගාස්තු සඳහා රු. පහක් (5.00) ක් ද බලපත්‍ර ලබා නොගත් පාපැදි සඳහා මහ මගදී (වැටලීම්) බලපත්‍ර නිකුත් කිරීමේ දී අය කරනු ලබන ගාස්තුවට අමතරව රුපියල් දහයක් (රු. 10.00) දඩ මුදලක් අය කිරීමටත්, හික්කඩුව නගර සභාවට පහත සඳහන් උපලේඛනය අනුව ගෙවිය යුතු බවට 255 අධිකාරය වන නගර සභා ආඥාපනතේ 184 (අ) වගන්තිය අනුව හික්කඩුව නගර සභාවේ ලේකම් හා කාර්ය කර්තව්‍ය හා බලතල ක්‍රියාත්මක කරන නිලධාරී එම්. බී. පී. ජානකී වන මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ලේකම් තීරණ අංක 2023/10/12/293 (XII) යටතේ තීරණය කළ බව මෙයින් නිවේදනය කරමි.

එම්. බී. පී. ජානකී,
ලේකම්,
හික්කඩුව නගර සභාව.

උපලේඛනය

		රු. ශත
01.	මෝටර් කාර් රථයක්, රෝද තුනේ මෝටර් රථයක්, මෝටර් ලොරි රථයක්, මෝටර් සයිකලයක්, කරත්තයක්, අත් කරත්තයක්, රික්ෂෝවක්, බයිසිකලයක්, ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහාම	25 0
02.	සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාර් රථයක් නැතහොත් බයිසිකලයක්, කරත්තයක් හෝ කාර් *නැතහොත්* ට්‍රයිසිකල් කරත්තයක් සඳහා	
	(අ) වෙළඳ කාර්යයක් සඳහා යොදවන්නේ නම්	10 0
	(ආ) වෙළඳ කාර්යයන් නොවන කාර්යයන්, සඳහා යොදවන්නේ නම්	5 0
	• සෑම කරත්තයක් සඳහා	20 0
	• සෑම අත් කරත්තයක් සඳහා	10 0
	• සෑම රික්ෂෝවක් සඳහා	7 50
	• සෑම අශ්වයෙකු, පෝනියෙකු හෝ කොටළුවෙකු සඳහා	15 0
	• සෑම අලියෙකු සඳහා	50 0

11-464/12

හික්කඩුව නගර සභාව

2024 වර්ෂය සඳහා විවිධ ගාස්තු පැනවීම

හික්කඩුව නගර සභාවට පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීමේ දී ඉටුකරන පහත සඳහන් සේවා හා වෙනත් අනුෂාංගික කාර්යයන් ඉටු කිරීමේ දී නගර සභා අරමුදලට අය කර ගත යුතු ගාස්තු මෙහි උපලේඛනයේ සඳහන් ආකාරයට විය යුතු බවත් මෙම සේවා ගාස්තු අය කිරීමට 2024 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක විය යුතු බවට 255 අධිකාරය වන නගර සභා ආඥාපනතේ 184 (අ) වගන්තිය අනුව හික්කඩුව නගර සභාවේ ලේකම් හා කාර්ය කර්තව්‍ය හා බලතල ක්‍රියාත්මක කරන නිලධාරී එම්. බී. පී. ජානකී වන මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ලේකම් තීරණ අංක 2023/10/12/293 (XIII) යටතේ තීරණය කළ බව මෙයින් නිවේදනය කරමි.

එම්. බී. පී. ජානකී,
ලේකම්,
හික්කඩුව නගර සභාව.

උපලේඛනය

		රු. ශත
01.	ඔප්පු සාරාංශ අයදුම් පත්‍රයක් සඳහා ගාස්තු	500 0
02.	නොපවරා ගැනීමේ සහතිකයක් සඳහා ගාස්තු	500 0
03.	අතිරේක තක්සේරු නිවේදනයක් සඳහා ගාස්තු	200 0

		රු. ශත
04.	හිමිකම් සහතිකයක් ලබා දීම සඳහා ගාස්තු	500 0
05.	වරිපනම් උධෘත නිකුත් කිරීම එක් වර්ෂයක් සඳහා ගාස්තු	200 0
06.	අස්ථානගත ලදු පතක ඡායා පිටපතක් ලබා දීම සඳහා ගාස්තු	100 0
07.	වෙනත් සහතික පත්‍ර ලබා දීම සඳහා ගාස්තු	500 0
08.	ගොඩනැගිලි අයදුම්පත්‍රයක් සඳහා ගාස්තු	1,000 0
09.	අස්ථානගත වූ අනුමත ගොඩනැගිලි සැලැස්මේ සහතික කරන ලද සත්‍ය ඡායා පිටපතක් සඳහා ගාස්තු	1,000 0
10.	අස්ථානගත වූ අනුමත මිනින්දෝරු සැලැස්මේ සහතික කරන ලද සත්‍ය ඡායා පිටපතක් සඳහා ගාස්තු	500 0
11.	අස්ථානගත වූ අනුමත අනුකූලතා සහතිකයේ සත්‍ය ඡායා පිටපතක් සඳහා ගාස්තු	500 0
12.	වීථිරේඛා අයදුම්පත්‍ර ගාස්තු	500 0
13.	අනුබෙදුම් අයදුම් පත්‍රයක් සඳහා ගාස්තු	500 0
14.	ටෙන්ඩර් අයදුම්පත්‍රයක් සඳහා ගාස්තුව	1,000 0
15.	ටෙන්ඩර් ඇප තැන්පතු	2,500 0

දැනට අය කරනු ලබන වෙනත් ගාස්තු:

01.	කසල බැහැර කිරීම සඳහා : ට්‍රැක්ටර් ලෝඩ් 01කට ට්‍රැක්ටර් ලෝඩ් 1/2කට ට්‍රැක්ටර් ලෝඩ් 1/4කට (පැටවීම අයදුම්කරු විසින් සිදුකළ යුතුය.)	2,500 0
02.	නගර සභා සම්මන්ත්‍රණ ශාලාව පරිහරණය කිරීමේ ගාස්තු :	
	(i) ගාස්තු අය කිරීමෙන් තොරව පැවැත්වෙන සාමාන්‍ය රැස්වීම් (අවම පැය 4) (විදුලි ජලය සමග) සම්මන්ත්‍රණ දේශන හා ප්‍රදර්ශන සඳහා ශාලා ගාස්තු (පැයකට) (විදුලිය ජලය සමග)	1,000 0
	ආරක්ෂිත ඇප මුදල	5,000 0
	(ii) මුදල් අයකර පෙන්වනු ලබන පාසල් අධ්‍යාපන : සම්මන්ත්‍රණ සඳහා ශාලා ගාස්තුව පැයකට (විදුලිය ජලය සමග)	1,500 0
	ආරක්ෂිත ඇප මුදල	7,500 0
	(iii) ක්‍රීඩා සමාජ උත්සව පොත් සල්පිල් සහ වෙළෙඳ ප්‍රදර්ශන සහ අලෙවිය දිනකට ශාලා ගාස්තු (විදුලිය ජලය සමග)	8,000 0
	ආරක්ෂිත ඇප මුදල	5,000 0
	(iv) මුදල් අයකර පවත්වනු ලබන පෞද්ගලික (අවම පැය 4) අධ්‍යාපන සම්මන්ත්‍රණ හා පන්ති සඳහා පැයකට	2,000 0
	ආරක්ෂිත ඇප මුදල	5,000 0
	(v) මංගල සාද ක්‍රීඩා සාමාජික භෝජන සංග්‍රහය (දිනකට) (විදුලි ජලය සමග)	15,000 0
	ආරක්ෂිත ඇප මුදල	10,000 0

		රු. ශත
(vi)	නාට්‍ය සංදර්ශන සංගීත සංදර්ශන විවිධ ප්‍රසංග සඳහා දිනකට (විදුලිය ජලය සමග)	10,000 0
	ආරක්ෂිත ඇප මුදල	10,000 0

(vii) රජයේ උත්සව සඳහා පළාත් පාලන කොමසාරිස්, ප්‍රාදේශීය ලේකම්, දිසාපති, පාර්ලිමේන්තු මන්ත්‍රී, යන අය විසින් නගර ශාලාව පරිහරණය කිරීම සඳහා කරනු ලබන ඉල්ලීම්වල දී බදු කුළියක් අය නොකිරීමත්, විදුලිය හා ජලය සඳහා රු. 1,000.00 ක් අය කිරීම

		රු. ශත
(viii)	නගර ශාලාව වෙන් කිරීම පෙරදින සැරසිලි සඳහා ශාලා ගාස්තු (පැය 02 හෝ පැය 02 කට අඩු නම්)	500 0
(ix)	නගර ශාලාව වෙන් කිරීම පෙරදින සැරසිලි සඳහා ශාලා ගාස්තු (පැය 02 හෝ පැය 02 කට වැඩි නම්)	1,000 0
(x)	සම්මන්ත්‍රණ ශාලාවේ ස්ථාපිත ශබ්ද වාහිනි යන්ත්‍ර සැපයීම	1,500 0
(xi)	පොල්තෙල් පහනට	500 0
(xii)	ශබ්ද වාහිනී යන්ත්‍ර	1,500 0
(xiii)	සාමාන්‍ය පුටු (අවමඟුල්) එක පුටුවක් සඳහා	10 0
	ඇප තැන්පතු මුදල	500 0
(xiv)	සම්මන්ත්‍රණ ශාලාවේ කොරිඩෝව අසල බිම් තීරුව	
	බදු දීම දිනක් සඳහා ගාස්තු	2,000 0
	ඇප තැන්පතු මුදල	1,000 0
(xv)	සාමාන්‍ය (වෙනත්) එක් පුටුවක් සඳහා	10 0
	ඇප තැන්පතු මුදල	1,000 0
(xvi)	ප්ලාස්ටික් පුටු (සම්මන්ත්‍රණ ශාලාව සඳහා පමණි)	
	සාමාන්‍ය පුටුවක් සඳහා	10 0
	ඇඳි පුටුවක් සඳහා	20 0
	ඇඳි සහිත ලී පුටුවක් සඳහා	100 0
(xvii)	ප්‍රක්ෂේපන යන්ත්‍රය සහ තිරය	1,500 0
(xviii)	නගර සීමාව තුළ මළගෙයක් වෙනුවෙන් කොඩි නොමිලේ ලබා දෙනු ලැබේ.	
	ඇප තැන්පතු මුදල	1,000 0
(xix)	එක් කොඩියක් සඳහා (රාජ්‍ය ආයතනයක හා විහාරස්ථාන හැර)	50 0
	ඇප තැන්පතු මුදල	1,000 0
(xx)	කොඩි කණුවක් සඳහා	50 0
	කොඩි කණුවක් සඳහා (විහාරස්ථාන හා මළ ගෙවල් සඳහා)	10 0
	ඇප තැන්පතු මුදල	1,500 0

	රු. ශත
(xxi) පැති කොඩි කණුවක් සඳහා	10 0
ඇප තැන්පතු මුදල	1,500 0
(xxii) තාවකාලික ටකරන් මඩු සඳහා වර්ග අඩියකට	15 0
(xxiii) හික්කඩුව නගර සභා සීමාව තුළ ප්‍රවාහන ගාස්තු	500 0
වැඩි වන කි.මී. එකක් (1 km) සඳහා	100 0
ඇප තැන්පතු මුදල	1,000 0

මහජන ක්‍රීඩා පිටිය වෙන් කිරීම සම්බන්ධව අය කරනු ලබන ගාස්තු ක්‍රමය

1. පාසල් ක්‍රිකට් තරග සඳහා	1,000 0
ඇප තැන්පතු මුදල	1,000 0
2. සැහැල්ලු පන්දු ක්‍රිකට් තරග සඳහා	3,000 0
ඇප තැන්පතු මුදල	2,000 0
3. මළල ක්‍රීඩා උත්සවය සඳහා (දිනකට)	3,000 0
ඇප තැන්පතු මුදල (දිනකට)	2,000 0
4. පා පන්දු ක්‍රීඩා සඳහා (දිනකට)	3,000 0
පාපන්දු තරගාවලි සඳහා (දිනකට)	5,000 0
ඇප තැන්පතු මුදල	5,000 0
5. සැහැල්ලු පන්දු ක්‍රිකට් තරගාවලියක් සඳහා (දිනකට)	5,000 0
ඇප තැන්පතු මුදල	5,000 0
වෙනත් අවශ්‍යතා සඳහා කුළියට දීම	
රැස්වීම් සඳහා	5,000 0
ඇප තැන්පතු මුදල	5,000 0
සංගීත සංදර්ශනයකට (පාසල්)	7,500 0
වෙනත් සංගීත සංදර්ශනයකට	10,000 0
සංගීත සංදර්ශනයකට ඇප තැන්පත් මුදල	25,000 0
සර්කස් කානිවල් සඳහා දිනකට	10,000 0
ඇප තැන්පතු මුදල (දිනකට)	25,000 0
හෙලිකොප්ටරයක් ගොඩ බැස්සවීමට	5,000 0
ක්‍රීඩා මණ්ඩපය වෙන් කිරීම	2,000 0

විවිධ කටයුතු සඳහා නගර සභාවට අයත් භූමි ප්‍රමාණය වෙන් කිරීම

01. අලෙවි ප්‍රවර්ධන කටයුතු දිනකට වර්ග අඩි එකකට	50 0
ඇප තැන්පතු මුදල	1,000 0
02. සංගීත සංදර්ශනයකට , සර්කස් කානිවල් හා වෙනත් (දිනකට)	5,000 0
ඇප තැන්පතු මුදල	1,000 0

වෙන් කිරීම් කොන්දේසි :

(i) සියලුම වෙන් කිරීම් මුදල් ගෙවා තහවුරු කර ගත යුතුය.

(ii) මුදල් නොගෙවා වෙන් කිරීම් කරනු නොලැබේ.

(iii) ක්‍රීඩා තරග සඳහා අයහපත් කාලගුණය හේතුවෙන් වෙනත් දිනයක් ලබා දෙනු ලැබේ. (වෙන් කර ගැනීමක් නොකළ දිනයක් විය යුතුයි.)

(iv) අයහපත් කාලගුණය හේතුවෙන් වෙනත් දිනයක් ලබා ගන්නේ නම් තරගය තිබූ දිනයේ හෝ පසුදින ලිඛිතව ඉදිරිපත් කළ යුතුය.

(v) ක්‍රීඩා තරග අයහපත් කාලගුණය හේතුවෙන් හැර වෙනත් හේතූන් නිසා කල් දැමීම්වල දී ඒ වෙනුවට වෙනත් දිනයක් ලබා දෙනු නොලැබේ.

(vi) මොනයම් හේතුවක් නිසාවත් මින් ඉදිරියට නගර සභා ක්‍රීඩාභූමිය අවමංගල කටයුතු සඳහා වෙන් නොකිරීමට හා ක්‍රීඩාංගනය තුළට වාහන ගෙන යාම සම්පූර්ණයෙන් තහනම් කිරීම

(vii) නගර සභා ක්‍රීඩාංගනය වෙන් කිරීම් සඳහා නගර සභාවේ ඉල්ලුම්පත්‍රයක් මගින් හෝ මුද්‍රිත ශීර්ෂ ලිපි මගින් ඉදිරිපත් කළ යුතුය. (ඉල්ලුම් පත්‍ර සකස් කර ගත යුතුය.)

(viii) ක්‍රීඩාංගනය වෙන් කිරීමට අනුමැතිය ලද වහාම මුදල් ගෙවා වෙන් කර ගැනීම තහවුරු කළ යුතුයි.

(ix) ක්‍රීඩා තරග හැර වෙනත් කාර්යයන් සඳහා ක්‍රීඩාංගනය වෙන් කිරීම සලකා බලනු ලබන්නේ සභාවේ අභිමතය පරිදිය.

(x) නගර ශාලාව සහ ක්‍රීඩා පිට්ටනිය වෙන් කිරීම කළ පසු එය අවලංගු කිරීමක දී පහත සඳහන් පරිදි දඩ මුදල් අය කරනු ඇත:

- මසකට හෝ ඊට වැඩි කාලයක් ඇතුළත දැනුම්දීම කළහොත් ගෙවා ඇති ශාලා ගාස්තුවෙන් 25%ක් අය කරනු ලැබේ.
- දින 10-29 ක් ඇතුළත දැනුම් දීම කළහොත් ගාස්තුවෙන් 50% ක් අය කරනු ලැබේ.
- දින 10 ක් ඇතුළත දැනුම් දීම කළහොත් ශාලා ගාස්තුවෙන් 75%ක් අයකර ගැනීමෙන් පසුව ගෙවා ඇති මුදල් නිදහස් කරනු ලැබේ.

(i) අයහපත් කාලගුණ තත්ත්වයන්, විදුලි ඇණ හිටීම් යන හේතූන් මත හැර වෙනත් හේතූන්/පෞද්ගලික හේතූන් මත ක්‍රීඩාපිටිය, නගර සභා සම්මන්ත්‍රණ ශාලාව වෙන් කළ දිනය වෙනුවට වෙනත් දිනයක් ලබා දෙනු නොලැබේ.

(ii) කාලීනව ඇතිවන අවශ්‍යතා මත වෙන් කිරීම් අවලංගු කිරීමේ බලය නගර සභාව සතුය.

(iii) නගර සභා සම්මන්ත්‍රණ ශාලාව, ක්‍රීඩාපිටිය සඳහා තබා ගන්නා ලද ඇප මුදල් ආපසු නිදහස් කිරීමේදී හානි වී තිබුණහොත් ඒ සඳහා ඇස්තමේන්තු ගත මුදල අඩු කළ පසු ගෙවීම් කරනු ලැබේ.

මාර්ග පළඳු කිරීම :

(i) කාපට් අතුරන ලද මාර්ග සඳහා		රු. 7,000 0 ව. මී. 1ක් සඳහා
(ii) තාර අතුරන ලද මාර්ග සඳහා	රු. 1111.11 ව. මී. 1 ක් සඳහා	රු. 4,000 0 ව. මී. 1ක් සඳහා
(iii) කොන්ක්‍රීට් අතුරන ලද මාර්ග සඳහා		රු. 4,200 0 ව. මී. 1ක් සඳහා
(iv) අන්තර් සම්බන්ධිත මාර්ග සඳහා	රු. 350 0 ව. මී. 1 ක් සඳහා	රු. 800 0 ව. මී. 1 ක් සඳහා
(v) බොරළු හෝ පස් අතුරන ලද මාර්ගයේවල හැරීම සඳහා	ව. මී. 1ක් සඳහා	රු. 2000 0 දි. මී. 1ක් සඳහා

යෝජිත කාර්යය ඉටු නොකළ අවස්ථාවල දී, ආපසු ගෙවනු ලබන්නේ වැට් බදු රහිත මූලික මුදලින් 80% ක් පමණි. මීට අමතරව රජයේ බදු මුදල් ඉහත මිල ගණන්වලට ඇතුළත් විය යුතු ය.

අනතුරුදායක ගස් කැපීමේ අයදුම්පතක් සඳහා ගාස්තු :	රු. ශත
කොස් ගසක් සඳහා ගාස්තු	1,500 0
වෙනත් ගස් සඳහා ගාස්තු (එක් ගසක් සඳහා)	500 0
පරිසර බලපත්‍රයක් ලබාගැනීම :	
නව බලපත්‍රයක් ලබාගැනීම (අයදුම් පත්‍ර ගාස්තු)	500 0
බලපත්‍රය අලුත් කිරීම සඳහා (අයදුම් පත්‍ර ගාස්තු)	500 0
පරිසර බලපත්‍ර පරීක්ෂණ ගාස්තු :	
250,000 හෝ ඊට අඩු	3,000 0
250,001 - 500,000	3,750 0
500,001 - 1,000,000	5,000 0
1,000,001 ට වැඩි	10,000 0

පරිසර බලපත්‍ර අලුත්කිරීමේ දී අනුමත පරීක්ෂණ ගාස්තුවලින් 50% ක ගාස්තුවක් ලැඟුම්හල් හා හෝටල් සහ ලී මෝල් සඳහා ගෙවීම

ආපන ශාලා සඳහා අලුත්කිරීමේදී පරීක්ෂණ ගාස්තු

	රු. ශත
මෘත දේහ ආදාහනය කිරීමේ ආදාහනාගාර ගාස්තු :	
බල ප්‍රදේශය තුළ පදිංචි වැඩිහිටි අයෙකු සඳහා	9,000 0
බල ප්‍රදේශය තුළ පදිංචි වැඩිහිටි නොවන අයෙකු සඳහා	8,500 0
බල ප්‍රදේශයෙන් පිටත පදිංචි වැඩිහිටි අයෙකු සඳහා	13,000 0
බල ප්‍රදේශයෙන් පිටත පදිංචි වැඩිහිටි නොවන අයෙකු සඳහා	12,500 0
බල ප්‍රදේශය තුළ පදිංචි සමෘද්ධිලාභියෙකුගේ පවුලේ වැඩිහිටි අයෙකු සඳහා	8,500 0
බල ප්‍රදේශය තුළ පදිංචි සමෘද්ධිලාභියෙකුගේ පවුලේ වැඩිහිටි නොවන අයෙකු සඳහා	8,000 0
සුසාන භූමි භූමදන කිරීමේ ගාස්තු	
ළදරු (ළමා) වැඩිහිටි	505 0
නගර සභාව සතු පොදු වැසිකිලි සහ ජල ස්නාන පහසුකම් ලබාදීමේ ගාස්තු	
සමුපකාරය අසළ වැසිකිලි පද්ධතියේ වැසිකිලි පහසුකම් සඳහා ගාස්තු	20 0
ජල ස්නානය සඳහා	50 0
හික්කඩුව රේල් ගේට්ටුව අසළ වැසිකිලි පද්ධතියේ වැසිකිලි පහසුකම් සඳහා ගාස්තු	20 0
ගල්මල් නැරඹීමේ වීදුරු පතුල් බෝට්ටු සේවාව	
දේශීය - එක් ගමන් වාරයක් සඳහා	130 0
විදේශීය - එක් ගමන් වාරයක් සඳහා	200 0
නගර සභාවට අයත් රථ වාහන නැවතුම්පොළවල් සඳහා බලපත්‍ර ගාස්තු	500 0
ත්‍රීරෝද රථ/අත්ට්‍රැක්ටර්	500 0
වෑන් රථ	750 0
ලොරි රථ	1,000 0

	රු. ශත
පුස්තකාල සාමාජික ගාස්තු	10 0
සාමාජිකත්වය අලුත් කිරීම (වසර දෙකකට වරක්)	20 0
පුස්තකාලීය සාමාජික ගාස්තු තැන්පතු මුදල	100 0
පොතක් අස්ථාන ගතවූ විට පොතේ වර්තමාන වටිනාකම සමඟ අය කරන ගාස්තුව	25% ක ගාස්තුවක්
පුස්තකාළ දඩ මුදල් එක් පොතකට එක් දිනකට අය කරන ගාස්තු	1 0
පෙර පාසල් සඳහා ඇතුළත් කර ගැනීමේ අයදුම්පත්‍ර ගාස්තුව (වසර 02 ක් සඳහා)	300 0
පෙර පාසල් සඳහා ඇතුළත් කර ගැනීමේ අයදුම්පත්‍ර ගාස්තුව (වසර 1 ක් සඳහා)	200 0
ලීටර් 3500 ජල බවුසරය	
සතියේ දින	7,050 0
නිවාඩු දින	7,600 0
ලීටර් 5000 ජල බවුසරය	
සතියේ දින	10,800 0
නිවාඩු දින	11,300 0
ජල බවුසරය රඳවා ගැනීම (දිනකට)	2,500 0
කි. මී. 10 ට වැඩි නම් කි. මී එකකට රු. 250 ක් අය කරයි	
පොදු කටයුතු සඳහා ජල බවුසර් එක	1,000 0
ජල ටැංකිය දිනකට	600 0
අමතර දිනකට	250 0
මාර්ග තලනය සහා සීමාව තුළ	12,760 0
සීමාවෙන් පිටත	15,260 0
ප්‍රවාහන හා ඉන්ධන සේවාව ලබා ගන්නා අය සැපයිය යුතු යි.	
(2020.06.01 දින සිට බල පැවැත්වෙන පරිදි)	
හාඩ්මේක් රථය (පැයකට)	1,200 0
අමතර පැයකට	350 0
ඉන්ධන සහාව මගින්	
බැකෝ යන්ත්‍ර	
එක් පැයකට	4,500 0
ගලි බවුසරය	6,500 0
ප්‍රවාහන ගාස්තු කි. මී. එකකට රු. 250.00 ක් අය කරයි.	

උඩුබද්දාව ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා අක්කර බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වන වගන්තියේ (3) වන උප වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාරව, උඩුබද්දාව ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍ය ඉටුකරන, උඩුබද්දාව ප්‍රාදේශීය සභාවේ ලේකම් එම්. පී. සී. රේණුකා වන මම, එකී පනතේ 146 වන වගන්තියේ (1) වන උප වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව උඩුබද්දාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2024 වර්ෂයට අදාලව අක්කර බදු පැනවීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට 2023 වර්ෂයේ ඔක්තෝබර් මස 02 වැනි දින 268 අංක දරන තීරණය යටතේ ම විසින් තීරණය කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

එම්. පී. සී. රේණුකා,
ලේකම්,
බලතල ක්‍රියාත්මක කරන,
කාර්යය කර්තව්‍ය ඉටුකරන නිලධාරි,
උඩුබද්දාව ප්‍රාදේශීය සභාව.

2023 වර්ෂයේ ඔක්තෝබර් මස 25 වැනි දින,
උඩුබද්දාව ප්‍රාදේශීය සභාවේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වන වගන්තියේ (3) වන උප වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 146 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2017 වර්ෂයේ දී බලාත්මක කරන ලද සත්‍යෝක්ෂණය කිරීම 2024 වර්ෂය සඳහා පිළිගැනීමටත්,

එකී පනතේ 134 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, උඩුබද්දාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටියා වූ ද, ඉහත කී පනතේ 135 වැනි වගන්තියේ නියමය යටතේ අක්කර බද්දෙන් නිදහස් කර නොමැත්තා වූ ද, ස්ථිර හෝ නිතිපතා ගොවිතැනක් යටතේ වූ,

(*අ*) හෙක්ටයාර පහක් (05) හෝ ඊට වැඩි වූ සෑම ඉඩමක් වෙනුවෙන්ම එකී ඉඩමේ සෑම හෙක්ටයාරයක්ම මත 2023 වර්ෂය සඳහා රුපියල් 10 බැගින් වන වාර්ෂික අක්කර බද්දක් පනවා අය කිරීමටත්,

(*ආ*) ඉහත කී පනතේ 134 වැනි වගන්තියේ (3) වන උප වගන්තියේ අතුරු විධානය යටතේ පළාත් පාලන විෂයය භාර ගරු අමාත්‍යතුමා විසින් උඩුබද්දාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය විශේෂ ප්‍රදේශයක් වශයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ IV (ආ) වන කොටසේ 1989.03.10 වැනි දිනැති *ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත්කර ඇති හෙයින්, හෙක්ටයාර් එකකට වැඩි එහෙත් හෙක්ටයාර් පහකට අඩු වූ සෑම ඉඩමක් මත 2024 වර්ෂය සඳහා රුපියල් 50 ක් බැගින් වන වාර්ෂික අක්කර බද්දක් පනවා අය කිරීමට සහ,

(*ඇ*) ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (6) වැනි උපවගන්තියේ විධිවිධාන යටතේ එකී වර්ෂයේ මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30, දෙසැම්බර් 31 යන දිනවලට පෙර සමාන වාරික හතරකින් උඩුබද්දාව ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට මම තීරණය කරමි.

11-456/1

උඩුබද්දාව ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වන වගන්තියේ (3) වන උප වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාරව, උඩුබද්දාව ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍ය ඉටුකරන, උඩුබද්දාව ප්‍රාදේශීය සභාවේ ලේකම් එම්. පී. සී. රේණුකා වන මම, එකී පනතේ 134 වන වගන්තියේ (1) වන උප වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව උඩුබද්දාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පිහිටි දියුණු ගම් ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත්කර ඇති කලාපය සඳහා 2024 වර්ෂයට අදාළව වරිපනම් බදු පැනවීම පහත සඳහන්

ආකාරයට විය යුතු බවට 2023 වර්ෂයේ ඔක්තෝබර් මස 02 වැනි දින 269 අංක දරන තීරණය යටතේ ම විසින් තීරණය කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

එම්. පී. සී. රේණුකා,
ලේකම්,
බලතල ක්‍රියාත්මක කරන,
කාර්යය කර්තව්‍ය ඉටුකරන නිලධාරි,
උඩුබද්දාව ප්‍රාදේශීය සභාව.

2023 වර්ෂයේ ඔක්තෝබර් මස 25 වැනි දින,
උඩුබද්දාව ප්‍රාදේශීය සභාවේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වන වගන්තියේ (3) වන උප වගන්තිය යටතේ ඇති බලතල ප්‍රකාරව එකී පනතේ 134 වන වගන්තියේ (1) වන උප වගන්ති සමග කියවිය යුතු 146 වගන්තියේ (1) වන උපවගන්ති යටතේ උඩුබද්දාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුලත පිහිටි දියුණු ගම් ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත්කර ඇති කලාපයේ ගොඩනැගිලිවල, ඉඩම්වල, ගෙපත්වල 2016 වර්ෂයේ බලාත්මක කර 2023 වර්ෂය තුලදී ක්‍රියාත්මක වූ වාර්ෂික වටිනාකම් තක්සේරුවම 2024 වර්ෂය සඳහා පිළිගැනීමටත්,

එම තක්සේරුව මත 1987 අංක 15 දරන ප්‍රදේශීය සභා පනතේ 134(1) වැනි වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර එකී දේපළ මත ඉහත කී වාර්ෂික තක්සේරු වටිනාකමින් සියයට හතරක (4%) වාර්ෂික වරිපනමක් 2024 වර්ෂයේදී නියම විය යුතු බවටත්,

උඩුබද්දාව ප්‍රාදේශීය සභාව වෙත වරිපනමක් ගෙවීමට යටත් සෑම තැනැත්තෙකු විසින්ම යථෝක්ත වරිපනම 2024 වර්ෂයේ මාර්තු මස 31, ජුනි මස 30, සැප්තැම්බර් මස 30, දෙසැම්බර් මස 31 යන දිනවලින් අවසන් වන කාර්තු හතර තුලදී සමාන වාරික හතරකින් ගෙවනු ලැබිය යුතු යැයි විධානය කිරීමටත්,

2024 වර්ෂයට ගෙවිය යුතු වරිපනම 2024 ජනවාරි මස 31 දිනට පෙර හෝ ඊට පෙර ගෙවනු ලබන්නේ නම් 10% ක වරිපනමක් ද වරිපනම් කාර්තු වශයෙන් ගෙවන්නේ නම් අදාළ කාර්තුවේ පළමු මස ඇතුලත ගෙවනු ලබන විට 5%ක වට්ටමක් ද උඩුබද්දාව ප්‍රාදේශීය සභාව ලබාදිය යුතු බවටත් මම තීරණය කරමි.

උපලේඛනය

කාර්තුව	ගෙවිය යුතු අවසන් දිනය	5% වට්ටම සඳහා හිමිකම් ලබන අවසාන දිනය
පළමුවන කාර්තුව	2024.03.31	2024.01.31
දෙවන කාර්තුව	2024.06.30	2024.04.30
තෙවන කාර්තුව	2024.09.30	2024.07.31
හතරවන කාර්තුව	2024.12.31	2024.10.31

11-456/2

උඩුබද්දාව ප්‍රාදේශීය සභාව

2024 වර්ෂයට වාහන හා සත්ත්ව බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වන වගන්තියේ (3) වන උප වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාරව, උඩුබද්දාව ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍ය ඉටුකරන, උඩුබද්දාව ප්‍රාදේශීය සභාවේ ලේකම් එම්. පී. සී. රේණුකා වන මම, එකී පනතේ 147 හා 148 වගන්තිවල විධිවිධාන ප්‍රකාරව උඩුබද්දාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2024 වර්ෂයට අදාළව වාහන හා සත්ත්ව බදු පැනවීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට 2023 වර්ෂයේ ඔක්තෝබර් මස 02 වැනි දින 270 අංක දරන තීරණය යටතේ ම විසින් තීරණය කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

එකී වාහනය හෝ සතා තමන් භාරයේ තබා ගන්නා දින ගණන දින තිහක් සම්පූර්ණ වූ වහාම 2018 වර්ෂය සඳහා වන මෙම බද්ද ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් නිවේදනය කරමි.

එම්. පී. සී. රේණුකා,
ලේකම්,
බලතල ක්‍රියාත්මක කරන,
කාර්යය කර්තව්‍ය ඉටුකරන නිලධාරි,
උඩුබද්දාව ප්‍රාදේශීය සභාව.

2023 වර්ෂයේ ඔක්තෝබර් මස 25 වැනි දින,
උඩුබද්දාව ප්‍රාදේශීය සභාවේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වන වගන්තියේ (3) වන උප වගන්තිය සමඟ කියවිය යුතු, එම පනතේ 147 හා 148 වැනි වගන්තිවලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර උඩුබද්දාව ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත 2024 වර්ෂයේ දී පහත උපලේඛනයෙහි I වැනි තීරුවේ සඳහන් කිසියම් වාහනයක් හෝ සතෙකු තමා සන්තකයේ තබා ගන්නා සෑම තැනැත්තෙකු මතම එහි II වැනි තීරුවේ අනු ප්‍රමාණයක වාහන හා සත්ත්ව බද්දක් 2024 වර්ෂය සඳහා නියම විය යුතු බවටත් එකී වාහන හා සත්ත්ව බද්දට යටත් තැනැත්තෙකුම විසින් එකී වාහනය හෝ සතා තමන් භාරයේ තබා ගන්නා දින ගණන දින තිහක් සම්පූර්ණ වූ වහාම 2024 වර්ෂය සඳහා වන මෙම බද්ද ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බටවත් මම තීරණය කරමි.

උපලේඛනය

I වැනි තීරය	*II* වැනි තීරය රු. ශත
(1) (i) මෝටර් රථයක්, මෝටර් ට්‍රයිකාරයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, ජින් රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා	25 0
(ii) සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාරයක් හෝ බයිසිකල් කරත්තයක් සඳහා -	
(අ) වෙළෙඳ කාර්යයන් සඳහා යොදවාගන්නේ නම්	18 0
(ආ) වෙළෙඳ නොවන කාර්යයක් සඳහා යොදවාගන්නේ නම්	4 0
(iii) සෑම කරත්තයක් සඳහා	20 0
(iv) සෑම අත් කරත්තයක් සඳහා	10 0
(v) සෑම රික්ෂෝවක් සඳහා	7 50
(vi) සෑම අශ්වයෙකු, පෝනියකු හෝ කොටළුවෙකු සඳහා	15 0
(vii) සෑම ඇතෙකු සඳහා	50 0

(2) විශ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝද සහිත ළමා වාහන, වීල් බැරෝ, හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළෙඳ කර්යය සඳහා යොදවන අත් කරත්ත සහ වෙළෙඳ කාර්යය සඳහා නොයොදවන අත් කරත්ත ඉහත ගෙවීමෙන් නිදහස් කෙරේ.

11-456/3

උඩුබද්දාව ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා ව්‍යාපාර බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වන වගන්තියේ (3) වන උප වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාරව, උඩුබද්දාව ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍ය ඉටුකරන, උඩුබද්දාව ප්‍රාදේශීය සභාවේ ලේකම් එම්. පී. සී. රේණුකා වන මම, එකී පනතේ 152 වන වගන්තියේ (1) වන උප වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව උඩුබද්දාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2024 වර්ෂයට අදාළව ව්‍යාපාර බදු පැනවීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට 2023 වර්ෂයේ ඔක්තෝබර් මස 02 වැනි දින 271 අංක දරන තීරණය යටතේ ම විසින් තීරණය කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

එම්. පී. සී. රේණුකා,
ලේකම්,
බලතල ක්‍රියාත්මක කරන,
කාර්යය කර්තව්‍ය ඉටුකරන නිලධාරී,
උඩුබද්දාව ප්‍රාදේශීය සභාව.

2023 වර්ෂයේ ඔක්තෝබර් මස 25 වැනි දින,
උඩුබද්දාව ප්‍රාදේශීය සභාවේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වන වගන්තියේ (3) වැනි උපවගන්තිය සමග කියවිය යුතු 152 වන වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ උඩුබද්දාව ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර, එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබාගැනීම හෝ එකී පනතේ 150 වැනි වගන්තිය යටතේ යම් කර්මාන්ත බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ හා වෘත්තියක් නොවන්නා වූ කිසියම් ව්‍යාපාරයක් උඩුබද්දාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2024 වර්ෂයේදී කරගෙන යනු ලබන, සෑම තැනැත්තෙකුගෙන් ම, එකී ව්‍යාපාරයේ ඊට පෙර වර්ෂයේ ලැබීම් මෙහි පහත උපලේඛනයේ I වැනි තීරුවේ නිරූපිත යම් විෂයාංක සීමාවන් ඇතුළත පවත්නා අවස්ථාවක එකී II වැනි තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත අනුප්‍රමාණය අනුව වූ ව්‍යාපාර බද්දක් 2024 වර්ෂය සඳහා නියම විය යුතු බවටත්, එකී ව්‍යාපාර බද්දට යටත් තැනැත්තෙකු 2024 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර උඩුබද්දාව ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් සභාව විසින් යෝජනා කරන්නීය.

උපලේඛනය

	I වැනි තීරුව	*II වැනි තීරුව*
	බද්ද අදාළවන වර්ෂයට පෙර වර්ෂයේ ව්‍යාපාරයෙන් ලත් ලැබීම් ප්‍රමාණය	*ගෙවිය යුතු බද්ද රු. ශත*
01.	රු.6,000 නොඉක්මවන අවස්ථාවක	නැත
02.	රු.6,001 ඉක්මවන නමුත් රු.12,000 නොඉක්මවන විට	90 0
03.	රු.12,001 ඉක්මවන නමුත් රු.18,750 නොඉක්මවන විට	180 0
04.	රු.18,751 ඉක්මවන නමුත් රු.75,000 නොඉක්මවන විට	360 0
05.	රු.75,001 ඉක්මවන නමුත් රු.150,000 නොඉක්මවන විට	1,200 0
06.	රු.150,001 ඉක්මවන විට	3,000 0

11-456/4

උඩුබද්දාව ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා බලපත්‍ර ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වන වගන්තියේ (3) වන උප වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාරව, උඩුබද්දාව ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍ය ඉටුකරන, උඩුබද්දාව ප්‍රාදේශීය සභාවේ ලේකම් එම්. පී. සී. රේණුකා වන මම, එකී පනතේ 147 වන වගන්තිය හා 149 වන වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව උඩුබද්දාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2024 වර්ෂයට අදාළව බලපත්‍ර ගාස්තු පහත සඳහන් ආකාරයට විය යුතු බවට 2023 වර්ෂයේ ඔක්තෝබර් මස 02 වැනි දින 272 අංක දරන තීරණය යටතේ ම විසින් තීරණය කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

එම්. පී. සී. රේණුකා,
ලේකම්,
බලතල ක්‍රියාත්මක කරන,
කාර්යය කර්තව්‍ය ඉටුකරන නිලධාරි,
උඩුබද්දාව ප්‍රාදේශීය සභාව.

2023 වර්ෂයේ ඔක්තෝබර් මස 25 වැනි දින,
උඩුබද්දාව ප්‍රාදේශීය සභාවේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වැනි වගන්තියේ (3) වන උපවගන්තිය සමග කියවිය යුතු 147 වැනි වගන්තිය හා 149 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, එකී පනතේ හෝ එකී පනත යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක හෝ උඩුබද්දාව ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ඇති සම්මත අතුරු ව්‍යවස්ථාව යටතේ මෙහි උපලේඛනයෙහි I වැනි තීරුවේ නිරූපිත යම් කාර්යයක් සඳහා උඩුබද්දාව ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත යම් ස්ථානයක් හෝ පරිශ්‍රයක් පාවිච්චි කිරීමට බලය දෙමින් 2024 වර්ෂයේ නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් සම්බන්ධයෙන් එම උපලේඛනයෙහි II වැනි තීරුවේ අනුරූප සටහනේ නිරූපිත ප්‍රමාණයක බලපත්‍ර ගාස්තුවක් 2024 වර්ෂය සඳහා නියම විය යුතු බවට ද,

තව ද, එකී ස්ථානය හෝ පරිශ්‍රය 1968 අංක 14 දරන සංචාරක මණ්ඩල පනතේ කාර්යය සඳහා සංචාරක මණ්ඩලයේ අනුමත කර ඇති හෝ පිළිගෙන ඇති හෝටලයක් හෝ ආපන ශාලාවක් හෝ නවාතැන්පළක් වන විට දී, ඊට අදාළ බලපත්‍ර ලබාදීමේ දී එම ස්ථානයේ හෝ පරිශ්‍රයේ පසුගිය වර්ෂයේ ලත් ලැබීම්වලින් සියයට එකක (1%) බලපත්‍ර ගාස්තුව ලෙස 2024 වර්ෂය සඳහා නියම වී යුතු බවටත් එකී බලපත්‍රය ලබා ගන්නා තැනැත්තෙකු 2024 වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනට පෙර බලපත්‍ර ගාස්තුව ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් මම තීරණය කරමි.

උපලේඛනය I

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147-149 වගන්ති ප්‍රකාර බලපත්‍ර ගාස්තු අය කිරීම

අනු. අංකය	*I වැනි තීරය* *බලපත්‍රයේ ස්වභාවය*	*II වැනි තීරය* *ස්ථානයේ වාර්ෂික වටිනාකම*		
		රු. 1 සිට රු. 750 දක්වා	*රු. 751 සිට රු. 1,500 දක්වා*	*රු. 1,501 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
01.	මිනිරන් ශුද්ධ කිරීම හෝ ගබඩා කිරීම	500 0	750 0	1,000 0
02.	පොහොර හෝ රසායනික පොහොර නිපදවීම හෝ විකිණීමට තබා ගැනීම	500 0	750 0	1,000 0
03.	සම් පදම් කිරීම	500 0	750 0	1,000 0
04.	සම් විකිණීමට තබා ගැනීම	500 0	750 0	1,000 0
05.	සත්ත්ව පාලනය (මස්, බිත්තර හෝ කිරි සඳහා)	500 0	750 0	1,000 0
06.	උම්බලකඩ නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
07.	රබර් නිෂ්පාදනය කිරීම හෝ රබර් රොටී තබාගැනීම	500 0	750 0	1,000 0
08.	පශු වෛද්‍ය ගිලන්හලක් පවත්වා ගැනීම	500 0	750 0	1,000 0
09.	තොග වශයෙන් විකිණීම සඳහා නරක්වන සුළු කෑම වර්ග හෝ ආහාර ද්‍රව්‍ය තබාගැනීම	500 0	750 0	1,000 0
10.	කරවල, ලුණු මාළු හෝ ජාඩි කිලෝග්‍රෑම් 150 කට වැඩි ප්‍රමාණයක් තබා ගැනීම	500 0	750 0	1,000 0

	I වැනි තීරය	*II වැනි තීරය*		
අනු. අංකය	*බලපත්‍රයේ ස්වභාවය*	*ස්ථානයේ වාර්ෂික වටිනාකම*		
		රු. 1 සිට රු. 750 දක්වා	*රු. 751 සිට රු. 1,500 දක්වා*	*රු. 1,501 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
11.	මාළු හෝ මස් ජාඩි දැමීම හෝ වේලීම හෝ අයිස් දැමීම	500 0	750 0	1,000 0
12.	පොල්කටු අඟුරු හෝ දැව අඟුරු නිපදවීම	500 0	750 0	1,000 0
13.	දුම්කොළ වියළීම	500 0	750 0	1,000 0
14.	සත්ත්ව ආහාර නිපදවීම	500 0	750 0	1,000 0
15.	පුන්නක්කු නිපදවීම	500 0	750 0	1,000 0
16.	සත්ත්ව මාංස හෝ ලේ පැසවීම	500 0	750 0	1,000 0
17.	සබන් නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
18.	සත්ත්ව ඇටකටු ඇඹරීම හෝ තබා ගැනීම	500 0	750 0	1,000 0
19.	ට්‍රන්ක පෙට්ටි සෑදීම	500 0	750 0	1,000 0
37.	නිවාඩු නිකේතනයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
38.	රතිඤ්ඤා වෙළඳාම	500 0	750 0	1,000 0
39.	ආහාර ද්‍රව්‍ය ඇසුරුම් කිරීම (සෝයා සහ ධාන්‍ය වර්ග)	500 0	750 0	1,000 0
40.	මඩපුවක් වළක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
41.	රූපලාවන්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

අකුරණ ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා අක්කර බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, එකී පනතේ 134 වැනි වගන්තිය යටතේ අකුරණ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර 2023 වර්ෂයේ සැප්තැම්බර් මස 27 වැනි දින තීරණ අංක 1476 යටතේ බලපත්‍ර මත ගාස්තු පැනවීමට තීරණය කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2024 වර්ෂය සඳහා පනවන ලද ඒ අක්කර බද්ද, මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් මස 31 යන දිනවලින් අවසන්වන සෑම කාර්තුවක් තුළ දී සමාන වාරික හතරකින් ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වැනි වගන්තියේ 03 වැනි උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, අකුරණ ප්‍රාදේශීය සභාවේ ලේකම් ලෙස එකී ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියෙන් ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව, 2024 වර්ෂය සඳහා වන සම්පූර්ණ අක්කර බද්ද 2024 වර්ෂයේ ජනවාරි මස 31 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලය වෙත ගෙවනු ලැබුවහොත් එම සම්පූර්ණ අක්කර බදු ප්‍රමාණයෙන් සියයට දහයක (10%) ක වට්ටමක් ද, එක් එක් කාර්තුවකට අදාළ අක්කර බද්ද ඒ එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දිනයට මත්තෙන් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබුවහොත් සියයට පහක (5%) වට්ටමක් ද දෙනු ලැබේ.

ඩී. ජී. එම්. බී. රණසිංහ,
ලේකම්,
අකුරණ ප්‍රාදේශීය සභාව.

2023 වර්ෂයේ නොවැම්බර් මස 01 වැනි දින,
අකුරණ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තියෙන් ප්‍රාදේශීය සභා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර අකුරණ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටියාවූ ද, ඉහත කී පනතේ 135 වැනි වගන්තියේ නියමය යටතේ අක්කර බද්දෙන් නිදහස් කර නොමැති වූ ද, ස්ථිර හෝ නිතිපතා ගොවිතැන් යටතේ වූ -

(අ) හෙක්ටයාර් 05ට හෝ ඊට වැඩි ඉඩම්වලින් හෙක්ටයාර් 01ට රු. 10ක් බැගින් වූ අක්කර බද්දක් අය කිරීමටත්,

(ආ) ඉහත කී පනතේ 134 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තියේ අතුරු විධානය යටතේ පළාත් පාලන විෂයභාර ගරු අමාත්‍යතුමා විසින් අකුරණ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය විශේෂ ප්‍රදේශයක් වශයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ IV (ආ) කොටසේ 1989 පෙබරවාරි මස 03 දිනැති *ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත්කර ඇති හෙයින්, හෙක්ටයාර් 05කට අඩු නමුත් හෙක්ටයාර් 01කට නොඅඩු වගා කළ ඉඩම්වලින් රු. 50ක වාර්ෂික බද්දක් පනවා අය කිරීමට, සහ

(ඇ) ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (6) උපවගන්තියේ විධිවිධාන යටතේ එකී වර්ෂයේ පළමුවැනි කාර්තුව 2024 මාර්තු 31 වැනි දිනෙන් ද, දෙවැනි කාර්තුව 2024 ජුනි මස 30 වැනි දිනෙන් ද, තුන්වන කාර්තුව 2024 සැප්තැම්බර් මස 30 වැනි දිනයෙන් ද, සිව්වැනි කාර්තුව 2024 දෙසැම්බර් මස 31 යන දිනවලට පෙර සමාන වාරික 4 කින් ගෙවිය යුතු යැයි ද අකුරණ ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

අකුරණ ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා කර්මාන්ත බද්ද පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, එකී පනතේ 150 වන වගන්තිය යටතේ අකුරණ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර 2023 වර්ෂයේ සැප්තැම්බර් මස 27 වැනි දින තීරණ අංක 1474 යටතේ කර්මාන්ත බදු මත ගාස්තු පැනවීමට තීරණය කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ අනුව අංක 1955/7 හා 2016.02.23 වැනි දින දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශේෂ ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශයට පත් කරන ලද සම්මත අතුරු ව්‍යවස්ථාව යටතේ අකුරණ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කිසියම් කර්මාන්තයක් පවත්වාගෙන යාම සඳහා 2024 වර්ෂයේ දී අකුරණ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක් මත ගාස්තුවක් අයකරනු ලබන බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

ඩී. ජී. එම්. බී. රණසිංහ,
ලේකම්,
අකුරණ ප්‍රාදේශීය සභාව.

2023 වර්ෂයේ නොවැම්බර් මස 01 වැනි දින,
අකුරණ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වැනි වගන්තියේ 3 වැනි උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව අකුරණ ප්‍රාදේශීය සභාවේ ලේකම් ලෙස එකී ප්‍රාදේශීය සභාව විසින් වැලඳ ගන්නා ලද ඉහත අතුරු ව්‍යවස්ථාවක් යටතේ හෝ අකුරණ ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවක් යටතේ අකුරණ ප්‍රාදේශීය සභාව විසින් 2024 වර්ෂය තුළදී නිකුත් කරනු ලබන බලපත්‍ර සම්බන්ධයෙන්, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර අකුරණ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත කරගෙන යනු ලබන පහත උපලේඛනයේ I වැනි තීරුවේ සඳහන් එක් එක් කර්මාන්තය වෙනුවෙන් එම උපලේඛනයේ II වැනි තීරුවේ, ඒ එක් එක් කර්මාන්තය පවත්වාගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකමට අනුරූප තීරුවේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක්, 2024 වර්ෂය සඳහා පනවා අයකළ යුතු බවටත්, එකී කර්මාන්ත බද්දට යටත් තැනැත්තෙකු 2024 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර අකුරණ ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් අකුරණ ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

උපලේඛනය

I වැනි තීරය		*II වැනි තීරය*		
		ස්ථානයේ වාර්ෂික වටිනාකම රුපියල්		
අනු. අංකය	*කර්මාන්තයේ ස්වභාවය*	*රු. 750 නොඉක්මවන අවස්ථාවක*	*රු. 751 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,501 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
01.	කළුගල් අතුරු නිෂ්පාදන ස්ථානයක් පවත්වාගෙන යාම (යන්ත්‍රානුසාර නොවන)	500 0	750 0	1,000 0
02.	කළුගල් කැඩීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම (යන්ත්‍රානුසාරයෙන් නොවන)	500 0	750 0	1,000 0
03.	යන්ත්‍රානුසාරයෙන් කළුගල් ඇඹරීමේ මෝලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
04.	යාන්ත්‍රික වඩු මඩුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
05.	සාමාන්‍ය වඩු මඩුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

අනු. අංකය	*කර්මාන්තයේ ස්වභාවය*	*I වැනි තීරය*	*II වැනි තීරය*	
		ස්ථානයේ වාර්ෂික වටිනාකම රුපියල්		
		රු. 750 නොඉක්මවන අවස්ථාවක	*රු. 751 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,501 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
06.	බීරළු/කැටයම් ලියවීමේ/කැපීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
07.	දර මඩුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
08.	පින්තූර රාමු කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
09.	ටින්කර් හා ස්ප්‍රේ පේන්ටින් කිරීම	500 0	750 0	1,000 0
10.	වායු සමීකරණ අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
11.	ෆයිබර් ග්ලාස් වැඩපල	500 0	750 0	1,000 0
12.	වාහන එංජින් අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
13.	ත්‍රීරෝද රථ අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
14.	යතුරුපැදි අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
15.	ටයර්, ටියුබ් වෝල්කනයිස් කිරීම	500 0	750 0	1,000 0
16.	වාහන කුෂන් වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
17.	ආනයන කරන ලද පලුදු රථවාහන යථා තත්ත්වයට පත්කිරීම (අළුත්වැඩියා කිරීමේ ස්ථාන/රීකන්ඩිෂන් කිරීම)	500 0	750 0	1,000 0
18.	ලොරි බොඩි සෑදීම	500 0	750 0	1,000 0
19.	ටයර් නැවත පිරවීම	500 0	750 0	1,000 0
20.	හුණු පෝරණුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
21.	තොග වශයෙන් හුණු කුඩු පැකට්කර විකිණීම	500 0	750 0	1,000 0
22.	සිමෙන්ති බ්ලොක් ගල් නිපදවීම	500 0	750 0	1,000 0
23.	සිමෙන්ති ආශ්‍රයෙන් ගොඩනැගිලි ද්‍රව්‍ය නිපදවීම	500 0	750 0	1,000 0
24.	වී හා ධාන්‍ය වර්ග ඇඹරුම්හල්	500 0	750 0	1,000 0
25.	කුරක්කන්, හාල් පිටි කිරීම	500 0	750 0	1,000 0
26.	පොල්තෙල් මෝලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
27.	කම්හල් (යකඩ වැඩපල)	500 0	750 0	1,000 0
28.	යාන්ත්‍රික ලේත් වැඩපල	500 0	750 0	1,000 0
29.	වෑල්ඩින් වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
30.	ඇළුමිනියම් වෑද්දුම්/වාත්තු වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
31.	ඇලුමිනියම් පිත්තල ආශ්‍රිත පිත්තල වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
32.	දුනු වැඩපල	500 0	750 0	1,000 0
33.	ගිනි පෙට්ටි කම්හලක්	500 0	750 0	1,000 0
34.	කාබනික පොහොර නිපදවීමේ ස්ථානයක්	500 0	750 0	1,000 0
35.	සත්ව ඇටකටු ගබඩාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
36.	හම් ගබඩාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
37.	මැටි භාණ්ඩ නිෂ්පාදනය	500 0	750 0	1,000 0
38.	ඉටිපන්දම්/හඳුන්කුරු නිෂ්පාදනය	500 0	750 0	1,000 0
39.	වෙස් මුහුණු නිපදවීමේ ස්ථානයක්	500 0	750 0	1,000 0
40.	සබන් නිෂ්පාදන ස්ථානයක්	500 0	750 0	1,000 0
41.	වේවල් භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
42.	සබන් හා පිරිසිදු කිරීමේ රසායන ද්‍රව්‍ය නිෂ්පාදනය	500 0	750 0	1,000 0
43.	ප්ලාස්ටික් ද්‍රව්‍ය නිෂ්පාදනය	500 0	750 0	1,000 0
44.	බතික් වැඩපලක් හෝ රෙදි මෝස්තර කිරීමේ ස්ථානයක්	500 0	750 0	1,000 0
45.	මදුරුදැල් මහන ස්ථානයක් හෝ විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

	I වැනි තීරය	*II වැනි තීරය*		
		ස්ථානයේ වාර්ෂික වටිනාකම රුපියල්		
අනු. අංකය	*කර්මාන්තයේ ස්වභාවය*	*රු. 750 නොඉක්මවන අවස්ථාවක*	*රු. 751 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,501 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
46.	ජුකී මැෂින් අලුත්වැඩියාව	500 0	750 0	1,000 0
47.	අත් යන්ත්‍ර රෙදි විවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
48.	බලවේග රෙදි විවීමේ කම්හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
49.	පාවහන් නිෂ්පාදන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
50.	දේශීය බෙහෙත් වර්ග නිපදවීම	500 0	750 0	1,000 0
51.	බීඩි කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
52.	ඔරලෝසු අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
53.	ගඩොල් පෝරණුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
54.	ලී මෝලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
55.	යාන්ත්‍රික තහඩු නැවීමේ වැඩපලවල්	500 0	750 0	1,000 0
56.	පැස්ටල් හා ලිපිද්‍රව්‍ය නිෂ්පාදනය	500 0	750 0	1,000 0
57.	විදුලි මෝටර් එතීම	500 0	750 0	1,000 0
58.	සයිලන්සර් වැඩපල	500 0	750 0	1,000 0
59.	වාහන සේවා කිරීමේ ස්ථානය් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
60.	රන් භාණ්ඩ නිෂ්පාදනාගාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
61.	රථ වාහන අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

11-463/3

අකුරණ ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා ව්‍යාපාර බද්ද පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, එකී පනතේ 152 වන වගන්තිය යටතේ අකුරණ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර 2023 වර්ෂයේ සැප්තැම්බර් මස 27 වැනි දින තීරණ අංක 1475 යටතේ ව්‍යාපාර බදු මත ගාස්තු පැනවීමට තීරණය කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ අනුව අංක 1955/7 හා 2016.02.23 වැනි දින දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශේෂ ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශයට පත් කරන ලද සම්මත අතුරු ව්‍යවස්ථාව යටතේ අකුරණ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කිසියම් ව්‍යාපාරයක් පවත්වාගෙන යාම සඳහා 2024 වර්ෂයේ දී අකුරණ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක් මත ගාස්තුවක් අයකරනු ලබන බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

2024 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

ඩී. ජී. එම්. බී. රණසිංහ,
ලේකම්,
අකුරණ ප්‍රාදේශීය සභාව.

2023 වර්ෂයේ නොවැම්බර් මස 01 වැනි දින,
අකුරණ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වැනි වගන්තියේ 3 වැනි උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, අකුරණ ප්‍රාදේශීය සභාවේ ලේකම් ලෙස එකී ප්‍රාදේශීය සභාව විසින් වැලඳ ගන්නා ලද ඉහත අතුරු ව්‍යවස්ථාවක් යටතේ හෝ අකුරණ ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවක් යටතේ අකුරණ ප්‍රාදේශීය සභාව විසින් 2024 වර්ෂය තුළදී නිකුත් කරනු ලබන බලපත්‍ර සම්බන්ධයෙන්, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වැනි වගන්තියේ (1) වන උප වගන්තියෙන් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ එකී පනතේ 150 වන වගන්තිය යටතේ යම් කර්මාන්ත බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නාවූ හා වෘත්තියක් නොවන්නා වූ කිසියම් ව්‍යාපාරයක් අකුරණ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2024 වර්ෂයේ දී කරගෙන යනු ලබන සෑම තැනැත්තෙකුගෙන්ම, එකී ව්‍යාපාරයේ ඊට පෙර වර්ෂයේ ලැබීම් මෙහි පහත උපලේඛනයේ අංක 1 හි I තීරුවේ නිරූපිත යම් විෂයාංකයක යම් සීමාවක් ඇතුළත පවත්නා අවස්ථාවක එහි II වැනි තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත අනුප්‍රමාණය අනුව උපලේඛන අංක II හි සඳහන් ව්‍යාපාර සඳහා වූ ව්‍යාපාර බද්දක් 2024 වර්ෂය සඳහා පනවා අයකිරීමටත්, බද්දට යටත් යම් තැනැත්තකු එකී ව්‍යාපාර බද්ද 2024 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර අකුරණ ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් අකුරණ ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

උපලේඛනය 1

	1 වැනි තීරුව	*11 වැනි තීරුව*
	බද්ද අදාළ වන වර්ෂයට පෙර වර්ෂයේ ව්‍යාපාරයෙන් ලත් ලැබීම් ප්‍රමාණය	*ගෙවිය යුතු බද්ද*
		රු. ශත
1.	රු. 6,000.00 නොඉක්මවන අවස්ථාවක ගෙවිය යුතු බද්ද	නැත
2.	රු. 6,001.00 ඉක්මවන එහෙත් රු.12,000.00 නොඉක්මවන විට	90 0
3.	රු. 12,001.00 ඉක්මවන එහෙත් රු.18,750.00 නොඉක්මවන විට	180 0
4.	රු. 18,751.00 ඉක්මවන එහෙත් රු.75,000.00 නොඉක්මවන විට	360 0
5.	රු. 75,001.00 ඉක්මවන එහෙත් රු.1,50,000.00 නොඉක්මවන විට	1,200 0
6.	රු. 1,50,001.00 ඉක්මවන විට	3,000 0

උපලේඛනය II

01. කොමිස් ඒජන්තවරු
02. වෙන්දේසිකරුවන්
03. බ්‍රෝකර්වරුන්
04. මුදල් ආයෝජකයින් (මෙරට)
05. මුදල් ආයෝජකයින් (අපනයන ව්‍යාපාරිකයින්)
06. කොන්ත්‍රාත්කරුවන්
07. සැපයුම්කරුවන් (ගොඩනැගිලි, නිමි ඇඟලුම්, ලිපි ද්‍රව්‍ය, සුඛෝපභෝගී භාණ්ඩ සහ වෙනත්)
08. රියදුරු පුහුණු ආයතන
09. පෞද්ගලික පංති පවත්වන්නන්.
10. හජ්ජ්/දඹදිව/යාත්‍රා යන ආගමිකයින් හා විදේශ සංචාර ගෙනයාමේ නියෝජිත කාර්යාලයක් පවත්වාගෙන යාම
11. විදේශ රැකියා ඒජන්සියක් පවත්වාගෙන යාම
12. ලොතරැයි නියෝජිතයින්
13. රේස් ඔට්ටු පොලවල්
14. රක්ෂණ නියෝජිත කාර්යාල
15. මෝටර් රථ වාහන වෙළෙඳාම් කරන්නන්
16. ඒජන්සි තැපැල්හල්/ඒජන්සි වෙළෙඳසැල්
17. රන් ආභරණ වෙළෙඳසැල්
18. වෙළෙඳ කටයුතු සඳහා වූ ප්‍රවාහන කුළියට දීමේ බදු

19. පෞද්ගලික/රජයේ බැංකු සේවා ස්ථාන
20. දුව සැපයුම්කරු ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
21. සුඛෝපභෝගී ගොඩනැගිලි උපකරණ ආනයනය කිරීම/විකිණීම
22. ශාලා කුළියට දීම (උත්සව ශාලා)
23. රා/රටබීම/අරක්කු/බීමහල් (තැබෑරුම්)
24. රූපවාහිනී සම්ප්‍රේෂණ කුළුනක් පවත්වාගෙන යාම
25. දුරකථන සේවා මධ්‍යස්ථාන (කොමියුනිකේෂන්)
26. පාසල් වෑන් රථ
27. යන්ත්‍රෝපකරණ අලෙවිය
28. අලෙවි නියෝජිත ආයතන
29. දේශීය/බටහිර වෛද්‍ය මධ්‍යස්ථාන
30. ඉන්ධන පිරවුම්හල්
31. ලී වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
32. ගෑස් අලෙවිය
33. කොන්ක්‍රීට් පෙර සවි භාණ්ඩ නිෂ්පාදන හා අලෙවිය
34. ඇඟළුම් ව්‍යාපාරය
35. උළු, ගල්, වැලි, ගඩොල් සැපයීම හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
36. මෙඩි ලැබ් (ලේ හා මුත්‍රා පරීක්ෂා කිරීමේ) ඒකකයක් පවත්වාගෙන යාම
37. දන්ත ශල්‍යාගාරයක් පවත්වාගෙන යාම
38. සමාජ ශාලාවක් පවත්වාගෙන යාම
39. බටහිර ඖෂධ අලෙවිය
40. ජලය බෝතල් කර විකිණීම
41. රෙදිපිළි වෙළෙඳාම
42. නිමි ඇඳුම් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
43. රථවාහන අංගනයක් පවත්වාගෙන යාම
44. සැලසුම් ශිල්පී ආයතනයක් පවත්වාගෙන යාම
45. විදුලි හා ගෘහ උපකරණ
46. පරිගණක පන්තියක් පවත්වාගෙන යාම
47. සුළු අපනයන භෝග එකතු කිරීම
48. විදේශ චෙක්පත්/මුදල් මාරු කරන ස්ථානයක් පවත්වාගෙන යාම
49. මුද්‍රණාලයක් පවත්වාගෙන යාම
50. හෙද සේවා ආයතනයක් පවත්වාගෙන යාම
51. අන්තර්ජාල පහසුකම් සැපයීම
52. පොත් ප්‍රකාශන ආයතනයක් පවත්වාගෙන යාම
53. පෞද්ගලික (ජාත්‍යන්තර) පාසල්
54. සංචාරක සේවා සැපයීම
55. ප්‍රවාහන සේවා ආයතනයක් පවත්වාගෙන යාම (කැබ් සර්විස්)
56. ලිහිසි තෙල් වෙළෙඳාම
57. පෞද්ගලික ආරක්ෂක සේවා
58. මධ්‍යසාර ගබඩාව
59. සාප්පු බඩු වෙළෙඳාම
60. වැඩසටහන් නිෂ්පාදනය සහ ප්‍රචාරණය
61. සිමෙන්ති අලෙවිය
62. හුණු තොග වශයෙන් ගබඩාකර විකිණීම
63. තීන්ත වර්ග ගබඩාකර විකිණීම
64. ඇස්බැස්ටෝස් සෙවිලි තහඩු ගබඩාකර විකිණීම
65. ක්‍රීඩා සමාජයක් පවත්වාගෙන යාම

66. විසිතුරු මසුන් අලෙවිය
67. රෙදි කැබලි ගබඩා කර විකිණීම
68. විදුලි රැහැන් ඇදීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
69. ශබ්ද විකාශන යන්ත්‍ර කුළියට දීම
70. ගෘහ භාණ්ඩ වෙළෙඳසැලක් පවත්වාගෙන යාම
71. ඇඳුම් මැසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම (කුඩා)
72. හිස් බෝතල්/ගෝනි/යකඩ බඩු ගඩබා කර විකිණීම
73. යකඩ බඩු කඩයක් පවත්වාගෙන යාම
74. පරිගණක උපාංග විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
75. රථවාහන අමතර කොටස් අලෙවිය
76. අටපිරිකර පූජා භාණ්ඩ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
77. ජංගම ලොතරැයි කුට්
78. ප්ලාස්ටික් බඩු අලෙවිය
79. පාවහන් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
80. අවමංගල්‍ය උත්සව භාණ්ඩ සැපයීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
81. මංගල උත්සව භාණ්ඩ සැපයීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
82. උද්‍යාන සැලසුම් ස්ථානයක් පවත්වාගෙන යාම
83. වේවැල් භාණ්ඩ අලෙවි කිරීම
84. සම් භාණ්ඩ විකිණීම
85. ලෝහ අත්කම් භාණ්ඩ අලෙවිය
86. පොල් විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම
87. ඇස් කණ්නාඩි අලෙවි කිරීම
88. මැටි භාණ්ඩ අලෙවිය
89. පැළ වර්ග අලෙවිය
90. සනීපාරක්ෂක භාණ්ඩ අලෙවිය
91. වාහන බැටරි විකිණීම
92. ජ්‍යෝතිෂ්‍ය කටයුතු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
93. ස්ථාවර හා ජංගම දුරකතන සම්බන්ධතා නිකුත් කිරීමේ තාවකාලික වෙළෙඳ කුටියක් පවත්වාගෙන යාම (දිනකට)
94. සෙලියුලර් දුරකතන හා දුරකතන අමතර කොටස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
95. දේශීය ආයුර්වේද ඖෂධ අලෙවිය
96. සත්ව ආහාර නිෂ්පාදනය හා අලෙවිය
97. කැබලි රෙදි අලෙවිය
98. ළදරු සනීපාරක්ෂක භාණ්ඩ වෙළෙඳාම
99. පාසල් උපකරණ හා ලිපිද්‍රව්‍ය අලෙවිය
100. ග්‍රොසරි වෙළෙඳසැලක් පවත්වාගෙන යාම
101. සුපිරි වෙළෙඳසැලක් පවත්වාගෙන යාම
102. එළවළු/සහල්/සිල්ලර බඩු/පොල්තෙල්/සීනි/පිටි එක් එක් භාණ්ඩ මිලට යටත්ව අලෙවි කිරීම
103. සහල් තොග හෝ සිල්ලරට විකිණීමේ වෙළෙඳසැලක් පවත්වාගෙන යාම
104. බුලත්, පුවක්, කොහු, ඉඳල්, කෙසෙල් කැන්, පලා වර්ග, තැඹිලි විකිණීම (සාමාන්‍ය වෙළෙඳාම)
105. වායු තුවක්කු අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
106. මැණික් ඔපදැමීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
107. දේශීය/බටහිර පෞද්ගලික රෝහලක් පවත්වාගෙන යාම
108. පිරිසිදු කිරීමේ සේවා ස්ථානයක් පවත්වාගෙන යාම
109. මුල් ඇඳුම් කුළියට දීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
110. මෝටර් රථ ධාවන පථයක් පවත්වාගෙන යාම
111. වාහන කැසට් අලෙවිය
112. උකස් මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම

113. විද්‍යුත් මාර්ග ඔස්සේ වෙළඳාම් කිරීම (Online)
114. පොහොර ගබඩාවක් පවත්වාගෙන යාම
115. සෙල්ලම් ක්‍රීඩා භාණ්ඩ වෙළඳාම
116. පැල තවානක් පවත්වාගෙන යාම
117. ලී මෝලක් පවත්වාගෙන යාම
118. මංගල හා අවමංගල සේවා සැපයීම

* 2024 බලපත්‍ර හා බදු පැනවීම අනුව බලපත්‍රයකට හෝ කර්මාන්ත බද්දකට යටත් නොවන ව්‍යාපාර වේ නම් එම සියලුම ව්‍යාපාර, ව්‍යාපාර බදුවලට යටත් වේ.

11-463/4

අකුරණ ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා ගෝ ඝාතක ආඥාපනත

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, පහත උපලේඛනයේ සඳහන් අය විසින් ඒ ඒ ස්ථානයන්හි පොද්ගලික එළගවමස්, එළමස් වෙළඳාම් කරගෙන යාම සඳහා බලපත්‍ර ලබා ගැනීමට ඉදිරිපත්ව සිටින බව ගෝඝාතක ආඥාපනතේ 272 වැනි අධිකාරය 7(2) වැනි වගන්තිය ප්‍රකාර 2023 වර්ෂයේ සැප්තැම්බර් මස 27 වැනි දින තීරණ අංක 1477 යටතේ ගාස්තු පැනවීමට තීරණය කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෙම බලපත්‍ර නිකුත් කිරීම පිළිබඳව අකුරණ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පදිංචි යම් අයෙකු විරුද්ධවන්නේ නම්, ඔහු හෝ ඇය විරුද්ධ වන්නේ කුමක් නිසාද යන වග සඳහන් ලියවිල්ලක් පිටපත් දෙකකින් යුක්තව මෙම දැන්වීම *ගැසට් පත්‍රයේ* පළවූ දින සිට දින 14ක් (දාහතරක්) ඇතුළත මාවෙත ඉදිරිපත් කළ යුතු බව මෙයින් දන්වමි.

මෙම කාල සීමාව තුළ මෙම නිවේදනය පිළිබඳව යම් විරුද්ධත්වයක් ඉදිරිපත් නොවුවහොත් පහත උපලේඛනයේ සඳහන් ඉල්ලුම්කරුවන් වෙත අදාළ ව්‍යාපාර ස්ථානවල වෙළෙදාම කරගෙන යාම සඳහා 2024.01.01 සිට 2024.12.31 වැනි දින දක්වා බලපත්‍ර ලබා දීම කරන බව පොදු මහජනතාවගේ දැනගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

ඩී. ජී. එම්. බී. රණසිංහ,
ලේකම්,
අකුරණ ප්‍රාදේශීය සභාව,

2023 වර්ෂයේ නොවැම්බර් මස 01 වැනි දින,
අකුරණ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

අනු. අංකය	*ඉල්ලුම්කරුගේ නම*	*ගවමස් වෙළෙඳසැල පවත්වාගෙන යාමට අපේක්ෂිත ස්ථානය*	*වෙළඳාමේ ස්වභාවය*
01.	එම්. නිෆ්රාස් මයා	අංක 276, කුරුඳුගහඇළ, මාතලේ පාර, අකුරණ	ගවමස්
02.	හනීෆා සරීනා බේගම් මිය	අංක 203, මාතලේ පාර, 7 කණුව, අකුරණ	ගවමස්
03.	එස්. එම්. සියාම් මොහොමඩ් මයා	අංක 17/ඒ, දුනුවිල පාර, අකුරණ	ගවමස්
04.	එස්. එම්. සියාම් මොහොමඩ් මයා	අංක 29, මාතලේ පාර, කුරුගොඩ හන්දිය	ගවමස්
05.	ඒ. එච්. ටී. එම්. අස්කර් මයා	අංක 372, රඹුකේඇළ. විලානගම	ගවමස්
06.	ඩබ්. එච්. එම්. එම්. සත්තාර් මයා	අංක 469/5, කසාවත්ත, බටුගොඩ	ගවමස්
07.	එම්. අයි. එම්. රිස්වාන් මයා	අංක 225/1, තෙළඹුගහවත්ත, අකුරණ	ගවමස්
08.	එම්. එම්. රිස්වාන් මයා	අංක 247, කුරුඳුගහඇළ, අකුරණ	ගවමස්
09.	කේ. එම්. පී. ඒ. සී. මොහොමඩ් මුන්සීන් මයා	අංක 274, කුරුඳුගහඇළ, මාතලේ පාර, අකුරණ	ගවමස්

අනු. අංකය	ඉල්ලුම්කරුගේ නම	ගවමස් වෙළෙඳසැල පවත්වාගෙන යාමට අපේක්ෂිත ස්ථානය	වෙළඳාමේ ස්වභාවය
10.	එස්. එච්. බී. සමාන් මයා	අංක 462, මාතලේ පාර, අකුරණ	ගවමස්
11.	ජේ. එම්. පයාස් මයා	අංක 242, මාතලේ පාර, අකුරණ	ගවමස්
12.	මොහොමඩ් ෆාසි මයා / මොහොමඩ් ෆාසීන් මයා	අංක 145/ජී, මාතලේ පාර, අකුරණ	ගවමස්
13.	එම්. ඒ. එම්. අනාස් මයා	අංක 444, මාතලේ පාර, අකුරණ	ගවමස්
14.	එම්. වයි. එම්. අස්වර් මයා	අංක 193/2, බුළුගොහාතැන්න, අකුරණ	ගවමස්
15.	එම්. එච්. එම්. අම්හාර් මයා	අංක 232, මාතලේ පාර, අකුරණ	ගවමස්
16.	එම්. ඒ. එම්. සම්රි මයා	අංක 32/1, දුනුවිල පාර, අකුරණ	ගවමස්
17.	එස්. එස්. ඉබ්‍රාහිම් මයා	අංක 84/4/D, පල්ලේවැලිකැටිය, අකුරණ	ගවමස්
18.	එස්. එම්. සියාම් මොහොමඩ් මයා	අංක 150, මාතලේ පාර, අකුරණ	ගවමස්
19.	ඕ. එම්. රිස්වාන් මයා	අංක 65, උඩවැලිකැටිය, බුළුගොහොතැන්න, අකුරණ	ගවමස්
20.	එම්. බී. සිත්ති වසීලා මිය	අංක 190/188, පල්ලේවැලිකැටිය, බුළුගොහොතැන්න	ගවමස්
21.	එම්. ජේ. එම්. ෆයිසාල් මයා	අංක 253/3, පන්ගොල්ලාමඩ, අකුරණ	ගවමස්
22.	ඩී. එම්. මුසම්මිල් මයා	නීරැල්ල, මේල්චේන, අකුරණ	ගවමස්

අනු. අංකය	ඉල්ලුම්කරුගේ නම	එළුමස් වෙළෙඳසැල පවත්වාගෙන යාමට අපේක්ෂිත ස්ථානය	වෙළඳාමේ ස්වභාවය
01.	එස්. එම්. සියාම් මොහොමඩ් මයා	අංක 17/ඒ, දුනුවිල පාර, අකුරණ	එළු මස්
02.	එස්. එම්. සියාම් මොහොමඩ් මයා	අංක 150, මාතලේ පාර, අකුරණ	එළු මස්
03.	එස්. එච්. බී. සමාන් මයා	අංක 462, මාතලේ පාර, අකුරණ	එළු මස්

11-463/5

අකුරණ ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා වෙනත් ආදායම් අය කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, 2023 වර්ෂයේ සැප්තැම්බර් මස 27 වැනි දින තීරණ අංක 148 යටතේ ව්‍යාපාර බදු මත ගාස්තු පැනවීමට තීරණය කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩී. ජී. එම්. බී. රණසිංහ,
ලේකම්,
අකුරණ ප්‍රාදේශීය සභාව,

2023 වර්ෂයේ නොවැම්බර් මස 01 වැනි දින,
අකුරණ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වැනි වගන්තියේ 3 වැනි උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව අකුරණ ප්‍රාදේශීය සභාවේ ලේකම් ලෙස 2024 වර්ෂයේ දී වෙනත් ආදායම් අය කිරීම සඳහා පහත උපලේඛනයේ සඳහන් සේවාවන් වෙනුවෙන් ගාස්තු පනවා අය කිරීමට තීරණය කරමි.

උපලේඛනය

	සේවාව		*ගාස්තුව* *රු. ශත*
01.	**ජල බවුසරය කුළියට දීම (ප්‍රාදේශීය සභා සීමාව තුළ) :**	**3000L**	**1500L**
	ආගමික ස්ථානයක් සඳහා	1,000 0	750 0
	අවමංගල්‍ය ස්ථාන සඳහා	2,000 0	750 0
	අනෙකුත්	5,000 0	3,000 0
	බල ප්‍රදේශයේ නියං කාලවල දී නොමිලයේ ලබාදීම		
	බල ප්‍රදේශයෙන් පිටත කි.මී. 1ක් සඳහා ප්‍රවාහන ගාස්තුව		500 0
	ජල බවුසරය රඳවා ගැනීමේ ගාස්තු :		
	පළමු පැය 2 සඳහා නොමිලේ ලබාදීම		
	වැඩිවන පළමු පැය සඳහා		200 0
	දෙවන පැය සඳහා		300 0
	ඉන්පසු වැඩිවන සෑම පැයකටම		350 0
02.	**බැකෝ යන්ත්‍රය කුළියට දීම (මීටර් පැයට)**		5,000 0
	පැය 5ට වඩා වැඩි නම්		4,500 0
03.	මෝටර් ග්‍රේඩරය කුලියට දීම		7,500 0
04.	**ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාව කුළියට දීම (දිනකට)**		
	ආසන 250ට වැඩි		20,000 0
	ආසන 100-250 අතර		15,000 0
	ආසන 100 සඳහා		10,000 0
05.	පුටු කුළියට දීම - එක් පුටුවක් සඳහා (දිනකට)		15 0
	පුටු කුළියට දීම - තැන්පත් මුදල		5,000 0
06.	කොඩි කණු කුළියට දීම - එක් කොඩි කණුවක් සඳහා (දිනකට)		50 0
	කොඩි කණු කුළියට දීම - තැන්පත් මුදල		3,000 0
07.	කොම්පෝස්ට් පොහොර කි.ග්‍රෑ. 01 (සිල්ලර)		20 0
	කොම්පෝස්ට් පොහොර කි.ග්‍රෑ. (තොග)		10 0 - 15 0
08.	කොම්පෝස්ට් බඳුන් 01 ක් (කොන්ක්‍රීට්)	මිලදී ගන්නා ලද වටිනාකමේ 75%	
09.	අකුරණ නගරයේ පොදු වැසිකිලිය සඳහා ගාස්තු අය කිරීම (එක් අයකුට)		10 0
10.	වීථි රේඛා නිකුත් කිරීම		2,500 0
	නිකුත් කරන ලද වීථි රේඛා සහතිකයක් මාස හයක් ඇතුළත සංශෝධන කර සහතිකයක් ලබා ගැනීමට ඒ සඳහා අය කළ යුතු අතිරේක ගාස්තුව		500 0
11.	මස් ප්‍රවාහන බලපත්‍ර නැවත සංශෝධනය කිරීමේ ගාස්තු		3,000 0
12.	එළ ගව මස් ප්‍රවාහනය සඳහා මස් කි. ග්‍රෑම් 500 දක්වා ගාස්තුව		5,000 0
13.	එළ ගව මස් ප්‍රවාහනය සඳහා මස් කි. ග්‍රෑම් 500 සිට 1,500 දක්වා ගාස්තුව		7,500 0
14.	එළ ගව මස් ප්‍රවාහනය සඳහා මස් කි. ග්‍රෑම් 1500 වැඩි ගාස්තුව		12,000 0

	සේවාව	*ගාස්තුව රු. ශත*
15.	එළු මස් ප්‍රවාහනය සඳහා මස් කි. ග්‍රෑම් 500 දක්වා ගාස්තුව	2,000 0
16.	එළු මස් ප්‍රවාහනය සඳහා මස් කි. ග්‍රෑම් 1,500 ට වැඩි ගාස්තුව	5,000 0
17.	වෙළෙඳ බලපත්‍ර පෝරම නිකුත් කිරීම	100 0
18.	වෙළෙඳ බලපත්‍රයක හා ව්‍යාපාර බදු ලිපියක පිටපතක් ලබා දීම	250 0
19.	ඉඩම් අනුබෙදුම් පෝරම ගාස්තු	1,000 0
20.	ගොඩනැගිලි අයදුම්පත්‍ර ගාස්තුව	2,700 0
21.	සැලසුම් ශිල්පීය ගාස්තු (වාර්ෂික)	3,000 0
22.	වරිපනම් ලේඛනයේ නම වෙනස් කිරීමේ පෝරම ගාස්තු :	100 0
23.	පරීක්ෂණ ගාස්තු	1,500 0
24.	ගලිරථ සේවා සඳහා අවසර ලිපි නිකුත් කිරීම	500 0
25.	**ව්‍යාපාර ප්‍රවර්ධන වැඩසටහන් සඳහා අයකරන ගාස්තු :**	
	1. කුඩා ලොරි රථය - දිනකට	3,000 0
	2. ලොකු ලොරි රථය - දිනකට	5,000 0
	3. කුඩයක් හෝ ආවරණයක් සඳහා - දිනකට	500 0
26.	ගිවිසුම්පත්‍ර ගාස්තු	1,500 0
27.	ජල නළ එලීම සඳහා මාර්ග පළුදු කිරීමේ ගාස්තු	
	1. පස් පාරක් සඳහා - තැන්පත් මුදල	3,000 0
	පරිපාලන ගාස්තු	1,000 0
	2. කොන්ක්‍රීට් / කැටගල් පාර - තැන්පත් මුදල	15,000 0
	පරිපාලන ගාස්තු	1,500 0
	3. තාර පාර - තැන්පත් මුදල	15,000 0
	පාරිපාලන ගාස්තු	1,500 0

28. **විනෝද බදු :**

28.1 විනෝද බදු ආඥාපනතේ 02 වන වගන්තියේ 1 වන උප වගන්තිය යටතේ මුද්‍රිත ප්‍රවේශපත්‍රවල සඳහන් වටිනාකමින් 5% - 25% අතර මුදලක් විනෝද බදු වශයෙන් සභාවට ගෙවිය යුතු වන්නේය.

28.2 ප්‍රසිද්ධ රැගුම් ආඥාපනත යටතේ සංගීත සංදර්ශනයක්, නාට්‍යයක්, සර්කස් සංදර්ශනයක් චිත්‍රපටියක් ප්‍රදර්ශනය කිරීම සඳහා බලපත්‍ර ගාස්තු පහත සඳහන් ආකාරයට වන්නේය.

දිනකට 1,000 0

29. වෙන්දේසිකරුවන් හා තැරැව්කරුවන්ගේ ආඥාපනත යටතේ යම් පුද්ගලයෙකු තැරැව්කරුවෙකු හෝ වෙන්දේසි කරුවෙකු වශයෙන් අකුරණ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ක්‍රියා කරන්නේ නම් ඒ සඳහා වාර්ෂිකව පහත සඳහන් ගාස්තු ගෙවා බලපත්‍රයක් ලබාගත යුතුය.

වෙන්දේසිකරුවෙකු	රු. 3,000 0
තැරැව්කරුවෙකු	රු. 3,000 0

30. අලවතුගොඩ ප්‍රාදේශීය සභා ක්‍රීඩා පිටියට ගාස්තු අයකිරීම

මුදල් අයකරන සංදර්ශන සඳහා	රු. 20,000 0
වෙනත්	රු. 3,000 0

31. ගව ජීවදානය සඳහා දූනට එක් ගවයෙක් සඳහා රු. 1,000 0

32. **වරිපනම් උධෘත නිකුත් කිරීම වෙනුවෙන් ගාස්තු අය කිරීම**

1. දේපළ ලේඛන සෙවීමේ ගාස්තු (වර්ෂයකට)	රු. 40 0
2. පිටපත් කිරීමේ ගාස්තු (එක් පිටුවකට)	රු. 20 0
3. උධෘත පරීක්ෂා කිරීමේ ගාස්තු වර්ෂයකට	රු. 15 0

11-463/6

අකුරණ ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා වාහන හා සතුන් පිළිබඳ බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, එකී පනතේ 147 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 148 වන වගන්තිය සහ හතරවන උපලේඛනයේ විධිවිධානවලින් අකුරණ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර 2023 වර්ෂයේ සැප්තැම්බර් මස 27 වැනි දින තීරණ අංක 1479 යටතේ වාහන හා සතුන් පිළිබඳ බදු පැනවීමට තීරණය කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වැනි වගන්තියේ 3 වැනි උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, අකුරණ ප්‍රාදේශීය සභාවේ ලේකම් ලෙස අකුරණ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වන වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 148 වන වගන්තිය සහ හතරවන උපලේඛනයේ විධිවිධාන වල ඇතුළත් බද්දට යටත් වන කිසියම් වාහනයක් හෝ සතෙකු තබා ගන්නා සෑම තැනැත්තෙකු තමා විසින්, එකී වාහනය හෝ සතා තමන් භාරයේ තබා ගන්නා දින ගණන දින තිහක් සම්පූර්ණ වූ වහාම 2024 වර්ෂය සඳහා වන මෙම බද්ද අකුරණ ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

ඩී. ජී. එම්. බී. රණසිංහ,
ලේකම්,
අකුරණ ප්‍රාදේශීය සභාව,

2023 වර්ෂයේ නොවැම්බර් මස 01 වැනි දින,
අකුරණ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

"1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වන වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 148 වන වගන්තිය සහ හතරවන උපලේඛනයේ විධිවිධානවලින් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර අකුරණ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2024 වර්ෂයේ දී පහත උපලේඛනයේ I වන තීරුවේ සඳහන් කිසියම් වාහනයක් හෝ සතෙකු තමා සන්තකයේ තබා ගන්නා සෑම තැනැත්තෙකු මත ම, එහි II වැනි තීරුවේ අනුරූපිත සටහනෙහි නිරූපිත බද්දක් 2024 වර්ෂය සඳහා පනවා අය කිරීමට අකුරණ ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

උපලේඛනය

			I වැනි තීරුව	*II වැනි තීරුව*
				රු. ශත
(1)	(i)	මෝටර් රථයක්, මෝටර් ට්‍රයිකාරයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, ජීප් රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා		25 0
	(ii)	සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාරයක් හෝ බයිසිකල් කරත්තයක් සඳහා		
		(අ) වෙළෙඳ කාර්යයක් සඳහා යොදවන්නේ නම්		18 0
		(ආ) වෙළෙඳ නොවන කාර්යයක් සඳහා යොදවන්නේ නම්		4 0
	(iii)	සෑම කරත්තයක් සඳහා		20 0
	(iv)	සෑම අත්කරත්තයක් සඳහා		10 0
	(v)	සෑම රික්ෂෝවක් සඳහා		7 0
	(vi)	සෑම අශ්වයෙකු, පෝනියෙකු හෝ කොටලුවෙකු සඳහා		15 0
	(vii)	සෑම ඇතෙකු සඳහා		50 0

(2) විශ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝද සහිත ළමා වාහන, වීල් බැරෝ, හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළෙඳ කාර්ය සඳහා යොදවන අත්කරත්ත සහ වෙළෙඳ කාර්ය සඳහා නොයොදවන අත්කරත්ත ඉහත ගෙවීමෙන් නිදහස් කෙරේ.

11-463/7

අකුරණ ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා ඉඩම් විකිණීම මත බදු අය කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, එකී පනතේ 154-101 වැනි වගන්තිය යටතේ අකුරණ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර 2023 වර්ෂයේ සැප්තැම්බර් මස 27 වැනි දින තීරණ අංක 1480 යටතේ බලපත්‍ර මත ගාස්තු පැනවීමට තීරණය කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වැනි වගන්තියේ 3 වැනි උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, අකුරණ ප්‍රාදේශීය සභාවේ ලේකම් ලෙස අකුරණ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත වූ යම් ඉඩමක් වෙන්දේසිකරුවෙකු හෝ තැරැව්කරුවෙකු හෝ ඔහුගේ සේවකයා හෝ අනුයෝජකයා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ හෝ අන්‍යාකාරයෙන් විකුණනු ලබන අවස්ථාවක ඒ ඉඩම විකිණීමෙන් ලත් මුදලින් 1%ක සමාන බද්දක් විකුණුම්කරු හෝ වෙන්දේසිකරු හෝ තැරැව්කරු හෝ ඔහුගේ සේවකයා හෝ අනුයෝජකයා විසින් අකුරණ ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ බලතල ප්‍රකාරව 154 (01) වැනි වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව මෙයින් දැනුම් දෙමි.

ඩී. ජී. එම්. බී. රණසිංහ,
ලේකම්,
අකුරණ ප්‍රාදේශීය සභාව,

2023 වර්ෂයේ නොවැම්බර් මස 01 වැනි දින,
අකුරණ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

11-463/8

අකුරණ ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා කුලී රථ වාහන හා නවතා තැබීමේ ස්ථාන ලියාපදිංචි කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, එකී පනතේ 147 වැනි වගන්තිය යටතේ අකුරණ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර 2023 වර්ෂයේ සැප්තැම්බර් මස 27 වැනි දින තීරණ අංක 1481 යටතේ බලපත්‍ර ගාස්තු පැනවීමට තීරණය කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ අනුව අංක 1955/7 හා 2016.02.23 දින දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශයට පත් කරන ලද සම්මත අතුරු ව්‍යවස්ථාව යටතේ අකුරණ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කුළී රථ වාහන නවතා තැබීම සඳහා 2024 වර්ෂය සඳහා වන මෙම බද්ද අකුරණ ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

ඒ අනුව කිසියම් අතුරු ව්‍යවස්ථාවක් යටතේ අකුරණ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කුළී රථ වාහන නවතා තැබීම සඳහා 2024 වර්ෂය සඳහා වන මෙම බද්ද අකුරණ ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

ඩී. ජී. එම්. බී. රණසිංහ,
ලේකම්,
අකුරණ ප්‍රාදේශීය සභාව,

2023 වර්ෂයේ නොවැම්බර් මස 01 වැනි දින,
අකුරණ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වැනි වගන්තියේ 3 වැනි උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, අකුරණ ප්‍රාදේශීය සභාවේ ලේකම් ලෙස අකුරණ ප්‍රාදේශීය සභාව විසින් සාදන ලද අතුරු ව්‍යවස්ථාව යටතේ අකුරණ ප්‍රාදේශීය සභාව විසින් 2024 වර්ෂය තුළදී කුළී රථ වාහන නවතා තැබීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වන වගන්තියේ (1) වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 126 වන වගන්තිය සහ හත්වන උප වගන්තියේ 'ඌ' ඡේදය යටතේ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව පහත I වැනි තීරුවේ සඳහන් එක් එක් කුලී රථ වාහනයක් වෙනුවෙන් එම II වැනි තීරුවේ අනුරූපිත සටහනෙහි නිරූපිත ප්‍රමාණයක කුලී රථ නවතා තැබීමේ ගාස්තුවක් අය කිරීමට අකුරණ ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

අනු. අංකය	*I වැනි තීරුව* *කුලී රථ වාහනය*	*II වැනි තීරුව* *ගාස්තු ප්‍රමාණයට වර්ෂයකට* *රු. ශත*
01	ලොරියක් සඳහා	6,000 0
02	වෑන් රථයක් සඳහා	6,000 0
03	ත්‍රිරෝද රථයක් සඳහා	3,500 0
04	එන්ජින් ධාරිතාව 1000ට අඩු බට්ටා ලොරි රථයක් සඳහා	5,000 0
05	ත්‍රිරෝද රථ නැවතුම්පොලට නව ත්‍රිරෝද රථයක් ලියාපදිංචි කිරීම සඳහා	
	ප්‍රධාන මාර්ගයක	30,000 0
	අතුරු මාර්ගයක	10,000 0

11-463/9

අකුරණ ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා සංවර්ධනය නොකළ ඉඩම් මත බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, එකී පනතේ 153 වැනි වගන්තිය (I) වැනි උප වගන්තිය යටතේ අකුරණ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර 2023 වර්ෂයේ සැප්තැම්බර් මස 27 වැනි දින තීරණ අංක 1482 යටතේ සංවර්ධනය නොකළ ඉඩම් මත බදු පැනවීමට තීරණය කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩී. ජී. එම්. බී. රණසිංහ,
ලේකම්,
අකුරණ ප්‍රාදේශීය සභාව,

2023 වර්ෂයේ නොවැම්බර් මස 01 වැනි දින,
අකුරණ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වැනි වගන්තියේ 3 වැනි උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, අකුරණ ප්‍රාදේශීය සභාවේ ලේකම් ලෙස 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 153 වන වගන්තියේ (1) වන උප වගන්තිය අනුව ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර අකුරණ ප්‍රාදේශීය සභා බලප්‍රදේශය ඇතුළත පිහිටි ගොඩනැගිලි ඉදිකිරීමට හෝ *ස්ථාවර නැනහොත්* නිතිපතා ගොවිතැන් කිරීමට සුදුසු යම් ඉඩමක -

(*අ*) ගොඩනැගිලි කිසිවක් ඉදිකර නොමැති නම්, හෝ
(*ආ*) ඒ ඉඩම විධිමත් ලෙස හෝ නිත්‍ය ලෙස වගා කිරීමට යටත් කර නොමැති විටක, හෝ
(*ඇ*) යම් ඉඩමක ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා ආවරණය වී ඇති ප්‍රමාණයට සමාන ප්‍රමාණයක් හැර සෙසු ඉඩම් කොටස් වගා කටයුතු සඳහා හෝ වෙනත් ඵලදායී කටයුත්තකට යොදාගෙන නොමැති විට එසේ ඵලදායී ලෙස යොදා ගෙන නොමැති කොටසද මෙම බද්දට යටත් වේ.

එකී, ඉඩම සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැළකීමට සහ එවැනි සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැළකෙන ඉඩම් මත 2024 වර්ෂය සඳහා ඒ එක් එක් ඉඩමේ, භූමියේ ප්‍රාග්ධන අගයෙන් සියයට 01 (1%) ක වාර්ෂික බද්දක් පැනවීමටත්, එකී සංවර්ධනය නොකළ ඉඩම් මත බද්ද 2024 වර්ෂයේ අප්‍රේල් මස 30 වන දිනට පෙර අකුරණ ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට විධාන කළ යුතු යයි යෝජනා කරන්නීය.

11-463/10

අකුරණ ප්‍රාදේශීය සභාව

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත (272 වැනි අධිකාරය) යටතේ විරෝධතා කැඳවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වැනි වගන්තියේ 3 වැනි උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, අකුරණ ප්‍රාදේශීය සභාවේ ලේකම් ලෙස මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳව ආඥා පනතේ 272 වැනි අධිකාරියේ 7 (2) වැනි වගන්තිය යටතේ 2023 වර්ෂයේ සැප්තැම්බර් මස 27 වැනි දින තීරණ අංක 1483 යටතේ මෙහි පහත සඳහන් අය විසින් උපලේඛනයේ සඳහන් කර ඇති ස්ථානයන්හි, 2024 වර්ෂයට ගෝ ඝාතකාගාරයක් හා එළු ඝාතකාගාරයක් පවත්වාගෙන යාම සඳහා බලපත්‍ර අයදුම්පත්‍ර මා වෙත ඉදිරිපත් කර ඇති බවත්, ඒ සඳහා එම බලපත්‍ර නිකුත් කිරීම පිළිබඳව අකුරණ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පදිංචි හෝ ජීවත්වන අයෙක් හෝ අයවළුන් විරුද්ධ වන්නේ නම් ඔහු හෝ ඇය එසේ විරුද්ධ වන්නේ කුමන හේතූන් පදනම් කරගෙනද යන්න පිළිබඳව විස්තර ලිඛිතව පිටපත් දෙකකින් යුක්තව මෙම දැන්වීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* (ආ) කොටසේ පළවූ දා සිට දින 14 ක් ඇතුළත මා වෙත දන්වා එවිය යුතු බව, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳව ආඥාපනතේ 272 වැනි අධිකාරයේ 7(2) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඩී. ජී. එම්. බී. රණසිංහ,
ලේකම්,
අකුරණ ප්‍රාදේශීය සභාව,

2023 වර්ෂයේ නොවැම්බර් මස 01 වැනි දින,
අකුරණ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

අනු. අංකය	*ඉල්ලුම්කරුගේ නම*	*ගව සාතකාගාරයක් හා එළු සාතකාගාරයක් පවත්වාගෙන යන ලිපිනය*
1.	එස්. එම්. සියාම් මොහොමඩ්	අංක: 253/1, පන්ගොල්ලාමඩ, අකුරණ.

11-463/11

අකුරණ ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා කසළ ගාස්තු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2023 වර්ෂයේ සැප්තැම්බර් මස 27 වැනි දින තීරණ අංක 1478 (iii) යටතේ කසළ ගාස්තු පනවා අය කිරීමට තීරණය කළ බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩී. ජී. එම්. බී. රණසිංහ,
ලේකම්,
අකුරණ ප්‍රාදේශීය සභාව,

2023 වර්ෂයේ නොවැම්බර් මස 01 වැනි දින,
අකුරණ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වැනි වගන්තියේ 3 වැනි උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, අකුරණ ප්‍රාදේශීය සභාවේ ලේකම් ලෙස එකී පනතේ ..... වැනි උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල අනුව හා 1989 අංක 12 දරන පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනතේ 2 වැනි උප වගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු 261 වැනි අධිකාරිය වන 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථාව) පනතේ (2) වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මධ්‍යම පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මධ්‍යම පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2013.06.28 වැනි දින අංක 1816/42 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV (අ) වැනි කොටස පළ කරනු ලැබූ නිවේදනයේ ප්‍රකාශයට පත්කරන ලද්දා වූ ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව 2016 ජනවාරි මස 14 වැනි දින අංක 1950 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රය* මගින් අකුරණ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ක්‍රියාත්මක කිරීම බල ගන්වා ඇත. ඉහත අතුරු ව්‍යවස්ථාව අනුව සහ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පහත උපලේඛනයේ සඳහන් වන පරිදි කසළ ගාස්තුවක් 2024 වර්ෂය සඳහා පනවා අය කිරීමට තීරණය කරමි.

අනු අංකය	*ව්‍යාපාරයේ ස්වභාවය*	*දිනකට කි.ග්‍රෑ. 1-5 දක්වා එකතු වන්නේ නම් මසකට අය විය යුතු ගාස්තුව* රු.ශත	*දිනකට කි.ග්‍රෑ. 6-10 දක්වා එකතු වන්නේ නම් මසකට අය විය යුතු ගාස්තුව* රු.ශත	*දිනකට කි.ග්‍රෑ. 11-19 දක්වා එකතු වන්නේ නම් මසකට අය විය යුතු ගාස්තුව* රු.ශත	*දිනකට කි.ග්‍රෑ. 20-29 දක්වා එකතු වන්නේ නම් මසකට අය විය යුතු ගාස්තුව* රු.ශත	*දිනකට කි.ග්‍රෑ. 30-39 දක්වා එකතු වන්නේ නම් මසකට අය විය යුතු ගාස්තුව* රු.ශත	*දිනකට කි.ග්‍රෑ. 40ට වැඩි වන්නේ නම් මසකට අය විය යුතු ගාස්තුව* රු.ශත
01	හෝටල්	300 0	750 0	1500 0	2500 0	3500 0	5000 0
02	එළවළු/පළතුරු	300 0	750 0	1000 0	1500 0	2000 0	2500 0
03	සුපර් මාර්කට්	550 0	1000 0	1500 0	1750 0	2000 0	2500 0

අනු අංකය	*ව්‍යාපාරයේ ස්වභාවය*	*දිනකට කි.ග්‍රෑ. 1-5 දක්වා එකතු වන්නේ නම් මසකට අය විය යුතු ගාස්තුව රු.ශත*	*දිනකට කි.ග්‍රෑ. 6-10 දක්වා එකතු වන්නේ නම් මසකට අය විය යුතු ගාස්තුව රු.ශත*	*දිනකට කි.ග්‍රෑ. 11-19 දක්වා එකතු වන්නේ නම් මසකට අය විය යුතු ගාස්තුව රු.ශත*	*දිනකට කි.ග්‍රෑ. 20-29 දක්වා එකතු වන්නේ නම් මසකට අය විය යුතු ගාස්තුව රු.ශත*	*දිනකට කි.ග්‍රෑ. 30-39 දක්වා එකතු වන්නේ නම් මසකට අය විය යුතු ගාස්තුව රු.ශත*	*දිනකට කි.ග්‍රෑ. 40ට වැඩි වන්නේ නම් මසකට අය විය යුතු ගාස්තුව රු.ශත*
04	තේ/සිල්ලර කඩ සාප්පු	300 0	750 0	1000 0	1300 0	1700 0	2000 0
05	කර්මාන්ත ශාලා	550 0	1000 0	1500 0	2000 0	2200 0	2500 0
06	පදික වෙළඳාම	150 0	200 0	300 0	500 0	1000 0	1500 0
07	දුරකථන අලෙවිසැල් සහ දුරකථන ඇමතුම් ලබාදෙන ස්ථාන	500 0	750 0	1000 0	1500 0	1750 0	1800 0
08	කාර්යාල හා මූල්‍ය ආයතන	500 0	750 0	1000 0	1500 0	1750 0	1800 0
09	ආරෝග්‍ය ශාලා වෛද්‍ය මධ්‍යස්ථාන වෛද්‍ය පර්යේෂණාගාර (ආසාදිත ද්‍රව්‍ය හැර)	500 0	750 0	1000 0	1250 0	1500 0	1800 0

කසල දාහකය සඳහා නොදිරන කසල ලබා ගැනීම - රාජ්‍ය ආයතන සඳහා කි.ග්‍රෑ.1කට රු. 55.00
පෞද්ගලික ආයතන සඳහා කි.ග්‍රෑ.1කට රු. 55.00

11-463/12

අකුරණ ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා පොළ ගාස්තු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2023 වර්ෂයේ සැප්තැම්බර් මස 27 වැනි දින තීරණ අංක 1478 (ii) යටතේ පොළ ගාස්තු පනවා අය කිරීමට තීරණය කළ බවත්,
පනවන ලද මෙම ගාස්තුව පොළ පැවැත්වෙන දින ප්‍රාදේශීය සභාවට ගාස්තු ගෙවා අකුරණ ප්‍රාදේශීය සභාවේ ලේකම්/ සභාපති වෙතින් බලපත්‍රයක් ලබා ගත යුතු බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩී. ජී. එම්. බී. රණසිංහ,
ලේකම්,
අකුරණ ප්‍රාදේශීය සභාව.

2023 වර්ෂයේ නොවැම්බර් මස 01 වැනි දින,
අකුරණ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වැනි වගන්තියේ 3 වැනි උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, අකුරණ ප්‍රාදේශීය සභාවේ ලේකම් ලෙස එකී පනතේ 126 (xii) වැනි උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල අනුව හා 2016.02.23 වැනි දින අංක 1955/7 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රය* මගින් 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තිය යටතේ පළාත් පාලන නිවාස හා ඉදිකිරීම් ගරු අමාත්‍යතුමන් විසින්

ආයතන පත්කරන ව්‍යවස්ථාවේ ..... වැනි අතුරු ව්‍යවස්ථාව වන ප්‍රාදේශීය සභා පොළ පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව අකුරණ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ යම් පොළ විධිමත් කිරීම පිණිස පහත උපලේඛනයේ සඳහන් වන පරිදි ගාස්තුවක් 2024 වර්ෂය සඳහා පනවා අය කිරීමට එම ගාස්තුව ගෙවිය යුතු යම් තැනැත්තෙක් / ආයතනය අකුරණ ප්‍රාදේශීය සභාවට ගාස්තු ගෙවා බලපත්‍රයක් ලබාගත යුතු බවට තීරණය කරමි.

අකුරණ/අලවතුගොඩ සිකුරාදා සති පොළ ගාස්තු අය කිරීම

	රු. ශත
ලොරි රථ/වෑන් රථ	1,000 0
පොඩි ලොරි රථ/වෑන් රථ	750 0
ත්‍රීරෝද රථ	500 0
හිස්බිම වර්ග අඩියක් සඳහා	10 0

11-463/13

අකුරණ ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා ප්‍රචාරක දැන්වීම් සහ දෘෂ්‍ය පරිසර ප්‍රදර්ශන ගාස්තු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2023 වර්ෂයේ සැප්තැම්බර් මස 27 වැනි දින තීරණ අංක 1478 (i) යටතේ බලපත්‍ර මත ප්‍රචාරක දැන්වීම් සහ දෘෂ්‍ය පරිසර ප්‍රදර්ශන ගාස්තු පනවා අය කිරීමට තීරණය කළ බවත්,

පනවන ලද මෙම ගාස්තුව දැන්වීම් ප්‍රදර්ශනය කිරීමට අදහස් කරන දිනකට යටත් පිරිසෙයින් දින 07කට කලින් ප්‍රාදේශීය සභාවට ගාස්තු ගෙවා අකුරණ ප්‍රාදේශීය සභාවේ ලේකම්/ සභාපති වෙතින් බලපත්‍රයක් ලබා ගත යුතු බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩී. ජී. එම්. බී. රණසිංහ,
ලේකම්,
අකුරණ ප්‍රාදේශීය සභාව,

2023 වර්ෂයේ නොවැම්බර් මස 01 වැනි දින,
අකුරණ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වැනි වගන්තියේ 3 වැනි උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, අකුරණ ප්‍රාදේශීය සභාවේ ලේකම් ලෙස එකී පනතේ 122 (1) වැනි උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල අනුව හා 2016.02.23 වැනි දින අංක 1955/7 දරන *අතිවිශේෂ ගැසට් පත්‍රය* මගින් 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තිය යටතේ පළාත් පාලන නිවාස හා ඉදිකිරීම් ගරු අමාත්‍යතුමන් විසින් ආයතන පත්කරන ව්‍යවස්ථාවේ 39 වැනි අතුරු ව්‍යවස්ථාව වන ප්‍රචාරක දැන්වීම් සහ දෘෂ්‍ය පරිසර ප්‍රදර්ශන පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව අකුරණ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ යම් වීදියකට, පාරකට, ඇළකට, දොළකට, වැවකට හෝ අහසට පෙනෙන පරිදි දැන්වීමක් ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම වෙනුවෙන් පහත උපලේඛනයේ සඳහන් වන පරිදි ගාස්තුවක් 2024 වර්ෂය සඳහා පනවා අය කිරීමට එම ගාස්තුව ගෙවිය යුතු යම් තැනැත්තෙක් / ආයතනය දැන්වීම් ප්‍රදර්ශනය කිරීමට අදහස් කරන දිනට දින හතකට (07) කලින් අකුරණ ප්‍රාදේශීය සභාවට ගාස්තු ගෙවා බලපත්‍රයක් ලබාගත යුතු බවට තීරණය කරමි.

දැන්වීම් ප්‍රදර්ශනය කිරීම සඳහා බලපත්‍ර ගාස්තු

	රු. ශත
1. ස්ථිර දැන්වීම් ලිත් වර්ෂයකට වර්ග අඩියකට - තහඩුවලින්	200 0
2. ස්ථිර දැන්වීම් ලිත් වර්ෂයකට වර්ග අඩියකට - ෆ්ලෙක්ස්	200 0
3. ස්ථිර දැන්වීම් ලිත් වර්ෂයකට වර්ග අඩියකට - රෙදිවලින්	200 0
4. තාවකාලික දැන්වීම් මාස 06 සඳහා වර්ග අඩියකට	100 0

11-463/14

මිහින්තලේ ප්‍රාදේශීය සභාව

2024 වර්ෂයට ව්‍යාපාර බදු පැනවීම

මිහින්තලේ ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය, කර්තව්‍ය ඉටුකරන මිහින්තලේ ප්‍රාදේශීය සභාවේ ලේකම්, පී. විජේසේන වන මම, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 09 වන වගන්තියේ 9 වන උපවගන්තිය සමග කියවිය යුතු එම පනතේම 152 (1) උපවගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව මිහින්තලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2024 වර්ෂයට අදාළව ව්‍යාපාර බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට 2023 ඔක්තෝබර් මස 05 දින පරිපාලන කමිටු තීරණ අංක MPS/2023/10/05/320 යටතේ පහත තීරණය ගෙන ඇති බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

එනම්,

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වන වගන්තියේ 3 වන උපවගන්තිය සමඟ කියවිය යුතු 152 වන වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ, මිහින්තලය ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ එම පනතේ 150 වන වගන්තිය යටතේ යම් බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ යම් ව්‍යාපාරයක් මිහින්තලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2024 වර්ෂයේ දී පවත්වාගෙන යන සෑම තැනැත්තෙක් මතම එම ව්‍යාපාරයේ 2023 වර්ෂයේ ආදායම මෙහි පහත උපලේඛනයෙහි I වන තීරුවේ නිරූපිත යම් විෂයාංක සීමාවක් ඇතුළත පවතින අවස්ථාවක එකී II තීරුවේ අනුරූප සටහනේ නිරූපිත අනුප්‍රමාණයක ව්‍යාපාර බද්දක් 2024 වර්ෂය සඳහා නියම විය යුතු බවට මම තීරණය කරමි.

පී. විජේසේන,
ලේකම්, බලතල, කාර්ය, කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී,
ප්‍රාදේශීය සභාව, මිහින්තලේ.

2023 වර්ෂයෙහි ඔක්තෝබර් මස 05 වැනි දින,
මිහින්තලේ ප්‍රාදේශීය සභාව,
මිහින්තලේ.

උපලේඛනය

I වන තීරුව *2023 වාර්ෂික වටිනාකම*	*II වන තීරුව* *රු. ශත*
රු. 6,000 නොඉක්මවන අවස්ථාවක	කිසිවක් නැත
රු. 6,001 ඉක්මවන එහෙත් රු. 12,000 නොඉක්මවන අවස්ථාවක	90 0
රු. 12,001 ඉක්මවන එහෙත් රු. 18,750 නොඉක්මවන අවස්ථාවක	180 0
රු. 18,751 ඉක්මවන එහෙත් රු. 75,000 නොඉක්මවන අවස්ථාවක	360 0
රු. 75,001 ඉක්මවන එහෙත් රු. 1,50,000 නොඉක්මවන අවස්ථාවක	1,200 0
රු. 1,50,001 ඉක්මවන අවස්ථාවක	3,000 0

11-466/1

මිහින්තලේ ප්‍රාදේශීය සභාව

2024 වර්ෂයට කර්මාන්ත බදු පැනවීම

මිහින්තලේ ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය, කර්තව්‍ය ඉටුකරන මිහින්තලේ ප්‍රාදේශීය සභාවේ ලේකම්, පී. විජේසේන වන මම, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 09 වන වගන්තියේ 3 වන උපවගන්තිය සමග කියවිය යුතු එම පනතේ 150 (1) උපවගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව මිහින්තලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2024 වර්ෂයට අදාළව කර්මාන්ත බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට 2023 ඔක්තෝබර් මස 05 දින පරිපාලන කමිටු තීරණ අංක MPS/2023/10/05/318 යටතේ පහත තීරණය ගෙන ඇති බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

එනම්,

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වන වගන්තියේ 3 වන උපවගන්තිය සමඟ කියවිය යුතු 150 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මිහින්තලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක පවත්වාගෙන යනු ලබන මෙහි පහත උපලේඛනයෙහි I වැනි තීරුවේ නිරූපිත සෑම කර්මාන්තයක් මතම එම උපලේඛනයෙහි II තීරුවේ අනුරූප සටහනේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2024 වර්ෂය සඳහා නියම විය යුතු බවට මම තීරණය කරමි.

පී. විජේසේන,
ලේකම්, බලතල, කාර්ය, කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
ප්‍රාදේශීය සභාව, මිහින්තලේ.

2023 වර්ෂයෙහි ඔක්තෝබර් මස 05 වැනි දින,
මිහින්තලේ ප්‍රාදේශීය සභාව,
මිහින්තලේ.

උපලේඛනය

I වැනි තීරුව *කර්මාන්තය*	*II වැනි තීරුව* *පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම*		
	රු. 750 නොඉක්මවන අවස්ථාවක	*රු. 751 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,501 ඉක්මවන අවස්ථාවක*
	රු. ශත	*රු. ශත*	*රු. ශත*
ඇඹරුම්හල්	500 0	750 0	1,000 0
පාපැදි අලුත්වැඩියාව	500 0	750 0	1,000 0
රන් රිදී භාණ්ඩ නිෂ්පාදනය	500 0	750 0	1,000 0
වඩු මඩු	500 0	750 0	1,000 0
යකඩ කම්හල්	500 0	750 0	1,000 0
යතුරුපැදි අලුත්වැඩියාව	500 0	750 0	1,000 0
කුෂන් වැඩපළ	500 0	750 0	1,000 0
වෑල්ඩින් වැඩපළ	500 0	750 0	1,000 0
සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදන	500 0	750 0	1,000 0
ලියවන පට්ටල්	500 0	750 0	1,000 0
මැටි ආශ්‍රිත නිෂ්පාදන	500 0	750 0	1,000 0
මුද්‍රණාල	500 0	750 0	1,000 0
ඉලෙක්ට්‍රොනික් වැඩපළ	500 0	750 0	1,000 0
ඇඳුම් මැසීමේ ස්ථාන	500 0	750 0	1,000 0
හඳුන්කුරු නිෂ්පාදන	500 0	750 0	1,000 0
වාහන අලුත්වැඩියා කිරීමේ ස්ථාන	500 0	750 0	1,000 0

11-466/2

මිහින්තලේ ප්‍රාදේශීය සභාව

2024 වර්ෂයට බලපත්‍ර ගාස්තු පැනවීම

මිහින්තලේ ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය, කර්තව්‍ය ඉටුකරන මිහින්තලේ ප්‍රාදේශීය සභාවේ ලේකම්, පී. විජේසේන වන මම, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 09 වන වගන්තියේ 3 වන උපවගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 147 වැනි වගන්තිය හා 149 වැනි වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව මිහින්තලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2024

වර්ෂයට අදාළව බලපත්‍ර ගාස්තු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට 2024 ඔක්තෝබර් මස 05 දින පරිපාලන කමිටු තීරණ අංක MPS/2023/10/05/319 යටතේ පහත තීරණය ගෙන ඇති බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

එනම්,

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වන වගන්තියේ 3 වන උපවගන්තිය සමඟ කියවිය යුතු 147 වන වගන්තිය හා 149 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව එකී පනතේ හෝ එකී පනත යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විස්තර කර ඇති මෙහි පහත උපලේඛනයෙහි I වන තීරුවේ නිරූපිත යම් කාර්යයක් සඳහා මිහින්තලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත යම් ස්ථානයක් හෝ පරිශ්‍රයක් පාවිච්චි කිරීමට බලය දෙමින් 2023 වර්ෂයේ නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් සම්බන්ධයෙන් එම උපලේඛනයේ II තීරුවේ අනුරූප සටහනේ නිරූපිත බලපත්‍ර ගාස්තුවක් 2024 වර්ෂය සඳහා නියම විය යුතු බවට ද,

තව ද, එකී ස්ථානය හෝ පරිශ්‍රය 1968 අංක 14 දරන සංචාරක මණ්ඩල පනතේ කාර්යය සඳහා සංචාරක මණ්ඩලයේ අනුමත කර, පිළිගෙන ඇති හෝටලයක්, ආපන ශාලාවක්, නවාතැන්පළක් වන විට දී, ඊට අදළ බලපත්‍ර ලබාදීමේ දී එම ස්ථානයේ හෝ පරිශ්‍රයේ 2023 වර්ෂයේ ආදායමින් 1% ක බලපත්‍ර ගාස්තුව ලෙස 2024 වර්ෂය සඳහා නියම විය යුතු බවට මම තීරණය කරමි.

පී. විජේසේන,
ලේකම්, බලතල, කාර්ය, කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී,
ප්‍රාදේශීය සභාව, මිහින්තලේ.

2023 වර්ෂයෙහි ඔක්තෝබර් මස 05 වැනි දින,
මිහින්තලේ ප්‍රාදේශීය සභාව,
මිහින්තලේ.

උපලේඛනය

I වන තීරුව	*II වන තීරුව* *පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම*		
බලපත්‍රයෙන් බලය දෙනු ලබන කාර්යය	*රු. 750 නොඉක්මවන අවස්ථාවක* *රු. ශත*	*රු. 751 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක* *රු. ශත*	*රු. 1,501 ඉක්මවන අවස්ථාවක* *රු. ශත*
ලැගුම් නිවාසයක් පවත්වාගෙන යාම	500 0	750 0	1000 0
හෝටලයක් පවත්වාගෙන යාම	500 0	750 0	1000 0
බත් කඩයක් පැවැත්වීම	500 0	750 0	1000 0
ආපන ශාලාවක් පැවැත්වීම	500 0	750 0	1000 0
තේ කඩයක් පවත්වාගෙන යාම	500 0	750 0	1000 0
කෝපි කඩයක් පවත්වාගෙන යාම	500 0	750 0	1000 0
බේකරියක් පවත්වාගෙන යාම	500 0	750 0	1000 0
කිරි පට්ටියක් පවත්වාගෙන යාම	500 0	750 0	1000 0
කිරි විකිණීම	500 0	750 0	1000 0
මාළු විකිණීම	500 0	750 0	1000 0
මස් විකිණීම	500 0	750 0	1000 0
අයිස් කර්මාන්තශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1000 0
ලොන්ඩරියක් පවත්වාගෙන යාම	500 0	750 0	1000 0
ගවගාලක් පවත්වාගෙන යාම	500 0	750 0	1000 0
පෞද්ගලික වෙළඳපොළක් පවත්වාගෙන යාම	500 0	750 0	1000 0
කොණ්ඩා සැකසීමේ සැලුන් හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1000 0
බාබර් සාප්පුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1000 0
ගෝඝාතක ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1000 0

මිහින්තලේ ප්‍රාදේශීය සභාව

2024 වර්ෂයට වාහන හා සත්ව බදු පැනවීම

මිහින්තලේ ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය, කර්තව්‍ය ඉටුකරන මිහින්තලේ ප්‍රාදේශීය සභාවේ ලේකම්, පී. විජේසේන වන මම, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 09 වන වගන්තියේ 3 වන උපවගන්තිය සමග කියවිය යුතු එම පනතේ 148 හා 147 වගන්තිවල විධිවිධාන ප්‍රකාරව මිහින්තලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2024 වර්ෂයට අදාළව වාහන හා සත්ව බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට 2023 ඔක්තෝබර් මස 05 දින තීරණ අංක MPS/2023/10/05/321 යටතේ පහත තීරණය ගෙන ඇති බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

එනම්,

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වන වගන්තියේ 3 වන උපවගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 147 වන වගන්තිය හා 148 වන වගන්තිය යටතේ, මිහින්තලේ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර මිහින්තලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2024 වර්ෂයේ දී පහත උපලේඛනයෙහි I වන තීරුවෙහි නිරූපිත කිසියම් වාහනයක් හෝ සතෙකු තමා සන්තකයෙහි තබා ගන්නා සෑම තැනැත්තෙක් මතම, එහි II වන තීරුවේ නිරූපිත බද්දක් 2024 වර්ෂය සඳහා නියම විය යුතු බවට මම තීරණය කරමි.

පී. විජේසේන,
ලේකම්, බලතල, කාර්ය, කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී,
ප්‍රාදේශීය සභාව, මිහින්තලේ.

2023 වර්ෂයෙහි ඔක්තෝබර් මස 05 වැනි දින,
මිහින්තලේ ප්‍රාදේශීය සභාව,
මිහින්තලේ.

I වැනි තීරුව	*II වැනි තීරුව*
වාහන හා සත්ත්ව බද්ද	*රු. ශත*
මෝටර් රථයක්, මෝටර් බයිසිකලයක්, මෝටර් ලොරියක්, රික්ෂෝවක්, කරත්තයක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහාම	
සෑම බයිසිකලයක් හෝ කරත්තයක් සඳහා :	25 0
(අ) වෙළඳ කාර්යයන් සඳහා යොදවන්නේ නම්	18 0
(ආ) වෙළඳ කාර්යයන් සඳහා නොවන කාර්යයන් සඳහා යොදවන්නේ නම්	4 0
පා පැදි බලපත්‍ර ලියාපදිංචි කිරීමේ සේවා ගාස්තුව	6 0
සෑම කරත්තයක් සඳහා	20 0
සෑම අත්ට්‍රැක්ටරයක් සඳහා	10 0
සෑම රික්ෂෝවක් සඳහා	7 50
සෑම අශ්වයෙකු පෝනියෙකු හෝ එළුවෙකු සඳහා	15 0
සෑම ඇතෙකු සඳහා	50 0

11-466/4

මිහින්තලේ ප්‍රාදේශීය සභාව

2024 වර්ෂයට ප්‍රචාරක දැන්වීම් පුවරු සඳහා බදු පැනවීම

මිහින්තලේ ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය, කර්තව්‍ය ඉටුකරන මිහින්තලේ ප්‍රාදේශීය සභාවේ ලේකම්, පී. විජේසේන වන මම, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 09 වන වගන්තියේ 3 වන උපවගන්තිය සමග කියවිය යුතු එම පනතේ 122 වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව මිහින්තලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2024 වර්ෂයට අදාළව ප්‍රචාරක දැන්වීම් පුවරු/දෘශ්‍ය පරිසරය සඳහා ගාස්තු පැනවීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට 2023 ඔක්තෝබර් මස 05 දින තීරණ අංක MPS/2023/10/05/322 යටතේ පහත තීරණය ගෙන ඇති බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

එනම්,

ප්‍රචාරක දැන්වීම් පුවරු/දෘශ්‍ය පරිසරය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යටතේ ප්‍රචාරක දැන්වීම් පුවරු ගාස්තු - 2024

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වන වගන්තියේ 3 වන උපවගන්තිය සමඟ කියවිය යුතු 122 (1) වන උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, 1988.08.23 වැනි දින අංක 520/07 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළාත් පාලන නිවාස හා ඉදිකිරීම් ගරු අමාත්‍යතුමා අනුමත කර ප්‍රකාශයට පත් කර ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවේ 39 වැනි කොටසේ ප්‍රචාරක දැන්වීම්/දෘශ්‍ය පරිසරය පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාර මිහින්තලේ ප්‍රාදේශීය සභා සීමාව තුළ යම් වීථියකට, පාරකට, ඇළකට, ජලාශයකට හෝ අහසට පෙනෙන පරිදි වර්ග අඩියකට නොඅඩු දැන්වීමක් හෝ ඉදිකිරීමක් ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම වෙනුවෙන් පහත උපලේඛනයේ සඳහන් පරිදි 2024 වර්ෂයට අදාළව දැන්වීම් පුවරු ගාස්තු අයකිරීම සුදුසු බවට මම තීරණය කරමි.

පී. විජේසේන,
ලේකම්, බලතල, කාර්යය, කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
ප්‍රාදේශීය සභාව, මිහින්තලේ.

2023 වර්ෂයෙහි ඔක්තෝබර් මස 05 වැනි දින,
මිහින්තලේ ප්‍රාදේශීය සභාව,
මිහින්තලේ.

අනු. අංකය	*විස්තරය*	*එක් වර්ෂයක ගාස්තුව රු. ශත*
01.	බිත්තියක හෝ පුවරුවක ප්‍රදර්ශනය කරනු ලබන (චිත්‍රපට දර්ශන ප්‍රචාරක දැන්වීම් හැර) ඕනෑම දැන්වීමක් සඳහා - වර්ග අඩියකට	55 0
02.	බිත්තියක හෝ පුවරුවක හෝ ලෑල්ලක හෝ ආධාරකයක් මගින් ප්‍රදර්ශනය කරවා ඇති දිස්න ප්‍රචාරක දැන්වීමක් සඳහා - සෑම වර්ග අඩියකටම	110 0
03.	සෑම වර්ගයකම ප්‍රචාරක බැනරයක් සඳහා සෑම වර්ග අඩියකටම (උපලේඛනයේ 1-3 දක්වා දැන්වීම් දෙපැත්තම ප්‍රදර්ශනය වන්නේ නම් මෙම ගාස්තු දෙගුණ වනු ඇත.)	11 0
04.	LED පුළුල් තිර - වර්ග අඩියක් සඳහා	220 0

11-466/5

මිහින්තලේ ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා වෙනත් ගාස්තු පැනවීම

මිහින්තලේ ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය, කර්තව්‍ය ඉටුකරන මිහින්තලේ ප්‍රාදේශීය සභාවේ ලේකම්, පී. විජේසේන වන මම, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 09 වන වගන්තියේ 3 වන උපවගන්තියේ විධිවිධාන ප්‍රකාරව මිහින්තලේ ප්‍රාදේශීය සභාව විසින් සපයනු ලබන සේවා සඳහා ගාස්තු 2024 වර්ෂයට අදාළව පහත සඳහන් ආකාරයට විය යුතු බවට 2023 ඔක්තෝබර් මස 05 දින තීරණ අංක MPS/2023/10/05/323 යටතේ පහත තීරණය ගෙන ඇති බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

පී. විජේසේන,
ලේකම්, බලතල, කාර්යය, කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
ප්‍රාදේශීය සභාව, මිහින්තලේ.

2023 වර්ෂයෙහි ඔක්තෝබර් මස 05 වැනි දින,
මිහින්තලේ ප්‍රාදේශීය සභාව,
මිහින්තලේ.

අනු. අංකය	*ගාස්තු විස්තරය*	*2024 වර්ෂය සඳහා අය කරනු ලබන ගාස්තුව රු. ශත*
01	ගලි බවුසරය බල ප්‍රදේශය ඇතුළත එක් වරකට (බල ප්‍රදේශයෙන් පිට අමතර එක් කි. මීටරයක් සඳහා යාමට සහ ඒමට ගාස්තුව රු. 500)	10,000 0
	ගලි බවුසරය එකම ස්ථානයේ අමතර එක් වරකට (නේවාසික)	3,000 0
	ගලි බවුසරය එකම ස්ථානයේ අමතර එක් වරකට (වාණිජ)	4,000 0
	ගලි බවුසරය එකම ස්ථානයේ අමතර එක් වරකට (බල ප්‍රදේශයෙන් පිට)	5,000 0
02	ට්‍රැක්ටර් ට්ලරය සමග දිනකට ගාස්තු (පැය 08)	වෙනස් වන ඉන්ධන මිල සලකා සභාව/පරිපාලන කමිටුව විසින් කලින් කලට යෝජනා කරනු ලබන ගාස්තුවක් අයකරනු ලබයි.
03	ට්‍රැක්ටර් ට්ලරය සමග වරුවකට ගාස්තු (පැය 04)	
04	ජේ.සී.බී. රථය පැයක් සඳහා	
05	ලොරි ජල බවුසරය - එක් දිනකට ගාස්තුව	
06	ට්‍රැක්ටර් සමග ජල බවුසරය - දිනකට ගාස්තුව	
07	ට්‍රැක්ටර් සමග ජල බවුසරය - වරුවකට ගාස්තුව	
08	ලොරි ටිපර් රථය - එක් දිනකට ගාස්තුව	
09	ලොරි ටිපර් රථය - වරුවකට ගාස්තුව	
10	මාර්ග පළුදු කිරීමේ ගාස්තු	2,000 0
11	පුස්තකාල සාමාජික ගාස්තු	200 0
12	සුසාන භූමියේ මෘත දේහය තැන්පත් කිරීම වර්ග අඩියක් සඳහා ගාස්තුව	50 0
13	භූමදාන කටයුතු සඳහා ගාස්තුව	250 0
14	කර්මාන්ත ගිවිසුම් පත්‍ර සඳහා ගාස්තුව	3,000 0
15	ක්‍රීඩාපිටිය එක් දිනක් වෙන් කිරීම සඳහා	3,000 0
16	ක්‍රීඩාපිටිය සංදර්ශනවලට භාවිතා කිරීම සඳහා - දිනක ගාස්තුව	10,000.00
17	ප්‍රචාරක ජංගම වෙළෙඳ රථ එකක් නගරයේ තබා ගැනීම සඳහා දිනකට	5,000 0
18	බොරළු/පස් ප්‍රවාහනය කිරීම සඳහා ප්‍රාදේශීය සභාව සතු මාර්ග භාවිතා කිරීම වෙනුවෙන් ගාස්තු අය කිරීම (කියුබ් 600ක් දක්වා කියුබ් 01 ක් සඳහා)	200 0
	බොරළු/පස් ප්‍රවාහනය කිරීම සඳහා ප්‍රාදේශීය සභාව සතු මාර්ග භාවිතා කිරීම වෙනුවෙන් ගාස්තු අය කිරීම (කියුබ් 600ට වැඩි කියුබ් 01 ක් සඳහා)	300 0
	බොරළු/පස් ප්‍රවාහනය කිරීම සඳහා ප්‍රාදේශීය සභාව සතු මාර්ග භාවිතා කිරීම වෙනුවෙන් ගාස්තු අය කිරීම (බල ප්‍රදේශයෙන් පිට ස්ථානයක සිට බොරළු ප්‍රවාහනයේ දී කියුබ් 01 ක් සඳහා)	400 0

1533/16 අංක හා 2008.01.25 දිනැති මධ්‍යම පරිසර අධිකාරියේ *ගැසට්* පත්‍රයට අදාලව ගාස්තු අයකිරීම

		රුපියල්
19	පාරිසරික බලපත්‍ර ගාස්තු - ආයෝජනය කළ මුදල රු. 2,50,000.00	4,500.00
	ආයෝජනය කළ මුදල රු. 2,50,000.00 - 500,000.00	
	ආයෝජනය කළ මුදල රු. 500,000.00 - 1,000,000.00	
	ආයෝජනය කළ මුදල රු. 1,000,000.00 ට වැඩි	
20	පාරිසරික පරීක්ෂණ ගාස්තු - ආයෝජනය කළ මුදල රු. 2,50,000.00	3,000.00
	ආයෝජනය කළ මුදල රු. 2,50,000.00 - 500,000.00	3,750.00
	ආයෝජනය කළ මුදල රු. 500,000.00 - 1,000,000.00	5,000.00
	ආයෝජනය කළ මුදල රු. 1,000,000.00 ට වැඩි	10,000.00
21	පාරිසරික බලපත්‍ර ඉල්ලුම්පත්‍ර ගාස්තු	500.00

රු. ශත

සභා තීරණ අනුව ගාස්තු අයකිරීම

22	සැලසුම් අනුමත කිරීම කාලය දීර්ඝ කිරීම වසරකට (නේවාසික) ගාස්තුව	5000.00
23	සැලසුම් අනුමත කිරීම කාලය දීර්ඝ කිරීම වසරකට (වාණිජ) ගාස්තුව	5000.00
24	ගොඩනැගිලි සැලසුම හා ඉඩම් අනුබෙදුම් ලබා දීමේ පෝරම ගාස්තු (වාණිජ)	1,500.00
25	ගොඩනැගිලි සැලසුම හා/ඉඩම් අනුබෙදුම් ලබා දීමේ පෝරම ගාස්තු (නේවාසික)	1,000.00
26	වීථිරේඛා හා පවරා නොගැනීමේ, සහතික ලබා දීමේ ගාස්තුව	1,250.00
27	වීථිරේඛා හා පවරා නොගැනීමේ, සහතික ලබා දීමේ පරීක්ෂණ ගාස්තුව	750.00
28	දීර්ඝ කාලීන බලපත්‍ර ලබා දීමේ නිර්දේශ සඳහා ගාස්තුව	1,000.00
29	දීර්ඝ කාලීන බලපත්‍ර ලබා දීමේ නිර්දේශ සඳහා පරීක්ෂණ ගාස්තුව	1,000.00
30	ගොඩනැගිලි සැලසුම් හා ඉඩම් අනුබෙදුම් පරීක්ෂණ ගාස්තු (නේවාසික)	3,000.00
31	ගොඩනැගිලි සැලසුම් හා ඉඩම් අනුබෙදුම් පරීක්ෂණ ගාස්තු (වාණිජ)	3,000.00
32	අනුකූලතා සහතික ලබාදීමේ පරීක්ෂණ ගාස්තුව	3,000.00

අංක 1597/08 - 2009 අප්‍රේල් 17 වැනි සිකුරාදා දින රජයේ අති විශේෂ *ගැසට් නිවේදනය* සහ ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරියේ පනත අනුව අය කරනු ලබන ගාස්තු :

33	*පෙරසැරි ගාස්තු*	*එක් බිම් කට්ටියකට අය කළ යුතු මුදල (මාර්ග කාණු හා පොදු බිම් කොටස් හැර)*
	ව.මී. 150 - 300	රු. 500
	ව.මී. 301 - 600	රු. 400
	ව.මී. 601 - 900	රු. 300
	ව.මී. 901ට වැඩි	රු. 200

ගොඩනැගිලි ඉදිකිරීම/පවත්නා ගොඩනැගිලිවලට අලුතින් කොටසක් එකතු කිරීම/නැවත ඉදිකිරීම සඳහා වූ පෙරසැරි ගාස්තු ගෙබිමේ විශාලත්වය අනුව :

වර්ග මීටර්	*නේවාසික (රු.)*	*වාණිජ හෝ වෙනත් (රු.)*
45ට අඩු	500	1,000
45 - 90	1,500	2,000
91 - 180	2,500	3,000
181 - 270	3,500	4,000
271 - 450	4,500	6,000
451 - 675	5,500	8,000
676 - 900	6,500	10,000
901 - 1,225	7,500	12,000
1,225ට වැඩි	7,500	12,000

ව. මී. 1226 ඉක්මවීමෙන් පසු සෑම ව. මී. 90ක් සඳහා ම රු. 1,000 බැගින්	ව.මී. 1226 ඉක්මවීමෙන් පසු සෑම ව. මී. 90ක් සඳහාම රු. 1,250 බැගින්.

යාපනය මහ නගර සභාව

යාපනය මහනගර සභාව විසින් මහනගර සභා ආඥාපනතේ 252 වන පරිච්ඡේදයේ 147, 247 අ, 247 ආ 247 ඇ වගන්ති යටතේ පහත පරිදි තීරණය කර ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

යාපනය මහ නගර සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යයන් සහ ක්‍රියාකාරකම් ඉටු කරන යාපනය මහ නගර සභාවේ කොමසාරිස් ආර්.ටී. ජෙයසීලන් වන මම, මහ නගර සභා ආඥාපනතේ 286 (අ) වගන්තිය සමඟ කියවිය යුතු ඉහත ආඥාපනතේ 247 (ආ) (1) වගන්තියේ විධිවිධාන අනුව යාපනය මහනගර සභාවේ බල ප්‍රදේශය සඳහා 2023 වසර සඳහා ව්‍යාපාරික බද්ද පැනවීම පහත පරිදි විය යුතු බව මෙයින් තීරණය කරමි. එනම්

මහ නගර සභා ආඥාපනතේ 286 (අ) වගන්තිය සමඟ කියවිය යුතු එකී ආඥාපනතේ 247 (ආ) (1) උප වගන්තිය යටතේ යාපනය මහ නගර සභාවට පැවරී ඇති බලතලවලට අනුකූලව එකී පනතේ විධිවිධාන හෝ ඒ යටතේ සාදන ලද කිසියම් උප රීතියක විධිවිධාන අනුව පහත විස්තර කර ඇති පරිදි වෙළඳ බද්ද 2024 වසර සඳහා අය කළ යුතු බව තීරණය කරමි.

ප්‍රචාරණය කිරීමෙන් භාණ්ඩ විකිණීම

එක් දිනක් සඳහා (100 sq.ft)	:	රු. 5,000.00
අමතර සෑම දිනයක් සඳහා	:	රු. 3,000.00

ඉඩ ප්‍රමාණය වැඩි වන විට ගාස්තුව ද ඊට සමානුපාතික ලෙස ඉහළ යනු ඇත.

කුඩා ක්ෂේත්‍රයක් වැනි ව්‍යුහයක ප්‍රචාරණය කිරීමෙන් වෙළඳාම් කිරීම (දිනකට)	:	රු. 2000,00

දේශීය නිෂ්පාදකයා, ස්වයං රැකියාලාභීන්, කාන්තා මූලික පවුල්, රාජ්‍ය දෙපාර්තමේන්තු, සමාජ ක්‍රියාකාරී ආයතන විසින් සංවිධානය කර පවත්වාගෙන යනු ලබන අලෙවි ප්‍රවර්ධන කටයුතු සඳහා සංවිධානාත්මකව පවත්වා ගෙන යනු ලබන 10' x 10' ප්‍රමාණයෙන් යුත් ස්ථානයක වෙළෙඳපොළක් හෝ අලෙවි ශාලා තුළ ව්‍යාපාරික කටයුතු සිදු කිරීම සඳහා එක් දින ගාස්තුව රු. 1000

11-473/1

යාපනය මහ නගර සභාව

කොම්බයන් මනල් හින්දු සුසාන භූමියේ ගෙවීම්

(2023.10.11 දිනැති කළමනාකරණය කමිටු රැස්වීමේ තීරණය අනුව)

මිය ගිය තැනැත්තන්ගේ දේහයන් දර භාවිතා කොට ආදාහනය කිරීම සඳහා	:	රු. 5,000.00
විදුලිය භාවිතයෙන් ආදාහනය කිරීම සඳහා (වැඩිහිටියන්) වයස අවුරුදු 14 සිට	:	රු. 16,000.00
විදුලිය භාවිතයෙන් ආදාහනය කිරීම සඳහා (බාල වයස්කරුවන්) වයස අවුරුදු 14 ට අඩු	:	රු. 8,000.00
දේහය මිහිදන් කිරීම සඳහා - වයස අවුරුදු 14 සිට (අධිකරණ නියෝග, පොලීසියේ ඉල්ලීම, ග්‍රාම නිලධාරීගේ තහවුරු කිරීම, රෝහලේ නියමිත අවසරය සමඟ ගෙනෙන ඒවා පමණක්)	:	රු. 8,000.00
දේහය මිහිදන් කිරීම සඳහා - වයස අවුරුදු 14 දක්වා	:	රු. 6,000.00
ඉවත් කරන ලද ශරීර කොටස් මිහිදන් කිරීම සඳහා (1 Kg - 30 Kg දක්වා මලු) (30 Kg - 60 Kg දක්වා මලු)	: :	රු. 4,000.00 රු. 8,000.00
මියගිය ගවයන් මිහිදන් කිරීම සඳහා	:	රු. 8,000.00
මල් ශාලාවෙන් ගෙනෙන ශරීර කොටස් අපද්‍රව්‍ය, ඇඟඵම් අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා සතියක ගාස්තුව	:	රු. 5,000.00

ආර්. ටී. ජෙයසීලන්,
මහනගර සභා කොමසාරිස්,
මහ නගර සභාව,
යාපනය.

11-473/2

නාගොඩ ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා වෙළඳ බලපත්‍ර ගාස්තු නියම කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 (3) වන වගන්තිය සහ එකී පනතේ 149 වැනි වගන්තිය සහ එකී පනතේ 147 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියේ (ආ) ඡේදයෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව නාගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2024 වර්ෂයට අදාළව බලපත්‍ර ගාස්තු නියම කිරීම පහත සඳහන් ආකාරයට සිදුවිය යුතු බවට තීරණ පොතේ අංක 2023.10.31 - 117 යටතේ තීරණය කළ බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

ඒ. එන්. එන්. ලමාහේවා,
ලේකම්,
නාගොඩ ප්‍රාදේශීය සභාව.

2023 ඔක්තෝබර් මස 31 වැනි දින,
නාගොඩ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

"ප්‍රාදේශීය සභාව විසින් සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක් යටතේ හෝ නාගොඩ ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවක් යටතේ බලපත්‍ර ලබාගත යුතු යම් කර්මාන්තයක් හෝ ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන ස්ථාන සඳහා නාගොඩ ප්‍රාදේශීය සභාව විසින් 2024 වර්ෂය සඳහා නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක් සම්බන්ධයෙන්ම, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 (3) වන වගන්තිය සහ එකී පනතේ 149 වැනි වගන්තිය සහ එකී පනතේ 147 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියේ (ආ) ඡේදයෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පහත උපලේඛනයේ I වැනි තීරුවේ සඳහන් එක් එක් කර්මාන්තය හෝ ව්‍යාපාරය වෙනුවෙන් එම උපලේඛනයේ II වැනි තීරුවේ අනුරූපී සටහනෙහි නිරූපිත ප්‍රමාණයේ බලපත්‍ර ගාස්තුවක් නියම කර අයකර ගැනීමටත්,

එකී උපලේඛනයේ සඳහන් කර්මාන්ත හෝ ව්‍යාපාර අතරින් ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ඇති හෝ එය විසින් අනුමත කර ඇති හෝ පිළිගෙන ඇති හෝටලයක් හෝ ආපන ශාලාවක් හෝ නවාතැන් පොළක් වන විට ඒවා සඳහා පසුගිය වර්ෂයේ ලත් ලැබීම්වලින් සියයට එක (1%)කට සමාන මුදල් ප්‍රමාණය හෝ ඉහත කී උපලේඛනයේ II වැනි තීරුවේ නිරූපිත ප්‍රමාණය යන මුදල් ප්‍රමාණය යන මුදල් ප්‍රමාණ දෙකෙන් වැඩි මුදලට සමාන ප්‍රමාණයක බලපත්‍ර ගාස්තුවක් නියම කර අයකළ යුතු බව තීරණය කරමි."

2024 වර්ෂය සඳහා ව්‍යාපාර බලපත්‍ර පැනවීම

අනු. අංකය	*බලය දෙනු ලබන කාර්යය*	*වාර්ෂික වටිනාකම රු. 750.00 නොඉක්මවන විට* රු. ශත	*වාර්ෂික වටිනාකම රු. 751.00 රු. 1,500.0 නොඉක්මවන විට* රු. ශත	*වාර්ෂික වටිනාකම රු. 1,501.00 ඉක්මවන විට* රු. ශත
01.	ලැඟුම් නිවාස	500.00	750.00	1,000.00
02.	හෝටල්	500.00	750.00	1,000.00
03.	බත් කඩ, ආපන ශාලා සහ තේ හෝ කෝපි කඩ	500.00	750.00	1,000.00
04.	බේකරි	500.00	750.00	1,000.00
05.	කිරි පට්ටි හා කිරි වෙළඳාම	500.00	750.00	1,000.00
06.	මාළු විකිණීම	500.00	750.00	1,000.00
07.	මස් විකිණීම	500.00	750.00	1,000.00
08.	අයිස් කර්මාන්ත ශාලා	500.00	750.00	1,000.00
09.	සිසිල් බීම කර්මාන්ත ශාලා	500.00	750.00	1,000.00
10.	ලොන්ඩරි	500.00	750.00	1,000.00

අනු. අංකය	*බලය දෙනු ලබන කාර්යය*	*වාර්ෂික වටිනාකම රු. 750.00 නොඉක්මවන විට* *රු. ශත*	*වාර්ෂික වටිනාකම රු. 751.00 රු. 1,500.0 නොඉක්මවන විට* *රු. ශත*	*වාර්ෂික වටිනාකම රු. 1,501.00 ඉක්මවන විට* *රු. ශත*
11.	ගව ගාල්	500.00	750.00	1,000.00
12.	ඝාතක මඩු	500.00	750.00	1,000.00
13.	කොණ්ඩා සැකසීමේ සැලුන් හල් සහ බාබර් සාප්පු	500.00	750.00	1,000.00

11 - 528/1

නාගොඩ ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා කර්මාන්ත නැතහොත් වෙළෙඳාම් බද්ද නියම කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 (3) වගන්තිය සහ එකී පනතේ 150 වන වගන්තියේ (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකරව, නාගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2024 වර්ෂයට අදාළව කර්මාන්ත නැතහොත් වෙළඳාමේ බද්ද පැනවීම පහත සඳහන් ආකාරයට සිදුවිය යුතු බවට තීරණ පොතේ අංක 2023.10.31 - 118 යටතේ තීරණය කල බව මෙයින් නිවේදනය කරමි.

ඒ. එන්. එන්. ලමාහේවා,
ලේකම්,
නාගොඩ ප්‍රාදේශීය සභාව.

2023 ඔක්තෝබර් මස 31 වැනි දින,
නාගොඩ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

"1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 (3) වගන්තිය සහ එකී පනතේ 150 වන වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත කරගෙන යනු ලබන, ඉහත කී පනතේ 152 වන වගන්තිය යටතේ ව්‍යාපාර බද්දක් ගෙවීමට යටත් වන යම් ව්‍යාපාරයක් නොවන්නා වූ සහ කිසියම් අතුරු ව්‍යවස්ථාවක් යටතේ බලපත්‍රයක් ලබා ගැනීම අවශ්‍ය නොවන්නා වූ යම් කර්මාන්තයක් *නැතහොත්* වෙළඳාමක් කරගෙන යනු ලබන අවස්ථාවක, ඒ එක් එක් කර්මාන්තය *නැතහොත්* වෙළෙඳාම පවත්වාගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකම, පහත උපලේඛනයේ I වැනි තීරුවේ සඳහන් යම් විෂයාංකයක සීමාව ඇතුළත පවතින අවස්ථාවක, ඒ උපලේඛනයේ II වැනි තීරුවේ සඳහන් ප්‍රමාණයට සමාන මුදලක කර්මාන්ත නැතහොත් වෙළෙඳාම් බද්දක් 2024 වර්ෂය සඳහා නියම කර අයකර ගත යුතු බව සහ ඒ කර්මාන්ත නැතහොත් වෙළෙඳාම් බද්ද ඒ වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් තීරණය කරමි."

උපලේඛනය

1 වැනි තීරුව	*11 වැනි තීරුව* *රු. ශත*
වාර්ෂික වටිනාකම -	
රු. 750.00 නොඉක්මවන අවස්ථාවක	500.00
රු. 751.00 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක	750.00
රු. 1501.00 ඉක්මවන අවස්ථාවක	1,000.00

011 - 528/2

නාගොඩ ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා ව්‍යාපාර බද්ද නියම කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 (3) වන වගන්තිය සහ එකී පනතේ 152 (1) වැනි උපවගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව නාගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2024 වර්ෂයට අදාළව ව්‍යාපාර බද්ද පැනවීම පහත සඳහන් ආකාරයට සිදුවිය යුතු බවට තීරණ පොතේ අංක 2023.10.31 - 119 යටතේ තීරණය කල බව මෙයින් නිවේදනය කරමි.

ඒ. එන්. එන්. ලමාහේවා,
ලේකම්,
නාගොඩ ප්‍රාදේශීය සභාව.

2023 ඔක්තෝබර් මස 31 වැනි දින,
නාගොඩ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

"1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 (3) වගන්තිය සහ එකී පනතේ 152 (1) වැනි උපවගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, නාගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත කරගෙන යනු ලබන, ඉහත කී පනතේ 150 වන වගන්තිය යටතේ යම් බද්දක් ගෙවීමට යටත් වන යම් කර්මාන්තයක් *නැතහොත්* වෙළෙඳාමක් නොවන්නා වූ සහ යම් අතුරු ව්‍යවස්ථාවක් යටතේ බලපත්‍රයක් ලබා ගැනීම අවශ්‍ය නොවන්නා වූ, යම් ව්‍යාපාරයක් කරගෙන යනු ලබන අවස්ථාවක, ඒ ව්‍යාපාරයෙන් පෙර වර්ෂයේ දී ලැබූ ආදායම, පහත උපලේඛනයේ I වැනි තීරුවේ සඳහන් යම් විෂයාංකයක සීමා ඇතුළත පවතින අවස්ථාවක, ඒ උපලේඛනයේ II වැනි තීරුවේ සඳහන් ප්‍රමාණයට සමාන මුදලක ව්‍යාපාර බද්දක් 2024 වර්ෂය සඳහා නියම කර අය කර ගත යුතු බව සහ ඒ ව්‍යාපාර බද්ද ඒ වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් තීරණය කරමි."

උපලේඛනය

I වැනි තීරුව	*II වැනි තීරුව* *රු. ශත*
බද්ද අදාළ වර්ෂයට පෙර වර්ෂය සඳහා වූ ව්‍යාපාරයේ ආදායම	
(i). රු. 6,000.00 නොඉක්මවන අවස්ථාවක	කිසිවක් නැත
(ii). රු. 6,001.00 ඉක්මවන එහෙත් රු. 12,000 නොඉක්මවන අවස්ථාවක	90.00
(iii). රු. 12,001.00 ඉක්මවන එහෙත් රු. 18,750 නොඉක්මවන අවස්ථාවක	180.00
(vi). රු. 18,751.00 ඉක්මවන එහෙත් රු. 75,000 නොඉක්මවන අවස්ථාවක	360.00
(v). රු. 75,001.00 ඉක්මවන එහෙත් රු. 1,50,000 නොඉක්මවන අවස්ථාවක	1,200.00
(vi). රු. 1,50,001 ඉක්මවන අවස්ථාවක	3,000.00

11 - 528/3

නාගොඩ ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා අක්කර බදු නියම කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 (3) වන වගන්තිය සහ එකී පනතේ 134(3) වැනි උපවගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව නාගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2024 වර්ෂයට අදාළව අක්කර බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට සිදුවිය යුතු බවට තීරණ පොතේ අංක 2023.10.31 - 120 යටතේ තීරණය කල බව මෙයින් නිවේදනය කරමි.

ඒ. එන්. එන්. ලමාහේවා,
ලේකම්,
නාගොඩ ප්‍රාදේශීය සභාව.

2023 ඔක්තෝබර් මස 31 වැනි දින,
නාගොඩ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

"1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 (3) වගන්තිය සහ එකී පනතේ 134 වැනි වගන්තියේ (3) වැනි උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර නාගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටියා වූද, ඉහත කී පනතේ 135 වන වගන්තියේ නියමය යටතේ අක්කර බද්දෙන් නිදහස් කර නොමැත්තා වූද, ස්ථිර හෝ නිතිපතා ගොවිතැනක් යටතේ වූ -

(අ) හෙක්ටයාර් පහක් හෝ ඊට වැඩි වූ සෑම ඉඩමක් වෙනුවෙන්ම එකී ඉඩමේ සෑම හෙක්ටයාරයක්ම මත 2024 වර්ෂය සඳහා රු. 10 බැගින් වන වාර්ෂික අක්කර බද්දක් පනවා අය කිරීමටත්,

(ආ) ඉහත කී පනතේ 134 වැනි වගන්තියේ (3) වැනි උප වගන්තියේ අතුරු විධානය යටතේ පළාත් පාලන විෂයය භාර ගරු ඇමැතිතුමා විසින් නාගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය විශේෂ ප්‍රදේශයක් වශයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ IV(ආ) වැනි කොටසේ 1989.02.03 දිනැති *ගැසට්* පත්‍රයේ පත්කර ඇති හෙයින්, හෙක්ටයාර් එකකට වැඩි එහෙත් හෙක්ටයාර් පහකට අඩු වූ සෑම ඉඩමක් මත 2024 වර්ෂය සඳහා රු. 50 බැගින් වන වාර්ෂික අක්කර බද්දක් පනවා අය කිරීමට : සහ

(ඇ) ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (6) වැනි උප වගන්තියේ විධි විධාන යටතේ එකී වර්ෂයේ මාර්තු 31, ජූනි 30 සැප්තැම්බර් 30, දෙසැම්බර් 31 යන දිනවලට පෙර සමාන වාරික හතරකින් අයකල යුතු බවට තීරණය කරමි."

11 - 528/4

නාගොඩ ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා ප්‍රචාරක දැන්වීම් බද්ද නියම කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 (3) වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව නාගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2024 වර්ෂයට අදාළව ප්‍රචාරක බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට සිදුවිය යුතු බවට තීරණ පොතේ අංක 2023.10.31 - 121 යටතේ තීරණය කල බව මෙයින් නිවේදනය කරමි.

ඒ. එන්. එන්. ලමාහේවා,
ලේකම්,
නාගොඩ ප්‍රාදේශීය සභාව.

2023 ඔක්තෝබර් මස 31 වැනි දින,
නාගොඩ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

"1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 (3) වගන්තිය සහ එකී පනතේ අංක 122(1) වැනි වගන්තියෙන් පැවරී ඇති බලතල අනුව 1988.08.23 වැනි දින අංක 520/7 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයේ IV (ආ) කොටසේ පළාත් පාලන අතිවිශේෂ *ගැසට්* පත්‍රයේ ප්‍රචාරක/දෘෂ්‍ය පරිසර පිළිබඳ අතුරු ව්‍යවස්ථා විධිවිධාන ප්‍රකාර නාගොඩ ප්‍රාදේශීය සභා සීමාව තුළ යම් වීදියකට, පාරකට, ඇලකට වැවකට හෝ අහසට පෙනෙන පරිදි දැන්වීමක් ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම වෙනුවෙන් පහත උපලේඛනයේ සඳහන් බලපත්‍ර ගාස්තුවක් නාගොඩ ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බව තීරණය කරමි."

උපලේඛනය

	රු. ශත
01. බිත්තියක හෝ පුවරුවක ප්‍රදර්ශනය කරනු ලබන ඕනෑම ප්‍රචාරක දැන්වීමක් සඳහා සෑම වර්ග අඩියකට (වර්ෂයකට)	රු. 200.00
02. බැනරයක් මගින් ප්‍රදර්ශනය කරනු ලබන ඕනෑම ප්‍රචාරක දැන්වීමක් සඳහා ම වර්ග අඩියකට (මසකට)	රු. 100.00

11 - 528/5

නාගොඩ ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා ප්‍රසිද්ධ රඟ දැක්වීමේ ආඥා පනත අනුව බදු නියම කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 (3) වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව නාගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2024 වර්ෂයට අදාළව ප්‍රසිද්ධ රඟ දැක්වීමේ ආඥා පනත අනුව බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට සිදු විය යුතු බවට තීරණ පොතේ අංක 2023.10.31 - 122 යටතේ තීරණය කල බව මෙයින් නිවේදනය කරමි.

ඒ. එන්. එන්. ලමාහේවා,
ලේකම්,
නාගොඩ ප්‍රාදේශීය සභාව.

2023 ඔක්තෝබර් මස 31 වැනි දින,
නාගොඩ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

"(176 වැනි අධිකාරිය) ප්‍රසිද්ධ රඟ දැක්වීමේ ආඥා පනතේ 3 වැනි වගන්තිය ප්‍රකාරව බලපත්‍ර ගාස්තු නාගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2024 වර්ෂයට පහත උපලේඛනයේ පරිදි පනවනු ලබන බව තීරණය කරමි."

උපලේඛනය

01. තාවකාලික චිත්‍රපට දර්ශනය, සර්කස් සංදර්ශන, මැජික් සංදර්ශන, නාට්‍ය සංදර්ශන හෝ වෙනත් යම් සංදර්ශනයක් සඳහා	*රු. ශත*
එක් දිනකට බලපත්‍ර ගාස්තුව	1,000.00
වැඩිවන සෑම දිනකටම	500.00
02. සංගීත සංදර්ශන සඳහා එක් දිනකට	1,000.00
03. ප්‍රවේශපත්‍රවල වටිනාකමින් සියයට දහයක් (10%) විනෝද බද්ද ලෙස ගෙවිය යුතුය	

11 - 528/6

නාගොඩ ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා පෙරසැරි ගාස්තු, සේවා ගාස්තු ආවරණ අනුමැතිය ලබා දීමේ ගාස්තු හා නාගොඩ ප්‍රාදේශීය සභාව මගින් සපයනු ලබන සේවා වෙනුවෙන් ගාස්තු අය කිරීම නිවාස සහ නගර සංවර්ධන ආඥාපනත

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 (3) වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව නාගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ සිදු කරනු ලබන සංවර්ධන කාර්යයන්ගෙන් සහ ඉඩම් අනු බෙදුම් මත අය කරනු ලබන පෙරසැරි ගාස්තු, සේවා ගාස්තු, ආවරණ අනුමැතිය ලබාදීමේ ගාස්තු සහ නාගොඩ ප්‍රාදේශීය සභාව සතු දේපළ සහ නාගොඩ ප්‍රාදේශීය සභාව මගින් සපයනු ලබන සේවා වෙනුවෙන් 2024 වර්ෂයට ගාස්තු අය කිරීම පහත් සඳහන් ආකාරයට සිදු විය යුතු බවට තීරණ පොතේ අංක 2023.10.31 - 123 යටතේ තීරණය කළ බව මෙයින් නිවේදනය කරමි.

ඒ. එන්. එන්. ලමාහේවා,
ලේකම්,
නාගොඩ ප්‍රාදේශීය සභාව.

2023 ඔක්තෝබර් මස 31 වැනි දින,
නාගොඩ ප්‍රාදේශීය සභාව.

තීරණය

"නාගොඩ ප්‍රාදේශීය සභා බල සීමාව තුළ සිදු කරනු ලබන සංවර්ධන කාර්යයන්ගෙන් සහ ඉඩම් අනුබෙදුම් මත අයකරනු ලබන පෙරසැරි ගාස්තු, සේවා ගාස්තු, ආවරණ අනුමැතිය ලබාදීමේ ගාස්තු සහ නාගොඩ ප්‍රාදේශීය සභාව සතු දේපළ සහ නාගොඩ ප්‍රාදේශීය සභාව මගින් සපයනු ලබන සේවා වෙනුවෙන් පහත උපලේඛනවල සඳහන් ආකාරයට 2024 වර්ෂයට ගාස්තු ගෙවිය යුතු බවට තීරණය කරමි."

උපලේඛන 01	*රු. ශත*
පර්චස් 06 සිට 20 දක්වා එක් කැබැල්ලකට	400.00
පර්චස් 21 සිට 40 දක්වා එක් කැබැල්ලකට	500.00
පර්චස් 41 සිට 60 දක්වා එක් කැබැල්ලකට	600.00
පර්චස් 61 සිට 120 දක්වා එක් කැබැල්ලකට	750.00
පර්චස් 121 සිට 160 දක්වා එක් කැබැල්ලකට	1000.00
පර්චස් 161 සිට වැඩිවන සෑම පර්චස් එකකට හෝ ඉන් කොටසකට රු. 20 බැගින් අය කළ යුතුය.	

ගොඩනැගිලි ඉදි කිරීම මත ගාස්තු පැනවීම - 2024

උපලේඛන 02

ගොඩනැගිලිවල විශාලත්වය	*පදිංචිය සඳහා (රුපියල්)*	*වාණිජ හෝ වෙනත් කටයුත්තක් සඳහා (රුපියල්)*
වර්ග මීටර් 45 ට අඩු	150.00	300.00
වර්ග මීටර් 45 - 90	250.00	500.00
වර්ග මීටර් 91 - 180	500.00	1000.00
වර්ග මීටර් 181 - 270	1000.00	2000.00
වර්ග මීටර් 270 ට වැඩිවන සෑම වර්ග මීටර් 10 කට අමතරව එක් විය යුතු මුදල	100.00	300.00
මායිම් තාප්පයක් සඳහා (වර්ග මීටරයක් සඳහා)	50.00	100.00

උපලේඛන 03

විධිමත් බලපත්‍රයක් නොමැතිව කරනු ලබන ඉදිකිරීමක් හා භාවිතය වෙනස් කිරීමක් වෙනුවෙන් ආවරණ අනුමැතිය ලබා ගැනීම සඳහා ගෙවිය යුතු ගාස්තු - 2024

	ඉදිකිරීම් අදියර	*නේවාසික වර්ග මීටර් එකක් සඳහා ගෙවිය යුතු ගාස්තුව*	*වාණිජ හෝ වෙනත් වර්ග මීටර් එකක් සඳහා ගාස්තුව*
		රු. ශත	රු. ශත
01.	අත්තිවාරම් මට්ටම	20.00	50.00
02.	වහළ මට්ටම සඳහා ඉදිකොට ඇති විට	40.00	100.00

	ඉදිකිරීම් අදියර	*නේවාසික වර්ග මීටර් එකක් සඳහා ගෙවිය යුතු ගාස්තුව*	*වාණිජ හෝ වෙනත් වර්ග මීටර් එකක් සඳහා ගාස්තුව*
		රු. ශත	රු. ශත
03.	වහළ ඇතුළුව ඉදිකොට ඇති විට	60.00	150.00
04.	සම්පූර්ණයෙන් ඉදිකර ඇති විට	100.00	200.00
මායිම් තාප්පයක් සඳහා දික් මීටරයකට රු. 800.00 බැගින් (දික් අඩියකට රු. 250 බැගින්)			

උපලේඛන 04

ගොඩනැගිලිවල භාවිතය වෙනස් කිරීම සඳහා පෙරසැරි ගාස්තු

බිම් වර්ග ප්‍රමාණය	*ගාස්තුව (රුපියල්)*
500 දක්වා	100.00
501 - 1000	200.00
1001 - 2000	300.00
2001 - 3000	400.00
3001 - 5000	600.00
5001 - 7500	800.00
7501 - 10,000	1000.00
10,000 ට වැඩි	1000 සහ ඉන් වැඩි වන සෑම අමතර වර්ග අඩි 100ට හෝ ඉන් කොටසකට රු. 50 බැගින්

උපලේඛන 05

නාගොඩ ප්‍රාදේශීය සභාවට අයත් උඩුගම බහුකාර්ය ගොඩනැගිල්ල, ක්‍රීඩාංගණ, ජල බවුසර්, චතුර ටැංකි, ටිපර් රථ, ට්‍රැක්ටරය කුළියට දීම - 2024

එක් දිනක් සඳහා උඩුගම බහුකාර්ය ගොඩනැගිල්ල (පුටු 320ක් සමග) ලබා දීමේ ගාස්තුව :

පොදු කටයුතු සඳහා (රජයේ ආයතන, පාසල් සඳහා)	- රු. 10,000.00
පෞද්ගලික කටයුතු සඳහා	- රු. 15,000.00
තැන්පත් මුදල	- රු. 5,000.00
ජලය හා විදුලිය සඳහා	- රු. 2,000.00

උපලේඛන 06

ක්‍රීඩාංගණ කුළියට දීමේ ගාස්තු

ක්‍රීඩාංගණය	*පොදු/රාජ්‍ය කටයුතු (රු.)*	*පෞද්ගලික කටයුතු (රු.)*
මාපලගම ක්‍රීඩාංගණය	2500.00	5000.00
උඩුගම ක්‍රීඩාංගණය	2500.00	5000.00
ගෝණදෙනිය ක්‍රීඩාංගණය	2500.00	5000.00
උඩුගම දකුණ ක්‍රීඩාංගණය	2500.00	5000.00

උපලේඛන 07

	ලීටර් 4000 (රු.)	*ලීටර් 6000 (රු.)*	*ලීටර් 8000 (රු.)*
එක් දිනකට සහා බල ප්‍රදේශය තුළ අය කරන ගාස්තුව	8,000.00	10,000.00	13,000.00
එක් දිනකට සහා බල ප්‍රදේශයෙන් පිටත අය කරන ගාස්තුව	9,000.00	11,000.00	14,000.00

ටිපර් රථය කුළියට දීමේ ගාස්තු :

පැය 8 ක් සඳහා කි.මී. 50 දක්වා	රු. 20,000.00
පැය 8 කට වැඩිවන සෑම පැයකට	රු. 2,600.00
කි.මී. 50 ට වැඩිවන සෑම කිලෝමීටරයක්ම සඳහාම	රු. 100.00

ට්‍රැක්ටරය කුළියට දීමේ ගාස්තු :

ට්‍රැක්ටර් පැයකට කි.මී. 5 දක්වා (ට්‍රෙලරය සමග)	රු. 1,000.00
වැඩිවන සෑම කිලෝමීටරයක් සඳහම	රු. 400.00

* වතුර රහිතව ලීටර් 2000 ටැංකිය කුළියට දීමේ ගාස්තුව - එක් දිනක් සඳහා - රු. 2,000.00

ක්‍රීඩාංගන කුළියට දීමේ දී ජලය සහ විදුලිය ලබා ගන්නේ නම් ඒ සඳහා ගාස්තුව ද, ජල බවුසර්, ටිපර් රථ, ට්‍රැක්ටරය, වතුර ටැංකි සහ සහාව සතු අනෙකුත් වාහන කුළියට දීමට අදාළ ගාස්තු 2024 වර්ෂයේ සිදුවිය හැකි ජලය, විදුලිය සහ ඉන්ධන මිල වෙනස් වීම් සහ රට තුළ ඇතිවිය හැකි ආර්ථිකමය වෙනස් වීම මත තීරණය කිරීමට සහ සංශෝධනය කිරීමට නාගොඩ ප්‍රාදේශීය සභාවේ ලේකම් වන මා හට සම්පූර්ණ බලය ඇති බවට 2023 ඔක්තෝබර් මස 31 වැනි දින තීරණ පොතේ අංක 2023.10.31 - 124 යටතේ තීරණය කළ බව මෙයින් නිවේදනය කරමි.

උපලේඛන 08

2024 වර්ෂය සඳහා ආකෘති පත්‍ර සේවා සඳහා අය කරනු ලබන ගාස්තු:

1	විටිරේඛා හා නොපවරා ගැනීමේ සහතිකයක් නිකුත් කිරීමේ ගාස්තු	රු.	750.00
2.	අන්තරාදායක කොස් ගසකට බලපත්‍ර දීම සඳහා ගාස්තුව	රු.	2,000.00
3.	අන්තරාදායක වෙනත් ගසක් සඳහා බලපත්‍ර දීමේ ගාස්තු	රු.	1,000.00
4.	දේපළ අයිතිය සනාථ කිරීමේ සහතිකයක් නිකුත් කිරීමේ ගාස්තුව	රු.	200.00
5.	ගොඩනැගිලි ඉල්ලුම්පත්‍ර ගාස්තු	රු.	1,000.00
6.	නැවත බලපත්‍ර අලුත් කිරීමේ ඉල්ලුම්පත්‍ර ගාස්තු	රු.	500.00
7.	වෙනත් සහතිකයක් නිකුත් කිරීමේ ගාස්තුව	රු.	200.00
8.	මිනින්දෝරු සැලැස්ම අනුමත කිරීමේ ඉල්ලුම්පත්‍ර ගාස්තුව	රු.	750.00
9.	ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ අයදුම්පත් ගාස්තු	රු.	100.00
10.	පාරිසරික බලපත්‍ර ඉල්ලුම්පත් ගාස්තු	රු.	100.00
11.	ජල නළ එළීම සඳහා පාරවල් පළුදු කිරීමේ ඉල්ලුම්පත්‍ර ගාස්තු	රු.	200.00
12.	ජල නළ එළීම සඳහා පාරවල් පළුදු කිරීමේ පෙරසැරි ගාස්තු	රු.	500.00
13.	ගොඩනැගිලි සඳහා අනුකූලතා සහතිකය නිකුත් කිරීමේ අයදුම්පත්‍ර ගාස්තු	රු.	500.00
14.	**ගොඩනැගිලි සඳහා අනුකූලතා සහතිකය නිකුත් කිරීමේ ගාස්තු :**		
	a. නේවාසික භාවිතය සඳහා	රු.	1,000 0
	b. වාණිජ භාවිතය සඳහා	රු.	1,500 0

15.	**අනුමත ගොඩනැගිලි සැලසුම් කාලය දීර්ඝ කිරීමට අදාළ ගාස්තු :**		
	a. පළමු අවුරුද්ද සඳහා	රු.	150.00
	b. දෙවැනි අවුරුද්ද සඳහා	රු.	200.00
	c. තෙවැනි අවුරුද්ද සඳහා	රු.	250.00
	(උපරිම කාලය දීර්ඝ කිරීම වර්ෂ 03ක් පමණි)		
16.	**ඉඩමක් වෙන්දේසි කිරීමක් සඳහා අය කරන ගාස්තුව :**		
	a. සංවර්ධන බලපත්‍රයක් ලබා ගැනීමේ අයදුම්පත්‍ර ගාස්තුව	රු.	100.00
	b. සංවර්ධන බලපත්‍ර නිකුත් කිරීමේ ගාස්තු	රු.	1000.00
	c. කැබලි සැලසුම් අනුමත කිරීමේ අයදුම්පත් ගාස්තු	රු.	500.00
	d. කැබලි සැලසුම් අනුමත කිරීමේ පෙරසැරි ගාස්තුව (ඉඩමේ ඔප්පුවේ වටිනාකම අනුව)		
	(අ). රු. 25,000.00 හෝ ඊට අඩු වන විට	රු.	1,000.00
	(ආ). රු. 25,001 සිට රු. 500,000.00 දක්වා	රු.	5,000.00
	(ඇ). රු. 500,001.00 සිට රු. 1,000,000.00	රු.	10,000.00
	(ඈ). රු. 1,000,000.00 ට වැඩි	රු.	15,000.00
	e. කැබලි සැලසුම් අනුමත කිරීමේ ගාස්තු (කැබැල්ලකට)	රු.	500.00
	f. කැබලි සැලසුම් හා අනුකූලතා සහතික නිකුත් කිරීමේ ගාස්තු	රු.	1,000.00
17.	පුස්තකාල සාමාජික අයදුම්පත්‍ර ගාස්තු	රු.	100.00
18.	පුස්තකාල පොත් ප්‍රමාද ගාස්තු (පොත් දෙකටම)	රු.	4.00
19.	පුස්තකාල සාමාජිකත්වය අලුත් කිරීමේ ගාස්තු	රු.	50.00

දුරකථන කුළුණු හා විකාශන මධ්‍යස්ථාන සඳහා ගාස්තු

1.	දුරකථන කුළුණු හා විකාශන මධ්‍යස්ථානවල සැලැස්ම අනුමත කිරීමේ දී භූමියේ වර්ග අඩියක් සඳහා අයකරන ගාස්තු	රු.	100.00
2.	කුළුණේ පළමු මීටර් 10 නිදහස් වන අතර ඊට වැඩි වන මීටරයකට	රු.	2,500.00
3.	පරීක්ෂණ ගාස්තු	රු.	1,000.00
4.	වාර්ෂික ව්‍යාපාර බද්ද	රු.	3,000.00

ඒ. එන්. එන්. ලමාහේවා,
ලේකම්,
නාගොඩ ප්‍රාදේශීය සභාව.

2023 ඔක්තෝබර් මස 31 වැනි දින,
නාගොඩ ප්‍රාදේශීය සභාව.

නාගොඩ ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා ඉඩම් විකිණීම මත බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 (3) වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව නාගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2024 වර්ෂයට අදාළව ඉඩම් විකිණීම මත බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට සිදු විය යුතු බවට තීරණ පොතේ අංක 2023.10.31 - 125 යටතේ තීරණය කළ බව මෙයින් නිවේදනය කරමි.

ඒ. එන්. එන්. ලමාහේවා,
ලේකම්,
නාගොඩ ප්‍රාදේශීය සභාව.

2023 ඔක්තෝබර් මස 31 වැනි දින,
නාගොඩ ප්‍රාදේශීය සභාව.

තීරණය

"1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 (3) වන වගන්තිය යටතේ සහ එකී පනතේ 154(1) වගන්තිය යටතේ නාගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ යම් ඉඩමක් වෙන්දේසිකරු හෝ තැරැව්කරු හෝ ඔහුගේ සේවකයකු හෝ අනුයෝජිතයකු විසින් ප්‍රසිද්ධව වෙන්දේසියේ හෝ අන්‍යාකාරයකින් විකුණනු ලබන අවස්ථාවක ඒ ඉඩම් විකිණීමෙන් ලත් මුදලින් සියයට එකකට (1%) සමාන බද්දක් විකුණුම්කරු හෝ වෙන්දේසිකරු හෝ තැරැව්කරු හෝ ඔහුගේ සේවකයා අනුයෝජිතයා විසින් ගෙවිය යුතු බවට තීරණය කරමි."

11 - 528/8

නාගොඩ ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා රථවාහන හා සතුන් පිළිබඳ බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 (3) වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව නාගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2024 වර්ෂයට අදාළව රථ වාහන හා සතුන් පිළිබඳ බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට සිදු විය යුතු බවට තීරණ පොතේ අංක 2023.10.31 - 126 යටතේ තීරණය කළ බව මෙයින් නිවේදනය කරමි.

ඒ. එන්. එන්. ලමාහේවා,
ලේකම්,
නාගොඩ ප්‍රාදේශීය සභාව.

2023 ඔක්තෝබර් මස 31 වැනි දින,
නාගොඩ ප්‍රාදේශීය සභාව.

තීරණය

"1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 (3) වන වගන්තිය යටතේ සහ එකී පනතේ අංක 148 වැනි වගන්ති යටතේ පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් අනුප්‍රමාණ අනුව වාහන හා සතුන් පිළිබඳ බද්දක් 2024 වර්ෂය සඳහා නියම කිරීමට තීරණය කළ බව එකී පනතේ 147 වැනි වගන්තිය ප්‍රකාර මෙයින් දැනුම් දෙනු ලබන අතර 148 (3) වැනි වගන්තිය යටතේ බදු මුදල 2024 ජුනි මස 30 වැනි දිනට පෙර ගෙවිය යුතු බවට තීරණය කරමි."

උපලේඛනය

1	බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන වාහනයක් සඳහා	රු.	25.00
2.	පාපැදිය වෙළඳ කාර්යයක් සඳහා යොදවන්නේ නම්	රු.	18.00
3.	පාපැදිය වෙළඳ කාර්යයක් නොවන කාර්යයක් සඳහා යොදවන්නේ නම්	රු.	4.00

11 - 528/9

අත්තනගල්ල ප්‍රාදේශීය සභාව

වරිපනම් ප්‍රතිශතය පිළිගැනීම සහ වරිපනම් බදු පැනවීම - 2024

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 (3) වගන්තියේ පැවරූ බලතල අනුව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 (1) වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව අත්තනගල්ල ප්‍රාදේශීය සභාවේ බල ප්‍රදේශ සඳහා 2024 වර්ෂයට අදාළව වරිපනම් බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට, තීරණ අංක 81 (1) යටතේ 2023 සැප්තැම්බර් මස 13 වැනි දින මා තීරණය කරන ලදී.

කේ. ඒ. උපුල් රංජිත්,
අත්තනගල්ල ප්‍රාදේශීය සභාවේ ලේකම් සහ සභාවේ
බලතල, කාර්යය, කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී,
අත්තනගල්ල ප්‍රාදේශීය සභාව.

2023 සැප්තැම්බර් මස 13 වැනි දින,
අත්තනගල්ල ප්‍රාදේශීය සභාව,
නිට්ටඹුව.

එනම්, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වැනි වගන්තියෙහි (1) වැනි උපවගන්තිය යටතේ අත්තනගල්ල ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 453/6 හා 1987.05.12 දිනැති *ගැසට් පත්‍රය* යටතේ ඉඩම්වල, ගෙපත්වල වාර්ෂික වටිනාකම සඳහා වේයන්ගොඩ උප කාර්යාල බල ප්‍රදේශයට 2016 වර්ෂයේ තක්සේරුව ද, බෙම්මුල්ල උපකාර්යාලය සඳහා 2019 තක්සේරුව ද, ඔයබඩපේරුව උපකාර්යාලය සඳහා 2023 තක්සේරුව ද, අනෙකුත් උපකාර්යාල වන එගොඩපොත උපකාර්යාලය / මෙගොඩපොත උපකාර්යාලය සඳහා 2009 තක්සේරුවේ සත්‍යක්ෂණය 2024 වර්ෂයේ තක්සේරුව ලෙස සම්මත කළ යුතු බවටත්, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) උප වගන්තියෙහි බලතල ප්‍රකාරව එකී දේපළ මත ඉහත කී තක්සේරුව සඳහා වාර්ෂික වටිනාකමින් සියයට හතක් (7%) වාර්ෂික වරිපනම් බද්දක් නියම විය යුතුය.

තව ද, 2024 වර්ෂයෙහි පහත උපලේඛනයෙහි සඳහන් එක් එක් කාර්තුව වෙනුවෙන් ඉදිරියෙන් නිරූපිත දිනයට පෙර එසේ නියම කරන ලද වාර්ෂික වරිපනම් බද්ද අත්තනගල්ල ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවිය යුතු බවටත්, එලෙස වාර්ෂික වරිපනම් බද්ද 2024 වර්ෂයෙහි ජනවාරි මස 31 වැනි දින හෝ ඊට ප්‍රථම ගෙවන්නේ නම් වාර්ෂික වරිපනම් බද්දේ ප්‍රමාණයෙන් සියයට දහයක (10%) වට්ටමක් ද, එකී උපලේඛනයෙහි එක් එක් කාර්තුව ඉදිරියේ තුන්වන තීරුවේ නිරූපිත දිනයට පෙර අදාළ වරිපනම් බදු මුදල අත්තනගල්ල ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවනු ලබන්නේ නම් එකී කාර්තුවට අදාළ මුදලින් සියයට පහක (5%) වට්ටමක් ද, අත්තනගල්ල ප්‍රාදේශීය සභාව ලබා දිය යුතු වේ.

උපලේඛනය

කාර්තුව	*ගෙවිය යුතු දිනය*	*10% වට්ටම සඳහා හිමිකම් ලබන අවසාන දිනය*	*5% වට්ටම සඳහා හිමිකම් ලබන අවසාන දිනය*
පළමු වන කාර්තුව	2024 මාර්තු 31 ට පෙර	2024 ජනවාරි 31	
දෙවන කාර්තුව	2024 ජූනි 30 ට පෙර		2024 අප්‍රේල් 30
තුන්වන කාර්තුව	2024 සැප්තැම්බර් 30 ට පෙර		2024 ජූලි 31
හතරවන කාර්තුව	2024 දෙසැම්බර් 31 ට පෙර		2024 ඔක්තෝබර් 31

11-525/1

අත්තනගල්ල ප්‍රාදේශීය සභාව

අක්කර බදු පැනවීම - 2024

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 (3) වගන්තියේ පැවරූ බලතල අනුව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 (3) වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව අත්තනගල්ල ප්‍රාදේශීය සභා බල සීමාව ඇතුළත පිහිටියා වූ ද, ස්ථිර හෝ නිතිපතා ගොවිතැනක් යටතේ වූ හෙක්ටයාර එකක් මත 2024 වර්ෂය සඳහා රුපියල් 50/- ක් බැගින් වන වාර්ෂික අක්කර බද්දක් පනවා අය කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට 2023 සැප්තැම්බර් මස 13 වැනි දින මා තීරණය කරන ලදී.

කේ. ඒ. උපුල් රංජිත්,
අත්තනගල්ල ප්‍රාදේශීය සභාවේ ලේකම් සහ සභාවේ
බලතල, කාර්යය, කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී,
අත්තනගල්ල ප්‍රාදේශීය සභාව.

2023 සැප්තැම්බර් මස 13 වැනි දින,
අත්තනගල්ල ප්‍රාදේශීය සභාව,
නිට්ටඹුව.

ඉහත කී පනතේ 134 (3) වන වගන්තියෙහි සඳහන් විධිවිධාන අනුව පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් අක්කර බද්ද නියම කිරීමේ හා අය කිරීමේ කාර්යය සඳහා විශේෂ ප්‍රදේශයක් වශයෙන් සළකනු ලබන බව අංක 450/6 හා 1989.02.03 දිනැති *ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කර ඇති නියමයන්ට ඇතුළත් අත්තනගල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටියා වූ හෙක්ටයාර් එකකට වැඩි එහෙත් හෙක්ටයාර පහකට අඩු ස්ථිර හෝ නිතිපතා ගොවිතැන් යටතේ සෑම ඉඩමක් වෙනුවෙන් ම, එකී ඉඩමේ හෙක්ටයාර එකක් සඳහා 2024 වර්ෂයට රුපියල් පනහක් බැගින් වන වාර්ෂික අක්කර බද්දක් පනවා අය කළ යුතු අතර,

තව ද, 2024 වර්ෂයෙහි පහත උපලේඛනයෙහි සඳහන් එක් එක් කාර්තුව වෙනුවෙන් ඉදිරියෙන් නිරූපිත දිනයට පෙර, එසේ නියම කරන ලද වාර්ෂික අක්කර බද්ද අත්තනගල්ල ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවිය යුතු බවටත්, එලෙස වාර්ෂික අක්කර බද්ද 2024 වර්ෂයෙහි ජනවාරි මස 31 වැනි දින හෝ ඊට ප්‍රථම ගෙවන්නේ නම් වාර්ෂික අක්කර බද්දේ ප්‍රමාණයෙන් සියයට දහයක (10%) වට්ටමක් ද, එකී උපලේඛනයෙහි එක් එක් කාර්තුව ඉදිරියේ තුන්වන නිරූපිත දිනයට පෙර අදාළ අක්කර බදු මුදල අත්තනගල්ල ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවනු ලබන්නේ නම් එකී කාර්තුවකට මුදලින් 5% ක වට්ටමක් ද, අත්තනගල්ල ප්‍රාදේශීය සභාව ලබා දිය යුතු වේ,

උපලේඛනය

කාර්තුව	*ගෙවිය යුතු දිනය*	*10% වට්ටම සඳහා නිමිකම් ලබන අවසාන දිනය*	*5% වට්ටම සඳහා නිමිකම් ලබන අවසාන දිනය*
පළමු වන කාර්තුව	2024 මාර්තු 31 ට පෙර	2024 ජනවාරි 31	
දෙවන කාර්තුව	2024 ජූනි 30 ට පෙර		2024 අප්‍රේල් 30
තුන්වන කාර්තුව	2024 සැප්තැම්බර් 30 ට පෙර		2024 ජූලි 31
හතරවන කාර්තුව	2024 දෙසැම්බර් 31 ට පෙර		2024 ඔක්තෝබර් 31

11-525/2

අත්තනගල්ල ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 155, 159 (1) හා 161 වගන්ති අනුව වරෙන්තු ගාස්තු පැනවීම - 2024

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 (3) වගන්තියේ පැවරූ බලතල අනුව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159 (1) හා 161 වගන්තිවල විධිවිධාන ප්‍රකාරව අත්තනගල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ප්‍රකාශිත වරිපනම් බදු හා කුළී ගාස්තු අය

කිරීමේ දී නිශ්චිත කාලසීමාව තුළ ගෙවීම පැහැර හරින්නන් වෙත වරෙන්තු ගාස්තුව පහත සඳහන් ආකාරයට විය යුතු බවට 2023 සැප්තැම්බර් මස 13 වැනි දින මා තීරණය කරන ලදී.

කේ. ඒ. උපුල් රංජිත්,
අත්තනගල්ල ප්‍රාදේශීය සභාවේ ලේකම් සහ සභාවේ
බලතල, කාර්යය, කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
අත්තනගල්ල ප්‍රාදේශීය සභාව.

2023 සැප්තැම්බර් මස 13 වැනි දින,
අත්තනගල්ල ප්‍රාදේශීය සභාව,
නිට්ටඹුව.

1. අයවිය යුතු බද්දේ හෝ කුළියේ ප්‍රමාණයෙන් 10%ක් ද,
2. හිස්බිම හා නිවාස ස්ථාන සම්බන්ධයෙන් අය විය යුතු වරිපනම් බද්දේ ප්‍රමාණයෙන් 15%ක් ද,
3. හිස්බිම හා නිවාස ස්ථාන නොවන දේපළ සම්බන්ධයෙන් අයවිය යුතු වරිපනම් බද්දේ ප්‍රමාණයෙන් 20% ක් ද, අය කළ යුතු වේ.

11-525/3

අත්තනගල්ල ප්‍රාදේශීය සභාව

ඉඩම් විකිණීම මත බදු අය කිරීම - 2024

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 (3) වගන්තියේ පැවරූ බලතල අනුව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154 (1) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව අත්තනගල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ යම් ඉඩමක් වෙන්දේසිකරුවෙකු හෝ තැරැව්කරුවෙකු හෝ ඔවුන්ගේ සේවකයා හෝ අනු නියෝජිතයා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ හෝ අන්‍යාකාරයකින් විකුණනු ලබන අවස්ථාවක එම ඉඩම විකිණීමෙන් ලැබෙන මුදලින් 1% කට සමාන බද්දක් එකී වෙන්දේසිකරු හෝ තැරැව්කරු හෝ ඔහුගේ අනු නියෝජිතයා විසින් අත්තනගල්ල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට 2023 සැප්තැම්බර් මස 13 වැනි දින මා තීරණය කරන ලදී.

කේ. ඒ. උපුල් රංජිත්,
අත්තනගල්ල ප්‍රාදේශීය සභාවේ ලේකම් සහ සභාවේ
බලතල, කාර්යය, කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
අත්තනගල්ල ප්‍රාදේශීය සභාව.

2023 සැප්තැම්බර් මස 13 වැනි දින,
අත්තනගල්ල ප්‍රාදේශීය සභාව,
නිට්ටඹුව.

11-525/4

අත්තනගල්ල ප්‍රාදේශීය සභාව

සංවර්ධනය නොකළ ඉඩම් සඳහා පැනවෙන බදු - 2024

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 (3) වගන්තියේ පැවරූ බලතල අනුව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 153 වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව අත්තනගල්ල ප්‍රාදේශීය සභා සීමාව තුළ ඇති සංවර්ධනය නොකළ ඉඩම් සඳහා එම ඉඩමේ ප්‍රාග්ධන බිම් අගයෙන් සියයට දෙකක් (2%) වන බද්දක් 2024 වර්ෂය සඳහා පනවා අය කළ යුතු බවටත්, එම බද්දේ කාර්යය සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 153 (1) (ආ) ඡේදය යටතේ වන "සමානුපාතය" වශයෙන් එම ඉඩමේ ගොඩනැගිලිවලින් ආවරණය වූ

බිම් ප්‍රමාණය සහ සම්පූර්ණ බිම් ප්‍රමාණය අතර ඇති අනුපාතය නියමිත ප්‍රමාණයට වඩා අඩු වීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට 2023 සැප්තැම්බර් මස 13 වැනි දින මා තීරණය කරන ලදී.

කේ. ඒ. උපුල් රංජිත්,
අත්තනගල්ල ප්‍රාදේශීය සභාවේ ලේකම් සහ සභාවේ
බලතල, කාර්යය, කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී,
අත්තනගල්ල ප්‍රාදේශීය සභාව.

2023 සැප්තැම්බර් මස 13 වැනි දින,
අත්තනගල්ල ප්‍රාදේශීය සභාව,
නිට්ටඹුව.

11-525/5

අත්තනගල්ල ප්‍රාදේශීය සභාව

රථ වාහන හා සතුන් පිළිබඳ බදු පැනවීම - 2024

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 (3) වගන්තියේ පැවරූ බලතල අනුව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වැනි වගන්තිය හා 148 වැනි වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව පහත උපලේඛනයෙහි දැක්වෙන ආකාරයට වාහන හා සතුන් පිළිබඳ වාර්ෂික බද්දක් අත්තනගල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2024 වර්ෂයට අදාළව නියම කර අය කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට 2023 සැප්තැම්බර් මස 13 වන දින මා තීරණය කරන ලදී.

කේ. ඒ. උපුල් රංජිත්,
අත්තනගල්ල ප්‍රාදේශීය සභාවේ ලේකම් සහ සභාවේ
බලතල, කාර්යය, කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී,
අත්තනගල්ල ප්‍රාදේශීය සභාව.

2023 සැප්තැම්බර් මස 13 වැනි දින,
අත්තනගල්ල ප්‍රාදේශීය සභාව,
නිට්ටඹුව.

උපලේඛනය

	I වැනි තීරය	*II වැනි තීරය* *රු. ශත*
1.	මෝටර් රථයක්, මෝටර් කාරයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක් හෝ කරත්තයක්, ජීන් රික්ෂෝවක් හෝ බයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා කාර්තුව	
	(අ) වෙළඳ කාර්යයක් සඳහා යොදවන්නේ නම්	18 0
	(ආ) වෙළඳ කාර්යයක් නොවන කාර්යයක් සඳහා යොදවන්නේ නම්	4 0
2.	සෑම කරත්තයක් සඳහා	20 0
3.	සෑම අත් කරත්තයක් සඳහා	10 0
4.	සෑම රික්ෂෝවක් සඳහා	7 50
5.	සෑම අශ්වයෙකු, පෝනියෙකු හෝ කොටළුවෙකු සඳහා	15 0
6.	සෑම ඇතෙකු සඳහා	50 0

විෂ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝද ඇති ළමා වාහන, වීල්බැරෝ, හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළඳ කාර්යය සඳහා යොදවන අත් කරත්ත සහ වෙළඳ කාර්ය සඳහා නොයොදවන අත් කරත්ත මෙකී ගෙවීමෙන් නිදහස් කෙරේ.

මේ උපලේඛනයේ "වෙළඳ කාර්ය" යන්න, විකිණීම සඳහා හෝ අන්‍යාකාරයකින් හෝ යම් වෙළඳ ව්‍යාපාරයක් නැතහොත් කර්මාන්තයක් සඳහා වූ යම් ද්‍රව්‍ය හෝ බඩු හෝ යම් ලිඛිත නැතහොත් මුද්‍රිත ද්‍රව්‍ය ගෙනයාම හෝ ප්‍රවාහනය කිරීම ඇතුළත් වේ.

11-525/6

අත්තනගල්ල ප්‍රාදේශීය සභාව

109 වගන්තිය අනුව 2024 වර්ෂය සඳහා වෙනත් ගාස්තු අය කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 (3) වගන්තියේ පැවරූ බලතල අනුව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 109 වගන්තිය අනුව පහත උපලේඛනයෙහි දැක්වෙන ආකාරයට අත්තනගල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2024 වර්ෂයට අදාළව වෙනත් ගාස්තු නියමකර අය කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට 2023 සැප්තැම්බර් මස 13 වැනි දින මා තීරණය කරන ලදී.

කේ. ඒ. උපුල් රංජිත්,
අත්තනගල්ල ප්‍රාදේශීය සභාවේ ලේකම් සහ සභාවේ
බලතල, කාර්යය, කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී,
අත්තනගල්ල ප්‍රාදේශීය සභාව.

2023 සැප්තැම්බර් මස 13 වැනි දින,
අත්තනගල්ල ප්‍රාදේශීය සභාව,
නිට්ටඹුව.

උපලේඛනය

		රු. ශත
01.	සුසාන භූමිවල ස්මාරක ඉදි කිරීම (උපරිම උස අඩි 06) - වර්ග අඩියකට	500 0
02.	සුසාන භූමිවල තැන්පත් කිරීම සඳහා (උපරිම උස අඩි 06) - වර්ග අඩියකට	500 0
03.	*ආදාහනාගාර වෙන් කිරීම :*	
	- බල ප්‍රදේශය තුළ සිදුවන එක් ආදාහනයක් සඳහා	10,000 0
	- බල ප්‍රදේශයෙන් පිටත සිදුවන එක් ආදාහනයක් සඳහා	12,000 0
04.	*ගලි බවුසරය වෙන් කිරීම :*	
	- බල ප්‍රදේශය තුළ - නිවාස	5,000 0
	- ව්‍යාපාරික ස්ථාන	8,000 0
	- ආගමික	4,700 0
	- රාජ්‍ය	5,500 0
	(කලින් කළ රජය විසින් පනවන බදු මුදල් අදාළ වේ.)	
	- බල ප්‍රදේශයෙන් පිටත - නිවාස	6,000 0
	- ව්‍යාපාරික ස්ථාන	9,000 0
	- ආගමික	5,000 0
	- රාජ්‍ය	6,500 0
(කලින් කලට රජය විසින් පනවන ලද බදු මුදල් එකතු විය යුතු අතර ප්‍රවාහන ගාස්තු ලෙස කි. මී. 01ක් සඳහා රු. 90 0 ක් එකතු වේ. අදාළ වේ.)		
05.	*ශාලා ගාස්තු* - ප්‍රධාන කාර්යාලයේ රැස්වීම් ශාලාව (දිනකට)	
	- බල ප්‍රදේශය තුළ	6,000 0
	- බල ප්‍රදේශයෙන් පිටත	7,500 0

	රු. ශත
ඔයබඩපේරුව උපකාර්යාලයේ රැස්වීම් ශාලාව (දිනකට)	
- ආසන සමග ශාලාව	7,500 0
වේයන්ගොඩ රංග ශාලාව :	
- දිනක් (පැය 12ක් සඳහා)	100,000 0
- දින 1/2ක් (පැය 6ක් සඳහා)	60,000 0
- නැවත ගෙවනු ලබන තැන්පත් මුදල්	25,000 0

06. (i) **මාර්ග පළුදු කිරීම හේතුවෙන් අය කිරීම (වර්ග මීටර් 1ක් සඳහා) :**

1. බොරළු	940 0
2. තාර	2,860 0
3. කොන්ක්‍රීට්	7,815 0
4. කාපට්	9,250 0
5. අන්තර් සම්බන්ධිත කුට්ටිගල්	9250 0

(ii) මාර්ග භාවිතයට අවසර ගැනීම (මාර්ග හානි සඳහා)
කිලෝමීටරයක් සඳහා ආපසු ගෙවන (තැන්පතුවක්) 100,000 0

07. **ප්‍රාදේශීය සභා භූමියේ රථ ගාල් සඳහා වාහන නැවතුම් ගාස්තු අයකිරීම (පැයකට) :**

1. මෝටර් සයිකලයක් සඳහා	50 0
2. ත්‍රීවීල් රථයක් සඳහා	50 0
3. කාර්/වෑන් සඳහා	100 0
4. ලොරි/බස් සඳහා	100 0

(වැඩි වන සෑම පැයකටම රු. 10 0 බැගින් අයකළ යුතුය.)

08. **කොම්පෝස්ට් පොහොර :**

ප්‍රමාණය (Kg)	*මිල රු. ශත*
01 - 100	20 0
101 - 499	18 0
500 - 999	16 0
1000 ට වැඩි	12 0

09. (i) **ජල බවුසරය (6000L) ධාරිතාව සඳහා ප්‍රවාහන ගාස්තුව :**

	රු. ශත
නිවසක් සඳහා	6,000 0
ව්‍යාපාරික ස්ථානයක් සඳහා	8,000 0
ජල ගාස්තුව	960 0

(මෙම ජල බවුසරය ලබා දෙනු ලබන්නේ පානීය ජලය ලබා ගැනීමේ අවශ්‍යතාවය වෙනුවෙන් පමණයි.)

(ii) **ජල බවුසරය (3000L) ධාරිතාව සඳහා ප්‍රවාහන ගාස්තුව :**

නිවසක් සඳහා	4,000 0
ජල ගාස්තුව	300 0

බවුසරය රඳවාගෙන ජලය ලබා ගැනීමේ කටයුතු වෙනුවෙන් (3000L ධාරිතාව) ජල බවුසරය පමණක් ලබා දෙයි. ඒ සඳහා,

රඳවා ගැනීමේ ගාස්තුව දිනකට	රු. 500
රඳවා ගැනීමේ පළමු පැය	නිදහස්
දෙවන පැයේ සිට සෑම පැයකටම	රු. 500 බැගින්

(කළින් කළට රජය විසින් පනවන ලද බදු මුදල් මෙම ගාස්තු සඳහා අදාළ වේ.)

11-525/7

අත්තනගල්ල ප්‍රාදේශීය සභාව

1947/6 හා 2015.12.28 දින පළාත් සභාව විසින් සම්මත කරන ලද අතුරු ව්‍යවස්ථාව අනුව ගාස්තු අය කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 (3) වගන්තියේ පැවරූ බලතල අනුව අංක 1947/6 හා 2015.12.28 වැනි දින දරන බස්නාහිර පළාත් සභාව විසින් සම්මත කරන ලද අතුරු ව්‍යවස්ථාව, අංක 1989, 2016.10.14 වැනි දින *ගැසට් පත්‍රයේ* පළකර 2017.01.01 වැනි දින සිට අදාළවන පරිදි අත්තනගල්ල ප්‍රාදේශීය සභාව විසින් වැළඳ ගැනීමෙන්, පහත උපලේඛනයෙහි දැක්වෙන ආකාරයට අත්තනගල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2024 වර්ෂයට අදාළව පහත සඳහන් ආකාරයට විය යුතු බවට 2023 සැප්තැම්බර් මස 13 වැනි දින මා තීරණය කරන ලදී.

කේ. ඒ. උපුල් රංජිත්,
අත්තනගල්ල ප්‍රාදේශීය සභාවේ ලේකම් සහ සභාවේ
බලතල, කාර්යය, කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
අත්තනගල්ල ප්‍රාදේශීය සභාව.

2023 සැප්තැම්බර් මස 13 වැනි දින,
අත්තනගල්ල ප්‍රාදේශීය සභාව,
නිට්ටඹුව.

		රු. ශත
1.	ගොඩනැගිලි අයදුම්පත්‍රයක්/බිම් කට්ටි/පෝරම ගාස්තු	750 0
2.	විථි රේඛා පරීක්ෂණ ගාස්තු/මාර්ග සහතික	500 0
3.	සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ ඉල්ලුම්පත් ගාස්තු	500 0
5.	පෙර පාසල් ගාස්තු - එක් දරුවෙකු සඳහා මසකට උපරිමය	300 0
6.	පෙර පාසල්වල ඇතුළත්වීමේ අයදුම්පත්‍ර ගාස්තු	200 0
7.	පුස්තකාල සාමාජික ගාස්තු	100 0
8.	පුස්තකාල අයදුම්පත් ගාස්තු	50 0
9.	පුස්තකාල සාමාජිකත්වය අලුත් කිරීම	50 0
10.	ඔප්පු සාරාංශ අයදුම්පත්‍ර ගාස්තු	100 0
11.	ඔප්පු සාරාංශ පරීක්ෂණ ගාස්තු	400 0

02. **සභාව සතු භූමි තාවකාලිකව විවිධ කාර්යයන් සඳහා ලබා දීමේදී අයකරන ගාස්තු :**

			රු. ශත
1.	I.	සභාව සතු නිට්ටඹුව මහජන ක්‍රීඩාපිටිය මුදල් අය කිරීමේ කාර්යයන් සඳහා යොදවා ගැනීමේදී කුළී අය කිරීම වැට් බදු රහිතව එක් දිනක් සඳහා	10,000 0
	II.	සභාව සතු නිට්ටඹුව මහජන ක්‍රීඩාපිටිය මුදල් අය නොකරන කාර්යයක් සඳහා යොදවා ගැනීමේදී කුළී අය කිරීම වැට් බදු රහිතව එක් දිනක් සඳහා	5,000 0

		රු. ශත
2.	නිට්ටඹුව හා වේයන්ගොඩ ක්‍රීඩාභූමිය සංගීත සංදර්ශන, සැණකෙළි සඳහා එක් දිනකට වෙන් කිරීමේදී කොන්දේසි මත ආපසු ගෙවන රු. 50,000 ක් ද තැන්පත් කළ යුතු ය.	5,000 0
3.	ඉහත ස්ථාන හැර ප්‍රාදේශීය සභාව සතු සියලුම ක්‍රීඩාපිටි සඳහා කුළී අය කිරීම වැට් බදු රහිතව එක් දිනක් සඳහා	5,000 0
4.	නාගරික ප්‍රදේශය තුළ පිහිටි සභාවට අයත් විවෘත බිම් කුළියට දීමට වර්ග අඩියක් සඳහා වැට් බදු රහිතව එක් දිනක් සඳහා සභාව තීරණය කරනු ලබන වෙළඳ කාර්යයන් සඳහා පමණයි (උපරිමය දින 14)	10 0
03.	01. වීථිරේඛා සහතිකයක්/නොපවරා ගැනීමේ සහතිකයක් ලබා ගැනීම සඳහා	500 0
	02. වරිපනම් ලේඛනයේ උධෘත සනාථ කරන සහතික (වර්ෂ ගණනාවක් සම්බන්ධයෙන් උධෘත ලබා ගැනීමේ දී වැඩිවන එක් වර්ෂයක් සඳහා එක් අවුරුද්දකට රු. 100 බැගින් වැඩිවේ.)	500 0
	03. නිකුත් කරන ලද තක්සේරු නිවේදන සනාථ කරන සහතික	500 0
04.	ලියාපදිංචි ත්‍රිරෝද රථ සංගමයක එක් ත්‍රිරෝද රථයක් සඳහා මසකට (කලින් කළ රජය විසින් පනවන බදු මුදල් අදාළ වේ.)	100 0

11-525/8

අත්තනගල්ල ප්‍රාදේශීය සභාව

2024 වර්ෂයට ව්‍යාපාර බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 (3) වගන්තියේ පැවරූ බලතල අනුව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 (1) උපවගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව අත්තනගල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2024 වර්ෂයට අදාළව ව්‍යාපාර බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට 2023 සැප්තැම්බර් මස 13 වැනි දින මා තීරණය කරන ලදී.

කේ. ඒ. උපුල් රංජිත්,
අත්තනගල්ල ප්‍රාදේශීය සභාවේ ලේකම් සහ සභාවේ
බලතල, කාර්යය, කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
අත්තනගල්ල ප්‍රාදේශීය සභාව.

2023 සැප්තැම්බර් මස 13 වැනි දින,
අත්තනගල්ල ප්‍රාදේශීය සභාව,
නිට්ටඹුව.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වැනි උපවගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ අත්තනගල්ල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ එම පනතේ 150 වන වගන්තිය යටතේ යම් බද්දක් ගෙවීම අවශ්‍ය නොවන යම් ව්‍යාපාරයක් අත්තනගල්ල ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත 2024 වර්ෂයේ දී පවත්වාගෙන යන සෑම තැනැත්තෙක්ම එම ව්‍යාපාරයේ 2023 වර්ෂයේ ආදායම මෙහි පහත උපලේඛනයෙහි I වැනි තීරුවේ නිරූපිත යම් යම් විෂයාංක සීමාවන් ඇතුළත පවතින අවස්ථාවක එකී II වැනි තීරුවේ අනුරූප සටහනේ නිරූපිත අනුප්‍රමාණයක ව්‍යාපාර බද්දක් 2024 වර්ෂය සඳහා නියම විය යුතුය.

පළමුවන උපලේඛනය

I වැනි තීරුව *2023 වර්ෂය සඳහා වූ ව්‍යාපාරයේ ආදායම*	*II වැනි තීරුව* *ගෙවිය යුතු වාර්ෂික බද්ද* *රු. ශත*
රු. 6,000 නොඉක්මවන අවස්ථාවක	අය කිරීමක් නැත
රු. 6,001 ඉක්මවන එහෙත් රු. 12,000 නොඉක්මවන විට	90 0
රු. 12,001 ඉක්මවන නමුත් රු. 18,750 නොඉක්මවන විට	180 0
රු. 18,751 ඉක්මවන නමුත් රු. 75,000 නොඉක්මවන විට	360 0
රු. 75,001 ඉක්මවන නමුත් රු. 1,50,000 නොඉක්මවන විට	1,200 0
රු. 1,50,001 ඉක්මවන විට	3,000 0

11-525/9

අත්තනගල්ල ප්‍රාදේශීය සභාව

කර්මාන්ත බදු පැනවීම - 2024

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 (3) වගන්තියේ පැවරූ බලතල අනුව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 (1) වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව, අත්තනගල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2024 වර්ෂයට අදාළව කර්මාන්ත බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට 2023 සැප්තැම්බර් මස 13 වැනි දින මා තීරණය කරන ලදී.

කේ. ඒ. උපුල් රංජිත්,
අත්තනගල්ල ප්‍රාදේශීය සභාවේ ලේකම් සහ සභාවේ
බලතල, කාර්යය, කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
අත්තනගල්ල ප්‍රාදේශීය සභාව.

2023 සැප්තැම්බර් මස 13 වැනි දින,
අත්තනගල්ල ප්‍රාදේශීය සභාව,
නිට්ටඹුව.

තීරණය

අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අත්තනගල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක පවත්වාගෙන යනු ලබන මෙහි පහත උපලේඛනයෙහි 1 වැනි තීරුවේ නිරූපිත සෑම කර්මාන්තයක් සම්බන්ධයෙන් එම උපලේඛනයෙහි II වැනි තීරුවේ අනුරූප සටහනේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2024 වර්ෂය සඳහා නියම විය යුතු වේ.

උපලේඛනය

අනු. අංකය	*කර්මාන්තයේ ස්වභාවය*	*I වැනි තීරුව*	*II වැනි තීරුව*	
			පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම	
		රු. 750 නොඉක්මවන අවස්ථාවක	*රු. 751 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන*	*රු. 1,501 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
1.	පුවක් වේලා සකස් කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
2.	ලේ හෝ අතුණුබහන් උණු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
3.	ලී වේළීම සඳහා	500 0	750 0	1,000 0
4.	යන්ත්‍රානුසාරයෙන් රබර් ෂීට් නිපදවීම හා දුම් ගැසීම	500 0	750 0	1,000 0
5.	අත්යන්ත්‍ර මාර්ගයෙන් රබර් ෂීට් නිපදවීම හා දුම් ගැසීම	500 0	750 0	1,000 0
6.	ප්ලාස්ටික් වැල් හෝ වේවැල් භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපාර ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
7.	දුම්කොළ වේලා සකස් කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
8.	සුරුට්ටු නිපදවීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
9.	පැණි නිපදවීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
10.	බීඩි, නිපදවීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
11.	කොප්පරා නිපදවීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
12.	දත් බෙහෙත් නිපදවීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
13.	කපාපු පොල් නිපදවීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
14.	හුණු නිපදවීම සඳහා පෝරණුවක් පවත්වාගෙන යාම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
15.	ගම් නිපදවීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
16.	යන්ත්‍රානුසාරයෙන් හෝ විදුලි බලයෙන් ක්‍රියා කරන (බලවේග, තූල් කටින) හෝ රෙදි නිපදවීමේ ආයතනයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
17.	ඇඟලුම් කම්හලක් (ගාමන්ට්) පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
18.	ප්ලාස්ටික් බඩු, ප්ලාස්ටික් නාම පුවරු හා ප්ලාස්ටික් ද්‍රව්‍ය නිපදවීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
19.	යන්ත්‍රානුසාරයෙන් සපත්තු හෝ පාවහන් නිපදවීම සඳහා	500 0	750 0	1,000 0
20.	රබර් අත්වැසුම් නිෂ්පාදනය සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
21.	කුඩාරම් නිෂ්පාදනය සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
22.	කාඩ්බෝඩ් පෙට්ටි නිපදවීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
23.	ප්‍රමාණයෙන් ටොන් 10ක් ඉක්මවන සත්ත්ව ආහාර නිෂ්පාදන ගබඩාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
24.	වතුර බෝතල් කිරීමේ ආයතනයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
25.	දැව පදම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
26.	මෙතිලේටඩ් ස්පිරිතු නිපදවීම හෝ ගබඩා කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
27.	කපු පුළුන් නිපදවීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
28.	එක් අයෙකුට වැඩි දෙනෙකු සේවය කරන ස්ථානයක ආභරණ නිපදවීම	500 0	750 0	1,000 0
29.	එක් අයෙකුට වැඩි දෙනෙකු සේවය කරන ස්ථානයක යකඩ කම්හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
30.	විදුලි බලයෙන් ක්‍රියා කරන මුද්‍රණාලයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
31.	අත්යන්ත්‍ර මගින් ක්‍රියා කරන මුද්‍රණාලයක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
32.	තේ කොළ පැකට් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0

අනු. අංකය	කර්මාන්තයේ ස්වභාවය	I වැනි තීරුව	II වැනි තීරුව පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම	
		රු. 750 නොඉක්මවන අවස්ථාවක	රු. 751 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන	රු. 1,501 ඉක්මවන අවස්ථාවක
		රු. ශත	රු. ශත	රු. ශත
33.	ඩුප්ලෝ යන්ත්‍ර භාවිතා කර මුද්‍රණ කටයුතු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
34.	මිශ්‍ර හෝ කෘතිම පොහොර නිපදවීම සඳහා සුදුසු ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
35.	වීදුරු නිෂ්පාදනය සඳහා සුදුසු ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
36.	යන්ත්‍රෝපකරණ හා යන්ත්‍රානුසාරයෙන් අමතර කොටස් එකළස් කිරීම සඳහා සුදුසු ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
37.	සිමෙන්ති බ්ලොක් ගල් නිපදවීම සඳහා සුදුසු ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
38.	කළු ගල් පිපිරවීම සඳහා සුදුසු ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
39.	කරවල වේලීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
40.	මිරිස්, පිටි ධාන්‍ය, කුළු බඩු හෝ වෙනත් ඇට වර්ග ඇඹරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
41.	අත්යන්ත්‍ර මගින් ක්‍රියාකරන ලී මෝල්ක් පවත්වාගෙන යාම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
42.	අම්ලකර වායුව (ඔක්සිජන්) භාවිතා කර යකඩ කම්හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
43.	අ. බ. 10 හෝ 20 අතර වූ වී මෝල්ක් සඳහා ඇඹරුම්හලක් පවත්වාගෙන යාම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
44.	අ. බ. 20 ට අධික වූ වී මෝල්ක් සඳහා ඇඹරුම්හලක් පවත්වාගෙන යාම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
45.	යන්ත්‍රානුසාරයෙන් ගඩොල් හෝ උළු පිළිස්සීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
46.	යන්ත්‍රානුසාරයෙන් හෝ අන් අයුරකින් ගඩොල් හෝ උළු පිළිස්සීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
47.	බැටරි චාජ් කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
48.	නුණු ගල් පිළිස්සීම, රෑස් කිරීම, වේලීම හා කැබලිවලට කැඩීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
49.	යාන්ත්‍රික බලයෙන් ක්‍රියාකරන ටයර් අළුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
50.	ටයර් හෝ ටියුබ් වෝල්කනයිසින් කිරීමේ ආයතනයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
51.	රෙදි මුද්‍රණය කිරීම හා පින්තාරු කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
52.	විද්‍යුත් ලෝහාලේපනය කිරීම සඳහා යාන්ත්‍රික බලයෙන් ක්‍රියා නොකරන ගරාජයක් හැර වෙනත් ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
53.	බයිසිකල් අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
54.	බෙලෙක් වැඩ කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
55.	වඩු වැඩ කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
56.	ගෘහ භාණ්ඩ නිපදවීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
57.	තෙල් නිෂ්කර්ශණය කිරීම සඳහා යන්ත්‍රයක් හෝ සෙක්කුවක් තබා ගැනීම	500 0	750 0	1,000 0
58.	විදුලි උපකරණ හෝ රේඩියෝ අලුත්වැඩියා කිරීමේ සාප්පුවක් හෝ රේඩියෝ කර්මාන්ත ශාලාවක් සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

	I වැනි තීරුව	*II වැනි තීරුව*		
		පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම		
අනු. අංකය	*කර්මාන්තයේ ස්වභාවය*	*රු. 750 නොඉක්මවන අවස්ථාවක*	*රු. 751 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන*	*රු. 1,501 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
59.	රස කැවිලි නිපදවීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
60.	තේ පෙට්ටි නිපදවීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
61.	පොල්කටු අඟුරු නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
62.	සෙල්ලම් බඩු නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
63.	නූල් කෝන් නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
64.	තලාතු මිනිරන් වේලීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
65.	ගෙන්දගම් දුම් ගැසීමෙන් කුරුඳු, එනසාල් හෝ කොහු වේලීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
66.	මාළු වරල් වේලීම හෝ සකස් කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
67.	යන්ත්‍රානුසාරයෙන් ලෝහ ඉැනයිට් ගැනීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
68.	හුණු ගල් කැඩීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
69.	කපු නූල් පොඟවා නිම කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
70.	සයිලන්සර් නිපදවීමේ කර්මාන්ත ශාලාවක් හෝ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
71.	මේද නිපදවීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
72.	යන්ත්‍රානුසාරයෙන් තෙල් නිෂ්කර්ෂණය කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
73.	යන්ත්‍රානුසාරයෙන් ඇටකටු ඇඹරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
74.	තෙල් මෝල්ක් පවත්වාගෙන යාම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
75.	පෑස්සීමේ හෝ අම්ලකර පෑස්සීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
76.	ලියවන පට්ටලයක් භාවිතා කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
77.	මෝටර් ගරාජයක් සහිතව හෝ මෝටර් වාහන සර්විස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
78.	කොහු හෝ කෙඳි වර්ග නිපදවීම හෝ කොහු කෙඳි වර්ගවලින් සාදනු ලබන භාණ්ඩ නිපදවීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
79.	ලී පෙඟවීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
80.	ඇලුමිනියම් බඩු නිපදවීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
81.	යන්ත්‍ර නොමැතිව ගඩොල් හෝ උළු නිපදවීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
82.	ගල් කැඩීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
83.	යන්ත්‍රානුසාරයෙන් ගල් කැඩීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
84.	යන්ත්‍රානුසාරයෙන් කුට්ටි ගල් කැඩීම හා ඉරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
85.	මැණික් වෙළෙඳුන් මැණික් ඔප දමා කැපීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
86.	සීනි බෝල හා ද්‍රව ග්ලූකෝස් නිපදවීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
87.	යන්ත්‍ර නොමැතිව සපත්තු හෝ පාවහන් නිපදවීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
88.	අත් යන්ත්‍ර මාර්ගයෙන් පෙට්ටි නිපදවීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

අනු. අංකය	කර්මාන්තයේ ස්වභාවය	I වැනි තීරුව	II වැනි තීරුව පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම	
		රු. 750 නොඉක්මවන අවස්ථාවක	රු. 751 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන	රු. 1,501 ඉක්මවන අවස්ථාවක
		රු. ශත	රු. ශත	රු. ශත
89.	හකුරු නිපදවීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
90.	කම්හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
91.	ගිනි පෙට්ටි නිපදවීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
92.	ආයුර්වේද ඖෂධ, තෙල් වර්ග නිෂ්පාදනය සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
93.	සබන් නිෂ්පාදනය කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
94.	බුරුසු නිෂ්පාදනය සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
95.	ප්ලාස්ටික් පටි නිපදවීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
96.	විකල්ප බලශක්ති උත්පාදනය සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
97.	විෂබීජ නාශක හා පවිත්‍රකාරක නිපදවීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
98.	මැටි භාණ්ඩ ගබඩා කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
99.	පොල් ලෙලි පෙඟවීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
100.	කොන්ක්‍රීට් උළු, බට හෝ වෙනත් කොන්ක්‍රීට් භාණ්ඩ නිපදවීම සඳහා හා ගබඩා කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
101.	වේවැල් භාණ්ඩ නිෂ්පාදනය හා ගබඩා කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
1989 අංක 12 දරන පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය සමග කියවිය යුතු 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තිය යටතේ බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව අංක 1888/47 හා 2014 නොවැම්බර් මස 14 දාතමින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශයට පත්කළ 1989 අංක 12 දරන පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය සමග කියවිය යුතු 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වන වගන්තියේ විධිවිධාන අනුව 2015 සැප්තැම්බර් මස 22 වැනි දින බස්නාහිර පළාතේ පළාත් සභාව විසින් අනුමත කළ 2016.08.03 වැනි දිනැති අංක 1978/22 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් නිවැරදි කරන ලද 2015.12.28 දිනැති අංක 1947/6 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන්නට යෙදුන සම්මත අතුරු ව්‍යවස්ථාවේ ප්‍රචාරක දැන්වීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථාව 2020.01.17 වැනි දිනැති අංක 2159 දරන *ගැසට් පත්‍රය* මගින් නිවැරදි කරන ලද 2016.11.25 දිනැති අංක 1995 දරන *ගැසට් පත්‍රය* මගින් පානදුර ප්‍රාදේශීය සභාව විසින් වැළඳගෙන ඇති අතර එම ප්‍රචාරක දැන්වීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ 8 වන වගන්තියෙන් පානදුර ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පානදුර ප්‍රාදේශීය සභා සීමාව තුළ කිනම් ආකාරයකට හෝ පෙනෙන පරිදි දැන්වීමක් ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම වෙනුවෙන් පහත උපලේඛනයේ සඳහන් ගාස්තුවක් 2024 වර්ෂය සඳහා අයකළ යුතු බවටත් එකී අතුරු ව්‍යවස්ථාවේ 5(2) වගන්තිය ප්‍රකාරව ඉල්ලුම් පත්‍රයක් සඳහා රු.200/- ක ගාස්තුවක් අයකළ යුතු බවටත් මම තීරණය කරමි.

උපලේඛනය

අනු අංකය	*ප්‍රවරුවේ ස්වභාවය*	*වර්ග මීටර් ප්‍රමාණය*	*ගාස්තුව රුපියල්*		
			මාස 03 ට අඩු	*මාස 03 හෝ 06 අතර*	*වසරක්*
01	කිසියම් බිත්තියක් හෝ තාප්පයක ප්‍රචාරනය කරනු ලබන ප්‍රචාරක දැන්වීම්	1 ට අඩු	250/-	350/-	500/-
		1 ට වැඩි	1 ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 200/- බැගින්		
02	රෙදි, ඩිජිටල් බැනර් සඳහා	3 ට අඩ	250/-	350/-	500/-
		3 ට වැඩි	3 ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 200/- බැගින්		
03	තහඩු හෝ දැව මගින් ප්‍රදර්ශනය කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා	1 ට අඩු	500/-	750/-	1,000/-
		1 ට වැඩි	1 ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 300/- බැගින්		
04	විදුලිය යොදා ක්‍රියාත්මක කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා	1 ට අඩු	500/-	750/-	1,000/-
		1 ට වැඩි	1 ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 300/- බැගින්		
05	ඉටි රෙදි හෝ කාඩ්බෝඩ් මගින් කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා	1 ට අඩු	250/-	350/-	500/-
		1 ට වැඩි	1 ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 200/- බැගින්		
06	ප්ලාස්ටික් හෝ ෆයිබර් පුවරු මගින් කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා	1 ට අඩ	250/-	350/-	500/-
		1 ට වැඩි	1 ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 200/- බැගින්		
07	විද්‍යුත් උපකරණ යොදා කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා	1 ට අඩ	750/-	850/-	1,000/-
		1 ට වැඩි	1 ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 500/- බැගින්		

එල්. එච්. නුවන් සංජය ප්‍රනාන්දු,
ලේකම් හා බලතල, කාර්යය, කර්තව්‍ය
ක්‍රියාත්මක කිරීමේ නිළධාරි,
පානදුර ප්‍රාදේශීය සභාව,
වාද්දුව.

2023 ඔක්තෝබර් මස 26 වැනි දින,
පානදුර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

11-511/5

පානදුර ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා ත්‍රීරෝද රථ නවතා තැබීමේ බලපත්‍ර ගාස්තු පැනවීම

පානදුර ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍ය ඉටු කරන, පානදුර ප්‍රාදේශීය සභාවේ ලේකම් එල්. එච්. නුවන් සංජය ප්‍රනාන්දු වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පානදුර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2024 වර්ෂයට අදාළව ත්‍රීරෝද රථ නවතා තැබීමේ අවසර පත්‍රය ගාස්තු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට මම තීරණය කරමි. එනම්,

1989 අංක 12 දරන පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය සමග කියවිය යුතු 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තිය යටතේ බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව අංක 1888/47 හා 2014 නොවැම්බර් මස 14 දාතමින් *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශයට පත් කළ 1989 අංක 12 දරන පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය සමග කියවිය යුතු 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වන වගන්තියේ විධිවිධාන අනුව 2015 සැප්තැම්බර් මස 22 වැනි දින බස්නාහිර පළාතේ පළාත් සභාව විසින් අනුමත කළ 2016.08.03 වැනි දිනැති අංක 1978/22 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් නිවැරදි කරන ලද 2015.12.28 දිනැති අංක 1947/6 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන්නට යෙදුන සම්මත අතුරු ව්‍යවස්ථාවේ ත්‍රිරෝද රථ නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව 2020.01.17 වැනි දින අංක 2159 දරන *ගැසට් පත්‍රය* මගින් නිවැරදි කරන ලද 2016.11.25 දිනැති අංක 1995 දරන *ගැසට් පත්‍රය* මගින් පානදුර ප්‍රාදේශීය සභාව විසින් වැළඳගෙන ඇති අතර එම ත්‍රිරෝද රථ නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ 9 වන වගන්තිය සමඟ කියවිය යුතු එම අතුරු ව්‍යවස්ථාවේ 4 වන වගන්තියෙන් පානදුර ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව වාහන නැවතුම්පල ස්ථානවල ත්‍රිරෝද රථ නවතා තැබීම වෙනුවෙන් නිකුත් කරනු ලබන අවසර පත්‍රය සඳහා වාර්ෂිකව රු.1,200/- ක ගාස්තුවක් අයකළ යුතු බවට මම තීරණය කරමි.

එල්. එච්. නුවන් සංජය ප්‍රනාන්දු,
ලේකම් හා බලතල, කාර්යය, කර්තව්‍ය
ක්‍රියාත්මක කිරීමේ නිළධාරි,
පානදුර ප්‍රාදේශීය සභාව,
වාද්දුව.

2023 ඔක්තෝබර් මස 26 වැනි දින,
පානදුර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

11-511/6

පානදුර ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා සංවර්ධනය නොකළ ඉඩම් මත බදු පැනවීම

පානදුර ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යයකර්තව්‍ය ඉටු කරන, පානදුර ප්‍රාදේශීය සභාවේ ලේකම් එල්. එච්. නුවන් සංජය ප්‍රනාන්දු වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පානදුර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2024 වර්ෂයට අදාළව සංවර්ධනය නොකළ ඉඩම් මත බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට මම තීරණය කරමි. එනම්,

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 153 වන වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව පානදුර ප්‍රාදේශීය සභා සීමා තුළ ඇති සංවර්ධනය නොකළ ඉඩම් සඳහා එම ඉඩමේ ප්‍රාග්ධන බිම් අගයෙන් සියයට එකක් (1%) වන බද්දක් 2024 වර්ෂය සඳහා පනවා අයකළ යුතු බවටත්, එම බද්දේ කාර්යය සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 153(1) (ඇ) අනුවගන්තිය යටතේ වන "සමානුපාතය" වශයෙන් එම ඉඩමේ ගොඩනැගිලි වලින් ආවරණය වූ බිම් ප්‍රමාණය සහ සම්පූර්ණ බිම් ප්‍රමාණය අතර අනුපාතය 1/4 ක් විය යුතු බවට මම තීරණය කරමි.

එල්. එච්. නුවන් සංජය ප්‍රනාන්දු,
ලේකම් හා බලතල, කාර්යය, කර්තව්‍ය
ක්‍රියාත්මක කිරීමේ නිළධාරි,
පානදුර ප්‍රාදේශීය සභාව,
වාද්දුව.

2023 ඔක්තෝබර් මස 26 වැනි දින,
පානදුර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

11-511/7

පානදුර ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා සැරසිලි විධිමත් කිරීමේ ගාස්තු අය කිරීම

පානදුර ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍ය ඉටු කරන, පානදුර ප්‍රාදේශීය සභාවේ ලේකම් එල්. එච්. නුවන් සංජය ප්‍රනාන්දු වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පානදුර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2024 වර්ෂයට අදාළව සැරසිලි විධිමත් කිරීමේ ගාස්තු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට මම තීරණය කරමි. එනම්,

1989 අංක 12 දරන පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තිය යටතේ බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව අංක 1888/47 හා 2014 නොවැම්බර් මස 14 දාතමින් *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශයට පත් කළ 1989 අංක 12 දරන පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය සමග කියවිය යුතු 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වන වගන්තියේ විධිවිධාන අනුව 2015 සැප්තැම්බර් මස 22 වැනි දින බස්නාහිර පළාතේ පළාත් සභාව විසින් අනුමත කළ 2016.08.03 වැනි දිනැති අංක 1978/22 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් නිවැරදි කරන ලද 2015.12.28 දිනැති අංක 1947/6 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන්නට යෙදුන සම්මත අතුරු ව්‍යවස්ථාවේ සැරසිලි විධිමත් කිරීම සඳහා වන අතුරු ව්‍යවස්ථාව 2020.01.17 වැනි දිනැති අංක 2159 දරන *ගැසට් පත්‍රය* මගින් නිවැරදි කරන ලද 2016.11.25 දිනැති අංක 1995 දරන *ගැසට් පත්‍රය* මගින් පානදුර ප්‍රාදේශීය සභාව විසින් වැළඳගෙන ඇති අතර එම සැරසිලි විධිමත් කිරීම සඳහා වන අතුරු ව්‍යවස්ථාවේ 8 වැනි වගන්තියෙන් පානදුර ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පානදුර ප්‍රාදේශීය සභා සීමාව තුළ සැරසිලි විධිමත් කිරීම වෙනුවෙන් රු. 200/- ක ගාස්තුවක් 2024 වර්ෂය සඳහා අයකළ යුතු බවට මම තීරණය කරමි.

එල්. එච්. නුවන් සංජය ප්‍රනාන්දු,
ලේකම් හා බලතල, කාර්යය, කර්තව්‍ය
ක්‍රියාත්මක කිරීමේ නිලධාරී,
පානදුර ප්‍රාදේශීය සභාව,
වාද්දුව.

2023 ඔක්තෝබර් මස 26 වැනි දින,
පානදුර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

11-511/8

පානදුර ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා ආදාහනාගාර පිළිබඳ ගාස්තු අය කිරීම

පානදුර ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍ය ඉටු කරන, පානදුර ප්‍රාදේශීය සභාවේ ලේකම් එල්. එච්. නුවන් සංජය ප්‍රනාන්දු වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පානදුර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2024 වර්ෂයට අදාළව ආදාහනාගාර පිළිබඳ ගාස්තු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට මම තීරණය කරමි. එනම්,

1989 අංක 12 දරන පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය සමග කියවිය යුතු 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තිය යටතේ බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව අංක 1888/47 හා 2014 නොවැම්බර් මස 14 දාතමින් *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශයට පත් කළ 1989 අංක 12 දරන පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය සමග කියවිය යුතු 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වන වගන්තියේ විධිවිධාන අනුව 2015 සැප්තැම්බර් මස 22 වැනි දින බස්නාහිර පළාතේ පළාත් සභාව විසින් අනුමත කළ 2016.08.03 වැනි දිනැති අංක 1978/22 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් නිවැරදි කරන ලද 2015.12.28 දිනැති අංක 1947/6 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන්නට යෙදුන සම්මත අතුරු ව්‍යවස්ථාවේ ආදාහනාගාර පිළිබඳ අතුරු ව්‍යවස්ථාව 2020.01.17 වැනි දිනැති අංක 2159 දරන *ගැසට් පත්‍රය* මගින් නිවැරදි කරන ලද 2016.11.25 දිනැති අංක 1995 දරන *ගැසට් පත්‍රය* මගින් පානදුර ප්‍රාදේශීය සභාව විසින් වැළඳගෙන ඇති අතර එම ආදාහනාගාර පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ 16 වැනි වගන්තියෙන් පානදුර ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පානදුර ප්‍රාදේශීය සභාව විසින් මෘත ශරීර ආදාහනය කිරීම සඳහා පහත උපලේඛනයේ දක්වා ඇති පරිදි ගාස්තුවක් 2024 වර්ෂය සඳහා අයකළ යුතු බවට මම තීරණය කරමි.

ඉහත කී උපලේඛනය

ප්‍රදේශය	*අය කරනු ලබන ගාස්තුව*
සභා බලප්‍රදේශය තුළ	*රු. 12,500/-*
සභා බලප්‍රදේශයෙන් පිටත	*රු. 13,500/-*

එල්. එච්. නුවන් සංජය ප්‍රනාන්දු,
ලේකම් හා බලතල, කාර්යය, කර්තව්‍ය
ක්‍රියාත්මක කිරීමේ නිළධාරි,
පානදුර ප්‍රාදේශීය සභාව,
වාද්දුව.

2023 ඔක්තෝබර් මස 26 වැනි දින,
පානදුර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

11-511/9

පානදුර ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා ක්‍රීඩා භූමි පරිහරණය පිළිබඳ ගාස්තු අය කිරීම

පානදුර ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍ය ඉටුකරන, පානදුර ප්‍රාදේශීය සභාවේ ලේකම් එල්. එච්. නුවන් සංජය ප්‍රනාන්දු වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පානදුර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2024 වර්ෂයට අදාළව ආදාහනාගාර පිළිබඳ ගාස්තු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට මම තීරණය කරමි. එනම්,

1989 අංක 12 දරන පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය සමග කියවිය යුතු 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තිය යටතේ බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව අංක 1888/47 හා 2014 නොවැම්බර් මස 14 දාතමින් *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශයට පත් කළ 1989 අංක 12 දරන පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය සමග කියවිය යුතු 1952 අංක 06 දරන පළත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වන වගන්තියේ විධිවිධාන අනුව 2015 සැප්තැම්බර් මස 22 වැනි දින බස්නාහිර පළාතේ පළාත් සභාව විසින් අනුමත කළ 2016.08.03 වැනි දිනැති අංක 1978/22 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් නිවැරදි කරන ලද 2015.12.28 දිනැති අංක 1947/6 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන්නට යෙදුන සම්මත අතුරු ව්‍යවස්ථාවේ ක්‍රීඩා භූමි පිළිබඳ අතුරු ව්‍යවස්ථාව 2020.01.17 වැනි දිනැති අංක 2159 දරන *ගැසට් පත්‍රය* මගින් නිවැරදි කරන ලද 2016.11.25 දිනැති අංක 1995 දරන *ගැසට් පත්‍රය* මගින් පානදුර ප්‍රාදේශීය සභාව විසින් වැළඳගෙන ඇති අතර එම ක්‍රීඩා භූමි පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ 04 වන වගන්තියේ (2) වන උප වගන්තියෙන් පානදුර ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පානදුර ප්‍රාදේශීය සභාව විසින් ක්‍රීඩා භූමි පරිහරණය කිරීම සඳහා පහත උප ලේඛනයේ දක්වා ඇති පරිදි ගාස්තු හා තැන්පත් මුදල් 2024 වර්ෂය සඳහා අය කළ යුතු බවට මම තීරණය කරමි.

උපලේඛනය

කාරණය	*දිනකට අය කරනු ලබන ගාස්තුව*	*තැන්පත් මුදල*
සාමාන්‍ය/පාසල්/විහාරස්ථාන/ ආගමික	රු. 2,500/-	රු. 5,000/- (දිනකට)
තරගාවලි/ව්‍යාපාරික	රු. 7,500/-	රු. 5,000/- (දිනකට)
සැණකෙළි/සංගීත සංදර්ශන සඳහා	රු. 20,000/-	දින 02 ක් දක්වා රු. 50,000/- දින 03 සිට දින 10 ක් දක්වා රු. 100,000/- ඊට වැඩිවන සෑම දිනකටම රු. 5,000/- බැගින්.

■ ක්‍රීඩා භූමිය තුළ සිදු කරනු ලබන තාවකාලික ඉදිකිරීම් කටයුතු හා ඉවත් කිරීම් සඳහා යොදා ගන්නා දිනයන් සඳහාද මෙම ගාස්තු අය කරනු ලබන අතර දින ගණන යන්නටද එම දිනයන් ඇතුළත්වේ. ■ ජල විදුලි සඳහා මනු කියවීම අනුව ගාස්තු තැන්පත් මුදලින් අය කරනු ලැබේ.
පූජ්‍ය පක්ෂයේ ආදාහන උත්සව සඳහා ගාස්තු අය නොකෙරේ.

එල්. එච්. නුවන් සංජය ප්‍රනාන්දු
ලේකම් හා බලතල, කාර්යය, කර්තව්‍ය
ක්‍රියාත්මක කිරීමේ නිළධාරි,
පානදුර ප්‍රාදේශීය සභාව,
වාද්දූව.

2023 ඔක්තෝබර් මස 26 වැනි දින,
පානදුර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

11-511/10

පානදුර ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා සේවා සහ ගාස්තු අය කිරීම

පානදුර ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍ය ඉටු කරන, පානදුර ප්‍රාදේශීය සභාවේ ලේකම් එල්. එච්. නුවන් සංජය ප්‍රනාන්දු වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පානදුර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2024 වර්ෂයට අදාලව සේවා සහ ගාස්තු අය කිරීම පිළිබඳ ගාස්තු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට මම තීරණය කරමි. එනම්,

තීරණය

1989 අංක 12 දරන පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය සමග කියවිය යුතු 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තිය යටතේ බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව අංක 1888/47 හා 2014 නොවැම්බර් මස 14 දාතමින් *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශයට පත් කළ 1989 අංක 12 දරන පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය සමග කියවිය යුතු 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වන වගන්තියේ විධිවිධාන අනුව 2015 සැප්තැම්බර් මස 22 වැනි දින බස්නාහිර පළාතේ පළාත් සභාව විසින් අනුමත කළ 2016.08.03 වැනි දිනැති අංක 1978/22 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් නිවැරදි කරන ලද 2015.12.28 දිනැති අංක 1947/6 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන්නට යෙදුන සම්මත අතුරු ව්‍යවස්ථාවේ සේවා ගාස්තු අයකිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව 2020.01.17 වැනි දිනැති අංක 2159 දරන *ගැසට් පත්‍රය* මගින් නිවැරදි කරන ලද 2016.11.25 දිනැති අංක 1995 දරන *ගැසට් පත්‍රය* මගින් පානදුර ප්‍රාදේශීය සභාව විසින් වැළඳගෙන ඇති අතර එම සේවා සඳහා ගාස්තු අයකිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ 4 වැනි වගන්තියෙන් පානදුර ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පහත උපලේඛනයේ දක්වා ඇති පරිදි ගාස්තුවක් 2024 වර්ෂය සඳහා අයකළ යුතු බවට මම තීරණය කරමි.

උපලේඛනය

සේවා සඳහා ගාස්තු අයකිරීම

	සේවාව	*ගාස්තුව*
i.	පෙර පාසල් සඳහා ඇතුල්වීමේ ඉල්ලුම් පත්‍රය	ඉල්ලුම් පත්‍රය - රු. 200
ii.	පුස්තකාල සාමාජිකත්වය සඳහා ඉල්ලුම් පත්‍රය	ඉල්ලුම් පත්‍රය - රු. 200
iii.	වරිපනම් ලේඛනයේ උදෘත	මුල් වර්ෂය සඳහා - රු. 500 වැඩිවන සෑම වර්ෂයකටම - රු. 100
iv.	වීථි රේඛා සහතිකයක් ලබා ගැනීමේ ඉල්ලුම්පත්‍රය/ නොපවරා ගැනීමේ සහතික ලබා ගැනීමේ ඉල්ලුම් පත්‍රය හා හිමිකම් සහතික ඉල්ලුම් පත්‍රය.	රු. 500
v.	වීථි රේඛා සහතිකයක් නිකුත් කිරීමට අදාල ගාස්තු	රු. 1,000 0
vi.	නොපවරා ගැනීමේ සහතිකයක් හා හිමිකම් සහතිකයක් නිකුත් කිරීමට අදාල ගාස්තු	
vii.	වාර්ෂික තක්සේරු නිවේදනයට අමතරව තක්සේරු නිවේදනයක් නිකුත් කිරීමට අදාළ ගාස්තු	රු. 300

එල්. එච්. නුවන් සංජය ප්‍රනාන්දු,
ලේකම් හා බලතල, කාර්යය, කර්තව්‍ය
ක්‍රියාත්මක කිරීමේ නිළධාරි,
පානදුර ප්‍රාදේශීය සභාව,
වාද්දුව.

2023 ඔක්තෝබර් මස 26 වැනි දින,
පානදුර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

11-511/11

පානදුර ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා වෙනත් ගාස්තු අය කිරීම

පානදුර ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍ය ඉටු කරන, පානදුර ප්‍රාදේශීය සභාවේ ලේකම් එල්. එච්. නුවන් සංජය ප්‍රනාන්දු වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පානදුර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2024 වර්ෂයට අදාලව වෙනත් ගාස්තු අය කිරීම පිළිබඳ ගාස්තු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට මම තීරණය කරමි. එනම්,

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන අනුව පානදුර ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පානදුර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ වෙනත් ගාස්තු අයකිරීම පහත උපලේඛනයේ දක්වා ඇති පරිදි 2024 වර්ෂය සඳහා අය කළ යුතු බවට මම තීරණය කරමි.

උපලේඛනය

	සේවාව	*ගාස්තුව*
i.	සුසාන භූමි සම්බන්ධයෙන් අයකරනු ලබන ගාස්තු	සෑය බැඳ ආදාහනය කිරීම රු.1,000 අළු කුටි සඳහා රු. 12,500 දෙවන වර අළු කුටිය ලබාදීම රු. 3,000 භූමිදානය සඳහා රු. 2,000 ස්ථාවර වළක නැවත තැන්පත් කිරීම රු. 4,000
ii.	පෙර පාසල් සඳහා ඇතුල් වීමේ ගාස්තු	පළමු වසර සඳහා ඇතුළත් වීමේ ගාස්තුව රු. 350 දෙවන වසර සඳහා ඇතුළත් වීමේ ගාස්තු රු. 300
iii.	පුස්තකාල සාමාජිකත්ව ගාස්තු	සාමාජිකත්වය සඳහා ගාස්තු රු. 50 සාමාජිකත්වය සඳහා තැන්පතු රු. 100 සාමාජිකත්වය අලුත් කිරීමට රු. 40
iv.	සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම	රු. 2,500
v.	කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම	රු. 3,000
vi.	උපදේශන සේවා ලියාපදිංචි කිරීම	රු. 2,500
vii.	සේවා සැපයීම සඳහා ගාස්තු අය කිරීම	
බැකෝ යන්ත්‍රය කුළියට දීම		මීටර් පැයකට (1) රු. 5,000
මාර්ග තලනය කුළියට දීම. (පැය 8 ක කාලයක් සඳහා)		දිනකට රු. 12,000
ගලි බවුසරය කුළියට දීම		සභා සීමාව තුළ රු. 8,000 සීමාවෙන් පිටත රු. 9,000 (වැඩි වන කි. මී. 1කට රු. 200 බැගින්)
ජල බවුසරය (පානීය ජලය සඳහා පමණි)		ලීටර් 1000 ට රු. 3,500 + ජලාප්‍රවාහන මණ්ඩලයට ගෙවන මුදල් (කිලෝ මීටරයට රු. 150 බැගින්)
කැළි කසල බැහැර කිරීම සඳහා		වෙන් කරන ලද කසළ ට්‍රැක්ටර් ලෝඩ් 1ට රු. 15,000
අනතුරුදායක ගස් සඳහා අයදුම්පත්‍රය		රු. 500
මිනින්දෝරු සැලසුම් අනුමත කිරීමේ අයදුම්පත්‍රය		රු. 500
සංවර්ධන අයදුම්පත්‍රය (ගොඩනැගිලි අයදුම්පත්‍රය)		රු. 800
අමතර සැලසුම් පිටපත් ගාස්තු		රු. 500
ඔප්පු සාරාංශ භාරගැනීමේ ගාස්තු තක්සේරු දෙපාර්තමේන්තු ගාස්තු		රු. 500 රු. 200
viii. ලිපි නිකුත් කිරීම		රු. 300
ix. නිර්වන්දි ගිවිසුම් ගාස්තු		රු. 500
x. ණැන සලෙහි ගාස්තු		පරිගණක පුහුණු පාඨමාලා ගාස්තු ශිෂ්‍ය - මසකට රු. 500 බැගින් මාස 03ට මුළු ගාස්තුව රු. 1,500 වැඩිහිටි - මසකට රු. 1,000 බැගින් මාස 03ට මුළු ගාස්තුව රු. 3,000
xi.	කාය වර්ධන මධ්‍යස්ථානයේ සේවා ලබා ගැනීමට පැමිණෙන්නන් සඳහා ගාස්තු	

	සේවාව	*ගාස්තුව*	
මාසික සාමාජික මුදල		වැඩිහිටියන් සඳහා - රු. 1,000 0 වයස අවු. 19 ට අඩු පාසල් ළමුන් සඳහා - රු. 500 0	
සාමාජිකත්වය මාස 06 ක් සඳහා එකවර ගෙවීමේ දී		වැඩිහිටියන් සඳහා - රු. 4,000 0 වයස අවු. 19 ට අඩු පාසල් ළමුන් සඳහා - රු. 2,500 0	
xii	ජල නල එළීමේදී මාර්ග පළුදු කිරීමට අදාලව ගාස්තු අය කිරීම		$1m^2$ ක් සඳහා
		කොන්ක්‍රීට් ඇතිරූ මාර්ග	රු. 7,500
		අන්තර් සම්බන්ධ කුට්ටි ගල්	රු. 4,500
		තාර ඇතිරූ මාර්ග	රු. 3,500
		කාපට් ඇතිරූ මාර්ග	රු. 10,000
		බොරළු මාර්ග	රු. 500

xiii. උත්සව ශාලාව කුලියට දීම (පැය 8 ක කාලයක් සඳහා)

අනු අංකය	*සේවාව*	*ශාලා කුලිය* *රු. ශත*	*ජලය* *රු. ශත*	*විදුලිය* *රු. ශත*	*ශබ්ද විකාශන යන්ත්‍රය* *රු. ශත*	*අලෝකකරණය* *රු. ශත*	*එකතුව* *රු. ශත*	*ආපසු ගෙවන තැන්පත්* *රු. ශත*
i	ප්‍රවේශපත්‍ර අලෙවි නොකරන නාට්‍ය සංදර්ශන, උත්සව හා ප්‍රසංග සඳහා ශාලා කුලිය	7,500	2,000	3,000	3,000	2,500	18,000	7,500
ii	ප්‍රවේශ පත්‍ර අලෙවි කරන කටයුතු සඳහා	15,000	2,000	3,000	3,000	2,500	25,500	7,500
iii.	රාජ්‍ය ආයතන සඳහා	5,000	2,000	3,000	3,000	2,500	15,500	3,000
iv	ප්‍රවේශපත්‍ර අලෙවි නොකරන සාකච්ඡා/සම්මන්ත්‍රණ හා පාසල් ළමුන්ගේ සංදර්ශන සඳහා ශාලා කුලිය	3,000	2,000	3,000	3,000	2,500	13,500	1,500
v	ප්‍රවේශ පත්‍ර අලෙවි කරන සාකච්ඡා/සම්මන්ත්‍රණ හා පාසල් ළමුන්ගේ සංදර්ශන සඳහා ශාලා කුලිය	5,000	2,000	3,000	3,000	2,500	15,500	1,500

කථන පුවරුව රු. 300
පොල්තෙල් පහන රු. 200
පුටුවක මිල රු. 20
සවස 5 න් පසුව අමතර සෑම කටයුත්තක් සඳහාම පැයකට අය කරන මුදල රු. 1,000
ඉදිරියේ දී රජය විසින් ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණ මත ඉහත සියළු ගාස්තු සම්බන්ධයෙන් බදු මුදල් එකතු විය හැක.

එල්. එච්. නුවන් සංජය ප්‍රනාන්දු,
ලේකම් හා බලතල, කාර්යය, කර්තව්‍ය
ක්‍රියාත්මක කිරීමේ නිළධාරි,
පානදුර ප්‍රාදේශීය සභාව,
වාද්දුව.

2023 ඔක්තෝබර් මස 26 වැනි දින,
පානදුර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

11-511/12

නාරම්මල ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීම

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් නාරම්මල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර 2023.09.22 වැනි දින මාගේ තීරණ අංක 790 යටතේ පහත තීරණය ගෙන ඇති බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩී. ඩී. වික්‍රමසිංහ,
ලේකම්,
නාරම්මල ප්‍රාදේශීය සභාව.

2023 සැප්තැම්බර් මස 22 වැනි දින,
නාරම්මල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වන වගන්තියේ (I) වන උප වගන්තියෙන් නාරම්මල ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1659 හා 2010.06.18 දිනැති *ගැසට් පත්‍රය* යටතේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ දියුණු කළ ප්‍රදේශය යැයි ප්‍රකාශයට පත් කර ඇත්තා වූ ගොඩනැගිලිවල, ඉඩම්වල, ගෙපත්වල 2023 වර්ෂයේදී බල පැවැත්වූ වාර්ෂික වටිනාකම 2024 වර්ෂයේ වාර්ෂික වටිනාකම ලෙස පිළිගැනීමටත්,

එකී තක්සේරුව මත 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (1) වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර එකී දේපළ මත ඉහත කී වාර්ෂික වටිනාකමින් සියයට හතරක (4%) වරිපනම් බද්දක් පනවා අය කළ යුතු බවටත්,

තවද, 2024 වර්ෂයෙහි පහත උප ලේඛනයෙහි සඳහන් එක් එක් කාර්තුව වෙනුවෙන් ඉදිරියෙන් නිරූපිත දිනයට පෙර එසේ නියම කරන ලද වාර්ෂික වරිපනම් බද්ද නාරම්මල ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවිය යුතු බවටත් එලෙස වාර්ෂික වරිපනම් බද්ද 2024 වර්ෂයෙහි ජනවාරි මස 31 වැනි දින හෝ ඊට ප්‍රථම ගෙවන්නේ නම්, වාර්ෂික වරිපනම් බද්දේ ප්‍රමාණයෙන් සියයට දහය (10%) ක වට්ටමක් ද, එකී උපලේඛනයෙහි එක් එක් කාර්තුව ඉදිරියේ තුන්වන තීරුවේ නිරූපිත දිනයට පෙර අදාළ වරිපනම් බදු මුදල නාරම්මල ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවනු ලබන්නේ නම් එක කාර්තුවකට අදාළ මුදලින් 5% ක වට්ටමක්ද නාරම්මල ප්‍රාදේශීය සභාව ලබා දිය යුතු බවටත් මම තීරණය කරමි.

උප ලේඛනය

කාර්තුව	*ගෙවිය යුතු දිනය*	*5% ක වට්ටම සඳහා හිමිකම් ලබන අවසාන දිනය*
පළමුවන කාර්තුව	2024.03.31	2024.01.31
දෙවන කාර්තුව	2024.06.30	2024.04.30
තුන්වන කාර්තුව	2024.09.30	2024.07.31
හතරවන කාර්තුව	2024.12.31	2024.10.31

11-200/1

නාරම්මල ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා අක්කර බදු පැනවීම

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (3) වැනි උප වගන්තියෙන් නාරම්මල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර 2023 වර්ෂයේ සැප්තැම්බර් 22 වැනි දින මාගේ තීරණ අංක 791 යටතේ පහත තීරණය ගෙන ඇති බව මහ ජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩී. ඩී. වික්‍රමසිංහ,
ලේකම්,
නාරම්මල ප්‍රාදේශීය සභාව.

2023 සැප්තැම්බර් මස 22 වැනි දින,
නාරම්මල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (3) වැනි උප වගන්තියෙන් නාරම්මල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර නාරම්මල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටියා වූ ද 135 වගන්තියේ නියමයන් යටතේ අක්කර බද්දෙන් නිදහස් කර නොමැත්තා වුද වරිපනම් බදු අය නොකරනු ලබන ප්‍රදේශවල ස්ථීර හෝ නිතිපතා ගොවිතැන් යටත් වූ ඉඩම් වලින් පහත උප ලේඛනයේ සඳහන් ප්‍රමාණයන්ගෙන් යුතු අක්කර බද්දක් පනවා අය කිරීමට මම තීරණය කරමි.

උප ලේඛනය

1.	ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් 05 කට අඩු නමුත් හෙක්ටයාර් එකකට නොඅඩු වන අවස්ථාවක	රු. 50.00
2.	ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් 05 ක් හෝ ඊට වැඩි වන අවස්ථාවක හෙක්ටයාරයක් සඳහා	රු.10.00

තවද 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 146 (1) උප වගන්තියෙන් ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2023 වර්ෂයේ බලාත්මක කරන ලද තක්සේරුව 2024 වර්ෂය සඳහා අදාළ කර ගැනීමටත්,

2024 වර්ෂයෙහි පහත උප ලේඛනයෙහි සඳහන් එක් එක් කාර්තුව වෙනුවෙන් ඉදිරියෙන් නිරූපිත දිනයට පෙර එසේ නියම කරන ලද වාර්ෂික අක්කර බද්ද නාරම්මල ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවිය යුතු බවටත් ,එලෙස වාර්ෂික අක්කර බද්ද 2024 වර්ෂයෙහි ජනවාරි මස 31 වැනි දින හෝ ඊට ප්‍රථම ගෙවන්නේ නම් , වාර්ෂික අක්කර බද්දේ ප්‍රමාණයෙන් සියයට දහයක (10%) ක වට්ටමක්ද එකී උප ලේඛනයෙහි එක් එක් කාර්තුවට ඉදිරියේ තුන්වන තීරුවේ නිරූපිත දිනයට පෙර අදාළ අක්කර බදු මුදල නාරම්මල ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවනු ලබන්නේ නම් එක කාර්තුවක අදාළ මුදලින් 5% ක වට්ටමක් ද නාරම්මල ප්‍රාදේශීය සභාව ලබා දිය යුතු බවටත් මම තීරණය කරමි.

උප ලේඛනය

කාර්තුව	*ගෙවිය යුතු දිනය*	*5% වට්ටම සඳහා නිමිකම් ලබන අවසාන දිනය*
පළමු වන කාර්තුව	2024.03.31	2024.01.31
දෙවන කාර්තුව	2024.06.30	2024.04.30
තුන්වන කාර්තුව	2024.09.30	2024.07.31
හතරවන කාර්තුව	2024.12.31	2024.10.31

නාරම්මල ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා කර්මාන්ත බදු පැනවීම

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තිය යටතේ නාරම්මල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව 2023 වර්ෂයේ සැප්තැම්බර් 22 වැනි දින මාගේ තීරණ අංක 792 යටතේ පහත තීරණය ගෙන ඇති බව මහ ජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩී. ඩී. වික්‍රමසිංහ,
ලේකම්,
නාරම්මල ප්‍රාදේශීය සභාව.

2023 සැප්තැම්බර් මස 22 වැනි දින,
නාරම්මල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වන වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර නාරම්මල ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත කර ගෙන යනු ලබන පහත උප ලේඛනයෙහි I වන තීරුවේ නිරූපිත එක් එක් කර්මාන්තය වෙනුවෙන් එම උප ලේඛනයෙහි II තීරුවේ ඒ එක් එක් කර්මාන්තය පවත්වාගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකමට අනුරූප සටහනේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2024 වර්ෂය සඳහා පනවා අය කළ යුතු යැයි මම තීරණය කරමි.

උපලේඛනය

අනු අංකය	*I වන තීරය* *කර්මාන්තයේ ස්වභාවය*	*II වන තීරය* *ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. 750 ට වැඩි නොවන විට* *රු. ශත*	*ස්ථානයේ වාර්ෂික වටිනාකම රු 751 ට වැඩි නමුත් රු 1500.00 ට වැඩි නොවන විට* *රු. ශත*	*ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. 1501.00 ට වැඩි වන විට* *රු. ශත*
1	විදුලි බලයෙන් ක්‍රියා කරන මුද්‍රණාලයක්	500 0	750 0	1,000 0
2	අතින් ක්‍රියා කරන මුද්‍රණාලයක්	500 0	750 0	1,000 0
3	ඉදල් කොසු , මුසුන් නිදපවීමේ ස්ථානයක්	500 0	750 0	1,000 0
4	කොන්ක්‍රීට් ගඩොල් , සිලින්ඩර් හෝ වෙනත් කොන්ක්‍රීට් භාණ්ඩ නිපදවීම සහ විකිණීම	500 0	750 0	1,000 0
5	මැටි භාණ්ඩ නිපදවන ස්ථානයක්	500 0	750 0	1,000 0
6	මිරිස් කුළුබඩු වර්ග ඇඹරුම්හලක්	500 0	750 0	1,000 0
7	ඇඳුම් මහන ස්ථානයක්	500 0	750 0	1,000 0
8	කුෂන් වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
9	ඉටි පන්දම්,හදුන්කුරු නිෂ්පාදනය	500 0	750 0	1,000 0
10	බිම්මල් වගා කිරීම	500 0	750 0	1,000 0
11	රෙදි පාපිසි නිෂ්පාදනය	500 0	750 0	1,000 0
12	පපඩම් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
13	පොල් ළෙලි කැපීමේ කර්මාන්තය	500 0	750 0	1,000 0
14	සුරුට්ටු ,බීඩි නිෂ්පාදනය	500 0	750 0	1,000 0
15	ආයුර්වේද ඖෂධ බෝතල් කිරීමේ ස්ථානයක්	500 0	750 0	1,000 0
16	කොප්පරා නිපදවීම	500 0	750 0	1,000 0
17	වී මෝලක් (මිදුල සහිත හෝ රහිත)	500 0	750 0	1,000 0
18	යතුරු කැපීමේ ස්ථානයක්	500 0	750 0	1,000 0

අනු අංකය	I වන තීරය කර්මාන්තයේ ස්වභාවය	ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. 750 ට වැඩි නොවන විට	II වන තීරය ස්ථානයේ වාර්ෂික වටිනාකම රු 751 ට වැඩි නමුත් රු 1500.00 ට වැඩි නොවන විට	ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. 1501.00 ට වැඩි වන විට
		රු. ශත	රු. ශත	රු. ශත
19	පාවහන් නිෂ්පාදන ස්ථානයක්	500 0	750 0	1,000 0
20	යකඩ නිකල් කරන ස්ථානයක්	500 0	750 0	1,000 0
21	ක්‍රීඩා භාණ්ඩ නිෂ්පාදනය	500 0	750 0	1,000 0
22	මල් පෝච්චි නිපදවීම	500 0	750 0	1,000 0
23	බෑග් මැසීම	500 0	750 0	1,000 0

11-200/3

නාරම්මල ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා ව්‍යාපාර බදු පැනවීම

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තිය යටතේ නාරම්මල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව 2023 වර්ෂයේ සැප්තැම්බර් 22 වැනි දින මාගේ තීරණ අංක 793 යටතේ පහත තීරණය ගෙන ඇති බව මහ ජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩී.ඩී.වික්‍රමසිංහ,
ලේකම්,
නාරම්මල ප්‍රාදේශීය සභාව.

2023 සැප්තැම්බර් මස 22 වැනි දින,
නාරම්මල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 152 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ නාරම්මල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විධි විධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ එම පනතේ 150 වන වගන්තිය යටතේ යම් බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නාවූ යම් ව්‍යාපාරයක්/කර්මාන්තයක් නාරම්මල ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුලත 2024 වර්ෂයේදී පවත්වාගෙන යන සෑම තැනැත්තෙකුගෙන්ම එම ව්‍යාපාරයේ 2023 වර්ෂයේ ආදායම මෙහි පහත උපලේඛනයෙහි I වැනි තීරයේ නිරූපිත යම් විෂයාංකයක සීමාවන් ඇතුලත පවතින අවස්ථාවක එකී II වැනි තීරයේ අනුරූප සටහනේ නිරූපිත අනුප්‍රමාණයක ව්‍යාපාර බද්දක් 2024 වර්ෂයේ අප්‍රේල් මස 30 වෙනි දිනට පෙර ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් මම තීරණය කරමි.

	I වන කොටස ව්‍යාපාරයේ ආදායම - පසුගිය වසරේ ආදායම	II වන කොටස ගෙවිය යුතු බද්ද(රු.)
1.	රු.6000/- නොඉක්මවූ අවස්ථාව	කිසිවක් නැත
2.	රු 6,001 ඉක්මවන එහෙත් රු12,000 නොඉක්මවන අවස්ථාවක	90 0
3.	රු 12,001 ඉක්මවන එහෙත් රු18,750 නොඉක්මවන අවස්ථාවක	180 0
4.	රු 18,751 ඉක්මවන එහෙත් රු75,000 නොඉක්මවන අවස්ථාවක	360 0
5.	රු 75,001 ඉක්මවන එහෙත් රු1,50,000 නොඉක්මවන අවස්ථාවක	1,200 0
6.	රු 1,50,001 ඉක්මවන අවස්ථාවක	3,000 0

11-200/4

නාරම්මල ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා බලපත්‍ර ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වැනි වගන්තිය යටතේ නාරම්මල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව 2023 වර්ෂයේ සැප්තැම්බර් 22 වැනි දින මාගේ තීරණ අංක 794 යටතේ පහත තීරණය ගෙන ඇති බව මහ ජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

තවද , එකී ස්ථානය හෝ පරිශ්‍රය 1968 අංක 14 දරන සංචාරක මණ්ඩල පනතේ කාර්යය සඳහා සංචාරක මණ්ඩලයේ අනුමත කර ඇති, පිළිගෙන ඇති හෝටලයක්, ආපන ශාලාවක්, නවාතැන්පලක් වන විට දී, ඊට අදාළ බලපත්‍ර ලබා දීමේ දී එම ස්ථානයේ හෝ පරිශ්‍රයේ 2023 වර්ෂයේ ලැබීම්වලින් සියයට එකක්(1%) බලපත්‍ර ගාස්තුව ලෙස 2024 වර්ෂය සඳහා නියම විය යුතු බවටත් මහ ජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩී.ඩී.වික්‍රමසිංහ,
ලේකම්,
නාරම්මල ප්‍රාදේශීය සභාව.

2023 සැප්තැම්බර් මස 22 වැනි දින,
නාරම්මල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වන වගන්තිය සමග කියවිය යුතු 147 වන වගන්තිය යටතේ නාරම්මල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර එකී පනතේ හෝ එකී පනත යටතේ ප්‍රාදේශීය සභාව විසින් සාදන ලද අතුරු ව්‍යවස්ථාවක හෝ ප්‍රාදේශීය සභාව පිළිගෙන ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවක් යටතේ විස්තර කර ඇති මෙහි පහත උපලේඛනයෙහි I වන තීරුවේ නිරූපිත යම් කාර්යයක් සඳහා නාරම්මල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුලත යම් පරිශ්‍රයක් පාවිච්චි කිරීමට බලය දෙමින් 2024 වර්ෂයේ නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් සම්බන්ධයෙන් එම උපලේඛනයේ II වැනි තීරුවේ අනුරූපිත සටහනේ නිරූපිත බලපත්‍ර ගාස්තුවක් පනවා අයකල යුතුයැයි මම තීරණය කරමි.

උපලේඛනය

අප්‍රසන්න ව්‍යාපාර

අනු අංකය	*I වැනි තීරුව* *ව්‍යාපාරයේ ස්වභාවය*	*II වැනි තීරුව* *ස්ථානයේ වාර්ෂික වටිනාකම*		
		රු. 750 නොඉක්මවන අවස්ථාවක	*රු. 751 ට වැඩි එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,501 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
01.	පොහොර හෝ රසායනික පොහොර නිපදවීම හෝ විකිණීමට ළඟ තබා ගැනීම	500 0	750 0	1,000 0
02.	සම් පදම් කිරීම	500 0	750 0	1,000 0
03.	සම් විකිණීමට තබා ගැනීම	500 0	750 0	1,000 0
04.	සත්ව පාලනය	500 0	750 0	1,000 0
05.	රබර් නිෂ්පාදනය කිරීම හෝ රබර් රොටී නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
06.	පශු වෛද්‍ය ගිලන්හලක් පැවැත්වීම	500 0	750 0	1,000 0
07.	තොග වශයෙන් විකිණීම සඳහා නරක් වන සුළු කෑම වර්ග හෝ ආහාර ද්‍රව්‍ය තබා ගැනීම	500 0	750 0	1,000 0

අනු අංකය	I වැනි තීරුව ව්‍යාපාරයේ ස්වභාවය	II වැනි තීරුව ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. 750 නොඉක්මවන අවස්ථාවක රු. ශත	රු. 751 ට වැඩි එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක රු. ශත	රු. 1,501 ඉක්මවන අවස්ථාවක රු. ශත
08.	කරවල , ලුණු මාළු හෝ ජාඩි කිලෝග්‍රෑම් 150 කට වැඩි ප්‍රමාණයක් තබා	500 0	750 0	1,000 0
09.	මාළු හෝ මස් ජාඩි දැමීම හෝ වේලීම හෝ අයිස් දැමීම	500 0	750 0	1,000 0
10.	පොල්කටු අඟුරු හෝ දැව අඟුරු නිපදවීම	500 0	750 0	1,000 0
11.	දුම්කොළ වියළීම	500 0	750 0	1,000 0
12.	සත්ත්ව ආහාර නිපදවීම	500 0	750 0	1,000 0
13.	පුන්නක්කු නිපදවීම	500 0	750 0	1,000 0
14.	සබන් නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
15.	ලෝහ සුන්බුන් ළඟ තබා ගැනීම	500 0	750 0	1,000 0
16.	ගෘහ භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
17.	වේවැල් භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
18.	වඩු කර්මාන්ත ශාලාවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
19.	සිරප් හෝ පළතුරු බීම නිෂ්පාදනය	500 0	750 0	1,000 0
20.	රස කැවිලි නිෂ්පාදනය	500 0	750 0	1,000 0
21.	පොල් ලෙලි පෙඟවීම (පල් කිරීම)	500 0	750 0	1,000 0
22.	බුරුසු වර්ග නිපදවීම	500 0	750 0	1,000 0
23.	දත් බුරුසු නිපදවීම	500 0	750 0	1,000 0
24.	විනාකිරි නිපදවීම	500 0	750 0	1,000 0
25.	දැව ඉරීම	500 0	750 0	1,000 0
26.	පින්තාරු තීන්ත , වාර්නිෂ් හෝ ඩිස්ටෙම්පර් නිපදවීම	500 0	750 0	1,000 0
27.	සෝඩා නිපදවීම	500 0	750 0	1,000 0
28.	කෙදි සායම් කිරීම	500 0	750 0	1,000 0
29.	සම්භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
30.	පළතුරු ,මාළු හෝ වෙනත් ආහාර වර්ග ටින් වල ඇසිරීම	500 0	750 0	1,000 0
31.	කෝපි ධාන්‍ය වර්ග පිටි කිරීම	500 0	750 0	1,000 0
32.	සුවඳවිලවුන් නිපදවීම	500 0	750 0	1,000 0
33.	ගෑස් මැන්ටල් නිපදවීම	500 0	750 0	1,000 0
34.	පොටි නිපදවීම	500 0	750 0	1,000 0
35.	ඉටි පන්දම් නිපදවීම	500 0	750 0	1,000 0
36.	කපුරු නිපදවීම	500 0	750 0	1,000 0
37.	ලියන තීන්ත , අච්චු තීන්ත හෝ ස්ටෙන්සිල් තීන්ත නිපදවීම	500 0	750 0	1,000 0
38.	රෙදි සෝදන නිල් නිපදවීම	500 0	750 0	1,000 0
39.	ලාකඩ නිපදවීම	500 0	750 0	1,000 0
40.	ටයර් ටියුබ් වොල්කනයිසින් කිරීම	500 0	750 0	1,000 0
41.	ටයර් නැවත පිරවීම	500 0	750 0	1,000 0
42.	සිමෙන්ති භාණ්ඩ හෝ ඇස්බැස්ටෝස් සිමෙන්ති භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
43.	ප්ලාස්ටික් භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
44.	ගඩොල් පිළිස්සීම	500 0	750 0	1,000 0
45.	යන්ත්‍රානුසාරයෙන් රෙදි විවීම	500 0	750 0	1,000 0
46.	උළු නිපදවීම	500 0	750 0	1,000 0
47.	පොහොර, හුණු පිටි හෝ වෙනත් ද්‍රව්‍යයන් දමා තිබූ ගෝනි පිරිසිදු කර විකිණීම	500 0	750 0	1,000 0
48.	යන්ත්‍රානුසාරයෙන් සිමෙන්ති බ්ලෝක් ගල් නිපදවීම	500 0	750 0	1,000 0
49.	අලුත් ලෝහ හෝ පරණ ලෝහ තබා ගැනීම	500 0	750 0	1,000 0

අනු අංකය	I වැනි තීරුව ව්‍යාපාරයේ ස්වභාවය	II වැනි තීරුව ස්ථානයේ වාර්ෂික වටිනාකම		
		රු. 750 නොඉක්මවන අවස්ථාවක	රු. 751 ට වැඩි එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක	රු. 1,501 ඉක්මවන අවස්ථාවක
		රු. ශත	රු. ශත	රු. ශත
	අන්තරාදායක ව්‍යාපාර			
01.	කළුගල් කැණීම හෝ කැඩීම	500 0	750 0	1,000 0
2.	පොල් තෙල් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
03.	ගිනි පෙට්ටි නිෂ්පාදනය හෝ ගබඩා කිරීම	500 0	750 0	1,000 0
04.	මෙතිලේටඩ් ස්ප්‍රීතු නිෂ්පාදනය	500 0	750 0	1,000 0
05.	තේ පෙට්ටි නිපදවීම	500 0	750 0	1,000 0
06.	කොහු හෝ වෙනත් කෙදි වර්ග නිපදවීම	500 0	750 0	1,000 0
07.	කොහු හෝ වෙනත් කෙදි වලින් භාණ්ඩ නිෂ්පාදනය	500 0	750 0	1,000 0
08.	පාවිච්චි කළ ඇඳුම් ගබඩා කිරීම	500 0	750 0	1,000 0
09.	ස්වර්ණාභරණ නිෂ්පාදනය හෝ අළුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
10.	යන්ත්‍රානුසාරයෙන් ලී ඉරීම	500 0	750 0	1,000 0
11.	යන්ත්‍රෝපකරණ පාවිච්චි කරන කම්හලක් පැවැත්වීම	500 0	750 0	1,000 0
12.	හිස් ගෝනි හෝ හිස් බෝතල් ගබඩා කිරීම	500 0	750 0	1,000 0
13.	පාපැදි හෝ යතුරුපැදි අලුත්වැඩියාව	500 0	750 0	1,000 0
14.	පාවිච්චි කරන ලද කඩදාසි හෝ පත්තර තබා ගැනීම	500 0	750 0	1,000 0
15.	විසිර පින්තාරු කිරීම	500 0	750 0	1,000 0
16.	ගිනිකෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤා ගබඩා කිරීම	500 0	750 0	1,000 0
17.	ලෝහ සංස්කාර්ය කර්මාන්ත ආයුධ (යන්ත්‍රෝපකරණ , ආයුධ , උපකරණ නිපදවීම)	500 0	750 0	1,000 0
	අප්‍රසන්න හා අන්තරාදායක ව්‍යාපාර			
01.	රසායනික ද්‍රව්‍ය පාවිච්චි කර කුරුඳු , කරදමුංගු , එනසාල් හෝ කෙදි වර්ග සකස් කිරීම	500 0	750 0	1,000 0
02.	ඩ්‍රයික්ලීන් කිරීම හෝ සායම් දැමීම	500 0	750 0	1,000 0
03.	රෙදි මුද්‍රණය කිරීම හෝ සායම් දැමීම හෝ බතික් කිරීම	500 0	750 0	1,000 0
04.	විද්‍යුත් ලෝහ ආලේපනය කිරීම	500 0	750 0	1,000 0
05.	තෙල් හෝ සත්ත්ව මේද නිපදවීම	500 0	750 0	1,000 0
06.	හුණු ගල් හෝ හිරි ගල් පිලිස්සීම	500 0	750 0	1,000 0
07.	ගිණිකෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤා නිපදවීම	500 0	750 0	1,000 0
08.	බැටරි විද්‍යුත් ආරෝපණය කිරීම හෝ අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
09.	ලෝහ වර්ග පෑස්සවීම	500 0	750 0	1,000 0
10.	මෝටර් වාහන අළුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
11.	මෝටර් වාහන සේවා කිරීම	500 0	750 0	1,000 0
12.	යන්ත්‍රානුසාරයෙන් ලෝහ කුඩු කිරීම	500 0	750 0	1,000 0
13.	වාත්තු මඩුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
14.	බෙලෙක් වැඩපළක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
15.	මෝටර් වාහන බොඩි තැනීම	500 0	750 0	1,000 0
16.	කෘමි නාශක , දිලීර නාශක , පැළෑටි නාශක හෝ පළිබෝධ නාශක නිපදවීම හෝ නැවත පිරවීම	500 0 500 0	750 0 750 0	1,000 0 1,000 0
17.	විෂබීජ නාශක නිපදවීම	500 0	750 0	1,000 0
18.	මදුරු දඟර නිපදවීම	500 0	750 0	1,000 0

අනු අංකය	I වැනි තීරුව ව්‍යාපාරයේ ස්වභාවය	II වැනි තීරුව ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. 750 නොඉක්මවන අවස්ථාවක රු. ශත	රු. 751 ට වැඩි එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක රු. ශත	රු. 1,501 ඉක්මවන අවස්ථාවක රු. ශත
	බලපත්‍ර ලබා ගත යුතු වෙනත් ව්‍යාපාර			
01.	ලැගුම් නිවාසයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
02.	හෝටල්	500 0	750 0	1,000 0
03.	බත්කඩ ආපන ශාලා සහ තේ හෝ කෝපි	500 0	750 0	1,000 0
04.	බේකරි නිෂ්පාදන	500 0	750 0	1,000 0
05.	කිරි පට්ටි හා කිරි වෙළඳාම	500 0	750 0	1,000 0
06.	ආහාර විකිණීම	500 0	750 0	1,000 0
07.	මාළු විකිණීම	500 0	750 0	1,000 0
08.	මස් විකිණීම	500 0	750 0	1,000 0
09.	ලොන්ඩරි	500 0	750 0	1,000 0
10.	සංචාරක වෙළඳාම	500 0	750 0	1,000 0
11.	ගව ගාල්	500 0	750 0	1,000 0
12.	ඝාතක මඩු	500 0	750 0	1,000 0

11-200/5

නාරම්මල ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා ප්‍රචාරක දැන්වීම් / දෘෂ්‍ය පරිසරය පිළිබඳ අතුරු ව්‍යවස්ථානුකූල ගාස්තු අය කිරීම

නාරම්මල ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර 2023 වර්ෂයේ සැප්තැම්බර් 22 වැනි දින මාගේ තීරණ අංක 795 යටතේ පහත තීරණය ගෙන ඇති බව මහ ජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩී. ඩී. වික්‍රමසිංහ,
ලේකම්,
නාරම්මල ප්‍රාදේශීය සභාව.

2023 සැප්තැම්බර් මස 22 වැනි දින,
නාරම්මල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය - ප්‍රචාරක දැන්වීම් / දෘෂ්‍ය පරිසරය පිළිබඳ අතුරු ව්‍යවස්ථානුකූල ගාස්තු අය කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 122 (1) වගන්ති ප්‍රකාර ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල අනුව 1988.08.23 වැනි දින අංක 520/7 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළාත් පාලන, නිවාස හා ඉදි කිරීම් ගරු අමාත්‍යතුමා විසින් ප්‍රකාශයට පත් කරන 1952 අංක 06 දරන සම්මත අතුරු ව්‍යවස්ථාව නාරම්මල ප්‍රාදේශීය සභාව විසින් වැළඳගෙන 2011.06.24 වැනි දින අංක 1712 *ගැසට් පත්‍රයේ* IV (ආ) කොටසේ පළකරනු ලැබූ එම අතුරු ව්‍යවස්ථාවේ 39 වන අතුරු ව්‍යවස්ථාව වන ප්‍රචාරක දැන්වීම්/දෘෂ්‍ය පරිසරය පිළිබඳ අතුරු ව්‍යවස්ථා විධිවිධාන අනුව නාරම්මල ප්‍රාදේශීය සභා සීමාව තුළ යම් වීදියකට, පාරකට, ඇලකට, වැවකට හෝ අහසට පෙනෙන පරිදි දැන්වීමක් ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම වෙනුවෙන් පහත උප ලේඛනයේ සඳහන් පරිදි ගාස්තුවක් 2024 වර්ෂය සඳහා පනවා අය කිරීමටත් එම ගාස්තුව ගෙවිය යුතු යම් තැනැත්තෙක් දැන්වීම් ප්‍රදර්ශනය කිරීමට අදහස් කරන දිනට යටත් පිරිසෙයින් දවස් හතකට කලින් ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් මම තීරණය කරමි.

උපලේඛනය

01. මුදල් අයකර ප්‍රදර්ශනය කරන සංදර්ශන හෝ ව්‍යාපාරික ස්වභාවයෙන් තාවකාලික බැනරයක් ප්‍රදර්ශනය කිරීම වෙනුවෙන් මසකට වර්ග අඩියකට රුපියල් 20 බැගින් ගාස්තුවක් අය කිරීම.

02. තාවකාලික චිත්‍රපට දර්ශන හා නාට්‍ය සංදර්ශන ආදිය වෙනුවෙන් පුවරුවක ආධාරයෙන් ප්‍රදර්ශනය කරනු ලබන දැන්වීමක් සඳහා මසකට වර්ග අඩියකට රු.30 බැගින් ගාස්තුවක් අය කිරීම.

03. යම්කිසි තාප්පයක හෝ බිත්තියක ප්‍රදර්ශන දැන්වීමක් සඳහා වසරකට වර්ග අඩියට රු.100 බැගින් වූ වාර්ෂික ගාස්තුවක් අය කිරීම.

04. ඉහත ප්‍රචාරක දැන්වීම්වලට අයත් නොවන සියලු දැන්වීම් පුවරු සඳහා 2021.07.08 වැනි දින නිකුත් කරන ලද අංක 2235/54 දරන නාගරික සංවර්ධන අධිකාරිය මගින් නිකුත් කරන ලද *ගැසට්* පත්‍රයට අනුකූලව අය කිරීම. (නාගරික සංවර්ධන අධිකාරිය මගින් සිදුකරන සංශෝධනයන්ට යටත් වේ.)

11-200/6

නාරම්මල ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා වෙනත් ගාස්තු අය කිරීම

නාරම්මල ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2023 වර්ෂයේ සැප්තැම්බර් මස 22 වැනි දින මාගේ තීරණ අංක 796 යටතේ පහත තීරණය ගෙන ඇති බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩී. සී. වික්‍රමසිංහ,
ලේකම්,
නාරම්මල ප්‍රාදේශීය සභාව.

2023 සැප්තැම්බර් මස 22 වැනි දින,
නාරම්මල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ පැවරී ඇති බලතල ප්‍රකාර නිකුත් කරනු ලබන සහතික, ලබා දෙනු ලබන සේවාවන්, වෙනත් අයකරනු ලබන ගාස්තු 2024 වර්ෂයේ දී මෙහි පහත උපලේඛනයේ සඳහන් පරිදි අය කිරීමට මම තීරණය කරමි.

උපලේඛනය

		රු. ශත
01	වීථි රේඛා සහ නොපවරා ගැනීමේ සහතික, ගොඩනැගිලි සීමා සහතික යන හිමිකම් සහතික සඳහා	700 0
	වීථි රේඛා සහ නොපවරා ගැනීමේ සහතික, ගොඩනැගිලි සීමා සහතික යන හිමිකම් සහතික ඉල්ලුම්පත්‍රයක් සඳහා	100 0
02	දේපළ අයිතිය හැරවීමේ , වරිපනම් ලේඛනයේ නම වෙනස් කිරීම ඉල්ලුම් පත් හා වෙනත් සහතික පත්‍රයක් සඳහා	200 0
03	ගොඩනැගිලි අනුකූලතා සහතික සඳහා ගාස්තු 2021.07.08 දිනැති අංක 2235/54 දරන නාගරික සංවර්ධන අධිකාරියේ *ගැසට්* පත්‍රයට අනුකූලව අය කිරීම	

		රු. ශත
04	ගොඩනැගිලි අයදුම්පත්වල වලංගු කාලය දීර්ඝ කිරීමට වසරක් සඳහා	300 0
05	ගොඩනැගිලි අයදුම්පතක් සඳහා	300 0
06	ගොඩනැගිලි ඉදි කිරීම සඳහා ගාස්තු 2021.07.08 දිනැති අංක 2235/54 දරන නාගරික සංවර්ධන අධිකාරියේ *ගැසට්* පත්‍රයට අනුකූලව අය කිරීම	
07	අනතුරුදායක ගස් කැපීමේ අයදුම්පත්‍රයක් සඳහා	300 0
08	පරිසර බලපත්‍ර අයදුම්පත්‍රයක් හා අළුත් කිරීමේ අයදුම්පත්‍රයක් සඳහා	200 0
09	ඉඩම් කට්ටි කිරීමේ අයදුම්පත්‍රයක් සඳහා	2,000 0
10	අගරු චෙක්පත් දඩ මුදල්	100 0
11	පිඹුරුපතක් අනුමත කිරීමේ අයදුම්පත්‍රයක් සඳහා	100 0
12	පරිසර බලපත්‍ර ගාස්තු	1,250 0
	පරිසර බලපත්‍ර පරීක්ෂණ ගාස්තු -	
	ආයෝජනය රු. 10,000 0 ට අඩු නම්	250 0
	ආයෝජනය රු. 10,001 0 - රු. 100,000 0	500 0
	ආයෝජනය රු. 100,001 0 - රු.500,000 0	1,250 0
	ආයෝජනය රු. 500,001 0 - රු. 10,00,000 0	2,500 0
	ආයෝජනය රු. 10,00,000 ට වැඩි	5,000 0
13.	අස්ථානගත පොත් - වර්තමාන පොතේ මිල+40% ක මුදලක්	
14	වරිපනම් ගෙවන බවට සහතිකයක් ලබාගැනීම	200 0
15.	වරිපනම් ලේඛනයේ උපුටන ලබා ගැනීම, දේපළ තක්සේරු ලේඛනයක් සඳහා	300 0
16.	වෙළඳ බලපත්‍ර ලබා ගත් බවට සහතිකයක් නිකුත් කිරීම වසරකට	200 0
17.	නැති වූ සහතිකවල පිටපතක් සඳහා	300 0
18.	සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම	500 0
19.	බස්නැවතුම්පළ රථගාල් ගාස්තු අයකිරීම (ටිකට්පත්)	100 0
20.	වාහන නැවතුම් ස්ථාන (ත්‍රීරෝද රථ, වෑන් රථ,බස් රථ,ලොරි රථ,ට්‍රැක්ටර් හා අත් ට්‍රැක්ටර්)	
	ලියාපදිංචි කිරීමේ ගාස්තු	200 0
	ත්‍රීරෝද රථ සඳහා ගාස්තු - වර්ෂයකට	750 0
	වෑන් රථ සඳහා ගාස්තු - වර්ෂයකට	2,000 0
	ලොරි රථ සඳහා ගාස්තු - වර්ෂයකට	2,000 0
	බස් රථ සඳහා ගාස්තු - වර්ෂයකට	2,500 0
	රෝද හතර ලොකු ට්‍රැක්ටර් සඳහා ගාස්තු - වර්ෂයකට	2,000 0
	අත් ට්‍රැක්ටර් සඳහා ගාස්තු - වර්ෂයකට	1,500 0

		රු. ශත
21.	ප්‍රචාරක වැඩසටහන් : * එක් වාහනයක් පමණක් යොදාගෙන ආහාර ආදිය සම්බන්ධව ප්‍රචාරක වැඩසටහන්වලට පැය 8 ක් සඳහා (ඊට වැඩිවන සෑම පැයක් සඳහාම රු.100 0) * වාහන පොළවල් ,දුරකථන සමාගම් විසින් පවත්වන ලද ප්‍රචාරක වැඩ සටහන් හා වෙනත් සියලු ප්‍රචාරක වැඩසටහන් හා රැස්වීම් ආදිය සඳහා පැය 8 ක් සඳහා (ඊට වැඩිවන සෑම පැයක් සඳහා රු.100 0)	3,000 0 5,000 0

11-200/7

නාරම්මල ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා ප්‍රජා ශාලා, ක්‍රීඩා පිටි කුළියට දීම වෙනුවෙන් ගාස්තු අය කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ පැවරී ඇති බලතල අනුව නාරම්මල ප්‍රාදේශීය සභාවට අයත් ක්‍රීඩා පිටි හා ප්‍රජා ශාලා කුළියට දීම වෙනුවෙන් 2024 වර්ෂයට ගාස්තු අය කිරීම සඳහා 2023 වර්ෂයේ සැප්තැම්බර් මස 22 වැනි දින මාගේ තීරණ අංක 797 යටතේ පහත තීරණය ගෙන ඇති බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩී. ඩී. වික්‍රමසිංහ,
ලේකම්,
නාරම්මල ප්‍රාදේශීය සභාව.

2023 සැප්තැම්බර් මස 22 වැනි දින,
නාරම්මල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ පැවරී ඇති බලතල අනුව නාරම්මල ප්‍රාදේශීය සභාවට අයත් ක්‍රීඩා පිටි හා ප්‍රජා ශාලා කුළියට දීම වෙනුවෙන් 2024 වර්ෂයට අදාළව ගාස්තු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවටත් නාරම්මල ප්‍රාදේශීය සභාවට අයත් නාරම්මල හා දඹදෙණිය ප්‍රජා ශාලා ප්‍රයෝජනයට ගැනීම වෙනුවෙන් පහත උපලේඛන අංක 01 හි සඳහන් ආකාරයට ගාස්තු අයකිරීමටත් නාරම්මල යූ. බී. විජේකෝන් ක්‍රීඩාංගනය , දඹදෙණිය මහජන ක්‍රීඩාංගනය, දඹදෙණිය ශාන්ත බණ්ඩාර ක්‍රීඩාංගනය සහ ක්‍රීඩාංගන නොවන වෙනත් එළිමහන් ස්ථාන ප්‍රයෝජනයට ගැනීම වෙනුවෙන් උපලේඛන අංක 02 හි සඳහන් ආකාරයට ගාස්තු ගෙවිය යුතු බවටත් මම තීරණය කරමි.

උපලේඛන අංක 01

ප්‍රජා ශාලා කුළියට දීම

විස්තරය	*කුළී මුදල්*	*විදුලිය සහ ජලය සඳහා*	*ඇප තැන්පත්*
	රු. ශත	*රු. ශත*	*රු. ශත*
01 පොත් ප්‍රදර්ශනයක් සඳහා :			
1. පළමු දින	5,000 0	2,000 0	
2. දෙවන දින	3,000 0	2,000 0	5,000 0
දින දෙකකට වැඩිවන සෑම අවස්ථාවකදී ම රු.2,000 බැගින්	2,000 0	2,000 0	
02. ආබාධිතයන්ගේ උත්සවයක් සඳහා	1,000 0	1,000 0	2,000 0
03. වාණිජ වෙළඳ ප්‍රදර්ශනයක් සඳහා දිනකට	5,000 0	3,500 0	5,000 0
04. වාණිජ සල්පිල් සඳහා දිනකට	5,000 0	3,500 0	5,000 0
05. ත්‍යාග ප්‍රදානෝත්සවයක් සඳහා	4,000 0	2,000 0	5,000 0
06. රූපලාවන්‍ය ප්‍රදර්ශනයක් සඳහා	4,000 0	2,500 0	2,000 0
07. විවාහ මංගල උත්සවයක් සඳහා (සභා බල ප්‍රදේශයට අයත්)			
(පවිත්‍ර කිරීමේ ගාස්තු දිනකට රු. 1,500 0)	10,000 0	4,000 0	5,000 0
08. විවාහ මංගල උත්සවයක් සඳහා (සභා බල ප්‍රදේශයෙන් පිටත)			
(පවිත්‍ර කිරීමේ ගාස්තු දිනකට රු. 2,000 0)	11,000 0	4,000 0	5,000 0

විස්තරය	*කුලී මුදල්*	*විදුලිය සහ ජලය සඳහා*	*ඇප තැන්පත්*
	රු. ශත	*රු. ශත*	*රු. ශත*
09. රැස්වීමක් සමග සුහද හමුවක් සඳහා දිනකට	3,000 0	2,500 0	3,000 0
10. අධ්‍යාපනික සම්මන්ත්‍රනයක් සඳහා දිනකට	40,000 0	2,000 0	3,000 0
11. පෙර පාසල් උත්සව සඳහා (පෙර පාසල් උත්සව නිම වීමෙන් පසු දැඩි ලෙස අපවිත්‍ර වී ඇත්නම් තැන්පත් මුදල ආපසු ගෙවනු නොලැබේ)	4,000 0	3,000 0	2,000 0
12. කරාටේ පන්ති සඳහා	2,000 0	2,000 0	3,000 0
13 දානමය කටයුතු සඳහා දිනකට (දැඩි ලෙස අපවිත්‍ර වී ඇත්නම් තැන්පත් මුදල ආපසු ගෙවනු නොලැබේ)	2,000 0	2,000 0	3,000 0
14. නාට්‍ය සංදර්ශන සඳහා (පවිත්‍ර කිරීමේ ගාස්තු දිනකට ර.1,500 0)	8,000 0	4,000 0	10,000 0
15. ස්වයං රැකියා පිළිබඳ දැනුවත් කිරීම සඳහා	2,000 0	2,000 0	2,000 0
16. සංගීත සංදර්ශන සඳහා දිනකට (පවිත්‍ර කිරීමේ ගාස්තු දිනකට රු.2,000 0)	16,000 0	5,000 0	10,000 0

උප ලේඛන අංක 02

මහජන ක්‍රීඩාංගනය කුළියට දීම :

01. සියලුම මහජන රැස්වීම් සඳහා (දිනකට) (පවිත්‍ර කිරීමේ ගාස්තු දිනකට ර.1,500 0)	5,000 0	3,000 0	10,000 0
02. සංගීත සංදර්ශන හෝ එවැනි වෙනත් කාර්යයන් සඳහා දිනකට (පවිත්‍ර කිරීමේ ගාස්තු දිනකට ර.3,000 0)	15,000 0	7,500 0	25,000 0
03. ක්‍රීඩා තරග හෝ ක්‍රීඩා උත්සව සඳහා දිනකට	5,000 0	2,000 0	5,000 0
04. වාණිජ සල්පිල් සඳහා දිනකට (පවිත්‍ර කිරීමේ ගාස්තු රු. 3,000 0)	7,000 0	10,000 0	25,000 0
05. අලෙවි ප්‍රවර්ධන වැඩසටහන්	4,000 0	3,000 0	3,000 0
06. පෙර පාසල් උත්සව සඳහා (පෙර පාසල් උත්සව නිමවීමෙන් පසු දැඩි ලෙස අපවිත්‍ර වී ඇත්නම් තැන්පත් මුදල ආපසු ගෙවනු නොලැබේ)	2,000 0	1,000 0	2,000 0

11-200/8

නාරම්මල ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා වාහන හා සතුන් පිළිබඳ බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 148 වැනි වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර 2023 වර්ෂයේ සැප්තැම්බර් 22 වැනි දින මාගේ තීරණ අංක 798 යටතේ පහත තීරණය ගෙන ඇති බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩී. ඩී. වික්‍රමසිංහ,
ලේකම්,
නාරම්මල ප්‍රාදේශීය සභාව.

2023 සැප්තැම්බර් මස 22 වැනි දින,
නාරම්මල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වන වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 148 වන වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර මෙහි පහත උපලේඛනයෙහි I වන තීරුවේ නිරූපිත වාහන හා සතුන් සම්බන්ධයෙන් එම උප ලේඛනයේ II වන තීරුවේ නිරූපිත ප්‍රමාණයක බද්දක් 2024 වර්ෂය සඳහා පනවා අය කළ යුතු බවට මම තීරණය කරමි.

උපලේඛනය

1 වැනි තීරුව		*11 වැනි තීරුව* *රු ශත*
I	මෝටර් රථයක් මෝටර් කාරයක් මෝටර් ලොරියක් මෝටර් බයිසිකලයක්, කරත්තයක් ,ජීන් රික්ෂෝවක් බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහාම	25 0
II	සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කරයක් හෝ බයිසිකල් කරත්තයක් සඳහා	
	(අ) වෙළඳ කාර්යයන් සඳහා යොදවන්නේ නම්	18.00
	(ආ) වෙළඳ කාර්යයක් නොවන කාර්යය සඳහා යොදවන්නේ නම්	04 0
සෑම කරත්තයක් සඳහාම		20 0
සෑම අත් කරත්තයක් සඳහාම		10 0
සෑම රික්ෂෝවක් සඳහා		07 0
සෑම අශ්වයෙකු,පෝනියෙකු හෝ කොටලුවෙකු සඳහාම		15 0
සෑම ඇතෙකු සඳහාම		50 0

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ IV උපලේඛනයේ පරිදි විශ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝද ඇති ළමා වාහන, වීල්බැරෝ හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළඳ කාර්ය සඳහා යොදවන අත් කරත්ත සහ වෙළඳ කාර්ය සඳහා නොයොදවන අත් කරත්ත මෙකී ගෙවීමෙන් නිදහස් කෙරේ.

11-200/9

නාරම්මල ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා සතිපොළ ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර සති පොළ භූමිය සෙනසුරාදා, ඉරිදා, සඳුදා හැර සතියේ වෙනත් දිනයන් හි කුලියට ලබා දීම සඳහා හා නාරම්මල සතිපොළ භූමිය ඇතුළත වෙළඳ කුටි සඳහා, බුලත් පොළ සඳහා , වාහන සුරැකුම්පොළ සඳහා හා දඹදෙණිය සතිපොළ සඳහා ගාස්තු අය කිරීමට 2023 වර්ෂයේ සැප්තැම්බර් 22 වැනි දින මාගේ තීරණ අංක 799 යටතේ පහත තීරණය ගෙන ඇති බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩී. ඩී. වික්‍රමසිංහ,
ලේකම්,
නාරම්මල ප්‍රාදේශීය සභාව.

2023 සැප්තැම්බර් මස 22 වැනි දින,
නාරම්මල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය සමග කියවිය යුතු නාරම්මල සතිපොළ භූමිය ඇතුළත වෙළඳ කුටි , බුලත් පොළ ගාස්තු , වාහන සුරැකුම්පොළ සඳහා අය කළ යුතු ගාස්තු හා දඹදෙණිය සතිපොළ ගාස්තු පහත උපලේඛන I හි සඳහන් පරිදි විය යුතු බවටත් නාරම්මල සතිපොළ භූමිය සෙනසුරාදා, ඉරිදා, සඳුදා හැර සතියේ වෙනත් දිනයන්හි කුලියට ලබා දීමේ ගාස්තු පහත උපලේඛන II සඳහන් පරිදි විය යුතු බවටත් මම තීරණය කරමි.

උපලේඛන I

	රු. ශත.
1 නාරම්මල සතිපොළ ඇතුළත වෙළඳ කුටියක් සඳහා	350 0
2 නාරම්මල සතිපොළ ඇතුළත පදික වෙළඳුන්ගෙන් දිග් අඩියක් සඳහා	30 0
3 නාරම්මල සතිපොළ මාර්ගය දෙපස පදික වෙළඳුන්ගෙන් දිග් අඩියක් සඳහා	25 0
4 නාරම්මල බුලත් පොළ සඳහා බුලත් කොළ 1,000 කට	50 0
5 වාහන සුරැකුම්පොළ :	
1 යතුරුපැදියකට /පා පැදියකට	20 0
2 ත්‍රී රෝද රථයකට	30 0
3 කුඩා ලොරි රථයකට/වෑන් රථයකට/කාරයකට	100 0
4 බස්/ලොරි රථයකට	100 0
6 දඹදෙණිය සතිපොළ ඇතුළත වෙළඳ කුටියක් සඳහා	100 0

උප ලේඛන II

අනු අංකය	*දිනකට ගාස්තුව*	*විදුලිය/ජලය ගාස්තුව පැය 12 කට*	*තැන්පත් මුදල*
	රු. ශත	*රු. ශත*	*රු. ශත*
1. සංගීත සංදර්ශනයක් සඳහා	25,000 0	15,000 0	25,000 0
2 .එළිමහන් නාට්‍ය සංදර්ශන හා චිත්‍රපට සඳහා	15,000 0	4,500 0	15,000 0
3. රැස්වීම්,සුභද හමු හා දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා	5,000 0	3,500 0	10,000 0
4. වාණිජ ප්‍රදර්ශන, සල්පිල් සඳහා	10,000 0	5,000 0	10,000 0
5. පෙර පාසල් උත්සව සඳහා	2,000 0	3,000 0	5,000 0
6. අධ්‍යාපන සම්මන්ත්‍රණ සඳහා	10,000 0	3,000 0	10,000 0
7. මංගල උත්සව සඳහා	10,000 0	3,000 0	10,000 0
8. මංගල උත්සව සඳහා(සංගීත කණ්ඩායම සමග)	10,000 0	7,500 0	10,000 0
9 ත්‍යාග ප්‍රදානෝත්සවයක් සඳහා	5,000 0	3,000 0	10,000 0
10. අලෙවි ප්‍රවර්ධන වැඩසටහන් සඳහා	10,000 0	5,000 0	10,000 0

11-200/10

නාරම්මල ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමේ ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වන වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 93 වන වගන්තිය සහ 126 වන වගන්තියේ IX වන උපවගන්තියේ (ආ) සහ (ඇ) ඡේද වලින් ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල අනුව ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම වෙනුවෙන් 2024 වර්ෂයට අදාළව ගාස්තුවක් අය කිරීම 2023 වර්ෂයේ සැප්තැම්බර් 22 වැනි දින මාගේ තීරණ අංක 800 යටතේ පහත තීරණය ගෙන ඇති බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩී. ඩී. වික්‍රමසිංහ,
ලේකම්,
නාරම්මල ප්‍රාදේශීය සභාව.

2023 සැප්තැම්බර් මස 22 වැනි දින,
නාරම්මල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වන වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 93 වන වගන්තිය සහ 126 වන වගන්තියේ IX වන උපවගන්තියේ (ආ) සහ (ඇ) ඡේද වලින් ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල අනුව 2015.09.25 වැනි දින අංක 1933/40 දරන *අති විශේෂ ගැසට් පත්‍රය* මගින් 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වැනි වගන්තිය යටතේ වයඹ පළාත් සංස්කෘතික කටයුතු, ඉඩම්, පරිසර,සංචාරක,ආයෝජන සම්බන්ධීකරණ, සමුපකාර සංවර්ධන සහ ආහාර සැපයුම් හා බෙදාහැරීම් ගරු අමාත්‍යතුමා විසින් ප්‍රකාශයට පත් කරන ලද ප්‍රාදේශීය සභා ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථාව නාරම්මල ප්‍රාදේශීය සභාව මගින් වැළඳගෙන 2016.04.22 වැනි දින අංක 1964 *ගැසට් පත්‍රයේ* IV (ආ) කොටසේ පළ කරනු ලැබූ එම අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව 2023 වර්ෂය සඳහා ගෘහස්ථ නොවන ඒකක සහ වෙළඳ පරිශ්‍රවලින් වසරකට රු.100.00 ක ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමේ ගාස්තුවක් පනවා අය කිරීමටත් මහා පරිමාණයේ කර්මාන්ත සිදු කෙරෙන ස්ථානවලින් කිලෝ ග්‍රෑම් එකක් සඳහා රු.12.00 ක ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමේ ගාස්තුවක් පනවා අය කිරීමටත් මම තීරණය කරමි.

11-200/11

නාරම්මල ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා ඔළියදෙණිය ආදාහනාගාරයේ මෘතදේහ ආදාහනය කිරීම සඳහා ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වන වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 69 වන වගන්තිය සහ 126 වන වගන්තියෙන් ඉහත අතුරු ව්‍යවස්ථා පැනවීමට ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 03 වන වගන්තිය ප්‍රකාර 2024 වර්ෂයට අදාළව ඔළියාදෙණිය ආදාහනාගාරයේ මෘතදේහ ආදාහනය කිරීම සඳහා ගාස්තු පැනවීම 2023 වර්ෂයේ සැප්තැම්බර් 22 වැනි දින මාගේ තීරණ අංක 801 යටතේ පහත තීරණය ගෙන ඇති බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩී. ඩී. වික්‍රමසිංහ,
ලේකම්,
නාරම්මල ප්‍රාදේශීය සභාව.

2023 සැප්තැම්බර් මස 13 වැනි දින,
නාරම්මල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වන වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 69 වන වගන්තිය සහ 126 වන වගන්තියෙන් ඉහත අතුරු ව්‍යවස්ථා පැනවීමට ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 03 වන වගන්තිය ප්‍රකාර 2024 වර්ෂයට අදාළව ඔළියාදෙණිය ආදාහනාගාරයේ මෘතදේහ ආදාහනය කිරීම සඳහා ගාස්තු පැනවීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට මම තීරණය කරමි.

බල ප්‍රදේශයේ පදිංචිකරුවෙකුගේ මෘත දේහයක් සඳහා	රු. 12,730.00
බල ප්‍රදේශයෙන් පිටත පදිංචිකරුවෙකුගේ මෘත දේහයක් සඳහා	රු. 13,700.00

* මෙම ගාස්තු වෙළඳ පොළ ගෑස් මීළෙ හි සිදුවන උච්චාවචනයන්ට යටත් ව සංශෝධනය විය හැක.

11-200/12

නාරම්මල ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා ප්‍රාදේශීය සභාව සතු යන්ත්‍රෝපකරණ කුලියට දීම

ගලිගමුව ප්‍රාදේශීය සභාවේ ලේකම් එස්. ඒ. එස්. එම්. වික්‍රමසූරිය වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 (3) උප වගන්තිය අනුව මා වෙත ගලිගමුව ප්‍රාදේශීය සභාවේ බලතල කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී වශයෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව එකී පනතේ 9 (3) උප වගන්තිය සමඟ හා එම පනතේ 147 වැනි වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 153 වැනි වගන්තියේ විධි විධාන ප්‍රකාරව සංවර්ධනය නොකළ ඉඩම් මත බදු පැනවීම සම්බන්ධ තීරණය වර්ෂ 2023.11.01 වැනි දින තීරණ අංක 2023.11.01/06 යටතේ ගන්නට යෙදුන බව මෙයින් නිවේදනය කරමි.

එස්. ඒ. සජීවනී මැණික් වික්‍රමසූරිය,
ලේකම්,
ගලිගමුව ප්‍රාදේශීය සභාව.

2023 නොවැම්බර් මස 06 වැනි දින,
ගලිගමුව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

2024 වර්ෂය සඳහා සංවර්ධනය නොකළ ඉඩම් මත බදු පැනවීමට අදාළ තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 153(1) (අ) (ආ) (ඇ) (ඈ) 153 (2) විධි විධාන ප්‍රකාරව ගලිගමුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සංවර්ධනය නොකළ ඉඩම් වෙනුවෙන් අදාළ ඉඩමෙහි ප්‍රාග්ධන බිම් අගයෙන් 1% ක බදු මුදලක් 2024 වර්ෂය සඳහා පනවා අය කිරීම සුදුසු බව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 (3) උප වගන්තියෙන් ගලිගමුව ප්‍රාදේශීය සභාවේ බලතල කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී වශයෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මම තීරණය කරමි.

11-514/6

ගලිගමුව ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා වාහන හා සතුන් පිළිබඳ බදු පැනවීම

ගලිගමුව ප්‍රාදේශීය සභාවේ ලේකම් එස්. ඒ. එස්. එම්. වික්‍රමසූරිය වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 (3) උප වගන්තිය අනුව මා වෙත ගලිගමුව ප්‍රාදේශීය සභාවේ බලතල කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී වශයෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව එකී පනතේ 9 (3) උප වගන්තිය සමඟ හා එම පනතේ 147 වැනි වගන්තිය හා 148 වැනි වගන්තිය යටතේ 2024 වර්ෂය සඳහා වාහන හා සතුන් පිළිබඳ බදු පැනවීම සම්බන්ධ තීරණය වර්ෂ 2023.11.01 වැනි දින තීරණ අංක 2023.11.01/07 යටතේ ගන්නට යෙදුන බව මෙයින් නිවේදනය කරමි.

එස්. ඒ. සජීවනී මැණික් වික්‍රමසූරිය,
ලේකම්,
ගලිගමුව ප්‍රාදේශීය සභාව.

2023 නොවැම්බර් මස 06 වැනි දින,
ගලිගමුව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

2024 වර්ෂය සඳහා වාහන හා සතුන් පිළිබඳ බදු පැනවීමට අදාළ තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වන වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 148 වන වගන්තිය යටතේ ගලිගමුව ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව ගලිගමුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2024 වර්ෂයේදී පහත උපලේඛනයෙහි 1 වන තීරුවේ නිරූපිත කිසියම් වාහනයක් හෝ සතෙකු තමා සන්තකයෙහි තබා ගන්නා සෑම තැනැත්තෙකුගෙන්ම එහි 11 වන තීරුවේ නිරූපිත බද්දක් 2024 වර්ෂය සඳහා පනවා අය කිරීම සුදුසු බව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 (3) උප වගන්තියෙන්

ගලිගමුව ප්‍රාදේශීය සභාවේ බලතල කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි වශයෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මම තීරණය කරමි.

I වන තීරුව		*II වන තීරුව*
අනු අංකය	*ව්‍යාපාරයේ ස්වභාවය*	*රු. ශත*
1	මෝටර් රථයක්, මෝටර් ට්‍රයි කාරයක් මෝටර් ලොරියක් මෝටර් බයිසිකලයක්, කරත්තයක්, ජීන් රික්ෂෝවක්, බයිසිලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාරයක් හෝ කරත්තයක් සඳහා	25.00
	(අ) වෙළඳ කාර්යයක් සඳහා යොද වන්නේ නම්	18.00
	(ආ) වෙළඳ කාර්යයක් නොවන කාර්යයක් සඳහා යොදවන්නේ නම්	4.00
2	සෑම කරත්තයක් සඳහා	20.00
3	සෑම අත් කරත්තයක් සඳහා	10.00
4	සෑම රික්ෂෝවක් සඳහා	7.00
5	සෑම අශ්වයකු පෝනියකු හෝ කොටළුවකු සඳහා	15.00
6	සෑම ඇතෙකු සඳහා	50.00

11-514/7

ගලිගමුව ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා සංචාරක හෝටල්, ආපනශාලා, නවාතැන්පලවල් සඳහා බලපත්‍ර ගාස්තු පැනවීම

ගලිගමුව ප්‍රාදේශීය සභාවේ ලේකම් එස්. ඒ. එස්. එම්. වික්‍රමසූරිය වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 (3) උප වගන්තිය අනුව මා වෙත ගලිගමුව ප්‍රාදේශීය සභාවේ බලතල කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි වශයෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව එකී පනතේ 9 (3) උප වගන්තිය සමඟ කියවිය යුතු හා එම පනතේ 147 වැනි වගන්තිය හා 149 වැනි වගන්තියේ විධි විධාන ප්‍රකාරව 2024 වර්ෂය සඳහා සංචාරක හෝටල්, ආපනශාලා, නවාතැන්පලවල් සඳහා බලපත්‍ර ගාස්තු පැනවීම සම්බන්ධ තීරණය වර්ෂ 2023.11.01 වැනි තීරණ අංක 2023/11/01/08 යටතේ ගන්නට යෙදුන බව මෙයින් නිවේදනය කරමි.

එස්. ඒ. සජීවනී මැණික් වික්‍රමසූරිය,
ලේකම්,
ගලිගමුව ප්‍රාදේශීය සභාව.

2023 නොවැම්බර් මස 06 වැනි දින,
ගලිගමුව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

2024 වර්ෂය සඳහා සංචාරක හෝටල්, ආපනශාලා, නවාතැන්පලවල් සඳහා බලපත්‍ර ගාස්තු පැනවීමට අදාළ තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වන වගන්තියෙන් ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ඇත්තා වූ ද අනුමත කර හෝ පිළිගත්තා වූ ද බල ප්‍රදේශයේ ඇති සංචාරක හෝටල්, ආපන ශාලා හෝ නවාතැන්පලවල් සඳහා පසුගිය වර්ෂයේ පිරිවැටුම පදනම් කරගෙන එයින් 1% නොඉක්මවන ගාස්තු අය කිරීමටත්, අළුතින් ආරම්භ කළ ව්‍යාපාරයක් නම්, පළමු අවුරුද්දේ එම ස්ථානයේ වාර්ෂික වටිනාකම මත 2024 වර්ෂයේ සිට බලපත්‍ර ගාස්තු අය කිරීමටත්, එම බලපත්‍ර ගාස්තු 2024.03.31 වන දිනට ප්‍රථම ගෙවීමට නියම කිරීම සුදුසු බව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 (3) උප වගන්තියෙන් ගලිගමුව ප්‍රාදේශීය සභාවේ බලතල කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි වශයෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මම තීරණය කරමි.

11-514/8

ගලිගමුව ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා ගාස්තු අයකිරීම

ගලිගමුව ප්‍රාදේශීය සභාව විසින් තීරණය කර පනවා ඇති පහත සඳහන් ගාස්තු 2024 වර්ෂය සඳහා ද ක්‍රියාත්මක කිරීම සුදුසු බව එම සභාවේ බලතල කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී වශයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) උප වගන්තිය අනුව, ගලිගමුව ප්‍රාදේශීය සභාවේ ලේකම් එස්. ඒ. එස්. එම්. වික්‍රමසූරිය වන මා වෙත පැවරී ඇති ප්‍රකාරව මම තීරණය කරමි.

එස්. ඒ. සජීවනී මැණික් වික්‍රමසූරිය,
ලේකම්,
ගලිගමුව ප්‍රාදේශීය සභාව.

2023 නොවැම්බර් මස 06 වැනි දින,
ගලිගමුව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යන්ත්‍රෝපකරණ කුළියට සැපයීම සඳහා ගාස්තු අය කිරීම

● ජල බවුසරය කුලියට දීමේ ගාස්තු	රු. ශත
ජලය සමග ලෝඩ් එකක ගාස්තුව	රු. 5,000.00
සේවා ගාස්තු	රු. 700.00
යාමට ඒමට කි. මී. 01 ක් සඳහා	රු. 150.00
ජල බවුසරය රඳවා තබා ගන්නේ නම් (පැය 24 ක් ඇතුළත)	රු. 1,000.00
හිස් බවුසරය කුලියට දීම (පැය 8 කට අඩු) ඉහත මිලගණන් යටතේ (ජල සම්පාදන මණ්ඩලයේ ජල ගාස්තු සඳහා අයකරන ගාස්තුව අඩු කරනු ලැබේ.)	
ජලය රහිතව බවුසරය පැය 8ක් හෝ ඊට වැඩි කාලයකට ලබාදීම.	
රියදුරු සමඟ (කි.මී. 24 ක දුරක් සඳහා අයකරනු නොලැබේ.)	රු.8,000.00
කි. මී. 25 ට වැඩිවන කි. මීටර් 1ක් සඳහා (යාම සහ ඒම)	රු. 150.00

● ගලි බවුසරය කුලියට දීම	
බල ප්‍රදේශය තුළ ලෝඩ් 01 ක් සඳහා	රු. 6,000.00
බල ප්‍රදේශයෙන් පිටත ලෝඩ් 01 ක් සඳහා	රු. 7,000.00
සේවා ගාස්තුව	රු. 750.00
අමතර බැහැර කරන ලෝඩ් 01 ක් සඳහා (එම ස්ථානයට අදාළව)	රු. 3,500.00
යාමට ඒමට කි. මී. 01 ක් සඳහා (ගලිගමුව ප්‍රාදේශීය සභාවේ සිට ගණනය කිරීමේදී ආරම්භක ස්ථානය හා අවසාන ස්ථානය ලෙස සලකයි.)	රු. 150.00

මාර්ග තලනය

දිනකට (ඉන්ධන රහිතව)	රු. 4,000.00

● ZA 5575 දරණ බැකෝ යන්ත්‍රය	
මීටර් පැය 01 ට (පැය 2ක මුදල සේවාව සැපයීමට පෙර ගෙවිය යුතුය. යාම සහ ඒමද මීටර් පැය වලට ඇතුළත් වේ)	රු. 5,600.00

- ZA 5408 දරණ මෝටර් ග්‍රේඩරය

මීටර් පැය 01 ට රු. 5,500.00

(පැය 2ක මුදල සේවාව සැපයීමට පෙර ගෙවිය යුතුය. යාම සහ ඒමද මීටර් පැය වලට ඇතුළත් වේ. කිලෝ මීටර් 10 ට වඩා වැඩි වන විට කැරියර් රථයක් මගින් රැගෙන යාමට අදාළ වියදම සේවාලාභියා විසින් දැරිය යුතුය.)

- පුටු 01 - දිනක් සඳහා - රු. 5.00
- කොඩි කණු 01 - දිනක් සඳහා - රු. 25.00
- පාලම් කොඩි 01 - දිනක් සඳහා - රු. 10.00
- වෙනත් කොඩි 01 - දිනක් සඳහා - රු. 5.00
- ටකරන් තහඩු 01 - දිනක් සඳහා - රු. 10.00
- සාස්පාන්/තාච්චි 01 - දිනක් සඳහා - රු. 100.00
- නව වේදිකාව - එක් දිනක් සඳහා- රු. 10,000.00
- ජල ගාස්තු අය කිරීම - තැන්පත් - රු. 3,000.00

ගෘහ	
ස්ථාවර ගාස්තුව	රු. 75.00
ඒකක 1-10	රු. 4.00
11-20	රු. 10.00
21-30	රු. 20.00
31-50	රු. 30.00
51 සිට	රු. 50.00
ව්‍යාපාර	
ස්ථාවර ගාස්තු	රු. 150.00
එක් ඒකකයක් සඳහා	රු. 40.00

● ප්‍රචාරක දැන්වීම් පුවරු ගාස්තු අය කිරීම

විස්තරය	*වර්ග අඩි 01 ට මිල*
බැනරයක් මගින් ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය	රු. 30.00
කටවුටි	රු. 45.00
ස්ථිර පුවරුවක ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීම	රු. 90.00

● 2024 වර්ෂය සඳහා අයදුම්පත්/සහතික නිකුත් කිරීම සඳහා ගාස්තු අය කිරීම

අනු අංකය	*අයදුම්පත් වර්ගය*	*2024 වර්ෂයට ගාස්තුව*
1.	ගොඩනැගිලි අයදුම්පත් ගාස්තු	රු. 960.00
2.	වීථි රේඛා හා නොපවරා ගැනීමේ සහතික නිකුත් කිරීමේ ගාස්තු	රු. 650.00
3.	අනතුරුදායක කොස් ගස් සඳහා අයදුම්පත්‍ර ගාස්තු	රු. 750.00
4.	අනතුරුදායක ගස් (අනෙකුත් සියලුම) සඳහා අයදුම්පත්‍ර ගාස්තු	රු. 500.00
5.	පරිසර බලපත්‍ර නිකුත් කිරීමේ ගාස්තු	රු. 4,000.00
6.	පරිසර බලපත්‍ර අයදුම් පත් ගාස්තු	රු. 120.00

7.	කොම්පෝස්ට් පොහොර කිලෝ 01 ක්	රු. 20.00
8.	කොම්පෝස්ට් පොහොර කිලෝ 500 හෝ ඊට වඩා	රු. 15.00
9.	ආදාහනාගාර සේවාව පවත්වාගෙන යාම වෙනුවෙන් ගාස්තු	
	බල ප්‍රදේශය තුළ පදිංචි අයකුගේ මෘත දේහයක් ආදාහනය කිරීම	රු. 12,000.00
	බල ප්‍රදේශයෙන් පිටත පදිංචි අයකුගේ මෘතදේහයක් ආදාහනය කිරීම.	රු. 13,000.00
	ගලිගමුව ප්‍රාදේශීය සභාවේ සේවය කරන හෝ කරන ලද කාර්ය මණ්ඩලයේ යම් තැනැත්තකුගේ හෝ මහජන නියෝජිතයෙකුගේ ආදාහනය වෙනුවෙන් (අතුරුව්‍යවස්ථාව අනුව)	- නොමිලේ

10. පිඹුරු සැලැස්ම අනුමත කිරීම (පර්චස් ප්‍රමාණය අනුව) :

1.	පර්චස් 6 - 20 දක්වා	රු. 500.00
2.	පර්චස් 21 - 30 දක්වා	රු. 700.00
3.	පර්චස් 31 -50 දක්වා	රු. 1,000.00
4.	පර්චස් 51 ට වැඩි සියලුම පිඹුරුපත් සඳහා	රු.1,500.00

- නාගරික සංවර්ධන අධිකාරියට අයත් ප්‍රදේශයක පිඹුරුපත් අනුමත කිරීමේ පෝරම ගාස්තු රු. 110.00
- නිවාස හා නගර සංවර්ධන ආඥාපනත ක්‍රියාත්මක වන ප්‍රදේශයක පිඹුරුපත් අනුමත කිරීමේ පෝරම ගාස්තුව රු. 110.00

වරිපනම් ලේඛනයේ නම සංශෝධනය කිරීමේ පෝරම ගාස්තු රු. 200.00

සභාව සතු මාර්ග පළුදු කිරීම සඳහා ගාස්තු :

ස්වභාවය	*මීටරයක් සඳහා අය කිරීම*				
	කාපට් පාර	*තාර පාර*	*කොන්ක්‍රීට් පාර*	*ඉන්ටර්ලොක් පාර*	*බොරළු පාර*
	රු. ශත	*රු. ශත*	*රු. ශත*	*රු. ශත*	*රු. ශත*
මාර්ගය හරහා නල එලීම	3,000.00	1,000.00	1,000.00	900.00	200.00
මාර්ගය අයිනේ වලක් කැපීම	600.00	600.00	600.00	600.00	600.00
මාර්ග උරහිස කානු කැපීම	100.00	200.00	200.00	200.00	100.00

රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා නිකුත් කරනු ලබන බලපත්‍ර මත ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වැනි වගන්තියේ (3) වැනි උප වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 147 වැනි වගන්තිය සමග කියවිය යුතු 149 වැනි වගන්තිය යටතේ රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව පහත සඳහන් පරිදි බලපත්‍ර මත ගාස්තු පනවා අය කිරීමට 2023.09.25 දින තීරණ අංක 2023.09.25/140 යටතේ පහත දැක්වෙන තීරණය ගන්නා ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ආර්. එම්. නදීකා නිරෝෂිණී අබේකෝන්,
සභා ලේකම් හා බලතල කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී,
රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාව.

2023 සැප්තැම්බර් මස 25 වැනි දින,
රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාව,
ආඳාඋල්පත, උඟරණිය.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වැනි වගන්තියේ (3) වන උප වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 147 වැනි වගන්තිය සමග කියවිය යුතු 149 වන වගන්තිය යටතේ රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව එකී පනතේ හෝ එකී පනත යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විස්තර කර ඇති මෙහි පහත උපලේඛනයෙහි 1 වැනි තීරුවේ නිරූපිත යම් කාර්යයක් සඳහා රිදීමාලියද්ද ප්‍රදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක් පාවිච්චි කිරීමට බලය දෙමින් 2024 වර්ෂයේ නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් සම්බන්ධයෙන් එම උප ලේඛනයෙහි II තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත බලපත්‍ර ගාස්තුවක් පනවා අය කළ යුතු යැයි තීරණය කරමි.

උපලේඛන - 01

	I වැනි තීරය	*II වැනි තීරය*		
	බලය දෙනු ලබන කාර්යය	*පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම*		
අනු. අංකය	*වෙළෙඳාම හෝ ව්‍යාපාරයේ ස්වභාවය*	*රු.750 නොඉක්මවන අවස්ථාවක*	*රු. 751 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,501 0 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
1.	බේකරියක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
2.	සිල්ලර බඩු කඩයක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
3.	හෝටලයක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
4.	තේ කඩයක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
5.	එළවළු, පලතුරු වෙළෙඳාම සඳහා	500 0	750 0	1,000 0
6.	සිල්ලර බඩු වර්ග තොග වෙළෙඳාම සඳහා	500 0	750 0	1,000 0
7.	සංචාරක වෙළෙඳාම හෝ පදික වෙළෙඳාම සඳහා	500 0	750 0	1,000 0
8.	ග්‍රොසරියක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
9.	සිසිල් බීම (කුල්ස්පොට්) වෙළෙඳසැලක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
10.	පොල්තෙල් මෝලක් හා මිරිස්, කුළුබඩු, ධාන්‍ය වර්ග ඇඹරුම්හලක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
11.	වී ඇඹරුම්හලක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0

අනු. අංකය	I වැනි තීරය බලය දෙනු ලබන කාර්යය වෙළෙඳාම හෝ ව්‍යාපාරයේ ස්වභාවය	පරිශ්‍රයේ	II වැනි තීරය වාර්ෂික වටිනාකම	
		රු.750 නොඉක්මවන අවස්ථාවක	රු. 751 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක	රු. 1,501 0 ඉක්මවන අවස්ථාවක
		රු. ශත	රු. ශත	රු. ශත
12.	යෝගට්, අයිස්ක්‍රීම්, අයිස් පැකට් නිෂ්පාදනය හා අලෙවිය සඳහා	500 0	750 0	1,000 0
13.	කුළුබඩු වර්ග පැකට් කිරීම සඳහා	500 0	750 0	1,000 0
14.	පරණ යකඩ ඇතුළු අබිලි ද්‍රව්‍ය මිලදී ගැනීම හා විකිණීම සිදු කරන ස්ථාන සඳහා	500 0	750 0	1,000 0
15.	බාබර් සාප්පුවක් සඳහා	500 0	750 0	1,000 0
16.	හුණු පෝරණුවක් සඳහා	500 0	750 0	1,000 0
17.	ග්‍රැවල් කැපීම සඳහා	500 0	750 0	1,000 0
18.	මාළු වෙළෙඳසැලක් සඳහා	500 0	750 0	1,000 0
19.	කුකුළු මස් වෙළෙඳසැලක් සඳහා	500 0	750 0	1,000 0
20.	ගව මස් වෙළෙඳසැලක් සඳහා	500 0	750 0	1,000 0
21.	ඌරු මස් වෙළඳසැලක් සඳහා	500 0	750 0	1,000 0
22.	රසකැවිලි, බයිට් වර්ග නිෂ්පාදනය හා අලෙවිය සඳහා	500 0	750 0	1,000 0
23.	වීදුරු අලෙවි කරන ස්ථානයක් සඳහා	500 0	750 0	1,000 0
24.	පලතුරු මිලදී ගැනීමේ ස්ථානයක් සඳහා	500 0	750 0	1,000 0
25.	බෑග්/සපත්තු/සම්භාණ්ඩ නිපදවීම හා අලෙවිය සඳහා	500 0	750 0	1,000 0
26.	පොල්කටු අඟුරු හා දූව අඟුරු නිෂ්පාදනය සඳහා	500 0	750 0	1,000 0
27.	කාබනික පොහොර හෝ රසායනික පොහොර නිපදවීම හෝ විකිණීමට තබාගැනීම	500 0	750 0	1,000 0
28.	සත්ත්ව පාලන (මස්, කිරි හෝ බිත්තර සඳහා) සතුන් ඇති කරන ස්ථාන පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
29.	රබර් නිෂ්පාදනය කිරීම හෝ රබර් රොටි තබාගැනීම	500 0	750 0	1,000 0
30.	තොග වශයෙන් විකිණීම සඳහා නරක්වන සුළු කෑම වර්ග හෝ ආහාර ද්‍රව්‍ය තබා ගැනීම	500 0	750 0	1,000 0
31.	කරවල, මාළු හෝ ජාඩි කිලෝග්‍රෑම් 100ට වඩා වැඩි ප්‍රමාණයක් තබාගැනීම	500 0	750 0	1,000 0
32.	මාළු හෝ ජාඩි දූමීම හෝ වේලීම හෝ අයිස් දැමීම	500 0	750 0	1,000 0
33.	පොල්කටු අඟුරු හෝ දූව අඟුරු නිපදවීම	500 0	750 0	1,000 0
34.	දුම්කොළ වියළීම	500 0	750 0	1,000 0
35.	සත්ත්ව ආහාර නිපදවීම	500 0	750 0	1,000 0
36.	පුන්නක්කු නිපදවීම	500 0	750 0	1,000 0
37.	අලුත් ලෝහ හෝ පරණ ලෝහ තබාගැනීම	500 0	750 0	1,000 0
38.	ගෘහ භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
39.	වේවැල් භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
40.	වඩු කර්මාන්ත ශාලාවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
41.	සිරප් හෝ පලතුරු බීම නිපදවීම	500 0	750 0	1,000 0
42.	දූව ඉරීම	500 0	750 0	1,000 0

අනු. අංකය	I වැනි තීරය බලය දෙනු ලබන කාර්යය වෙළෙඳාම හෝ ව්‍යාපාරයේ ස්වභාවය	පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම	II වැනි තීරය වාර්ෂික වටිනාකම	
		රු.750 නොඉක්මවන අවස්ථාවක	රු. 751 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක	රු. 1,501 0 ඉක්මවන අවස්ථාවක
		රු. ශත	රු. ශත	රු. ශත
43.	පින්තාරු තීන්ත, වාර්නිෂ් හෝ ඩිස්ටෙම්පර් නිපදවීම	500 0	750 0	1,000 0
44.	කෘෂිකර්ම ගොවිපල	500 0	750 0	1,000 0
45.	කෘෂි නිෂ්පාදන අලෙවිය	500 0	750 0	1,000 0
46.	ටයර් නැවත පිරවීම	500 0	750 0	1,000 0
47.	ටයර්, ටියුබ් වොල්කනයිසින් කිරීම	500 0	750 0	1,000 0
48.	සිමෙන්ති භාණ්ඩ හෝ ඇස්බැස්ටර් භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
49.	ප්ලාස්ටික් භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
50.	ගඩොල් පිළිස්සීම	500 0	750 0	1,000 0
51.	ටයර්/ටියුබ් අලෙවිය	500 0	750 0	1,000 0
52.	සපත්තු/බෑග්/සම් භාණ්ඩ නිෂ්පාදනය	500 0	750 0	1,000 0
53.	දුම්කොළ යොදා කෙරෙන සිගරට්, බීඩි සුරුට්ටු නිපදවීම	500 0	750 0	1,000 0
54.	කළුගල්/තිරුවානා ගල් කැනීම හෝ කැඩීම	500 0	750 0	1,000 0
55.	සිසිල් බීම නිෂ්පාදනය	500 0	750 0	1,000 0
56.	පොල්තෙල් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
57.	ගිනිපෙට්ටි නිෂ්පාදනය හෝ ගබඩා කිරීම	500 0	750 0	1,000 0
58.	කොහු හෝ වෙනත් කෙඳිවර්ග නිෂ්පාදනය	500 0	750 0	1,000 0
59.	කොහු හෝ වෙනත් කෙඳිවර්ගවලින් භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
60.	පිදුරු තබා ගැනීම	500 0	750 0	1,000 0
61.	පාවිච්චි කළ ඇඳුම් ගබඩා කිරීම	500 0	750 0	1,000 0
62.	ස්වර්ණාභරණ නිෂ්පාදනය හෝ අලුත්වැඩියාව	500 0	750 0	1,000 0
63.	යන්ත්‍රානුසාරයෙන් ලී ඉරීම	500 0	750 0	1,000 0
64.	හිරිගල් හෝ හුණු ගල් කැණීම	500 0	750 0	1,000 0
65.	යන්ත්‍රෝපකරණ පාවිච්චි කරන කම්හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
66.	හිස් ගෝනි හෝ හිස් බෝතල් තබාගැනීම	500 0	750 0	1,000 0
67.	පා පැදි හෝ යතුරු පැදි අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
68.	පාවිච්චි කරන ලද කඩදාසි හෝ පත්තර තබාගැනීම	500 0	750 0	1,000 0
69.	විසිතුරු පින්තාරු කිරීම	500 0	750 0	1,000 0
70.	ගිනිකෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤු ගබඩා කිරීම	500 0	750 0	1,000 0
71.	වෑල්ඩින් වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
72.	හුණුගල් හෝ හිරිගල් නිපදවීම	500 0	750 0	1,000 0
73.	මෝටර් වාහන අලුත්වැඩියාව	500 0	750 0	1,000 0
74.	මෝටර් වාහන සේවා කිරීම	500 0	750 0	1,000 0
75.	වාත්තු මඩුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
76.	බෙලෙක් වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
77.	මෝටර් වාහන බොඩි තැබීම	500 0	750 0	1,000 0
78.	කෘමිනාශක, දිලීර නාශක, පැළෑටි හෝ පලිබෝධ නාශක නිපදවීම	500 0	750 0	1,000 0
79.	වීදුරු භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
80.	යකඩ තහඩු ගැල්වනයිස් කිරීම	500 0	750 0	1,000 0

අනු. අංකය	I වැනි තීරය බලය දෙනු ලබන කාර්යය වෙළෙඳාම හෝ ව්‍යාපාරයේ ස්වභාවය	පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම		
		රු.750 නොඉක්මවන අවස්ථාවක	රු. 751 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක	රු. 1,501 0 ඉක්මවන අවස්ථාවක
		රු. ශත	රු. ශත	රු. ශත
81.	ඇළුමිණියම් භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
83.	වායු සමීකරණ යන්ත්‍ර, ශීතකරණ හෝ අධි ශීතකරණ අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
83.	බ්‍රේක් ලයිනර්, ක්ලච් ලයිනර් නිපදවීම	500 0	750 0	1,000 0
84.	දුරකථන අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
85.	කුකුළු බිත්තර අලෙවිකරන්නන්	500 0	750 0	1,000 0
86.	සමුපකාර වෙළඳසැලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
87.	දියලුණු ඇසුරුම් කර විකිණීමේ ස්ථානයක් සඳහා	500 0	750 0	1,000 0
88.	යකඩ කම්මලක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
89.	රූපවාහිනී, ගුවන් විදුලි, පරිගණක හා ජංගම දුරකතන	500 0	750 0	1,000 0
	ඇතුළු ඉලෙක්ට්‍රොනික් යන්ත්‍ර අලුත්වැඩියා කිරීම සඳහා	500 0	750 0	1,000 0
90.	මුද්‍රණාලයක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
91.	සත්ව ගොවිපලක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
92.	පැණි හකුරු නිෂ්පාදනය හා අලෙවිය සඳහා	500 0	750 0	1,000 0
93.	පපඩම් නිෂ්පාදනය හා අලෙවිය සඳහා	500 0	750 0	1,000 0
93.	ගෑස් සිලින්ඩර් අලෙවිය සඳහා	500 0	750 0	1,000 0
95.	බැටරි චාර්ජ් කිරීම සඳහා	500 0	750 0	1,000 0
96.	අවමංගල සේවා ස්ථානයක් සඳහා	500 0	750 0	1,000 0
97.	බුලත්, පුවක්, දුම්කොළ විකිණීමේ ස්ථානයක්	500 0	750 0	1,000 0
	පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
98.	කුෂන් වැඩපලක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
99.	ධාන්‍ය වර්ග මිළදී ගැනීමේ ස්ථානයක් සඳහා	500 0	750 0	1,000 0
100.	ගර්කින් පදම් කිරීම සඳහා	500 0	750 0	1,000 0
101.	කිරි ශීත කිරීමේ ස්ථානයක් සඳහා	500 0	750 0	1,000 0
102.	මැටි භාණ්ඩ නිෂ්පාදනය හා අලෙවිය සඳහා	500 0	750 0	1,000 0
103.	බිම්මල් නිෂ්පාදනය හා අලෙවි කිරීම සඳහා	500 0	750 0	1,000 0
104.	ඔරලෝසු අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
105.	පෞද්ගලික සෞඛ්‍ය ආයතන	500 0	750 0	1,000 0
106.	විදුලි උත්පාදන ආයතන	500 0	750 0	1,000 0
107.	ඖෂධ අලෙවිකරන ස්ථාන	500 0	750 0	1,000 0
108.	පොල්තෙල් ගබඩාවක් පවත්වාගෙන යන්නන්	500 0	750 0	1,000 0
109.	රූපලාවන්‍යාගාර පවත්වන්නන්	500 0	750 0	1,000 0
110.	කෘෂි නිෂ්පාදන ගබඩාකරන්නන්	500 0	750 0	1,000 0
111.	විසිතුරු මසුන් සහ වෙනත් සුරතල් සතුන් ඇති කිරීම	500 0	750 0	1,000 0
	හා අභිජනනය කිරීම			
112.	මී මැසි ගොවිපලක් පවත්වාගෙන යන්නන්	500 0	750 0	1,000 0
113.	කළුගල් ඇඹරුම්හල්	500 0	750 0	1,000 0
114.	පාවහන්/සම්භාණ්ඩ නිෂ්පාදනය	500 0	750 0	1,000 0

රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාව

2024 වර්ෂයේ ව්‍යාපාර බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වැනි වගන්තියේ (3) වන උප වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 152 වැනි වගන්තිය යටතේ රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව පහත සඳහන් වෙළඳ ව්‍යාපාර සඳහා බදු පනවා අය කිරීමට 2023.09.25 දින තීරණ අංක 2023.09.25/141 යටතේ පහත දැක්වෙන තීරණය ගන්නා ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ආර්. එම්. නදීකා නිරෝෂිණී අබේකෝන්,
සභා ලේකම් හා බලතල කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාව.

2023 සැප්තැම්බර් මස 25 වැනි දින,
රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාව,
ආඳාඋල්පත, ඌරණිය.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වැනි වගන්තියේ (3) වන උප වගන්තිය සමග කියවියයුතු එකී පනතේ 152 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ එම පනතේ 150 වන වගන්තිය යටතේ යම් කර්මාන්ත බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ යම් ව්‍යාපාරයක් රිදීමාලියද්ද ප්‍රාදේශීය සභා බලප්‍රදේශය ඇතුළත 2024 වර්ෂයේ දී පවත්වාගෙන යන සෑම තැනැත්තෙකුගෙන්ම එම ව්‍යාපාරයේ 2023 වර්ෂයේ ආදායම මෙහි පහත උපලේඛනයෙහි I වන තීරුවේ නිරූපිත යම් විෂයාංකයක සීමාවන් ඇතුලත පවතින අවස්ථාවක එකී II තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත අනුප්‍රමාණයක ව්‍යාපාර බද්දක් 2024 වර්ෂය සඳහා පනවා අය කළ යුතු යැයි ද,

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වගන්තියේ, 1 වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව බද්දට යටත්වන සෑම තැනැත්තෙකු විසින්ම යථෝක්ත බද්ද 2024.03.31 දිනට ප්‍රථම රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබිය යුතු යැයි ද, තීරණය කරමි.

I කොටස/ I උපලේඛනය

ඇතැම් වෙළෙඳ ව්‍යාපාර සම්බන්ධ බදු - 152 වැනි වගන්තිය

01.	කොමිස් ඒජන්තවරු
02.	වෙන්දේසිකරුවන්
03.	මුදල් ආයෝජකයින්
04.	උකස් බඩු ගන්නවුන්
05.	කොන්ත්‍රාත්කරුවන්
06.	ගොඩනැගිලි ද්‍රව්‍ය අලෙවිකරන්නන්
07.	ලොතරැයි නියෝජිතයින්
08.	බැංකු හා රක්ෂණ නියෝජිතයින්
09.	මෝටර් රථ වෙළෙඳාම්කරුවන්
10.	මැණික් වෙළෙඳ ව්‍යාපාරිකයින්
11.	පෞද්ගලික අධ්‍යාපන ආයතන
12.	ඒජන්තවරු මාර්ගයෙන් බඩු විකිණීම

13. ඇඟළුම් කර්මාන්ත පවත්වන්නන්
14. වාහන අමතර කොටස් අලෙවි කරුවන්
15. බ්‍රෝකර්වරු
16. කුලී කාර් හා වෑන් අයිතිකරුවන්
17. ගෘහ භාණ්ඩ අලෙවිය
18. ජංගම දුරකථන හා උපාංග අලෙවිකරුවන්
19. ඡායාරූප ශාලා පවත්වාගෙන යන්නන්
20. විදුලි උපකරණ අලෙවිකරුවන්
21. පාසල් උපකරණ හා ලිපි ද්‍රව්‍ය අලෙවිකරන්නන්
22. උත්සව භාණ්ඩ සැපයුම්කරුවන්
23. දුම් පරීක්ෂා කරන ස්ථාන සඳහා
24. පූජා භාණ්ඩ අලෙවි කරන්නන්
25. ගීත පටිගත කරන ස්ථාන
26. ශබ්ද විකාශන යන්ත්‍ර කුලියට දීමේ ස්ථාන
27. උද්‍යාන භෝග අලෙවිකරුවන්
28. ශ්‍රව්‍ය දෘෂ්‍ය ගීත හා චිත්‍රපට පටිගත කිරීම /පෙන්වීම/ කුලියට දෙන ස්ථානයක් පවත්වාගෙන යන්නන්
29. වාහන අලෙවිකරුවන්
30. දුරකථන සම්ප්‍රේෂණ කුළුණු
31. රියදුරු පුහුණු ආයතන
32. මුදල් ණයට දෙන්නන්
33. ගෘහ නිර්මාණ ශිල්පීය කාර්යාල පවත්වාගෙන යන්නන්
34. කාය වර්ධන මධ්‍යස්ථාන පවත්වාගෙන යන්නන්
35. ඡායා පිටපත්, දුරකථන ඇමතුම්, ෆැක්ස්, ලැමිනේටින් ලබාගන්නා ස්ථාන
36. ටයර් අලෙවිකරන්නන්
37. පුවත්පත් හා පොත් අලෙවි කරන්නන්
38. පරිගණක පුහුණුව ලබාදෙන ආයතන
39. අත්කම් නිෂ්පාදන අලෙවිකරන්නන්
40. ජුකී පුහුණු ආයතන
41. තිරරෙදි නිර්මාණ හා අලෙවිකරුවන්
42. ඇන්ටෙනා අලෙවිකරුවන්
43. නොතාරිස් කාර්යාල
44. පෞද්ගලික බස් රථ හිමියන්
45. නීතිඥ කාර්යාල පවත්වන්නන්
46. ඉඩම් මැනීමේ කාර්යාල පවත්වන්නන්
47. මල් අතුරිකිලි/පැල තවාන් පවත්වාගෙන යන්නන්
48. සුපිරි වෙළෙඳසැල්
49. කුලී පදනම මත පස් කැපීමේ යන්ත්‍ර ලබාදෙන්නන්
50. ඉලෙක්ට්‍රොනික් භාණ්ඩ නිෂ්පාදනය හා අලෙවිය සඳහා
51. ඡායා පිටපත්, රෝණියෝ පිටපත් ගැනීමේ ස්ථානයක් සඳහා
52. බීජ වර්ග හා කෘෂි උපකරණ, වාහන අලෙවිකරුවන්
53. ත්‍රිරෝද රථ, යතුරු පැදි, වාහන අමතර කොටස් අලෙවිය
54. ජෝතිෂ්‍ය කාර්යාල පවත්වාගෙන යන්නන්
55. ග්‍රැවල් ප්‍රවාහනය කරන්නන්
56. පස් ගබඩා කරන්නන්
57. සිසිල්බීම අලෙවිකරුවන්
58. ප්‍රචාරක ආයතන පවත්වාගෙන යන්නන්
59. ඔන්ලයින් ක්‍රමයට අනුව භාණ්ඩ ප්‍රවාහනය කරන්නන්

උපලේඛනය

	I වන තීරය *2023 වර්ෂයේදී ආදායම*	*II වන තීරය* *රු. ශත*
01	රු. 6,000.00 නොඉක්මවන අවස්ථාවන්හි දී	කිසිවක් නොමැත
02	රු. 6,001.00 ඉක්මවන එහෙත් රු. 12,000.00 නොඉක්මවන අවස්ථාවන්හි දි	90 0
03	රු. 12,001.00 ඉක්මවන එහෙත් රු. 18,750.00 නොඉක්මවන අවස්ථාවන්හිදී	180 0
04	රු. 18,751.00 ඉක්මවන එහෙත් රු. 75,000.00 නොඉක්මවන අවස්ථාවන්හි දි	360 0
05	රු. 75,001.00 ඉක්මවන එහෙත් රු. 1,50,000.00 නොඉක්මවන අවස්ථාවන්දි දී	1,200 0
06	රු. 1,50,001.00 ඉක්මවන අවස්ථාවන්හි දි	3,000 0

11 -455/2

රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාව

2024 වර්ෂයේ වාහන හා සතුන් පිළිබඳ බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වැනි වගන්තියේ (3) වන උප වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 147 වැනි වගන්තිය සමග කියවිය යුතු 148 වැනි වගන්තිය යටතේ රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව පහත සඳහන් වාහන හා සතුන් පිළිබඳ බදු පනවා අයකිරීමට 2023.09.25 දින තීරණ අංක 2023.09.25/142 යටතේ පහත දැක්වෙන තීරණය ගන්නා ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ආර්. එම්. නදීකා නිරෝෂිණී අබේකෝන්,
සභා ලේකම් හා බලතල කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාව.

2023 සැප්තැම්බර් මස 25 වැනි දින,
රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාව,
ආඳාඋල්පත, උහරණිය.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වැනි වගන්තියේ (3) වන උප වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 147 වැනි වගන්තිය සමග කියවිය යුතු 148 වැනි වගන්තිය යටතේ රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව රිදීමාලියද්ද ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2024 වර්ෂයේදී පහත උපලේඛනයෙහි I වන තීරුවේ නිරූපිත කිසියම් වාහනයක් හෝ සතෙකු තමා සන්තකයේ තබා ගන්නා සෑම තැනැත්තෙකුගෙන්ම එහි II වැනි තීරුවේ නිරූපිත බද්දක් පනවා අයකළ යුතු යැයි ද,

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 148 වැනි වගන්තියේ (3) වන උපවගන්තියේ ප්‍රකාරව වාහන හා සතුන් පිළිබඳ බද්දට යටත් සෑම තැනැත්තෙකු විසින්ම යථෝක්ත බද්ද 2024.03.31 දිනට ප්‍රථම ගෙවිය යුතු යැයි තීරණය කරමි.

අංකය	*විස්තරය*	*රු. ශත*
01	මෝටර් රථයක්, මෝටර් ට්‍රයි කාරයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, රික්ෂෝවක්, බයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහාම	25 0
02	වෙළෙඳ කාර්ය සඳහා යොදවන්නේ නම්	18 0
03	වෙළෙඳ නොවන කාර්ය සඳහා යොදවන්නේ නම්	4 0
04	බයිසිකලයක් සඳහා - බලපත්‍ර ගාස්තු	4 0
05	සෑම කරත්තයක් සඳහාම	20 0
06	සෑම අත් කරත්තයක් සඳහාම	10 0

අංකය	*විස්තරය*	*රු. ශත*
07	සෑම රික්ෂෝවක් සඳහාම	7 0
08	සෑම අශ්වයකු, පෝනියකු හා කොටළුවකු සඳහාම	15 0
09	සෑම ඇතෙකු, අලියකු සඳහාම	50 0

විශ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝද ඇති ළමා වාහන, විල් බැරෝ, හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළඳ කාර්යය සඳහා යොදවන අත් කරත්ත සහ වෙළෙඳ කාර්යය සඳහා නොයොදවන අත්කරත්ත මෙකී ගෙවීමෙන් නිදහස් කෙරේ.

මේ උපලේඛනයේ වෙළෙඳ කාර්යයන්ට, විකිණීම සඳහා හෝ අන්‍යාකාරයකින් හෝ යම් වෙළෙඳ ව්‍යාපාරයක් නැතහොත් කර්මාන්තයක් සඳහා වූ යම් ද්‍රව්‍ය හෝ බඩු හෝ යම් ලිඛිත නැතහොත් මුද්‍රිත ද්‍රව්‍ය ගෙන යාම හෝ ප්‍රවාහනය කිරීම ඇතුළත් වේ.

11 -455/3

රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාව

2024 වර්ෂයට අදාළව අක්කර බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වැනි වගන්තියේ (3) වන උප වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 134 වැනි වගන්තියේ (3) වන උප වගන්තියෙන් රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව අක්කර බදු පනවා අය කිරීමට 2023.09.25 දින තීරණ අංක 2023.09.25/143 යටතේ පහත දැක්වෙන තීරණය ගන්නා ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ආර්. එම්. නදීකා නිරෝෂිණි අබේකෝන්,
සභා ලේකම් හා බලතල කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී,
රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාව.

2023 සැප්තැම්බර් මස 25 වැනි දින,
රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාව,
ආඳාඋල්පත, උහරණිය.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වැනි වගන්තියේ (3) වන උප වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 134 වැනි වගන්තියේ (3) වන උප වගන්තියෙන් රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව රිදීමාලියද්ද ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටියා වූ ද, ස්ථිර හෝ නීතිපතා ගොවිතැන් කරන්නා වූ ද,

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 (1) වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව රිදීමාලියද්ද ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි අක්කර බද්දට යටත් සෑම ඉඩමකම 2023 වර්ෂයේ දී බලාත්මක සත්‍යාක්ෂණය 2024 වර්ෂයේ සත්‍යාක්ෂණය ලෙස පිළිගැනීමට ද,

(ආ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 (1) වන උප වගන්තියෙන් වැඩිදුරටත් සඳහන් විධිවිධාන යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ අංක 1811 දරන 2013.05.17 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* IV වන කොටසේ හා 1989.04.28 දිනැති *ගැසට් පත්‍රය* යටතේ අක්කර බද්ද නියම කිරීම හා අය කිරීමේ කාර්යය සඳහා විශේෂ ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කර ඇති රිදීමාලියද්ද ප්‍රාදේශීය සභා බල සීමාව ඇතුළත පිහිටියා වූ ද ස්ථිර හෝ නීතිපතා ගොවිතැන් කරන්නා වූද එක් එක් ඉඩම් හෙක්ටයාරය මත පහත දක්වා ඇති බදු අනුප්‍රමාණය නොඉක්මවන අක්කර බද්දක් පනවා අය කිරීමට තීරණය කරමි.

ඉඩම් ප්‍රමාණය	*බදු අනු ප්‍රමාණය වර්ෂයකට රු. ශත*
ඒ ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් පහකට අඩු නමුත් හෙක්ටයාර් එකකට නොඅඩු වන අවස්ථාවක	50 0 බැගින්
ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් පහක් හෝ ඊට වැඩි වන අවස්ථාවක එසේ වැඩිවන එක් හෙක්ටයාරයකට	10 0 බැගින්

(ඈ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (6) වන සහ (7) වන උපවගන්තිවලින් පැවරී ඇති බලතල ප්‍රකාරව යටොක්ත බද්ද 2024 වර්ෂයේ මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 යන දින වලින් අවසන් වන කාර්තු 04 කින් ප්‍රාදේශීය සභාවට ගෙවන ලෙස බද්දට යටත් වන සෑම තැනැත්තෙකුටම නියම කිරීමට විධානය කිරීමට ද,

යම් වාර්ෂික අක්කර බද්දක් එම වර්ෂයේ ජනවාරි මාසයේ 31 වැනි දින හෝ ඊට ප්‍රථම ගෙවුවහොත් එම වාර්ෂික බද්දේ ප්‍රමාණයෙන් 10% ක වට්ටමක් ද, එම බද්ද වාරිකවලින් ගෙවන අවස්ථාවක නම් එම බද්දේ වාරිකය අයවිය යුතු සෑම කාලසීමාවකම පළමුවන මාසය ඇතුළත ගෙවුවහොත් එම වාරිකයේ ප්‍රමාණයෙන් 5% ක වට්ටමක් ද සෑම බදුකරුවෙකුටම දිය යුතු යැයි තීරණය කරමි.

11 -455/4

රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා ප්‍රචාරක දැන්වීම්, දෘෂ්‍ය පරිශ්‍ර සඳහා ගාස්තු පැනවීම

තීරණය

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත 1989 අංක 12 දරන පළාත් සභා (අනුෂාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 262 වන අධිකාරය වූ 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තිය යටතේ ඌව පළාතේ පළාත් පාලන ඇමතිවරයාට පැවරී ඇති බලතල ප්‍රකාරව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1816/43 අංක දරන 2013.06.28 වැනි දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* IV (ඇ) කොටසේ ඌව පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යතුමා විසින් ප්‍රකාශයට පත්කොට ඇති රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාව වැළඳගෙන ඇති සම්මත අතුරු ව්‍යවස්ථාව අනුව එහි 17 වැනි කොටසේ විධිවිධාන ප්‍රකාරව රිදීමාලියද්ද ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කවර හෝ තැනැත්තෙකු විසින් කිසියම් ඉඩමක හෝ ගොඩනැගිල්ලක හෝ නිර්මිතයක ප්‍රදර්ශනය කරනු ලබන හා ජනතාවගේ දැන ගැනීම හෝ අවධානය පිණිස ප්‍රදර්ශනය කරන අලවන, සවිකරන, ඉදිකරන,එල්ලා තබන හෝ වෙනත් ආකාරයකින් ස්ථානගත කරනු ලබන ප්‍රචාරක කාර්යය සඳහා යොදාගනු ලබන හෝ කිසියම් අක්ෂර හෝ වචන හෝ රූප සටහන් හෝ ඇතුළත් වන ප්‍රචාරක දැන්වීමක් හෝ බැනරයක් හෝ කටවුට් එකක් හෝ කිසියම් ආකාරයක අනුරුවක් හෝ දැන්වීමක් හෝ නිවේදනයක් හෝ වෙළෙඳ දැන්වීමක් ද, විද්‍යුත් හෝ විදුලි බලය භාවිතයෙන් ප්‍රදර්ශනය කරන දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම වෙනුවෙන් පහත සඳහන් උපලේඛනයේ I වැනි තීරුවේ නිරූපිත විෂයාංක සීමාවන් ඇතුළත පවතින අවස්ථාවන් හි II හා III තීරුවේ සඳහන් ගාස්තු 2024 වර්ෂයේ පනවා අය කිරීමටත් සෑම ප්‍රචාරක දැන්වීම් අයදුම්කරුවෙක්ම එකී ගාස්තු, අවසර පත්‍රය ලබා ගැනීමට පෙර රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු අතර, අදාළ ප්‍රචාරක දැන්වීම් පළ කිරීමට දින 07 කට පෙර අවසර ලබාගත යුතු බවට හා ගලවා ඉවත් කරන ලද දැන්වීම් පුවරු හෝ බැනර් නැවත ලබා දීමේ දී 10% සේවා ගාස්තුවක් ගෙවිය යුතු යැයි 2023.09.25 දින තීරණ අංක 2023.09.25/144 යටතේ පහත දැක්වෙන තීරණය ගන්නා ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ආර්. එම්. නදීකා නිරෝෂිණි අබේකෝන්,
සභා ලේකම් හා බලතල කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාව.

2023 සැප්තැම්බර් මස 25 වැනි දින,
රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාව,
ආඳාඋල්පත, ඌරණිය.

අංකය	දැන්වීම් විස්තරය	I තීරුව අවසර පත්‍රය සඳහා ගාස්තුව II තීරුව මසකට හෝ ඉන් කොටසකට රු. ශත	III තීරුව වර්ෂයකට හෝ ඉන් කොටසකට රු. ශත
01.	කිසියම් බැම්මක හෝ පුවරුවක ප්‍රදර්ශනය කරන දැන්වීමකට (චිත්‍රපට දැන්වීම් හැර) සෑම වර්ග අඩියකටම	50 0	100 0
02.	පුද්ගලයෙක් විසින් ගෙන යනු ලබන, ගමන් කරනු ලබන වාහනයකට සවිකොට ඇති පුවරුවක අධාරකයක් මගින් ප්‍රචාරය කරනු ලබන බැනර් ආදිය (චිත්‍රපට දැන්වීම් හැර)		
	(අ) වර්ග අඩි 06 කට වැඩි නොවන ඕනෑම වර්ග අඩියකට	20 0	75 0
	(ආ) එම දැන්වීම් වර්ග අඩි 06 වැඩි සෑම අඩියකටම	30 0	100 0
03.	චිත්‍රපට දැන්වීම් ප්‍රචාරක දැන්වීම් සඳහා වර්ග අඩියකට	20 0	50 0
04.	ලී රාමුවක සවි කරන ලද කණ්ණාඩිවල හෝ ගස්වල ප්‍රදර්ශනය කරන ලද කුඩා වර්ගයේ දැන්වීම් පුවරුවකට සෑම වර්ග අඩියකට	40 0	55 0
05	කිසියම් පුද්ගලයෙක් හෝ පොදු නිවසක හෝ ගොඩනැගිල්ලක බිත්තියක, වහලයක, තාප්පයක, මහජනතාවට පෙනෙන පරිදි කිසියම් වෙළෙඳ ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය වීමට සැලැස්වීම සඳහා සෑම වර්ග අඩියකටම	50 0	100 0
06	කිසියම් වීථියක හෝ පාරකට යාව පිහිටි ගොඩනැගිල්ලක මුහුණතෙහි හෝ වෙළෙඳශාලා නාමපුවරු හෝ ගොඩනැගිල්ලෙහි සීමාව ඉක්මවා යන දිගකින් යුතු ප්‍රචාරක දැන්වීමක් සවි කිරීම නැතහොත් එල්ලා තැබීම (සෑම වර්ග අඩියකටම)	50 0	100 0

11 -455/5

රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා ගොඩනැගිලි සැළසුම් අනුමත කිරීමේ ගාස්තු පැනවීම

තීරණය

1915 අංක 19 දරන නිවාස හා නගර සංවර්ධන ආඥාපනතේ (පළාත් පාලන ආයතන ප්‍රධානියා) ලේකම්වරයාට/සභාපතිවරයාට ලැබී ඇති බලතල ප්‍රකාරව හා 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත 1989 අංක 12 දරන පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු (262 වන අධිකාරය වූ) 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තිය යටතේ පැවරී ඇති 1816/43 අංක දරන 2013.06.28 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* 4 (අ) කොටසේ උෆව පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යතුමා විසින් ප්‍රකාශයට පත් කොට ඇති රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාව පිළිගෙන ඇති සම්මත අතුරු ව්‍යවස්ථා මාලාවේ ii වන කොටසේ විධිවිධාන ප්‍රකාරව රිදීමාලියද්ද ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි මාර්ගයන් හි මධ්‍යයේ සිට දෙපසට අනුරූපි ප්‍රමාණයක් තුළ ගොඩනැගිලි තැනීම හා ඉදිකිරීම් පාලනය කිරීම සඳහා ගොඩනැගිලි හා ඉදිකිරීම් සැලසුම් හා සංවර්ධන සැළසුම් සභාව වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබා ගත යුතු බව විධානය කිරීමටත් 1 උපලේඛනය පරිදි පෙරසැරි ගාස්තු හා සංවර්ධන අවසරපත්‍ර ගාස්තු ප්‍රාදේශීය

සභාවට ගෙවිය යුතු යැයි 2023.09.25 දින තීරණ අංක 2023.09.25/145 යටතේ පහත දැක්වෙන තීරණය ගන්නා ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ආර්. එම්. නදීකා නිරෝෂිණි අබේකෝන්,
සභා ලේකම් හා බලතල කාර්ය කර්තව්‍ය
ක්‍රියාත්මක කිරීමේ නිලධාරී,
රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාව.

2023 සැප්තැම්බර් මස 25 වැනි දින,
රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාව,
ආඳාඋල්පත, ඌරණිය.

ප්‍රධාන මාර්ගයේ මධ්‍ය ලක්ෂ්‍ය රේඛාවේ සිට ගොඩනැගිලි සීමාව පහත පරිදි වේ.

වීථිරේඛා සීමාව (මීටර්)		*ගොඩනැගිලි සීමාව (මීටර්) (පහත ප්‍රමාණ තුළ ඇති සියලු ඉදිකිරීම් අනිවාර්යයෙන් අනුමත කළ යුතු වේ)*	
I. ඒ ශ්‍රේණියේ මාර්ග	16	I. ඒ ශ්‍රේණියේ මාර්ග	500
II. බී ශ්‍රේණියේ මාර්ග	13	II. බී ශ්‍රේණියේ මාර්ග	400
III. සී සහ ඩී ශ්‍රේණියේ මාර්ග	10	III. සී සහ ඩී ශ්‍රේණියේ මාර්ග	300
IV. අනෙකුත් මාර්ග	05	IV. අනෙකුත් මාර්ග	200

1 උපලේඛනය

සංවර්ධන කාර්යයේ ස්වභාවය	*අයකළ යුතු ගාස්තු*		
01. සංවර්ධන අවසර පත්‍ර නිකුත් කිරීම. (i) ඉඩම් අනු කොටස්වලට බෙදීම (අවම අනු බෙදුම පර්චස් 20 ක් (නේවාසික) විය යුතුය)	(i) පර්චස් 01 රු. 1,500.00 (වාණිජ නොවන)		
(ii) ඉඩම් අවම බෙදුම පර්චස් 10 ක් (වාණිජ)	(i) පර්චස් 01 රු. 3,000.00 (වාණිජ)		
(iii) ගොඩනැගිලි ඉදිකිරීම/පවත්නා ගොඩනැගිලිවලට අළුතින් කොටසක් එකතු කිරීම/නැවත ඉදිකිරීම	ගෙබිමේ විශාලත්වය	පදිංචිය සඳහා	වාණිජ/වෙනත් භාවිතය
	ච. මී. 50 ට අඩු	රු. 750 0	රු. 1,000 0
	ච. මී. 51-100	රු. 1000 0	රු. 2,500 0
	ච. මී. 101-150	රු. 1,500 0	රු. 3,000 0
	ච. මී. 151-250	රු. 1,750 0	රු. 4,000 0
	ච. මී. 251-450	රු. 2,000 0	රු. 6,000 0
	ච. මී. 451-700	රු. 2,500 0	රු. 8,000 0
	ච. මී. 701-900	රු. 3,000 0	රු. 10,000 0
	ච. මී. 901-1200	රු. 3,500 0	රු. 12,000 0
	ච. මී. 1,200 වැඩි	රු. 5,000 0	රු. 12,000 0
	ච. මී. 1201 ට වැඩි සෑම ච.මී 90ක් සඳහා රු. 1,000 බැගින් (පදිංචිය සඳහා)		
	ච. මී. 1201 ට වැඩි සෑම ච.මී 90ක් සඳහා රු. 1,250 බැගින් (වාණිජ)		
(iv) මායිම් තාප්ප/ ආරක්ෂක බැම් ඉදිකිරීම්	(iv) නේවාසික දික් මීටර් 1 ක් සඳහා	වාණිජ හා වෙනත් දික් මීටර් 1 ක් සඳහා	

සංවර්ධන කාර්යයේ ස්වභාවය	*අයකළ යුතු ගාස්තු*	
ගොඩනැගිලි සීමාවෙන් පිටත	රු. 300 0	රු. 400 0
ගොඩනැගිලි සීමාව තුළ	රු. 500 0	රු. 600 0
(v) ඉඩම්/ කුඹුරු ගොඩකිරීම	(v) වර්ග මීටර් 150 ට අඩු රු. 1,500 0 ක් සහ එයට වැඩි සෑම වර්ග මීටර් එකකටම රු. 100.00 බැගින්	
(vi) දුරකථන කුළුණු/ විදුලි සම්ප්‍රේෂණ කුළුණු ඉදිකිරීම	(vi) උස මීටර් 0-5 දක්වා රු. 150,000.000, 5-20 දක්වා රු. 300,000.00 ක් සහ වැඩිවන සෑම මීටර් එකකටම රු. 3000.00 බැගින්	
(vii) විශේෂ ව්‍යාපෘති සඳහා සංවර්ධන බලපත්‍ර නිකුත් කිරීම	(vii) කුඩා පරිමාණ සඳහා	රු. 5,000 0
	මධ්‍යම පරිමාණ සඳහා	රු. 10,000 0
	මහා පරිමාණ සඳහා	රු. 20,000 0
	ක්ෂේත්‍ර පරීක්ෂණ ගාස්තු	රු. 1,500 0
(viii) කළුගල්/තිරුවානා ගල් කැනීමේ ව්‍යාපෘති සඳහා අවසර පත්‍ර නිර්දේශ කිරීමේ වාර්තාවක් ලබා දීම සඳහා	(vii) පර්චස් 10 සිට පර්. 79 දක්වා	රු. 5,000 0
	පර්. 80 සිට අක්කර 01 දක්වා	රු. 7,500 0
	අක්කර 1 ට වැඩි	රු. 10,000 0
02. නේවාසික සඳහා වූ ඒකක වෙනස් කිරීම	ව.මී. 30 අඩු - රු. 500 0	
	ව.මී. 31-60 - රු. 750.00	
	61ට වැඩි වන එක් එක් ව.මී. සඳහා රු. 500 0 බැගින්	
03. අනුකූලතා සහතික නිකුත් කිරීම (සෑම ඉදි කිරීමක් සඳහාම සංවර්ධනයක් සඳහාම අනුකූලතා සහතිකයක් ලබා ගත යුතුය)	**අනුකූලතා සහතිකය ප්‍රදානය කිරීමේ ගාස්තු**	
(i) ඉඩම් අනු බෙදුම	(i) පළමු බිම් කොටසකට රු. 1,000 0 ක් සහ ඊට වැඩි වන සෑම බිම් කොටසකට රු. 500 0 බැගින්	
(ii) නේවාසික ඉදිකිරීම	(ii) වර්ග මීටර් 300ට අඩු රු. 3,000 0 සහ ඊට වැඩිවන සෑම වර්ග මීටර් එකකටම රු. 10 0 බැගින්	
(iii) වාණිජ හා වෙනත් ඉදිකිරීම්	(iii) වර්ග මීටර් 300ට අඩු රු. 3,000 0 සහ ඊට වැඩිවන සෑම වර්ග මීටර් එකකටම රු. 10 0 බැගින්	
(iv) මායිම් තාප්ප/ආරක්ෂක බැමි ඉදිකිරීම	(iv) පළමු දික් මීටර් 150ට අඩු රු 3,000 0 සහ එයට වැඩිවන සෑම දික් මීටර් එකකටම රු. 10 0 බැගින්	
(v) ඉඩම් කුඹුරු ගොඩකිරීම	(v) වර්ග මීටර් 150ට අඩු රු. 3,000 0 සහ ඊට වැඩිවන සෑම වර්ග මීටර් එකකටම රු. 20 0 බැගින්	
(vi) දුරකථන කුළුණු/ඇන්ටෙනා කුළුණු ඉදිකිරීම	(vi) රු. 10,000 0 (රුපියල් දහදාහක්)	
04. ආවරණ අනුමැතිය ලබාදීම	ආවරණ අනුමැතිය දීම සඳහා ගාස්තු	
(i) නිසි බලපත්‍රයක් නොමැතිව ඉඩම් අනු බෙදුම් කිරීම	එක් එක් බිම් කොටස සඳහා රු. 1,000 0 ගාස්තුවක්	

සංවර්ධන කාර්යයේ ස්වභාවය	*අයකළ යුතු ගාස්තු*	
(ii) නිසි සංවර්ධන බලපත්‍රයකින් තොරව ගොඩනැගිලි ඉදිකිරීම/කොටස් එකතු කිරීම/නැවත ඉදිකිරීම	නේවාසික ව. මී. 1 ක් සඳහා ගාස්තු	වාණිජ හා වෙනත් ව.මී. 1 ක් සඳහා ගාස්තු
අත්තිවාරම් වැඩ පමණක් (කයිරු මට්ටම) සම්පූර්ණ කොට ඇති විට	රු. 200 0	රු. 500 0
වහල මට්ටම දක්වා (වහලය රහිතව ඉදිකොට ඇතිවිට)	රු. 300 0	රු. 1,000 0
වහලය ඇතුළුව ඉදිකොට ඇති විට	රු. 400 0	රු. 1,500 0
සම්පූර්ණයෙන් ඉදිකොට ඇති විට	රු. 500 0	රු. 2,000 0
(iii) මායිම් තාප්ප/ආරක්ෂිත බැම්ම ඉදිකිරීම	රු. 400 0	රු. 400 0
(iv) ඉඩම් කුඹුරු ගොඩකිරීම සඳහා	සෑම ව. මී. 150 කට රු. 5,000 0 බැගින්	
(v) දුරකථන/විදුලි සංදේශ කුළුණු සඳහා	රු. 150,000 0 (රුපියල් එක් ලක්ෂ පනස්දහසක්)	
(vi) විශේෂ සංවර්ධන ව්‍යාපෘති	සෑම මිලියන 5කටම රු. 10,000 0 බැගින්	
(vii) අනුකූලතා සහතික නොමැතිව පදිංචිවීම/ භාවිත කිරීම හෝ ප්‍රයෝජනයට ගැනීම	එක් දිනකට රු. 50 0 බැගින්	
05. අයදුම්පත්‍ර සහ සහතික නිකුත් කිරීමේ ගාස්තු :		
(i) වීථි රේඛා අයදුම්පත්‍ර ගාස්තු	රු. 100 0	
සහතික පත්‍ර ගාස්තු	රු. 1,400 0	
(ii) නොපවරා ගැනීමේ අයදුම්පත්‍ර ගාස්තු	රු. 100 0	
සහතික පත්‍ර ගාස්තු	රු. 1,400 0	
(iii) ගොඩනැගිලි සැලසුම් අනුමැතියට අදාළ අයදුම්පත්‍ර ගාස්තු :		
වාණිජ නොවන	රු. 350 0	
වාණිජ	රු. 500 0	
(iv) සංවර්ධන බලපත්‍ර/නිවාස සැලසුම් කාලය දීර්ඝ කිරීම (වසරකට පමණක්)		
නේවාසික	රු. 500 0	
වාණිජ	රු. 1,000 0	
(v) දීර්ඝ කාලීන බදු බලපත්‍ර එකඟතා ලිපියක් නිකුත් කිරීම :		
නේවාසික	රු. 500 0	
වාණිජ	රු. 1,000 0	
(vi) පිඹුරුපත් අනුමත කිරීම් ගාස්තු	1,000 0	

සංවර්ධන කාර්යයේ ස්වභාවය	*අයකළ යුතු ගාස්තු*	
06. දීර්ඝ කාලීන බදු පදනම මත වගා ව්‍යාපෘති ඉඩම් සඳහා ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා නිර්දේශ වාර්තා ලබාදීම	කුඩා පරිමාණ සඳහා	රු. 5,000 0
	මධ්‍යම පරිමාණ සඳහා	රු. 10,000 0
	මහා පරිමාණ සඳහා	රු. 20,000 0
	ක්ෂේත්‍ර පරීක්ෂණ ගාස්තු	රු. 1,500 0
ඉහත සඳහන් එක් එක් කාරණයක් සඳහා පරීක්ෂණ ගාස්තුව රු. 1,000.00 බැගින් අය කෙරේ.		

11 -455/6

රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා ජල ගාස්තු පැනවීම

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වැනි වගන්තියේ (3) වන උප වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 122(1) වගන්තියේ පැවරී ඇති බලතල අනුව 1988.08.23 දින හා අංක 520/7 දරන පළාත් පාලන අති විශේෂ *ගැසට් පත්‍රයේ* IV(ආ) කොටසේ පළාත් පාලන නිවාස හා ඉදිකිරීම් අමාත්‍යවරයා විසින් ප්‍රකාශයට පත්කොට ඇති හා රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාව විසින් වැළඳගෙන ඇති එකී සම්මත අතුරු ව්‍යවස්ථාවේ 34 වන කොටසේ විධිවිධාන ප්‍රකාරව රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාව විසින් පවත්වාගෙන යනු ලබන ජල යෝජනා ක්‍රමයන්හි පහත උපලේඛන අංක I පරිදි ජල ගාස්තු රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට විධානය කිරීම සුදුසු යැයිද,

ඇකිරියන්කුඹුර හා කුරාලේවෙල ජල යෝජනා ක්‍රමයන්හි ජල සම්බන්ධතා ලබාදීමේදී ජල සම්බන්ධතා ලබා ගන්නා ජල පාරිභෝගිකයින්ගෙන්, සම්බන්ධතා ගාස්තු ලෙස රුපියල් දහදාහක (රු. 10,000.00) මුදලක් හා ඇප තැන්පත් ලෙස රුපියල් දෙදහසක (රු. 2,000.00) මුදලක් අයකර ගතයුතු යැයි 2023.09.25 තීරණ අංක 2023.09.25/146 යටතේ පහත දැක්වෙන තීරණය ගන්නා ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ආර්. එම්. නදීකා නිරෝෂිණී අබේකෝන්,
සභා ලේකම් හා බලතල කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී,
රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාව.

2023 සැප්තැම්බර් මස 25 වැනි දින,
රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාව,
ආඳාඋල්පත, ඌරණිය.

උපලේඛනය I

ගාස්තු අය කිරීම - ගෘහස්ථ

පරිහරණ ගාස්තුව

ඒකක ගණන	*ඒකකය රු .ශත*	*ස්ථාවර ගාස්තුව රු .ශත*
1 -05	18 0	250 0
6 - 10	23 0	250 0
11 - 15	33 0	250 0
16 - 20	68 0	250 0
21 - 25	100 0	250 0
26 - 30	145 0	250 0
31 - 40	160 0	250 0
41 - 50	165 0	250 0
51ට වැඩි	200 0	250 0

ගාස්තු අයකිරීම - වාණිජ

1 -05	120 0	320 0
6 - 10	120 0	320 0
11 - 15	120 0	320 0
16 - 20	120 0	320 0
21 - 25	120 0	320 0
26 - 30	120 0	320 0
31 - 40	120 0	320 0
41 - 50	120 0	320 0
51ට වැඩි	200 0	320 0

ගාස්තු අය කිරීම - රජයේ කාර්යාල

1 -05	50 0	300 0
6 - 10	50 0	300 0
11 - 15	50 0	300 0
16 - 20	50 0	300 0
21 - 25	55 0	300 0
26 - 30	55 0	300 0
31 - 40	60 0	300 0
41 - 50	75 0	300 0
51ට වැඩි	155 0	300 0

11 -455/7

රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා ඉඩම් විකිණීම මත ගාස්තු පැනවීම

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වැනි වගන්තියේ (3) වන උප වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 154(1) වගන්තියෙන් ලැබී ඇති බලතල ප්‍රකාරව රිදීමාලියද්ද ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ඉඩමක් වෙන්දේසිකරුවෙකු හෝ තැරැව්කරුවෙකු හෝ ඔහුගේ සේවකයකු හෝ අනු නියෝජිතයෙකු විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ හෝ අන්‍යාකාරයකින් විකුණනු ලබන අවස්ථාවක ඒ ඉඩම විකිණීමෙන් ලද මුදලින් 1%ක සමාන බද්දක් 2024 වර්ෂය තුළදී රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු යැයි 2023.09.25 දින තීරණ අංක 2023.09.25/147 යටතේ පහත දක්වෙන තීරණය ගන්නා ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ආර්. එම්. නදීකා නිරෝෂිණී අබේකෝන්,
සභා ලේකම් හා බලතල කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී,
රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාව.

2023 සැප්තැම්බර් මස 25 වැනි දින,
රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාව,
ආඳාඋල්පත, උඟරණිය.

11 -455/8

රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාව

2024 වර්ෂයේ දී වාහන, යන්ත්‍ර සූත්‍ර හා රැස්වීම් ශාලා කුලියට දීමේ ගාස්තු පැනවීම

යෝජනාව

රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාව විසින් 2023.09.25 දින තීරණ අංක 2023.09.25/148 යටතේ පහත දක්වෙන තීරණය ගන්නා ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ආර්. එම්. නදීකා නිරෝෂිණී අබේකෝන්,
සභා ලේකම් හා බලතල කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී,
රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාව.

2023 සැප්තැම්බර් මස 25 වැනි දින,
රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාව,
ආඳාඋල්පත, උඟරණිය.

අනු. අංකය	වාහනය/යන්ත්‍රය	ගාස්තුව	
		පැයකට රු. ශත	දිනකට රු. ශත
01	බැකෝ යන්ත්‍රය පැයකට		
	ඉන්ධන සහිතව	6,250 0	
	ඉන්ධන රහිතව	3,500 0	
	වැඩ නොකර තබාගන්නා දිනකට		4,500 0
02	රෝල (මාර්ග තලනය)		
	ඉන්ධන රහිතව (පැයකට)	1,750 0	
	වැඩ නොකර තබාගන්නා දිනකට		2,500 0
03	වැකර් යන්ත්‍රය - ඉන්ධන රහිතව		4,000 0
	වැඩ නොකර තබාගන්නා දිනකට		2,000 0
04	ට්‍රැක්ටර් ට්‍රේලරය සමග ඉන්ධන සහිතව පැයකට	2,000 0	11,000 0
	ට්‍රැක්ටරය සඳහා ඉන්ධන රහිතව		6,000 0
	ට්‍රැක්ටර් රොටරිය සඳහා	8,000 0	
	වැඩ නොකර තබාගන්නා දිනකට		2,000 0
05	කොන්ක්‍රීට් මැෂිම ක්‍රියාකරු සමග (ඉන්ධන රහිතව)		6,000 0
	ඇප තැන්පත් මුදල		2,500 0
	වැඩ නොකර තබාගන්නා දිනකට		2,000 0
06	ට්‍රැක්ටර් ජල බවුසරය එන්ජිම සහිතව (ලීටර් 3000)		
	ඉන්ධන රහිතව දිනකට කර්මාන්ත/වාණිජ කටයුත්තක දී		7,000 0
	ඉන්ධන සහිතව දිනකට වාණිජ කටයුතු සඳහා		11,000 0
	ට්‍රැක්ටර් ජල බවුසරය එන්ජිම රහිතව (ලීටර් 3000) දිනකට වානිජ නොවන කටයුතු සඳහා	1,000 0	
	වාණිජ කටයුත්තක දී - ඉන්ධන රහිතව දිනකට නොගන්නා අවස්ථාවේ දී පළමු කි.මී. 1 සඳහා රු. 1,000.00 ද, වැඩිවන සෑම කිලෝමීටරය සඳහා ම රු. 350.00 බැගින්		
	වැඩ නොකර තබාගන්නා දිනකට		2,000 0
07	ලොරි බවුසරය - (ලීටර් 6000) පළමු කි. මී. 1 සඳහා රු. 2,000 0 ද, වැඩිවන සෑම කිලෝමීටරය සඳහාම රු. 350 0 බැගින් (දිනකට නොගන්නා අවස්ථාවේ දී)		
	ඉන්ධන රහිතව රියදුරු සමග - දිනකට		11,000 0
	ඉන්ධන සහිතව රියදුරු සමග - දිනකට (පැය 06 සඳහා)		18,500 0
	වැඩ නොකර තබාගන්නා දිනකට		4,500 0
08	ටිපර් රථය - ඉන්ධන සහිතව රියදුරු සමග දිනකට උපරිම කි.මී. 100ක් සඳහා වන අතර වැඩිවන සෑම කිලෝමීටරය සඳහාම රු. 350 0 බැගින් අය කෙරේ		23,500 0
	(දිනකට කුලියට ලබා නොගන්නා අවස්ථාවේ දී, පළමු කි.මී. 1 සඳහා රු. 2,000.00ද, වැඩිවන සෑම කිලෝමීටරය සඳහාම රු. 350.00 බැගින්)		
	ඉන්ධන රහිතව රියදුරු සමග දිනකට		12,000 0
	වැඩ නොකර තබාගන්නා දිනට		4,500 0

අනු. අංකය	වාහනය/යන්ත්‍රය	ගාස්තුව: පැයකට රු. ශත	ගාස්තුව: දිනකට රු. ශත
09	කෘ කැබ් රථය - ඉන්ධන සහිතව රියදුරු සමග දිනකට (පළාත තුල) උපරිමය කි.මී. 100ක් සඳහා වන අතර මින් වැඩිවන සෑම කිලෝමීටරයක් සඳහා රු. 260.00 බැගින් අය කෙරේ		15,000 0
	ඉන්ධන රහිතව රියදුරු සමග දිනකට		12,000 0
	වැඩ නොකර තබාගන්නා දිනකට		4,500 0
10	කොකු නගුල භාවිත කිරීම - ප්‍රවාහනය කිරීම සඳහා ඉන්ධන සහිතව කි.මී. 1 සඳහා රු. 300.00 (යාමට සහ ඒමට යන දෙකටම)	4,500 0	
	ඩිස් නගුල භාවිතය ප්‍රවාහනය කිරීම සඳහා ඉන්ධන සහිතව කි.මී. 1 සඳහා රු. 300.00 (යාමට සහ ඒමට යන දෙකටම)	4,000 0	
	වල්කපන මැෂිම භාවිතය (දිනක් සඳහා)	7,000 0	
	දම්වැල් කියත කුලියට දීම (දිනකට පැය 8 ඉන්ධන හා ක්‍රියාකරු සමග)	6,000 0	
	ඇප තැන්පත් මුදල	2,500 0	
11	රැස්වීම් ශාලා කුලියට දීම : අඳාඋල්පත පිහිටි ප්‍රාදේශීය සභා කාර්යාලයේ රැස්වීම් ශාලාව ප්‍රජාව සඳහා දිනකට		5,000 0
	වෙළෙඳ ප්‍රචාරක හෝ පුහුණු වැඩ සටහන් සඳහා දිනකට		7,500 0
	ශ්‍රවණාගාරයට ඉදිරිපස ශාලාව සඳහා දිනකට		2,000 0

11 -455/9

රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාව

2024 වර්ෂයේ සේවා සඳහා කුලී හා ගාස්තු අය කිරීම

තීරණය

රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාව විසින් 2023.09.25 වැනි දින තීරණ අංක 2023.09.25/149 යටතේ පහත දැක්වෙන තීරණය ගන්නා ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ආර්. එම්. නදීකා නිරෝෂිණි අබේකෝන්,
සභා ලේකම් හා බලතල කාර්ය කර්තව්‍ය
ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාව.

2023 සැප්තැම්බර් මස 25 වැනි දින,
රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාව,
ආඳාඋල්පත, උහරණිය.

අ.අ	*සේවාව*	*ගාස්තුව රු. ශත*
01	ගැල්වනයිස් බට කුලියට දීම - දිනකට එක් බටයක් සඳහා	30 0
02	වැහි ආවරණ කුටි කුලියට දීම - දිනකට එක් කුටියක් සඳහා	250 0
03	ජල ටැංකි කුලියට දීම - දිනකට එක් ජල ටැංකියක් සඳහා (රඳවනය සමග)	200 0
04	දම්වැල් කියත කුලියට දීම - ඉන්ධන හා ක්‍රියාකරු සමග දිනකට (පැය 8)	6,000 0
	දම්වැල් කියත සඳහා ඇප තැන්පත් මුදල	2,500 0
05	අනු පිටපතක් සඳහා - සහතික/කුවිතාන්සි/බලපත්‍ර	50 0
06	බස් රථයක් සභාවේ ලියාපදිංචි වීම සඳහා සාමාජික ගාස්තු	3,000 0
07	සභාවේ ලියාපදිංචි බස්රථයක් සඳහා මසකට ගාස්තු	200 0
08	වෑන් රථයක් සභාවේ ලියාපදිංචි වීම සඳහා සාමාජික ගාස්තු	2,000 0
09	සභාවේ ලියාපදංචි වෑන් රථයක් සඳහා මසකට ගාස්තු	200 0
10	ත්‍රිරෝද රථයක් සභාවේ ලියාපදිංචි වීම සඳහා සාමාජික ගාස්තු	1,000 0
11	සභාවේ ලියාපදිංචි ත්‍රිරෝද රථයක් සඳහා මාසික ගාස්තු	100 0
12	සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම සඳහා එක් භාණ්ඩ කාණ්ඩයක් සඳහා ලියාපදිංචි වීම වෙනුවෙන්	750 0
13	නල ළිං සඳහා ගාස්තුව :	
	වාර්ෂික ගාස්තුව	600 0
	නළ ළිඳ පෞද්ගලිකව පරිහරණයට ගන්නා විට	2,500 0
14	ජල අයදුම්පත්‍ර ගාස්තු	100 0

මාර්ගය පළුදු කර ජල නළ එලීම :

01	මාර්ග උරහිස පළුදු කිරීම සඳහා ගාස්තු	වර්ග අඩි 01 සඳහා රු. 150.00 බැගින්
02	මාර්ග හරහා පළුදු කිරීම :	
	තාර/කාපට් මාර්ග සඳහා	වර්ග අඩි 01 සඳහා රු. 350.00 බැගින්
	කොන්ක්‍රීට් මාර්ග සඳහා	වර්ග අඩි 01 සඳහා රු. 300.00 බැගින්
	කුට්ටිගල් මාර්ග සඳහා	වර්ග අඩි 01 සඳහා රු. 250.00 බැගින්
	බොරළු පාර සඳහා	වර්ග අඩි 01 සඳහා රු. 200.00 බැගින්
03	ආපසු ගෙවන ඇප තැන්පත් මුදල	රු. 3,000.00

පුස්තකාල භාවිතය වෙනුවෙන් :

පුස්තකාල සඳහා ඇප තැන්පත්	*ගාස්තුව (රු. ශත)*
බල ප්‍රදේශය තුළ	නැත
බල ප්‍රදේශයෙන් පිට සාමාජිකත්වය සඳහා	2,000 0

පුස්තකාල වාර්ෂික සාමාජික ගාස්තු :

	රු. ශත
වැඩිහිටි	150 0
ළමා	100 0
පුස්තකාල සාමාජික ඉල්ලුම්පත්‍ර ගාස්තු	20 0
පුස්තකාල පොතක් සඳහා දිනකට අයකරන දඩ මුදල (ලැබීම ප්‍රමාදවන දිනක් සඳහා)	5 0
නැති වූ පුස්තකාල පොත් සඳහා	පොතේ වටිනාකම මෙන් දෙගුණයක් හා 25% ක ගාස්තුවක් අයකරනු ලැබේ.
පරිගණක අංශය සඳහා ඇතුලත්වීමේ සාමාජික ගාස්තු	500 0
ඩිජිටල් සාමාජික කාඩ්පත් සඳහා ගාස්තු	300 0

11-455/10

රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාව

2024 වර්ෂයේ ප්‍රාදේශීය සභාව සතු මාර්ග භාවිතය සඳහා ගාස්තු පැනවීම

තීරණය

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත 1989 අංක 12 දරන පළාත් සභා (අනුෂාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු (262 වන අධිකාරය වූ) එකී පනතේ 2 වන වගන්තිය යටතේ උඟව පළාතේ පළාත් පාලන විෂයභාර අමාත්‍යතුමා විසින් අංක 1816/43 හා 2013 ජුනි මස 28 වැනි දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ *ගැසට් පත්‍රයේ* iv (ඇ) කොටස මඟින් ප්‍රකාශයට පත් කර ඇති හා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වන වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 126 වන වගන්තිය යටතේ රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවේ 07 වන කොටසේ විධිවිධාන ප්‍රකාරව රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාවට අයත් මාර්ග භාවිතය වෙනුවෙන් උපලේඛනයේ පරිදි අවසර පත්‍ර සඳහා ගාස්තු රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට සහ මාර්ග භාවිතා කිරීමේ දී යොදාගත යුතු උපරිම වේගසීමාව පහත සඳහන් පරිදි විය යුතු යැයි 2023.09.25 දින තීරණ අංක 2023.09.25/150 යටතේ පහත දැක්වෙන තීරණය ගන්නා ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ආර්. එම්. නදීකා නිරෝෂිණී අබේකෝන්,
සභා ලේකම් හා බලතල කාර්ය කර්තව්‍ය
ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාව.

2023 සැප්තැම්බර් මස 25 වැනි දින,
රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාව,
ආඳාඋල්පත, උඟරණිය.

තීරණය

ගල්/ වැලි/ග්‍රැවල්/දැව ප්‍රවාහනය සම්බන්ධයෙන් රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාව සතු මාර්ග භාවිතා කිරීම වෙනුවෙන් පහත සඳහන් ගාස්තු අය කිරීමට මම තීරණය කරමි.

(1) වැලි හා ගල් කියුබ් 50 හෝ ඊට වඩා අඩු රු. 4,000 0 (මාසිකව)
(2) වැලි හා ගල් කියුබ් 100 ක් සඳහා රු. 5,000 0 (මාසිකව)
(3) වැලි හා ගල් කියුබ් 150 ක් සඳහා රු. 6,000 0 (මාසිකව)
(4) වැලි හා ගල් කියුබ් 210 ක් සඳහා රු. 7,500 0 (මාසිකව)
(5) ප්‍රවාහනය කරන ග්‍රැවල් කියුබ් 01 ක් සඳහා රු. 50 0 (මාසිකව)
(6) දැව ප්‍රවාහන සඳහා මාර්ග භාවිතය එක් බලපත්‍රයක් වෙනුවෙන් පමණක් රු. 1,500 0 (කියුබික් මීටර් 100ට අඩු/විශේෂ ව්‍යාපෘති සඳහා මෙම මුදල වෙනස් වේ.)

මාර්ගය	*වේග සීමාව*	*බර සීමාව*
කුඩාඔය මාර්ගය	30kmph	කියුබ් 01 ලොරි - ටොන් 7
කොලේයාය ඉකිරියගොඩ මාර්ගය	30kmph	කියුබ් 01 ලොරි - ටොන් 7
කටුකුඹුරන මාර්ගය	30kmph	කියුබ් 01 ලොරි - ටොන් 7
කටුකුඹුරන සිට කන්නල්කුඹුර වේවත්ත	30kmph	කියුබ් 01 ලොරි - ටොන් 7
නුගවෙල කුඩාඔය මාර්ගය	30kmph	කියුබ් 01 ලොරි - ටොන් 7
වෙළම්පැල 05 කණුව මාර්ගය	30kmph	කියුබ් 01 ලොරි - ටොන් 7
මකුලැස්ස මාර්ගය	30kmph	කියුබ් 01 ලොරි - ටොන් 7

11 -455/11

රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාව

2024 වර්ෂයේ ප්‍රචාරක හා වෙළෙඳ ප්‍රවර්ධන කටයුතු සඳහා ගාස්තු පැනවීම

තීරණය

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු (262 වන අධිකාරය වූ) 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තිය යටතේ ඌව පළාතේ පළාත් පාලන විෂය භාර අමාත්‍යතුමා විසින් අංක 1816/43 හා 2013 ජුනි මස 28 වැනි දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ***අති විශෙෂ ගැසට් පත්‍රයේ*** iv (අ) වැනි කොටස මගින් ප්‍රකාශයට පත් කර ඇති හා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වන වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 126 වන වගන්තිය යටතේ රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවේ 04 වැනි කොටසේ විධිවිධාන ප්‍රකාරව රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාවට අයත් ක්‍රීඩාපිටි හා විවෘත භූමි භාග භාවිතය වෙනුවෙන් පහත උපලේඛනයේ පරිදි අවසර පත්‍ර සඳහා ඇප තැන්පත් හා ගාස්තු රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු යැයි 2023.09.25 දින තීරණ අංක 2023.09.25/151 යටතේ පහත දැක්වෙන තීරණය ගන්නා ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ආර්. එම්. නදීකා නිරෝෂිණී අබේකෝන්,
සභා ලේකම් හා බලතල කාර්ය කර්තව්‍ය
ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාව.

2023 සැප්තැම්බර් මස 25 වැනි දින,
රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාව,
ආඳාඋල්පත, ඌරණිය.

උපලේඛනය

කාරණය	*දිනක ගාස්තුව*	*ඇප තැන්පත්*
	රු. ශත	*රු. ශත*
වෙළෙඳ ප්‍රචාරක කටයුත්තක් සඳහා	3,000 0	2,500 0
අනෙකුත් ප්‍රචාරක කටයුතු / දේශන සඳහා	2,500 0	1,500 0
විනෝද කටයුතු සඳහා	2,000 0	1,500 0

11 -455/12

රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාව

2024 විනෝද බදු අය කිරීම සඳහා ගාස්තු පැනවීම

තීරණය

විනෝද බදු ආඥාපනතේ 2 වන වගන්තිය යටතේ සෑම චිත්‍රපටි දර්ශනයක් හා සෑම සංගීත සංදර්ශනයක් සඳහාම මුද්‍රණය කරන ලද ප්‍රවේශපත්‍රවල වටිනාකමින් 10%ක මුදලක් ගෙවිය යුතුය. මීට අමතරව (176 වන වගන්තිය) ප්‍රසිද්ධ රඟ දැක්වීම් ආඥාපනතේ 3 වන වගන්තිය යටතේ ඉහත සඳහන් සංදර්ශනයක් වෙනුවෙන් දිනකට රු. 500 0 ක බලපත්‍ර ගාස්තුවක් ගෙවිය යුතු යැයි 2023.09.25 දින තීරණ අංක 2023.09.25/152 යටතේ පහත දැක්වෙන තීරණය ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ආර්. එම්. නදීකා නිරෝෂිණි අබේකෝන්,
සභා ලේකම් හා බලතල කාර්ය කර්තව්‍ය
ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාව.

2023 සැප්තැම්බර් මස 25 වැනි දින,
රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාව,
ආඳාඋල්පත, ඌරණිය.

11 -455/13

රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාව

2024 සුසාන භූමි සඳහා ගාස්තු පැනවීම

රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාව විසින් 2023 සැප්තැම්බර් මස 25 දින තීරණ අංක 2023.09.25/153 යටතේ පහත දැක්වෙන තීරණය ගන්නා ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ආර්. එම්. නදීකා නිරෝෂිණි අබේකෝන්,
සභා ලේකම් හා බලතල කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාව.

2023 සැප්තැම්බර් මස 25 වැනි දින,
රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාව,
ආඳාඋල්පත, ඌරණිය.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 127 වගන්තිය සමග කියවිය යුතු සුසාන භූමි ආඥාපනතේ 3 වන වගන්තියේ කාර්යය සඳහා එකී ආඥා පනතේ ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව රිදීමාලියද්ද ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටා ඇති සුසාන භූමිවල ස්මාරක ඉදිකිරීම සඳහා පහත සඳහන් ආකාරයට ගාස්තු පනවා අයකිරීමට තීරණය කරමි.

උපලේඛනය

01. එක් මෘත දේහයක් භූමදානය කිරීම සඳහා - නිදහස්
02. එක් මෘත දේහයක් තැන්පත් කිරීම සඳහා - රු. 5,000.00
03. සමරු පිළිරුවක් ඉදිකිරීම සඳහා වර්ග අඩියකට - රු. 1,000.00

11 -455/14

රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාව

2024 අයාලේ යන ගවයන් ඇල්ලීම වෙනුවෙන් ගාස්තු පැනවීම

තීරණය

06	ප්ලාස්ටික් පුවරු හෝ ෆයිබර් පුවරු මගින් කරනු ලබන ප්‍රචාරක දැන්වීම්	1 ට අඩු	250 0	350 0	500 0
		1 ට වැඩි	එකට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 200 බැගින්		
07	විද්‍යුත් උපකරණ යොදාකරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා	1 ට අඩු	750 0	850	1,000 0
		1 ට වැඩි	එකට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 500 0 බැගින්		

11 - 485/8

බුලත්සිංහල ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා අයාලේ යන ගවයින් පිළිබඳ බදු පැනවීම

බුලත්සිංහල ප්‍රාදේශීය සභාවේ ලේකම් හා කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි ලලනි දීපිකා උඩුමුල්ල වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 150(1) වන වගන්තියෙහි විධි විධාන ප්‍රකාරව බුලත්සිංහල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2024 වර්ෂයට අදාලව අයාලේ යන ගවයන් පිළිබඳ බදු පැනවීමට තීරණ අංක 609 යටතේ තීරණය කරමි.

ලලනි දීපිකා උඩුමුල්ල,
ලේකම් හා සභාවේ බලතල කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි
ප්‍රාදේශීය සභාව,
බුලත්සිංහල.

2023 ඔක්තෝබර් මස 08 වැනි දින,
බුලත්සිංහල ප්‍රාදේශීය සභාවේ දී ය.

තීරණය

බුලත්සිංහල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ප්‍රසිද්ධ මංමාවත් වල අයාලේ යන ගවයන් මහජනතාවට විවිධ දේපල හානි හා ආපදාවන් සිදුවන බැවින් ඒවා වැලැක්වීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත යටතේ 66(1), (2), (3) වගන්ති ප්‍රකාරව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර කටයුතු කිරීමටත් ඒ සඳහා අංක 01 උපලේඛනයේ සඳහන් ගාස්තු අය කිරීමටත් තීරණය කරමි.

උපලේඛනය 01

		රු. ශත
(අ)	අයාලේ යන එක් ගවයෙකු සඳහා එක් දිනකට	500 0
(ආ)	වැඩි වන සෑම දිනකටම	100 0 බැගින්

(ඇ) අල්ලන ගවයෙකු දින 10ක් ඇතුළත අයිතිකරු විසින් නිදහස් කරගනු නොලැබුණහොත් සභාව මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා එම මුදල් සභා අරමුදලට යොදවනු ලැබේ.

11 - 485/9

බුලත්සිංහල ප්‍රාදේශීය සභාව

2024 වර්ෂයට අදාලව ඇතැම් ඉඩම් විකිණීම මත බදු පැනවීම

බුලත්සිංහල ප්‍රාදේශීය සභාවේ ලේකම් හා කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි ලලනි දීපිකා උඩුමුල්ල වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154(1) වගන්තිය 2024 වර්ෂය සඳහා ඉඩම් විකිණීම මත බදු පැනවීමට තීරණ අංක 610 යටතේ තීරණය කරමි.

ලලනි දීපිකා උඩුමුල්ල,
ලේකම් හා සභාවේ බලතල කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි
ප්‍රාදේශීය සභාව,
බුලත්සිංහල.

2023 ඔක්තෝබර් මස 08 වැනි දින,
බුලත්සිංහල ප්‍රාදේශීය සභාවේ දී ය.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154(1) වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර බුලත්සිංහල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2024 වර්ෂය තුළ යම් ඉඩමක් වෙන්දේසි කරුවෙකු හෝ තැරැව්කරුවෙකු හෝ ඔහුගේ සේවකයෙකු හෝ අනුයෝජිතයා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ හෝ අන් ආකාරයකින් විකුණනු ලබන අවස්ථාවක ඒ ඉඩම විකිණීමෙන් ලත් මුදලින් 1% කට සමාන බද්දක් විකුණුම්කරු හෝ ඔහුගේ සේවකයා හෝ අනුයෝජිතයා ගෙන් බුලත්සිංහල ප්‍රාදේශීය සභාවට ඉඩම් විකිණීම මත බදු අය කර ගැනීමට තීරණය කරමි.

11 - 485/10

බුලත්සිංහල ප්‍රාදේශීය සභාව

විනෝද බදු පැනවීම

බුලත්සිංහල ප්‍රාදේශීය සභාවේ ලේකම් හා කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි ලලනි දීපිකා උඩුමුල්ල වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව බුලත්සිංහල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ විනෝද බදු පැනවීමට තීරණ අංක 611 යටතේ තීරණය කරමි.

ලලනි දීපිකා උඩුමුල්ල,
ලේකම් හා සභාවේ බලතල කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි
ප්‍රාදේශීය සභාව,
බුලත්සිංහල.

2023 ඔක්තෝබර් මස 08 වැනි දින,
බුලත්සිංහල ප්‍රාදේශීය සභාවේ දී ය.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර බුලත්සිංහල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මුදල් අය කර පෙන්වනු ලබන චිත්‍රපටි දර්ශන, සංගීත ප්‍රසංග, නාට්‍ය, මැජික් දර්ශන, සර්කස් දර්ශන, රජයේ අනුමත වීඩියෝ දර්ශන යනාදී ඕනෑම දර්ශනයක් නැරඹීම සඳහා ප්‍රේක්ෂකයකු වෙත නිකුත් කරනු ලබන ප්‍රවේශපත්‍රවල වටිනාකමින් 10%ක විනෝද බද්දක් බුලත්සිංහල ප්‍රාදේශීය සභාවට එම දර්ශන පෙන්වනු ලබන්නා විසින් ගෙවිය යුතු බවට තීරණය කරමි. පුණ්‍ය කටයුතු හෝ පොදු සංවර්ධන කටයුතු සඳහා පෙන්වනු ලබන දර්ශන පිළිගත හැකි සාක්ෂි මත බද්දෙන් නිදහස් කරනු ලැබේ. මෙම විනෝද බද්ද පනවා අය කිරීමට තීරණය කරමි.

11 - 485/11

බුලත්සිංහල ප්‍රාදේශීය සභාව

2024 වර්ෂයට අදාළව සංවර්ධනය නොකළ ඉඩම් මත බදු පැනවීම

බුලත්සිංහල ප්‍රාදේශීය සභාවේ ලේකම් හා කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි ලලනි දීපිකා උඩුමුල්ල වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 153 වගන්තියේ (1) ඡේදය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර බුලත්සිංහල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ඇති සංවර්ධනය නොකළ ඉඩම් මත පහත දැක්වෙන ආකාරයේ වාර්ෂික බද්දක් 2024 වර්ෂය සඳහා පනවා අය කිරීමට තීරණ අංක 612 යටතේ තීරණය කරමි.

ලලනි දීපිකා උඩුමුල්ල,
ලේකම් හා සභාවේ බලතල කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
ප්‍රාදේශීය සභාව,
බුලත්සිංහල.

2023 ඔක්තෝබර් මස 08 වැනි දින,
බුලත්සිංහල ප්‍රාදේශීය සභාවේ දී ය.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 153 වගන්තියේ (1) ඡේදය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර බුලත්සිංහල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ඇති සංවර්ධනය නොකළ ඉඩම් මත පහත දැක්වෙන ආකාරයේ වාර්ෂික බද්දක් 2024 වර්ෂය සඳහා පනවා අය කිරීමට තීරණය කරමි.

ඒ අනුව ගෙවිය යුතු වාර්ෂික බද්දේ ප්‍රමාණය එකී සංවර්ධනය නොකළ ඉඩමේ ප්‍රාග්ධන බිම් අගයෙන් 1%ක් විය යුතු ය. මේ බද්ද අයකිරීම සඳහා එකී පනතේ 153 (1) (ආ) ඡේදය යටතේ වන "සමානුපාතය" යන්නෙන් යම් ඉඩමක සම්පූර්ණ ඉඩමේ බිම් ප්‍රමාණය, එම ඉඩමේ ගොඩනැගිලිවලින් හෝ ස්ථිර නැතහොත් නිරන්තර වගාවකින් ආවරණය වූ බිම් ප්‍රමාණය අතර අනුපාතය 2:1 විය යුතු බවට හා ඊට අඩු සමානුපාතය සහිත යම් ඉඩමක් සංවර්ධනය නොකළ ඉඩමක් යනුවෙන් ද සළකනු ලැබේ.

11 - 485/12

බුලත්සිංහල ප්‍රාදේශීය සභාව

2024 වර්ෂයට අදාළව සැරසිලි විධිමත් කිරීම සඳහා ගාස්තු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122(1) වැනි වගන්තිය යටතේ බුලත්සිංහල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව 2015 දෙසැම්බර් මස 28 වන දින අංක 1947/6 හා 1976/21 දරන 2016/07/20 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍ර පළාත් සභා අති විශෙෂ *ගැසට් පත්‍රයේ* පළකර ඇති සම්මත අතුරු ව්‍යස්ථාවේ සැරසිලි විධිමත් කිරීම පිළිබඳ අතුරු

ව්‍යවස්ථාවේ ප්‍රකාරව බුලත්සිංහල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පහත 2 උපලේඛනයේ සඳහන් සැරසිලි විධිමත් කිරීම සඳහා ගාස්තු 2024 වර්ෂය සඳහා පනවා අයකළ යුතු බවට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය අනුව තීරණ අංක 615 යටතේ තීරණය කරමි.

ලලනි දීපිකා උඩුමුල්ල,
ලේකම් හා සභාවේ බලතල කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
ප්‍රාදේශීය සභාව,
බුලත්සිංහල.

2023 ඔක්තෝබර් මස 08 වැනි දින,
බුලත්සිංහල ප්‍රාදේශීය සභාවේ දී ය.

02 වැනි උපලේඛනය

1. සැරසිලි සඳහා ගාස්තුව
   වර්ග මීටර් 500 දක්වා රු.1000 0
   වැඩිවන සෑම වර්ග මීටරයක් සඳහා රු. 200 0 බැගින් අය කෙරේ.

සැරසිලි ඉවත් කර ගැනීමට නියමිත කාලය ඉක්මවා ඉවත් නොකරන්නේ නම් ඒ සඳහා ශ්‍රමික ගාස්තු වශයෙන් දිනකට රු.1000 0 බැගින් අය කෙරේ.

11 - 485/13

බුලත්සිංහල ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා සේවා ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ පැවරී ඇති බලතල ප්‍රකාරව බුලත්සිංහල ප්‍රාදේශීය සභා සේවාවන් සඳහා පහත උපලේඛනයේ සඳහන් ගාස්තු 2024 වර්ෂය සඳහා ක්‍රියාත්මක විය යුතු බවට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය අනුව තීරණ අංක 613 යටතේ තීරණය කරමි.

ලලනි දීපිකා උඩුමුල්ල,
ලේකම් හා සභාවේ බලතල කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි
ප්‍රාදේශීය සභාව,
බුලත්සිංහල.

2023 ඔක්තෝබර් මස 17 වැනි දින,
බුලත්සිංහල ප්‍රාදේශීය සභාවේ දී ය.

අයදුම්පත්‍ර ගාස්තු :

		රු. ශත
1.	පුස්තකාල සාමාජික අයදුම්පත් ගාස්තු	50 0
2.	පුස්තකාල සාමාජික ගාස්තු අලුත් කිරීම	50 0
3.	ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමේ අයදුම්පත්	1,500 0
4.	ඉඩම් අනුබෙදුම් සඳහා සංවර්ධන බලපත්‍රයක් ලබා ගැනීම සඳහා වන අයදුම්පත්‍රය	1,000 0
5.	අනතුරුදායක ගස් කපා ඉවත් කිරීමේ අයදුම්පත්‍රය	500 0
6.	නොපවරාගැනීමේ සහතික ලබා ගැනීම් ඉල්ලුම්පත්‍රය	100 0
7.	වීථිරේඛා සහතික ලබා ගැනීමේ ඉල්ලුම්පත්‍රය	1,000 0

	රු. ශත
8. සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ ඉල්ලුම්පත්‍ර	100 0
9. ක්‍රීඩාපිටිය වෙන් කිරීම සඳහා ඉල්ලුම්පත්‍ර ගාස්තු	100 0
10. පෙර පාසල් අයදුම්පත්‍ර ගාස්තු	200 0
11. වරිපනම් ලේඛනයේ නම සංශෝධනය කිරීමේ පෝරම ගාස්තු	200 0
12. වරිපනම් ලේඛනයේ නම සංශෝධනය කිරීමේ තක්සේරු ගාස්තු	200 0
13. සැරසිලි විධිමත් කිරීම සඳහා වන අයදුම්පත්‍ර ගාස්තු	100 0

සහතික ගාස්තු :

	රු. ශත
1. දේපළ හිමිකම් සහතික ගාස්තු	750 0
2. තක්සේරු දැන්වීමේ පිටපතක් නැවත නිකුත් කිරීමේ ගාස්තු	250 0
3. වීථිරේඛා සහතික ගාස්තු	1,000 0
4. නොපවරාගැනීමේ සහතික	1,000 0
5. වරිපනම් නොගෙවන බවට සහතික නිකුත් කිරීම	500 0
6. වෙනත් සහතික ගාස්තු	500 0

වෙනත් ගාස්තු :

1. පා පැදි බලපත්‍ර ගාස්තු - රු. 100 0
2. ත්‍රී රෝද රථ නැවතුම්පල බලපත්‍ර ගාස්තු - රු. 500.00
3. ටොන් 01ක ප්‍රමාණයේ තලන යන්ත්‍රය කුලියට දීම සඳහා ගාස්තු ක්‍රියාකරු සමග පැය 8කට දිනකට රු. 10,000 0
4. ගොඩැනැගිලි කාලය දීර්ඝ කිරීමේ ගාස්තු වර්ෂයකට ව.මී. 1000 දක්වා - රු. 5,000 0
5. ප්‍රාදේශීය සභා මාර්ගයක්/ප්‍රාදේශීය සභාව මගින් නඩත්තු කරන මාර්ගයක් ලෙස වාර්තාවක් ලබාදීමට ගාස්තුව - රු. 1,000 0
6. පිඹුරුපත් අනුමත කිරීම සඳහා පෙරසැරි ගාස්තු

පිඹුරුපතේ ප්‍රමාණය	*පෙරසැරි ගාස්තුව*
වර්ග මීටර් 150 - 300 දක්වාට අඩු	රු. 1,000 0
වර්ග මීටර් 301 - 600 දක්වා	රු. 800 0
වර්ග මීටර් 601 - 900 දක්වා	රු. 600 0
වර්ග මීටර් 900 ට වැඩි	රු. 500 0

7. අනුමත පිඹුරු පිටපත් / සැලසුම් පිටපත් ලබා දීමට ඡායා පිටපත් ගාස්තු A4 - A3	රු. 500 0
අනුමත පිඹුරු පිටපත් / සැලසුම් පිටපත් ලබා දීමට ඡායා පිටපත් ගාස්තු A3 - A0	රු. 1,000 0
8. පුස්තකාල සාමාජික ගාස්තු	රු. 150 0

පරිසර බලපත්‍ර පරීක්ෂණ ගාස්තු :

ආයෝජනය (රු.)	පරීක්ෂණ ගාස්තු (රු.)
250,000 හෝ ඊට අඩු	3,000 0
250 ,001 - 500,000	3,750 0
500,001 - 1,000,000	5,000 0
1,000,000 වැඩි	10,000 0

පරිසර බලපත්‍ර ගාස්තු රු. 4,500.00+ මුද්දර බදු රු. 450.00
පරිසර පෝරම ගාස්තු රු. 100.00

කොඩි කණු සඳහා ගාස්තු :

	රු. ශත
කොඩි කණු එකක් සඳහා ගාස්තු	100 0
ඒ සඳහා ආරක්ෂිත ඇප තැන්පතු (කොඩි කණු 01ක් සඳහා)	500 0
කොඩි එකක් සඳහා ගාස්තු	50 0
ඒ සඳහා ආරක්ෂිත ඇප තැන්පතු	100 0

* ආගමික ස්ථානවල උත්සව/ආගමික කටයුතු සඳහා කොඩි කණු 30ක් හා කොඩි (බෞද්ධ කොඩි හෝ පාට කොඩි) 30ක් පමණක් නොමිලේ ලබාදෙන අතර, අවමංගල්‍ය උත්සව සඳහා කොඩි කණු 10ක් හා කොඩි 10ක් නොමිලයේ ලබා දෙනු ලැබේ.

ගලි බවුසරයේ සේවා සැපයීමේ ගාස්තු :

ලීටර් 4000 ගලි බවුසරයේ සේවා සැපයීම බල ප්‍රදේශය ඇතුළත (එක් ගමන් වාරයක් සඳහා)	7,500 0
ප්‍රවාහනය කි.මී. 01 ක් සඳහා	700 0
වැඩිවන කි.මී. 01 ක් සඳහා	200 0

ආදාහනාගාර සඳහා ගාස්තු :

	රු. ශත
බල ප්‍රදේශය තුළ ආදාහනාගාර ගාස්තු	10,000 0
බල ප්‍රදේශයෙන් පිටත අයෙකු සඳහා ආදාහනාගාර ගාස්තු	22,000 0

JCB යන්ත්‍ර කුළියටදීම සඳහා ගාස්තු :

මීටර් පැයක් සඳහා	5,500 0

* ආගමික ස්ථානවලට ඉන්ධන සපයා ගැනීමට යටත්ව එක් දිනක් සඳහා නොමිලේ සපයනු ලැබේ.
* අනෙකුත් ඉල්ලීම් සඳහා පොදු කටයුතු නොවන ශ්‍රමදාන හා වෙනත් පෞද්ගලික කටයුතුවලට නියමිත ගාස්තු හා අයකිරීම් සිදු කර ලබා දෙනු ලැබේ.
* ස්වේච්ඡා සංවිධාන හෝ වෙනත් ග්‍රාමීය සමිති සමාගම් විසින් කරනු ලබන ඉල්ලීම් සඳහා ඉන්ධන ලබාදීමට යටත්ව උපරිම දින 01ක් පමණක් ලබාදෙනු ලැබේ.

වතුර ටැංකි කුළියට දීම :

ලීටර් 1000 ටැංකිය සඳහා ගාස්තු	750 0
ඇප තැන්පතු	2,000 0
සේවා ගාස්තු 1000 - ලීටර් 2000 ටැංකිය සඳහා ගාස්තු	1,000 0
ඇප තැන්පතු	3,000 0

ක්‍රීඩාපිටිය වෙන් කිරීම සඳහා ගාස්තු :

කාර්යය	අය කිරීම රු. ශත	තැන්පතු රු. ශත
ප්‍රවේශ පත්‍ර අලෙවිකර පවත්වන සංගීත සංදර්ශනය	දිනකට රු. 50,000 0 + සේවා ගාස්තු රු. 10,000	25,000 0
විවිධ වැඩසටහන් (ආදායම් උපදවන්නේ නැති)	දිනකට රු. 10,000 0 + සේවා ගාස්තු රු. 5,000	25,000 0
ව්‍යාපාරික ප්‍රදර්ශන	දිනකට රු. 25,000 0 + සේවා ගාස්තු රු. 10,000	20,000 0 වැඩිවන දිනකට රු. 5,000 0
ප්‍රවේශපත්‍ර අලෙවි නොකර පවත්වන සංගීත සංදර්ශනය	දිනකට රු. 20,000 0 + සේවා ගාස්තු රු. 10,000	20,000 0

කාර්යය	අය කිරීම රු. ශත	තැන්පතු රු. ශත
වේදිකාව සඳහා	දිනකට රු. 20,000 0	10,000 0
මුදල් අයකර පවත්වනු ලබන ක්‍රීඩා තරග	දිනකට රු. 10,000 0 + සේවා ගාස්තු රු. 5,000	10,000 0
මුදල් අයනොකර පවත්වනු ලබන ක්‍රීඩා තරග	දිනකට රු. 3,000 0 + සේවා ගාස්තු රු. 2,000	7,500 0

ඉහතින් වෙන් කරනු ලබන දින ගණනට අතිරේකව වැඩිවන දිනකට රු. 1,000.00 ක් අය කෙරේ.
විදුලි ඒකක වැයවන ප්‍රමාණයට ඒකකයක් සඳහා රු. 500.00 බැගින් අය කෙරේ.

බුලත්සිංහල ප්‍රාදේශීය සභාවට අයත් දිවා රාත්‍රී වොලිබෝල් හා බැඩ්මින්ටන් ක්‍රීඩාංගනය හා ඒ ආශ්‍රිත වාහන නැවතුම් භූමිය

මුදල් අයකර පවත්වුන ලබන තරගාවලි හා උත්සව සඳහා කුලී පදනම මත ලබා දීම වෙනුවෙන් පහත සඳහන් පරිදි ගාස්තු අය කරනු ලැබේ.

වොලිබෝල් හා බැඩ්මින්ටන් ක්‍රීඩා පිටිය - පෙ.ව. 6.00 - රාත්‍රී 12.00 දක්වා (වාහන නැවතුම් පහසුකම් සහිතව) එක් පිටියක් සඳහා රු. 3,000.00.

විදුලි ගාස්තුව සඳහා තැන්පත් කළයුතු මුදල (එක් පිටියක් සඳහා) රු. 2,000.00.
(වැය වූ විදුලි ඒකකයක් සඳහා රු. 50.00ක ගාස්තුවක් අය කර ඉතිරි මුදල් නිදහස් කිරීමට යටත්ව)

වොලිබෝල් හා බැඩ්මින්ටන් ක්‍රීඩා පිටි හැර ඉතිරි භූමිය ක්‍රීඩා හා වෙනත් කටයුතු සඳහා ලබාදීම.

* පෙ.ව. 6.00 ත් රාත්‍රී 12.00 දක්වා භූමිය ලබාදීම සඳහා ස්ථාවර ගාස්තුව - රු. 3.000.00
* විදුලිය ලබාගැනීම වෙනුවෙන් තැන්පත් කල යුතු මුදල රු. 3,000.00 (වැය වූ විදුලි ඒකකයක් සඳහා රු. 100.00ක ගාස්තුවක් අයකර ඉතිරි මුදල් නිදහ් කිරීමට යටත්ව)

බුලත්සිංහල ප්‍රාදේශීය සභාවට අයත් දිවා රාත්‍රී වොලිබෝල් හා බැඩ්මින්ටන් ක්‍රීඩාංගනවල පුහුණු සැසි පැවැත්වීම සඳහා පහත පරිදි ගාස්තු අය කරනු ලැබේ.

* පෙ.ව. 6.00ත් රාත්‍රී 12.00 දක්වා කාලය තුල සතියකට දින දෙකක් පුහුණුවීම් සඳහා ලබාදීමට මාසික 2,000.00 (විදුලි වියදම් ඇතුලුව) ගාස්තුව ස්ථාවර

ශ්‍රවනාගාරය වෙන් කිරීම සඳහා ගාස්තු :

කාර්යය	*අය කිරීම (ශබ්ද විකාශන රහිත) රු. ශත*	*අය කිරීම (ශබ්ද විකාශන සහිත) රු. ශත*	*තැන්පතු රු. ශත*	*සේවා ගාස්තු රු. ශත*
මංගල උත්සවයට පිටතින් ආහාර පිසගෙන එන පදනම මත	දිනකට රු. 25,000	දිනකට රු. 35,000	10,000 0	5,000 0
ව්‍යාපාරික ප්‍රදර්ශනය	දිනකට රු. 15,000	දිනකට රු. 25,000	10,000 0	5,000 0
චිත්‍රපට / නාට්‍ය / දේශන / සම්මන්ත්‍රණ (මුදල් අය නොකර සිදු කරන)	දිනකට රු. 5,000	දිනකට රු. 15,000	5,000 0	5,000 0
චිත්‍රපට / නාට්‍ය / දේශන / සම්මන්ත්‍රණ (මුදල් අය කර සිදුකරන)	දිනකට රු. 15,000	දිනකට රු. 20,000	5,000 0	5,000 0
ආගමික හා අධ්‍යාපනික වැඩසටහන්	මුදල් අය නොකරේ	මුදල් අය නොකරේ	5,000 0	2,000 0
වෙනත්	දිනකට රු. 10,000	දිනකට රු. 20,000	3,000 0	2,000 0
රාජ්‍ය ආයතන සඳහා	දිනකට රු. 5,000	රු. 10,000 0		

වැඩිවන දිනකට තැන්පත් මුදල	රු.	1,000 0
විදුලි ඒකකයකට	රු.	200 0
වේදිකාව අලෝකකරණ පද්ධතිය දිනකට	රු.	7,500 0
ශාලාව වෙන් කිරීම රාත්‍රී 8.00 දක්වා පමණි		
ජල නළ එලීම :		
තැන්පත් ගාස්තු	රු.	5,000 0
සේවා ගාස්තු	රු.	2,000 0

පාහියංගල නාන තොටුපල ගාස්තු

බුලත්සිංහල ප්‍රාදේශීය සභාව සතු පාහියංගල නාන තොටුපලෙහි වාහන නැවතුම්පල හා එම පරිශ්‍රය දෛනික කුලී පදනම මත පෙ.ව. 9.00 සිට ප.ව. 4.00 දක්වා කාලයට (සෙනසුරාදා, ඉරිදා හා රජයේ නිවාඩු දින හැර සතියේ දිනවල) වෙන් කර දීම වෙනුවෙන් දිනකට ගෙවන ගාස්තුව වශයෙන් රු. 8,000.00ක් ද නැවත ආපසු ගෙවන තැන්පතු වශයෙන් රු. 5,000.00ක්ද අය කරනු ලැබේ.

වාහන නවතා තැබීම වෙනුවෙන් පහත ගාස්තු අය කරනු ලැබේ.

* බස් රථ/ලොරි රථ පළමු පැය 03 සඳහා - රු. 300.00 වැඩි වන පැයකට රු. 100.00 බැගින්
* මෝටර් රථ/වෑන් රථ පළමු පැය 03 සඳහා - රු. 200.00 වැඩි වන පැයකට රු. 100.00 බැගින්
* ත්‍රී රෝද රථ පළමු පැය 03 සඳහා - රු. 150.00 වැඩි වන පැයකට රු. 100.00 බැගින්
* යතුරු පැදි පළමු පැය 03 සඳහා - රු. 100.00 වැඩි වන පැයකට රු. 100.00 බැගින්

සනීපාරක්ෂක ගාස්තු . රු. 50.00

11 - 485/14

———————————————————

බුලත්සිංහල ප්‍රාදේශීය සභාව

2024 කසළ බද්ද

බුලත්සිංහල ප්‍රාදේශීය සභාවේ ලේකම් හා කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි ලලනි දීපිකා උඩුමුල්ල වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 150(1) වන වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව බුලත්සිංහල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2024 වර්ෂයට අදාලව කසළ එකතු කිරීම සඳහා ගාස්තු අය කිරීම මත 2024 වර්ෂය සඳහා කසළ බැහැර කිරීම වෙනුවෙන් පහත උපලේඛනය යටතේ බුලත්සිංහල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි ආයතනවලින් නියම කර අයකිරීමට පහත සඳහන් ආකාරයට විය යුතු බවට තීරණ අංක 614 යටතේ තීරණය කරමි.

ලලනි දීපිකා උඩුමුල්ල,
ලේකම් හා සභාවේ බලතල කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි
ප්‍රාදේශීය සභාව,
බුලත්සිංහල.

2023 ඔක්තෝබර් මස 08 වැනි දින,
බුලත්සිංහල ප්‍රාදේශීය සභාවේ දී ය.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 19 වන වගන්තිය සහ 109 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2007 අංක 01 දරන ඝන අපද්‍රව්‍ය කළමනාකරණ රීති යටතේ පනවා නියම කර ඇති කසළ එකතු කිරීම සඳහා ගාස්තු අය කිරීම මත 2024 වර්ෂය සඳහා කසළ බැහැර කිරීම වෙනුවෙන් පහත උපලේඛනය යටතේ බුලත්සිංහල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි ආයතනවලින් ගාස්තු නියම කර අයකිරීමට තීරණය කරමි.

උපලේඛනය

අංකය	*වර්ගය*	*අපද්‍රව්‍ය ජනනය අනුව වර්ගීකරණය*	*දිනකට අපද්‍රව්‍ය ප්‍රමාණය (කි.ග්‍රෑ.)*	*මාසික වියදම රු. ශත*
01	හෝටල් (දේශීය සහ විදේශීය)	මහා පරිමාණ	>50	22,500-50,000
		මධ්‍ය පරිමාණ	10-50	5,000-22,500
02	නේවාසිකාගාර/හෝටල්	මහා පරිමාණ	>10	5,000-25,000
		මධ්‍ය පරිමාණ	5-10	2,500-5,000
		කුඩා පරිමාණ	<5	500-2500
03	අවන්හල් /ආහාර ලබාගනු ලබන ස්ථාන/උත්සව ශාලා	මහා පරිමාණ	>50	22,500-50,000
		මධ්‍ය පරිමාණ	10-50	5,000-22,500
		කුඩා පරිමාණ	<10	500-5,000
04	සුපිරි වෙළඳසැල්	මහා පරිමාණ	>50	22,500-50,000
		මධ්‍ය පරිමාණ	10-50	5,000-22,500
		කුඩා පරිමාණ	<10	1000-5,000
05	කර්මාන්තශාලා (උපද්‍රවකාරී නොවන)	මහා පරිමාණ	>50	22,500-50,000
		මධ්‍ය පරිමාණ	10-50	5,000-22,500
		කුඩා පරිමාණ	<10	1,000-5,000
06	පුද්ගලික රෝහල්, සාත්තු නිවාස සහ බෙහෙත්ශාලා (ආසාදිත නොවන)	මහා පරිමාණ	>30	20,000-50,000
		මධ්‍ය පරිමාණ	15-30	10,000-20,000
		කුඩා පරිමාණ	<15	1,000-10,000
07	අනෙකුත් වාණිජ ආයතන (රාජ්‍ය /පුද්ගලික)	මහා පරිමාණ	>30	15,000-40,000
		මධ්‍ය පරිමාණ	10-30	5,000-15,000
		කුඩා පරිමාණ	<10	500-5,000
08	සේවා සපයනු ලබන ආයතන (රාජ්‍ය / පුද්ගලික)	මහා පරිමාණ	>10	5,000-25,000
		මධ්‍ය පරිමාණ	5-10	2,500-5,000
		කුඩා පරිමාණ	<5	500-2,500

මොනරාගල ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 134 වැනි වගන්තියේ (i) වැනි උපවගන්තියෙන් මොනරාගල ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මොනරාගල ප්‍රාදේශීය සභාවේ සභා ලේකම්, ඩී. එම්. අනුර දිසානායක වන මම 2023 වර්ෂයේ සැප්තැම්බර් මස 26 වැනි දින මාගේ තීරණ අංක 125(i) දරන පහත සඳහන් තීරණය ගනු ලැබූ බව මහජනතාවට මෙයින් නිවේදනය කරමි.

ඩී. එම්. අනුර දිසානායක,
සභා ලේකම්,
මොනරාගල ප්‍රාදේශීය සභාව.

2023 ඔක්තෝබර් මස 12 වැනි දින,
මොනරාගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් මොනරාගල ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව දියුණු කළ ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත්කර ඇත්තා වූ ප්‍රදේශය තුළ පිහිටි සියලුම නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල හා ගෙපත්වල 2023 වර්ෂයට පිළිගෙන ක්‍රියාත්මක කරනු ලැබූ 2010 වර්ෂයේ දී සිදු කරන ලද තක්සේරුව 2024 වර්ෂය සඳහා පිළිගැනීමටත්,

(ආ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් ලැබී ඇති බලතල ප්‍රකාරව ඉහත කී තක්සේරුව මත එකී වාර්ෂික වටිනාකමින් සියයට දහයක (10%) වරිපනම් බද්දක් 2024 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්,

(ඇ) වර්ෂයේ සම්පූර්ණ වරිපනම් බදු මුදල් එම වර්ෂයේ ජනවාරි මස 31 වැනි දින හෝ එදිනට පෙර ගෙවන්නේ නම් 10% ක වට්ටමක් ද, කාර්තු වශයෙන් ගෙවන්නේ නම් කාර්තුවේ මුල් මාසය තුළ හෝ ඊට පෙර මුදල් ගෙවන විට 5% ක වට්ටමක් ද සභාව විසින් ලබා දීමටත්,

(ඈ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (6) වැනි උපවගන්තියේ බලතල යටතේ යථෝක්ත වරිපනම් බද්ද එකී වර්ෂයේ මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් මස 30 හා දෙසැම්බර් මස 31 යන දිනවලින් අවසන් වන කාර්තු හතර තුළදී සමාන වාරික හතරකින් මොනරාගල ප්‍රාදේශීය සභාව වෙත ගෙවන ලෙසටත්,

මොනරාගල ප්‍රාදේශීය සභාවේ සභාපති වන මම තීරණය කරමි.

11-524/1

මොනරාගල ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා වෙළෙඳ බලපත්‍ර ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය ප්‍රකාරව පැවරී ඇති බලතල අනුව මොනරාගල ප්‍රාදේශීය සභාවේ සභා ලේකම්, ඩී. එම්. අනුර දිසානායක වන මම 2023 වර්ෂයේ සැප්තැම්බර් මස 26 වැනි දින මාගේ තීරණ අංක 125(ii) දරන පහත සඳහන් තීරණය ගනු ලැබූ බව මහජනතාවට මෙයින් නිවේදනය කරමි.

2024 වර්ෂය සඳහා ගෙවන ලද වෙළඳ බලපත්‍ර ගාස්තු, ඒ වර්ෂයේ මාර්තු මස 31 වන දිනට පෙර හෝ වෙළඳ ව්‍යාපාරය ආරම්භ කර මාස 03ක් ඇතුලත වෙළඳ සැල සඳහා බලපත්‍රයක් ලබා ගත යුතු බවත්, නිවේදනය කරනු ලැබේ.

ඩී. එම්. අනුර දිසානායක,
සභා ලේකම්,
මොනරාගල ප්‍රාදේශීය සභාව.

2023 ඔක්තෝබර් මස 12 වැනි දින,
මොනරාගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147(1) වගන්තිය, 149 වන වගන්තිය හා 1988 අගෝස්තු මස 23 වැනි දින අංක 520/7 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* හා 2013 ජුනි මස 28 වැනි දින අංක 1816/43 දරන රජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කර ඇති අතුරු ව්‍යවස්ථාවලින් ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මොනරාගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත කරගෙන යනු ලබන පහත උපලේඛනයේ I වන තීරුවේ සඳහන් එක් එක් වෙළෙඳ ව්‍යාපාරය වෙනුවෙන් එම උපලේඛනයේ II වන තීරුවේ ඒ එක් එක් වෙළෙඳ ව්‍යාපාරය පවත්වාගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකමට අනුරූප තීරුවේ නිරූපිත ප්‍රමාණයක වෙළෙඳ බලපත්‍ර ගාස්තුවක් 2024 වර්ෂය සඳහා පනවා අයකළ යුතු බවටත්,

(ආ) එකී බලපත්‍ර ගාස්තුවට යටත් තැනැත්තෙකු 2024 වර්ෂයේ මාර්තු මස 31 වන දිනට පෙර එම ගාස්තුව මොනරාගල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත්,

මොනරාගල ප්‍රාදේශීය සභාවේ සභා ලේකම් වන මම තීරණය කරමි.

උපලේඛනය

අනු. අංකය	*I වන තීරුව* *කර්මාන්තයේ ස්වභාවය*	*II වන තීරුව* *ස්ථානයේ වාර්ෂික වටිනාකම රුපියල්*		
		රු. 750 නොඉක්මවන අවස්ථාවක	*රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
		රු. ශ.	*රු. ශ.*	*රු. ශ.*
01.	හෝටලයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
02.	බේකරියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
03.	තේ හෝ කෝපි කඩයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
04.	අත් යන්ත්‍ර මගින් රබර් දුම් ගැසීමේ හා නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
05.	ලී වෙළෙඳසැලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
06.	ශීතකරණ ලද ආහාර ද්‍රව්‍ය සඳහා සාප්පුවක් හෝ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
07.	මස් වෙළෙඳසැලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
08.	පළතුරු විකිණීම සඳහා සාප්පුවක් හෝ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
09.	හරක් මඩුවක්, ගාලක් හෝ නැවතුම්පොළක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
10.	ගෝ ඝාතක මඩුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
11.	කුකුළන් ආදී සතුන් විකිණීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
12.	කලුගල් පිපිරවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
13.	මිරිස්, කෝපි, පිටි, ධාන්‍ය හෝ කුළු බඩු හෝ වෙනත් මෑ වර්ග ඇඹරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
14.	යන්ත්‍රානුසාරයෙන් ක්‍රියාකරන වී මෝලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
15.	අම්ලකර වායුව (ඔක්සිජන්) භාවිතා කරන යකඩ කම්හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
16.	අශ්ව බල 10 හා 20 අතර වූ වී මෝලක්, ඇඹරුම්හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
17.	අශ්ව බල 20 ට අධික වූ වී මෝලක්, ඇඹරුම්හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
18.	වඩු වැඩ කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

	I වන තීරුව	*II වන තීරුව*		
අනු. අංකය	*කර්මාන්තයේ ස්වභාවය*	*ස්ථානයේ වාර්ෂික වටිනාකම රුපියල්*		
		රු. 750 නොඉක්මවන අවස්ථාවක	*රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
		රු. ශ.	*රු. ශ.*	*රු. ශ.*
19.	ගෘහ භාණ්ඩ සාප්පුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
20.	ප්‍රමාණයෙන් ටොන් 01 ක් සත්ත්ව ආහාර ගබඩාකර තබාගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
21.	මෝටර් ගරාජයක් පවත්වාගෙන යාම සඳහා (මෝටර් රථ අළුත්වැඩියාව)	500 0	750 0	1,000 0
22.	රස කැවිලි නිෂ්පාදනය කිරීමේ හෝ වෙළෙඳාම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
23.	පැස්සීමේ හෝ අම්ලකර පැස්සීමට ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
24.	ලියවන පට්ටලයක් භාවිතා කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
25.	මෝටර් වාහන අළුත්වැඩියා කිරීම හෝ එවැනි කාර්යයක් කිරීමට සුදුසු ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
26.	මෝටර් වාහන සර්විස් කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
27.	උළු, ගඩොල්, හා කබොක් රැස් කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
28.	යන්ත්‍ර නොමැතිව ගඩොල් හෝ උළු නිපදවීමේ ස්ථානයක් සඳහා	500 0	750 0	1,000 0
29.	හුණු හෝ හුණු ගල් ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
30.	අයිස් ක්‍රීම් නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
31.	චේවැල් බඩු නිපදවීම හා ගබඩාකර තබාගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
32.	කම්හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
33.	යෝගට් හෝ අයිස් ක්‍රීම් නිපදවීම	500 0	750 0	1,000 0
34.	යන්ත්‍ර මගින් ක්‍රියාකරන ගල්මෝලක් සඳහා	500 0	750 0	1,000 0
35.	බාබර් සාප්පුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
36.	බැටළුවන්, එළුවන් හෝ ඌරන් 10 ට වඩා ඇති මඩුවක් හෝ ගාලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
37.	මස් කඩයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
38.	ග්‍රොසරියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
39.	සිල්ලර බඩු වෙළෙඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
40.	සිල්ලර බඩු වෙළෙඳාම (ගම්බඳ)	500 0	750 0	1,000 0
41.	ආයුර්වේද බෙහෙත් වෙළෙඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
42.	ඉංග්‍රීසි බෙහෙත් වෙළෙඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
43.	මල් ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
44.	දත් බැඳීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
45.	ශීත කළ මස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
46.	කොන්ක්‍රීට් කණු හා ග්‍රිල් වැඩපළක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

මොනරාගල ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා කර්මාන්ත බද්ද පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය ප්‍රකාරව පැවරී ඇති බලතල අනුව මොනරාගල ප්‍රාදේශීය සභාවේ සභා ලේකම්, ඩී. එම්. අනුර දිසානායක වන මම 2023 වර්ෂයේ සැප්තැම්බර් මස 26 වැනි දින මාගේ තීරණ අංක 125(iii) දරන පහත සඳහන් තීරණය ගනු ලැබූ බව මහජනතාවට මෙයින් නිවේදනය කරමි.

2024 වර්ෂය සඳහා පනවන ලද එකී කර්මාන්ත බද්ද, ඒ වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත්, වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

ඩී. එම්. අනුර දිසානායක,
සභා ලේකම්,
මොනරාගල ප්‍රාදේශීය සභාව.

2023 ඔක්තෝබර් මස 12 වැනි දින,
මොනරාගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වන වගන්තියේ (1) වන හා (2) වැනි උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර මොනරාගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත කරගෙන යනු ලබන පහත උපලේඛනයේ I වන තීරුවේ සඳහන් එක් එක් කර්මාන්තය වෙනුවෙන්, එම උපලේඛනයේ II වැනි තීරුවේ සඳහන් ඒ එක් එක් කර්මාන්තය පවත්වාගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකමට අනුරූප තීරුවේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක්, 2024 වර්ෂය සඳහා පනවා අය කළ යුතු බවටත්,

(ආ) එකී කර්මාන්ත බද්දට යටත් තැනැත්තෙකු 2024 වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනට පෙර මොනරාගල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත්,

මොනරාගල ප්‍රාදේශීය සභාවේ සභා ලේකම් වන මම තීරණය කරමි.

උපලේඛනය

අනු. අංකය	*I වැනි තීරුව* *කර්මාන්තයේ ස්වභාවය*	*II වැනි තීරුව* *ස්ථානයේ වාර්ෂික වටිනාකම රුපියල්*		
		රු. 750 නොඉක්මවන අවස්ථාවක	*රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
		රු. ශ.	*රු. ශ.*	*රු. ශ.*
01.	මිරිදිය මසුන් අලෙවිය සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
02.	කරදිය මසුන් අලෙවිය සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
03.	බැටරි චාජ් කිරීම සඳහා	500 0	750 0	1,000 0
04.	යාන්ත්‍රික බලයෙන් ක්‍රියාකරන ටයර් අළුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
05.	ටයර් හෝ ටියුබ් වෝල්කනයිස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
06.	ටයර්, ටියුබ්, විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
07.	පාපැදි අළුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම	200 0	250 0	500 0
08.	බෙලෙක් වැඩ කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
09.	හොන්ඩර 5 කට වැඩි නොවූ තරම් තීන්ත හෝ වාර්නිස් ගබඩා කර තබාගැනීම සඳහා	500 0	750 0	1,000 0

	I වැනි තීරුව	*II වැනි තීරුව*		
අනු. අංකය	*කර්මාන්තයේ ස්වභාවය*	*ස්ථානයේ වාර්ෂික වටිනාකම රුපියල්*		
		රු. 750 නොඉක්මවන අවස්ථාවක	*රු. 751 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,501 ඉක්මවන අවස්ථාවක*
		රු. ශ.	*රු. ශ.*	*රු. ශ.*
10.	හොණ්ඩර 5 කට වැඩි වූ තරම් තීන්ත හෝ වාර්නිෂ් ගබඩාකර තබා ගැනීම සඳහා	500 0	750 0	1,000 0
11.	යන්ත්‍ර භාවිතයක් නොමැතිව ගෘහ භාණ්ඩ නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
12.	විදුලි බලයෙන් ක්‍රියා කරන මුද්‍රණාලයක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
13.	අත් යන්ත්‍ර මගින් ක්‍රියාකරන මුද්‍රණාලයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
14.	සංචාරක වෙළෙන්දෙකු වීම සඳහා	250 0	350 0	500 0
15.	රූපවාහිනී හෝ රේඩියෝ අලුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
16.	ගෝනි ගබඩාකර තබා ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	350 0	500 0	1,000 0
17.	හිස් බෝතල් ගබඩාකර තබා ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	350 0	500 0	1,000 0
18.	යකඩ බඩු ගබඩාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
19.	සිමෙන්ති ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
20.	දුම්කොළ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	300 0	500 0	1,000 0
21.	පුවක් ගබඩා කිරීම සඳහා	250 0	500 0	1,000 0
22.	මැණික් වෙළෙඳුන් විසින් මැණික් කැටයම් කපා ඔප දැමීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
23.	යන්ත්‍ර නොමැතිව සපත්තු හෝ පාවහන් නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	200 0	500 0	1,000 0
24.	යතුරු නිෂ්පාදනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
25.	අලුත් හෝ පරණ ලෝහ ගබඩා කර තබාගැනීමේ ස්ථානයක් සඳහා	300 0	500 0	1,000 0
26.	බෝල මේස ක්‍රීඩා කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
27.	වාත්තු මඩුවක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
28.	ලොන්ඩරියක් පවත්වාගෙන යාම සඳහා	300 0	500 0	1,000 0
29.	යතුරුපැදි අලුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
30.	ග්‍රොස් එකකට වැඩි ප්‍රමාණයක් සිසිල් බීම බෝතල් ගබඩාකර තබාගැනීමේ හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
31.	ගැලුම් 50 ට වැඩි ප්‍රමාණයක් පොල් තෙල් ගබඩාකර තබා ගැනීමේ හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
32.	පරණ ලෝහ ගබඩාකර තබා ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
33.	විසිතුරු පින්තාරු (ස්ප්‍රේ පේන්ටින්) සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
34.	කිලෝග්‍රෑම් 750 ට වැඩි වන සේ ප්‍රමාණයක් ගබඩා කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
35.	මෝටර් වාහන සඳහා බොඩි සෑදීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
36.	තොග වශයෙන් විකිණීම සඳහා හාල් පිටි, සීනි හෝ ලුණු කිලෝ 750 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම	500 0	750 0	1,000 0
37.	ගෑස් නිෂ්පාදනය කිරීම, ගබඩා කිරීම හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
38.	ශබ්ද විකාශන යන්ත්‍ර කුලියට දෙන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
39.	ගුවන් විදුලි යන්ත්‍ර, ටේප් රෙකෝඩර්, ටෙලිවිෂන් විකිණීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

	I වැනි තීරුව	*II වැනි තීරුව*		
අනු. අංකය	*කර්මාන්තයේ ස්වභාවය*	*ස්ථානයේ වාර්ෂික වටිනාකම රුපියල්*		
		රු. 750 නොඉක්මවන අවස්ථාවක	*රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
		රු. ශ.	*රු. ශ.*	*රු. ශ.*
40.	සාප්පු බඩු වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
41.	රේඩියෝ අමතර කොටස් වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
42.	මෝටර් රථ, මෝටර් බයිසිකල් අමතර කොටස් වෙළෙඳාම් කරන ස්ථානයක් සඳහා	500 0	750 0	1,000 0
43.	ඇලුමිනියම්, යකඩ වෙළෙඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
44.	පාවහන් වෙළෙඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
45.	මංගල උත්සව භාණ්ඩ සැපයීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
46.	මහන මැෂින් වෙළෙඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
47.	බයිසිකල් වෙළෙඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
48.	ස්වර්ණාභරණ වෙළෙඳසලක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
49.	ආයුර්වේද බෙහෙත් වෙළෙඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
50.	ලිපිද්‍රව්‍ය වෙළෙඳසලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
51.	පොත් සාප්පුවක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
52.	තොග වශයෙන් සිගරට් ගබඩාකිරීමේ හා බෙදාහැරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
53.	මැටි භාණ්ඩ වෙළෙඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
54.	බුලත් වෙළෙඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම	250 0	300 0	500 0
55.	විදුලි උපකරණ වෙළෙඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
56.	පින්තූර රාමු කරන හෝ විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
57.	කාර් ෂීට් කුෂන් කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
58.	රේස් ඔට්ටු පොළවල් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
59.	ඇස් කණ්නාඩි වෙළෙඳාම් කිරීම සඳහා සාප්පුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
60.	මෝටර් සයිකල් විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
61.	ඡායා පිටපත්කර ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
62.	පුවත්පත් හා සඟරා ආදිය වෙළෙඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
63.	සෙල්ලම් බඩු වෙළෙඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
64.	ගී පටිගත කිරීමේ හා සීඩී තැටිගත කිරීමේ හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
65.	ඉදල්, පාපිසි හා මුස්නා නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
66.	ජුකී මැෂින් උපයෝගී කර ගනිමින් පුහුණු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
67.	ජුකී මැෂින්වලින් ඇඳුම් මැසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
68.	ටින්කර් වැඩපලක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
69.	බීඩි නිෂ්පාදනය කිරීම සඳහා	500 0	750 0	1,000 0
70.	ඉන්ධන ගබඩා කිරීම හා විකිණීම සඳහා	500 0	750 0	1,000 0
71.	කෘෂිකාර්මික හා ගෘහ භාණ්ඩ ප්‍රදර්ශනාගාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
72.	නොතාරිස් කාර්යාලයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
73.	සිමෙන්ති වලින් නිෂ්පාදනය කරන ද්‍රව්‍ය අලෙවි කිරීම	500 0	750 0	1,000 0
74.	ලොතරැයි අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
75.	සුරතල් මසුන් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

	I වැනි තීරුව	*II වැනි තීරුව*		
අනු. අංකය	*කර්මාන්තයේ ස්වභාවය*	*ස්ථානයේ වාර්ෂික වටිනාකම රුපියල්*		
		රු. 750 නොඉක්මවන අවස්ථාවක	*රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
		රු. ශ.	*රු. ශ.*	*රු. ශ.*
76.	කිරි එකතු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
77.	බීඩි ගබඩා කිරීම හා විකිණීම	500 0	750 0	1,000 0
78.	ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
79.	පිඟන් හෝ වීදුරු භාණ්ඩ විකිණීම	500 0	750 0	1,000 0
80.	ඇඳුම් මැසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
81.	වැලිගොඩ දමා විකිණීමට රැස් කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
82.	පිත්තල භාණ්ඩ වෙළෙඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
83.	දුරකථන, ඡායා පිටපත්, පරිගණක කටයුතු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
84.	උළු ගබඩාවක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
85.	තාවකාලික එළවළු කඩ	500 0	750 0	1,000 0
86.	ඔරලෝසු වෙළෙඳාම් කරන, ඔරලෝසු අළුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
87.	ප්‍රචාරක නාම පුවරු සැදීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
88.	ජංගම දුරකථන විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
89.	කලුගල් කැඩීමේ වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
90.	මෙහි සඳහන් නොවන වෙනත් ව්‍යාපාර සඳහා	500 0	750 0	1,000 0

11-524/3

මොනරාගල ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා ව්‍යාපාර බද්ද පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය ප්‍රකාරව පැවරී ඇති බලතල අනුව මොනරාගල ප්‍රාදේශීය සභාවේ සභා ලේකම්, ඩී. එම්. අනුර දිසානායක වන මම, 2023 වර්ෂයේ සැප්තැම්බර් මස 26 වැනි දින මාගේ තීරණ අංක 125(iv) දරන පහත සඳහන් තීරණය ගනු ලැබූ බව මහජනතාවට මෙයින් නිවේදනය කරමි.

2024 වර්ෂය සඳහා ගෙවන ලද එකී ව්‍යාපාර බද්ද, ඒ වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත්, නිවේදනය කරනු ලැබේ.

ඩී. එම්. අනුර දිසානායක,
සභා ලේකම්,
මොනරාගල ප්‍රාදේශීය සභාව.

2023 ඔක්තෝබර් මස 12 වැනි දින,
මොනරාගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වැනි වගන්තියේ (1) වන උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර, එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබාගැනීම හෝ එකී පනතේ 150 වන වගන්තිය යටතේ යම් කර්මාන්ත බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ හා වෘත්තියක් නොවන්නා වූ කිසියම්

ව්‍යාපාරයක් මොනරාගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2024 වර්ෂයේ දී කරගෙන යනු ලබන සෑම තැනැත්තකුගෙන්ම, එකී ව්‍යාපාරයේ ඊට පෙර වර්ෂයේ ලැබීම් මෙහි පහත උපලේඛනයේ I වන තීරුවේ නිරූපිත යම් විෂයාංකයක සීමාවන් ඇතුළත පවත්නා අවස්ථාවක එහි II වන තීරුවේ අනුරූප සටහනේ නිරූපිත අනුප්‍රමාණය අනුව වූ ව්‍යාපාර බද්දක් 2024 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්,

බද්දට යටත් යම් තැනැත්තකු එකී ව්‍යාපාර බද්ද 2024 වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනට පෙර මොනරාගල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත්,

මොනරාගල ප්‍රාදේශීය සභාවේ සභාපති වන මම තීරණය කරමි.

උපලේඛනය

I වැනි තීරුව	*II වැනි තීරුව*
බද්දට අදාළවන වර්ෂයට පෙර වර්ෂයේ ව්‍යාපාරයෙන් ලත් ලැබීම් ප්‍රමාණය	*ගෙවිය යුතු බද්ද රු. ශත.*
1. රු. 6,000 නොඉක්මවන අවස්ථාවක	නැත
2. රු. 6,000 ඉක්මවන නමුත් රු. 12,000 නොඉක්මවන විට	90 0
3. රු. 12,000 ඉක්මවන නමුත් රු. 18,750 නොඉක්මවන විට	180 0
4. රු. 18,750 ඉක්මවන නමුත් රු. 75,000 නොඉක්මවන විට	360 0
5. රු. 75,000 ඉක්මවන නමුත් රු. 150,000 නොඉක්මවන විට	1,200 0
6. රු. 1,50,000 ඉක්මවන විට	3,000 0

මෙම ව්‍යාපාර බදු අදාළවන ව්‍යාපාර :

1. වෙන්දේසිකරුවන්
2. කොන්ත්‍රාත්කරුවන්
3. උකස් බඩු ගන්නවුන්
4. පෞද්ගලික අධ්‍යාපන පන්ති පවත්වන්නන්
5. ගෘහ නිර්මාණ ශිල්පීන්
6. සැපයුම්කරුවන්
7. ප්‍රවාහන සේවා
8. කුලී කාර් අයිතිකරුවන්
9. මෝටර් රථ හා යතුරු පැදි විකුණුම්කරුවන්
10. බැංකු හා රක්ෂණ ලීසිං සමාගම්
11. රියැදුරු පුහුණු පාසල
12. මැණික් වෙළඳාම
13. චාරිකා සේවා ආයතන
14. යන්ත්‍රානුසාරයෙන් කළුගල් වැඩපලක් පවත්වාගෙන යාම
15. ඇඟලුම් කර්මාන්තශාලාවක් පවත්වාගෙන යාම
16. බහුආංගික වෙළඳසැල් (ෆුඩ් සිටි)
17. මත්පැන් තොග හා සිල්ලර වශයෙන් පවත්වාගෙන යන ස්ථානයක් (රට බීමහල්)
18. ආගන්තුක නිවාසයක් පවත්වාගෙන යාම
19. සමාජශාලාවක් පවත්වාගෙන යාම
20. මසා නිමකළ හා රෙදිපිළි සාප්පු අලෙවිසැල්
21. ගොඩනැගිලි ද්‍රව්‍ය වෙළෙඳාම් කරන ස්ථානයක්
22. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සම්ප්‍රේෂණ කුළුණු
23. මෙහි වර්ග නොකරන ලද වෙනත් ව්‍යාපාරික ස්ථාන

මොනරාගල ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි හෝටලයකට, ආපනශාලාවකට හෝ නවාතැන්පොළකට සියයට එකක බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය ප්‍රකාරව පැවරී ඇති බලතල අනුව මොනරාගල ප්‍රාදේශීය සභාවේ සභා ලේකම්, ඩී. එම්. අනුර දිසානායක වන මම 2023 වර්ෂයේ සැප්තැම්බර් මස 26 වැනි දින මාගේ තීරණ අංක 125(v) දරන පහත සඳහන් තීරණය ගනු ලැබූ බව මහජනතාවට මෙයින් නිවේදනය කරමි.

2024 වර්ෂයේ පවත්වාගෙන යනු ලබන හෝටලය, ආපන ශාලාව හෝ නවාතැන්පොල ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කරනු ලැබ ඇති අනුමත කර ඇති ආයතන වෙනුවෙන් පෙර වර්ෂයේ ආදායමෙන් 1% ක (සියයට එකක) බදු 2024 මාර්තු මස 31 වැනි දිනට පෙර ලබා ගත යුතු බවත් නිවේදනය කරනු ලැබේ.

ඩී. එම්. අනුර දිසානායක,
සභා ලේකම්,
මොනරාගල ප්‍රාදේශීය සභාව.

2023 ඔක්තෝබර් මස 12 වැනි දින,
මොනරාගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147(1) වන වගන්තියේ, (149) වන වගන්තිය හා 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනත යටතේ ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මොනරාගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පවත්වාගෙන යනු ලබන ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කරනු ලැබ ඇත්තා වූ ද, අනුමත කර හෝ පිළිගත්තා වූ අවස්ථාවක 1% ක (සියයට එකක) බදු මුදල අය කරනු ලැබූ අවුරුද්දට පෙරාතුව වූ අවුරුද්දේ එකී හෝටලයේ, ආපනශාලාවේ හෝ නවාතැන්පොළේ ආදායම අනුව විය යුතු බවටත්,

(ආ) නැතහොත් හෝටලයේ, ආපනශාලාවේ හෝ නවාතැන්පොළ ක්‍රියාත්මක වන පළමුවන අවුරුද්ද වන අවස්ථාවක එම ගාස්තුව එම ස්ථානයේ වාර්ෂික වටිනාකම අනුව තීරණය විය යුතු අතර, එකී බදු මුදල 2024 වර්ෂය සඳහා පනවා අයකළ යුතු බවත්, එකී බදු මුදලට යටත් තැනැත්තකු 2024 වර්ෂයේ මාර්තු මස 31 දිනට පෙර මොනරාගල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත්,

මොනරාගල ප්‍රාදේශීය සභාවේ සභාපති වන මම තීරණය කරමි.

11 -524/5

මොනරාගල ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා ප්‍රචාරක දැන්වීම් ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය ප්‍රකාරව පැවරී ඇති බලතල අනුව මොනරාගල ප්‍රාදේශීය සභාවේ සභා ලේකම්, ඩී. එම්. අනුර දිසානායක වන මම 2023 වර්ෂයේ සැප්තැම්බර් මස 26 වැනි දින මාගේ තීරණ අංක 125(vi) දරන පහත සඳහන් තීරණය ගනු ලැබූ බව මහජනතාවට මෙයින් නිවේදනය කරමි.

ඩී. එම්. අනුර දිසානායක,
සභා ලේකම්,
මොනරාගල ප්‍රාදේශීය සභාව.

2023 ඔක්තෝබර් මස 12 වැනි දින,
මොනරාගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 122(1) වැනි වගන්තියෙන් මා හට පැවරී ඇති බලතල අනුව 1988.08.23 වැනි දින අංක 520/7 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ iv (ඇ) කොටසේ පළාත් පාලන *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* පළ කර ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවේ 39 වන කොටසේ ප්‍රචාරක දෘශ්‍ය පරිසරය අතුරු ව්‍යවස්ථා විධිවිධාන ප්‍රකාර මොනරාගල ප්‍රාදේශීය සභා සීමාව තුළ යම් වීදියකට, පාරකට, ඇලකට, වැවකට හෝ අහසට පෙනෙන පරිදි දැන්වීමක් ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම වෙනුවෙන් පහත උපලේඛනයේ සඳහන් බලපත්‍ර ගාස්තුව සහ රජය පනවා ඇති සහ අලුතින් පනවනු ලබන බදු, 2024 වර්ෂයට අයකර ගැනීමට ;

මොනරාගල ප්‍රාදේශීය සභාවේ සභාපති වන මම තීරණය කරමි.

උපලේඛනය

		රු. ශත
01.	බිත්තියක හෝ පුවරුවක ප්‍රදර්ශනය කරනු ලබන ඕනෑම ප්‍රචාරක දැන්වීමක් සඳහා වර්ග අඩි එකකට අවුරුද්දකට (චිත්‍රපට දර්ශන, ප්‍රචාරක දැන්වීමක් හැර) (ස්ථාවර යකඩ රාමුවක් සහිත විශාල පරිමාණයේ හා මධ්‍ය පරිමාණයේ)	50 00
02.	ප්‍රචාරක දැන්වීමක් (බැනර් ප්‍රදර්ශනය කිරීම) වෙනුවෙන් එක් දැන්වීමකට වර්ග අඩි එකකට දින එකකට වැඩි දින 14 ක් නොඉක්මවන විට	25 00
03.	දින 14 කට වැඩි මුත් දින 30 නොඉක්මවන විට වර්ග අඩි එකකට	20 00
04.	දින 30 කට වැඩිමුත් මාස 06 ක් නොඉක්මවන විට වර්ග අඩි එකකට	50 00
05.	මාස 06 ක් නොඉක්මවන විට වර්ග අඩි 01 කට	50 00
06.	ලී රාමුවක් සවිකරන ලද කණුවල හෝ මහා මාර්ගයේ යම් තැනක ප්‍රදර්ශනය කරන දැන්වීම් සඳහා සෑම වර්ග අඩි 1 කට දින 14 ක් සඳහා	7 50
07.	මාස 03ක් නොඉක්මවන විට වර්ග අඩි 01කට	15 00
08.	මාස 03 ඉක්මවන එහෙත් අවුරුදු 01ක් නොඉක්මවන විට වර්ග අඩි එකකට	25 00
09.	සංඛ්‍යාංඛ නාම පුවරු (ඩිජිටල් නාම පුවරු) වර්ග අඩි එකකට	100 0

11-524/6

මොනරාගල ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා ඉල්ලුම්පත්, සහතිකපත් ගාස්තු හා වෙනත් අයකිරීම්

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය ප්‍රකාරව පැවරී ඇති බලතල අනුව මොනරාගල ප්‍රාදේශීය සභාවේ සභා ලේකම්, ඩී. එම්. අනුර දිසානායක වන මම 2023 වර්ෂයේ සැප්තැම්බර් මස 26 වැනි දින මාගේ තීරණ අංක 125 (vii) දරන පහත සඳහන් තීරණය ගනු ලැබූ බව මහජනතාවට මෙයින් නිවේදනය කරමි.

ඩී. එම්. අනුර දිසානායක,
සභා ලේකම්,
මොනරාගල ප්‍රාදේශීය සභාව.

2023 ඔක්තෝබර් මස 12 වැනි දින,
මොනරාගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

මොනරාගල ප්‍රාදේශීය සභාව මගින් නිකුත් කරනු ලබන ඉල්ලුම්පත් හා සහතිකපත් හා වෙනත් අය කිරීම් සඳහා අයකර ගනු ලබන ගාස්තු 2024 වර්ෂයට අයකර ගැනීමටත්, මොනරාගල ප්‍රාදේශීය සභාවේ සභා ලේකම් වන මම තීරණය කරමි.

	අයකිරීම් විස්තරය	*මුදල (රු.)*
01.	ගොඩනැගිලි අයදුම්පත්‍ර :	
	(i) නිවසක් සඳහා	345 0
	(ii) ව්‍යාපාර ස්ථානයක් සඳහා	575 0
	(iii) ඉඩම් අනුකොටස් බෙදීමේ අයදුම්පත්‍ර	245 0
02.	(i) වරිපනම් ලේඛනයේ නම වෙනස් කිරීමේ අයදුම්පත්	250 0
	(ii) වරිපනම් තක්සේරු ලේඛනයේ පිටපත් ලබාදීම සඳහා ගාස්තු	115 0
03.	(i) වීථිරේඛා හා නොපවරවා ගැනීමේ සහතිකපත් අයදුම්පත්‍ර ගාස්තු	100 0
	(ii) වීථිරේඛා හා නොපවරවා ගැනීමේ සහතික පත්‍ර ගාස්තු	1,000 0
	(iii) වීථිරේඛා හා නොපවරවා ගැනීමේ සහතිකපත්‍ර සංශෝධනය සඳහා ගාස්තු	150 0
04.	පරිසර ආරක්ෂණ බලපත්‍ර ගාස්තු (වර්ෂ 03 කට)	4,500 0
05.	පුස්තකාල සාමාජිකත්ව ගාස්තු	130 0
06.	වෙනත් සහතික හා අයදුම්පත්‍ර ගාස්තු	100 0
07.	ගලි සේවා ගාස්තු :	
	1.1 බල ප්‍රදේශය තුළ	6,000 0
	1.2 කම්කරු කුළිය (එක් කම්කරුවෙකු සඳහා)	500 0
	1.3 අමතර ගලි බවුසර සේවා ගාස්තු	5,000 0
07.	ගලි සේවා ගාස්තු :	
	2.1 බල ප්‍රදේශයෙන් පිටත :	6,500 0
	2.2 කම්කරු කුළිය (එක් කම්කරුවෙකු සඳහා)	500 0
	2.3 අමතර ගලි බවුසර සේවා ගාස්තු	5,500 0
	2.4 ධාවන කුළිය කි. මී. 01 කට (එක් ගමන් වාරයක් සඳහා)	300 0
08.	මෝටර් ග්‍රේඩරය මීටර් පැයකට අයකිරීම් (ඉහත මුදලට අමතරව මීටර් පැයකට ඩීසල් ලීටර් 10 ක මුදලක් සැපයිය යුතුය)	5,000 0
09.	බැකෝ ලෝඩර් යන්ත්‍රය මීටර් පැයකට අයකිරීම්	6,500 0
10.	මාර්ග තලනය පැයකට අයකිරීම්	5,000 0
11.	ප්‍රාදේශීය සභාව මගින් නඩත්තු කරන මාර්ග පළුදු කිරීමේ ගාස්තු අය කිරීම (ඇස්තමේන්තු මුදල මත තීරණය කරනු ලැබේ.)	
12.	කොම්පෝස්ට් පොහොර කිලෝ 01 ක්	30 0

	අයකිරීම් විස්තරය	*මුදල (රු.)*
13.	ප්‍රාදේශීය සභාවට අයත් ග්‍රාමීය මාර්ගවල වැලි ප්‍රවාහන අවසරපත්‍ර ගාස්තු :	
	1. වැලි කියුබ් 01 සිට 35 දක්වා	2,500 0
	2. වැලි කියුබ් 35 සිට 100 දක්වා	5,000 0
	3. වැලි කියුබ් 100 ට වැඩි	10,000 0
14.	මගී ප්‍රවාහන හා භාණ්ඩ ප්‍රවාහන සේවා මත රථවාහන ලියාපදිංචි කිරීමේ ගාස්තු :	
	1. ත්‍රීවිල් රථයකට	1,200 0
15.	ජල බවුසර් ගාස්තු : (බල ප්‍රදේශය තුළ)	
	(වෙනත් උත්සව සඳහා)	
	1:1 ජල බවුසර ගාස්තුව	1,000 0
	1:2 ප්‍රවාහන ගාස්තුව	250 0
	1:3 සේවක කුළිය	100 0
	(ඉදිකිරීම් හා වෙනත්) :	
	2:1 ජල බවුසර ගාස්තුව	2,000 0
	2:2 ප්‍රවාහන ගාස්තුව	250 0
	2:3 සේවක කුළිය	100 0
	ජල බවුසර් ගාස්තු (බල ප්‍රදේශයෙන් පිටත)	
	(වෙනත් උත්සව සඳහා) :	
	3:1 ජල බවුසර ගාස්තුව	2,000 0
	3:2 ප්‍රවාහන ගාස්තුව (මීටර් පැයකට)	01km ක් සඳහා රු. 100 බැගින්
	3:3 සේවක කුළිය	200 0
	(ඉදිකිරීම් හා වෙනත්)	
	4:1 ජල බවුසර ගාස්තුව	3,000 0
	4:2 ප්‍රවාහන ගාස්තුව (මීටර් පැයකට)	01km ක් සඳහා රු. 100 බැගින්
	4:3 සේවක කුළිය	200 0
16.	කසළ ප්‍රවාහනය සඳහා ගාස්තු අයකිරීම : (මාසයක් සඳහා)	
	1:1 කර්මාන්තශාලා සඳහා ගාස්තුව	15,000 0
	1:2 වෙනත් ව්‍යාපාරික ස්ථාන (මාසයක් සඳහා)	3,000 0
	1:3 කසළ අංගනයේ ඇති ප්‍රතිචක්‍රීකරණය කල හැකි කසළ ගබඩාව කුළියට දීම	3,000 0
	1:4 මොනරාගල නගරයේ ඇති කසළ සම්පත් මධ්‍යස්ථානය කුළියට දීම	5,000 0

17. ස්කිට් ස්ටීල් ලෝඩර් (බොක් කැට් යන්ත්‍රය) මීටර් පැයක් සඳහා රු. 3,125.00 ක මුදලක් (එම පැය සඳහා ඩීසල් ලීටර් 5 ක මුදලක් ලබා දිය යුතු අතර ප්‍රවාහනය සපයා ගත යුතුය)

18. ටොන් 01 ප්‍රමාණයේ බේබ් ගල්රෝල දිනක් සඳහා (පැය 08 ක දිනක්) රු. 8,000.00ක මුදලක් (ඉන්ධන සහ ප්‍රවාහනය සපයා ගත යුතුය.)

19. ට්‍රැක්ටර් එන්ජිම සමග වළ කපන යන්ත්‍රය පැයක් සඳහා රු. 2,500.00 ක මුදලක්

මොනරාගල ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා ක්‍රීඩාපිටිය, ප්‍රජාශාලාව, සුසාන භූමිය සඳහා ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය ප්‍රකාරව පැවරී ඇති බලතල අනුව මොනරාගල ප්‍රාදේශීය සභාවේ සභා ලේකම්, ඩී. එම්. අනුර දිසානායක වන මම 2023 වර්ෂයේ සැප්තැම්බර් මස 26 වැනි දින මාගේ තීරණ අංක 125(viii) දරන පහත සඳහන් තීරණය ගනු ලැබූ බව මහජනතාවට මෙයින් නිවේදනය කරමි.

ඩී. එම්. අනුර දිසානායක,
සභා ලේකම්,
මොනරාගල ප්‍රාදේශීය සභාව.

2023 ඔක්තෝබර් මස 12 වැනි දින,
මොනරාගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

2013.06.28 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* සඳහන් පරිදි සම්මත අතුරු ව්‍යවස්ථාව වැළඳ ගත් බව දන්වන අතර, 2024 වර්ෂයට මොනරාගල ප්‍රාදේශීය සභාව සතු ක්‍රීඩාපිටි සඳහා

01. දිනකට ක්‍රීඩාපිටි වෙන් කිරීම සඳහා ගාස්තු රු. 4000 0

02. දින 01-02 සඳහා තන්පතු මුදල රු. 15,000 0

03. දින දෙකකට වඩා වැඩිවන සෑම දිනකටම අමතර තැන්පතු මුදල රු. 5,000 0

04. එක් දිනකට කම්කරුවන් දෙදෙනෙක් සඳහා කුළිය රු. 1,400 0 x 2

05. ප්‍රාදේශීය සභා විදුලි සැපයුමෙන් විදුලිය ලබා ගන්නේ නම්

05. i ශබ්ද විකාශන යන්ත්‍ර සඳහා පමණක් දිනකට රු. 1,000 0

05. ii ශබ්ද විකාශන යන්ත්‍ර සහ විදුලි සැරසිලි සඳහා දිනකට රු. 2,000 0

05. ii ශබ්ද විකාශන යන්ත්‍ර, විදුලි සැරසිලි සහ වෙළඳ කුටි සඳහා දිනකට රු. 2,500 0

(මෙම භූමියේ සහ අවට අලාභ හානියක් සිදුවුවහොත් කාර්මික නිලධාරී මහතාගේ ඇස්තමේන්තුවට අනුව අය කිරීම් සිදු කරනු ලැබේ.)

06. ප්‍රජා ශාලාව වෙන් කරවා ගැනීම සඳහා දිනකට
(කරනු ලබන වැඩසටහනට අදාළව) රු. 5,000.00 - 7,500.00 ක මුදලක්

i. රැස්වීම් කටයුතු සඳහා රු. 5,000 0

ii. උත්සව කටයුතු සඳහා රු. 6,000 0

iii. අලෙවි ප්‍රවර්ධන හා මංගල උත්සව සඳහා රු. 7,500 0

07. ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාව වෙන් කරවා ගැනීම සඳහා දිනකට රු. 3,000 ක මුදලක්

08. ප්‍රාදේශීය සභාව සතු පුටු ලබාදීම් එක් පුටුවක් සඳහා දිනකට රු. 20.00 ක මුදලක්

09. හරිත උයන ඡායාරූප ගැනීමට පමණක් වෙන් කරවා ගැනීම සඳහා රු. 2,000 0ක මුදලක්

10.1 අවමංගල්‍ය රථය සඳහා ගාස්තු :

කිලෝ මීටර් (යන එන දුර ඇතුලුව)	*අය කරන ගාස්තුව*
කිලෝ මීටර් 1 ත් 5 ත් අතර දුර සඳහා	රු. 2,000 0
කිලෝ මීටර් 5 ත් 10 ත් අතර දුර සඳහා	රු. 2,500 0
කිලෝ මීටර් 10 ත් 15 ත් අතර දුර සඳහා	රු. 3,000 0
කිලෝ මීටර් 15 ත් 20ත් අතර දුර සඳහා	රු. 3,500 0
කිලෝ මීටර් 20 ත් 30 ත් අතර දුර සඳහා	රු. 5,000 0
කිලෝ මීටර් 30 ට වැඩි රු. 5,000 0 සහ ඊට අමතරව වැඩි වන කිලෝ මීටර් 1 සඳහා රු. 90 0 බැගින් (යන එන දුර සමග)	රු. 5,000 0 සමග වැඩිවන කිලෝ මීටර් 1 සඳහා රු. 90 0 බැගින් (යන එන දුර සමග)
අනෙකුත් ප්‍රවාහන කටයුතු වෙනුවෙන් කිලෝ මීටර් 1 ක් සඳහා රු. 90.00 බැගින් (යන එන දුර සමග)	

10.ii කම්කරු කුළිය රු. 1,000 0

11. සුසාන භූමියේ මළ සිරුරක් මිහිදන් කිරීම සඳහා වල බැඳීමට රු. 2,000 0 ක මුදලක් ද අයකර ගැනීමටත්

මොනරාගල ප්‍රාදේශීය සභාවේ සභා ලේකම් වන මම තීරණය කරමි.

11-524/8

මොනරාගල ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා පෙරසැරි ගාස්තු, සේවා ගාස්තු ආවරණ අනුමැතිය ලබා දීම සඳහා ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය ප්‍රකාරව පැවරී ඇති බලතල අනුව මොනරාගල ප්‍රාදේශීය සභාවේ සභා ලේකම්, ඩී. එම්. අනුර දිසානායක වන මම 2023 වර්ෂයේ සැප්තැම්බර් මස 26 වැනි දින මාගේ තීරණ අංක 125(ix) දරන පහත සඳහන් තීරණය ගනු ලැබූ බව මහජනතාවට මෙයින් නිවේදනය කරමි.

2024 වර්ෂය සඳහා පෙරසැරි ගාස්තු, සේවා ගාස්තු හා ආවරණ අනුමැතිය දීම සඳහා ගාස්තු එම වර්ෂය තුළ ලබාගත යුතු බව, නිවේදනය කරනු ලැබේ.

ඩී. එම්. අනුර දිසානායක,
සභා ලේකම්,
මොනරාගල ප්‍රාදේශීය සභාව.

2023 ඔක්තෝබර් මස 12 වැනි දින,
මොනරාගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරී පනත යටතේ මොනරාගල නාගරික ප්‍රදේශය සංවර්ධිත ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කර ඇත. 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත යටතේ 49 වන වගන්තිය, 52 වන වගන්තිය හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2235/54 හා 2021 ජූලි 08 දිනැති *අති විශේෂ ගැසට් පත්‍රය* ප්‍රකාරව ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල අනුව මොනරාගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත කරනු ලබන ඉදිකිරීම් අවසර පත්‍ර ලබාගැනීම සඳහා පෙරසැරි ගාස්තු, සේවා ගාස්තු හා ආවරණ අනුමැතිය ලබාදීම සඳහා ගාස්තු 2024 වර්ෂය සඳහා මොනරාගල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බව මොනරාගල ප්‍රාදේශීය සභාවේ සභා ලේකම් වන මම තීරණය කරමි.

ඉඩම්

ප්‍රමාණය (පර්චස්)	*ගාස්තු රු. ශත*
6-12	575 0
13-24	460 0
25-36	345 0
36 ට වැඩි	230 0

ගොඩනැගිලි

ගෙබිම් ප්‍රමාණය (වර්ග අඩි)	*නේවාසික රු. ශ.*	*වාණිජ රු. ශ.*
485 ට අඩු	575 0	1,150 0
485-970	1,725 0	2,300 0
971-1940	2,875 0	3,400 0
1941-2910	4,025 0	4,600 0
2911-4842	5,175 0	6,900 0
4843-7263	6,325 0	9,200 0
7264-9684	7,475 0	11,500 0
9685-13181	8,625 0	13,800 0
13181ට වැඩි		13,800 0

ගොඩනැගිලි සංවර්ධන බලපත්‍රයේ කාලය දීර්ඝ කිරීමේ ගාස්තු :

කාලය	*මුදල*
වසරක් සඳහා	රු. 1,000 0
වසර දෙකක් සඳහා	රු. 2,000 0

විදුලි සංදේශ කුළුණු

උස සෑම මීටර් 5 කටම රු. 10,000 0 බැගින්

අනුකූලතා ගාස්තු අය කිරීම

01. *නේවාසික*
ව.මී. 300 ට අඩු — රු. 3,450 0
(වැඩිවන සෑම වර්ග මීටර් 01 ක් සඳහා රු. 10/- බැගින්)

02. *වාණිජ*
ව.මී. 100 ට අඩු — රු. 3,450 0
(වැඩිවන සෑම වර්ග මීටර් 01 ක් සඳහා රු. 20/- බැගින්)

03. *තාප්ප*
ව.මී. 100 ට අඩු — රු. 1,000 0
(වැඩිවන සෑම වර්ග මීටර් 01 ක් සඳහා රු. 10/- බැගින්)

04. කුඹුරු ඉඩම් ගොඩකිරීම

ව.මී. 150 ට අඩු (වැඩිවන සෑම වර්ග මීටර් 01 ක් සඳහා රු. 20/- බැගින්)	රු. 3,450 0

05. විදුලි සංදේශ කුළුණු

ව.මී. 5-20 අතර (වැඩිවන සෑම මීටර් 01 ක් සඳහා රු. 100/- බැගින්)	රු. 3,450 0

11-524/9

මොනරාගල ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා ආදාහනාගාරය සඳහා ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය ප්‍රකාරව පැවරී ඇති බලතල අනුව මොනරාගල ප්‍රාදේශීය සභාවේ සභා ලේකම්, ඩී. එම්. අනුර දිසානායක වන මම, 2023 වර්ෂයේ සැප්තැම්බර් මස 26 වැනි දින මාගේ තීරණ අංක 125(x) දරන පහත සඳහන් තීරණය ගනු ලැබූ බව මහජනතාවට මෙයින් නිවේදනය කරමි.

2024 වර්ෂයට මොනරාගල ප්‍රාදේශීය සභාව සතු ආදහනාගාරයේ මෘතදේහයක් ආදහනය කිරීම සඳහා ගාස්තු ලෙස,

සභා බල ප්‍රදේශය තුළ පදිංචි අයෙකුගේ මෘත දේහයක් ආදහනය කිරීම වෙනුවෙන් රු. 12,500 ක් ද, සභා බල ප්‍රදේශයෙන් පිටත පදිංචි අයෙකුගේ මෘත දේහයක් ආදහනය කිරීම වෙනුවෙන් රු. 14,500 ක මුදලක් ද, අළු තැන්පත් කිරීමේ කුටියක් වෙන්කර ගැනීම සඳහා රු. 5,000 ක මුදලක් ද අයකර ගන්නා බව වැඩි දුරටත් නිවේදනය කරනු ලැබේ.

ඩී. එම්. අනුර දිසානායක,
සභා ලේකම්,
මොනරාගල ප්‍රාදේශීය සභාව.

2023 ඔක්තෝබර් මස 12 වැනි දින,
මොනරාගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

2013.06.28 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* සඳහන් පරිදි සම්මත අතුරු ව්‍යවස්ථාව වැළඳගත් බව දන්වන අතර, මොනරාගල ප්‍රාදේශීය සභාව සතු ආදාහනාගාරයේ මෘත දේහයක් ආදාහනය කිරීම සඳහා 2024 වර්ෂයට,

